# සුමංගල විලාසිනී නම් වූ
# දීඝනිකායට්ඨ කථා
## (සිංහල පරිවර්තනය)

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා !

## 2-17
## මහා සුදර්ශන සූත්‍ර වර්ණනාව

එවමෙමසුතං යනු මහා සුදසසන සූත්‍රයයි. මෙය එහි පෙර වර්ණනා නොකළ පද වර්ණනාවය. සබ්බරතනමයො යනු මෙහි එක් ගඩොලක් රුවන්මුවා වේ. එකක් රිදීමුවා වේ. එකක් වෛදූර්ය මැණික් වේ. එකක් පලිඟු මැණික් වේ. එකක් මැසිරිගල් වේ. එකක් සියළු රත්මුවා වේ. මේ පවුර සියළු පවුරුවල ඇතුළත උසින් සැට රියනක් විය. ඇතැම් තෙරුන් වහන්සේලා නගරය වනාහි ඇතුළෙහි සිට බලන්නන්ට දර්ශනීයව වැටහේ. එහෙයින් සියළු බාහිරව සැටරියනකි. සෙස්ස පිළිවෙළින් පහත් යයි කියති. ඇතමෙක් පිටත සිට බලන්නන්ට දර්ශනීයව වැටහේ. එනිසා සියළු අභ්‍යන්තරය සැට රියණකි. සෙස්ස පිළිවෙළින් පහත් වේ. ඇතමෙක් ඇතුළත ද පිටතද සිට බලන්නන්ට දර්ශනීයව වැටහේ. එහෙයින් මැදපවුර හැටරියනකි. ඇතුළ ද පිටත ද තුන පිළිවෙළින් පහත් වේ. එසිකා - යනු එසිකා ස්ථම්භයයි. ඉඳුකීලයයි. තිපොරිසනිඛාතා - යනු

Scanned with CamScanner

එක් පුරුෂයකු තමාගේ අතින් පස් රියනකි. එහෙයින් පුරුෂයන් තිදෙනෙකුගේ ප්‍රාකාරය පාලොස් රියන් පමණ යන අර්ථයයි. ඒවා කෙසේ පිහිටියේද? නගරයේ එක එක මහා දොර උළුවහු නිසා එක එකක් එක එකක් කුඩා දොර උළුවහු නිසා එක එකක් මහදොර උළුවහු කුඩා දොර උළුවහු අතර තුන්වැන්න සදායයි ද තල් පන්ති අතර සියළු රන්මුවා වූ තල්වලින් එක් රන්මුවාමයයි පවුරේ කී ලක්‍ෂණ අනුව දතයුතුයි. කොලගෙඩි ආදියෙහි ද මෙම පිළිවෙළමයි. ඒ තල්ගස් පන්තිය වනාහි අසූ රියනක් උසට විසිරුණු වැලිතලා සමහුම්යෙහි පවුරු අතර එක එකක් වෙන වෙනම පිහිටියේය. වගගු යනු සුන්දර රජනියො - යනු ඇලීමට සමත් වූ කමනියො - යනු දවසක් ඇසුවත් කැමති වේ, එපා නොවේ. මදනියො - යනු මාන මදය පුරුෂමදය උපදවන. පඤ්චඞ්ගිකසස - යනු ආතත, විතත, ආතතවිතත, බෙරවලින් සහ නලා, තාලම්පට යන මේවායින් යුක්ත වූ, එහි ආතත නම් සමින් යුත් බෙරවලින් එක් තලයක් පිටක් ඇති තූර්ය භාණ්ඩයකි. විතත නම් දෙපසම තල ඇති, ආතත විතත නම් සියළු ආකාරයෙන් වඩන ලද, සුසිර නම් තලා ආදියයි. ඝන නම් සම් ආදියයි. සුවිනීතසස - යනු ඇදීම් බුරුල් කිරීම් ආදියෙන් මඩනා ලද සුප්පටිකාලිකසස යනු උපොෂථ අංශයේ - ප්‍රමාණයෙහි සිටිබව දැනගැනීමට මනාව කුසලෙන සමනනාගතසස - යන යමෙක් වාදකිරීමට දක්‍ෂ සමර්ථ ඔවුන් සමග වාදකරන්නන්ගේ ධූතතා යනු සූදුවෙහි සුරාවෙහි ඇලීම. සොණ්ඩා යනු සුරාවෙහි ඇලීම. එයම නැවත නැවත පානය කිරීමට කැමැත්ත වශයෙන් ඇති පිපාසාව. පරිවාරෙසුං - යනු අත් පා විසිකරමින් නටමින් ක්‍රීඩා කළහ. සීසං නහාතසස - යනු හිස සමග සුවඳ ජලයෙන් නෑම. උපොසථිකසසා - යනු සමාදන් වූ පෙහෙවස් ඇත්තේ. උපරිපාසාදසසවරයාතසස ප්‍රාසාදයේ ඉහළමාලයට පැමිණ, ආහාර වළඳා ප්‍රාසාදයේ ඉහළ මහතලයෙහි සිරියහන් ගැබට පිවිස සිල් ආවර්ජනා කරන්නේ. එදා වනාහි රජතුමා උදේම ලක්‍ෂයක් වියදම්කර මහාදානයක් පිරිනමා සුවඳ පැන්කල සොළොසකින් හිසෙහි ස්නානය කොට උදේ ආහාර කිස නිමවා පිරිසිදු උතුරු සළුව එකස්කොට පෙරවා, ඉහළ ප්‍රාසාදයේ සිරියහනෙහි එරමිනිය ගොතා හුන්නේ තමාගේ දානමය පින් සමූහය ආවර්ජනා කරමින් සිටියේය. මෙය සියළු සක්විති රජුන්ගේ ධර්මතාවකි. එසේ ආවර්ජනා කරන්නාවූ ඔවුන්ට කියන ලද ආකාර පින්කම් හේතුවෙන් සතුවෙන් හටගත් නිල්මැණික් සමූහයක් මෙන් පෙරදිග මුහුදු ජලතලය දෙබෑ කරන්නාක් මෙන් අහස අලංකාර කරන්නාක් මෙන් දිව්‍ය චක්‍රරත්නය පහළ වේ. මහා සුදර්ශන රජතුමාට ද එය එසේම

පහළ විය. එය දිව්‍යානුභාවයෙන් යුත් නිසා දිව්‍ය යයි කියන ලදී. මෙහි අර (ගරාදි) දහසක් නිසා සහස්සාර - නම් වේ. නිම් වලලු (පට්ටම්) සහ නාභියෙන් ....යුත් නිසා සනෙමිකං සනාභිකං - වේ. සියළු ආකාරයෙන් සම්පූර්ණ නිසා සබ්බාකාර පරිපූරං - වේ. එහි රෝදයද ඇල්ම ඇතිකරන අර්ථයෙන් රත්නයද චක්කරතනං - වේ. යම් නාභියකින් යුක්ත වූ නිසා සනාභිකං යයි කියන ලදී. එය ඉඳුනිල්මිණිමුවා වේ. මැද වනාහි රිදීමුවා පනෙල් වේ. සුදු සිනිඳු දත් පෙළින් සිනා සෙන්නාක් මෙන් බබළයි. මැද සිදුරකින් මෙන් ඇතුළත පිටත දෙපසෙහි ම සඳමඬලේ රිදීපටකින් කරන ලද පරික්ෂේප ඇත්තේ වේ. නැබ පනෙල් වෙළන ලද පටවල සුදුසු තැන්වල වෙන්කොට දක්වන ලද රේඛා මනාව බෙදන ලද්දාක් මෙන් පෙනේ. මෙය නාභියෙන් සියළු ආකාර සම්පූර්ණ වීමකි. අර සත්රත්මුවා වේ. හිරුරැස් මෙන් ප්‍රභා සම්පන්න වේ. ඒවායෙහිද ගැටි මැණික් වෙන්කිරීමේ රේඛාදිය මනාසේ බෙදූවාක් මෙන් පෙනේ. මෙය අරවල සබ්බාකාර පරිපූරිතා - වේ. යමකින් වනාහි ඒ නේමි සනේමිකං - යයි කියන ලදි. එය තරුණ සූර්ය රශ්මි කලාප සිරියෙන් අපහාස කරන්නාක් මෙන් ඉතා රතු පිරිසිදු පබලුමුවා වේ. මෙහි සන්ධිවල වනාහි සන්ධ්‍යා වර්ණයෙන් යුත් රතු ජම්බුනදියෙහි හටගත් රන්පටිමෙන් වට වූ වෙන්වූ රේඛාවලින් බෙදනලද්දා මෙන් පෙනේ. මෙය නෙමියා සබ්බාකාර පරිපූරිතා - නම් වේ.

නිම්වලලුපටෙහි අර දහයක් දහයක් අතර ඇතුළ සිදුරැති පිඹින නලාවක් මෙන් සිදුරු මණ්ඩලයෙහි ඔබ්බන ලද සුළං යන්නා පබළු දඬුවෙක් වේ. එය වාතයෙන් සොලවනවිට ඉතා හොඳින් වාදනය කරන පංච තුරිය මෙන් සුන්දර, සිත් අලවන, එපා නොවන, මුසපත්වන ශබ්දයෙන් යුක්ත වේ. වගගුච රජනීයොච කමනීයො ච, මදනියොච හොති ඒ පබළු දඬුවෙහි මුදුනෙහි සේසත දෙපස එක්රැස් වූ මල්මාලා පේලි දෙකක් වේ. මෙසේ එක්රැස් වූ මල්මාලා පේලි සියයක් හා සේසත් සියයක් දරණ පබළු දඬු සියයකින් සැදුණු නිම්වලලු පරික්ෂේපයෙන් නාභි පනෙල් දෙක ඇතුළත සිංහ මුහුණු දෙකක් වේ. ඒවායෙන් තල්කඳක් සා පිරුණු සඳ කිරණ කලාප සිරියෙන් හා තරුණ හිරු හා සමාන රන් කම්බිලි පන්දුවක් කෙළවරකොට ඇති අහස් ගඟ සිරියට අපහාස කරන්නාක් මෙන් මුතුවැල් දෙකක් එල්බේ. චක්‍රරත්නය සමග ඒවා අහසෙහි මනාව පෙරලෙමින් යනවිට චක්‍ර රත්න තුනක් එකවිට පෙරලෙන්නාක් මෙන් හැඟේ. මෙය එහි සියළු ආකාරයෙන් සබ්බකාර

පරිපූරිතා - නම් වේ. මෙය මෙසේ සියළු ආකාරයෙන් සපිරි සවභාවෙයන් සවස ආහාර ගෙන තම තමාගේ ගෙවල පැණවූ අසුන්හි හිඳ මිනිසුන් අල්ලාප සල්ලාපයෙහි යෙදෙන කල්හි, දරුවන් සිව් මංසල්වල ක්‍රීඩා කරන කල්හි උසිනුත් නොව පහතිනුත් නොව වනහිස මුදුනේ අහස් පෙදෙසෙන් ගස් මුදුන් ආලෝක කරන්නාක් මෙන් දොලොස් යොදුනක සිට අස්වනු ලබන මිහිරි සරෙන් සතුන් කන් පුරවමින් යොදුනක සිට හා ආලෝකයෙන් බබළන වර්ණයෙන් ඇස් අදින්නාක් මෙන් සක්විති රජුගේ පුණ්‍යානුභාවය ප්‍රකාශ කරන්නාක් මෙන් රාජධානිය ඉදිරියට එයි. ඉක්බිති මේ මේ සක්රුවනේ ශබ්දය ඇසීමෙන්ම කොහෙන් මේ කාගෙද මේ ශබ්දය යයි මෙනෙහි කළ සිතින් පෙරදිග බලන්නාවූ මිනිසුන්ගෙන් එකෙක් තව එකෙකුට මෙසේ කීය.

පිනැත්ත, බලන්න... අසිරිමත් වේ. මේ පුන්සඳ පෙර එකක්ම නැඟුනේය. අද වනාහි තමාගේ දෙවැනියෙකු සමග නැගීය. මෙය රාජහංස යුවලක් මෙන් පූර්ණචන්‍ද්‍ර යුගලයකි. පෙර වෙනත් ආකාරයෙන් ගුවන් තලයේ උදාවේ. අනිකා ඔහුට කීය. යහළුව, මොනවා කියනවද? පුන්සඳ දෙකක් එකට නැගෙනවා ඔබ කොහෙහරි දක තිබෙනවාද? මෙය තවන රස ධාරාවෙන් රතු රත්වන් වූ සූර්යය උදාවූයේ නොවේද? ඔහු සිනාසී අනිකාට මෙසේ කීය. පිස්සුද? දන් නේද ඉර බැස්සේ. එය කොහොම මේ පුන්සඳ ලුහුබඳිමින් උදාවන්නේද? ඒකාන්තයෙන් මෙය නොයෙක් රත්නාලෝකයෙන් බබළණ කිසියම් පින්වතෙකුගේ විමානයක් වන්නේය. ඔවුන්ට නින්දා කරමින් අනෙකෙක් මෙසේ කීය. පින්වත්නි, මොනවද දොඩන්නේ, මෙය පුන්සඳ නොවේ. හිරු නොවේ, දෙව් විමනක් නොවේ. ඒවාට මෙබඳු වූ නාද සම්පතක් නැත. මෙය සක්රුවනම විය යුතුය. ඒ ජනයාගේ මේ කථා සල්ලාපය පවතිද්දීම සඳමඬල හැරදමා ඒ සක්රුවන අභිමුඛයට පැමිණියේය. එයින් පසු ඔවුන් විසින් කවුරුන් උදෙසා මෙය පහළවූයේදැයි කී කල්හි, වෙන කිසිවකු සඳහා නොවේ, අපගේ මහරජතුමා පිරූ සක්විති සම්පත් නිසා මෙය පහළ වී යයි සිතූහ. ඒ මහා ජනයාද මෙය දක්නා සෙසු ජනයාද යන සියල්ලෝම සක්රුවන අනුගමනය කරමින් යති. ඒ සත්රුවන ද රජ සඳහාම තමාගේ පැමිණීම දක්වීමට මෙන් සත්වරක් ම පවුරමතින් නගරයට ගොස් ඉක්බිති රජුගේ ඇතුළුනගරය ප්‍රදක්ෂිණා කොට ඇතුළු පුරයේ ඉහළ සීමැදුරු කවුළුව සමාන සුවඳමල් ආදියෙන් පහසුවෙන් පූජා කිරීමට හැකි ස්ථානයක අකුර ගැසුවාක් මෙන් සිටියි. මෙසේ සිටිවිට වා

කවුළු සිදුරු ආදියෙන් පිවිස නා නා වර්ණවලින් බබළමින් ඇතුළු ප්‍රාසාදය අලංකාර කරමින් පැවති ආලෝක සමූහය දැක එය දැකීමට රජුට කැමැත්තක් ඇතිවිය. සේවකයෝ ද පිය තෙපුල් පඬුරුවලින් එය දක්වති. නිවේදනය කරති. ඉක්බිති රජතුමා බලවත් ප්‍රීතියෙන් පහස්නා ලද ශරීර ඇත්තේ ආසනය හැර නැගී සිට සීමැදුරු කවුළුව ලඟට ගොස් සක්රුවන දැක, මෙය මා පෙර අසන ලදැයි සිතයි. මහසුදසුන් රජතුමාට ද එය එසේම විය. එසේ හෙයින් කියන ලදි. "මහා සුදසසන රජු දැක...හේ සක්විති රජවෙයි" මම සක්විති රජවීම්ද? කොපමණකින් සක්විති වේද? අඟලක් දෙකක් පමණ අහසට නැග සක්රුවන සිටි කල්හි, දැන් ඊට පැවතිය යුතු කළයුතු යමක් වේ නම් එය දක්වීමට අළබො ආනනො" යනාදිය කීහ.

එහි උට්ඨායාසනා - හිඳගත් අසුනෙන් නැගිට, සක්රුවන සමීපයට ගොස් සුවණ්ණභිඞ්කාරං - ඇත් සොඬ සමාන පනෙල් ඇති රන් කෙණ්ඩිය ඔසවා අභිවදෙව රාජා මහා සුදසසනො සඩිං චතුරංගිනියා සෙනාය - සියළු සක්විතීන්ගේ වත් අනුව ජලයෙන් ඉස, ''පින්වත් සක්රුවන ජයගනීවා'' යන වචනවලට අනතුරුවම අහසට පැන නැගී සක්රුවන පවතී. එසේ පැවති කාලයෙහි පටන් ඒ රජතුමා සක්විති රජ නම් වන්නේය. සක්රුවන එසේ පවතින කල්හි එය අනුව යමින් සක්විති රජතුමා උතුම් යානයකට නැගී අහසට යයි. ඉක්බිති ඔහුගේ සත් සෙමෙර ගත් අත් ඇති පිරිවර ජනයාද ඇතුළුනුවර ජනයාද නොයෙක් ආකාර කඤ්චුක කවචාදියෙන් සැරසී විවිධ ආභරණාලෝකයෙන් බබළන ඔසවන ලද ධජ පතාකවලින් අලංකාර වූ තම තමාගේ බලකාය සමග උපරජ සේනාපතීන්ගේ පටන් අහසට නැගී රජුව පිරිවරා සිටිති. රජුගේ කැමැත්තෙන් ජන සංග්‍රහය සඳහා නගරයෙහි බෙර වාදනය කර ''දරුවනි, අපගේ රජතුමාට සක්රුවන පහළ විය. තම තමා ගේ සම්පත් අනුව සැරසී රැස්වන්න'' යයි දන්වනු ලැබේ. මහජනයා වනාහි සක්රුවනේ පියවි නාදයෙන් සියළු වැඩ අතහැර සුවඳ මල් ආදිය ගෙන රැස්වූවෝ ඒ සියල්ලෝ ද අහසට නැගී රජතුමාව පිරිවරාගෙන සිටිති. යම් යම් අයෙකුට රජු සමග යෑමට කැමැත්තේ වී නම් ඒ ඒ සියල්ලෝ ද අහසට ගියෝ වෙති. මෙසේ දොළොස් යොදුනක් දිගපළලින් පිරිස වෙති. එහි එකදු පුරුෂයෙකුවත් සිඳීබිඳී ගිය ශරීරයෙක් කිලිටි ඇඳුමක් නොවීය. සක්විති රජතුමා පිරිසිදු පිරිවර ඇත්තේ විය. සක්විති පිරිස නම් විද්‍යාධර පිරිසක් මෙන අහසින් යන්නේ ඉඳුනිල් මිණි බිමක විසුරුවන රුවන්

Scanned with CamScanner

මෙන් වෙති. මහ සුදසුන් රජතුමාද එසේම විය. එසේ හෙයින් කියන ලදී. "සිවුරඟ සෙනග සමග සුදසුන් රජතුමා ද එසේම විය". ඒ සක්රුවන රුක් අගින් ඉහළ ඉතා උස් නොවූ ඉතා පහත් නොවූ අහස් පෙදෙසක පවතී. ගස්වල මල් ගෙඩි කොල කැමති කෙනෙකුට බිම සිටියා මෙන් පහසුවෙන් ඒවා ගතහැකි වේ. මේ රජතුමාය. මේ උපරජතුමාය. මේ සේනාපතී යයි සැලකීමට හැකි වේ. ස්ථානාදියෙහි ද ඉරියව්වලද යමෙක් යමක් කැමති වේද හේ එය සිදුකර යති. චිත්‍ර කර්මාදි සිල්පවල යෙදීමට කැමති අය තම තමාගේ සිල්පාදිය කරමින් යති. බිම මෙන් ඔවුන්ගේ සියලු කටයුතු අහසෙහි සිදු වේ. මෙසේ සක්විති පිරිස ගෙන ඒ සක්රුවන වම්පසින් මහාමේරුව හැර සමුදුරට ඉහළින් යොදුන් හත්දහසක් පමණ වූ පූර්ව විදේහයට යයි. එහි වෙන්වූ දොලොස් යොදුනෙක් වටකරන ලද යොදුන් තිස් හයක් වූ පිරිසට විසියහැකි සුලභ ආහාර උපකරණ ඡායා ජලය ඇති රමණීය වූ තැනිතලා භූමිභාගයක ඉහළ අහසේ සත්රුවන අකුර ගැසුවාක් මෙන් සිටී. ඉක්බිති ඒ සංඥාවෙන් ඒ මහාජනයා බැස කැමති පරිදි ස්නාන භෝජනාදි සියළු කිස කරමින් වාසය කරති. මහ සුදසුන් රජතුමාට ද ඒ එසේම ඒ සියල්ල සිදුවිය.

එසේ හෙයින් කියන ලදී. "ආනන්දය, යම් ප්‍රදේශයක සක්රුවන පිහිටියේද එහි මහා සුදසුන් රජතුමා සිව්රඟ සෙනඟ සමග විසීමට එළඹේ." මෙසේ සක්විති රජතුමා වාසයට පැමිණි කල්හි එහි රජවරු ඒ අනුන්ගේ චක්‍රයක් ආවේ යයි අසාද බලසෙනඟ රැස් කොට යුදයට සැරසීමක් නැත. සක්රුවන පහළ වූ තැන්පටන් ඒ රජතුමාට එරෙහිව ආයුධ ඔසවන විරුද්ධ අදහස් ඇති රජෙක් නැත. මෙය සක්රුවනේ අනුභාවයයි.

සක්අනුහසින් සිය
දමෙති සතුරෝ සියළුම
රජ අරින්දම නම්
කියයි ඔහු සක එහෙයින්

එහෙයින් ඒ සියළුම රජවරු ම තමාගේ රාජ්‍ය ශ්‍රී සම්පත් අනුරූප පඬුරු ගෙන ඒ රජු වෙත එළඹ නැමුණු හිසින් තමාගේ ඔටුණු මිණි එළියෙන් පාද පූජා කරන්නේ "මහරජතුමණී, වඩිනු මැනවි" ආදි වචනයෙන් ඔහුගේ කීකරුවූවන් බවට පැමිණෙති. මහසුදසුන් රජතුමා ද

එසේම කෙළේය. එහෙයින් කියන ලදී. යම් සේ ආනන්ද පෙර දිසාවෙන් මහරජ අනුසාසනා කරව", එහි සවාගතං - යහපත්ව පැමිණීම. කෙනෙක් පැමිණි කල්හි සෝක කරති. ගිය කල්හි සතුටු වෙති. කෙනෙක් පැමිණි කල්හි සතුටු වෙති. ගිය කල්හි සෝක කරති. එබඳු වූ ඔබගේ පැමිණීම සතුටකි. යෑම දුකකි. එනිසා ඔබගේ පැමිණීම ස්වාගමනයකියි කියන ලදී. මෙසේ කීකල්හි සක්විති රජ වාර්ෂිකව මට බදු පමණක් දෙන්න යයි නොකියයි. එකෙකුගේ සම්පත් උදුරා තවකෙකුට නොදේ. තමාගේ ධර්මරාජභාවයට අනුරූපව ප්‍රාණඝාතාදිය ප්‍රඥාවෙන් පරීක්ෂා කොට ප්‍රේමවන්ත මිහිරි ස්වරයෙන්, බලන්න දරුවනි, ප්‍රාණඝාතය යන මෙය සෙවිනා ලද්දේ භාවිත කරන ලද්දේ බොහෝ කොට කරන ලද්දේ නිරයට වැටෙන්නේ ය... යනාදි නයින් අවවාද දෙයි. මහා සුදස්සන ද එසේ කෙළේය. එසෙයින් කියන ලදී.. "මහා සුදර්ශන රජතුමා මෙසේ කීවේය. "ප්‍රාණය නොනැසිය යුතුය... සුදුසු සේ අනුභව කරන්න. කිම සියළුම රජවරු අවවාද ගන්නෝද ? බුදුන් වහන්සේ අවවාද කළත් සියල්ලෝම නොගනිති. කිම රජුගේ අවවාද සියල්ලන් ම ගනිතිද? එහෙයින් යමෙක් නුවණැත්තේ පණ්ඩිතවේද හේ ගනී. අනුව යතියි ආනන්දයෙනියි කීහ.

මෙසේ පූර්ව විදේහියන්ට අවවාද දුන් කල්හි කරන ලද උදේ ආහාරය ඇත්තේ ඒ සක්රුවන සක්විති බලයෙන් අහසට නැගී නැගෙනහිර මුහුදට බැසයයි. එසේ බැසගත් එය බෙහෙත් සුවඳ ස්පර්ශ කළ පෙණය හකුලාගත් නා රජෙකු මෙන් හකුලන ලද ජලරල ඇතිව මතුවන්නේ මහසමුදුර ජලය යොදුනක් පමණ උඩට නැගී වෛදූර්ය භිත්තියක් මෙන් සිටී. එකෙණෙහි ම ඒ රජුගේ පින්සිරි දැකීමට මෙන් මහසමුදුරු තලයෙහි විසිරුණු නොයෙක් රුවන් රැස් සැනින් පැමිණ ඒ ප්‍රදේශයේ පිරෙයි. ඉක්බිති ඒ රජපිරිස නොයෙක් රතනයෙන් පිරි ඒ මුහුදු තලය බලා කැමති පරිදි ඔඩොක්කු ආදිය පුරවා ගනිති. කැමති සේ ඒ රතන ඇරගන්නා තුරු ඒ සක්රුවන නවතී. නැවතී සිටින්නේද එහි ඉදිරියෙන් පිරිස සිටිති. මැද රජතුමාය. කෙළවර සක්රුවනය. එයද මුහුදු ජලය පොළඹවන්නා සේ සක්රුවන් සිරියෙන්, එහි වියෝගය නොඉවසන්නාක් මෙන් නිම්වලලු කෙළවර වැදෙමින් මැදෙමින් ඉවුරටම යයි.

මෙසේ සක්විති රජතුමා නැගෙනහිර සමුද්‍රය අවසන් කොට ඇති පූර්ව විදේහය ජයගෙන දකුණු සමුද්‍රය අවසන්කොට ඇති දඹදිව

ජය ගැනීම කැමැත්තේ සක්රුවන කියූ මගින් දකුණු මුහුද අභිමුඛව යයි. මහසුදසුන් රජතුමා ද එසේම පැමිණියේය. එසේ හෙයින් කියන ලදී. "ආනන්දයෙනි, ඉක්බිතිව ඒ සක්රුවන පෙරදිග මුහුද ගිලී මතු වී දකුණු දිසාවේ පවතී." මෙසේ පවතින ආකාරය පවතින විවරය සේනාව ඇතුළුවීම් පෙරළා රජුගේ ගමන ඔවුන්ගේ අනුසාසනා දකුණු මුහුදට බැසීම මුහුදු ජලය උඩට නැගීම් රුවන් ගැනීම් ආදි සියල්ල පෙර කී ආකාරයෙන් දත යුතුය. දස දහසක් යොදුන් දඹදිව ජයගෙන දකුණු මුහුදෙන් ද නැගී සත් දහසක් පමණ යොදුන් අපරගෝයාන ජය ගැනීමට පෙර කී නයින් ගොස් එය ද මුහුද කෙළවර කොට ජයගෙන පැසුළු මුහුදෙන් නැගී අටදහසක් පමණ යොදුන් උතුරුකුරු දිවයින ජයගැනීමට එසේ ම ගොස් එය ද ජයගෙන උතුරු මුහුදෙන් නැගී සිටියි. මෙපමණකින් සක්විති රජතුමා විසින් සතර අන්තකොට ඇති පොළොවේ ආධිපත්‍යයට පැමිණෙන ලදී. හේ මෙසේ දිනන ලද ජය, ඇත්තේ තමාගේ රාජ ශ්‍රී සම්පත්තිය ප්‍රදර්ශනය කිරීම සඳහා පිරිස සහිතව ඉහල ගගන තලයේ හැපී මනාව පිපුණාවූ නෙළුම්, උපුල්, මානෙල්, වශයෙන් විසිතුරු වූ විල් සතරක් මෙන් මහාද්වීපය බලා සක්රුවන කියූ මගින්ම පිළිවෙළින් තමාගේ රාජධානියට පෙරළා පැමිණෙයි. ඉක්බිති සක්රුවන ඇතුළුනුවර දොර බබළවමින් මෙන් සිටී. මෙසේ සක්රුවන පිහිටි කල්හි රජුගේ ඇතුළුනුවර හුළු එළිවලින් හෝ පහන්වලින් කිසිකාරියක් නැත. සක්රුවනේ ආලෝකයෙන්ම රෑ අඳුර නැසෙයි. අඳුර කැමති අයට අඳුරම වේ. මහ සුදසුන් රජතුමාට ද මේවා මෙසේම විය. එහෙයින් කියනලදී. දකුණු මුහුදට බැස... මෙබඳු වූ සක්රුවන පහළ විය.

මෙසේ පහළ වූ සක්රුවනේම සක්විතිගේ ඇමත්තෝ ස්වාභාවික මඞගල ඇතුගේ ස්ථානයෙහි සමතලා පිරිසිදු බිම්කඩක් කරව. රත්සඳුන් ආදී සුවඳින් ආලේප කරවා විසිතුරු වර්ණ ඇති සුවඳ මල් ඉහළ රන්තරු අතරින් ගවසා කුසුම් දාමයෙන් යුත් වියනින් දෙව්විමනක් මෙන් සරසා මෙබඳු වූ දිව්‍ය හස්ති රත්නයේ පැමිණීම සිතනු මැනවැයි කියති. හේ පෙර කී සේ මහ දනක් දී සිල්ද සමාදන්ව ඒ පින්සම්පත් ආවර්ජනා කරමින් හුන්නේ ය.

ඉක්බිති එතුමාගේ පින් අනුහසින් මෙහෙයවන ලද සදත් කුලයෙන් හෝ පෙහෙවස් කුලයෙන් හෝ ඒ විශේෂ සත්කාරය විඳිනු කැමත්තේ තරුණ රිවිමණ්ඩල සේ සුරත් පා ග්‍රීව මුව අලංකාරව සුපිරිසිදු සුදු සිරුර

Scanned with CamScanner

ඇත්තේ සතඟින් යුත් මනාව පිහිටි අඟ පසඟින් යුක්තවූයේ පිපුණු රත් පියුමක්මෙන් මනොඥ වූ සොඬ අඟ ඇත්තේ සෘධිමත් යෝගියකු මෙන් අහස් ගමනට සමත් මනෝසිලා සුණු ඇලුණු ඉදිරිපස ඇති රිදී පව්වෙන් ශ්‍රේෂ්ඨ ඇතෙක් ඒ ප්‍රදේශයේ සිටී. ඌ සදත් කුලයෙන් එන්නේ සියල්ලටම පසුව එයි. උපොෂථ කුලයෙන් එන්නේ සියල්ලටම මුලින් එයි. පෙලෙහි වනාහි "උපොෂථො නාගරාජා ඉච්චච" උපෝෂථ ඇත්රජා මෙසේ පැමිණ තමාම පුරන ලද සක්විති වතාවත් ඇත්තේ සක්විතින්ගේ කියන ලද සිතුවිල්ල අනුව එයි. මහ සුදසුන් රජතුමාට වනාහි තමාම ස්වාභාවික මංගල ඇත් ස්ථානයට පැමිණ මඟුල් ඇතා අයින්කර එහි සිටියේය. එයින් කියන ලදී. "නැවත ආනන්ද,..... ඇත් රජ" යයි මෙසේ පහළ විය. ඇත්ගොව්වෝ ඒ ඇත්රුවන දැක සතුටුව වහා ගොස් රජුට දන්වති. රජතුමා වහ වහා පැමිණ ඇත්රුවන දැක පහන් සිත්ව සොඳුරුව පින්වත් ඇත්වාහනය, ඉදින් දමනයව පැමිණෙන්නේ නම් යයි සිතමින් අත් දික් කෙළේය. ඉක්බිති හේ ගෘහ දෙනගේ වසුපැටවා මෙන් කන් ඔසවා කැමති බව දක්වමින් රජු වෙත එළඹෙයි. රජ නැගෙනු කැමත්තේ වේ. ඉක්බිති පිරිවර ජනයා අදහස දැන ඒ ඇත්රුවන රන්දද රනින් ලකරවූ රන් දැලකින් වසා පැමිණ වී. රජ ඒ ඇත්රුවන නොහිඳවා සත්රුවන්මය ඉනිමගකින් නැග අහස් ගමනට නැඹුරු සිතැත්තේ වෙයි. ඔහුගේ ඒ සිතිවිල්ල සමග ඒ ඇත්රජ රාජ හංසයකු මෙන් ඉඳුනිල් මිණි ආලෝක ජාල නිල් ගුවන්තලයට නැගේ. එයින් සක් චාරිකාවේ කියන ලද අයුරින්ම සියළු රාජපිරිස පිරිස් සහිත රජ පොළොවේ සියළු රජුන්ට අනුසාසනා කොට උදේ ආහාරයට (පාතරාසයව) සිය රාජධානියට පෙරළා එයි. මෙසේ මහත් සෘද්ධි ඇති සක්විති රජුගේ ඇත්රුවන මේ මහ සුදසුන්ට ද එබඳුම විය. එයින් කියන ලදී "රජු දැක... පහළවීය." මෙසේ පහළ වූ ඇත්රුවනින් පසු රජුගේ පිරිස සවාභාවික මඟුල් අස්හල පිහිටි තැන පිරිසිදු කර සමතලා කරවා පෙර කී නයින්ම අලංකාර කෙළේය. රජතුමා ඔහුගේ පැමිණීම සිතීමට උත්සාහ කෙළේය. හෙතෙම පෙර පරිද්දෙන්ම දානමාන සත්කාරාදිය කොට සිල් සමාදන්ව ප්‍රාසාදයෙහි සුවසේ හිඳින්නේ පින් සම්පත් සිහිකරයි. ඉක්බිති ඔහුගේ පින් තෙදින් මෙහෙයවන ලද සින්ධව කුලයෙන් විදුලියෙන් එතු සරත් කාලයේ සුදුවලා රැසක සිරිය පෑ රතු පා රතු හොම්බ සඳරැස් රැසක් සමාන පිරිසිදු සිනිඳු සනයෙන් යුත් ශරීරය කාක ගීවයක් මෙන් ඉඳුනිල් මිණි මෙන් ද කලුවන් හිසින් යුත් කලුහිස මනාව තබන ලද්දාක් මෙන් මුදුතණ සමාන සියුම්වට සෘජු ගති ශරීරයෙන් මුඤ්ජ තණමෙන් කෙසින්

යුතු අහසින් යන වලාහක නම් අස්රජ අවුත් ඒ ස්ථානයෙහි පිහිටියේය. මහාසුදසසන රජුට වනාහි ඇත්රුවන මෙන් ආවේය. සෙසු සියල්ල ඇත්රුවනෙහි කී නයින් දතයුතුය. මෙබඳු වූ අස්රුවන උදෙසා භාග්‍යවතුන් වහන්සේ "පුන ච පර"නති යනාදි කීහ. මෙසේ පහළ වූ රුවන් අතර රියන් හතරක් පමණ ගැල් නැබක් පමණ විසාල දෙකෙළවර පියුම් කෙමියක කෙළවර වෙළන ලද පිරිසිදු මුතු කලාපවලින් රන් පියුමෙන් අලංකාර කළ අසූහාර දහසක් මැණික් පිරිවරද තරු පිරිවරද සඳ මෙන් බබළන වේපුල්ල පර්වතයෙන් මිණිරුවනක් එයි. එසේ එය පැමිණි විට මුතුදූල් හැර උණ ලීවලින් රියන් හැටක් පමණ අහසට එසවීමෙන් රාත්‍රී භාගයෙහි හාත්පස යොදුනක් පමණ අවකාශයෙහි එලිය පැතිරේ. ඒ සියළු ආලෝකය හිරු නැගි කලක් පරිද්දෙන් හැඳින ගැනීමේ ආලෝකය වේ. එයින් ගොවියෝ කෘෂිකර්මය, වෙළෙන්දෝ ආපන වැඩ දවල් යයි සිතමින් ඒ ඒ සිල්පීහු ඒ ඒ කර්මාන්තවල යෙදෙති. මහා සුදස්සනයන්ට ද ඒ සියල්ල එසේ විය. එයින් කියන ලදී. "නැවත ආනන්ද, මිනිරුවන පහළ විය" මෙසේ මිණිරුවන පහළවීමෙන් පසු සක්විතිහුගේ විසය රස අනුභවය සඳහා විශේෂ කාරණ වූ ස්ත්‍රී රත්නය පහළ වේ. මදුරජ කුලයෙන් හෝ අගමෙහෙසිය කැඳවයි. උතුරුකුරු දිවයිනේ හෝ පින් අනුහසින් තමාම එයි'' ආනන්දය, නැවත ද මහසුදසුන් රජතුමාට අභිරූප වූ දර්ශනීය වූ වනිතා රුවන පහළවේ. ආදි නයින් පෙළෙහි ආවේය.

එහි සටහනින් පිරුණු අධික රූප ඇතැයි අභිරූපා - වේ. දකින්නේම ඇස් පිනවයි. එහෙයින් අනිත් කිස අත්හැර දකිය යුතු නිසා දසසනීය - වේ. දැකීමෙන්ම සිත පැහැදෙන නිසා පාසාදිකා වේ. පරමාය - මෙසේ පහළවන සුළු උතුම් බැවින්, වණ්ණපොක්ඛරතාය - යනු වර්ණයෙන් සුන්දර බැවින්, සමනනාගතා - යනු යුක්තවීමය. අභිරූප හෝ ඉතා උස් නැති ඉතා මිටි නැති දර්ශනීය ඉතා කෙට්ටු නැති ඉතා මහත නැති පහදවන සුළු, ඉතා කලු නැති ඉතා එලලු නැති උතුම්වූ සුන්දරත්වයෙන් යුක්ත වූ එහෙයින් අතික්කනත මානුසං වණ්ණං අපපතතා දිබ්බං වණ්ණං - මිනිසුන්ගේ වර්ණාලෝකය පිටතට නො නික්මේ. දෙවියන්ගේ දුරට නික්මේ. එය වනාහි දොලොස් රියනක් පමණ ප්‍රදේශයෙහි ශරීරාලෝකය බබළයි. වැඩි දිග නැති අයගේ පළමු යුගලයෙන් ආරෝහ සම්පත්තිය ද දෙවන යුගලයෙන් පරිනාහ සම්පත්තිය ද තුන්වන යුගලයෙන් වර්ණ සමාපත්තිය ද කියන ලදී. තුල පිචුනොවා කපපාස

පිචුනො වා - යනු ගිතලෙහි බහා සියක්වර ගසා දැමූ පුලුන් හෝ කපු පුලුන් හෝ සීතෙ - යනු රජුට සීත කාලයෙහි උණෙහ රජුට උණුසුම් කාලයෙහි. චන්දන ගන්ධො - සිවු දෑ සුවඳට එක්කළ රත්හඳුන් සුවඳ සිරුරෙන් හැමවිටම වහනය වෙයි. උප්පලගන්ධො වායති - යනු සීතය කියන කාලයෙහි මුව අරිනවිට නිල් උපුල්වල ඉතා මිහිරි සුවඳ හමයි. මෙබඳු වූ ස්පර්ශ සුවඳ සමවතින් යුත් ඇගේ ශරීර සම්පත්තියට අනුරූප හැසිරීම දක්වීමට "තං ඛො පනාති" යනාදිය කියන ලදී. එහි රජු දැක හුන් අසුනෙන් ගින්නෙන් දැවුනාක් මෙන් පළමුව නැගී සිටී යනු පුබ්බුට්ඨායි - වේ. රජු හිඳගත් කල්හි තල්වැටින් පවන් සැලීම් ආදිය කොට පසුව නිදයි. හිඳියි. පච්ඡා නිපාතිනි නම් වේ. දේවයෙනි කුමක් කරම්දැයි වචනයෙන් කීකරු බව දක්වීම කිංකාරපටිස්සාවිනී - නම් වේ. රජුගේ කැමැත්තෙන්ම හැසිරෙයි කරයි යනු මනාපචාරිණී - වේ. රජු යමක් ප්‍රිය නම් එය කියයි යනු පියවාදිනී - වේ. දැන් මෙම ආචාර පිරිසිදුවම මිස කපටිකමට නොවේ යයි දක්වීමට ''තං ඛො පනාති'' යනාදිය කීය. එහි නො අතිචාරී - යනු ඉක්මවා නොහැසිරෙයි. රජුහැර වෙනපුරුෂයකු සිතින්වත් නොපතයි යයි කියන ලද්දේ වේ. එහි ඇගේ නම් ආදියෙහි අභිරූපා යනාදිය ඇතුළත ද පුබ්බුට්ඨායිනී ආදිය ප්‍රකෘති ගුණ යයි කියන ලදී.

"අතික්‍රාන්ත මනුෂ්‍ය වර්ණාව" ආදිය වනාහි සක්විතිහු හේ පින් නිසා සක්රුවනේ පහළවීමේ පටන් පෙරකර්මවල ආනිශංසයෙන් පහළ වේ යයි දත යුතුය. අභිරූප දර්ශනාදිය ද සක්රුවනේ පහළවීමේ පටන් සියළු ආකාරයෙන් සම්පූර්ණවී හටගත්තේය. එයින් කීහ. ''මෙබඳු ඇත් රුවනක්පහළවීය'' මෙබඳු වූ ස්ත්‍රී රත්නයක් පහළවීමෙන් පසු සක්විතිහුගේ ධනය පිළිබඳව කටයුතු පහසුවෙන් පැවැත්වීම සඳහා ගෘහපති රත්නය පහළ වේ. හේ ප්‍රකෘතියෙන්ම මහත් සම්පත් ඇති මහත් භොග කුලයෙහි උපදී. රජතුමාගේ ධනය රැස්කර දෙන ගහපති සිටුවරයා වේ. සක්රුවනේ අනුහස් සහිතව ඔහුට කර්ම විපාකයෙන් උපන් දිව ඇස් පහළ වේ. එයින් පොළොව තුළ යොදුනක් දක්වා තිබෙන නිධාන පෙනෙයි. හේ ඒ සම්පත් දැක සතුටු සිතැත්තේ ගොස් රජතුමාට ධනය පවරා ධනය පිළිබඳ සියළු කටයුතු සම්පාදනය කරයි. මහ සුදසුන් රජතුමාට ද එසේම සම්පාදනය කෙළේය. එයින් කියන ලදී.

"නැවත ද ආනන්දයෙනි... මෙබඳු වූ ගහපති රුවනක් පහළ විය." මෙසේ ගහපතිරුවන පහළවීමෙන් පසු සක්විති රජතුමාට සියළු කෘත්‍ය සංවිධානයෙහි සමර්ථ පරිනායක රත්නයක් පහළ වේ. හේ රජතුමාගේ දෙටුපුතා වේ. ස්වභාවයෙන් ම හේ පණ්ඩිතයෙකි. ව්‍යක්තයෙකි, නුවණැත්තෙකි. රජතුමාගේ පින්වත්කම් නිසාත් තමාගේ කර්මානුභාවයෙන් අනුන් සිත් දැන ගන්නා ඤාණය ඇතිව උපදී. එයින් යොදුන් දොලහක රජ පිරිසේ සිත් හැසිරෙන ආකාරය දැන රජුට හිත අහිතයන් වෙන්කර නියමකර දක්වීමට සමත් වේ. හේද තමාගේ ආනුභාවය දැක සතුටු සිතැත්තේ සියළු කෘත්‍ය අනුසාසනයෙන් පවරයි. මහසුදස්සුන්ට ද එසේම පැවරීය. එසේ හෙයින් කියන ලදී. "නැවත ද... පරිනායක රුවන පහළවිය." එහි ඨපෙතබබං ඨපෙතුං යනු ඒ ඒ තනතුරෙහි තැබිය යුතුය. සමවෙපාකිනියා යනු සමානව වූ පැසීම් ඇති ගහණියා යනු කර්ම තෙජෝ ධාතුවෙන්. එහි යමෙකුට ආහාර ගත් වහාම දිරවයි. යමෙකුට වනාහි වළදෙහි බත් මෙන් එහිම පවතියි. මේ දෙදෙනා සමවෙපාකිනියා නොවේ. යමෙකුට වනාහි ආහාර වෙලාවෙහි ආහාර රුචිය ඇතිවේද හේ සමවේපාකිනියෙන් යුක්ත වේ. මාපෙසි බො යනු නගරයෙහි අණබෙර පතුරා ජනයා රැස්කරවා මැවීමක් නොවේ. රජතුමාගේ සිතිවිල්ල සමග පොළොව බිඳගෙන පොකුණු අසූහාර දහසක් පහළ විය. මෙය එය සඳහා කියන ලදී. දවිහි වෙදිකාහි යනු එකක් ගඩොල් අවසානයෙහි වටකරන ලදී. එකක් කාමරය වෙන්කරන ස්ථානෙයෙහි. එතදහොසි යනු කුමක් නිසා වූයේද ? එක් දවසක් වනාහි ස්නානය කොට පැන් බී ගමන් කරන මහජනයා මහා පුරුෂයා බලා මොවුහු උමතුවෙසින් යති. ඉදින් මෙහි පළදින්නාවූ මල් වේ නම් යහපත් වන්නේය. ඉක්බිති ඔහුට මෙය විය. එහි සබ්බොතුකං යනු මලකි. එක්සෘතුවකටම පිපේ. සැම සාතුවකම පිපෙන සේ සලස්සමි යනුයි. රොපාපෙසි නා නා වර්ණ උපුල් බීජාදිය ඒ ඒ තැනින් ගෙන්වාගෙන රෝපනය කෙළේ නොවේ. ඒ සිතත් සමගම ඒ සියල්ල ඉටුවිය. ලෝකයා එය රජු රෝපනය කරන ලදයි සිතති. එයින් කියන ලදී. "රෝපනය කරවීය" යයි එතැන්පටන් මහජනයා නොයෙක් ආකාර දිය ගොඩ මල් පැළඳ නැකැත් කෙළි කෙළින්නාක් මෙන් යති. ඉක්බිති රජතුමා ජන සුවය ඊටත් වඩා එලවීමට කැමැත්තේ ''මම මේ පොකුණු ඉවුරෙහි'' යයි ආදි ජනයාට සැප සැලසීමට සිතා සියල්ල කළේය.

එහි නහාපෙසු අනෙකෙකුගේ ඇඟ උළයි. අනෙකෙකුගේ ඇඟ

සබන්ගායි. ඉවුරේ නාන කෙනෙකුට අනෙකෙක් දිය ගෙන දෙයි. අනිකෙක් වස්ත්‍ර පිළිගනී. දෙයි. පටය්පෙසි බො කෙසේ තැබීද? සත්‍රීන්ට ද පුරුෂයන්ටද සුදුසු අලංකාර කරවා එහි සත්‍රීන්ට පමණක් සේවය වශයෙන් ද සෙසු සියල්ල පරිත්‍යාග වශයෙන් තබා මහ සුදසුන් රජතුමා දන් දෙයි. එය වළඳන්නැයි බෙර පියවි කරවීය. මහජනයා පොකුණු තීරයට පැමිණ ස්නානය කොට ඇඳුම් මාරුකරගෙන නොයෙක් සුවඳ ගල්වා විසිතුරු මල් පැළඳ දාන සාලාවට ගොස් නොයෙක් ආකාර කැඳබත් කැවිලි ආදියෙහි ද අෂ්ටවිධ පාන වර්ගවලද යමෙක් යමක් කැමතිවේද හේ එය කා බී නොයෙක් වර්ණ සිනිඳු කොමු ආදි වස්ත්‍ර ඇඳ සම්පත් විඳ යමෙකුට ඒවා ඇත්නම් හැර යයි. යමෙකුට නැත්නම් ගෙන යයි. ඇත් අස් යානාවලින් යන්නෝද මදක් නැවතී අනවශ්‍ය දේ හැර අවශ්‍ය දේ රැගෙන යති. සත්රුවන් පළඳනා පැළඳ සම්පත් අනුභව කොට අනවශ්‍ය ඒවා හැර අවශ්‍ය ඒවා රැගෙන යති. ඒ දානය දෙන කල්හි දඹදිව වැස්සන්ගේ වෙනත් වැඩක් නැත. රජුගේ දානය ගනිමින් හැසිරෙති. ඉක්බිති බ්‍රාහ්මණ ගෘහපතියෝ සිතුහ. මේ රජතුමා මෙබඳු වූ දානයක් දෙන්නේ ද අපගෙන් සහල් ආදිය හෝ කිරි ආදිය හෝ දෙවයි කිසිවක් ගෙන්වා නොගනී. රජතුමා ගෙන්වා නොගනී යයි අප නිශ්ශබ්ද වී සිටීම සුදුසු නොවේ. ඔව්හු බොහෝ සම්පත් එකතු කොට රජුට පිරිනැමූහ. එහෙයින් "ඉක්බිති ආනන්ද, බ්‍රහ්මණ ගෘහපතියෝ" යයි කීහ. එවං සමචිනෙතසු කුමක් හෙයින් මෙසේ සිතුහුද? කිසිවෙකුගෙන් ටිකක් ගන්නා ලදී. කිසිවෙකුගෙන් ගොඩක් ගන්නා ලදී. ඒවායෙහි වෙනස්කම් දකින්නේ ඇස ඔබේ ගෙදරින් සුන්දර දෙයක් ගන්නා ලද්දේ ? මගේ ගෙදරින් එසේ නැත. ඔබේ ගෙයින් බොහෝ මගේ ගෙයින් එසේ නැත. මෙසේ කලහ ශබ්ද උපදින්නේය. ඒවා නූපදීවායි හේ මෙසේ සමව සිතීය. එහි ත්‍වං සමම එන්න යාළුවෙ. ධමමං නාම පාසාදං පහයට නමක් තියා අණ කෙළේය. විස්කම් වනාහි දේවයන් වහන්ස... පහය කොපමණ ලොකුවට විය යුතුදැයි විචාරා, දිගින් යොදුනයි පළලින් අඩ යොදුනයි. සියල්ල රුවනින්ම විය යුතුයයි කී කල්හි එසේ වේවායි සොඳුරු වචනයට පිළිවදන් දී එසේය මහරජ යයි රජු ලවා පිළිගෙන මැවීය. එහි එවං භද්දනෙතවාති බො ආනන්දය මෙසේ යහපත් යයි ආනන්ද කියා යන අර්ථයි.

කුණහීභාවෙන සමණ දහම් පිළිවෙත් කිරීමට අවකාස සලසමින් යයි සිතමින් නිශ්ශබ්දව ඉවසීය. සාරමයො සඳුන් අරටුමය. අභිහි වෙදිකාහි

මෙහි එක් වේදිකාවක් හිනිහිස විය. එකක්යට වෙන්කිරීම් මත්තෙහි ද දුදිකෙඛා අහොසි බැලීමට අපහසු. ප්‍රභා සම්පත්තියෙන් බැලීමට අපහසු යන අර්ථයයි. දෙවෙ-අහසෙහි- මුසති ගෙන යයි. එඥාපෙති නිසලව සිටීමට ඉඩ නොදේ විදෙධ - උබබිදෙධ මෙසය පහවීම දුරුවූ කල්හි මාපෙසි බො මම මෙතන පොකුණක් හදමි. ඔබලාගේ ගෙවල් කඩා දාන්න යයි නොකියා හොඳින් සිතීමත් සමගම එය සිදුවිය. තෙ සබබ කාමෙහි - සියල්ලන් විසින් ම බලාපොරොත්තුවන වසතුවලින්, ශ්‍රමණයෝ ශ්‍රමණ පිරිකරවලින් බමුණන් බමුණු පිරිකරින් සතුටුකරන ලදී.

පළමු බණවර නිමි.

සෙය්‍යථීදං - නිපාතයකි. "තසස කතමෙසං" එය කියද තුනයයි අර්ථයයි. මහිදධිකො සිත් ඉපදවීම වශයෙන් පොකුණු අසූහාර දහසක් නිපදවිය හැකි මහත් වූ සෘදධියෙන් යුක්ත වූ, මහානුභාවො - ඒවායේම අත්දකීම් ලබාගත යුතු මහත් බැවින් මහත් වූ ආනුභාවයෙන් යුක්ත වූ දානසස - සම්පත් පරිත්‍යාගයට. දමසස ආලවක සූත්‍රයෙහි පඤ්ඤාදම යයි ආවේය. මෙහි තමා දමනය කරන්නහු විසින් කරන ලද පොහොය කර්මයයි. සංයමසස සීලයාගේ මෙහි සිට පූර්ව යෝගය දත යුතුය.

රජතුමා වනාහි පෙර ගෘහපති කුලයෙහි උපන්නේ ය. එසමයෙහි කාශ්‍යප බුදුරදුන්ගේ සාසනය ධරමාන විය. එක් තෙර නමක් අරණෙහි වසයි. බෝසත් තමාගේ කර්මයෙන් අරණට පිවිස තෙරුන් දක එළඹ වැඳ තෙරුන්ගේ හිඳින තැන් සක්මන් කරන තැන් බලා ස්වාමීනි ආයුෂ්‍යයන් වහන්සේ මෙහි වසන්නේදැයි විචාළේය. ඔව් උපාසක යයි අසා මෙහි ආර්යන් වහන්සේට පන්සලක් කිරීම වටී යයි සිතා තමාගේ කටයුතු අතහැර ද්‍රව්‍ය සම්භාරය කැබලි කර පන්සලක් කර සෙවිලි කර භිත්ති මැටියෙන් ආලේපකර දොර යොදා කාෂ්ඨ ඇතිරියක් කර පරිභෝග කරන්නේද නොකරන්නේදැයි එකත්පසෙක හුන්නේය. තෙරුන් වහන්සේ ඇතුළු ගමින් වැඩ පන්සලට පිවිස කටු ඇතිරියෙහි වැඩ සිටියේය. උපාසක ද පැමිණවැඳ සවාමීන් වහන්ස පන්සල පහසුදැයි ඇසීය. හොඳයි පැවිද්දන්ට සරුප්වේ. සවාමීනී මෙහි වසන්නේද? උපාසක ඔව්. හේ ඉවසු ආකාරයෙන් වසන්නේ යයි දන නිතිපතා මාගේ ගෙට වඩිනු මැනවැයි දන්වා සවාමීනී මට එකවරයක් දෙනු මැනවයි ඉල්ලීය. උපාසක

CS Scanned with CamScanner

පැවිද්දෝ වර ඉක්ම වූහ. සවාමීනි යමක් කැපද යමක් නිවැරදිද එය උපාසකට කියන්න. ස්වාමීනි මිනිස්සු වසන තැන මඟුලෙහි හා අවමඟුලෙහි පැමිණීම බලාපොරොත්තු වෙති. නොපැමිණිවුන්ට කිපෙති. එහෙයින් අනිත් ආරාධිත තැනකට වැඩියත් මගේ ගෙදරට පැමිණ බත්කිස නිමවනු මැනවි. තෙරුන් වහන්සේ ඉවසූහ. හේ පන්සලෙහි කලාලයක් අතුරා ඇඳ පුටු තැබීය. පිට ඇන්ද ඉවත් කර පා පුවරුවක් තැබීය. පොකුණක් තැනී. සක්මනක් කොට වැලි ඉස්සේය. මුවන් පැමිණ බිත්තියේ ඇඟ අතුල්ලා මැටි හෙළනවා දක කටු වැටකින් පරික්ෂෙප කෙළේය. පොකුණට බැස දිය කළඹනවා දක වටේට තල්ගස් රෝපනය කෙළේය. මෙසේ ආවාසය නිමකොට තෙරුන්වහන්සේට තුන් සිවුරු, පිණ්ඩපාතය, ඖෂධ පරිභෝග භාජන, ආරකණටකය (කටු ඉවත් කරන ආයුධය) නිය ඡේදකය, ඉඳිකටු, සැරයටිය, පාවහන්. දිය කලය, ඡත්‍රය, දුම්කබල, පාත්‍රය, තලිය, පෙරහන් කඩය, දිය ඩබරාව යනාදි පැවිද්දන් පරිභෝග කරන සියල්ල දුන්නේය. තෙරුන් වහන්සේට බෝසත්තුමා නුදුන් පිරිකර නම් නොවීය. හේ සිල් රකින්නේ පෙහෙවස් සමාදන් වන්නේ දිවිතෙක් තෙරුන්ට උපස්ථාන කෙළේය. තෙර එහිම වසන්නේ රහත් බවට පැමිණ පිරිනිවන් පෑවේය. බෝසත්තුමාද දිවිතෙක් පින්කොට දෙව්ලොව ඉපිද එයින් චුතව මිනිස් ලොවට එන්නේ කුසාවතී රාජධානියෙහි ඉපිද මහා සුදස්න රජ වීය.

මෙසේ වැඩි ලොකු නැති - කළ පින යම් තැනෙක් හී
මහපල දෙන නිසා - කළයුතු පඬුවන් විසින්

මහාවියූහං රිදීමුවා මහ කුළුගෙයක්. එය පිවිසෙනු කැමතිව පැමිණියේය. එතතවතා කාමවිතකකා කාම සංකල්පනා ඔබ විසින් මෙයින් නැවැත්විය යුතුය. මෙයින් පසු අහුම් වේ. මෙය ධ්‍යානාගාර නම් වේ. ඔබ සමග වාසය කරන සථානයට ගොස් මෙසේ විතර්ක තුනම කුළුගෙවල් දෙකේදීම නැවැත්වීය. පඨමජ්ඣානං ආදියෙහි වෙනම කසිණ පරිකර්ම කෘත්‍ය නම් නැත. නීල කසිණයෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි නිල්මැණික් පීත කසිණයෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි රත්රන් ලෝහිත කසිණයෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි රතුමැණික් ඕදාත කසිණයෙන් ප්‍රයෝජනයක් ඇතිකල්හි රිදී බැලූ බැලූ තැන කසිණම පෙනේ. මෙතතා සහගතෙන ආදියෙහි යමක් කිවයුතු නම් ඒ සියල්ල විසුද්ධි මාර්ගයෙහි කියන ලදමය.

මෙසේ පෙළෙහි සතර දහැන් සතර අප්‍රමාන්‍ය නොකඩන ලදී. මහාපුරුෂයා වනාහි අෂ්ඨ සමාපත්ති පංච අභිඥා උපදවා අනුලෝම පටිලෝම ආදි තුදුස් ආකාරයෙන් සමාපත්තිවලට පිවිසෙන්නේ මී පිඩුවකට පැමිණි මී මැස්සකු මී රසයෙහි මෙන් සමාපත් සුවයෙන්ම යැපේ. කුසාවතී රාජධානි පමුඛානි - කුසාවතී රාජධානිය එහි නගර ප්‍රමුඛ සියල්ල ශ්‍රේෂ්ඨය යන අර්ථයයි. භත්තාභිහාරො ගෙනදිය යුතු බත් වේ. වර්ෂ ලක්‍ෂයක් යයි කුමක් හෙයින් මෙසේ සිතුවේද? ඔවුන්ගේ ශබ්දයෙන් කලකිරී සමාපත්ති ශබ්දය කටුකයයි කියන ලදී. එහෙයින් ශබ්දයෙන් කලකිරුණු මහා පුරුෂයා ඉක්බිති කුමක් හෙයින් මෙහි පැමිණෙන්නැයි නො කියයිද? දූත් රජතුමා නොබලා යයි නිබඳ වැටුම නොලබන්නේය. ඔවුන්ගේ එය නොසිඳුවයි නොකියයි. එතදහොසි කවදා මෙය වූයේද? රජුගේ කාලක්‍රියා දිනයෙහි. එකල වනාහි බොහෝ දෙවිවරු මෙසේ සිතූහ. රජතුමා අනාථව කලුරිය නොකෙරේවා. අන්තඃපුරයෙහි දූ පුතුන් පිරිවරා කළුරිය කෙරේවායි. ඉක්බිති දේවියට ආවේශව ඔවුන්ට මේ සිත ඉපදවූහ. තානි වත්ථානි කහ වනාහි සවභාවයෙන් රජුට මනාප වේ. එහෙයින් ඒවා පොරවන්නැයි කීය. එහිම දෙව් තිට්ඨා දේවිය, මේ ධ්‍යානාගාරයයි. ඔබ සමග වසන තැනක් නොවේ. මගේ ධ්‍යාන ඇල්ම විඳින තැනය. මෙහි ඇතුළුවෙන්න එපා. එතදහොසි ලෝකයේ සත්වයෝ නම් මරණාසන්නකාලයේ අතිශයින් බබළයි. එහෙත් ඒ රජතුමාගේ ප්‍රසන්න ඉන්‍ද්‍රිය සවභාව දක මෙය විය. එහෙයින් රජතුමා කලුරිය නොකළේය. ඔහුගේ කලුරිය කිරීම නොසිතන්නේ ගුණ සම්පත් කියා සිටින ආකාරය කරන්නෙමියි සිතා ඉමානි තෙ දෙවා ආදිය කීය. තත්ථ ඡන්දං ජනෙහි ප්‍රේමය උපදවන්න. ඇල්ම ඇතිකරන්න. ජීවිතෙ අපෙක්ඛ ජීවිතයෙහි ආශාව ආලය කරන්න යන අර්ථයයි.

එවං ඛො මං දෙවි - දේවයන් වහන්ස, අපි ස්ත්‍රියෝ වෙමු. පැවිද්දන්ගේ ආසන්න කථා නොදනිමු. මහරජතුමණි, කෙසේ කියම්ද ? රජ පැවිද්දෙකැයි සිතමින් දේවිය කී කල්හි දේවිය, මා එසේ නොසලකන්න යනාදිය කීය. ගරහිතා බුදු පසේබුදු රහත් අතිත් පණ්ඩිත බහුශ්‍රැතයින් විසින් ගරහන ලද. කුමන කරුණුද? අපේක්ෂා සහිතව කලුරිය කිරීමෙන් තමාගේ ගෙදරම යක්, බලු, එලු, ගොන්, මී හරක්, මී, මකුණු ආදි ආත්මභාවයන් ඇතිව උපදින කරුණු වේ. අථ ඛො ආනන්ද සුභද්දා දෙවි අස්සුනි පමජ්ජිත්වා දේවිය පැත්තකට ගොස් අඬා වැලපී කඳුලු පිසදමා මෙය කීවාය.

ගහපතිසසාවා කුමක්හෙයින් කීද? ඔවුන්ගේ සෝණ සිටුපුතා ආදීන් මෙන් මහත් සව්මත් වේ. සෝණ සිටුපුතාගේ වනාහි එක් බත් පිඟානක් දෙලක්‍ෂයක් අගී. මෙසේ ඔවුන්ගේ එබඳු බත් බුදීමෙන් මොහොතක් බත් මතය, බත් මූර්ඡාව, බත් කලාන්තය වේ. යං තෙන සමයෙන අජ්ඣාවසාමි යම් තැනක වසම්ද එය එක නගරයක් වේ. අවසේස නගරවල දූ පුත්තු මෙන්ම දාසයෝ ද විසූහ. ප්‍රාසාද කූටාගාරවලද මෙම පිළිවෙළමය. පලලංකවලද (ආසන) එකම ආසනයක් තමා පරිභෝගය කරයි. සෙසු ඒවා දූ පුත්තු පරිභෝග කරති. ස්ත්‍රීන් අතරෙහි ද එක්කෙනෙක් උවටැන් කරයි. සෙස්සෝ පිරිවර පමණක් වෙති. පරිදහාමි එකම පිළිසඟලක් පරිහරණය කරමි. සෙසු ඒවා පිරිවරා හැසිරෙන සොළොස් ලක්‍ෂ අසූදහසක් පුරුෂයන්ට වේ. භුඤ්ජාමි උඩත් පරිසෙයින් නැලියක් පමණ වළඳමි. සෙස්ස පිරිවරා හැසිරෙන අටලක්‍ෂ හතලිස් දහසක පුරුෂයන්ට වේ යයි දක්වයි. එක් තලියක පිසීම ජනයින් දස දෙනෙකුට ප්‍රමාණවත් වේ. නගර හාරදහසක් ද ප්‍රාසාද දහසක්ද කුළුගෙවල් දහසක් ද එකම පන්සලක් කළ පිනෙන් පහළවිය. අසූහාර දහසක් ආසන (පලලංක) නිදාගැනීමට දුන් ඇඳේ පිනින් පහළවිය. අසූහාර දහසක් ඇතුන්, අසුන්, රථ හිඳ ගැනීමට දුන් ආසනයේ පිනින් පහළවිය. අසූහාර දහසක් පොකුණු එක් පොකුණක පිනින් පහළවිය. අසූහාර. දහසක් සත්‍රීන්, පුතුන්, ගෘහපතියන්. පරිභෝග භාජන, පාත්‍රය, තලිය, දිය ඩබරාව, පෙරහන්කඩය, ආරකණ්ටකය, කතුර, නියහරනය, යතුර, කන්මල හරනය, පා පුටුව, වහන් සඟල, කුඩය, හැරමිටිය යන මේවා දීමේ පිනෙන් පහළවිය. අසූහාර දහසක් වස්ත්‍ර හඳින පොරෝනා දීමේ පිනෙන් පහළ විය. අසූහාර දහසක් බත්තලි භෝජන දානයේ පිනින් පහළවියයි දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මහා සුදස්සන රජතුමාගේ සම්පත් මුලසිට විස්තර වශයෙන් කියා ඒ සියල්ල ලමයිනගේ වැලිකෙළියක මෙන් දක්වමින් පිරිනිවන් මඤ්චකයේ සැතපුනේම "ආනන්ද බලන්න" යයි ආදිය කීහ.

තත්‍ථ විපරිනතා - ප්‍රකෘතිය අත්හැරීමෙන් නිවුණු පහනක් මෙන් නොපැණවූ බවට ගියේය. එවං අනිච්චා ඛො ආනන්‍ද සංඛාරා මෙසේ ඇතිවී අභාවාර්ථයෙන් අනිත්‍ය වේ. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ. යම්සේ යම් පුරුෂයෙක් සත් රියනක උස සපුගසකට ඉනිමගක් බැඳ නැඟී සපුමල් ගෙන ඉනිමග මුදමින් බසින්නේය. මෙසේ ඉනිමග බඳින්නක් මෙන් නොයෙක් වර්ෂ කෝටි ලක්‍ෂයක් උස මහා සුදර්ශන සම්පත්තියට

නැග සම්පත් මතුවෙහි සිට අනිත්‍ය ලක්‍ෂණය ගෙන ඉණිමග මුදන්නාක් මෙන් බැස්සේය. එයින්ම පෙර වසභ රජතුමා ලෝහ ප්‍රාසාදයේ නැගෙනහිර පැත්තේ අඹතුරු සෙවනෙහි දීඝභාණක තෙරවරුන් මේ සූත්‍රය සජ්ඣායනය කරනු අසා පින්වත්නි කිම ? මාගේ ආර්යන් වහන්සේ විසින් මෙහි කියන ලද තමාගේ කැබී තැන සම්පත්ම කියා යයි සිතන්නේ, ආනන්ද, සංසාර අනිත්‍ය'' යයි කී කල්හි පසැසින් බුදුහිමි මෙය දැක මෙසේ දෙසන ලදැයි වමත හකුළුවා දකුණතින් අත්පොළසන් දී සාධු සාධු යයි සතුටු සිතින් සාධුකාර දුන්නේය.

එවං අද්ධුවා මෙසේ දිය බුබුළු ආදිය මෙන් සපීරබවක් නැත. අනසසාසිකා මෙසේ හීනෙන් බීපු පානයක් මෙන් ආලේපිත සඳුන් මෙන්ද ආශ්වාද රහිතය. සරීරං නිකඛිපෙය්‍ය ශරීරය අත්හරින්නේය. දූන් අනිකෙකුගේ ශරීරයේ අත්හැරීමක් හෝ පිළිදැගුම් කිරීමක් හෝ නැත. ආනන්දය කථාගතයන් ගේ කෙලෙස් ප්‍රහීන හෙයින් යයි කියති. මෙය වදාරා නැවත තෙරුන් ඇමතුහ. සක්විතිහුගේ ආනුභාවය රජු පැවිදිවීමෙන් සත්වන දවසෙහි අතුරුදහන් වේ. මහා සුදර්ශනගේ වනාහි කලුරිය කිරීමෙන් සත්වන දවසෙහි සත්රුවන් පවුරු සත්රුවන් තල්පන්ති අසූහාර දහසක් පොකුණු, ධර්මප්‍රාසාදය, දහම් පොකුණ සක්රුවන යන මේ සියල්ල අතුරුදහන් වේ. ඇතුන් ආදියෙහිද මේ ධර්මතාව ආයුෂ ක්ෂීණ වූවෝ ඒ සමගම කලුරිය කරති. ආයුෂ ඉතිරි ඇත්රුවන උපොෂථ කුලයට යයි. අස්රුවන වලාහක කුලයට යයි. මිණිරුවන වේපුල්ල පර්වතයටම යයි. සත්‍රීරත්නය ඔහුගේ අනුභාවයෙන් අතුරුදහන් වෙයි. ගෘහපති රත්නයේ ඇස් ස්වාභාවිකවම වේ. පරිණායක රත්නයේ ව්‍යකතභාවය නැසෙන්නේය. ඉදමවොච භගවා මෙය පෙළෙහි ඇතුළත්වද නැතුවද සියල්ල භාග්‍යවතුන් වහන්සේ දෙසූහ. සෙස්ස පැහැදිලි වේමය.

මහා සුදසසන සූත්‍ර වර්ණනාව නිමි.

# 2-18
## ජනවසභ සූත්‍ර වර්ණනාව

**එවං මෙ සුතං** ජනවසභ සූත්‍රය, එහි මේ ගැඹුරු පද වර්ණනාවයි. **පරිතො පරිතො ජනපදෙසු** - ජනපදවල හාත්පසම, පරිචාරකෙ බුද්ධ ධම්ම සංඝ තෙරුවන් පුදන නමදින උවසුවන්. **උපපත්තීසු** ඤාණ, ගති පින් උප්පත්තිවල **කාසිකොසලෙසු** කාසි රටෙහි ද කෝසලයෙහි ද, කසී කොසොල් රටවල යන අර්ථයයි. **සියළුතන්හි** මෙම පිළිවෙළයි. අංග, මගධ, යෝනක, කම්බෝජ, අස්සක, අවන්ති යන රටවල් සයෙහි මියගිය පුද්ගලයන් ඉපදුණු සථාන ප්‍රකාශ නොකරන ලදී. මේ සොලොස් ජනපදවලින් කාසි කොසලාදී දහයේ පමණක් ප්‍රකාශ කරන ලදී. **නාදිකියා** නාදික ගම්වාසීහු, **තෙන** - ඒ අනාගාමී ආදී භාවයෙන්, **සුත්වා** - සර්වඥතාඥානයෙන් පිරිසිඳ විස්තර කරන භාග්‍යවතුන් වහන්සේගේ පැණ විසඳුම් අසා අනාගාමී ආදියෙහි අවසානයට ගිය. ඒ අනාගාමී ආදි ස්වභාවයෙන් සතුටු වූහ.

අටුවාවෙහි වනාහි තෙ නාති ඔවුහු නාදිකියා යයි කියන ලදී. මේ අර්ථයෙහි න කාරය නිපාත මාත්‍රයක් වේ. **භගවනතං කිත්තයමාන රූපො** - බුදුරදුන්ට ප්‍රශංසා වේවා. ධර්මයට සංඝයාට ප්‍රශංසා වේවා. ධර්මය පැහැදිලිව දේශනා කිරීමට ප්‍රශංසා වේවා. මෙසේ ගුණ වර්ණනා කරමින් ම කලුරිය කෙළේය. **බහුජනො පසීදෙය්‍ය**- අපගේ පියා-මව-සහෝදරයා-සහෝදරී-පුතා-දූව-යහළුවා ඔවුහු අප සමග එකට නිදාගත්හ. ඒ ඒ ප්‍රියමනාප දේ කළහ. දූත් වනාහි අනාගාමී සකෘදාගාමී සෝවාන් අනේ සාධු. ඉතා හොඳයි. මෙසේ බොහෝ ජනයා ප්‍රසාදයට පැමිණෙන්නේය. **ගති** ඤාණ ගතියෙහි **අභිසම්පරාය** - ඤාණය ලැබීම්ම. **අද්දසා බො** - ගුණ කියන ජනයින් දුක්කේද? සූවිසි ලක්‍ෂයක්. **උපසනතපදිසෙසා** - උපශාන්ත දර්ශනය. භාතිරිවා වඩාත් බබළයි. වඩාත් දිලෙයි. **ඉන්‍ද්‍රියානං** - මනස හවෙනි කොට ඇති ඉන්ද්‍රියයන්. **අද්දසං බො අහං ආනන්ද** දහසක් නොව විස්සක් නොව සියයක් නොව දාහක් නොව අඩුවැඩි නැති සූවිසි ලක්‍ෂයක් දුක්කෙමි යි කීහ. දූක, මෙපමණ ජනයා මා නිසා දුකින් මිදුනේ යයි බලවත් සතුටක් ඇතිවිය. සිත පහන් විය. සිතේ පහන් බව නිසා සිත ආශ්‍රිත රුධිරය පහන් විය. රුධිරය ප්‍රසන්නවීමෙන් මනස සවැනි කොට ඇති ඉන්‍ද්‍රියයන් ප්‍රසන්න විය. මේ සියල්ල වදාරා නැවත

ආනන්ද යනාදිය කීහ. එහි හේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම කථාව අසා දස දහසක් ලක්‍ෂයකට ජ්‍යේෂ්ඨ වී සෝවාන් විය. එහෙයින් ඔහුට ජනවසභ නම ඇතිවිය. **ඉතො සත්තා** - මේ දෙව්ලොවින් චුතව හතක්. **තතො සත්තා** - මිනිස් ලොවින් චුතව සතක්. **සංසාරානි චතුද්දසා** - සියළු දාහතර කඳ පිළිවෙළ. **නිවාසමභිජානාමි** - ජාති වශයෙන් නිවාස දනිමි. **යත්ථ මෙ වුසිතං පුරෙ** - වෙසමුණිගේ සමාගමට පැමිණීමෙන් දෙවියන් කෙරෙහි ද රජබවට පැමිණීමෙන් මිනිසුන් කෙරෙහි ද මේ ආත්මභාවයෙන් පෙර මවිසින් වාසය කරන ලදි. පෙර මෙසේ වසන ලද බැවින් ද දූන් සෝවාන් වී ත්‍රිවිධ රත්නයෙහි බොහෝ පින්කම් කොට එහි අනුභාවයෙන් ඉහළ ඉපදීමට හැකි වූවත් බොහෝ කලක් විසූතැන ආශාව බලවත් බැවින් මෙහිම ඉපදුනේය. **ආසා ච පනමෙ සන්තිට්ඨති** - මම මෙයින් සෝවාන් වීමියි නිදාගැනීමටවත් ප්‍රමාද නොවී කාලය ගත කෙළෙමි. සකෘදාගාමි මාර්ගය සඳහා මගේ විදර්ශනාව අරඹන ලදි. අද අදම අවබෝධ කරන්නෙමියි මෙසේ උත්සාහයෙන් වාසය කරමියි දක්වයි. **යදග්ගෙ** වැල්මී වනයෙහි පළමු දර්ශනයෙහි සෝවාන් වූ දවස සඳහා කියයි. **තදග්ගෙ අහං භන්තෙ දීඝ රත්තං අවිනිපාතො අවිනිපාතං සඤ්ජානාමි** ඒ දවස ආදිකොට ස්වාමීනි මම පෙර තුදුස් ආත්මභාව සංඛ්‍යාත දීර්ඝ කාලයක් අපායට නොවැටුණේ වැල්මී වනයෙහි සෝවාන් මාර්ග වශයෙන් අවබෝධ කළ අපායට නොවැටෙන ස්වභාවය දනිමියි යන අර්ථයයි. **අනච්ඡරියං** - අනු අසිරිය සිතමින් නැවත නැවත මෙය අසිරිය වේ. කිසියම් කාර්යකට යන්නේ භාග්‍යවතුන් වහනසේ අතරමග දුටුවෙමි. මෙය ද අසිරියකි. වෙසමුණි මහරජහුගේ පිරිසෙන් අනුසාසනා ලබන්නේ භාග්‍යවතුන් වහන්සේ දූක්කා හා සමානව අබිමුවෙහි දී අසන ලදී. **අතරමග දෙව පච්චයා** - දුටුබවද වෙසමුණි රජුගේ හමුවෙහි අසනලද බව දන්වනු කැමති බවද, **සන්නිපතිතා** කුමක් සඳහා රැස්වූවෝද? ඔවුහු වනාහි කරුණු සතරකින් රැස්වන්නාහුය. වස් විසීම් සංග්‍රහය සඳහා, වස්පවාරණ සංග්‍රහය සඳහා, ධර්මශ්‍රවණය සඳහා සහ පරසතු ක්‍රීඩාව සඳහා, එහි හෙට වස් එළඹීම යයි ඇසළ පුණු පොහෝදින දෙව්ලොව දෙකෙහිම දෙවියෝ සුධර්මා දිව්‍ය සභාවේ රැස්වී සාකච්ඡා කරති. අසවල් විහාරයෙහි එක් භික්ෂුවක් වස් එළඹියේය. අසවල් විහාරයෙහි දෙදෙනෙකි. තුනක්, හතරක්, පහක්, දහයක්, විස්සක්, තිහක්, හතලිහක් පනසක්, සීයක්, දාහක් භික්ෂූහු වස් එළඹියහ. මේ මේ තැන්වල ආර්යන් වහන්සේ ගේ, ආරක්ෂාව සංවිධානය කරන්න. මෙසේ වස් එළඹීමේ සංග්‍රහය කියන ලද්දේ වේ. එදාද මේ කාරණයෙන් ම රැස් වූහ. **ඉදං තෙසං හොති**

Scanned with CamScanner

**ආසනසම්ං** - මේ ඒ සිව්මහ රජුන්ට ආසනය වේ. මෙසේ ඔව්හු හිඳගත් පසු අපට පසුපස ආසනය වේ. **යෙනත්‍ථෙන** - යම් වස් එළඹීම් අර්ථයෙන්. **තං අත්‍ථං චින්තයිත්‍වා තං අත්‍ථං මන්තයිත්‍වා** - ආරණ්‍යයන්හි භික්ෂු සංඝයාගේ ආරක්ෂාව සිතා මේ මේ තැන්වල භික්ෂු සංඝයාගේ ආරක්ෂාව මනාව සංවිධානය කරන්න යයි සිව්මහ රජුන් සමග සාකච්ඡා කර, **වුත්‍තා වචනාපි තං** - දෙව්පුත්වරු තිස්තුන් දෙනා කියති. මහරජවරුන්ගේ කියන ලද වචනය නම්, දෙව්පුත් තිස්තුන් දෙනා එසේ පසුව අනුසාසනා කරති. **සෙස්ස** පසුව අනුසාසනා කළ වචන නම්. පද දෙකෙහිම "න" යන්න නිපාතයකි. **අව්පකකන්තා** - ආවාවූ. **උළාරො**-මහා, විපුල. **දෙවානුභවං** - යම් ඒ සියළු දෙවිවරුන්ගේ වස්ත්‍ර අලංකාර විමාන, ශරීරවල ආලෝකය දොළොස් යොදුනක් පැතිරේ. මහපිනැතියන් පෙර ශරීරාලෝකය යොදුන් සියයක් පැතිරේ. ඒ දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවමිනි. **බ්‍රහමුනොහෙතං පුබබනිමිත්තං** - අරුණළු හිරුගේ උදාවීමේ පෙරටුව එයි. මෙය පූර්ව නිමිත්තකි. එසේම මෙය ද පූර්ව නිමිත්තැයි දක්වයි. **අනභිසමභවනීයො** නොපැමිණිය යුතු. එය තව්තිසා දෙවියෝ නොදත් යන අර්ථයයි. **චකඛුපථසම්ං** - චක්ෂුප්‍රසාදයට ආපාථගත වූ හෝ, හේ දෙවියන්ගේ ඇස් හමුවට පැමිණිය නොහැකිය. පහළ නොවේය යනු අර්ථයයි. **යං යං** දෙවිවරු ඉහළ ඉහළ දෙවියන්ගේ ඕලාරික කොට මවන ලදබැවින් දැකීමට හැකිවෙති. **වෙදපටිලාභං** - සන්තෝෂ ප්‍රතිලාභය. **අධුනාභිසිත්තො රජ්ජෙන** - දැන් අභිෂේක කරන ලද රාජ්‍යයෙන්. මේ අර්ථය සඳහා දුටුගැමුණු ආවේය. වසතුව දැක්විය යුතුය. හේ වනාහි දෙතිස් දෙමළ රජුන් දිනා අනුරපුරයෙහි ලබන ලද අභිෂේකයෙන් ලැබූ සොම්නසින් මාසයක් නින්ද නොලැබීය. ඉන්පසු නින්ද නොලබමියි භික්ෂු සංඝයා වහන්සේට දැන්විය. එසේ නම් මහරජතුමණි, අද උදේම පෙහෙවස් අධිෂ්ඨාන කරන්න. හේ පෙහෙවෙස් සමාදන් විය. සංඝයා ගොස් චිත්ත යමකය සජ්ඣායනා කරන්න යයි ආභිධර්මික භික්ෂූන් අටනමක් යැවීය. උන්වහන්සේලා වැඩමවා මහරජතුමණි. ඔබ නිදාගන්න යයි කියා සජ්ඣායනය ආරම්භ කළහ. රජතුමා සජ්ඣායනය අසමින්ම නින්දට වැටුණේය. උන්වහන්සේලා රජ්ජුරුවන් අවදිකරන්න එපා කියමින් වැඩියහ. රජතුමා දෙවන දිනයෙහි ඉර උදාවනවිට පිබිදී තෙරුන් නොදක ආර්යන් වහන්සේලා කොහේදැයි ඇසීය. ඔබවහන්සේ නින්දට වැටුණුබව දැන වැඩියහයි කීවේය. පින්වත්නි, මගේ ආර්යන් වහන්සේලා නොදන්නා බෙහෙතක් නම් නැත. නින්ද යැමටත් බෙහෙත් දන්නේම යයි කීය. **පංචසිඛෝ** - පංචසිඛ ගාන්ධර්වයන් සමානව. පංචසිඛ ගාන්ධර්ව

දිව්‍ය පුත්‍රයාට සියළු දෙවියෝම ප්‍රිය කරති. ඒ නිසා බ්‍රහ්මයා ද එබඳු ආත්මභාවයක් මවාගෙන පහළ විය. **පලලංකෙ නිසීදි** - ආසනයෙහි නැමී හිඳගත්තේය. **විසසටෙඨා** - මුදාහරින ලද්දේ, පීඩා රහිත. **විඤෙඤයො** - අර්ථය දන්වන්නා. **මංජු** - මිහිරි, මෘදු. **සවණීයො** - ඇසිය යුතු, කනට සැප ඇති. **බින්දු** - ඒකඝනවූ. **අවිසාරි** - නොවිසිරුණු, නො පැතුරුණු. **ගම්භීරො** - නාභියේ මුල සිට ගැඹුරෙන් හටගත්. දිව දත් තොල් තල්ල පමණ හටගත්. මෙසේ හටගත්විට මිහිරි නොවේ. දුරට නොඇසේ. **නිනනාදී** - මහාමෙඝ, (ගෙරවිලි හඬ) බෙර ශබ්ද මෙන් නින්නාදයෙන් යුක්ත. මෙහි පසු පස පද පෙර පදවල අර්ථයම බව දත යුතුය.

**යථා පරිසං** - සිටිනතාක් පිරිසට දන්වයි. ශබ්දය ඇතුළත පිරිසට ඇසෙයි. පිටතට නො ඇසෙයි. යෙහි කෙහි ච ආදිය බොහෝ දෙනාට හිතවත් බවට පිළිපන් බව දැක්වීමට කියයි. **සරණංගතා** යම් ඒ මේ සරණ යෑමක් ගැන නො කියයි. සැකරහිත අය ගත් සරණ ගැන කියයි. **ගනධබබකා යං පරිපුරෙනති** ගාන්ධර්ව දේවාංගනය පරිපූර්ණය වේ. මෙසේ අපගේ ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ තැන් පටන් සදෙව්ලොව පිටිකොටා පුරවන නැලි මෙන් බටවන විල්වන මෙන්ද නිතරම ඉපදෙන පිරිස විය. **යාව සුපඤඤතතා** මෙ තෙන භගවතා එහෙයින් මාගේ.ශාසතෘවූ භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තාක් හොඳින් පිණවන ලදද හොඳින් කියන ලදී. **ඉදධිපාද** මෙහි වැඩි දියුණුවීම් අර්ථයෙන් ඉදධි නම් වේ. පිහිටීම් අර්ථයෙන් පාද යයි දතයුතුය.

**ඉදධිපහුතාය** ඍද්ධි ප්‍රමාණවත්වීම සඳහා, **ඉදධිවිසවිතාය** ඍද්ධි වසීවන බැවින්, නැවත නැවත සේවනය කිරීම් වශයෙන් පුරුදු කරන ලද වසීභාවය කියන ලදී. **ඉදධිවිකුබබනතාය** ඍද්ධි විකුර්වනයට නොයෙක් ආකාරයෙන් දැක්වීම සඳහා, **ඡන්‍ද සමාධි පධාන සංඛාර සමනනාගතං** ආදියෙහි ඡන්‍ද හේතුවෙන් ඡන්‍ද ප්‍රධානවීමෙන් හෝ සමාධිය ඡන්‍ද සමාධි නම් වේ. කරනු කැමති ඡන්‍දය අධිපති කොට ලැබූ සමාධියට වෙනත් වචනයකි. ප්‍රධාන වූ සංස්කාර පධාන සංඛාර වේ. සිව්කිස සාදාදෙන සම්‍යක ප්‍රධාන වීර්යට මෙය අධිවචනයකි. සමනනාගතං ඡන්‍ද සමාධියෙන් ද ප්‍රධාන සංස්කාරවලින් ද යුක්ත වූ, ඉදධිපාදං නිෂ්පත්ති පර්යායෙන් හෝ සමෘද්ධි අර්ථයෙන් හෝ සත්වයෝ මෙයින් දියුණු කරත් යයි වැඩි වූ බොහෝ වූ උසස් බවට ගියා වේ යයි මේ ක්‍රමයෙන් හෝ ඍද්ධි යන සංඛ්‍යාවට ගිය අභිඥා සිතින් යුක්ත ඡන්‍ද සමාධි ප්‍රධාන සංස්කාරවල

Scanned with CamScanner

අධිෂ්ඨාන අර්ථයෙන් පදනම් වූ සෙසු චිත්ත චෛතසික රාශිය යන අර්ථයයි. මෙය කියන ලද්දේමය "ඉද්ධිපාද යයි එබඳු වූ වේදනාස්කන්ධය... විඤ්ඤාණ ස්කන්ධ" යයි. මෙම නයින් සෙස්සෙහි ද අර්ථය දතයුතුයි. යම්සේ ඡන්දය අධිපති කොට ලැබූ සමාධිය ඡන්ද සමාධියයි කියන ලදී. මෙසේ විරිය, චිත්ත, විමංස අධිපති කොට ලැබූ සමාධි විරිය විමංස සමාධියයි කියනු ලැබේ. තවද උපචාර ධ්‍යානවලට පාදක වූ ප්‍රථම ධ්‍යානවල සෘද්ධිය උපචාර සහිත ප්‍රථම ධ්‍යාන පාදක වූ ද්විතීය ධ්‍යාන සෘද්ධිය යයි මෙහි අර්ථය මෙසේය යි දත යුතුය. ඉද්ධිපාද කථා විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි ද විභංගට්ඨ කථාවෙහි ද කියන ලදී. නිෂ්පන්න සෘද්ධි අනිෂ්පන්න සෘද්ධියයි කිසිවෙක් කියති. ඔවුන්ගේ වාදමථනය සඳහා අභිධර්මයෙහි උත්තර මූලක වාරයෙහි "සතර සෘද්ධි පාද ඡන්ද ඉද්ධිපාද, විරිය ඉද්ධිපාද, චිත්ත ඉද්ධිපාද, විමංස ඉද්ධිපාද යයි ආවේය. එහි ඡන්ද ඉද්ධිපාදය කෙසේද? මෙහි භික්ෂුව යම් අවස්ථාවක ලෝකොත්තර ධර්මවිනය වඩා ද නෛර්‍යානික වූ අපචයගාමී වූ දෘෂ්ටීන් පහකිරීම සඳහා පළමුවන භූමියට පැමිණීම සඳහා කාමයන්ගෙන් වෙන්ව... ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. දුකසේ ප්‍රතිපදාවෙන් දුෂ්කර වූ අභිඥාවෙන්. එසමයෙහි ඡන්දය ඡන්දයට අයත් කුසල් කරනු කැමති ධර්ම ඡන්දය ඡන්දඉද්ධි පාදය යයි කියනු ලැබේ. සෙසු ධර්ම ඡන්ද ඉද්ධිපාදය සමග සම්බන්ධ වේ. මෙය වනාහි ලෝකෝත්තර වශයෙන් ආවේය. එහි රට්ඨපාල තෙර ඡන්දය ධුරකොට ලෝකෝත්තර ධර්ම ඉපදවීය. සෝණ තෙර විරිය ධුරකොට සම්භූත තෙර සිත ධුර කොට මෝඝරාජ තෙර වීමංසාව ධුර කොට ද ලෝකෝත්තර දහම් නිපදවූහ.

එහි යම්සේ තනතුරු බලාපොරොත්තුවෙන් රජෙකු ඇසුරුකොට වෙසෙන ඇමති පුතුන් සතරදෙනාගෙන් එක් කෙනක් උපස්ථානයෙහි කැමැත්ත ඇති වී රජතුමාගේ අදහස ද රුචිය ද දැනගෙන දිවා රෑ උපස්ථාන කරන්නේ රජු සතුටුකොට තනතුරට පැමිණියේය. මෙසේ හේ ඡන්ද ධුරයෙන් ලොව්තුරු දහම් නිපදවී යයි දත යුතුය. තව කෙනෙක් දිනපතා උපස්ථාන කරන්ට කාට පුළුවන්ද කියා කාර්යයන් පැමිණිවිට පරාක්‍රමයෙන් සතුටු කරමියි සිතී. ප්‍රත්‍යන්තය කුපිත වූ විට රජු විසින් යවනු ලැබූයේ පරාක්‍රමයෙන් සතුරන් මර්ධනය කොට තනතුරට පැමිණියේය. යම්සේ හේ වීර්ය ධුරයෙන් ලොවුතුරා දහම් නිපදවී යයි දත යුතුය. තව කෙනෙක් දිනපතා උපස්ථානය ද බාහු බලයෙන් සැත් ඒ වැලකීම ද දුෂ්කර යයි සිතා මන්ත්‍ර බලයෙන් සතුටු කරමියි රාජ්‍ය

පාලනයෙහි කරන ලද පුහුණුව ඇත්තේ මන්ත්‍ර සංවිධානයෙන් තනතුර ලැබිය. මෙසේ හේ චිත්ත ධූරයෙන් ලොවුතුරා දහම් නිපදවී යයි දත යුතුය. අනික් තැනැත්තා මේ උපස්ථාන ආදියෙන් කිම? රජවරු ජාති සම්පන්නයාට තනතුරු දෙති. එබඳු කෙනෙකුට දෙනවිට මට දෙන්නේ යයි ජාතිසම්පන්න බව නිසාම තනතුරට පැමිණියේය. යම්සේ හේ මෙසේ සුපිරිසුදු වූ වීමංසය නිසා වීමංස ධූරයෙන් ලොවුතුරු දහම් නිපදවී යයි දත යුතුය.

අනෙක විහිතං - අනේක විධ වූ. ඉද්ධිවිධං - සෘද්ධි කොට්ඨාශ. සුඛසසාධිගමාය - ධ්‍යාන, මාර්ග හා ඵල සුවය සඳහා අවබෝධ කිරීමට, සංසට්ඨො - සම්ප්‍රයුක්ත සිත. අරිය ධම්මං - ආර්ය වූ භාග්‍යවත් වූ බුදුරදුන් විසින් දේශනා කරනලද ධර්මය. සුණාති - ශාස්තෲන් වහන්සේ නමින් භික්‍ෂු භික්‍ෂුණීන් ආදීන් හෝ දේශනා කරනු ලබන්නේ අසයි. යොනිසො මනසිකාරො - උපායෙන් මාර්ගයෙන් හේතුවෙන් අනිත්‍යයයි ආදි වශයෙන් මෙනෙහි කරයි. යොනිසො මනසිකාර නම් උපායෙන් මෙනෙහි කිරීම, මාර්ගයෙන් මෙනෙහි කිරීම අනිත්‍යයෙහි අනිත්‍යයයි ද දුකෙහි දුක්යයි ද අනාත්මයෙහි අනාත්මයයි ද අසුභයෙහි අසුභයයි ද සත්‍යානුලෝම වශයෙන් හෝ සිත වසඟකර ගැනීම, සිතා බැලීම. එකඟකර ගැනීම මෙනෙහි කිරීම යන මෙය. යොනිසො මනසිකාරය යයි කියනු ලැබේ. මෙසේ කීකල්හි යොනිසො මනසිකාරයෙහි ක්‍රියා ආරම්භ කෙරේ යන අර්ථයයි. අසංසට්ඨො වස්තුකාමයෙන් හා ක්ලේශකාමයෙන් යුක්ත නොවී වාසය කරයි. උප්පජ්ජති සුඛං ප්‍රථම ධ්‍යාන සුවය උපදී. සුඛාභියෙය්‍යා සොමනස්සං සමාපත්තියෙන් නැගිටි තැනැත්තාට ධ්‍යාන සුව හේතුවෙන් පසුව සොම්නස ඇතිවේ. මුදා - සන්තෝෂයේ ආකාරයෙන් ලැබෙන දුර්ලභ ප්‍රීතියකි. පාමොජ්ජං ඉතාමත් බලවත් ප්‍රීති සොම්නස. පඨමො ඔකාසාධිගමො පළමුවන ධ්‍යානය පංච නීවරණ යටපත්කොට තමාට ඉඩ ලබා ගැනීම. ඔළාරිකා මෙහි කාය වචී සංස්කාර පළමුව ඖළාරික වේ. චිත්ත සංඛාර කෙසේ ඖළාරික වේද? ප්‍රහීන නොකළ බැවිනි. කාය සංඛාර හතරවන ධ්‍යානයෙන් ප්‍රහීන වේ. වචී සංඛාර දෙවන ධ්‍යානයෙන්. චිත්ත සංඛාර නිරෝධ සමාපත්තියෙන්. මෙසේ කාය වචී චිත්ත සංඛාර ප්‍රහීන වූ කල්හි ද ඒවා සිටී. ප්‍රහීන වූවද දැඩි සේ ගැනීම අප්‍රහීන බැවින් ඖළාරික බව ඇතිවිය. සුඛං නිරෝධ සමාපත්තියෙන් නැගිටින තැනැත්තාට උපදින සතරවන ධ්‍යාන ඵල සමාපත්ති සුවය. සුඛා භියෙය්‍යා සොමනස්සං ඵල සමාපත්තියෙන් නැගිටි යෝගාවචරයාට පසුව ඇතිවන සොම්නස.

දුතියො ඔකාසාධිගමො සතරවන ධ්‍යානය සැප දුක් යටපත් කොට තමනට අවකාශ ගෙන සිටියි. මෙහි දෙවන තුන්වන ධ්‍යාන සතරවන ධ්‍යානය ගත් කල්හි එහි ඇතුළත්වන බැවින් වෙන්කොට නොකියන ලදී.

ඉදං කුසලං ආදියෙහි කුසල නම් දසකුසල කර්ම පථයයි. අකුසලං දස අකුසල කර්ම පථයයි. සාවද්‍ය දුකාදිය ද මේවායේ වශයෙන්ම දැනගත යුතුය. මේ සියල්ලම කලු ද සුදු ද සමාන නිසා කණ්හ සුක්ක පටිභාග වේ. එසේම මීට අසමාන වන්නේ නිවන පමණකි. අවිජ්ජා පහීයති විද්‍යාව මුවා කරන අවිද්‍යාව ප්‍රහීන වේ. විජ්ජා රහත් මාර්ගයෙන් විද්‍යාව උපදී. සුඛං අර්හත් මාර්ග සැපය මෙන්ම ඵල සැපයද, සුඛා භීයොභා සොමනස්සං ඵල සමාපත්තියෙන් නැගී සිටින්නාට පසුව ඇතිවන සොම්නස. තතියො ඔකාසාධිගමො රහත් මගින් සියළු කෙලෙස් විෂ්කම්භනය කොට තමාට අවකාශ ලබාගෙන සිටියි. එහෙයින් තතිය ඔකාසාධිගම යයි කියන ලදී. සෙසු මාර්ග වනාහි රහත් මග ගත් කල්හි එහි ඇතුළත් නිසා වෙනම නොකියන ලදී. මේ ඔකාසාධිගම තුන වනාහි අටතිස් අරමුණු වශයෙන් විස්තර කොට කිව යුතුය. කෙසේද ? සියළුම අරමුණු විසුද්ධි මාර්ගයෙහි කියන ලද නයින්ම උපචාර වශයෙන් ද අර්පනා වශයෙන් ද වෙන් වශයෙන් ගත යුතුය. ප්‍රථම ධ්‍යානය සූවිසි ස්ථානයෙහි පළමු ඕකාසාධිගමයයි කිව යුතුය.

දෙවන ධ්‍යාන ස්ථාන දහතුනක හතරවන ධ්‍යානය ද නිරෝධ සමාපත්තිය ද ස්ථාන පහළොවක පමුණුවා දෙවන ඕකාසාධිගමය කිව යුතුය. උපචාර ධ්‍යාන දහය වනාහි මාර්ගයට පදස්ථානය වූ තුන්වන ඔකාසාධිගමය ඇසුරු කරයි. එසේ වූවද ශික්ෂා තුන අතුරෙන් අධිශීල ශික්ෂාව පළමුවන ඕකාසාධිගමය භජනය කරයි. අධිචිත්ත ශික්ෂාව දෙවැන්නද අධිපඤ්ඤා තුන්වැන්න ද භජනය කරයි. මෙසේ ශික්ෂා වශයෙන් ද කිව යුතුය. සාමඤ්ඤ ඵලයෙහි මූල සීලයේ සිට රහත් බව දක්වා තුන්වන ඕකාසාධිගමය වේ. මෙසේ සාමඤ්ඤඵල සූත්‍ර වශයෙන් ද කිව යුතුය. තුන්පිටකය අතුරෙන් විනය පිටකය පළමු ඕකාසාධිගමය භජනය කරයි. සූත්‍රපිටකය දෙවැන්නද අභිධර්ම පිටකය තෙවැන්න ද භජනය කරයි. මෙසේ පිටක වශයෙන් ද කිව යුතුය. පෙර මහතෙරවරු වස් එළඹීමෙහි මේ සූත්‍රය එළවති. කුමන කරුණකින්ද? තුන්පිටකය බෙදා කීමට ලැබෙන්නෙමු යයි ත්‍රිපිටකය සමොධානය කොට කියන්නහුට කිව නොහැකිය. ත්‍රිපිටකය බෙදා කියනලද මේ සූත්‍රය මනාව කියන ලද්දේ වේ. කුසලසාධිගමාය මාර්ග කුසලයේ මෙන්ම ඵල කුසලයේ ද

අධිගමය සඳහා මේ දෙකම අනවද්‍ය අර්ථයෙන් ඎෙම අර්ථයෙන් හෝ කුසලවේ. එහි සමමා සමාධියති එහි ආධ්‍යාත්ම කයෙහි මනාව එකඟවූයේ ඒකාග්‍ර සිත වේ. බහිද්ධා පරකායෙ ඤාණ දසසනං අභිනිබ්බත්තති තමාගේ ශරීරයෙන් අන්‍යාගේ ශරීරය කෙළින් ඤාණය යවයි. සියළු තැන මෙම නයයි. සබ්බා යන පදයෙන් කායාදියෙහි පිරික්සන්නා සතියයි. ලොකො යන පදයෙන් පරිගෘහිත කායාදියද ලෝකය. මේ සතර සතිපට්ඨාන ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදූයි දත යුතුය. මෙහි පිරිකර තුනකි. රථය සීල පිරිකරය. ධ්‍යාන අක්‍ෂයයි. චක්‍ර වීර්යයි. මෙහි අලංකාරය පිරිවය පවුරු හතකින් නගරය වටකරන ලද්දේ සුපරික්‍ෂාවේයයි මෙහි පිරිවර පිරිකර වේ. ගිලන්පස... ජීවන පිරිකර වේ. මෙහි සම්භාරය පිරිකර වේ. මෙහි පිරිවර පිරිකර වශයෙන් සමාධි පිරිකර හතක් කියන ලදී. පරික්ඛාර යනු පිරිකරය, අයං වුච්චති භො සමමා සමාධි මේ සප්ත රත්නයෙන් පිරිවරන ලද චක්‍රවර්ති මෙන් අංග සතකින් යුත් ආර්ය සමාධියයි කියනු ලැබේ. ස උපනිසො ඉති උපනිශ්‍රය වේ යයි කියනු ලැබේ. පිරිවර සහිත වේ යයි කියන ලද්දේ වේ. සමමා සංකපෙපා පහොති සම්මාදිට්ඨියේ සිටියහුගේ, සම්මා සංකප්පය පවත්වයි. සියළු පදවල මේ පිළිවෙළම වේ. මෙහි මෙය මාර්ග වශයෙන් ද ඵල වශයෙන් ද දත යුතුය. කෙසේද ? මාර්ග සම්මා දිට්ඨියෙහි සිටියහු මාර්ග සම්මා සංකප්පය පවත්වයි... මාර්ග ඤාණයෙහි සිටියහු මාර්ග විමුක්තිය පවත්වයි. එසේම ඵල සම්මා දිට්ඨියෙහි සිටියහු ඵල සම්මා සංකප්පය පවත්වයි. ඵල සම්මා ඤාණයෙහි සිටියහු ඵල විමුක්තිය පවත්වයි. සවාකඛාතො ආදිය විසුද්ධි මාර්ගයෙහි වර්ණනා කරන ලදී. අපාරුතා විවෘත. අමතසස නිවනේ. දවාරා ප්‍රවේශවන මාර්ග. අවෙච්චපපසාදෙන නොසෙල්වෙන පැහැදීමෙන් ධමමවිනීතා ධර්මයෙන් පමුණුවන ලද. අථායං ඉතරා පජා අනාගාමීන් සඳහා කියන ලදී. අනාගාමීහුද ඇතැයි කියන ලද්දේ වේ. පුඤ්ඤභාග පින් කොටසකින් උපන්. ඔත්තපපං බියවන්නේ, මුසාවාද බියෙන් දනගන්නට නොහැකි වෙමි. දන ගැනීමේ මාගේ බලයක් නැතැයි දක්වයි. තං කිං මඤ්ඤති භවං මෙයින් තනිකර වෙසවුණු නොවිචාරයි. මෙබඳු රූප වූ ශාස්තෘන් වහන්සේ නොවූහ. නො වන්නේය හෝ ලබ්ධි ඇත. සියළු බුදුවරයන්ගේ අවබෝධයෙහි විශේෂයක් තමා. සයං පරිසායං තමාගේ පිරිසෙහි නයිදං බ්‍රහමචරියං මේ ඒ සියළු ශික්‍ෂාත්‍රය සංඛ්‍යාත බ්‍රහමචර්යාව. සෙස්ස පැහැදිලිය. මේ පද ධර්ම සංග්‍රාහක තෙරවරුන් විසින් තබන ලදී.

ජනවසභ සූත්‍රවර්ණනාව නිමි.

# 2-19

## මහා ගෝවින්ද සූත්‍ර වර්ණනාව

**එවමෙම සුතං** මහා ගෝවින්ද සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. මේ එහි ගැඹුරු පද වර්ණනාවය. **පංචසිඛො** සිළු පසක් ඇත්තේ. කුණ්ඩල පහක් ඇත්තේ. හේ වනාහි මිනිස් පියසේ පින්කම් කරන කාලයෙහි පන්සිළු දහර කාලයෙහි වසු පැටවුන් බලාගන්නා නායකයෙක්ව සිව් මංසලවල සාලා කරන්නේ, පොකුණු කරන්නේ, ඒ දඬු බඳින්නේ, මාර්ගවල විසම තැන් සමකරන්නේ, යානාවල අකුර නසන ගස් ඉවත් කරන්නේ, මෙබඳු පින්කරමින් හැසිර තරුණ කාලයෙහිම කලුරිය කෙළේය. ඔහුගේ ඒ ආත්මභාවය ඉෂ්ට කාන්ත මනාප විය. හේ කලුරිය කොට චාතුම්මහාරාජික දේවලෝකයෙහි වර්ෂ අනූ ලක්ෂයක් පමණ ආයුෂ ගෙන ඉපදුනේය. ඔහුගේ තුන්ගවු පමණ රන්කඳක් හා සමාන ආත්මභාවය විය. හේ ගැල්දහසක පමණ ආභරණ පැළඳගෙන කළ නවයක් පමණ සුවඳ විලවුන් ගල්වා දිව්‍ය රතු වස්ත්‍ර ධරා රතු මැණික් කරාබු පැළඳ කොණ්ඩ පහක් පිට දිගට වැටෙන සේ පන්සිළු දාරක පරිහාරයෙන් ම හැසිරේ. එයින් හේ පංචසිඛ යයි හැඳින් වේ.

ඉක්මගිය, ක්ෂීණ වූ රාත්‍රියේ, එක් කොටසක් ඉකුත් වී ගිය යන අර්ථයයි. **අභික්කන්ත වණ්ණා** අති ඉෂ්ට කාන්ත මනාප වූ වර්ණය. ස්වභාවයෙන් ම හේ කාන්ත වර්ණ ඇත්තේය. අලංකාරකොට ආ බැවින් අභික්කන්ත විය. **කෙවල කප්පං** ඉතිරි නැතිව, හාත්පසින්, අනවසේ සාර්ථයයි. මෙහි කේවල ශබ්දය, කෙවලකප්පං ජෙතවනං ආදියෙහි මෙනි. **ඔභාසෙත්වා** ආලෝකය පතුරුවා, සඳ මෙන් හිරු මෙන් ඒකාලෝක කොට යන අර්ථයයි. **සුධම්මාය සභායං** සුධම්මා නම් කාන්තාවගේ වහළ මුදුනේ සවිකරන ලද රියනක් පමණ උස් වූ දණ්ඩක් ඇති රැස්වීම් ශාලාවේ. එහි වනාහි පලිඟුමය බිම ය. මිණිමුවා ඇණය. රුවන්මුවා මැටිය. රිදීමුවා ටැම්ගැටි සහ එක්කොට බැඳීම්ය. පබලුමය ව්‍යාල රූපය. සත්රුවන් මුවා ගෝපාන සීස (කැණිමඬල මුදුන) පැතිපාසක මුවවිටිය. නිල්මැණික් ගඩොල් පියසිය. රුවන්මුවා පියසි පටය. රිදීමුවා කොත්ය. දිග පළලින් යොදුන් තුන්සියයක්. වටේට යොදුන් නවසියයකි. මෙබඳු වූ සුධම්මා සභාවෙහි. **ධතරට්ඨො** ආදියෙහි ධතරට්ඨ නම් ගාන්ධර්ව

රජ කෝටි ලක්ෂයක් ගාන්ධර්ව දේවතාවන් විසින් පිරිවරන ලදී. කෝටි ලක්ෂයක් රන්මුවා පලක ද රන් සැත් ද ගන්වාගෙන පෙරදිසායෙහි බටහිර බලා දෙ දෙව්ලොව දෙවියන් පෙරටු කොට හුන්නේ ය. විරූළහක කුම්භණ්ඩ රජ, කෝටි ලක්ෂයක් කුම්භණ්ඩ දෙවියන් පිරිවරා කෝටි ලක්ෂයක් මිණිමුවා පලක සහ රන් සැත් ගන්වාගෙන දකුණු දිසාවෙහි උතුරු දෙස බලා දෙ දෙව්ලොව දෙවියන් පෙරටු කොට හුන්නේ ය. විරූපක්ඛෝ නාගයින්ගේ නාරජ, කෝටි ලක්ෂයක් නාගයින් පිරිවරා කෝටි ලක්ෂයක් මිණිමුවා පලකද රන් සැත් ද ගන්වාගෙන පැසුළු දෙසෙහි පෙරදිග බලා දෙ දෙව්ලොව දෙවියන් පෙරටු කොට හුන්නේ ය. වෙසසවණෝ යක් රජු කෝටි ලක්ෂයක් යකුන් පිරිවරා කෝටි ලක්ෂයක් පබළු පලක ද රන්සැත් ද ගෙන්වාගෙන උතුරු දිසායෙහි දකුණ බලා දෙදෙව්ලොව දෙවියන් පෙරටු කොට හුන්නේ යයි දත යුතුය.

අථ පච්ඡා අම්හාකං ආසනං හොති ඔවුන්ට පිටුපසින් අපට හිඳගැනීමට ඉඩ ලැබුනේය. එයින් පසු පිවිසීමට හෝ බැලීමට නොහැකි විය. මෙහි රැස්වුණු කරුණ පෙර කියන ලදී. එය සතරාකාරය. වස් එළඹීම් සංග්‍රහයෙහි විස්තර වශයෙන් සඳහන් වේ. වස් එළඹෙන දිනයෙහි මෙන් මහා පවාරණ පොහොය දිනයෙහි ද රැස්ව අද කොහාට ගොස් කාගේ සමීපයෙහි පවරන්නෙමුදැයි සාකච්ඡා කරති. එහි දෙව් රජ වූ සක්‍රයා පුවඟු දිවයිනේ මහා විහාරයෙහි ම බොහෝ සෙයින් පවාරණය කරයි. සෙසු දෙව්වරු පරසතු ආදි දිවමල් ද දිව සඳුන් සුණු ද ගෙන තම තමා මනාප මනාප තැන්වලට ගොස් පවාරණය කරති. මෙසේ පවාරණ සංග්‍රහය පිණිස රැස්වෙති. දෙව්ලොව වනාහි ආසාවතී නම් වැලක් ඇත. එය පිපෙන්නේයයි දෙව්වරු වර්ෂ දහසක් උපස්ථානයට යති. පරසතු පිපෙන කල්හි එක් වසරක් උපස්ථානයට යති. ඔවුහු එහි පඬුපලස පැහැගත් තැන් සිට සතුටු වෙති. යම්සේ කීහ. මහණෙනි, යම් කාලයක තාවතිංස දෙවියන්ගේ පරසතු මල්ගස කොබෝලීල පඬුපැහැ වේද එවිට මහණෙනි, තව්තිසා දෙවියෝ සතුටු වෙති. පරසතු ගස දැන් පඬුපැහැ ගැන් වී ඇත. නොබෝ කලකින්ම හරිත පැහැ වන්නේය. යම් කලක තාවතිංස දෙවියන්ගේ පරසතු රුක කොබෝලීල හරිත පැහැගැනීමේදී අළුත් මොට්ටු හටගනී. මල් මොට්ටු හටගනී. මල් කැකුළු ඇතිවේ. එවිට තව්තිසා වැසි දෙවියෝ සතුටු වෙති. පරසතු රුක දැන් මල් කැකුළු හටගති. නොබෝ කලකින් පිපුණු මල් ඇතිවන්නේය. මහණෙනි පරසතු රුක මල්පිපුණු විට පනස් යොදුනක් පැහැය විහිදුවන්නේය.

සියක් යොදුනක් සුවඳ විහිදෙන්නේය. මෙය පරසතු ගසේ ආනුභාවයයි. පරසතු යනු මල්පිපුණු කල මෙහි ගසට නැගීමක් හෝ කෙක්කක් ගෙන අතු පාත් කිරීමක් හෝ මල් නෙලා ..... හෝ මල් එකතුකර පැසකට දැමීමක් හෝ නැත. මල් නෙලන වාතයක් නැගී මල් නැටියෙන් සිඳියි. පිළිගන්න වාතයෙන් පිළිගනී. ප්‍රවේශ කරන වාතයෙන් සුධර්මා දේවසභාවට ප්‍රවේශ කරයි. අමදින වාතයකින් පරමල් අස්කරයි. අතුරන වාතයකින් කර්ණිකා කේසර කොල ඉවත්කර අතුරයි. මැද ධර්මාසනය වෙයි. යොදුනක් පමණ රුවන් අසුනෙහි ඉහළ යොදුන් තුනක් පමණ සේසතක් දරයි. ඉන් අනතුරුව සක්දෙව් රජුට ආසනය අතුරනු ලැබේ. ඉන්පසු දේවපුත්‍රයින් තිස්තුන් දෙනා, අනතුරුව මහේසාක්‍ය දෙවියන් අනිත් දෙවියන්ට මල්කර්ණිකාම ආසන වේ. දෙවියෝ දේවසභාවට පිවිස හිඳගනිති. ඉක්බිති මල්රේණු වැටි උඩට නැගී ඉහළ මල්කෙමිවල වැදී වැටෙන්නේ දේවතාවන්ගේ තුන්ගවු පමණ ශරීර ලා රසෙන් පිරියම් කළා සේ කරයි. මෙසේ පරසතු ක්‍රීඩා රසානුභවය සඳහා රැස් වෙති. මාසයේ අටවන දිනවල දෙව්ලොව මහා ධර්ම දේශනාවක් වෙයි. එය පැවැත්වෙන්නේ සුධර්මා දේව සභාවේදීය. පවත්වන්නේ සනංකුමාර මහා බ්‍රහමයා හෝ සක්දෙවිඳුන් හෝ ධර්මකථික භික්‍ෂුවක් හෝ ධර්ම කථික අන්‍ය දිව්‍ය පුත්‍රයෙක් හෝ විසිනි. පක්‍ෂයේ අටවක් දිනවල සිව්වරම් රජුන්ගේ අමාත්‍යවරු. ද තුදුස්වක් දිනවල වරම් දෙවිවරුන් ගේ පුත්‍රයෝ ද ....... පෞර්ණමී දිනවල සතරවරම් දෙවිවරුද තික්මී රන්පතක් හා දැහිඟලක් ගෙන ගම් නියම්ගම් රාජධානිවල සැරිසරති. අසවල් ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ බුදුන් සරණ ගියේ දහම් සරණ ගියේ සඟුන් සරණ ගියේ පන්සිල් රකී. මාසයේ පෙහෙවෙස් රකී. මව්පිය උපස්ථාන කරයි, අසවල් තැන උපුල් අත් සියයක මල්කලයක් පූජා කළා. පහන් දහසක් දල්වූවා. අකල් දහම් දෙසුම් පැවැත්වූවා. ඡත්‍ර වේදිකා, මුදුගරාදිවැට, ගර්භ වේදිකා, සීහාසන, සීහ සෝපාන, කරවන ලදී. ත්‍රිවිධ සුචරිත ක්‍රියා පුරන ලදී. දසකුසල දහම්වල යෙදිණි. මේ ආදිය දැ හිඟුලෙන් රන්පතහි ලියාගෙන ගොස් පංචසිඛට දෙති. පංචසිඛ මාතලීට දෙයි. මාතලී ඒවා එකතුකර සක්දෙව් රජුට දෙයි. පින් කරන්නෝ අඩු නම් පොත් කුඩා වෙයි. මහාජනයා පමාවෙන් වාසය කරයි. අපාය පිරෙයි. සදෙව් ලෝ හිස් වේ යයි නොසතුටු වෙති. පොත් ලොකු වන්නේ නම් එය දුක මහජනයා අප්‍රමාදයෙන් වාසය කරයි. සතර අපාය හිස් වේ. සදෙව්ලෝ පිරෙන්නේය. බුද සසුනෙහි පින් කොට පැමිණි කල්හි මහ පින්වතුන් පෙරටුකොට නැකැත් කෙළි ලබමු යයි

සතුටු වෙති. ඒ පොත් රැගෙන සක්දෙව් රජ කියවයි. ඔහුගේ සවාභාවික ශබ්දයෙන් කියවන කල්හි දොළොස් යොදුනක් ඇසේ. උස් හඬින් කියවන කල්හි දස යොදුන් දහසක් සියළු දෙව් නගරය වසා පැතිරේ. මෙසේ ධර්ම ශ්‍රවණය සඳහා රැස්වෙති. මෙය වනාහි පවාරණය ගැනීම සඳහා රැස් වී යයි දත යුතුය.

තථාගතං නමසසනතා කරුණු නවයකින් තථාගතයන් වහන්සේ නමස්කාර කරමින්. ධමමසස ච සුධමමතං සවාකඛාතාදි බෙදීමෙන් යුත් ධර්මයේ යහපත් සවභාවය. සෘජු ප්‍රතිපත්ති ආදි බෙදීමෙන්. සංඝසස සුපපටිපනනං අර්ථය වේ. යථාභූචෙච යථාර්ථය, යථා සවභාවය, වණෙණා ගුණයෙහි. පයිරුදාහසි කීවේය. බහුජන හිතාය පටිපරනනා කෙසේ පිළිපන්නේද? දීපංකර පාද මූලයෙහි අෂ්ට ධර්ම සමෝධානයෙන් බුද්ධත්වය සඳහා ප්‍රාර්ථනා කරන්නේ ද බොහෝ දෙනාගේ හිත පිණිස පිළිපන්නේ වේ. දාන පාරමී සීල, නෙකඛමම, පඤඤා, විරිය, ක්‍ෂාන්ති, සචච, අදිට්ඨාන, මෙතතා, උපෙකඛා, පාරමිතා සිව් අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරන්නේද බහුජන හිත පිණිස පිළිපන්නේ වේ. ක්‍ෂාන්තිවාදි තාපස කාලයෙහි චුලල ධමමපාල කුමාර කාලයෙහි ඡද්දන්ත ඇත් රජ කාලයේ භූරිදත්ත චම්පෙය්‍ය සංඛපාල නාග රාජ කාලයේ මහා කපි කාලයේ ද එබඳු දුෂ්කර දේ කෙළේ ද බහුජන හිත පිණිසයි. වෙස්සන්තර ආත්මභාවයෙහි සිට සතත සතික මහා දානය දී සත්තැනක පොළොව කම්පා කරවා පාරමී කුළුගැන්වූයේ ද බොහෝ දෙනාගේ හිත පිණිසයි. ඊට අනතුරු ආත්මභාවයෙහි තුසී පුරයෙහි ආයු තෙක් සිටින්නේ ද බහුජන හිත පිණිසය. එහි පස් පෙරනිමිති දැක දස දහසක් සක්වල දෙවියන් විසින් අයදින ලද්දේ පස් මහබැලුම් බලා දෙවියන්ට සංග්‍රහ පිණිස පිළිණ දී තුස පුරයෙන් සැව මව්කුස පිළිසිඳීම් ගන්නේ ද බහුජන හිත පිණිසය. මව්කුස දසමසක් වැස ලුම්බිණි උයනේදී මව්කුසින් නික්මෙන්නේද බහුජන හිත පිණිසයි. එකුන් තිස්වසක් ගිහිගෙයි වැස මහබිනික්මන් කොට අනෝමා නදී තීරයෙහි පැවිදි වන්නේ ද සවසක් ආත්ම ක්ලමථයෙන් පධන් වීර්ය කොට බෝමැඩ අරා සර්වඥතාඥානය පිළිවිදින්නේ ද සත් සතියක් බෝමැඩ යැපෙන්නේ ද ඉසිපතනයට පැමිණ අනුත්තර වූ දම්සක් පවත්වන්නේ ද යමාමහ පෙළහර කරමින් දේවාරෝහණය කරන්නේ ද බුදුව පන්සාලිස් වසක් සිටින්නේ ද ආයු සංස්කාරය හරින්නේ ද දෙ සල් ගස් අතර අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන්නේ ද බොහෝ දෙනාට හිත පිණිස පිළිපන් නිසාමය. උන්වහන්සේගේ අබ පියල්ල පමණ ධාතු

දරන්නේ ද බහුජන හිත පිණිසම වේ යයි දත යුතුය. සෙසු එක පදයේම වේවචන වේ. එහි පසු පසු පදවල පෙර පෙර පදවල අර්ථ වේ.

නෙව අතීතංසෙ සමනුපසසාමි න පනෙතරහි අතීතයෙහි ද බුදුන්ගෙන් අනිකක් නො බලමි. අනාගතයෙහිද නොබලන්නෙමි. දනුදු අන් ශාසතෘවරයෙකුගේ අභාවයෙන් අන්තැනක ඒ භාග්‍යවතුන් වහන්සේ නොබලමි. අර්ථය වේ. අටුවාවෙහි ඒකාන්තයෙන් අතීතානාගත බුදුවරු අපගේ ශාසතෘන් වහන්සේ හා සමානවේමය. එසේ පවතින විට කුමක් නිසා කීවේදැයි විචාරා දූන් බොහෝ දෙනාට හිත පිණිස පිළිපන් ශාසතෘන් වහන්සේ අපේ ශාසතෘන් වහන්සේ හැර අන් කිසිවෙක් නැත. එහෙයින් නොදකිමියි ප්‍රකාශ කෙළේ යයි කියන ලදී. යම්සේ මෙහි මෙසේද මෙයින් පසු පදවලද මේ අර්ථය දත යුතුය.

සවාකඛාතාදිය ද කුසලාදිය ද කියන ලද අර්ථ ඇත්තේමය. ගඞගාදකං යමුනොදකෙන ගංගා යමුනා එකතුවන තැන ජලය වර්ණයෙන් ද සුවඳින් ද රසයෙන් ද සසඳන විට සමාන වේ. මැද බුන්රන් මෙන් එක සමානම වේ. මහසමුදුර ජලයෙන් මිශ්‍රවන විට මෙන් විසම නොවේ. පිරිසිදු වූ නිවනේ ප්‍රතිපදාව ද පිරිසිදුමය, තරුණ කාලයෙහි වෙදකම් ආදිය කොට අගෝචරයෙහි හැසිර මහළු කාලයෙහි නිර්වාණගාමී ප්‍රතිපදාව පිරිසිදුවම වැටේ. උපමාව ආකාසයයි. ආකාසයද නො ඇලේ. පිරිසිදුය. සඳ හිරු අහසෙහි කැමති කැමති තැන්වලට යන්නාක් මෙන් නිවනට ගමන් කරන භික්ෂුවද ප්‍රතිපදාවද කුලයෙහි හෝ ගණයෙහි හෝ නො ඇලී නොබැඳී අහස මෙන් වීමට වටී. එය වනාහි එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් පණවන ලදී. කියන ලදී. දේශනා කරන ලදී. එසේ හෙයින් කියන ලදී. "නිවන හා ප්‍රතිපදාව සැසැඳේ". පටිපදානං ප්‍රතිපදාවෙහි සිටින්නන් ගේ. වුසිතවතං විසුවන්ගේ, මොවුන්ගේ. ලද්ධ සහයො එකිනෙකාගේ එහි සමාන මාර්ගය නිසා සහාය වේ. අදුතියො, අසහායො, අප්පටිමො මෙය වනාහි අසමාන අරුතින් කියන ලදී. අපනුජ්ජා ඔවුන් අතර ද ඵල සමාපත්තියෙන් වාසය කරන්නා සිතෙන් ඔවුන් බැහැරකර, එකම සිතෙන් අනුයුක්තව වාසය කරයි යන අර්ථයකි.

අභිනිපඵනෙනා ඛො පන තසස භගවතො ඒ භාග්‍යවතුන් වහන්සේට මහා ලාභයක් උපන්නේ ය. කවදා පටන් උපන්නේද?

අභිසම්බෝධියට පැමිණ සත් සති ගෙවා ඉසිපතනයෙහි දම්සක් පවත්වා අනුක්‍රමයෙන් දෙව් මිනිසුන් දමනය කරන්නේ, තුන් ජටිලයන් පැවිදි කරවා රජගහ නගරයට වැඩ බිම්බිසාර රජු හික්මවීමේ සිට ඉපදුනේය. යමක් සඳහා කියන ලදද. "එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ සත්කාර කරනු ලබන්නේ ගරු කරනු ලබන්නේ පුදනු ලබන්නේ (මානිතො පූජිතො අපචිතො) සිවුරු ආහාර සෙනසුන් ගිලන් පස ලබන්නේ වෙති." සිව් අසංඛ්‍ය කල්ප ලක්ෂයක්, උත්සන්න වූ පින ගලායෑම හටගන්නේ ලාභ සත්කාර මහගඟක් මෙන් වසා පැතිරෙමින් එයි.

එක් කලෙක රජගහනුවර, සැවැත් නුවර, සාකේතයෙහි, නොසඹෑ නුවර, බරණැස් නුවර භාග්‍යවතුන් වහන්සේට පිළිවෙළ බතක් ඇතිවිය. එහි එක් අයෙක් "මම සියයක් වියදම් කර දානයක් දෙන්නෙමියි කොලයක ලියා විහාර දොරේ බැන්දේය. අනෙකෙක් මම දෙසීයක්, අනෙකෙක් මම පන්සීයක්, අනෙකෙක් මම දාහක්, අනෙකෙක් මම දෙදාහක්, අනෙකෙක් මම පන් දහසක් - දස දහසක් - විසි දහසක්. අනෙකෙක් මම ලක්ෂයක්, අනෙකෙක් මම දෙලක්ෂයක් වියදම් කොට දානයක් දෙන්නෙමියි කොලයක ලියා විහාරයේ දොරෙහි බැන්දේය. බුදුරදුන් ජනපද චාරිකාවේ වඩින විට ද ඉඩක් ලැබුණු විට දන් දෙමියයි ජනයා ගැල්පුරා බඩු රැගෙන බුදුන් වහන්සේ පසුපස යති. යම්සේ කීහ.. "එසමයෙහි ජානපදිකයෝ බොහෝ ලුණු ද තෙල්ද හාල්ද කෑ යුතු දේද වැළඳිය යුතු දේද ගැල්වල පුරවා භාග්‍යවතුන් වහන්සේ පසු පසු ගියාහු වෙති. යම් තැනක පිළිවෙළ අනුව ඉඩ ලැබේද එතැන දානය පිළිගන්වන්නෙමුයි කියා යති. මෙසේ ඛන්ධකවල ද විනයෙහි ද වෙනත් බොහෝ කථාවසතුන් දත යුතුය. අසදෘශ දානයෙන් මේ ලාභය මුදුන් පැමිණීය. එක් සමයක වනාහි බුදුරජ ජනපද චාරිකාවේ හැසිර දෙව්රම් වෙහෙරට පැමිණි කල්හි රජතුමා ආරාධනා කොට දානය දුන්නේය. දෙවන දිනයෙහි නගරවාසීහු දන් දුන්හ. නැවත ඔවුන්ගේ දානයට වැඩිය රජතුමා, ඔහුගේ දානයට වැඩියක් නගරවාසීහු, මෙසේ බොහෝ දවස් ගත වූ පසු රජ සිතීය. මේ නරගවාසීහු දින දින අතිරේක දාන පූජා කරති. පෘථිවිශ්වර වූ රජු නාගරිකයන් ගේ දානයෙන් පරාජය වී ගර්හාවට ලක්වෙන්නේ යයි. ඉන්පසු මල්ලිකා දේවියගෙන් උපායක් විමසීය. ඒ රජ සල්කලණ පෝරුවෙන් මඬුවක් කරවා එය තිල් උපුලින් සෙවෙනි කරවා ආසන පන්සීයක් පනවා ආසන පිටිපස ඇතුන් පන්සීයක් රඳවා එක එක ඇතා එක එක භික්ෂූන් වහන්සේට සුදු කුඩයක් ඇල්ලීය. ආසන දෙකක් පාසා

අතරෙහි සියළු අලංකාරයෙන් සැරසුණු ක්ෂත්‍රියදූවරු සිවුදෑ ගඳ (කොකුම්, ලවඟ, තුවරලා, ඉඳුසල්ලාටු) අඹරති - කුඩු කරති, කුඩු වූ සුණු මැද සුවඳ ඔරුවෙහි බහාලති. වෙනත් ක්ෂත්‍රිය දූවරු නිලුපුල් අතකින් ඒවා පෙරළති. මෙසේ එක් එක් භික්ෂූන් වහන්සේට ක්ෂත්‍රිය දූවරුන් තිදෙනා බැගින් පිරිවර වූහ. සියළු අලංකාරයෙන් සැරසුණු වෙනත් ස්ත්‍රීහු තල්වැට ගෙන පවන් සලති. වෙනත් කාන්තාවෝ ඩබරාව ගෙන පැන් පෙරති, අන්‍ය කාන්තාවෝ භාජනවලින් දිය ගෙනෙති. භාග්‍යවතුන් වහන්සේට[1] පා සෝදන පුවරුව, පා පුටුව, හේත්තුවෙන ලෑල්ල, ඡත්‍රපාදමණි යන අනර්ඝ සතර විය. සංඝ නවක භික්ෂූන් වහන්සේගේ දානවසතුව ලක්ෂයක් අගනේය. ඒ දානයෙහි අංගුලිමාල තෙරුන් වහන්සේ සංඝ නවකයෙක් වූහ. උන්වහන්සේගේ ආසනය සමීපයට ගෙනෙන ලද ඇතා උන්වහන්සේට කුඩය ඇල්ලීමට බිය විය. ඒ බව රජුට දැන්වූහ. දුෂ්ඨ ඇතා හැර වෙන ඇතකු නැති බව ද කීහ. ඒ ඇතා ගෙන ඒමට නොහැකි බවද කීහ. රජ එය බුදුහිමට දැන්වීය. සංඝ නවක තෙර කව්දැයි බුදුහු විචාළහ. අඟුල්මල් තෙර බව දැන්වීය. එසේ නම් ඒ දුෂ්ඨ ඇතා ගෙනවුත් තබන්නැයි කීහ. මතැතා මර්දනය කොට ගෙනාහ. ඒ ඇතා තෙරුන්ගේ තේජසින් නාසයෙන් හුලං පොදක් පිටකිරීමටද නොහැකි විය. මෙසේ සත් දිනක් දානය දෙන ලදී. සත්වන දිනයෙහි රජ බුදුන් වැඳ ධර්මය දේශනා කරන්නැයි ආරාධනා කෙළේය.

රජුගේ පිරිස අතර කාල හා ජුණ්ණ යයි ඇමතිවරු දෙදෙනෙක් වෙති. රජමාලිගාවට අයත් ධනය විනාශ වේ යයි කාල ඇමති සිතීය. "මෙතෙක් දෙනා මොනවද කරන්නේ, කාල විහාරයට ගොස් තිදා ගනී. රාජ පුරුෂයෙකුට මේ ධනය ලැබුන නම් මොනවද නොකරන්නේ. රජු සන්තකය අහෝ විනාශ වේ," ජුණ්ණ ඇමති මෙසේ සිතීය, "මේ රාජ ස්වභාවය ඉතා මහත්ය. වෙන කාටද මෙසේ කරන්න පුළුවන්. එබඳු රාජ සවභාවයේ සිට මෙබඳු දානයක් දීගත නොහැකි නම් මොන රජෙක්ද? භාග්‍යවතුන් වහන්සේ පිරිසෙහි අදහස් බලන්නේ ඔවුන් දෙදෙනා ගේ අදහස් දැන ඉදින් අද ජුණ්ණගේ අදහසින් ධර්ම කථාව කරන්නෙම් නම් කාලගේ හිස සත්කඩක්ව පුපුරන්නේය. මා විසින් වනාහි සත්වානු කම්පාවෙන් පාරමිතා පුරන ලදී. ජුණ්ණ වෙනත් දවසක මගේ ධර්ම කථාව අසා මාර්ගඵල අවබෝධ කරන්නේය. දැන් වනාහි කාල බලන්නෙමි යයි රජතුමාට සතර පද ගාථාවක් වදාළහ.

1 හෙළ කුඩය, පාත්‍රා වළල්ල, පාදපීඨය, හිඳිනා පලඟ - සද්ධර්ම රත්නාවලිය

සග නොයති මසුරෝ - දද දනෝ දන් නොවණති
අනුමෙවෙමින් එ දන - නුවණැති පරලොව දිනා

රජ අසතුටුව, මවිසින් මහ දනක් දෙන ලදී. සතරහු මට මඳ බණක් වදාළහ. දසබල බුදුරදුන් ගේ සිත ගැනීමට නොහැකිවෙමියි හැඟේ. හේ උදේ ආහාරය ගෙන විහාරයට ගොස් භාග්‍යවතුන් වැඳ විචාළේය. සවාමිනී මවිසින් මහ දනක් දෙන ලදී. අනුමෝදනාව කුඩා විය. සවාමිනී මාගේ වැරැද්ද කුමක්ද? මහරජ ඔබේ වැරැද්දක් නැත. පිරිස අපිරිසිදුය. එනිසා දහම් නොදෙසන ලදී. ස්වාමින් වහන්ස, කුමක් හෙයින් පිරිස අපිරිසිදුද? ශාස්තෲන් වහන්සේ ඇමතිවරු දෙදෙනාගේ පරිවිතකකය දන්වූහ. රජ කාල විචාළේය. දරුව කාල එසේද? මහරජ එසේය. මා සතු දේ මා දෙනකල්හි ඔබේ කොතනද රිදෙන්නේ ? ඔහු දකීමට නොහැකිවෙමි. මාගේ රාජ්‍යයෙන් ඔහු පිටුවහල් කරන්න. ඉන්පසු ජුණණ කැඳවීය. දරුව මෙසේ සිතීදැයි විචාළේය. මහරජ එසේය. ඔබේ සිත අනුවම එසේවේවා. ඒ මණ්ඩපයෙහිම ඒ පනවන ලද අසුන්වලම පන්සීයක් භික්ෂූන් වඩා හිඳුවා ඒ තැන් දූවරුන්ම පිරිවරා රජ ගෙදරින් ධනය ගෙන මා දුන් ලෙසම සතියක් දානය දෙන්න. හේ එසේ දුන්නේය. දී සත්වන දිනයෙහි භාග්‍යවතුන් වහන්සේ මට දහම් දෙසන්න යයි අයදීය. ශාස්තෲන් වහන්සේ දාන දෙකේම අනුමෝදනාව එකක් කොට මහා ගංඟා දෙකක ජලය පිරුණු මහා ගංඟාවක් කරන්නා සේ මහා ධර්ම දේශනාවක් දෙසූහ. දේශනා අවසානයෙහි ජුණණ සෝවාන් විය. රජ පැහැදී දසබලයන් වහන්සේට බාහිර වසතු ප්‍රදානය කෙළේය. ඒ භාග්‍යවතුන් වහන්සේට මෙසේ ලාභ උපන්නේ යයි දත යුතුය.

අභිනිපඵනෙනා සිලොකො ගුණකථා වර්ණනාවයි. එයද භාග්‍යවතුන් වහන්සේගේ දම්සක් පැවතුමේ සිට නිපන්නේය. එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේ, ක්ෂත්‍රියෝ ද බ්‍රාහමණයෝද ගැහැවියෝද නාග සුපර්ණ ගාන්ධර්ව දෙවියෝ බ්‍රහමයෝද වර්ණනා කරති. කුමක් කියා ? මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ ආදියෙනි. අන්‍ය තීර්ථකයෝ වර රෝජට දහසක් දී ශ්‍රමණ ගෞමයන්ගේ නුගුණ කියවයි පිටත් කළහ. හේ දහස ගෙන දසබල ගෞතමයන් පාදතලයේ සිට කේසාන්තය දක්වා බලන්නේ ලිකබා මාත්‍රයකුදු දොසක් නොදක පැතිරුණු දෙතිස් මහ පුරිස් ලකුණින් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් ලකරවූ බ්‍යාම ප්‍රභාවෙන් නබෝ ගැබ සේ, විසිතුරු කුසුමෙන් සුන්දර වූ නඳුන් උයන හා සම වූ

අනවද්‍ය වූ ආත්මභාවයෙහි (ශරීරයෙහි) නුගුණ කියන්නාගේ කට ද ඇදවන්නේය. හිස ද සත්කඩක්ව පැලෙන්නේ ය. නුගුණ කීමට උපායෙක් නැත. වර්ණනාවම කරන්නෙමියි පාදතලයේ සිට කේසාන්තය දක්වා අතිරේක පද දහසකින් වර්ණනාවම කෙළේය. යමක ප්‍රාතිහාර්යයේදී මේ වර්ණනා තොමෝ මුදුන් පැමිණියාය. මෙසේ ගුණ ...........උපන්නේය. යාව මඤ්ඤෙද ඛත්තියා ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, වෛශ්‍ය, ශුද්‍ර, නාග, සුපර්‍ණ, යක්‍ෂ, අසුර, දේව, බ්‍රහමයෝ, සියල්ලෝම ප්‍රියමනාප ව තුටු පහටුව වාසය කරති. විගතමදො ඛො පනා මෙපමණක් ජනයෝ ප්‍රියමනාප රූපව වසති. මතින් පමා වී ජව වශයෙන් ආහාර නොගනිති. අනික් අතට ඒ භාග්‍යවතුන් වහන්සේ විගත මදයෙන් ආහාර ගනිති. යථාවාදී වචනයෙන් යම්සේ කියා ද ඒ අනුවම කයින් ක්‍රියා කරති. කයින් වචනය හෝ වචනයෙන් කය හෝ නො ඉක්මවති. වචනය කයින් ද කය වචනයෙන් ද සම වේ යම් සේ කීහ.

වමින් වේ හූරු - දකුණින් වේය අජමුව
තේළක වේ සරෙන් - මහළු ගවයෙකි අඟකින්

මේ සූකර යක්‍ෂයා හුරන් දැක ඌරන් හා සමාන වම් පැත්ත පෙන්වා ඔවුන් අල්ලා කයි. අජාමිගයන් දැක ඔවුන් හා සමාන දකුණු පැත්ත පෙන්වා ඔවුන් ගෙන කයි. වසු පැටවුන් දැක වසු හඬින් ශබ්ද කරන්නේ ඔවුන්ගෙන කයි. ගොනුන් දැක ඔවුන්ගේ අංවලට සමාන අං මවා ඔවුන් දුරින්ම ගොනකු මෙන් පෙනේ යයි ලංවූ විට ගෙන කයි. ධම්මික වායස ජාතකයෙහි වාතභක්ඛයා මෙන් කුරුල්ලන් විසින් අසන ලද කවුඩා මම වායුව අනුභව කරන බැවින් මුව විවරකොට ප්‍රාණීන් මැරේය යන භයින් එක් පාදයකින් සිටියෙමි. එහෙයින් ඔබලාද ,

දහම හැසිරෙනු ඔබ - නැයිනි, හැසිරෙන්න දහමෙහි
දහම් සැරි සුව දේ - මෙලෝ පරලෝ දෙක්හී

කුරුල්ලන් විශ්වාසයට - පැමිණවීය එයින්,

සොඳුරුය මේ සකුණ - දැහැමිය උතුම් ගුණ දද
එක් පයින් සිටිමින් - දහම් දහම් යයි යෙමින්

මෙසේ විශ්වාසයට පැමිණි කුරුල්ලන් කැවේය. එහෙයින් එනිසා ඔවුන්ගේ වචන කයින් නොවේ. කය වචනයෙන් සම නොවේ යයි දක්වයි. එතෙර වූ තරණය කළ සැකය මොහුටනුයි (සැකය නැතැයි සේයි) තිණ්ණ විචිකිච්ඡා වේ. එය කෙසේද එය කෙසේදැයි එබඳු වූ කථා දුරු වූයේ මොහුටය. විගත කථා වේ. එසේම යම්සේ මහජනයා මේ ගස කුමන ගසක්ද ? මේගම, මේ ජනපදය, මේ රට කුමන රටක්ද ? කුමක් හෙයින් මේ ගස ඍජුවේද ? මේ ගස ඇදවේද? සමහර මල් සුවඳයි සමහර මල් දුගඳයි. සමහර ගෙඩි මිහිරියි. සමහර ගෙඩි අම්හිරියි. සැක ඇතිවේ. ශාස්තෲන් වහන්සේ එසේ නැත. ශාස්තෲන් වහන්සේ වනාහි මේ නාමධාතූන් ගේ උත්සන්න අනුත්සන්න බැවින් මෙය මෙසේ වේ යයි සැක නැතිවේමය. යම්සේ ප්‍රථම ධ්‍යානලාභීන් ගේ ද්විතීය ධ්‍යානාදියෙහි සැක ඇතිවේ. පසේ බුදුන් ගේ ද සර්වඥතා ඥානයෙහි යාවත්ව ස්ථිර වශයෙන් නැති නිසා ව්‍යවහාර වශයෙන් සැක ඇතිවේ. බුදුන් වහන්සේට මෙසේ නොවේ. උන්වහන්සේ සියළු තැන සැක නැතිවම දක්වයි. පරියොසිත සංකපෙපා කිසිවෙක් සීලය පමණනින්ද, කිසිවෙක් විදර්ශනාව පමණකින්ද කිසිවෙක් ප්‍රථම ධ්‍යානයෙන්ද.... නෙවසඤ්ඤා නා සඤ්ඤා සමාපත්තියෙන් ද කිසිවෙක් සාවක පාරමී ඥාණයෙන් ද කිසිවෙක් පසේබුදු නුවණින් ද පරියෝසිත සංකපපා සම්පූර්ණ වූ මනෝරථ වන්නාහ. මාගේ ශාස්තෲන් වහන්සේ එසේ නොවේ. මාගේ ශාස්තෲන් වහන්සේ වනාහි සර්වඥතා ඥාණයෙන් මනෝ රථය මුදුන් පමුණුවා ගන්නාහයි දක්වයි. අජඣාසයං ආදි බ්‍රහමචරියං කරණාර්ථයෙහි ද්විතීය, වචනයි. අධික වූ අදහසින් උතුම් නිශ්‍රය වීමෙන් ආදි බ්‍රහම චරියාවෙන් පුරාණ බ්‍රහම චරියාවෙන්ද ආර්ය මාර්ගයෙන් සැකයෙන් එතෙරව සැකය පහකොට පරියෝසිත සංකපප යන අර්ථයයි. පෙර නොඇසූවිරූ ධර්ම කෙරෙහි තමාම සත්‍ය අවබෝධ කෙළේය. එහි ද සර්වඥතාවට පැමිණි බල කෙරෙහි ද වසීභාවයයි වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ පරියෝසිත සංකපපතාව ද ආර්ය මාර්ගයෙන් ම නිපන්නේය. යථරිව භගවා භාග්‍යවතුන් වහන්සේ යම්සේද, මෙසේ එකම දඹදිව් තලයෙහි සිව් දිසාවෙහි චාරිකාවේ හැසිරෙන්නේ ඒකාන්තයෙන් සතර බුදුවරයෝ ධර්මය දේශනා කරන්නාහයි බලාපොරොත්තු වන්නේ තුන් බුදුවරයෝ යයි කීහ. පසුව දස පාරමී පුරා හතරක් තුනක් හෝ උපත් දුලබය. ඉදින් නිබඳවම එක්තනැක වසන්නේ ධර්ම දේශනා කරන්නේ නම් ඒක චාරිකාවක යෙදෙන්නේ මෙසේද දඹදිව සෝභා කරන්නේද බොහෝ දෙනාගේ හිත

සුව පැමිණෙන්නේ ය. යි සිතා අහො වත මාරිසා යයි කීහ. මෙහි අට්ඨානමෙතං අනවකාසො ඨානං යනු අවකාශයයි. මේ දෙකම කාරණා යන්නට අධිවචනම වේ. කාරණය සිටියි, මෙහි ඊට අයත් පැවැත්මෙන් ඵලය ඨාන වේ. අවකාශය මෙන් ද එය නැතිව වෙන තැනක නොපවතියයි අවකාස වේ. යං යනු කරණාර්ථයෙහි ද්විතීයාය. මෙය කියන ලද්දේ වේ. යම් හේතුවකින් එක ලෝක ධාතුවක බුදුවරු දෙදෙනෙක් එකට පහළවන්නාහු නම් එය සිදු නොවන්නේය.

යම් පමණ සඳහිරු - එළිකර හැසිරෙන දිසා
සහස්‍යුරු ලොව එම - වසයෙහි නවතයි ඔවුන්

ගාථාවේ එක් සක්වලක්ම එක් ලෝක ධාතුවකි. ''දහසක් ලෝකධාතු කම්පාවූයේය'' යයි ආ තැන සක්වල දහසක් ලෝකධාතුවක්. ''ආනන්ද තථාගතයන් වහන්සේ කැමති වන්නේනම් තුන් දහසක් මහා ලෝකධාතුව ශබ්දයෙන් දන්වන්නේ නම් ආලෝකයෙන් පතුරවන්නේ නම්'' ආ තැන තුන්දහසක් මහා ලෝකධාතුව එක් ලෝකධාතුවකි. ''මේ දස දහසක් ලෝක ධාතුව'' යයි ආ තැන සක්වල දස දහසක් එක් ලෝක ධාතුවකි. එකිසසා ලොකධාතුයා ඒ සඳහා යයි කීහ. මෙපමණක් ජාති ක්ෂේත්‍රය නම් වේ. මේ සක්වළෙහි දඹදිව මධ්‍ය දේශය හැර වෙන් තැනක බුදුවරු නූපදිති. ජාතික්ෂේත්‍රයෙන් පිටත බුදුවරුන්ගේ උත්පත්තිසථාන නොපෙනේ. යෙනත්‍ථෙන යම් පචාරණ සංග්‍රහයකින්. වණ්ණෙන චෙව යසසාවා අලංකාර පිරිවරින්ද පින් සිරියෙන්ද යන අර්ථයයි. සාධු මහා බ්‍රහෙම මෙහි සාධු ශබ්දය සම්ප්‍රසාදනයෙහිය. සංඛාය මොදමා දූන සතුටුවෙමු. යාව දීඝ රත්‍තං මහා පඤ්ඤාව සො භගවා මෙපමණ යයි පිරිසිඳ කීමට නොහැකිය. බොහෝ කාලයක් අපගේ ඒ භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රඥාවන්තව යයි කීම ඔබලා සිතන්න. ඉක්බිති තමාම මේ ප්‍රශ්නය විසඳන කැමැත්තේ, ''යහළුව පාරමී පුරා බෝ පළඟෙහි තුන්මරුන්ගේ මුදුන බිඳ ප්‍රතිවේධ තුළ අසාධාරණ ඤාණය ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රාඥ වන්නේ දූන් මෙය අසිරිමත් නොවේ. පරිපාකයට නොගිය අවබෝධයෙන් ප්‍රදේශ ඤාණයක සිටියේ රාගසහිත කාලයෙහි ද මහා ප්‍රඥා බවම ඔබට කියන්නෙමි''යි භවයෙන් වැසුණු කරුණ ගෙනහැර දක්වන්නේ භූත පුබ්බං භො ආදිය කීහ. පුරොහිතො සියළු කටයුතුවල අනුසාසනා කරන්නේ පුරෝහිතය. ගොවින්‍දො ගොවින්ද අභිෂේකයෙන් අභිෂේක

කළාවූ ස්වභාවයෙන්ම වනාහි අභිෂේකයේ සිට වෙනත් නමක් ගොවින්දො යයි ව්‍යවහාර විය.

ජොතිපාලො බැබළීමෙන් ද පාලනයෙන් ද ජෝතිපාල. ඔහු උපන් දිනයෙහි සියළු ආයුධ දිලිසුනේය. රජතුමාද පාන්දරම තමාගේ මඟුල්කඩුව දිලිසෙනු දැක බියවී සිටියේය. මහාගෝවින්ද පාන්දරම රාජ සේවයට ගොස් ''සුවසේ පහන් කෙළේද''යි ඇසීය. රජ ඇදුරුතුමණි, ''මට මොන සැප තින්දක්ද''යි කියා ඒ කරුණ දන්වීය. මහරජතුමණි. බිය නොවන්න. මට පුතෙක් උපන්නා. ඔහුගේ අනුභාවයෙන් සියළු නුවර ආවුධ දිලිසුණේ'' යයි කීය. කිම මෙම කුමාර සතුරුවන්නේ දැයි සිතා රජ වැඩියක් බිය විය. මහරජ කුමක් සිතන්නේදැයි විචාරණ ලද්දේ එය දන්වීය, ඉක්බිති මහරජ බිය නොවන්න. මේ කුමරා ඔබට ද්‍රෝහි නො වෙන්නේ ය. සියළු දඹදිව ප්‍රඥාවෙන් ඔහු හා සම කෙනෙක් නො වෙන්නේ ය. මගේ පුතාගේ වචනයෙන් මහජනයාගේ සැක බිඳී යන්නේ ය. ඔබ වහන්සේගේ සෑම කටයුතුවල අනුසාසනා කරන්නේ යයි අස්වැසීය. සතුටු වූ රජ කුමරාගේ කිරිමිලට වේවයි දහසක් දී කුමරා වැඩුණු කළ මට පෙන්වන්නැයි කීය. කුමරා පිළිවෙළින් වැඩිවියට පැමිණියේ ඇලුණු බැවින් හා පාලක සමර්ථනාවෙන් ද ජෝතිපාලයයි නම් කළහ. එයින් කියන ලදී "ජොතනතො ච පාලනතො ච ජොතිපාලො" බැබළීමෙන් ද පාලනයෙන් ද ජෝතිපාල වේ.

සමම වොසසජ්ජිත්වා මනාව අත්හැර, පාඨය මෙයම වේ. අලමත්‍ථදසතරො සමර්ථ, ප්‍රතිබල, අර්ථය දක්නා, අර්ථය දැකීමට හැකි අලමත්‍ථදසං වේ. අතිශායාර්ථයෙහි අලමත්‍ථදසතරො වේ. අර්ථය ඉතා හොඳින්ම දක්නා සුළු. ජොතිපාලසෙවව මාණවසස අනුසාසනියා හේ ද ජෝතිපාලම අසා අනුසාසනා කෙරේ යයි දක්වයි. භවමත්‍ථු භවනතං ජොතිපාලං භවත් ජෝතිපාලයන්ට වැඩක්ම වේවා. සියළු යහපත ද මංගලද වේවා යන අර්ථයයි. සමෙමාදනීයං කථං මහරජතුමණි මෙසේ නො සිතන්න. සියළු සතුන්ට මෙය ඒකාන්ත ධර්මයකි. ආදි නයින් මරණ ප්‍රතිසංයුකත සෝකය නැති කිරීමෙන් පිළිසඳර කථා අවසන් කොට, මා භවං ජොතිපාලො අනුසාසනියා පච්චව්‍යාහාසි නොවැලකෙන්න අනුසාසනයෙන්. මම අනුසාසනා නොකරමියි අනුසාසනයෙන් නොවැලකෙන්න යන අර්ථයයි. අභිසමෙහාසී සංවිධාන කොට තැබීය. මනුසසා එවමාහංසු ඔහු පියාට වඩා මහා ප්‍රාඥය, සියළු කටයුතුවල

අනුසාසනා කරයි. සියළු කර්මාන්ත සංවිධානය කරනු දැක සතුටු සිත්ව පින්වත් බමුණා ගෝවින්දය, මේ පින්වතා ඒකාන්තයෙන් මහා ගෝවින්ද බ්‍රහමණයාය,යි මෙසේ කීහ. මෙය කියන ලදී. ගෝවින්ද නම් පින්වත් බමුණෙක් විය. ඒ මොහුගේ පියායි. මොහු වනාහි ඒකාන්තයෙන් මහා ගෝවින්ද බ්‍රාහ්මණයාය. යෙන තෙ ඡ ඛතතියා ක්‍ෂත්‍රිය සදෙනා වන ඔව්හු සහායකයෝ යයි කියන ලදී. ඔවුන් වනාහි රේණුගේ පියාගේ කණිටු සොයුරෝය. එහෙයින් මහා ගෝවින්ද මොහු අභිෂිත කළ පසු මොවුන් රාජ සංවිධානයෙහි කරන්නේ හෝ නොකරන්නේ කල් ඇතිව ඔවුන් රේණු වෙත යවා පිළිණ ගත්තේ යයි සිතා ක්‍ෂත්‍රිය කුමාරයින් සදෙනා වෙත එළඹියේය.

රාජකත්තාරො රාජකාරක ඇමතිවරු, මදනියා කාමා මත්කරන පමාකරන කාම. කල්ගිය කල මෙය සිහිකිරීමටද නොහැකි වන්නේය. එහෙයින් පින්වතුන් එන්න යන අර්ථයයි. සරාමහං භො එකල්හි වනාහි මිනිසුන් ගේ සත්‍යවාදී කාලයක් විය. එහෙයින් මා කියන ලද්දේ කවදාද කවුද දැක්කේ කවුද ඇසුවෙ අභූත නොකියා පින්වත මම සිහිකරමියි කීය. සමෙමාදනීයං කථං කිම මහරජ, දෙව්දත් ගිය කල්හි නොසිතන්න. මෙය සියළු සතුන්ට ඒකාන්ත ධර්මතාවකි. සංසාරවල මේ සවභාවයයි. මෙබඳු වූ පිළිසඳර කතා සබ්බානි සකටමුඛානි පට්ඨපෙසි සියළු රාජ්‍ය සයම ගැල්මුවව තැබීය. එක් එක් රජුගේ රාජ්‍යය යොදුන් තුන්සියයක් වේ. රේණු රජුගේ පියාණන් මෙන් විය. කුමක් හෙයින් මෙසේ පිහිටුවීද? කලින් කල රජවරුන් දැකීමට පැමිණෙන අනික් රජුන් නොපෙළා තම තමාගේ ජනපදයෙහි සේනාවම එන්නේය. යන්නේයයි අනිත් රාජ්‍යකට ගිය කෙනෙකුගේ බත් දෙව, හරක් දෙව, යි කියන්නාහුට මින්පසු උද්සෝෂණය කරති. මේ රජවරු තම තමාගේ විජිතවලින් නොයති. අප ලඟ තිබෙන මේ මේ දේවල් ලබමින්, ඉල්ලමින් මිනිස්සු අප පෙළමියි නොසිතති. මෙය සිතා මහා ගොවින්ද රජවරු බොහෝ කලක් සතුටෙන් රාජ්‍යානුශාසනා කෙරෙතැයි මෙසේ පිහිටුවීය.

කළිඟුවේ දන්තපුර - පෝතනය අස්මකයේ
අවන්තියේ මාහිස් - රෝරුකය සෝවීරයේ

විදේහයෙ මිථිලා - අංගයෙහි චම්පා මැවී
බරණැස කාසියේ - ගොවිඳුගෙ මැවුම් මේවා

මේ නගර හත ඒ රජුන්ගේ ප්‍රයෝජනය සඳහා මහා ගෝවින්ද විසින්ම නිර්මාණය කරන ලදි.

සත්තභූ බ්‍රහමදතෙතා ච වෙසසභූ භරතො සහ
රෙණු චෙව ධතරට්ඨා තදාසුං සතත භාරතා

මේ ඒ සත් රජුන් ගේ නම්ය. ඔවුන්ගෙන් එක්කෙනෙකුට සත්තභූ නම විය. එක්කෙනෙක් බ්‍රහමදත්ත නම් විය. එක්කෙනෙක් වෙසසභූ විය. එක්කෙනෙක් භරත විය. ඒ සමග තවත් වෙස්සභූ නමක් විය. එක්කෙණෙක් රේණු නම් විය. කෙනෙක් ධෘතරට්ඨ විය. මේ සත් භාරතයෝ දඹදිව්තලයෙහි භාරත මහරජවරු වූහ.

පළමු බණවර නිමි.

**උපසංකමිංසු** - අපගේ මේ ඓශ්වර්ය සම්පත්තිය අනිකෙකුගේ ආනුභාවයෙන් නොව මහා ගෝවින්දයන් ගේ ආනුභාවයෙන් නිපන්නේය. මහා ගෝවින්ද තෙමේ අපගේ සත්රජුන් සමගි කොට දඹදිව්තලයෙහි පිහිටුවීය. පෙර උපකාරයට ප්‍රත්‍යුපකාර කිරීම පහසු නොවේ, අප සත්දෙනාගේම අනුසාසනා කෙරේවා හේ ම සේනාපති ද පුරෝහිත ද කරමු. කිසේ අපගේ සමෘද්ධිය වන්නේ යයි සිතා ඔහු වෙත එළඹුනාහ. මහා ගෝවින්ද තෙමේ ද මා විසින් ඔව්හු සමගි කරනු ලැබූහ. ඉදින් ඔවුන්ගේ වෙනත් සේනාපති සහ පුරෝහිත වන්නාහු නම් එයින් තම තමාගේ සේනාපති පුරෝහිතයන්ගේ උපදෙස් ගෙන භේදවන නිසා ඔවුන්ගේ සේනාපති තනතුර ද පුරෝහිත තනතුර ද ඉවසිමියි සිතා භවත්නි එසේ වේවායි පිළිවදන් දුන්නේය. සතත ච බ්‍රාහමණ මහාසාලෙ මම සියළු තැන්වල පෙනී සිටියත් නැතත් යම්තැනක මම පෙනී නොසිටියේ නම් එහි කළයුතු දේ මොව්හු කරන්නෝ යයි අනු පුරෝහිතයන් සත් දෙනෙකු තැබීය. ඔවුන් සඳහා මෙය කියන ලදී. සතත ච බ්‍රාහමණ මහා සාලේ. දවසට තුන්වරක් හෝ උදේ හෝ සවස හෝ නාන්නේ යයි නහාතකා වේ. වතාවත් අවසානයෙහි හෝ නැම වේ. එතැන් පටන් බමුණන් සමග ආහාර නොගනිත්. නොබොත් යනු ද නහාතක වේ. අබහුගඟ්ඤජ් ඉහළ නැගුණේය. එකල වනාහි

බ්‍රහමයා සමග සාකච්ඡාකර සියළු දඹදිව මෙසේ අනුශාසනා කිරීමට නොහැකියයි නිදාගත් හුන්තැන්වල මිනිසුන්ගේ කතා පැවතියේය.

(ධුර) න බො පනාහං මහා පුරුෂයා වනාහි මේ මට පෙර නොවූ විරෝධයක්, ඇතිවිය. වර්ණ ඇතිවීම බරෙක් නොවේ. උපන් තනතුරු රැකීම බරෙකි. මෙය ද මට නොසිතා කථා නොකොට තනතුරු ඇතිවිය සිතා කතාකොට මේ මීට වඩා පළල්වම වන්නේය. බ්‍රහමයා දැකීමේ උපායක් සොයන්නෝ එය දැක ''මවිසින් මෙසේ අසන ලද්දැයි ආදිය ද මෙහි කල්පනා කෙළේය. යෙන රේණු රාජා තෙනුපසංකම් මෙසේ මාගේ අතරතුර දකිනු කැමත්තේ හෝ දොඩනු කැමැත්තේ නොවන්නේය. එයින් සිදුණු පළිබෝධ ඇත්තේ සුවසේ වාසය කරන්නෙමියි පළිබෝධ නැතිකිරීම සඳහා එළඹියේය. සියළු තැන මෙම පිළිවෙළමය. සාදිසියො සමවර්ණ, සමජාතික. තවං සන්ථාගාරං කාරෙත්වා දිවා රාත්‍රි සථාන සහ සක්මන් මළු සහිතව වැසි සාරමසෙහි විසීමට යෝග්‍ය වූ බිහි තලින් වටවූ විචිත්‍ර වූ තානායමක් කරවා කරුණඣානං ඣායි කරුණාවෙන් තුන හතර ධ්‍යාන වැඩීය. කරුණා මුවින් වනාහි මෙහි ඉතිරි බ්‍රහ්ම විහාර තුනද යන්නා ලද්දේ වේ. පරිතසසතා ධ්‍යාන භූමියෙහි සිටියහුට (ධ්‍යාන ගත වූ විට) අකමැති හෝ කලකිරීම් හෝ බිය තැවීම් හෝ නැත බ්‍රහ්මයා වනාහි පැමිණීම බලාපොරොත්තුවන, පැමිණීමේ තෘෂ්ණා ඇති යන අර්ථ වේ. භයං සිත උත්‍රාසයට පමුණුවන බිය. අජානතා නොදන්නේ. කථං ජානෙම තං මයං අපි කෙසේ නම් ඒ කථාව දනිමුද? මේ එය වසන්නාගේ නම කුමක්ද කුලය කුමක්ද ආදිය කුමන අයුරින් ඔහු දරන්නේද යන අර්ථයයි. මං වෙ කුමාරං ජානනනති මා කුමරුයයි ළමයෙකැයි දනිති. බ්‍රහමලොකෙ ශ්‍රේෂ්ඨ ලෝකයෙහි, සනනතන බොහෝ කාලයක, පුරාණ වූ, මම ඒ පුරාණ කුමරා වූ සනං කුමාර නම් බ්‍රහ්මයා යයි දක්වයි. එවං ගොවින්ද ජානාහි ගෝවින්ද පණ්ඩිතයෙනි, මෙසේ මා දැනගන්න. මෙසේ දරාගන්න.

අසුන දිය පා කෙත - මදුපාසය ද බඹහුද
අගය විමසමු අපි - කරනුය අගය අපහට

මෙහි අගඝං යනු ආගන්තුකව පිළිගැන්විය යුතුයයි කියනු ලැබේ. එහෙයින්ම මෙම අසුන පණවන ලදී. මෙහි වාඩිවෙන්න. මේ ජලය පිරිසිදුය. මෙයින් පැන් බොන්න. පා සෝදන්න. මෙය පා තෙලය,

මෙයින් පාදයේ ගල්වන්න. මෙය මධුපාසය. බෝසත්තුමාගේ බ්‍රහ්මචර්යාව අනෙකකුගේ බ්‍රහමචර්යාවට සමාන නොවේ. මෙය හෙට හෝ මෙය තුන්වන දිනයෙහි නොවෙන්නේය. සන්නිධිය නම් කරන්නේය. මධුපාසය නම් ලුණු නැති තෙලින් නොබැද මෝරු නම් හුමාල ජලයෙන් තැම්බූ සාක එය සඳහා මෙය ගෙන අනුභව කරවයි කියන්නේ අගෙස භවනතං පුචඡාම ආදිය කීහ. මේ සියල්ලද අගසා බ්‍රහමුනො අප්‍පි පින්වත ඔබ විචාරමු. මෙසේ විචාරන්නවුන්ද අගසං කුරුතු. පින්වත පිළිගැනීමු. මෙය අගස යයි කියන ලද්දේ වේ. කිම ? මෙයින් එකක්වත්බ්‍රහමයා නොවළඳාද? මෙය නොදනීද? අප නොදනී. දන්නේ ද තමා සමීපයට පැමිණි ආගන්තුකයා විචාල යුතුයයි වතාවත් හිසින් විචාරයි. ඉක්බිති බ්‍රහ්මයා කිම පණ්ඩිතයෙක්ද මා පරිභෝග කරන බව දූන විචාරයිද ? නැතහොත් කුහකකමේ සිට විචාරයි. පරීක්‍ෂාකර බලන්නේවත් හිසින් සිට විචාරන්නේ යයි දූන දූන් එය පිළිගැනිමි වටී යයි, පතිගණහාම තෙ අගසං යං ත්‍වං ගොවිනද භාසසි - යයි කීය. ගෝවින්ද ඔබ යමක් කීවේද? මේ ආසනය පනවන ලදී. මෙහි හිඳගන්න. එහි ඒ අප ආසනයේ හිඳගන්නේ නම් වෙමු. පැන් බොන ලද්දෝ වෙමු. මගේ පාද සේවනය කරනු ලබත්වා තෙල් ආලේප කරනු ලැබේවා. දිය සාක ද පරිභෝග කරනු ලැබේවා. ඉවසූ කාලයේ සිට ඔබ දෙන ලද දේ මම පිළිගතිමි. එහෙයින් කියන ලදී. පතිගණහාම තෙ අගසං යං ත්‍වං ගොවිනද භාසසි මෙසේ වනාහි අගසය පිළිගෙන ප්‍රශ්නයට ඉඩ හරින්නේ දිටඨධමම හිතතථාය යනාදිය කීය. කංඛී අකංඛී පරවෙදියෙසු මම සැක සහිත වූයේ භවතා නිසා සංස්කරණය වූයේ අනුන් ප්‍රකට පරවාදි ප්‍රශ්නවල නිසැක වූයේ වෙමි. හිත්‍වා මමතතං මෙය මගේ මෙය මගේ උපකරණ තෘෂ්ණාව හැර, මනුජෙසු සත්ත්වයන් කෙරෙහි, මිනිසුන්ගේ යමෙක් මමත්‍වය හැර යයි අර්ථය වේ. එකෙක් නැගිට සිටින්නේ, එකොදිභූතො - එකෙක් හිඳගෙන ඉන්නේ, මෙහි වචනාර්ථය වනාහි එකෙක් පිබිදෙයි පවත්වයි යනු එකෝදිවේ. එබඳු වූයේ යයි එකොදිභූතො වේ. එත්‍ව ඨිතො - මේ ධර්මවල සිටියේ. එත්‍ථ ච සිකඛමානො - මේ ධර්මවල හික්මෙන්නේ යන්න මෙහි සංක්‍ෂෙපයහි. විස්තර වනාහි ඉහළ මහා ගෝවින්ද විසින් ද බ්‍රහ්ම විසින් ද කියන ලදී.

එහි එතෙ අවිදධා - මේ පිළිගදෙහි මම අවිද්ධය, නොදනිමිය යන අර්ථයයි. ඉධ භූහි ධීරා - එහෙයින් මම ඔබ කියන්න. ධීර, පණ්ඩිත කියන්න. කෙනාවටා වාති පජා කුරුරු - කවර නම් කෙලෙස් ආවරණයෙන්

ආවරණය කත ලද ප්‍රජාව කුණුගඳ හමයි. ආපායිකා - අපායට එළඹි. නිවුත බ්‍රහම ලොකා - වසත ලද පිහිත වසනලද බ්‍රහමලෝකය මොහුටනුසි නිවුත බ්‍රහම ලෝක වේ. ප්‍රජාවගේ කවර නම් ක්ලේශයකින් බ්‍රහමලෝක මාර්ගය වසත ලද්දේ පිළිසත් වූයේදැයි විචාරයි. කොධො මොස වජ්ජං නිකතී ච දොබෙහා - කිපෙන ලක්‍ෂණය ක්‍රෝධයයි. අනුන් මුළාකරන ලක්‍ෂණය මුසාවාදය සමානයයි දක්වා වංචා ලක්‍ෂණ වූ කපටි බවද මිත්‍රද්‍රෝහි ලක්‍ෂණය වූ (දෙබහය) ද්වේශයද. කදරියතා අතිමානො උසුයසා - තද මසුරු ලක්‍ෂණය මසුරුකම ද ඉක්මවා මතින ලක්‍ෂණය වූ මානය ද අනුන්ගේ සම්පත් නැති කරණ ලක්‍ෂණයම වූ උසුයාා ද. ඉචඡා විචිකිච්ඡා - තෘෂ්ණා ලක්‍ෂණය වූ ඉචඡාව ද මසුරු ලක්‍ෂණය වූ විචිකිච්ඡාව ද විහිංසා ලක්‍ෂණය වූ අනුන් වෙහෙසීමද, ලොභො ච දොසො ච මදො ච මොහො - යම්කිසි තැනක ඇලෙන ලක්‍ෂණය වූ ලෝභයද දූෂ්‍ය ලක්‍ෂණය වූ ද්වේශයද මත්වන ලක්‍ෂණය වූ මදයද මුළාවන ලක්‍ෂණය මෝහය ද, එතෙසු-යුකතා අතිරාමගන්ධා - මේ කෙළෙස් තුදුසෙහි යුක්ත වූ ප්‍රජාව නිරාමයන්ට නොවෙති. සාම ගන්ධය, පක්ෂි ගඳ හා කුණු ගඳ යයි කියයි. ආපායිකා නිවුත බ්‍රහමලොකා - මෙය වනාහි අපායික ද වේ. වැසුණු බ්‍රහ්මලෝක මාර්ගයද දක්වයි. මේ සූත්‍රය කියන්නා විසින් ආමගන්ධ සූත්‍රයෙන්ද දක්වා කිවයුතුයි. ආමගන්ධ සූත්‍රයද මෙය දක්වා කිව යුතුය. තෙ න සුනිමමදයා - ඒ ආමගන්ධය මනාව නිමි මද වූ සුවයෙන් මද නැතිකළයුතු පහකළ යුතු නොවේ. අත්හැරීමට දුෂ්කරය යන අර්ථය වේ. යසසදානි භවං ගොවින්‍දො කාලං මඤ්ඤති - පිංවත් ගෝවින්දය පැවිදිවීමට කාලය දනගන්න. මෙයම වේවා. මෙසේ ඇති කල්හි ඔබ සමීපයට මාගේ පැමිණීම ද යහපත් ගමනක් වන්නේය. කිවයුතු ධර්මකථා හොඳින් කීවා නම් වන්නේය. දරුව ඔබ තරුණ වියේ සිටියේ සියළු දඹදිවට අග්‍ර පුරුෂයාය. මෙසේ මහත් වූ ශ්‍රී සම්පත් හැරදමා ඔබගේ පැවිදිවීම නම් ගඳැතෙක් යකඩ දම්වැල් බිඳදමා යන ගමනක් මෙන් අත්‍යුදාරය. බුද්ධතනති නම් වන මෙය මහා පුරුෂයා දැඩිලෙස උත්සාහවත් කර සනංකුමාර බ්‍රහ්මයා බ්‍රහ්ම ලෝකයට ගියේය. මහා පුරුෂයාද මම මෙයින් නික්මී පැවිදිවීම සුදුසු නොවේ. මම රාජකුලයේ ප්‍රයෝජනය සඳහා අනුසාසනය කරමි. එහෙයින් රජුට දන්වන්නෙමි. ඉදින් රජුට දන්වන්නෙමි, ඉදින් ඔහුත් පැවිදිවන්නේ නම් යහපති, පැවිදි නො වන්නේ නම් පුරෝහිත තනතුර බාරදී මම පැවිදි වන්නෙමියි සිතා "ඉක්බිති මහාගෝවින්ද... මම පුරෝහිත තිලයෙහි නො ඇලෙමියි යනාදිය කීය, නාහං පුරොහිචෙච රමෙ - මම

පුරෝහිත බවෙහි නොඇලෙමි. කලකිරුණෙමි. වෙනත් පුරෝහිතයකු සොයාගන්න.

ඉක්බිති රජතුමා සිව්මසක් විවේකීව සිටි බමුණාගේ ගෘහයෙහි ඒකාන්තයෙන් සම්පත් මඳ යයි සිතා ධනයෙන් ආරාධනා කරන්නේ, ඉදින් ඔබට අඩුවක් වේ නම් ඒවා මම සම්පූර්ණ කරමි යයි කියා නැවත මොහු හුදකලාව සිටින්නේ කුමක් නිසාද? කිසියම් හිරිහැරයක් වන්නේ යයි සිතා,

වෙ' නම් යම් හිංසන - වලහම් පොළොවෙ සෙන්පති
ඔබ පියා මා පුත් - ගොවිඳ අත්නොහරිනු මා

එහි අර්ථය - යො තංහිංසති තං වාරෙමි - හුදෙක් මෙහි මවිසින් කළයුතු වන්නේ අසවල් දෙයයයි කියන්න. එය මම දනිමි. භූමි සෙනාපති අහං - එසේ නැතහොත් මම පොළොවෙහි සවාමියා වෙමි. ඒ මම මේ රාජ්‍යය ඔබටම පවරා දෙමි. ත්‍වං පිතා අහං පුතෙතා - ඔබ පිය තනතුරෙහි සිටින්නෙහිය. ඒ ඔබ මාගේ සිත ඔබම ගෙන ගෝවින්ද නොයන්න. ඔබ කැමති සේ පවතින්න. මම සිත අනුවම සිටින්නේ ඔබදෙන ආහාර අනුභව කරමින් ඔබට අසි සම් අතින් සේවය කරමි. ඔබේ රථය හෝ පදවන්නෙමි. ගෝවින්ද අප අත්නොහරින්න යනු ද පාඨයකි. එහි අර්ථය ඔබ පිය ස්ථානයෙහි සිටින්න. මම පුත් සථානයෙහි සිටිමි. ගෝවින්ද අප අත් නොහරින්න. ඉක්බිති මහා පුරුෂයා රජු යමක් සිතුවේ නම් එය තමාට නැතිබව දක්වන්නේ,

අඩු නැත කාමයෙහි - හිංසන ද මට නැත්මය
නැත ඇල්ම ගිහිගෙය - අසමින් අමනුස් වදන්

එහි නමත්ථි - මට නැත. ගහෙ - ගෙයි. ඉක්බිති රජු ඔහු විචාරයි.

අමනුස් කිනම් වණ - කිමෙක් වේද කී බස ඔහු
අසා යම් වදනක් - අත් හරින අප සැම දෙන

එහි ජනසි නො ගෙහෙ අමෙහ ච කෙවලෙ - සම්පත් පිරුණු බමුණාගේ ගෙයද ඇලීම් වශයෙන් තමාගේ ගෙයද අපගේ ගෙයද හුදෙක් සියළු දඹදිව වාසීන් යම් වදනක් අසා අත්හරී යයි කියයි. ඉක්බිති මහාපුරුෂයා රජට කියන්නේ "උප වුත්‍ථසස මෙ පුබ්බෙ" යනාදිය කීය,

Scanned with CamScanner

**උපවුත්ථසස** - එහි සිව්මසක් හුදකලාව වාසය කෙළේ. **යටඨුකාමසස මෙ සතො අගග පජ්ජලිතො ආසි කුසපතත පරිත්‍ථතො** - කුසපත් වලින් ආරක්‍ෂා කරමින් ගිතෙල් හකුරු පැණි ආදිය බහා ගිනි දල්වීමට ආරම්භ කෙළේය. මෙසේ ගිනි දල්වා මහජනයාට මහා දානයක් දෙන්නෙමි'යි මෙසේ සිතා සිටියහ. **සනනතනො** - සනංකුමාර බ්‍රහ්මයා, එයින් රජතුමා ද පැවිදිවෙනු කැමැත්තේ **සද්දහාමි** ආදිය කීය. එහි කථං වතෙතථ අඤ්ඤථා ඔබ කෙසේ හෝ අන්‍යකාරයකින් පවතින්නේද? **තෙ තං අනුවතතිසසාමි** - කෙසේ හෝ මම ද ඔබ අනුව සිටිමි අනුව පැවිදිවෙමි යනු පාඨයි. අනුව යන්නෙමි යන අර්ථයි. **අකාච** - පටලය නැති. කසට නැති. **ගොවිනදසසනුසාසනෙ** - ගෝවින්ද ගේ අනුසාසනයෙහි. පිංවත් ගෝවින්දම ශාස්තෘ කොට හැසිරෙමියි කියයි. **යෙන තෙ ජ බතතියා තෙනුපසංකමි රෙණු** රජුට මහරජ සාධු. රාජ්‍යය නම් මව පියා, සහෝදරයා සහෝදරිය ආදීහුද මරවා ගන්නා සතුන් අතුරෙහි මහත් රාජසිරි හැර පැවිදිවනු කැමැත්තෙන් මහරජු විසින් උදාර දෙයක් කරන ලදැයි ස්ථිර කොට උත්සාහය දෘඩ කොට එළඹියේය. **එවං සමචිතෙතසු** - රජු සිතන නියාමයෙන් ම දිනක බමුණාගේ සම්පත් පිරිහෙන්නේයයි සිතන්නේ සමසිත් විය. **ධනෙන සිකෙඛයාමා** - පොළඹවන්නෙමු. සංග්‍රහ කරන්නෙමු. **තාවතාං ආහරීයතං** - එපමණ ගෙන එනු ලැබේවා. යනු ලැබේවා කැමති තරම් ගන්නැයි කියන ලදී. **භවනතානංයෙව වාහස.** - පින්වතුන් ප්‍රත්‍ය කොට ඔබලා විසින් දෙන ලද දෙයින් ම බොහෝ ඇතිවන ලදී. **සචෙ ජහථ කාමානි** - ඉඳින් වස්තු කාමයන්ද ක්ලේශ කාමයන් ද අත්හරින්නේ නම්. **යතථ පතතා ප්‍රථුජ්ජනො** - පෘථග්ජන සත්වයෝ කාමයන් කෙරෙහි ඇලෙති. **ආරභතො දළහාහොථ** - මෙසේ ඇති කල්හි වීර්ය ආරම්භ කරන්න. පරාක්‍රමය අඩු නොකොට අධිෂ්ඨානයෙන් දෘඩ කරන්න. **ඛනතීබල සමාහිතා** -- ක්‍ෂාන්ති බලයෙන් යුක්ත වන්නැයි රජු උත්සාහ කරවයි. **එසමගෙගා උජුමගෙගා** - මේ කරුණාධ්‍යාන මාර්ගය ඍජු මාර්ගයයි. **එසමගෙගා අනුතතරො** - බඹලොව ඉපදීමට මෙයම අසදෘශ වූ උතුම් මාර්ගයයි. **සඳධමෙමා සබභිරකඛිතො** එය ද බුදු පසේබුදු ශ්‍රාවකයන් විසින් ද .......විසින් රකින ලද ධර්මය නම් යයි කරුණා ධ්‍යානයේ වර්ණනාවෙන් ද ඒවායේ නොනැවතීම පිණිස දෘඩ ක්‍රියාවම කරයි. **කො පන හො ජානාති ජීවිතානං** - පින්වත ජීවිතය නම් දිය බුබුල වෙති, තණ අග පිනිබිඳු මෙනි. එකෙණෙහි විනාශ වන ස්වභාවය වේ. එහි ගතිය නොදනී, කොයි මොහොතේ බිඳේද කියා, **ගමනියො බොපන සමපරායො** - පරලෝකය වනාහි අවශ්‍යයෙන්ම යා

යුතුමය. එහි පණ්ඩිත කුලපුත්‍රයා විසින් ප්‍රඥාවෙන් අවබෝධ කළ යුතුය. මනතා යනු ප්‍රඥාවය-එයින් දැනගත යුතුය. අවබෝධ කළ යුතුය. පරීක්‍ෂා කළ යුතුය. දත යුතුය යන අර්ථය වේ. කරණාර්ථයෙහි ආධාර වේ. මනතාය බොධබ්බං - ප්‍රඥාවෙන් අවබෝධ කළ යුතුය. නුවණින් දත යුතුය යන අර්ථයයි. කුමක් අවබෝධ කළයුතුද? ජීවිතය දැන ගැනීමට අපහසු බව අවශ්‍යයෙන් පරලොව යා යුතු බව. දැන ගෙන ද වනාහි සියළු පළිබෝධයන් සිඳ කුසල් කළ යුතුය. බ්‍රහමචර්යෙහි හැසිරිය යුතුය. කුමක් හෙයින් ද? යම්හෙයකින් ඉපදුණු අය අමරණීය නොවන හෙයිනි. අපෙපසක්ඛා ච අපපලාභාව - පින්වත පැවිද්ද නම් අල්ප කීර්තිය ද පැවිදිවූ කාලයේ පටන් රජය හැර පැවිදි වූයේ ද වෙහෙස කොට තදින් වෙහෙසකොට ලාමක අනාථ කොට කියත්. අල්ප ලාභ ඇත්තේ ද වේ. ගම හැමතැනම ඇවිද්ද ද ආහාරය දුර්ලභ වේ මය. මෙය වනාහි බ්‍රහමඤ්ඤය උසස් ජීවිතයකි. මහේසාඛ්‍ය, මහා යසස් ඇති මහාලාභ ඇති ලාභ සත්කාරවලින් යුකතවද වේ. පින්වතා දැන් සියළු දඹදිව අග්‍ර පුරෝහිත වේ. සියළු තැනම මුලසුන ලැබේ, මුලසුන් ලැබේ. අග්‍ර ආහාර ලැබේ. අග ගඳම ලබයි. රාජා ච රඤ්ඤං - මම දැන් ප්‍රකෘති රජ වෙමි, චක්‍රවර්ති රජු මෙනි. අවසේසස ගෘහ පතියන් මැද සක්දෙවිඳ මෙනි චත්තවාරිසා හරියා සාදිසියෝ - සිව් බිරියන් හා සමානය. අන්‍යයෝ වනාහි තුන්වයසෙහි බොහෝ තිළියෝ මෙනි.

චාරිකං චරති - ගම් නියම් පිළිවෙළින් චාරිකාවේ හැසිරෙයි. ගිය ගිය තැන බුදු කොලහලය මෙන් වේ. මිනිස්සු මහා ගෝවින්ද පණ්ඩිතයන් එතියි අසා කලින්ම මණ්ඩපයක් කරවා මාර්ගය අලංකාර කරවා පෙරගමන් කොට කැඳවාගෙන එති. මහත් ලාභ සත්කාර මහෝඝයක් මෙන් උතුරා යමින් උපදී. සතත පුරොහිතසස - සත් රජුන්ගේ පුරෝහිතයන්ට. මෙසේ දැන් මෙබඳු තැන්වල කිසියම් දුකක් උපන් කල්හි ''නමො බුදධසස'' යයි කියති. මෙසේ එකල ''නමත්‍ථු මහා ගොවින්‍දසස බ්‍රාහමණසස, නමත්‍ථු සතත පුරොහිතසස'' යයි කියති. ''මෙතතා සහගතෙන'' ආදි නයින් පෙළෙහි බ්‍රහම විහාරම ආවේය. මහා පුරුෂයා වනාහි සියළු අෂ්ඨ සමාපත්තිද පඤ්ච අභිඥා ද ඉපදවීය. සාවකානඤ්ච බ්‍රහම ලොක සහව්‍යතාය මගගං දෙසෙසි - බඹලොව බඹුන් හා සමග විසීමට මාර්ගය කීවේය. සබ්බෙන සබ්බං - යමෙක් අෂ්ට සමාපත්තිද පඤ්ච අභිඥා ද ඉපදවූහ. යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානිංසු - ඇතමෙක් අෂට සමාපත්තිවලින් එක සමාපත්තියක්වත්

නොදත්හ, ඉපදවීමට නොහැකි වූහ. අමොඝා - විපාක සහිත. අවඤ්ඤා - වඳනැති. සබ්බනිහීත පසවන්ති - හීන වූ ගඳඹකය රැස් කළහ. සඵලා - සෙසු දෙව්ලෝ උපත් සාර්ථක විය. සඋද්‍රයා - බඹලොව උපතින් සංවර්ධනය විය. සරාමහං - සිහිකරමි මම පංචසිඛ, මෙම පදයෙන් වනාහි මේ සූත්‍රාන්තය බුද්ධභාෂිත නම් විය. නිබ්බිදාය - සසරෙහි කලකිරීම සඳහා නොවන, න විරාගාය - සසරෙහි විරාගය සඳහා නොවන. න නිරොධාය - සසරේ නිරෝධය පිණිස නොවන. න උපසමාය - සසරේ උපසමනය සඳහා නොවන. න අභිඤ්ඤාය - සසර දැන ගැනීමට නොවන. න සම්බොධාය - කෙලෙස් නින්දෙන් ඉවත් වී සසරින් එගොඩවීම සඳහා නොවේ. න නිබ්බානාය - අමෘත මහා නිර්වාණාර්ථය සඳහා නොවේ. එකන්ත නිබ්බිදාය - ඒකාන්තයෙන් ම සසරෙහි කලකිරීම සඳහා. මෙහි වනාහි නිබ්බිදාය යනු විදර්ශනාවය. විරාගාය - මාර්ගය. නිරෝධාය උපසමාය - නිවන. අභිඤ්ඤාය සම්බොධාය - මාර්ගය. නිබ්බාණාය - නිවනම වේ.

එක් තැනක විදර්ශනාව මාර්ග තුනෙහි නිවන් තුනක කියති. මැඩගත් කථා දත යුතුය. පරියායයෙන් වනාහි මේ සියල්ලම මාර්ග සමාන වචනද නිර්වාණ සමාන වචන ද වේ. සම්මාදිට්ඨි - ආදියෙහි යමක් කිවයුතු නම් ඒ සියල්ල විසුද්ධි මාර්ගයෙහි සත්‍ය වර්ණනාවෙහි කියන ලද්දේමය. යෙන සබ්බෙන සබ්බං - යමෙක් සතර මාර්ග සම්පූර්ණ කිරීමට නො දනිත් ද තුනක් හෝ දෙකක් හෝ එකක් හෝ උපදවති. සබ්බසංසෙව ඉමෙසං කුලපුත්තානං - බ්‍රහ්ම චර්යාව පුරුදු පුහුණු කළ කුලපුත්‍රයන්ට හිස් නොවූ..... බඹලොව උපත් සහිත, රහත් බවින් කුළුගන්වා දේශනාව අවසන් කෙළේය.

භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා - භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාව සිතෙන් පිළිගනිමින් සතුටු වී වචනයෙන් ප්‍රශංසා කරන්නේ අනුමෝදන් ව මහ ඇඳිලි සිරසෙහි පිහිටුවා ප්‍රසන්න ලා රසයෙහි ගිලෙන්නාක් මෙන් දසබලයන් ගේ සවණක් රැස් දැලතුලට පිවිස සතර තැනෙක වැඳ තුන්වරක් පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේට ස්තුති කරන්නේ ශාස්තෲන්ද ඉදිරියෙහි අතුරුදහන්ව තමාගේ දෙව්ලොවටම පැමිණියේය.

මහා ගෝවින්ද සූත්‍ර වර්ණනාව නිමි.

# 2-20

## මහා සමය සූත්‍රය

එවං මෙසුතං යනු මහා සමය සූත්‍රයයි. මෙය පෙර විස්තර නොකළ පද වර්ණනාවයි. සකෙකසු - අම්බට්ඨ සූත්‍රයෙහි කියන ලද උත්පත්ති පිළිවෙළින් "සක්‍ය මත භො කුමාරො" යන උදානය නිසා සක්‍ය යයි ලැබූ නම් ඇති කුමරුන් ගේ නිවස වූ එක් ජනපදයකට ද රූඪී වශයෙන් සක්කාය කියනු ලැබේ. එහෙයින් ශාක්‍ය ජනදයෙහි. මහාවනෙ - රෝපනය නොකළ ස්වයං ජාතම හටගෙන හිමවත සමග ඒකාබද්ධ වූ මහා වනයෙහි. සබෙබහෙව අරහනෙතහි - මේ සූත්‍ර දේශනා කළ දිනයෙහි ම රහත් බවට පැමිණ එහි පිළිවෙළ කථාව මෙසේයඃ- ශාක්‍ය හා කෝලියයෝ වනාහි ශාක්‍ය හා කෝලිය ජනපද අතර වූ රෝහිණී නදියේ එක අමුණක් බැඳ ජලය ගෙන ගොවිතැන් කරති. ඉක්බිති කාලයක පොසොන් මාසයෙහි සස්‍ය මැලවෙන කල්හි නගර දෙකේම ගොවියෝ රැස්වූහ. එහි දී කෝලිය නගරවාසීහු මෙසේ කීහ. මේ ජලය දෙගොල්ලම ගත්තොත් එක ගොල්ලකගේවත් කුඹුරුවලට ප්‍රමාණවත් නොවේ. අපේ කුඹුරු එක දියවරකින් පැසේ. ඒ නිසා මේ ජලය අපට දෙන්න. කපිලවත්ථු නගරවාසීහු මෙසේ කීහ. ඔබලාගේ අටුකොටු පුරවාගෙන සිටින විට රත්රන්, නිල්මැණික, කහවණු ගෙන පැසි, පසුම්බි ගත් අත් ඇතිව ඔබලාගේ ගෙවල් ගානේ යන්ට අපට බැහැ. අපගේ ගොයම්ද එක දියවරකින් පැසේ. මේ ජලය අපට දෙන්න. අපි නොදෙමු අපි නොදෙමු යයි මෙසේ කථා ඇතිවී එකෙක් නැගිට එකෙකුට පහරක් ගැසීය. හේද අනෙකෙකුට යයි ඔවුනොවුන් පහර දී රාජකුලවල ජාති ආදියෙන් ගම් කෝලාහල කළහ. කෝලිය කම්කරුවෝ මෙසේ කියති. ඔබලාගේ කපිලවත්ථු වාසීන් අරගෙන ගර්ජනා කෙරේද? ඔව්හු බලු හිවල් ආදීන් මෙන් තමන්ගේ සහෝදරයින් සමග සංවාස කළහ. ඔවුන්ගේ මේ ඇත් අස් ඵලක ආවුද වලින් අපට මොනව කරන්නද? ශාක්‍ය කම්කරුවෝ ද මෙසේ කියති. ඔබලා දූන් කුෂ්ඨ දරුවන් අරගෙන ගර්ජන කරවුද? අනාථව යන තැනක් නැතිව තිරිසනුන් මෙන් කොලොම් ගසක විසූහ. ඔවුන්ගේ ඇතුන් අසුන් ඵලකායුධවලින් අපට මොනව කරන්නද? ඔවුහු මෙසේ ඒ කටයුතුවල නිරත ඇමතිවරුන්ට කීහ. ඇමතිවරු රාජකුලයන්ට කීහ. එයින් සහෝදරියන් සමග සංවාසය කළ ශාක්‍යයන්ගේ ශක්තිය ද බලය ද පෙන්වන්නෙමු යයි යුද්ධය සඳහා

නික්මුණාහ. කෝලියෝ ද කොලොම්ගස්වාසීන්ගේ ශක්තිය ද බලය ද පෙන්වමු යයි යුද්ධයට නික්මුණාහ. භාග්‍යවතුන් වහන්සේ ද රාත්‍රියෙහි අලුයම් වෙලෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගිට ලොව බලන්නේ මෙසේ මොවුන් යුද්ධයට නික්මෙනවා දුටහ.

එසේ දැක මා ගිය කල්හි යුදධය සංසිඳෙන්නේ ද නැද්දැයි පරීක්ෂා කරන්නේ, මම එහි ගොස් කලහය සංසිඳවීම සඳහා ජාතක තුනක් දේශනා කරන්නෙමි. එයින් කලහය සංසිඳෙන්නේය. ඉක්බිතිව සමගිය දැක්වීම සඳහා ජාතක දෙකක් දේශනා කොට අත්තදණ්ඩ සූත්‍රාන්තය දේශනා කරන්නෙමි. දේශනාව අසා උභය නගරවාසීහු දෙසිය පනහ බැගින් කුමාරවරුන් පන්සියයක් දෙන්නාහ. මම ඔවුන් පැවිදි කරවන්නෙමි. මහා සමාගමක් වන්නේයයි සනිටුහන් කළහ. එහෙයින් මේ යුදපෙරමුණට වඩින්නේ කිසිවෙකුට නොදන්වා තමන් වහන්සේම පාසිවුරු ගෙන වැඩමවා දෙසෙනග අතරෙහි අහසෙහි පලක්බැඳ සවණක් රස් විහිදුවා වැඩ උන්හ. කපිලවස්තුවාසීහු භාග්‍යවතුන් වහන්සේ දැක අපගේ ඥාති ශ්‍රේෂ්ඨයා වූ භාග්‍යවතුන් වහන්සේ වැඩියහ. අප කලහ කරන බව උන්වහන්සේ දකින ලදැයි සිතා භාග්‍යවතුන් වහන්සේ පැමිණි කල්හි අනුන් ශරීර ආයුධවලින් විනාශ කිරීමට නොහැකිය. කෝලිය නගරවාසින් අප විනාශ කළත් කමක් නැතැයි ආවුධ විසිකොට බුදුන් වැඳ සිටියහ. බුදුන් වහන්සේ දැනගෙනම මහරජ කුමක් නිසා පැමිණියේදැයි ඇසූහ. භාග්‍යවතුන් වහන්ස ජලක්‍රීඩා පිණිස නෙවේ. පර්වත ක්‍රීඩා පිණිස නොවේ. ගංගා කෙළි සඳහා නොවේ. ගිරිදසුන් සඳහා නොවේ. මහරජ කලහය කුමක් නිසාද? ස්වාමීනි, ජලය නිසා. මහරජ ජලය කොපමණ වටීද? ස්වාමීනි වටිනාකමක් නැත. පොළොව කොතෙක් වටීද? නොවටී ස්වාමීනි, ක්ෂත්‍රියා කොපමණ වටීද? ස්වාමීනි ක්ෂත්‍රියා මිල කළ නොහැකිය. නොවටිනා ජලය නිසා වටිනා ක්ෂත්‍රියන් විනාශ කරවුද? කලහයෙන් ආශ්වාදයක් නැත. කලහ වශයෙන් මහරජ, අස්ථානයෙහි වෛර කොට එක් රුක් දේවතාවෙක් කලු සිංහයකු සමග බඳින ලද වෛර ඇත්තේ, මේ මුළු කප පුරාම පැවතියේ යයි වදාරා එඳන ජාතකය වදාළේය. මහරජ අනුන් කෙරෙහි විශ්වාසය තැබිය යුතු නොවේ. අනුන් කෙරෙහි විශ්වාසයෙන් එක් සාවකුගේ කථාව අසා යොදුන් තුන්දහසක් පළල හිමවතෙහි සිව්පා ගණයා මහසමුදුර කරා දිව්වාහ. එනිසා අනුන්ගේ කියමන් නොඇසිය යුතුයි කියා පය්විළුදියන ජාතකය වදාළේය.

එයින් පසු මහරජු කිසිකලක දුර්වලයෙක් මහබලවතෙකුගේ වුවද සිදුරු විවර දකියි. කිසිවිට දුබලවූ වටු කුරුල්ලෝ ද මහත් බල ඇති ඇතා ඝාතනය කොළෝ යයි කියා ලටුකික ජාතකය වදාළහ. මෙසේ කලහය සංසිඳවීම පිණිස ජාතක තුනක් වදාරා සමගිය පැහැදිලි කර දීම සඳහා ජාතක දෙකක් වදාළේය. මහරජ සමගි වී නම් කිසිවෙකුට ඇඟිලි ගැසීමට නොහැකි යයි කියා රුක්ඛ ධම්ම ජාතකය වදාළේය. මහරජ සමගිවූවන්ගේ කිසි සිදුරක් බැලීමට නොහැකි විය. යම් කලෙක ඔවුනොවුන් කලහ කරණවිට වැදි පුත්‍රයා මරා ගෙනගියහ. විවාදයෙහි ආශ්වාදයක් නැතැයි කියා වට්ටක ජාතකය වදාළේය. මෙසේ මේ ජාතක පහ කියා අවසානයෙහි අත්තදණ්ඩ සූත්‍රය වදාළේය. රජවරු පැහැදී ශාස්තෲන් වහන්සේ නොවැඩියේ නම් අපි අපේ අත්වලින් ඔවුනොවුන් කපා කොටාගෙන රුධිර ගංගාවක් පවත්වන්නෙමු. අපගේ දූ පුතුන් ගෙදර නොදකිමු. පණිවිඩ ප්‍රති පණිවිඩ ගෙන්වන කෙනෙක්ද නැත. ශාස්තෲන් නිසා ජීවිතය ලද්දෙමු. ඉදින් ශාස්තෲන් ගිහිගේ විසුයේ නම් දෙදහසක් දිවයින් පිරිවරා සිව්මහ රජය උන්වහන්සේට අත්වේ. අතිරේක පුත්තු දහසක් වන්නාහ. එයින් ක්ෂත්‍රිය පිරිවර ඇතිවන්නාහ. දූන් සම්පත් හැරදමා සම්බෝධියට පැමිණියේය. දූනුදු ක්ෂත්‍රිය පිරිවර ඇතිව හැසිරේවයි උභය නගරවාසීහු කුමරුන් දෙසිය පනහ බැගින් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් පැවිදි කරවා මහාවනයට එළඹියහ. ඔව්හු ගුරු ගෞරවය වශයෙන් මිස තමන්ගේ කැමැත්තෙන් පැවිදි නොවූහ. එනිසා ඔවුන් පැවිද්දෙහි අනභිරති ඇති විය. ඔවුන්ගේ පැරණි බිරියෝද ඔවුන්ගේ සවාමිවරුන්ට කලකිරවා ගිහිගෙයි නොපිහිටයි ආදිය කියා හසුන් යවති. ඔව්හු වැඩිතරම් කලකිරුණාහ. භාග්‍යවතුන් වහන්සේ ආවර්ජනා කරන්නේ ඔවුන්ගේ සාසනයෙහි නොඇලීම දැක, මේ භික්ෂූහු මා වැනි බුදුකෙනෙකුන් සමග එකට වසන්නේ කලකිරෙති. ඔවුන්ට කුණාල පොකුණේ කථාව කියා එහි පමුණුවා අනභිරතිය දුරුකෙරමියි. කුණාල පොකුණේ වර්ණනාව වදාළේය. ඔව්හු එය දකිනු කැමති වූහ. මහණෙනි කුණාල පොකුණ දකිනු කැමැත්තහුද? එසේය භාග්‍යවතුන් වහන්ස. එසේ නම් එන්න යමු. භාග්‍යවතුන් වහන්ස, සෘද්ධිවන්තයන්ගේ ගමන් මගට අපි කෙසේ එන්නෙමුද? ඔබලා යනු කැමැත්ත පමණක් ඇතිකරගන්න. මම මගේ ශක්තියෙන් ගෙන යන්නෙමි. ස්වාමීන් වහන්ස, ඉතා හොඳයි. ඉක්බිති බුදුහු භික්ෂූන් පන්සියය රැගෙන අහසට නැගී කුණාල විලෙහි පිහිටුවා ඒ භික්ෂූන්ට කීහ. මහණෙනි මේ කුණාල විලෙහි මාලුන් ගේ නම් දන්නේ නැත්නම් මගෙන් අහන්න. ඔව්හු

විචාළහ. භාග්‍යවතුන් වහන්සේ ඇසූ ඇසූ දේ කීහ. මාලුන්ගේ පමණක් නොව ඒ වන ලැහැබෙහි ගස්වල ද පර්වත පාදයෙහි දෙපා සිව්පා පක්ෂීන්ගේ ද නම් අස්සවා කියා දුන්හ. ඉක්බිති පක්ෂීන් දෙදෙනෙකු හොටින් ගන්නා ලද දඬුවක සිටි කුණාල පක්ෂි රජු පෙරටුවද පසුවද දෙපාර්ශයෙහි ද පක්ෂීන් පිරිවරණ ලද්දේ එයි. භික්ෂූහු ඌ දැක, ස්වාමීනි, මොහු මොවුන්ගේ රජතුමා වන්නේයයි හඟිමි, මේ පිරිවර ඔහුගේ විය හැකිය. මහණෙනි, එය එසේය. මොහු ද මගේ වංශයේය. මගේ පරම්පරාවේය. ස්වාමීනි, අපි තව කුරුල්ලන් දකිමු. භාග්‍යවතුන් වහන්සේ, මොහු ද මගේ වංසයේය, මගේ පරම්පරාවේ යයි කියයි. එය ඇසීමට කැමතිවෙමු. කැමති ද මහණෙනි, එසේය. එසේ නම් අසන්න. ගාථා තුන්සියයකින් සරසා කුණාල ජාතකය වදාරන්නේ සාසනය කෙරෙහි නොඇල්ම දුරු කෙළේය. දේශනාවසානයෙහි සියල්ලෝම සෝවාන් පලයෙහි පිහිටියහ. මේ භික්ෂූන්ට මෙපමණක් ඇති. අහසට නැගී මහා වනයටම වැඩියහ. ඒ භික්ෂූහු යනවිට බුදුරදුන්ගේ ශක්තියෙන් ගොස් ආපසු එනවිට තමන්ගේ ශක්තියෙන් භාග්‍යවතුන් පරිවරා මහාවනයෙහි බැස්සහ. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද ආසනයෙහි වැඩවිඳ ඒ භික්ෂූන් අමතා, එන්න මහණෙනි, වාඩිවෙන්න. ඉහළ මාර්ග තුන සඳහා කෙලෙස් නැතිකිරීමට කමටහන් කියන්නෙමියි කමටහන් වදාළහ. භික්ෂූහු සිතූහ. "භාග්‍යවතුන් වහන්සේ අපගේ අනභිරතභාවය දැක කුණාල විලට පමුණුවා අනභිරතිය දුරු කළහ. එහි දී සෝවාන් ඵලයට පැමිණි අපි දුන් මාර්ග තුනට අදාල කමටහන් දුන්හ. අපි සෝවාන් පමණකින් ම ගත කිරීමට නුසුදුසුය. එවිට උතුම් පුරුෂයන් හා සමාන නොවන්නේය. ඔව්හු බුදුරදුන් වැඳ නැගිට නිසීදන ගසා දමා වෙන් වෙන්ව පර්වත පාද රුක්මුල්වල හිඳගත්හ. භාග්‍යවතුන් වහන්සේ සිතූහ. මේ භික්ෂූහු ප්‍රකෘත්තියෙන් ම නොහරින ලද කර්මාන්ත ඇත්තේ පසු බසින කාරණා නම් නැත. යන්නේ යන්නේම විදර්ශනා වඩා රහත් බවට පැමිණ තම කථා ලද ගුණ මට දන්වන්නෙමුයි මා සමීපයට එන්නාහ. මේ අය පැමිණි කල දස දහසක් සක්වල දෙවියෝ එක් සක්වලක රැස්වෙති. මහා සමාගමක් වන්නේය. විවිකත අවකාශයක මා හිඳ ගැනීම වටනේ යයි එයින් විවේක අවකාශයක ආසනයක් පනවාගෙන වැඩ උන්හ. සියල්ලට පළමු කමටහන් ගෙන ගිය තෙරහු සිව්පිළිසිඹියා සහිතව රහත් වූහ.

ඉන්පසු අනික් තෙර කෙනෙක්ද අනික් තෙර කෙනෙක්දැයි පන්සිය ම නෙළුම් කොලවල නෙළුම් මල් මෙන් පිපුණාහ. සියල්ලටම

පළමු රහත් බවට පත් භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට දන්වන්නෙමියි පලඟ දිගහැර නිසීදනය ගසාදමා නැගිට බුදුන් වහන්සේ දෙසට හැරුණේය. මෙසේ අන්‍යයන්ද වූ පන්සියම දාන ශාලාවට වඩින්නාක් මෙන් පිළිවෙළින් පැමිණියහ. පළමුවෙන් පැමිණි භික්ෂුව බුදුන් වැඳ නිසීදනය පනවා එකත් පසෙක හිඳ ලඝු ගුණය කියනු කැමතිව වෙන කිසිවක් ඇද්දැයි නැතැයි නැවතී පැමිණි මග බලන්නේ අනෙකකු දක්ක, අනිකකු දක්ක මෙසේ ඒ සියල්ලෝම පැමිණ එකත් පසෙක හිඳ මෙතෙම ඔහුගේ ගෙන එන්නේ නොකීවේය. මෙතෙමේද නොකීවේය. රහතන් වහන්සේගේ වනාහි ආකාර දෙකක් වේ. මා ලබාගත් ගුණය දෙවියන් සහිත ලෝකයා වහාම අවබෝධ කරගන්නේ නම් යයි සිතක් උපදී. ලැබූ ගුණය නිධානයක් ලත් පුරුෂයකු මෙන් අනිකෙකුට දන්වීමට කැමති නොවේ. මෙසේ රැස් වූ කල්හි ඒ ආර්ය මණ්ඩලයෙහි ප්‍රාචීන යුගන්ධරය වටකරන ලද වලාකුල, මීදුම, දුම, රජස්, රාහු යන උපක්‍රෘත මණ්ඩලයක් මෙන් නිම්වලල්ල ගෙන කරකවන රිදී සකක් මෙන් පුන්සඳ මණ්ඩල පැන අහසට පිළිපන්හ. මෙසේ මෙබඳු ක්‍ෂණයෙහි ලයෙහි මොහොතෙහි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කපිලවත්තු මහ වනයෙහි රහතන් වහන්සේ පන්සිය නමක් සමග වාසය කරති. එහි භාග්‍යවතුන් වහන්සේද මහා සම්මත වංශයෙහි උපන්හ. ඒ භික්ෂු පන්සිය නම ද මහාසම්මත කුලයෙහි උපන්හ. භාග්‍යවතුන් වහන්සේ ක්‍ෂත්‍රිය ගර්භයෙන් උපන්හ. ඔව්හුද රජකුලයෙන් පැවිදි වූහ. භාග්‍යවතුන් වහන්සේ සිහසුන හැර අතටපත් සක්විති රජය හැර පැවිදි වූහ. ඔව්හුද සිහසුන හැර අතටපත් රාජ්‍යයන් හැර පැවිදි වූහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිසිදු පිරිවර ඇත්තේ වීතරාගීව වීතරාගී පිරිවර ඇත්තේ වීත දෝසව වීත දෝස පිරිවර ඇත්තේ වීත මෝහව වීතමෝහ පිරිවර ඇත්තේ තෘෂ්ණා රහිත වූයේ තෘෂ්ණා රහිත පිරිවර ඇත්තේ නික්ලේශව නික්ලේශ පිරිවර ඇත්තේ ශාන්ත වූයේ ශාන්ත පිරිවර ඇත්තේ දාන්ත වූයේ දාන්ත පිරිවර ඇත්තේ මුක්තව මුක්ත පිරිවර ඇත්තේ අතිශයින් බබළයි. මෙය වර්ණභූමි නම් වේ. යම්පමණ ශාක්‍යයෝද එපමණ එපමණ කිවයුතු යයි කියන ලද්දේ මේ භික්ෂූන් සඳහාය. "සියල්ලෝම රහත් වූ පන්සියයක් පමණ භික්ෂූන් සමඟ" "පඤ්චමතෙහි භික්ඛු සතෙහි සබ්බෙහෙව අරහන්තෙහි'' යෙහුයෝහන - බොහෝ දෙනෙක් රැස්වූහ. ටික දෙනෙක් නො පැමිණියහ. අසඤ්ඤී, අරූපාවචර දෙවියෝද පැමිණි දෙවියෝ ද එහි මේ රැස්වීමට හැකිය. මහා වනයේ වනාහී හාත්පස දෙවියෝ සෙලවුනහ. පින්වත ඉඩදෙන්න. බුදුන් දකින්ට බණ ඇසීමට

බික් සඟන දැකීමට බොහෝ උපකාර වේ. ආයෙම ආයෙම මහා ශබ්ද කරමින් පැමිණ භාග්‍යවතුන් වහන්සේද ඒ මොහොතේ රහත් බවට පැමිණ භික්ෂු සංඝයාද එකත්පසෙක සිටියහ.

මේ උපායෙන් ම ඒ ඒ ශබ්ද අසා ශබ්දය අස් ගව්වක්, ගව්වක්, අඩ යොදුනක්, යොදුනක් ආදී වශයෙන් යොදුන් තුන්දහසක් පළල හිමවතෙහි තෙවරක් ද හැටතුන් දහසක් නගරවල, අනූනව ලක්ෂයක් දොණ මුඛවල, කෝටි අනූහය ලක්ෂයක් පටුනු ගම්වල, පනස් හයක් රුවන් ආකාරවල සියළු දඹදිව, පූර්ව විදේහය, අපරගෝයාන, උතුරුකුරු දිවයින, දෙදහසක් කුඩා දිවයින්වල, සක්වල මුළුල්ල, එයින් දෙවන,තෙවන යනාදී දස දහසක් සක්වල දෙවියෝ රැස්වූහයි දත යුතුය. දස දහසක් සක්වල යනු මෙහි ලෝකධාතු දහය අභිප්‍රේතය. එයින් කියන ලදී. "දසහි ච ලොක ධාතුහි දේවතා යෙභුය්‍යෙන සනනිපතිතා හොනති". මෙසේ රැස් වූ දෙවියන් ගෙන් බ්‍රහමලෝකය දක්වා සියළු සක්වලගැබ ඉඳිකටු කුලාවෙහි දමන ලද ඉඳිකටු මෙන් සම්පූර්ණ වූයේ වේ. එහි බ්‍රහම ලෝකයේ මෙසේ ලේසයකින් මිදුණු බුද්ධුප්පාදයෙන් අලංකාර වූ ලෝකයේ රමණීය බව දැකීම සඳහා පූර්ව දිසාවෙහි ඔසවන ලද රිදීමුවා මහා ආදාසයක් (කන්නාඩියක්) තබන ලදැයි දතයුතුය. ලෝහ ප්‍රාසාදයෙහි සත්වන මහලෙහි තබන ලද පලිඟු පාෂාණයට සමාන පහණක්, කැටක් බඹලොව සිට යටට හෙළන ලද්දේ සිව්මසකින් පොළවට පැමිණේ. මෙබඳු මහත් අවකාසයෙහි යම්සේ යට සිට දමන ලද මල් හෝ දුම් උඩට යෑමට හෝ ඉහළසිට දමනලද අබ ඇටයක් පහළට වැටීමට අතරක් නොලබයි. මෙසේ අතරක් නැතිව දෙවියෝ වූහ. සක්විති රජතුමා සිටින තැන සම්බන්ධ නොවේ. පැමිණි මහේසාක්‍ය ක්‍ෂත්‍රියෝ ද ඉඩ ලබති. පසුව පසුව අති සම්බන්ධ වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින තැන සම්බාධ රහිතය. පැමිණි මහේසාක්‍ය දෙවියෝ ද බ්‍රහමයෝ ද අවකාශ ලබති. තවද භාග්‍යවතුන් වහන්සේ ආසන්න සථානයේ මහා පරිනිබ්බාන සූත්‍රයේ කියන ලද අයුරින්ම කොස්ගසක අග පෙදෙසෙහි (වාලගග නිතතුදදන මතෙත) දහයක්, විස්සක්, තිහක් දෙව්වරු සියුම් ආත්ම මවාගෙන සිටියහ. මුලින් මුලින් හැට හැට දෙවියෝ සිටියහ. **සුද්ධාවාසකායිකානං** - සුද්ධාවාසවල වාසීන්, සුද්ධාවාස නම් පිරිසිදු වූ අනාගාමීන්ගේ වාසය වූ බඹලොව පහය. **එතදහොසි** - කෙසේ වූයේද? ඒ බ්‍රහමයෝ වනාහි සමවතට සමවැද යම් කාලසීමාවකින් නැගී සිටියේ බඹවිමන බලනුයේ පසුබතේ බත් අග මෙන් ශූන්‍යබව දක්කාහ. බඹුන් එයින් කොහේ

ගියාදැයි ආවර්ජනා කරන්නේ මහා සමාගමට යයි දැන මේ මහා සමාගමෙන් අපි වෙන්විය. වෙන්වූවන්ට අවකාස දුර්ලභය. එහෙයින් යන්නේ හිස් අතින් නැතිව එක එක ගාථා සකස්කොට යමු යයි ඒ මහා සමාගමට තමන්ගේ පැමිණි බව දන්වන්නෙමු බුදුරදුන්ගේ ද ගුණ කියමු යයි මෙසේ ඔවුන්ගේ සමාපත්තියෙන් නැගිට ආවර්ජනය මෙසේ විය.

භගවතො පුරතො පාතුරහංසු - පෙළෙහි භගවතො සනතිකේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අබිමුවෙහිම බැස්සා මෙන් යයි කියන ලදී. මෙහි එම අර්ථය නැතැයි දත යුතුය. ඔව්හු වනාහි බඹලොව සිටියේම ගාථා සංස්කරණය කොට එක්කෙනෙක් පෙරදිග පිහිටි සක්වලක මුව විටෙහි බැස්සෝය. එක්කෙනෙක් දකුණෙහි පිහිටි සක්වලක මුවවිටක බැස්සේය. එක් කෙනෙක් පැසුළු දෙස පිහිටි සක්වලක මුවවිටට බැස්සෝය. එක්කෙනෙක් උතුරු දෙස පිහිටි සක්වලක මුවවිටට බැස්සේය. පෙරදිග සක්වල මුව විටට බැස්ස දෙවියා නීලකසිණ සමාපත්තියට සමවැදී නිල් රශ්මි විහිදුවා දස දහසක් දෙවියන් වෙත මිණි සමක් මුදාහරින්නාක් මෙන් තමාගේ පැමිණි බව දන්වා බුදුරදුන් වෙත පැමිණ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියේ තමා විසින් සකසන ලද ගාථාව කීවේය. දකුණු සක්වල මුව විටයෙහි බැස්ස දෙවියා ද පීත කසින සමවතට සමවැද රන් ආලෝක විහිදුවා දස දහසක් සක්වල දෙවියන් රන්වන් වස්ත්‍රයකින් පොරවන්නාක් මෙන් තමා පැමිණි බව දන්වා එසේම කළේය. පැසුළු සක්වල මුවවිටට බැස්ස බ්‍රහ්මයා ද ලෝහිත කසිණයට සමවැදී ලෝහිත රස් මුදා දසදහසක් සක්වල දෙවියන් රතු කම්බිලියකින් වසන්නාක් මෙන් තමාගේ පැමිණි බව දන්වා එසේම කෙළේය. උතුරු සක්වල මුවවිටට බැස්ස බ්‍රහ්මයා ද ඔදාත කසිණයට සමවැදී සුදු රස් මුදාහර දස දහසක් සක්වල දෙවියන් දෑ සමන් මල්මිටක් පොරවන්නාක් මෙන් තමාගේ පැමිණි බව දන්වා එසේම සිටියේය. පෙළෙහි වනාහි භගවතො "පුරතො පාරතුහංසු" වේ. ඉක්බිති ඒ දෙවියෝ භගවතුන් වැඳ එකත්පසක සිටියහ. මෙසේ එක්විටම අබිමුවෙහි පහළවූ බව ද වැඳ එකත්පසක සිටි බවද කියන ලදි. මේ පිළිවෙළින් වූයේ යයි එකට දක්වන ලදී. ගාථා කීම පෙළෙහි වෙන් වෙන්වම කියන ලදී.

තත්‍ර මහා සමයො - විසාල පිරිසක්. පවනං - වන ලැහැබ. මේ වන ලැහැබෙහි අද දෙපිරිසේම විසාල පිරිසක් රැස්වන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ කීහ. එහෙයින් ඔවුන්ගේ ඒ රැස්වීම දැකීම සඳහා "දෙවියෝ

පැමිණියහ'' යයි කීහ. එය දෙවකාය - දේව සමූහයා. ආගතමහ ඉමං ධමම සමයං - මෙසේ පැමිණි දේව සමූහයා දැක මම ද මේ ධර්ම සමූහයට පැමිණියෙමි. කුමකටද? දකඛිතායෙ අපරාජිත සඞසං - කුමන දිනීමක්ද? තුන් මරුන් අදම මැඩ දිනනලද සංග්‍රාම ඇති මේ අපරාජිත සංඝයා දැකීමට පැමිණියහ යන අර්ථයයි. ඒ බ්‍රහමයා මේ ගාථාව කියා භාග්‍යවතුන් වහන්ස්ට වැඳ පෙරදිග සක්වල මුවවිටියෙහි ම සිටියේය. ඉන්පසු දෙවැන්නා කී අයුරින්ම පැමිණ කීවේය. තත්‍ර භිකඛවො - ඒ රැස් වූ තැන භික්‍ෂුව සමාදහංසු - එකඟවීමෙන් යෙදූහ. චිත්තමත්තනො උජුකමකංසු - තමාගේ සිත සියළු වංක, කපටි, ඇදබව හැරදමා ඍජු කළහ. සාරථීව නෙත්තානි ගහෙත්වා - අසුන් මනාව පවතින කල්හි රියැදුරා කෙවිට තබා සියළු රැහැන් ගෙන නො හසුරුවා නොවලක්වා සිටී. මෙසේ ෂ අභිඤඤා සමන්නාගත සංවර වූ ඉඳුරන් ඇති මේ භික්‍ෂු පන්සිය දෙනා, ඉන්‍ද්‍රියෙහි රකඛනති පණ්ඩිතා - භාග්‍යවතුන් වහන්ස.... උන්වහන්සේලා දැකීමටමෙහි පැමිණියෙමු. හේ ද ගොස් නියම තැන සිටියේය. ඉක්බිති තුන්වැන්නා කියන ලද පිළිවෙළින් ම පැමිණ කීවේය. එහි ජෙත්වා ඛිලං - රාග, දෝස, මෝහ හුල් සිඳදමා. ජෙත්වා පලිඝං - රාගදොස මෝහ කණායුම (සිඳ) ඉන්‍දඛීලං - රාගදෝසමොහ ම ඉන්‍දඛීල වේ. ඌහච්චමනෙජා - මේ තෘෂ්ණා සංඛ්‍යාත ඒජයන් හේතුවීමෙන් ආශාරහිත වූ භික්‍ෂුව ඉන්‍ද්‍රඛීල හැනුණු සියල්ල නැතිකර. තෙ චරනති - සිව් දිසාවෙහි නොවලක්වන ලද හැසිරීම් ඇත්තේ සංචාරය කරති. සුදධා - උපක් කෙලශ නැති. විමලො - නිර්මල වූ මෙය එහිම පර්යාය වචනයකි. චකඛුමතා - පස් ඇසින් යුක්ත වූ. සුදනතා - ඇස කන නාසය දිව කය මනස මේවායින් සංවර වූ. සුසුනාගා - තරුණ ඇතා. ඔව්හු මෙබඳු වූ අනුත්තර වූ යෝග්‍ය හැසිරීමෙන් දමනය වූ තරුණ භික්‍ෂූන් දැකීම සඳහා ආවෙමු. හේ ද ගොස් සුදුසු තැනම සිටියේය. ඉක්බිති සතරවැන්නා කී ආකාරයෙන්ම පැමිණ කීවේය. එහි ගතාසෙ - ඒකමතික සරණාගමනයෙන් සරණ ගිය. හේද ගොස් සුදුසු ස්ථානයෙහිම සිටියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බලන්නේ පෘථිවීතලයේ සිට සක්වල මුවවිටින් අකිනිටා බඹලොව දක්වා රැස්ව හුන් දෙවියන් දැක මෙසේ සිතූහ. "මේ දේව සමාගම ඉතා විසාලය. මෙපමණ විසාල දේව සමාගමක් යැයි භික්‍ෂූහු නොදනිති." එය ඔවුන්ට කියන්නේ නම් යෙහෙකි'යි මෙසේ සිතා, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් ඇමතූහ. සියල්ල විස්තර කළයුතුය. එහි එතපරමා - මෙය ප්‍රමාණවත් ය. මෙය ඔවුන්ට ප්‍රමාණ වූයේ ඒත පරමාවේ. දැන් බුදුන් අභාව නිසා ''යම් ඒ භික්‍ෂූහු

දූත්'' තෙවන වර නොකියන ලදී. ආවිකඛිස්සාමි භිකඛවෙ - කුමක් හෙයින් කීවේද? දෙවියන් ගේ, සිතේ යහපත් බව ඇති කිරීම සඳහාය. දෙවියෝ වනාහි මෙසේ සිතූහ. "භාග්‍යවතුන් වහන්සේ මේ මහා සමාගමේ මහේසාක්‍ය දෙවියන්ගේ නම් පමණක් කියන්නේය. අල්පේ සාක්‍යයන්ගේ නම් කියන්නේද?" ඉක්බිති බුදුහු මේ දෙවියන් කුමක් සිතන්නේ දැයි ආවර්ජනා කරන්නේ, මුඛයෙන් අත ඇතුල්කොට හෘදය මාංශය මඩින්නා සේ බඩු සහිත සොරු ගන්නාක් මෙන් ද ඔවුන්ගේ ඒ සිත් හැසුරුණු ආකාරය දැන, දස දහසක් සක්වලින් පැමිණි අල්පේශාක්‍ය මහේශාක්‍ය සියළු දෙවියන්ගේ නම් කියන්නෙමි යයි සිතූහ. බුදුවරයෝ නම් ඉතා මහත් වූ සත්ත්ව විශේෂ කෙනෙක්හ. දෙවියන් සහිත ලෝකයාගේ දුටු, ඇසු, ස්පර්ශ, කළ, සිතූ, පැමිණි, සෙවු, අනුව හැසුරුණු සිත්, කිසිතැන කිසිවක් නිල් ආදි වශයෙන් බෙදන ලද රූප අරමුණුවල රූප අරමුණක් හෝ බෙර ශබ්ද වශයෙන් බෙදනලද ශබ්ද අරමුණුවල වෙන්වෙන් ශබ්ද අරමුණු හෝ යමක් ඇත්ද ඒ සියල්ලම ඤාණයට නො එන්නේ නොවේ. යම්සේ කීය. "මහණෙනි, සදේවක ලෝකයෝ යම් දෙවියන් සහිත මිනිසුන් ' දුටු සිතු සපර්ශ කළ දැනගත් පැමිණි, සෙවූ අනුව හැසුරුණු සිත් වේද ඒවා මම දනිමි. ඒවා මම දකිමි. ඒවා මම දැනගතිමි''. මෙසේ සියළු තැන නොනැසෙන ඤාණය භාග්‍යවතුන් වහන්සේ ඒ සියළු දේවතාවෝ සුදුසු නුසුදුසු වශයෙන් කොටස් දෙකක් කළහ. යම් කෙනෙක් කර්මාවරණෙයෙනි යුක්ත දැයි ආදි නයින් කියන ලද සත්‍වයන් අභබ්බ නම් වේ. ඔවුහු බුදුන් සමග එක් විහාරයක වාසය කළත් බුදුන් නොදකිති. ඊට වෙනස් වූයේ භබ්බ නම් වේ. ඔහු දුර වාසය කළද ගොස් සංග්‍රහ ලබති. එහෙයින් ඒ දේවතා රැස්වීමේ අභබ්බයන් හැර භබ්බයන් පිළිගත්හ. පිළිගෙන මෙපමණක් රාග චරිතයෝය, මෙපමණක් ද්වේශ චරිතයෝයයි, චරිත වශයෙන් කොටස් හයක් කළහ. අනතුරුව ඔවුන්ට ගැලපෙන ධර්ම දේශනා පරීක්ෂාකර බලන්නේ රාග චරිත දෙවියන්ට සම්මා පරිබ්බාජනීය සූත්‍රය දේශනා කරන්නෙමි. දෝස චරිතයන්ට කලහ විවාද සූත්‍රය, මෝහ චරිතයන්ට මහා ව්‍යුහ සූත්‍රය, විතක්ක චරිතයන්ට චූලල ව්‍යුහ සූත්‍රය, ශ්‍රද්ධා චරිතයන්ට තුවටක ප්‍රතිපදාව, බුද්ධි චරිතයන්ට පුරාභේද සූත්‍රය කියන්නෙමියි දේශනාව නියමකොට නැවත ඒ පිරිස මෙනෙහි කෙළේ, ධර්මය දැන ගන්නේ අත්තජ්ඣාසයෙන ද පරජ්ඣාසයෙන් ද අට්ඨුප්පත්තියෙන් ද පුච්ඡා වශයෙන් දැයි බැලීමටය. එයින් පුච්ඡා වශයෙන් දැනගන්නේ යයි දැන, දෙවියන්ගේ අදහස් වෙත චරිත වශයෙන් ප්‍රශ්න ඇසීමට ඒ භික්ෂූන් පන්සිය දෙනා අතරෙන් කිසිවෙක්

ඇද්දැයි බලන්නේ එක්කෙනෙකුටවත් හැකි නොවන බව දැක්කහ. ඉන්පසු අසූමහ ශ්‍රාවකයන් අග්‍ර ශ්‍රාවක දෙනම ගැන බලා ඔව්හු ද නොහැකිවෙත් යයි දැක සිතූහ. ඉදින් පසේ බුදුන්හු හැකිවන්නාහු දැයි බලා උන්වහන්සේ ද නොහැකි වන්නාහැයි දැක සක්‍ර සුයාමාදි කිසිවෙක් හැකිවන්නාහු දැයි බැලූහ. ඔවුන් අතර ද කිසිවෙකුට හැකිවයි නොදුටුවහ. ඉක්බිති "මා වැනි බුදුකෙනෙකුන්ට අනාගත ඥාණය පතුරුවා බලන්නේ වෙනත් බුදු කෙනෙකු නොදුටහ. මෙය අසිරිමත් නොවේ. දැන් තමා සමාන කෙනෙකු නොදකින්නේ. උපන් දිනයෙහි ද බ්‍රහමජාල සූත්‍ර වර්ණානාවේ කියන ලද නයින් තමා හා සමාන කෙනෙකු නොදක්නේ අගෙගාහමසම් ලොකසස පැවැත්විය නොහැකි සිංහනාදය කෙළේය. මෙසේ තමා හා සමාන කිසිවකු නොදැක සිතූහ. ඉදින් මම විචාරා මමම විසඳන්නේ නම් මේ දෙවිවරුන්ට අවබෝධකර ගැනීමට නොහැකි වේ. අනික් බුදු කෙනෙකුන් විචාරන කල්හි මා විසඳන විට ආශ්චර්ය වන්නේය, දෙවියන්ට අවබෝධ කර ගැනීමට ද හැකි වේ. එහෙයින් නිර්මිත බුදු කෙනෙකුන් මවන්නෙමි යයි අභිඥා පාදක ධ්‍යානයට සමවැදී නැගිට පාසිවුරු ගැනීම, ඉදිරිය බැලීම වටපිට බැලීම, දිග හැරීම හැකිලීම මා හා සමාන වේවායි කාමාවචර සිත්වලින් පරිකර්ම කොට ප්‍රාචීන යුගඳුරු වටකළ ඉහලට නැගෙන සඳමඬල බිඳ නික්මෙන්නාක් මෙන් රූපාවචර සිතින් අධිෂ්ඨාන කළහ. දේව සමූහයා ඒ දැක පින්වත් අනිත් හඳක් උදා වී යයි කීහ. පසුව එම සඳ හැර ආසන්නයට පැමිණි විට, සඳ නොවේ, හිරු උදාවෙයි. ආසන්නයට පැමිණි විට හිරු නොවේ, දෙව්විමණක්. ආසන්න වූ පසු දෙව් විමනක් නොවේ, දිව්‍ය පුත්‍රයෙක්. ආසන්නවූ පසු දෙව්පුතකු නොව මහා බ්‍රහමයාය, මහ බඹු නොවේ, පින්වත, තවත් බුදුකෙනෙක් වැඩියහයි කීහ. එහි ආර්ය දෙවියෝ සිතූහ. එක් ලෝක ධාතුවක බුදුවරයෝ දෙදෙනෙක් නැත. භාග්‍යවතුන් වහන්සේ තමන් හා සමාන වෙනත් බුදු කෙනෙකුන් ඒකාන්තයෙන්ම මවන ලදී. පෘථග්ජන දෙවියෝ මෙසේ සිතූහ. එක් බුදු කෙනෙකුට මෙපමණ දේව සන්නිපාතයක් නම් දෙදෙනෙකුට කෙතරම් මහත්වේද, ඉක්බිති ඒ දේව සමූහයා දකිද්දීම නිර්මිත බුදුහු වැඩ දශබලයන් නොවැඳම හමුවූ තැන සම සම කොට මවන ලද අසුනෙහි උන්නහ. භාග්‍යවතුන් වහන්සේ ගේ දෙතිස් මහ පුරුෂ ලක්‍ෂණ නිර්මිත බුදුන්ට ද එසේ විය. භාග්‍යවතුන් වහන්සේ ගේ ශරීරයෙන් සවණක් රස් නික්මෙති. නිර්මිත බුදුන්ගේ ශරීරයෙන් ද එසේවිය. බුදුරදුන්ගේ ශරීර රශ්මි නිර්මිත බුදුන්ගේ ශරීරයේ වැදෙයි. නිර්මිත බුදුන්ගේ ශරීර රශ්මි බුදුන්ගේ කයේ වැදෙයි. ඒ බුදුවරුන්

දෙදෙනාගේ ම ශරීරවලින් උඩට නැගී අකනිටා භවාග්‍රයෙහි වැදී එයින් නැවතී දෙව්වරුන්ගේ හිස් මුදුන්වල බැස සක්වල මුවවිට පිහිටියේය. සියළු සක්වල ගබ රුවන්මුවා වක් ගොණැස් වෙළුවක් මෙන් සෑ ගෙය බැබැලිණි. දස දහසක් සක්වල දෙවියෝ එක් සක්වලක රැස් වී බුදුවරු දෙනමගේ රස් ගබට පිවිස සිටියහ. නිර්මිත බුදුහු හිඳගෙනම දසබල බුදුන්ගේ බෝපලගෙහි ක්ලේශ ප්‍රහානයට ස්තුති කරන්නේ

අසම් මුනි නුවණැති - සිටි තෙරග පිරිනිවි තුණ
ගෙන් නික්ම හැර කම් - හෙ බික් කිසෙ ලොවැ ඇවිදී

ගීය ගැයූ, ශාස්තෲන් වහන්සේ දෙව්වරුන්ගේ සිත් කලණතා දැන ගැනීම සඳහා ආ පිළිවෙළින් නම්හොත් කියන්නෙමියි සිතා "මහණෙනි, කියන්නෙමි"යි ආදිය කීහ.

එහි සිලොකමනුකසසාමි - නියමිත අකුරු පදවචන සමූහය පවත්වන්නෙමි. යත්‍ථ භුමමා තදසසිතා - යම් යම් තැන්වල බිම් දෙවියන් ඒ ඒ ඇසුරු කොට, යෙ සිතා ගිරිගබහාරං - ආදියෙන් ඒ භික්ෂූන්ගේ වර්ණනාව කළහ. යම් භික්ෂූහු පර්වත ගුහා ඇසුරු කළහ. යන අර්ථයයි. පහිතතතා - යවන ලද. සමාහිතා - වික්ෂිප්ත නොවූ. පුථු - බොහෝ දෙනා. සීහාව සලලීනා - සිංහයන් මෙන් සැඟවී. හුදකලා බවට පැමිණියහ. ලොමහංසාභිසමභුනො - ලොමු දැහැ ගැනීම අබිබවා සිටියහ. නිර්භය යයි කියන ලද්දේ වේ. ඔදාත මනසා සුදධා - සුදු සිත් ව, පිරිසිදුව, විපපසනනමනාවිලා - ප්‍රසන්න වූ, නොකැළඹුනා වූ. භීයොා පඤචසතෙ ඤත්වා - සම්මා සම්බුදුන් සමග අතිරේක පන්සියයක් භික්ෂූහු දැන. වනෙ කාපිලවත්‍ථවෙ - කපිලවසතුව සමීපයෙහි හටගත් වනරොදෙහි. තතො ආමනතයී සත්‍ථා - එකල ඇමතුහ. සාවකෙ සාසනෙ රතෙ - තමන් වහන්සේගේ ධර්ම දේශනාව අවසානයේ ඇතිවන ශික්ෂාත්‍රයෙහි ඇලුණු ශ්‍රාවකයන්. සාසනයෙහි ඇලුණු හෙයින් "සාසනෙ රතෙ", " සිලොක මනු කසසාමි" මේ සියළු වචනයෙන් අන් කෙනෙක් කියන ලද්දාක් මෙන් කොට කියති.

දෙවකායා, අභිකකනතා තෙ විජානාථ භිකඛවො - ඔවුන් දිව ඇසින් දැනගන්න යයි ඒ භික්ෂූන්ට දිව ඇස් නුවණ ඇතිකර ගැනීම සඳහා වදාරති. තෙ ච ආතපපමකරුං සුත්වා බුදධසස සාසනං - ඒ

භික්ෂූහු ද බුද්ධානුශාසනය අසා එකෙනෙහිම ඒ සඳහා වීර්ය කළහ. මෙසේ වීර්ය කරද්දීම. **තෙසං පාතුරහු ඤාණං** - කෙබඳුද? අමනුසසාන දසසනං දිව ඇස් නුවණ පහළ විය. උන්වහන්සේලා විසින් ඒ අවස්ථාවේ පරිකර්ම කොට උපදවන ලද්දේ නොවේ. ආර්ය මාර්ගයෙන්ම එය උපදවන ලදී. අමනුෂ්‍යයන් දැකීම පිණිස උත්සාහය පමණක් කරන ලදී. ශාස්තෘන් වහන්සේ ද ඔබලාට ඤාණය ඇත. එය ඉදිරියට ගෙන ඔවුන් දැන ගන්න යයි මේ සඳහාම තෙ විජානාථ භික්ඛවො - යයි කීහ. **අපෙපකෙ සතමදදකඛුං** - ඒ භික්ෂූන් අතරෙන් සමහරෙක් අමුනුෂයන් සියයක් දැක්කහ. **සහසසං අථ සතතතිං** - කෙනෙක් දහසක් කෙනෙක් හැත්තෑ දහසකි. **අපෙපකෙනනත මදදකඛුං** බොහෝ දැක්කහ. සිය ගණන් වශයෙන් දහස් ගණන් වශයෙන් වෙන්කළ නොහැකි තරම් දැක්කහයි යන අර්ථයයි. කුමක් හෙයින්ද? **යම්සේ දිසා සබබා ඵුටා අහු** - බර වූ සම්පූර්ණව ද වූහ. **තඤච සබබං අභිඤඤාය** - ඔවුන් අතුරෙන් එක් එක්කෙනා යමක් දකින ලදද ඒ සියල්ල දැන, **වවකඛිතවා චකඛුමා** - අල්ලෙහි රේඛාවක්මෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් නියම කොට, පස් ඇසකින් වූයේ **චකඛුමා** - ශාස්තෘන් වහන්සේය. **තතො ආමනතයී** - පෙර කියන ලද ගාථාවම නම්හොත් දැක්වීම සඳහා කීහ. ඔබලා මොවුන්. **විජානාථ** - බලන්න, දකින්න. **යෙ වො අහං කිතතයිසසාමි** - මෙය එහි සම්බන්ධයයි. **ගිරාහි** - වචනවලින්. **අනුපුබබසො** - අනුපිළිවෙළින්. **සතත සහසසා යකඛා භුමමා කාපිලවඣවා** - මෙහි සත්දහසක් ඔව්හුද කපිලවසතු නිසා උපන් බූමාටු යක්ෂයෝ යයි කියයි.

**ඉදධිමනෙතා** - දිව්‍ය සෘද්ධියෙන් යුක්ත. **ජුතීමනෙතාආනුභව** සම්පන්න. **වණණවනෙතා** - ශරීර වර්ණයෙන් යුත්. **යසසසිනො** - පිරිවරින් යුත්. **මොදමානා අභිකකාමුං** - සතුටු සිතින් ආවාවූ. **භිකඛුනං සමිතිං වනං** - මේ මහාවනයෙි භික්ෂූන් සමීපයට, භික්ෂූන් දැකීම සඳහා පැමිණියා වූ, හෙවත් **සමිතිං** - සමූහය. භික්ෂු සමූහය දැකීම සඳහා පැමිණියාහු යනු අර්ථයයි. **ඡ සහසසා හෙමවතා යකඛා නානතත වණණිනො** සදහසක් හිමවි පව්වෙහි උපන් යක්කු. ඒ සියල්ලෝ නීලාදි වශයෙන් නොයෙක් වර්ණ ඇත්තෝය. **සාතාගිරාති සහසසා** - සාතාගිරි පව්වෙහි තුන්දහසක් යක්කු. **ඉවෙච තෙ සොළස සහසසා** - මේ සියල්ලෝම දොලොස් දහසක් වෙති. **වෙසසාමිතතා පඤචසතා** - වෙස්සාමිත්ත පව්වෙහි උපන් පන්සීයක්. **කුමහිරො රාජගහිතො** - රජගහනුවර උපන් කුම්භීර යකා. **වෙපුලලසස නිවෙසතං** - වේපුල්ල

පච්ච ඔහුගේ නිවේසනයයි. නිවාස සථානය යන අර්ථයි. **භියෙයා නං සත සහසසං යකඛානං පයිරුපාසති** - අතිරේක යකුන් ලක්‍ෂයක් හේ ඇසුරු කරයි. **කුමභීරො රාජගහිතො සොපාග සමිතිං වනං** - පිරිවර සමග ඒ කුම්භීර යක්‍ෂයා ද භික්‍ෂු සමූහයා දැකීම සඳහා මේ වනයට පැමිණියේය. **පුරිමඤච දිසං රාජා ධතරටෙඨා තං පසාසති** - පෙරදිග අනුසාසනා කරයි. **ගණධබබානං ආධිපති** - සතර දිසාවෙහි ගන්ධබ්බයන් ගේ දෙටුවා. ඒ සියල්ලෝ ඔහු යටතෙහි වසති. **මහාරාජා යසසසි සො** - මහත් පිරිවර ඇති මේ මහරජ. **පුතතාපි තසස බහවො ඉඤනාමා මහබබලා** - ඒ ධතරට හේ මහත් බල ඇති බොහෝ පුත්තු. ඒ සියල්ලෝම සක්දෙව් රජුගේ නම දරති. **විරූළෙහා තං පසාසති** - ඒ දිසාව විරූල්හ අනුසාසනා කරයි. **පුතතාපි තසස** - ඔහුට ද එබඳු වූ පුත්තු වෙති. පෙළෙහි වනාහි මහබ්බලා යයි ලියති. අටුවාවල මහාබලා යයි පාඨය වේ.

පෙරදිගෙහි ධතරට - දකුණෙහි විරූල්හක වේ
විරූපක් බටහිර - උතුරෙහි කුවෙර වන්නේ
සිව් මහරජහු ඒ - සිව් දිසා හාත්පසෙහි ම
දිලිසෙමින් සිටියහ - වනයෙහි කිඹුල්වත් නම්

මේ ගී වනාහි සර්ව සංග්‍රාහික වශයෙන් කියන ලදී. එහි අර්ථය මෙසේය. දස දහසක් සක්වළෙහි ධතරට්ඨ නම් මහරජ ඇත. කෝටි ලක්‍ෂයක් කෝටි ලක්‍ෂයක් ඒ සියළු ගන්ධබ්බ පිරිවර පැමිණ නැගෙනහිර දිසාවෙහි කපිලවසතු වනයෙහි සිට සක්වල ගැබ පුරා සිටියහ. මෙසේ දකුණු ආදි දිසාවල විරූල්හකාදීහු සිටිහ. එසේ හෙයින් කීය. **සමනතා චතුරො දිසා දදලලමානා අටඨංස** - මෙය කියන ලද්දේ වේ. සියළු සක්වලවලින් පැමිණ සතර දිසාවෙහි පර්වත මුදුනෙහි ගිනිකඳක් මෙන් මනාසේ දිලිසෙමින් සිටියහ. ඔව්හු වනාහි කපිලවසතු වනය සඳහා පැමිණියහ. එහෙයින් සක්වල පුරවා සක්වළ හා සමානව සිටියෝ ද. **වනෙ කාපිලවතථවේ** - යයි කියන ලදී. **තෙසං මායාවිනො දාසා ආගු වඤචනිකා සඨා** - ඒ මහරජවරුන් ගේ කරන ලද පව් වසන ලක්‍ෂණ වූ මායාවෙන් යුකත වූ කපටි හැසිරීම් ඇති දාසයෝ වෙති. ඔව්හු හමුවෙහි නො හමුවෙහි වංචාවලින් ලෝකයා වංචා කරන හෙයින් වචංනිකා යයි ද කෛරාටික රැවටීම්වලින් යුක්ත හෙයින් සඨා යයිද කියති. ඔව්හු ද ආවෝ යන අර්ථයයි. **මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු විටුචච විටුඩො සහා** - ඒ සියළු දාසයෝ රැවටිලිකාරයෝය. නම් වනාහි මෙහි එකෙක්

කුටෙණ්ඩුය, එකෙක් වේටෙණ්ඩුය, එකෙක් විටුච්චය, එකෙක් විටුඩෝය. සහා - ඒ විටුඩ ද ඔවුන් සමග ආවේය. චන්‍දනො කාම සෙට්ඨො ච කිනනිඝණ්ඩු - තවද කිනනු ඝණ්ඩු නම්. පෙළෙහි කින්නිඝණ්ඩු යයි ලියති. නිඝණ්ඩුච - නිඝණ්ඩු නම් අනිකෙක්. මෙපමණක් දාසයෝ, ඉතිරි අය වනාහිඃ

පනාද ඕපමඤ්ඤ - දේවසූත මාතලී
සිත්සෙන් ගඳඹ සහ - නලරජ ජනවසබ යන
පැමිණියහ පන්සිළු - තිඹරු සූරිය වච සා

මේ දෙව් රජවරු එහි දෙවසූත - දෙව් රියැදුරු. චිතන සෙනො - චිත්ත සහ සේන. ගන්‍ධබ්බ - චිතන සේන ගඳඹ කය ඇත්තෝය. ඔවුන් පමණක් නොව පනාදාදීහු ද ගඳඹයෝය, නළොරාජා - නළකාර දෙව්පුත්. ජනවසභො - ජනවසභ දෙව්පුත්. ආග පඤ්චසිඛො චෙව - පංචසිඛ දෙව්පුත් ද ආවේය. තිම්බරූ - තිම්බරු නම් ගඳඹ දෙව්පුත්. සූරිය වච්චසා - ඔහුගේ දියණිය. එතෙචඤ්ඤෙච රාජානො ගන්‍ධබ්බා සහ රාජුභි - මේ නම් වශයෙන් කියන ලද ගඳඹ රජවරු. මේ රජවරුන් සමග අන්‍ය වූ බොහෝ ගඳඹයෝ. මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං - තුටුපහසු සිතින් මේ වනයේ භික්ෂූන්ගේ සභාවට පැමිණියේ යන අර්ථය වේ. අථාගු නාභසා නාගා වෙසාලා සහ තච්ඡකා - නාභස විල්වාසී ද වේසාලිය වාසී නාගයෝ සහ නාග පිරිස පැමිණියහ. කම්බලස්සතරා - කම්බල ද අස්සතර ද. මොව්හු සිනේරු පාදයෙහි වසති. සුපර්ණයන්ට ගත නොහැකි මහේසාඛ්‍ය නාගයෝය. පායා ගා සහ ඤාතිභි - ප්‍රධාන තීර්ථවාසීහුද ඤාති සමූහයා සමග පැමිණියහ. යමුනා ධතරට්ඨා ච - යමුනා වාසීහු ද ධතරට්ඨ කුලයෙහි උපන් නාගයෝ ද එරාවණො මහානාගො - ඒරාවණ දෙව් පුත්. ජාතියෙන් නාග වේ. මොහු නාග ව්‍යහාරයෙන් ව්‍යවහාර කරයි. සොපාගා - හේද ආවේය.

යෙ නාගරාජෙ සහසා හරන්ති - මේ කියන ලද ආකාර නාගයන් ලෝභයෙන් යුක්තව සාහසිකව ගෙනයත්. ගනිති. දිබ්බා දිජා පක්ඛි විසුද්ධ චක්ඛු - දිව්‍යානුභවයෙන් දිව්‍ය, මව්කුසෙන් ද බිජුවටින්දැයි දෙවරක් උපන්නාහයි ද්විජ වෙත්. පියාපත් ඇති නිසා පක්ඛි වේ. යොදුන් සියයක් අතරෙහි ද යොදුන් දහසක් අතරෙහි ද නාගයන් දැකීමට සමත්

ඇස් ඇති බැවින් විසුද්ධ චක්ඛු වෙති. **වෙහාසයා තෙ වනමජ්ඣපත්තා** - ඔව්හු ආකාශයෙන් මේ මහා වනයට පැමිණියහ. **චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමං** - ඔවුන්ගේ චිත්‍රා, සුපර්ණා නම් වේ. **අභයං තදා නාගරාජානමාසි සුපණ්ණතො ඛෙමමකාසි බුද්ධො** - ඒ නිසා ඔවුන් **සියල්ලෝම සණ්හාහි වාචාහි උපවහයන්තා** - ඔවුනොවුන් මිතුරන් මෙන් ද නෑයින් මෙන්ද කතාබස් කරන්නේ සතුටුවන්නේ, වැළඳගන්නේ අත් ගන්නේ අංශකූටයෙහි අත තබන්නේ තුටුපහටු සිතින් **නාගා සුපණ්ණා සරණ මගංසු බුද්ධං** - ඔව්හු බුදුන්ම සරණ ගියහ.

**පෙර ජිතා වජිර හත්ථෙන** - ඉන්ද්‍ර නම් දෙව්රජතුමා විසින් දිනන ලදී. **සමුද්දං අසුරාසිතා** - මහ සමුද්‍රවාසී අසුරයන් දිනන ලදී. සුජාතා නම් අසුර කන්‍යාව සම්බන්ධව, **සියළු භාතරො වාසවසෙසතෙ ඉද්ධිමන්තො යසස්සිනො** - ඔවුන් අතරෙහි **කාලකඤ්ජා මහාභිංසා** - කාලකඤ්ජයෝ ද බිහිසුණු ආත්මභවයක් මවා පැමිණියහ. **අසුරා දානවෙඝසා** - දාන වෙඝස නම් අන්‍යයන්ට දුනු ශිල්පය දෙන අසුරයා, **වෙපචිත්ති සුචිත්ති ච පහාරාදො නමු චී සහා** - වෙපචිත්ති අසුරයා, සුචිත්ති අසුරයා, මේ අසුරයෝද නමුචි ද දිව්‍යපුත්‍ර මාරයා මොවුන් සමග පැමිණියහ. මේ අසුරයෝ මහා සමුද්‍රය වාසීහුය. මේ පරනිර්මිත දේව ලෝක වාසී කුමක් හෙයින් මොවුන් සමග ආවෝද? අකමැතිබව, ඔව්හු අකමැති අභබ්බයෝය. මේ අයද ඔවුන් හා සමානය. එහෙයින් ධාතු වශයෙන් සසඳන්නේ පැමිණියහ. **සතඤ්ච බලිපුත්තානං** - බලි නම් මහා අසුරයාගේ පුත්තු සියය. **සබ්බෙ වෙරො ච නාමකා** - සියල්ලෝ තමන්ගේ මාමා වූ රාහුගේ නම දරති. **සන්නයහිත්වා බලිංසෙනං** - තමාගේ බලි සේනාව සන්නාහ සන්නද්ධව. **රාහු භද්දමුපාගමුං** - රාහු අසුරේන්ද්‍රයා පැමිණියේය. **සමයො දානි භද්දනෙත** - භද්‍රය, කාලය ඔබට වේ. ඔබට භික්ෂූන් දැකීමට යන අර්ථය වේ. **ආපො ච දෙවා පඨවී ච තෙජො වායො තදාගමුං** - ආපෝ කසිණ ආදියෙහි අරමුණු ගෙන භාවනා කොට ඉපදුණු ආපෝ යනාදි නම් ඇති දෙවියෝ එදා පැමිණියහ. **වරුණා වාරුණා දේවා සොමො ච යසසා සහ** - වරුණා, වාරුණ, සොම යයි නම් ඇති දෙවියෝ යසසා නම් දෙවියා සමග ආවෝය යන අර්ථය වේ. **මෙත්තා කරුණා කායිකා** - මෛත්‍රී ධ්‍යානයෙහිද කරුණාධ්‍යානයේද පරිකර්ම කොට උපන් දෙවිවරු. **ආගු දෙවා යසස්සිනො** - මේ මහා යසස් ඇති දෙවියෝ පැමිණියහ. **දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො** - ඔව්හු දස ආකාරයකින් සිටියහ. දෙවියෝ දහ දෙනා නීලාදි වශයෙන්

විවිධ වර්ණ ඇත්තෝ වූහ. වෙණ්හු ච දෙවා - වෙණ්හු දෙවියාද, සහලී - සහලී දෙවියාද, අසමා ච ද්වෙ යමා - අසම දෙවියා යමක දෙවිවරු දෙදෙනාද. චන්දස්සූපනිසා දෙවා චන්දමාග පුරක්ඛත්වා - චන්ද්‍ර නිශ්‍රිතක දෙවියෝ චන්ද පෙරටුකොට පැමිණියහ. එසේම සූරිය නිසසිතක දෙවියෝ ද සූරියමාගු පුරකඛතවා නකඛතතානි පුරකඛතවා - නකඛතත නිසසිතක දෙවියෝද නකඛතතයන් පෙරටුකොට පැමිණියහ. ආගු මන්දවලාහකා - වාත අබ්භ උණ්හ යන වලාහකයෝ සියල්ලෝම මන්දවළාහක යයි කියනු ලැබේ. ඔව්හුද ආවෝය යන අර්ථය. වසූනං වාසවො සෙට්ඨො සක්කොපාග පුරින්දදො - වසුදෙවියන්ගේ ශ්‍රේෂ්ඨයා වූ වාසවයා සක්‍ර යයි ද පුරින්දද යයි ද කියනු ලැබේ. හේ ද ආවේය.

දසෙතෙ දසධා කායා - මේ දෙවියන් දහදෙනා දස ආකාරයකින් ආහ. සබ්බෙ නානත්තවණ්ණිනො - නීලාදි වශයෙන් විවිධ වර්ණය. අථාගු සහභූ දෙවා - ඉක්බිති සහභූ නම් දෙවියා ආවේය. ජලමග්ගී සිඛාරිව - ගිනිදැල්ලක් මෙන් දිලිසෙන ඔවුන්ගේ මේ නම් ද කියන ලදී. අරිට්ඨකා ච රොජා ච - අරිට්ඨ, රෝජ දෙවිවරු ද. උම්මා පුප්ඵනිභාසිනො - උම්මා පුප්ඵ දෙවියෝ නම් එක් දේව කොටසකි. ඔවුන්ගේ ශරීර ආලෝකය දිය බෙරලිය මල් වැනි නිසා උම්මා පුප්ඵනිභාසිනො යයි කියනු ලැබේ. වරුණා සහධම්මා මේ දෙවිවරු දෙදෙනෙකි. අච්චුතා ච අනෙජකා - අච්චුතා අනෙජක දෙවිවරු. සුලෙය්‍ය රුචිරා ආගු- සුලෙයති සහ රුචිර දෙවිවරු පැමිණියහ. දසෙතෙ දසධා - මේ දේවකාය දහයද දස අයුරින් පැමිණියහ. ආගු වාසවනෙසිනො - වාස වන වාසි දෙවියෝ ද පැමිණියහ. සමානා මහා සමානා සමාන මහා සමාන දෙවියෝ. මානුසා මානුසුත්තමා - මානුසද මානුසුත්තම ද දෙවියෝ. ඛිඩ්ඩා පදූසිකා ආගු ආගු මනොපදූසිකා - ඛිඩ්ඩාපදූසික මනෝපදූසික දෙවිවරු පැමිණියහ. අථාගු හරයො දෙවා - හරි නම් දෙවියා පැමිණියේය. යෙ ච ලොහිත වාසිනො - ලෝහිතවාසීහු ද පැමිණියහ. පාරගා මහා පාරගා - මේ දෙදෙනාද පැමිණියහ. සුක්කා කරුම්හා අරුණා ආගු වෙඝනසා සහ - මේ සුක්කාදි තිදෙනා වෙඝනස සමග පැමිණියහ. ඔදාත ගය්හා පාමොක්ඛා - ඕදාත ගය්හ නම් පාමොක් දෙවියො පැමිණියේය. ආගුදෙවා විචක්ඛණා විචක්ඛණ නම් දෙවියා පැමිණියේය. සදාමත්තාහාරගජා සදාමත්ත හාරගජ දෙවිවරුද මිස්සකා ච යසස්සිනො - කීර්ති ඇති මිස්සක දෙවියා ද ථනයං ආගු පජ්ජුනෙතා - පජ්ජුනන දෙවිරජද ගුගුරමින් ආවේය. යො දිසා අභිවස්සති - හේ යන යන තැන

වැසි වසී. වේම්භියා තුසිතා යාමා - බෙම්ය දෙවියෝ ද තුසිත පුර වාසීහු ද යාම දෙව්ලෝ වාසීහු ද කටඨකා ච යසසසිනො - යසස් ඇති කඨක දෙවියෝ ද, ලමබිතකා ලාමසෙටඨා - ලම්බීතක ලාම සෙටඨ දෙවිවරු ද, ජෝති නාමා ච ආසවා - පර්වත මුදුනේ කරන ලද ගිනි කඳක් බබළන ජෝති නම් දෙවියෙක් ඇත. ඔහු ද ආසව දෙවියාද පැමිණියෙහි යනු අර්ථයයි. නිමමාන රතිනො ආගු අථාගු පරනිමමිතා දසෙතෙ දසධා කායා - මේ දේව දසදෙනා දස අයුරින් පැමිණියහ. සබ්බෙතෙ දෙවනිකායා මේ අපෝ දේව ආදි ඡ දස සටඨි හය දහය හැට සියළු දේව නිකාය නිල් ආදි වශයෙන් විවිධ වර්ණ ඇත්තාහ. නාමනවයෙන ආගඤ්ජුං - නාම කොටසින් පැමිණියහ. යෙ චඤ්ඤෙ සදිසා සහ - ඔවුන් හා සමාන තවත් අන්‍ය වූ, වර්ණයෙන් ද නාමයෙන් ද ඔවුන් හා සමාන වූ, සෙසු සක්වල දෙවියෝ ද පැමිණියහ යයි එක් පදයකින් කලාප මෙන් එකතු කොට සියලු දෙවියෝ දක්වයි. මෙසේ දස දහසක් ලෝක ධාතුවල දෙවියන් දක්වා දූත් යම් කරුණක් සඳහා ඔවුන් පැමිණියේද එය දක්වන්නේ පවුඤ්ඨ ජාතිං - ගාථාව කීහ. එහි අර්ථය පවුඤ්ඨා වෙන් වූ ජාති ඔවුන්ටනුයි ආර්ය සංඝයා පවුඤ්ඨ ජාති නම් වේ. ඒ පවුඤ්ඨ ජාතිය රාග දෝස මෝහ හුල් නැතිහෙයින් අඛිල වූ සිව් ඕඝයන් තරණය කොට සිටි බැවින් ඔඝතිණ්ණවූ - සිව් ආශ්‍රවයන් නැති හෙයින් අනාසව වූ ආර්ය සංඝයා දකෙඛම දකිමු. ඒ ඕඝයන්ගෙන් එතෙර වූ බැවින් ඔගතරං අසිතාතිගං - තෘෂ්ණා දෘෂ්ටි ආශ්‍රය නොකළ බැවින් අතීත වූ සියළු ආකාරයෙන් අතීත වූ චන්‍දංච සඳ සේ බබළන දසබල තථාගතයන් ද දකිමු. ඒ සියල්ලෝම නාමයෙන් හා පරම්පරාවෙන් පැමිණියහ. යෙ චඤ්ඤෙ සදිසා සහා - දූත් බ්‍රහමයා දක්වන්නේ සුබ්‍රහමා පරමතෙතාච - ආදිය කීය. එහි සුබ්‍රහමා යනු එක් බ්‍රහමයෙකි. පරමතෙතා යනු ද එක් බ්‍රහමයෙකි. පුතතා ඉදධිමතො - භාග්‍යවත් බුදුන්ගේ මේ සෘද්ධිමත් පුත්තුවන ආර්ය බ්‍රහමයන් සමග පැමිණියහ. සනං කුමාරො තිසෙසා ච - සනංකුමාර ද තිසස මහා බ්‍රහමයා ද සොපාගා - හේ ද පැමිණියේය.

මහ බඹහු සිටිතී - සුවහස් බඹලෝ තෙලේ
ඉපිද බබළන්නේ - මහකය කිත් සහිත වී

මෙහි සහසසං බ්‍රහමලොකානං - එක ඇඟිල්ලෙන් එක සහසක් සක්වලද දසැඟිල්ලෙන් දස දහසක් සක්වල ආලෝක කිරීමට සමත් මහ බඹුන් දහසක් පැමිණියහ. මහා බ්‍රහමාභි තිටඨති - එක් එක් මහබඹා

අනිත් බඹුන් අභිබවා සිටියි. **උපපනෙනා** - බඹලොව ඉපිද ජුතිමනෙතා - ආනුභාව සම්පන්න. **හිසමාකායො** - මහකය. මගධයෙහි ග්‍රාම ක්‍ෂෙත්‍ර දෙක තුණක් පමණ වූ ශරීරයෙන්. **යසසසි සො** - ආත්මභාව ශ්‍රී සම්පත් සංඛ්‍යාත යසසින් යුක්ත වූ, **දසෙත්ථ ඉසසරා ආගු පචෙචක වසවතතිනො** - එක් බ්‍රහම සහස්‍රයක වෙන වෙනම වසයෙහි පවත්වති. එබඳු වූ දස ඊශ්වර වූ මහා බ්‍රහමයෝ පැමිණියහ. **තෙසඤච මජඣතො ආග හාරිතො පරිවාරිතො** - ඒ බ්‍රහමයින් මැද හාරිත නම් මහා බ්‍රහමයා දහසක් බ්‍රහ්ම පිරිවර සමග පැමිණියේය. **තෙ ච සබෙබ අභිකකනෙත සඉනෙද දෙවෙ සබ්‍රහමකෙ** - ඒ සියල්ලෝම සක්‍ර දේව රාජයා ජ්‍යෙෂ්ඨ කොට පැමිණි කල්හි හරිත බ්‍රහමයා ජේෂ්ඨකොට පැමිණි කල්හි, **මාරසෙනා අභිකකමි** - මාර සේනාව පැමිණියහ. **පසස කණහසසමනදියං** - කලුධර්ම (පව්) වූ මාරයාගේ බලවත් බව බලව්. **එථ ගණහථ බනධථ** - මෙසේ තමාගේ පිරිසට අණ කරයි. **රාගෙන බඃධ මත්‍ථුවෙ** - මේ සියළු දේව මණ්ඩලය රාගයෙන් බඳිනු ලැබේවා. **සමනතා පරිවාරෙථ මා වො මුඤචිත්ථ කොචිනං** - ඔබලා මොවුන්ගෙන් එක් කෙනෙකුවත් නොමුදව. **ඉති තත්‍ථ මහා සෙනො කණහසෙනං අපෙසයී** - මෙසේ එහි මහා සමයේ මහසෙන් මාරයා මාර සේනාව යැවීය. **පාණිනා ථලමාහචච** - අතින් පෘථිවිතලය පැහැර. **සරං කත්‍වා හෙරවං** - මාර හිංසනය දක්වීමට භයානක ශබ්දයක් කොට. **යථා පාවුසසකො මෙඝො ථනයනෙතා සවිජ්ජුකො** - විදුලිය සහිත පාවුස්සක මේඝය මෙන් මහා ගර්ජනයක් කරන්නේ, **තදා සො පචචුදාවතති** - ඒ වෙලාවේ ඒ මාරයා, විහිංසන දක්වා නැවතුනේය. **සංකුදෙධා අසයං වසී** - තදින් කිපී කිසිවකු තමා වසඟයෙහි තැබීමට නොහැකිව අත්හැර නැවතුනේය.

භාග්‍යවතුන් වහන්සේ මේ මාරයා මේ මහා සමාගම දක්‍ෂ අවබෝධයට අන්තරායක් කරන්නෙමියි වරින් වර මාර සේනාව යවා මාර විහිංසනය දක්වන්නේ යයි දැන ගත්හ. භාග්‍යවතුන් වහන්සේ ගේ සවභාවය මෙසේය. යම් තැනක අවබෝධය නොවන්නේ නම් එහි මාරසේනාවගේ විහිංසනය දක්වීම නොවලක්වති. යම් තැනක අවබෝධය වේ නම් එහි මාර විහිංසනය දක්වීම වලක්වති. එහි පිරිස මාරයාගේ රූපය නොදකියි. ශබ්දය නො අසයි. මෙසේ අධිෂ්ඨාන කරති. මේ සමාගමයෙහි මහා අභිසමය වන්නේ ය. එහෙයින් දෙවියෝ ඔහුගේ රූපය නොබලති ශබ්දය නො අසති යයි මෙසේ අධිෂ්ඨාන කළහ. එහෙයින් කියන ලදී.

වසයට ගනු බැරිව - ගියෙ හේ ආපසු කිපී
දැන සියල් බුදුහිමි - තිරකොට පසැස් ලෝ හිමි

භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ලම දැන තීරණය කොට, **මාරසෙනා අභික්කනතා තෙ විජානාථ භික්ඛවො** - මහණෙනි, මාරසේනාව පැමිණියා. ඔබලා තම තමාට අනුරූප පරිද්දෙන් දැනගන්න. ඵල සමාපත්තියට සමවදින්න යයි කියති. **ආතපපමකරුං** - පලසමවතට පිවිසීම සඳහා වීර්ය ආරම්භ කළහ. **වීතරාගෙහපක්කාමුං** - මාරයාද මාර අනුචරයෝද වීතරාග වූ ආර්යයන් කෙරෙන් ඈතට ගියහ. **නෙසං ලොමමපි ඉඤ්ජයුං** - ඒ වීතරාගීන්ගේ ලෝමයකුදු නො සෙලවූහ. ඉක්බිති මාරයා භික්ෂු සංඝයා අරබයා මේ ගීය කීවේය.

දිනූ සමර හැමදෙන - බිය නැති පිරුණු යසසැති
තුටුවෙති සමග අරි - පුඟුලන් පසිඳු බුදු සව්

**එහි මොදනති සහ භූතෙහි** - දසබල සසුනෙහි භූතයන්ගෙන් තොරව ඉපදුණු ආර්යන් සමග සතුටු වෙති. **ජනෙසුතා** - ජනයන් ඇසූ, විශ්‍රැත, ප්‍රකට, දැනගත්. මේ මහා සමය සූත්‍රය වනාහි දෙවියන්ට ප්‍රියය මනාපය. එනිසා යහපත කියන්නා විසින් අළුත් තැන්වල මේ සූත්‍රය කිවයුතුය. දෙවියෝ වනාහි මේ සූත්‍රය අසන්නෙමු යයි යොමු කළ කන් ඇතිව හැසිරෙති. මේ දේශනාව අවසානයෙහි කෝටිලක්‍ෂයක් දෙවියෝ රහත් වූහ. සෝවාන් ආදීන්ගේ ගණන් නියමයක් නැත. දේවතාවන්ට මේ සූත්‍රය ප්‍රිය මනාප බවට කථා වස්තුවක් මෙසේය. කොටපව් වෙහෙරෙහි වනාහි නාග ලෙන් දොරකඩ නා ගසෙහි එක් දේවතා දුවක් වසයි. එක් දහර භික්ෂුවක් ලෙන ඇතුළෙහි මේ සූත්‍රය සජ්ඣායනය කරයි. දෙව්දුව එය අසා සූත්‍රය අවසානයෙහි මහත් ශබ්දයෙන් සාධුකාර දුන්නාය. කවුද ඒ ? සවාමීනි මම දෙව්දුවක්මි. සාධුකාර දුන්නේ ඇයි ? ස්වාමීනි දසබල තථාගතයන් විසින් මහාවනයෙහි වැඩහිඳ වදාරන ලද දිනයෙහි මේ සූත්‍රය ඇසූ මම අද ඇසුවෙමි. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ එක් අකුරකුදු නොනසා ඔබ වහන්සේ විසින් මේ ධර්මය මනාව ගන්නා ලදී. දසබලයන් වහන්සේගේ දේශනාව ඔබ ඇසුවාද? එසේය ස්වාමීනි, මහා දේව රැස්වීමක් විය. ඔබ ඇසුවේ කොහේ සිටද? ස්වාමීනි, මම මහා වනයෙහි දෙවියන් සමග හුන්නෙමි. මහේසාක්‍ය දෙවිවරුන් එන කල්හි දඹදිව ඉඩ නොලදිමි. ඉන්පසු මේ තම්බපණ්ණි දීපයට පැමිණ දඹකොල

පටුනෙහි සිට ඇසීමට ඇරඹීමි. එහි ද මහේසාක්‍ය දෙවිවරුන් එන කල්හි පිළිවෙළින් පසු පසට යන්නේ රුහුණු ජනපදයෙහි මාගම පිටුපස ගොළු මුහුදෙහි කරවටක් දියට බැස එහි සිට ඇසුවෙමි. දේවතා දියණියෙනි, ඔබ සිටි තැන ඉතා දුරය බුදුරදුන් පෙනුනාද? සවාමීනි මොනවා කියනවද? ශාස්තෲන් වහන්සේ මහාවනයෙහි ධර්මය දේශනා කරන්නේ නිතරම මා දිහාම බලති යි සිතමින් බියවෙමින් ලජ්ජාවෙමින් දිය සුළිවල සැඟවී සිටියෙමි. ඒ දවසෙහි කෝටි ලක්ෂයක් දෙවියෝ රහත් වූහ. ඔබ එදා රහත් වුනාද ? නැත සවාමීනි, අනාගාමි ඵලයට පත් වී ඇතැයි සිතමි. නැත සවාමීනි, තුන් මාර්ගයට පැමිණි දෙවියන්ගේ ගණන පථය ඉක්මවිය. සෝවාන් වී ඇතැයි සිතමි. එ දවස දෙවියෝ සෝවන් ඵලයට පැමිණි බව නොවිචාල යුතුය.

ඉන් පසු ඒ භික්ෂුව ඇයට මෙසේ කීය. දේවතාවෙනි ඔබේ ආත්මභාවය මට පෙන්විය හැකිද ? සවාමීනි සියළු ශරීරය පෙන්විය නොහැකිය. ඇඟිලි පුරුකක් පමණක් දක්වන්නෙමි. යතුරු සිදුරෙන් ඇඟිල්ල ඇතුළු ලෙනට යොමු කළාය. සඳු දහසක් හිරු දහසක් නැගි කලක් පරිද්දෙන් මෙන් විය. දෙව්දියණිය ''සවාමීනි, අප්‍රමාද වන්න'' යයි දහර භික්ෂුව වැඳ ගියාය. මෙසේ මේ සූත්‍රය දෙවියන්ට ප්‍රියමනාප වේ. දෙවියෝ ඊට ඇලුම් කරති.

**මහා සමය සූත්‍ර වර්ණනාව නිමි.**

# 2-21

## සක්ක පඤ්හ සූත්‍ර වර්ණනාව

සක්ක පඤ්හ සූත්‍රය මවිසින් මෙසේ අසන ලදි. එහි ගැඹුරු පද වර්ණනාව මෙසේය. අම්බසණ්ඩා නාම බ්‍රහමණ ගාමො ඒ ගම වනාහි අම්බසණ්ඩය ලඟ ඊට ඇතුළත් විය. එහෙයින් අම්බසණ්ඩ යයි කියනු ලැබේ. වෙදියකෙ පබ්බතෙ - ඒ පර්වතය වනාහි පර්වත පාදයෙහි

හටගත් මිණි වේදිකාවක් මෙන් නිල් වන රාජියෙන් හාත්පසින් වටවී ඇත. එහෙයින් වෙදිය පර්වතය යයි හැඳින් වේ. ඉන්‍ද්‍රසාල ගුහායං - පෙර පර්වත දෙකක් අතරෙහි ඒ ගුහාව විය. ඉඳුසල් ගසක් එය ඉදිරියෙහි විය. ඒ නිසා ඒ ගුහාවද ඉන්‍ද්‍රසාල ගුහා යයි ව්‍යවහාර විය. ඉක්බිතිව බිත්තිවලින් වටකොට දොර ජනෙල් යොදා මනාව සකස්කොට හුනු පිරියම් කොට ලතා කර්ම මාලා කර්මවලින් අලංකාරකොට භාග්‍යවතුන් වහන්සේට පූජා කළහ. පෙර ව්‍යවහාරය වශයෙන් ම ඉන්‍ද්‍රසාල ගුහා විය. උස්සුක්කං උදපාදි ධාර්මික උත්සාහයක් ඇතිවිය. මොහු නිතරම භාග්‍යවතුන් වහන්සේ දකින්නේ ද නැත. දේව රැස්වීමක් ද නැත. එහි ඔහු නොපැමිණි විරීය. සක්‍රයා මෙන් අප්‍රමාදව වාසය කරන දිව්‍ය පුත්‍රයෙක් නැත. කුමක් හෙයින් බුදුන් දැකීම සඳහා උත්සාහයක් ඇතිවිද ? මරණ බියෙන් තර්ජිතව. එවිට ඔහුගේ ආයු පිරිහී තිබිණ. හේ පස් පෙර නිමිති දැක මගේ ආයු පිරිහී ඇතැයි දැනගත්තේය. යම් දිව්‍ය පුත්‍රයන්ගේ මරණ නිමිති පහළ වූ විට ඔවුන් අතරෙහි සුළු පිනක් කොට දෙව්ලොව උපන් අය දැන් කොහේ උපදිද්දැයි බියට සනත්‍රාසයට පැමිණෙති. යමෙක් බොහෝ පින්කොට දෙව්ලොව උපන්නේ ඔව්හු දුන් දන්වල රැකි සීල වැඩූ භාවනා නිසා ඉහළ ඉහළ දෙව්ලොව සම්පත් අනුභව කරන්නෙමියි බිය නොවෙති. සක්‍ර දිව්‍ය රාජයා පෙර නිමිති දැක දස දහසක් යොදුන් දේව නගරය යොදුන් දහසක් උස විජයොත්පාය, තුන් යොදුනක් වූ සුධර්මා දේවසභාව සත් යොදුනක් උස පරසතු රුක, සැට යොදුන් වූ පඬු ඇඹුල දෙසිය පනසක් නෘත්‍ය පර්ෂදය, දෙව්ලෝ දෙකෙහි දෙව්පිරිස නන්දන චිත්තලතා වන, මිස්සක ඵාරුසක වන මේ සියළු සම්පත් බලා මගේ මේ සම්පත් නැසේ යයි බියට පත්වූයේ විය. ඉන් පසු මගේ හෘදය නිශ්‍රිත සෝ උල උදුරා මේ සම්පත් සථිර කරන්නා වූ කිසියම් ශ්‍රමණයෙක් හෝ බ්‍රහමණයෙක් හෝ ලෝක පිතෘ මහා බ්‍රහ්මයා හෝ ඇද්දැයි බලන්නේ කිසිවකු නොදැක, නැවත මා වැනි ලක්ෂයකගේ උපන් සෝ උල්ද ගලවා දැමීමට සමර්ථ බුදුන් වහන්සේ සිටිනවා දැක, භාග්‍යවතුන් වහන්සේ දැකීමට සක්දෙව් රජුට මහත් උද්යෝගයක් ඇතිවිය.

කහං නු බො භගවා එතරහි විහරති - කුමන ජනපදයෙහි, කවර නගරයක් ඇසුරුකර කාගේ ප්‍රත්‍ය වළඳමින් අමාදම් කවරෙකුට දේශනා කරමින් වාසය කෙරෙත්ද? අද්දසා බො - දැක්කේය. අවබෝධ කළේය. මාරිස - මෙය ප්‍රිය වචනයකි. දෙවියන්ට වෙනම ව්‍යවහාර කෙරේ. නිදුක් වේවා යයිද කියන ලද්දේ වේ. කුමක් හෙයින් මේ දෙවියන්ට

ආමන්ත්‍රණය කෙළේද ? සහාය පිණිස. පෙර මොහු භාග්‍යවතුන් වහන්සේ සලලඝරයෙහි වාසය කරන කල්හි දැකීම සඳහා හුදකලාවම ආවේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ නුවණ මෝරා නැතැයි සලකා, දින කීපයක් ඉක්මවා, මා ඉඳුසල් ගුහාවේ වසන කල්හි පස් පෙරනිමිති දැක මරණභයින් බියපත්ව දෙදෙව්ලොව දෙවියන් සමග එළඹ තුදුස් පැනක් විචාරා උපේක්ෂාව පැන විසඳුම් අවසානයෙහි අසූ දහසක් දෙවියන් සමග සෝවාන් පලයෙහි පිහිටන්නේ යයි සිතා අවකාශ නුදුන්හ. හේ මම තනිව ගොස් බුදුන් අවකාශ නොදෙන ලදී. මට මාර්ග පලවල උපනිශ්‍රය ඒකාන්තයෙන් නැත. එක්කෙනෙකුට හෝ උපනිශ්‍රය ඇත්නම් භාග්‍යවතුන් වහන්සේ සක්වල කෙලවර පිරිසට ද දහම් දෙසන්නේමය. දෙදෙව්ලොව කිසිවකුට හෝ උපනිශ්‍රය ඇත්නම් බුදුහු දහම් දෙසති. ඒ අසා මම ද මාගේ දොම්නස සමනය කරගන්නෙමියි සිතා සහාය පිණිස දෙවියන් ඇමතීය.

**එවං භද්දනතවාති බො තාවතිංසා** - මෙසේ වේවා. මහරජ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යමු. බුද්ධෝත්පාද දුර්ලභය. පර්වත ක්‍රීඩා දිය කෙළි සඳහා යමුයි නොකියා මෙය ඉතා යහපත්ය. මෙබඳු ස්ථානයක අප නියෝජනය කරවීම කදිමය. **පච්චසොසාසුං** - ඔහුගේ වචනය හිස් මුදුනින් පිළිගත්හ. **ගන්ධබ්බ පුත්තං ආමන්තෙසි** - සියළු දෙවියන් ඇමතිය යුතුව තිබිය දී මොහුට කුමක් නිසා වෙනම ඇමති ද ? ඉඩ ලබා ගැනීම සඳහා, ඔහුට මෙබඳු අදහසක් විය. දෙදෙව්ලොව දෙවියන් ගෙන ධූරයෙන් උඩඟුව බුදුන් වෙත එළඹීම සුදුසු නැත. මෙතෙම වනාහි දසබලහුගේ උපස්ථායකයෙකි. වල්ලභයෙකි. කැමති කැමති විට ගොස් ප්‍රශ්න අසා දහම් අසයි. මොහු මුලින් යවා අවකාශ ලබාගෙන මොහු විසින් කළ අවකාශයෙන් එළඹ ප්‍රශ්න අසන්නෙමි යි ඉඩ ලබා ගැනීම සඳහා ඇමතීය. **එවං භද්දනතවා** - හේ ද මහරජ එසේ වේවා. ඔබ මා එන්න පින්වත, උයන්කෙළි ආදියෙහි හෝ නෘත්‍ය දර්ශනාදියට හෝ යමු යයි නොකියා බුදුන් දකින්නෙමු දහම් අසන්නෙමු යයි කීම ඉතා සොඳුරුය. දැඩිසේ තහවුරු කරන්නේ දෙව්රජුගේ පිඩනය අසා අනුගමනය සහගමනය එකලාව ගමන පැමිණියේය. **බෙලුවපණ්ඩු** - බෙලි මෙන්, පඬුවන් පැහැය. එය වනාහි රුවන්මුවා වීණා දෝනිය, ඉඳුනිල් මුවා දඬුව, රිදීමුවා තත්. පබළුමුවා ගානා දඬුව වේ. වීණා පත්ත ගව්වකි. තත් බඳින තැන ගව්වකි. උපරි දඬුව ගව්වකි. මෙසේ තුන්ගවු වීණාව, මෙසේ හේ වීණාව රැගෙන සමපනස් මූර්ජනාවලින් මූර්ජනා කොට නිය

අගින් පහරා මිහිරි ගී සර විහිදුවා සෙසු දෙවියන් සක්‍රයාගේ පැමිණෙන වෙලාව දන්වනු ලබන්නේ එකත් පසෙක සිටියේය. මෙසේ ඔහුගේ ගී වාදන සංඥාවෙන් දෙව්පිරිස රැස් වූ කල්හි. අථ ඛො සක්කො දෙවානමින්දො.... වෙදීයකෙ පබ්බතෙ පචචුට්ඨාසි අතිරිව ඔභාස ජාතො - අනිත් දවස්වල දෙවියෙකුගේ හෝ මාරයෙකුගේ හෝ බ්‍රහමයෙකුගේ හෝ ආලෝකයෙන් ආලෝක වේ. ඒ දවස වනාහි දෙදෙව් ලොවේ ම දෙවියන් ගේ ආලෝකයෙන් අතිශයින් ම ආලෝකවත්ව එකම බැබළීමකින් හිරු සඳු දහසක් උදා වූ මෙන් විය. පරිතො ගාමෙසු මනුස්සා - හාත්පස ගම්වල මිනිස්සු, ස්වභාවයෙන් ම සවස් කාලයෙහි ගම්මැද දරුවන් සෙල්ලම් කරන අවස්ථාවේ සක්‍රයා ආවේය. එහෙයින් මිනිස්සු දැක මෙසේ කීහ. දෙවියන් මධ්‍යම යාමෙහි බුදුන් වෙත එළඹෙන්නේ නොවේද? මේ තෙමේ පළමු යාමයේ පෙරභාගයෙහි ම ආවේද? මරණ භයින් තර්ජිතව. කිංසු නාමා - පිංවත, මෙය නම් කුමක්ද ? අද මගේ සාක්‍ය දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න විචාරීමට දහම් ඇසීමට එළඹෙන්නේය. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් ප්‍රශ්න විසඳන්නේ ද ධර්මය දෙසන්නේ දැයි අපටද ලාභයකි. මේ දෙවියන්ගේ සැක දුරුකරන ශාස්තෘන් වහන්සේ තුදුරු වෙහෙරෙහි වැඩ වසති. අප බත් තලියක් හෝ හැන්දක් පමණ භික්‍ෂුවක් හෝ පිළිගන්වන්නට අවසථාව ලබමු යයි ඇලී ලොමුදහ ගෙන ඉතා ප්‍රීතිමත්ව දසතිය එකතුකර හිසෙහි ඇඳිලි බැඳ නමස්කාර කරමින් සිටියහ.

දුරුපසංකමා - ඇසුරු කිරීමට දුෂ්කර, මම රාග සහිතය දෝස සහිතය මෝහ සහිතය. ශාස්තෘන් වහන්සේ වීතරාගය වීත දෝසය වීත මෝහය, මා වැන්නන්ට තථාගතයන් ඇසුරු කිරීම දුෂ්කරය. ඣාන රතා - ඒ ධ්‍යානයෙහි ඇලුණු. තදනනතරං පතිසලලීනා - ඉන් අනතුරුව විවේකීව සිටිති. දැන් පලසමවතෙහි හෝ. එහෙයින් හුදෙක් ඣායී නොවේ. ඣාන රතද වේ. එනිසා ඇසුරු කිරීම දුෂ්කරය. දැනුදු පලසමවතින් නම් ඇසුර දුෂ්කරය. පසාදෙය්‍යාසි - ආරාධනා කරන්නෙහි, මට ඉඩක් ලබාදෙන්නෙහි යයි කියයි. බෙලුව පණ්ඩු වීණාං ආදාය - මුලින්ම ගත්තා නේද? ගත්තා. මාර්ගයෙහි ගමන් කරන විට උරයෙහි එල්ලා ගනී. දැන් වම් අතේ තබා වාදනයට සකසා ගනියි. එහෙයින් ආදාය යයි කියන ලදී.

වන්දෙ තේ පිතරං භද්දෙ තිම්බරු සූරියවච්චසා - මෙහි සූරිය වච්චසා යනු හිරු සමාන සිරුර. ඒ දේව දියණිය ගේ පා තලයෙන් රැස් උඩනැගී කේසාන්තය දක්වා නැගේ. එහෙයින් තරුණ රිවිමඬල මෙන් හැගේ. මෙසේ ඇය සූරියවච්චසා යයි හඳුන්වති. ඒ සඳහා කීයඃ සොඳුර, සූරිය වච්චසාවෙනි, ඔබගේ පියාවූ තිම්බරු ගඳඹ දෙව්රජු වඳිමි. **යෙන ජාතාසි කල්‍යාණි** - යම් කරුණකින් තිම්බරු දෙව්රජුන් නිසා සියළු අංගවලින් කල්‍යාණව සෝභනව ඔබ උපන්නාය. **ආනන්ද ජනනී මම** - මගේ ප්‍රීතිය සොම්නස වැඩේ. **වාතොව සෙදතං කනෙතා** - යම්සේ හටගත් දාඩිය, ඩා හරන වාතය ඉටුවේ, කාන්ත වේ, මනාප වේ. යන අර්ථයෙනි. **පානීයංව පිපාසතො** - බීමට කැමැත්තහුට, පිපාසයෙන් යුත් අයට, **අංගීරසී** - අංගයෙහි රස් ඇති. **ධම්මො අරහතාමිව** - රහතන් වහන්සේට නවලෝකෝත්තර ධර්මය මෙනි. **ජිඝච්ජාතො** - බුදිනු කැමැත්තාට, බඩගිනි ඇත්තාට, **ජලන්තමිව වාරිනා** - යම්සේ ඇවිළෙන ගින්න දිය කලයෙන් නිවන්නේද මෙසේ ඔබේ කරුණා ඇතිවිය. මගේ රාග ගින්න නිවන්න යයි කියයි. **යුතතං කිඤ්ජක්කරෙණුනා** - පියුමෙහි කෙසරු රොනින් යුත්. **නාගො සම්මාභි තතෙතාවා** - ග්‍රීෂ්මයෙන් තැවුණු ඇතකු මෙන්, **ඔගහෙ තෙ ථනූදරං** - යම් සේ ඇතා පොකුණට බැස බී සොඬ අග පමණක් පෙනෙන සේ කොට ගිලී සුව සැපය විඳී. මෙසේ ඔබගේ තනමැද උදරයට බැස මම සුව සැපය ලබන්නේ කවදාදැයි අසයි.

**අකුස ඉක්මූ ඇතු සේ - විඳින යකටු දඬු දිනූ**
**තෙල උෘරු යුවලින් - මත්ව නොහැගේ කිසිවක්**

**එහි තුතතං** - කනමුල විඳින යකඩ කටුව. **තොමරං** - පා විඳින දඬු. **අංකුසෝ** - හිස මුදුන විඳින වකුටු කටුව. ඇතා මද වැහුණු විට එය ඉක්මවයි. අංකුසය ඉක්මවයි. අංකුසෙන් විඳිනු ලබන්නේ ද වසඟයට නොඑයි. හේ දිනූ මම ද කන් පා විඳින කටු දිනුවෙමි. අකුසෙන් ද යටත් නොවෙමි. මත් වූ දර්පයෙන් කිසි කරුණක් අවබෝධ නොවේ. හෙණ්ඩුව ජයගත් ඇතා මෙන් මට ද යකටු දඬු කිසි කරුණක් නොදනේ. මෙසේ මම ලස්සන වටොරවලින් මත්ව ප්‍රමාදව උමතු වූවකු මෙන් කිසි කරුණක් නොදනිමියි කියයි. එසේ නැතහොත් අකුස ඉක්ම වූ ඇතා මෙන් මමද ලස්සන කලවෙන් මත් වූයේ එයින් කිසි විරාග කරුණක් නො දනිමි. කුමක් හෙයින්ද? ඒ ඇතා විසින් මෙන් මවිසින් යකටු දඬු දිනන ලදී. කිසිවෙකුගේ කිසි වචනයක් නොගනිමි. **තයි ගථිත චිතෙතාසම්**

Scanned with CamScanner

- සොඳුර, ලස්සන ඌරුවලින් ඔබ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තෙමි. වෙළුණු සිත හෝ ආශාවද බලාපොරොත්තු සිත. **චිත්තං විපරිනාමිතං** - ප්‍රකෘතිය හැර සිටි. **පටිගනතුං න සක්කොමි** - නවතින්නට නො හැකි වෙමි. **වඩ්ක සසෙතාව අමබුජො** - බිලිය ගිල සිටි මාලුවා මෙන්. **වාමොරූ** - සිතට දූනෙනාකාරයෙන් පිහිටි කලවා. කෙසෙල් කඳන් සමාන වූ කලවා හෝ අර්ථ වේ. **සජා** - වැලඳ ගැනීම. **මඤලොචනෙ** - සත්‍රියයි. තියුණු නැතිව බලන්නී මඳව බලන්නී එනිසා මඤ ලොචන යයි කියනු ලැබේ. **පළිසසජා** - සියළු කොටස්වලින් වැළඳ. **එතමෙම අභිපත්‍ථිතං** - මෙය මා නිතර පතන ලද්දේය. **අපපකො වත මෙ සනෙතා** - සවභාවයෙන්ම මඤ වේ. **වලලිත කෙසියා** - කෙස් මුදා පිට දිගට විසුරුවා හැරිය විට සර්පයකු මෙන් ඉහළට යන්නාවූ කෙස් ඇති නිසා වෙලලිත කෙසී වේ. **අනෙක භාගො සමපාදි** - අනේකවිධ විය. අනෙකභාවො යනු ද පාඨයකි. **අරහනෙතව දකඛිණා** - රහතුන් කෙරෙහි දුන් දනක් මෙන් නොයෙක් අයුරින් ප්‍රභින්නය. **යං මෙ අත්‍ථි කතං පුඤඤං** - මවිසින් කළ යම් පිනක් ඇත. **අරහනෙතසු තාදිසු** - තාදී ලක්‍ෂණවලින් යුත් රහතුන් කෙරෙහි. **තයා සද්ධිං විපචචතං** - ඒ සියල්ල ඔබ සමගම විපාක දේවා. ඒකීය බවට ගිය. **නිපකො සතො** - නෙපක්ක යනු ප්‍රඥාවයි. එයින් යුක්ත වීම නිපක වේ. සිහියෙන් යුක්ත වූයේ සතො වේ. **අමතං මුනි ජිගිංසානො** - ඒ බුද්ධ මුනිතුමා අමෘතය නිවන යම්සේ සොයයි ද එසේම මම සූරිය වච්චසා සොයමි. යම්සේ උන්වහන්සේ අමත පද හැරගනු කැමත්තේ සොයන්නේ ගවේෂණය කරන්නේ හැසිරෙයි. එසේම මම ඇය සොයන්නේ හැසිරෙමියි යන අර්ථයයි.

**යථාපි මුනි නනෙදයා පත්‍වා සමෙබාධිමුත්තමං** - යම්සේ බුද්ධ මුනිතුමා බෝ පලඟෙහි හුන්නේ සබ්බඤ්ඤුත ඤාණයට පැමිණ සතුටු වන්නේ, තුටු වන්නේය. එසේ සතුටු වන්නෙමි. එසේම මම ද ඔබ හා එකතු වූයේ සතුටු වන්නෙමි. ප්‍රීති සොම්නස් වන්නේ යයි කියයි. **නාහං භදෙද වරෙයයාහෙ** - අහෙ යනු ඇමතීමයි. අහා සොඳුර, සූරියවච්චස සක්දෙව් රජු දෙදෙව්ලොව දෙව්රජය හෝ සූරියවච්චසා හෝ ගනුවයි වරදුන් විට දෙව්රජය හැර සූරිය වච්චසා ගනිමි. මෙසේ ඔබ මට උතුම්වන්නේය. කැමතිවන්නෙමි. ගන්නෙමියි යන අර්ථයයි.

**සාලංව න චිරං ඵුල්ලං** - ඔබගේ පියාගේ නගර දොරටුවෙහි කලක් නොපිපුණු සල්ගසෙක් ඇත. එය අතිශයින් ම මනහරය. ඔබ නොපිපුණු සල්ගසක් වගේ. **පිතරං තෙ සුමෙධසෙ** - අතිශයින් ශ්‍රීමත් වූ ඔබගේ පියතුමා ද වඳිනු ලබන්නේ, වඳිමි. නමස්කාර කරමි. **යසසා සෙ තාදිසී පජා** - යමෙකුට මෙබඳු වූ දූවක්විද? **සංසඥනි** - භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා ගී නාදයේ මෙන්ම වීණා නාදයේ වර්ණනා කෙළේද? කිම භගවත්හුට එහි ඇල්මක් ඇද්ද? නැත. සකොටසකින් යුත් උපේක්ෂාව. මෙබඳු තැන්වල භාග්‍යවතුන් වහන්සේ හුදෙක් ඉටු අනිටු දනිති. එහි නො ඇලේ. එය කියන ලදී.

ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේට ඇසක් විද්‍යාමාන වේ. භාග්‍යවතුන් වහන්සේ ඇසින් රූප බලයි. භාග්‍යවත්හුට ඡන්දරාගයක් නැත. භගවත්හු සුවිමුත්ත චිත්තයහ. ඇවැත්නි භාග්‍යවත්හට කථා ඇත. ආදි වශයෙන්. ඉදින් වර්ණනාව නො කෙළේ නම් මා ඉඩ ලබාදුන් බව පංචසිඛ නොදන්නේය. ඉක්බිති සක්‍රයා භගවත්හු පංචසිකට ඉඩ නොදෙන ලදැයි දෙවියන් ගෙන එයින් ආපසු හැරෙන්නේය. එයින් මහත් හානියක් වන්නේය. වර්ණා කළ කල්හි භගවත්හු පංචසිඛට අවකාශ දුන්නේ යයි දෙවියන් සමග එළඹ ප්‍රශ්න අසා අවසානයේ අසූ දහසක් දෙවියන් සමග සෝවාන් ඵලයෙහි පිහිටන්නේ යයි දැන වර්ණනා කළහ. **එහි කදා සංයූළහා** - කවදා රචනා කෙළේද ? පිඬු කරම්ද? **තෙන බො පනාහං භනෙත සමයෙන** - ඔබවහන්සේ සම්බෝධියට පැමිණීමෙන් අටවන සතියෙහි. **භද්දා නාම සූරියවච්චසා** - නමින් භද්දාය. ශරීර සම්පත්තියෙන් සූරිය වච්චසා. **භගිනී** - මෙය ව්‍යවහාර වචනයකි. දෙව්දුව යන අර්ථයයි. **පරකාමිනී** - කාමයෙහි ආශා ඇති. **උපනච්චන්තියා** - නෘත්‍ය දක්වන්නාවූ ඕ වනාහි එක් කලෙක චාතුම්මහා රාජිකා දෙවියන් සමග සක්දෙව් රජුට නැටුම් දැක්වීමට ගියාය. එකෙණෙහි සක්‍රයා තථාගතයන් වහන්සේගේ වර්ණනාව කීවේය. එදවස ගොස් නෘත්‍ය දක්වන්නී ඇසුවාය. **පටිසම්මොදනී** - ගැලපේ යයි ආදිය කියන්නේ භාග්‍යවතුන් වහන්සේ සතුටු වෙති. මෙසේ පංචසිඛ ද සතුටින් කතා කරයි. ගාථා ද කියන්නේ පංචසිඛ සතුටින් කියයි. භගවත්හු සතුටින් කථා කරති. **ආමනතයි** - දූත්විය ඔහුට මෙසේ අදහස් විය. පංචසිඛ මා යවන ලදී. මගේ කටයුත්තකට යවන ලදී. දූත් ඔහුගේ වැඩක් කරයි. ශාස්තෘන් වහන්සේ සමීපයෙහි මෙබඳු වූ නුසුදුසු කාමගුණ කීවේය. නළුවෝ නම් ලජ්ජා නැත්තෝ වෙති. කථා කරන්නේ විකාර දක්වන්නේය. ඔහුට මගේ

වැඩේ දන්වන්නෙමියි සිතා ඇමතිය. ''එවංච පන තථාගතා'' යයි ධර්ම සංගායනා තෙරවරුන් විසින් තබන ලද පදයකි. අභිවදනති - වැඩිකළ වචනයෙන් කියන ලදී. උරුළාා සමපාදි - මහත් වූ විචිත්‍රතා විය. අන්ධකාරො ගුහාය අනතරධායි ආලොකො උදපාදි - ගුහාව සවභාවයෙන් අඳුරුය. ඒ අතරක් නැති ආලෝකය ඇතිවිය. මේ සියල්ල ධර්ම සංග්‍රාහකයන්ගේ වචන වේ. චිරපටිහං භනෙත - බොහෝ කලකින් මම. බොහෝ කාලයක සිට දක්නු කැමැත්තේ යන අර්ථය වේ. කෙහි චි කෙහිචි කිචච කරණීයෙහි - දෙවියන්ගේ දූවරු ද පුත්තු ද ඇකයෙහි උපදිති. පාද පරිචාරිකා ස්ත්‍රීහු සයනයෙහි උපදිති. ඔවුන්ගේ සරසන්නියෝ සළුපිළි අන්දන්නියෝ සයනය පිරිවරා උපදිති. වතාවත් කරන්නෝ ඇතුලු විමානයෙහි උපදිති. මොවුන් සඳහා කලහ නැත. යමෙක් සීමාවෙහි උපන් විට මා සතුය. ඔබ සතුයයි තීරණය කිරීමට නොහැකි වූ විට කලහ කරන්නේ සක්දෙව් රජ විචාරති. හේ යමෙකුගේ විමානය ආසන්නයේ නම් ඔහුට අයත් යයි කියති. ඉදින් දෙදෙනාගේ ම සම ස්ථානයෙහි වී නම් යමෙකුගේ විමානය බලමින් සිටියේ නම් ඔහු සතු යයි කියයි. ඉදින් එක්කෙනෙකුගේ වත් විමානය නොබලා නම් ඒ නිසා ඒ දෙදෙනා කලහ කෙරේ නම් තමා සතු කරයි. ක්‍රීඩා ආදී කෘත්‍යයද කළයුතු වේය යනාදි කටයුතු නිසා කෙහිචි කෙහිචි කිචච කරණීයෙහි යයි කීය. සලළමුවා (එනම් සුවඳ ලීයෙන් කළ) ගඳ කිළියෙහි. අඤඤතරෙන සමාධිනා - එකල්හි භාග්‍යවතුන් වහන්සේ සක්‍රයා ගිය නොබෝ වෙලාවකින් නුවණින් දැන අවකාස නොකරනු කැමත්තේ පල සමවත් විහරණයෙන් වැඩ හුන්හ. මෙය නොදැන ''අඤඤතරෙන සමාධිනා'' යයි කීය.

භුඤජතීති ච නාමා - භුඤජතීති ඔහුගේ නම පරිචාරිකා - පාදපරිචාරිකා බිරිය වූ දෙව්දුව. ඕ තොමෝ වනාහි දෙවන ඵලයට පැමිණි නිසා දෙව්ලොව ඇලීමක් නැත. භාග්‍යවතුන් වහන්සේට උපස්ථානයට නිතර පැමිණ ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමින් සිටී. නෙම් සඤඤාත තමහා සමාධිමහා වුටඨිතො - සමවතේ සිටින්නා ශබ්ද ඇසීද? අසේ ඒකාන්තයෙන් එසේ නොකිවයුතු වේද? භාග්‍යවතුන් වහන්සේ සක්‍ර දේවේන්ද්‍රයාට නොවේද? තව ද ආයුෂ්මතා සක්නේම් හඬින් සමාධියෙන් නැගිට්ටා යයි කියහිද ? නිම්වලලු හඬ තබා සමවත් සමවන්නේ සමවත තුළ කණ ලඟ හක් යුගලයක පිඹීමද අකුණු හඬද නො අසයි. භාග්‍යවතුන් වහන්සේ මෙපමණ වෙලාවක්

Scanned with CamScanner

ශක්‍රයාට අවකාස නොකරමියි පිරිසිඳ කාල වශයෙන් පල සමවතට සමවැදුනේය. ශක්‍රයා ශාස්තෲන් වහන්සේ දූන මට අවකාස නොදෙතියි ගඳකිලිය පැදකුණු කොට රථය නවතා දෙව්ලොවට යැවිය. ගඳකිලි පිරිවෙණ (කුටිය) රථ ශබ්දයෙන් හැපී පසඟතුරු ගොස මෙන් විය. පිරිසිඳිණු ලැබූ කාලයෙන් සමවතින් නැගී සිටි භාග්‍යවතුන් වහන්සේට රථ ශබ්දයෙන් පළමු ආවර්ජනය ඉපදිණි. සම්පූර්ණ කරන්නී. ඉත්‍ථී චිත්තං විරාධෙත්‍වා - ස්ත්‍රී නමට නින්දා වේවා. ස්ත්‍රී බවින් වැඩක් නැත. ස්ත්‍රී භවයෙහි සිට සක්විති සම්පත් නැත. බ්‍රහ්ම සම්පත් නැත. පසේ බුදු විය නොහැක. සම්මා සම්බෝධිය අවබෝධ කළ නොහැක. මෙසේ සත්‍රී සිත කඩා දමති. මේ පුරුෂභාවය මහත්ය. ශ්‍රේෂ්ඨය, උතුම්ය. මෙහි සිට මේ සම්පත්වලට පැමිණියෙ හැකිය. මෙසේ වනාහි පුරුස බව වඩන්නී නම් සාදන්නී නම් ඕද එසේ කළහ. එහෙයින් කියන ලදී. "ඉත්‍ථී චිත්තං විරාධෙත්‍වා පුරිස චිත්තං භාවෙත්‍වා" ස්ත්‍රී සිත කඩා පුරිස සිත වඩා යනුවෙනි. හීනං ගන්‍ධබ්බ කායං - ගාන්‍ධර්ව නිකාය හීනය, ලාමකය. කුමක් හෙයින් පිරිසිදු සීලවන්තයෝ එහි උපන්නෝද? පෙර ආශාවෙන්. පෙර ඔවුන්ගේ වසන තැන මෙයම විය. එහෙයින් ඇලීම් වශයෙන් එහි උපන්හ. උපට්ඨානං - උපසථාන සාලාව. පාරිචරියං - සේවය කරන බව. ගී වාදනයෙන් අපි සේවය කරන්නෙමු යයි එති. පටිචොදෙසි - දෙව්පුත්තු සිහිකරවීය. හේ වනාහි ඔවුන් දූක මේ දෙව්පුත්තු අතිශයින් බබළති. අතිශයින් වර්ණවන්තයහ. කුමන කර්මයක් කොට පැමිණියහු දූයි අවර්ජනා කරන්නේ භික්ෂූන් වූහයි දූක්කේය. එයින් භික්ෂූහු වෙත්වා. සීලය සම්පූර්ණයෙන් ආරක්ෂා කළාහුදූයි පරීක්ෂා කරන්නේ සම්පූර්ණ යැයි දූක්කේය. එය තිබේවා. වෙනත් ගුණ ඇති නැති බව පරීක්ෂා කරන්නේ ධ්‍යාන ලාභීහු යයි දූක්කේය. එය තිබේවා. කොහේ විසූහුදූයි සොයන්නේ මොවුන් මගේ කුළුපගයෝ යයි දූක්කේය. පිරිසිදු සීලය නම් සදිව් ලොවේ කැමති දෙව්ලොවක උපදිති. මොව්හු ඉහළ දෙව්ලොවෙහි ද නූපන්හ. ධ්‍යාන ලාභීහු නම් බඹලොව උපදිති. මේ බඹලොව ද නූපන්නාහ. මම වනාහි මොවුන්ගේ අවවාදයෙන් පිහිටා දෙව්ලොව අයාති සක්දෙව්දුන්ගේ ආසනයෙහි පුත්ව උපන්මි. මොව්හු හීන වූ ගඳඹකයෙහි උපන්හ. අසපීවෙධ පුද්ගලයන් වන මොවුන් පෙරළා පෙරලා දූඩිකොට විදිය යුතු යයි සිතා කුතො මුඛා නාමා යයි ආදි වචනවලින් චෝදනා කෙළේය. එහි කුතො මුඛා - ධර්ම දේශනා කරන කල්හි භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ඔබලා එහෙ මෙහෙ

බලමින් සිටියාහු නැතහොත් නිදාගෙන හුන්නෝය. දුද්දිට්ඨරූපං - දකීමට අපහසු සවභාවය නොදකිය යුතු. සහධම්මිකෙ - එක් ශාස්තෘ ශාසනයක එකට ධර්මය පුහුණු වූ කරනලද පින් ඇති, තෙසං භනෙත - ගෝපක දෙව්පුත් විසින් ඔවුන්ට මෙසේ කියා නැවත අහෝ තොපට ලජ්ජා නැත. අහිරිකයෝය. ආදි වචනයෙන් චෝදනා කරනු ලැබූ දෙව්පුතුන් දෙදෙනෙක් ඒ අවස්ථාවේ ම සිහිය ලැබූහ. කායං බ්‍රහමපුරොහිතං - ඔව්හු මෙසේ සිතූහ. නළුවන් විසින් මේ නටමින් ගයමින් වයමින් පැමිණ - දාස නම් ඔවුන්ගේ ලැබිය යුතුය. මෙය වනාහි අපගේ දුටු කාලයේ පටන් තබන ලද ලුනු උදුනක් මෙන් තට තටාය වේ. මෙයින් ඇති වැඩේ කුමක්ද? ඉක්බිති ආවර්ජනා කරන්නේ, තම තමාගේ ශ්‍රමණ භාණ්ඩ පාරිශුද්ධ සීලය, ධ්‍යා ලාභී බව ඒවායෙහි කුළුපග බව දැක පිරිසිදු සීලය නම් සදෙව් ලොවෙහි කැමති තැනක උපදිති. ධ්‍යාන ලාභීහු බඹලොව, අපි ඉහළ දේවලොවක ද බඹලොව ද ඉපදීමට නොහැකි වූයෙමු. අපගේ අවවාදයෙහි පිහිටා මේ ස්ත්‍රිය ඉහළ ඉපදුනාය. අප පැවිදිව භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර හැසිර හීන වූ ගඳඹු රැහේ උපන්නෙමු. එහෙයින් අපට මෙයා මෙසේ නිග්‍රහ කෙරේයයි දැන ඔහුගේ කතාව අසද්දීම ඔවුනුරෙන් දෙදෙනෙක් ප්‍රථමධ්‍යාන සිහිය ලැබ ධ්‍යාන පාදක කොට සංස්කාරයන් සම්මර්ෂණය කරන්නේ අනාගාමී ඵලයෙහිම පිහිටියහ. ඉක්බිති ඔවුන්ගේ ඒ ස්වල්ප වූ කාමාවචර ආත්මභාවය දුරීමට නොහැකි විය. එහෙයින් එකෙණෙහි සැව බ්‍රහ්මපුරෝහිතයෙහි උපන්හ. එහෙයින් කියන ලදී. "කෙසං භනෙත, ගොපකෙන දෙවපුතෙතන චෝදනා කරනු ලැබූ දෙදෙනෙක් දෙව්විරු ඒ ආත්මයේම සිහිය ලැබූහ. කය බ්‍රහ්මපුරෝහිතයේය." එහි දිටෙඨව ධමෙම - ඒ ආත්මභාවයෙහි ම ධ්‍යාන සිහිය ලැබූහ. එහිම සිට චුතව, කායං බ්‍රහම පුරොහිතං - බ්‍රහ්ම පුරෝහිත ශරීර ලැබූහ. මෙසේ අර්ථ දත යුතුය.

එකො පන දෙවො - එක් දෙව්පුතෙක් ආශාව සිඳිය නොහැකිව කාමයෙහි ඇලී එහි ම විසීය. සංඝඤවු පට්ඨාසිං - සංඝයාට උපස්ථාන කෙළෙමි. සුධම්මතාය - ධර්මයේ සුන්දර බැවින්. තිදිවූපපනෙනා - තිදිවෙ තිදස පුරෙහි උපන්නේය. ගන්ධබ්බකායූපගතෙ වසිතෙ - ගදෙව් රැහේ ආවාසික බවට පැමිණි කල්හි යෙ ච මයං පුබෙබ මනුසසභූතා - පෙර මනුෂ්‍යන්ට අපි ආහාරපානවලින් උපස්ථාන කෙළෙමු. මෙය සමග යොදා අර්ථය දත යුතුය.

**පාදූපසංගයහ** - පා උපසථාන කොට, පා දෝවන, ඇතිල්ලීම් ආදිය කොට පුදා වැඳ. **සකෙ නිවෙසනෙ** - තමාගේ ගෙයි. මේ පදයේ උපස්ථාන කෙලෙමි. යන මේ සම්බන්ධය වේ. **පචචතතං වෙදිතබබො** - තමා විසින්ම දැනගත යුතුය. **අරියානං සුභාසිතානි** - භාග්‍යවත් බුදුන්ගෙන් අසා ඔබලා විසින් කියනු ලබන සුභාෂිත වචන. **තුමෙහ පන සෙට්ඨමුපාසමානා** - භාග්‍යවත්වූ උතුම් බුදුන් ඇසුරු කරන්නේ. අනුත්තර වූ බුද්ධ සාසනයෙහි හෝ **බ්‍රහමචරියා** - ශ්‍රේෂ්ඨ චර්යාව. **භවතුපපතති** - භවතුන්ගේ උපත්. **අගාරෙ වසනතොමයහං** - ගිහිගෙයි වසන මට. **සවාජජා** - **සො අජ්ජ** - ඒ අද. **ගොතම සාවකෙත** - මෙහි ගෝපක ගෞතම ශ්‍රාවකයෙක් යයි කියන ලදී. **සමෙචචා** - පැමිණ. **හඤ්ද විතායාම වියායමාම** - අහෝ උත්සාහ කරමු. උනන්දු කරමු. **මා නො මයං පරපෙසසා අහුමහ** - නො යනු නිපාතයකි. අපි අනුන්ගේ මෙහෙයවීම් ලබන්නේ නොවෙමු. **ගොතම සාසනෙහි** - මෙහි ස්වභාවයෙන් ලැබූ ප්‍රථම ධ්‍යානයම ගෝතම සාසනයයි කියන ලදී. එය සිහිකිරීම සිහිකළා යන අර්ථයයි. **චිත්තානි** - පස්කම් ගුණයුත් සිත් අත්හැර. **ආදීනවං** - ප්‍රථම ධ්‍යානයෙන් විෂ්කම්භන වශයෙන් කාම ආදීනව දක්කහ. තුන්වන මාර්ගයෙන් සමුච්ඡෙද වශයෙන්. **කාම සංයෝජන බන්ධනානි** - කාම සංයෝජන ද බැඳීම් ද, **පාපිම යොගානි** - පවිටු මාරයාගේ යෙදීම් වූ බැඳීම් වූ යන අර්ථයයි. **දුරච්චයානී** - ඉකුත් කිරීමට අපහසු. **සඉන්දා දෙවා සපජාපතිකා** - දෙවියන්ට ජ්‍යෙෂ්ඨ කොට සිටියේ ඒ ඉන්ද්‍ර වේ. දෙව්රජවරුන් ට ජ්‍යෙෂ්ඨකොට සිටියේ ඒ ප්‍රජාපති වේ. **සභායුපවිට්ඨා** - සභාවට පිවිස. හිඳගත්තේය යන අර්ථයයි. **වීරා** - සූරයෝ. **විරාගා** - වීතරාග. **විරජං කරොනතා** නොඇලීම් වූ අනාගාමි මාර්ගය වඩන. උපදවන. **නාගො ව සන්‍ධාන ගුණාති** කාම සංයෝජන බන්ධන සිඳදමා තව්තිසාව ඉක්මවූහ. **සංවෙගජාතසස** - සක්‍රයාට ඇති වූ සංවේගය. **කාමාභිභූ** - දෙපරිදි වූ ම කාමයන් මැඩ. **සතියා විහීනා** - ධ්‍යාන සිහියෙන් වෙන් වූ. **තිණ්ණාං තෙසං** - ඒ තිදෙනා අතරෙන්. **අවසිනෙත්ථ එකො** - එහි හීන වූ රැහේ එකෙකුම ගිලුනේය. **සමෙබාධිපථානුසාරිනො** - අනාගාමී මාර්ගය අනුව හැසිරෙන **දෙවෙපි හීලෙනති** - දෙදෙනෙක් දෙව් ලොව පිළිකුල් කරමින්. පහත් කරමින් උපචාර අර්පනා සමාධිවලින්, **සමාහිතතතා** - තමාගේ පාදූලි දෙවියන්ගේ හිසමත විසුරුවන්නේ අහසට නැගී ගියහ. **එතාදිසි ධමමපකාසනෙත්ථා** - මේ සාසනයේ එබඳු ඒ ධර්ම ප්‍රකාශ. ශ්‍රාවකයෝ යම් මේ ගුණවලින් යුක්ත වෙති. **න තත්ථ කංඛති කොචි සාවකො** - එහි ඒ ශ්‍රාවකයන් අතුරෙන් එකම ශ්‍රාවකයෙක්වත්

බුද්ධාදීන් කෙරෙහි හෝ දායකයන් කෙරෙහි හෝ සැක නොකරයි. සියළු දිසාවන්හි නො ඇලී, නොගෙන වාසය කරයි. දූන් භාග්‍යවතුන් වහන්සේ ගේ ගුණ කියන්නේ "නිත්තිණ්ණ ඔඝං විචිකිච්ඡ ජිනනං බුද්ධං නමස්සාමි ජිතං ජනිඥං" යයි කීය. විචිකිච්ඡා ජිනනං - එහි විචිකිච්ඡාවෙන් එතර වූ ජනිඥං - සියළු ලොවට උතුම් වූ. ඔබේ යම් යං තෙ ධම්මං - ධර්මයක් අජ්ඣගංසු තෙ - ඒ දෙව්පුත්තු අවබෝධ කළහ. කායං බ්‍රහමපුරොහිතං - අප බලාසිටිත් දී ම බ්‍රහම පෙරෙවි සිරුර. මෙය කියන ලද්දේ වේ. එසේ යම් ධර්මයක් දූන ඔවුන් තුන්දෙනා ගෙන් දෙදෙනෙක් අප බලාසිටිද්දීම බ්‍රහ්ම පුරෝහිතයට ගොස් මාර්ගඵල විශේෂයක් අවබෝධ කළහ. අපි ද ඒ ධර්මයට පැමිණියෙමු. ආගතමහාසි මාරිස - ආගත මනාසෙ පැමිණියෙමු. සපැමිණියෙමු. කතාවකාසා භගවතා පඤ්හං පුච්ඡම මාරිස - ඉදින් භාග්‍යවතුන් වහන්සේ අවකාශ කරන්නේ නම් ප්‍රශ්න අසමු. දීඝරත්තං විසුද්ධො බො අයං සකෙකා - බොහෝ කාලයක සිට පිරිසිදුය. කොපමණ කාලයක සිටද? බුදුන් පහළ නොවූ කාලයේ මගධ රටේ මණ්ඩල ගමේ මඝ මානවක කාලයේ පටන්. එකල මෙතෙමේ එක් දවසක් කලින්ම නැගිට ගමමැද මිනිසුන්ගේ කර්මාන්ත කරන තැනට ගොස් තමා සිටිතැන පස් කසල පයින්ම බැහැර කොට පිරිසිදු කෙළේය. වෙන එකෙක් පැමිණ එහි සිටියේය. හේ එයින්ම සිහිකල්පනාව ඇතිව ගම මැද කමතක් පමණ ස්ථානයක් සුද්ධකර වැලි ඉස දර ගෙන ඇවිත් සීත කාලයෙහි ගිනි ගසයි. දරුවෝද මහළු අයද පැමිණ එහි හිඳිති. ඉක්බිති ඔහුට අදහසක් ඇතිවිය. මම නගරයට ගොස් රාජරාජ මහ ඇමතිවරුන් දකිමි. මේ සඳහිරු කෙරෙහි සඳ දෙව්පුත් හිරු දෙව්පුත් යයි කියති. මොව්හු කුමක් කොට මේ සම්පත් අත්කර ගන්නේද? වෙන මොකවත් නොවේ, පින්කම් කොට යයි සිතා මවිසින් ද මෙබඳු දිව සැපත් දෙන පින්කම්ම කළයුතු යයි සිතීය. හේ කලින්ම නැගිට කැඳ බී පොරව වෑය උදලු මොහොල අත් ඇතිව සිව්මං සලකට ගොස් මොහොලින් ගල් ඔසවා පෙරළයි. යානාවල අකුර වැදෙන ගස් අස් කරයි. විසම තැන් සමකරයි. සිව්මංසලේ සාලා කරයි. පොකුණ කණියි. ඒ දඬු බඳියි. මෙසේ දවල් කාලයෙහි වැඩකර ඉර බසින විට ගෙදර එයි. අන් අය අසයි. පින්වත් මඝයෙනි, ඔබ උදේම නික් මී සවස කැලයෙන් එයි. මොකවත් වැඩක් කරනවද? පින්කම් කරමි. සවර්ගගාමි මග සුද්ධ කරමි පිනැතිය පින් ඔබ දන්නවාද? නොදනිමි. නගරෙට ගිය වෙලාවෙ, රාජ රාජ මහාමාත්‍යවරුන් දක්කද? එසේය දූක ඇත්තෙමි. පින්කම් කොට ඔවුන් ඒ ඒ තැන් ලබා ඇත. අපිත් එහෙම සම්පත්ති

දායක පින්කම් කරමු. චන්‍ද සූර්ය දිව්‍ය පුත්‍රයන් ගැන ඔබ අහල තියෙනවද? එසේය ඇසූවිරූය. ඒ සවර්ගයට යන මාර්ගය මම පිරිසිදු කරමි. මේ පින්කම් ඔබටම වටී. අනිත් කෙනෙකුට වටිනවාද? මෙය කවුරුවත් වලක්වන්නේ නැත. එහෙනම් හෙට වනයට යන වෙලාවෙ මටත් කතා කරන්න. දෙවන දින ඔහු රැගෙන ගියේය. මෙසේ ඒ ගමෙහි තරුණයෝ තිස්තුන් දෙනෙක් ඔහු අනුගමනය කරන්නෝ වූහ. ඔව්හු ඒකමතිකව පින්කම් කරමින් හැසිරෙති. යම් දිසාවකට යන විට පාර සමතලා කරන්නේ එක දවසකින් ම කරති. පොකුණු කණිමින් සාලා කරමින් ඒ දඬු බඳිමින් එක දවසකින් ම නිමාවට පත් වෙයි.

ඉක්බිති ඔවුන්ගේ ගමේ ගම්දෙටුවා සිතීය. පෙර මම මොවුන් සුරාපානය කරන කල්හි ප්‍රාණඝාතාදිය කරන කල්හි කහවණු වශයෙන් ද දඩබලය ආදී වශයෙන්ද ධනය ලැබුවෙමි. දැන් මොවුන් පින්කම් කරන කාලයේ පටන් අය නැත. ඔවුන් රජු සමග බිඳවමි. රජු වෙත ගොස් මහරජ, සොරුන් දකින්නෙමි. කොහේද ? දරුව, මගේ ගමේ. දරුව, මොන හොරුද ? දේවයන් වහන්ස රාජ අපරාධ, කවුද දන්නේ ? ගෘහපතියෝද, ගෘහපතියො කුමක් කරන්නාහුද ? ඔබ කුමන ජාතිකයෝද දැනගෙන කුමක් හෙයින් මට නොකීවේද ? මහරජ බියෙන් නොකීවෙමි. දැන් මට දොස් කියන්න එපා. මොහු හයියෙන් කියයි අදහා එසේ නම් යන්න. ඔබම ඔවුන් ගෙනෙන්න යයි බල සෙනග දී යැවීය. හේ ගොස් දිවකල වනයෙහි වැඩකොට අහර ගෙන ගම මැද හිඳ හෙට කුමක් කරමුද? මොන පාරද සමතලා කරන්නේ ? පොකුණු කනින්නෝ ඒදඬු බඳින්නෝ ආදිය කතා කරමින් අනුගාමිකයන් පිරවරා සිටියේය. දූවන්න එපා. මේ රජ අණ යයි කියා බැඳ ගෙන ආවේය. ඉක්බිති ඔවුන්ගේ ස්ත්‍රීහු අපගේ මිනිසුන් රාජාපරාධ සොරු යයි බැඳගෙන ගියේ යයි අසා මොවුන් පින්කම් කරමු යයි දිනපතා වනයට ගොස් සිටිති. වැඩ පාලුවේ. ගෙදර කිසි දියුණුවක් නැත. බැන්ද හොඳා ගෙනිච්චා හොඳා යයි කීහ. ගාම භොජකද ඔවුන් ගෙන ගොස් රජුට දැක්වීය. රජ පරීක්ෂා නොකොට ඇතුලවා පාගවයි කීය. ඔවුන් ගෙනියන කල්හි මඝ අන් අයට කීය. පින්වත්නි මගේ වචනය කරන්න හැකිවච්ද? ඔබේ වචනය කරන්නේම අප මේ භයට පැමියෙමු. මෙසේ ඇති කල්හිත් ඔබේ වචනය කරමු. එන්න පින්වත්නි, ඔබලා හොරුද? නැද්ද? අපි සොරු නොවෙමු. මෙලොව සත්‍ය ක්‍රියා නම් ඇත. එහෙයින් සියළු දෙනාම අප සොරු නම් ඇතු විසින් පාගනු ලැබේවා. සොරු නොවේ නම් පාගනු

Scanned with CamScanner

නොලබත්වා යි සත්‍ය ක්‍රියා කරන්න. ඔව්හු එසේ කළහ. ඇතාට ලඟට යන්ටවත් නොහැකි විය. කෑ ගසාගෙන පලා ගියේය. කණමුල පා හිස්මුදන විදින තුත්ත තෝමර අංකුසයෙන් කොටාද ඇතු මෙහෙයවීමට නොහැකි විය. රජුට දැන්වූහ. එසේ වී නම් ඉහළ කලල් වලින් වස්වා පාගවාපියන්නැයි කී. එසේ කළ කල්හි දෙගුණයක් කෑ ගසා පලා යයි. රජ එය අසා කේලාම්කරු කැඳවා කීය.

දරුව ඇතා පෑගීමට කැමති නොවේ. එසේය. දේවයන් වහන්ස, ජ්‍යෙෂ්ඨ මාණවකයා මන්තර දනී. මෙය මන්තර ආනුභාවයයි. රජ ඔහු කැඳවා ඔබට මන්තර ඇත්දැයි විචාළේය. දේවයන් වහන්ස මට මන්තර නැත. මා විසින් සත්‍ය ක්‍රියාවක් කරන ලදී. ඉදින් රජ සොරු මඩිත්වා. සොරු නොවේ නම් නොමඩිත්වා. මෙය අපගේ සත්‍ය ක්‍රියාවේ ආනුභාවයයි. දරුව ඔබලාගේ වැඩ මොනවාද? දේවයන් වහන්ස අපි පාරවල් සමතලා කරමු. සිව්මං සලවල සාලා කරමු. පොකුණු කණිමු. ඒ දඬු බඳිමු. මෙබඳු වූ පින්කම් කරමින් හැසිරෙමු. මේ තෙමේ ඔබලාට කුමක් නිසා කේළාම් කීවේද ? අප පමා වූ කාලයෙහි මේ මේ ලාභ ලභයි. අප්‍රමාද කාලයේ ඔහුට ඒවා නැත. මේ කාරණයෙනි. දරුව, මේ ඇතා තිරිසනෙකි. ඔහු ද ඔබලාගේ ගුණ දනියි. මම මනුෂ්‍යයෙක් වෙලත් නොදනිමි. ඔබලා වසන ගම ඔබලාට අහරණීය කොට දෙමි. මේ ඇතා ද ඔබලාටමය. කේළම්කරු ද ඔබලාගේ දාසයෙක් වේවා. මෙතැන් සිට මට ද පින්කම් කරවයි ධනය දී පිටත් කෙළේය. ඔවුහු ධනය ගෙන වාරයෙන් වාරය ඇතුපිට නැගී යන්නෝ සාකච්ඡා කරන්නේ, පින්වත්නි පින්කම් නම් අනාගත භවය සඳහා කරයි. අපගේ වනාහි ඇතුළු ජලයෙහි පිපුණු තිල්මහනෙල් මලක් මෙන් මේ ආත්ම භවයෙහි ම විපාක දෙයි. දැන් අතිරේකව ද පින්කම් කරමු. කුමක් කරමුදැයි සාකච්ඡා කර සතරමං සන්ධිය සථාවර කොට මහාජනයාට විශ්‍රාම ශාලාවක් කරමු. ස්ත්‍රීන් සම්බන්ධ නොකර කරමු. අප සොරුන් යයි ගෙන ගෙනයන කල්හි ගෑනුන්ගෙන් එක්කෙනෙක්වත් සිතිවිලි මාත්‍රයක් නොකොට බැන්දා හොඳා බැන්ද හොඳා යයි කෑ ගැසූහ. එහෙයින් ඔවුන්ට සම්බන්ධවීමට නොදෙමු. ඔව්හු තමන්ගේ ගෙවලට ගොස් ඇතාට පිඬුබත් තිස්තුනක් දෙති. තණමිටි තිස්තුනක් ගෙනෙති. ඒ සියල්ල ඇතාගේ කුස පුරවයි. ඔව්හු වනයට පිවිස ගස් කපති. කැපූ කැපූ ගස් ඇතා ඇද ගැල් මාර්ගයෙහි තබයි. ඔව්හු ගස් සැස ශාලාවේ කර්මාන්ත ඇරඹූහ.

මඝගේ ගෙදර සුජාතා සුධම්මා චිත්තා නන්දා යයි බිරියෝ සතර දෙනෙක් වූහ. සුධම්මා වඩුවා විචාළාය. දරුව, අපේ ස්වාමි පුරුෂයෝ කලින් ගොස් සවස එති. කුමන වැඩක් කරත්ද? අම්මේ, සාලාවක් කරති. දරුව, මා කෙරෙහි ද සාලාවේ පිනක් කර දෙනවද? ස්ත්‍රීහු සම්බන්ධ කර නොගැනීමට මොව්හු කියති. ඕ වඩුවාට කහවණු අටක් දී දරුව, යම්කිසි උපායකින් මට පින් කරව. හේ හොඳයි අම්මේ කියා. පළමුවම වැපොරෝ ගෙන ගම මැද සිට පින්වත්නි කිම, අද මේ වෙලාවෙ යන්නැද්දැයි උස් හඬින් කියා සියළු දෙනාම මගට එළිපත් බව දැන ඔබලා යන්න මම ටිකක් පමාවෙනවා ඔවුන් මුලින් යවා වෙන මගකට පිවිස කර්ණිකාවකට අවශ්‍ය ගසක් කපා සැස මට්ටම් කොට ගෙනවුත් සුධම්මාගේ ගෙයි තැබීය. මා විසින් දෙන්න යයි කියන දිනයෙහි බැහැරකොට දෙන්න. ඉක්බිති දුව කර්මාන්ත නිමි කල්හි බිම් කර්මාන්තයේ පටන් බැම් බැඳීම්, කණු එසවීම්, එක්කොට යෙදීම්, කැණිමඬල බැඳීම් කළ කල්හි ඒ වඩුවා කැණිමඬල මත හිඳ සතර දිසාවෙහි ගොනැස් ඔසවා පින්වත්නි, එකක් අමතක වී ඇතැයි කීය. පින්වත කුමක්ද අමතක වුනේ. මේ සියල්ලම අමතක වෙයි. පින්වත්නි මේ ගොනැස් පිහිටු වන්නේ කොහේද? කර්ණිකාවක් (මුදුන් කොත) ලැබුණොත් වටී. කොහෙන්ද දැන් ලබා ගන්න පුළුවන්. කුලවතුන්ගේ ගෙවල්වලින් හැකිවේවි. ගිහිල්ලා අහල බලන්න. ඔව්හු ඇතුළු ගමට ගොස් විචාරන්නේ, සුධම්මාගේ ගෙයි දොර සිට මේ ගෙදර කර්ණිකාවක් ඇද්දැයි විචාළහ. ඕ තොමෝ ඇතැයි කීවාය. එහෙනම් මුදල් ගන්න. මුදල් නොගනිමි. ඉදින් මට පින්දෙන්නේ නම් දෙමි. ඉක්බිති වඩුවා විසින් කිම දරුවනි කර්ණිකාවක් ලැබුණේදැයි අසන ලදී. එය ඔහුට දැන්වූහ. වඩුවා කැණිමඬලේ උන්නේම අහස බලා, පින්වත්නි, අද නැකත යහපත්ය. මෙය තව අවුරුද්දක් ගිහිල්ලයි ලබන් පුළුවන්. ඔබලා දුකසේ ගෙන දුව අවුරුද්ද මුළුල්ලේ මෙතැන දිරාපත් වෙයි. දෙව්ලොව උපන් කාලයේ ඇයටද සාලාවේ කොණක් වේවා. එය ගෙනෙන්නැයි කීය. ඕ තොමෝද නැවත ඔවුන් ඒමට පෙර කර්ණිකාවේ යට තලයෙහි ''මේ සාලාව සුධර්මා නම් යයි අකුරු කොටවා අලුත් වස්ත්‍රයකින් වෙළා තැබීය. ගැමියෝ පැමිණ කර්ණිකා ව ගෙනෙන්න එයින් ඔබටත් පින් දෙන්නෙමු යයි කීහ. ඕ එය බැහැරට ගෙන දරුවනි, අටක් හෝ දහසයක් හෝ ගොනැස් වද්දනතුරු මේ වස්ත්‍රවෙළුම ගලවන්න එපා යයි කියා දුන්නාය. ඔව්හු හොඳයි කියා ගෙන ගොනැස් වද්දවා වස්ත්‍ර වෙළුම් හැරපීහ. මගියෙක් උඩ බලන්නේ අකුරු දැක, පින්වත්නි මේ කුමක්ද අකුරු යයි

මිනිසුන් කැඳවා දක්වීය. හේ මේ සාලාව සුධම්මා නම් යයි කීය. පින්වත්නි අහක් කරන්න. අපි මුලපටන් සාලාව හදා නාම මාත්‍රයකුදු නො ලබමු. මෝ තොමෝ රියනක් පමණ කර්ණිකාවකින් සාලාව තමාගේ නමින් කරවූවාය. වඩුවා ඔවුන් කෑ ගසද්දීම ගොනැස් ප්‍රවේශ කරවා ඇණ යොදා ශාලාවේ වැඩ අවසන් කෙළේය.

ශාලාව තුනට බෙදූහ. එක කොටසක ඉසුරුමතුන්, එක් කොටසක් දුප්පතුන් අනිත් කොට ගිලනුන් ය. එක් දිනක් දුප්පතුන්ට එක් දිනක් රෝගීන්ට පෝරු තිස්තුනක් අතුරා ඇතාට සංඥා දුන්හ. ආගන්තුකයෝ පැමිණ, යමෙකුගේ ඇතුරූ ඵලකයෙහි හිඳියි. ඔහු ගෙන ඵලක හිමියාගේ ගෙයි තබයි. ඔහුගේ පා පිරිකම් පිට පිරිකම් කන බොන සයන සියල්ල ඵලක හිමියාටම භාර වන්නේය. ඇතා පැමිණි පැමිණි අය ගෙන ඵලක හිමියාගේ ගෙදරට පමුණුවයි. හේ ඔහුගේ ඒ දවසේ වැඩ කරයි. මඝමාණවක තෙමේ ශාලාව නුදුරෙහි කොබෝ ලීල ගසක් රෝපනය කෙළේය. එහි මුල ගල් පුවරුක් ඇතිරීය. නන්ද නම් බිරිය නුදුරෙහි පොකුණක් කැණ වූවාය. චිත්තා මල්පැල රෝපනය කළාය. සියල්ලටම දෙවු තැනැත්තිය වනාහි කන්නාඩියක් ගෙන ශරීරය සරසමින් හැසිරෙයි. මඝ ඇයට කීය. සොඳුර, සුධම්මා සාලාවට දායක වූවාය. නඳා පොකුණක් කැණවූවාය. චිත්තා මල්ගස් රෝපණය කළාය. ඔබේ වනාහි පින්කමක් නැත. සොඳුර, එක් පින්කමක් කරන්න. ඕතොමෝ ඔබ කාටද මේව කරන්නේ, ඔබ විසින් කළ කල්හි මටම වන්නේ යයි කියා ශරීරය සැරසීමේ ම යෙදෙයි. මඝ ආයුතෙක් සිට එයින් සැව තව්තිසා භවනයෙහි සක්‍රව උපන්නේය. ඒ තිස්තුන් දෙනාද කලුරිය කොට දෙව්පුතුන් තිස්තුන් දෙනෙක්ව ඔහු සමීපයෙහි උපන්හ. සක්‍රයාගේ වෛජයන්ත නම් ප්‍රාසාදය යොදුන් සත් සියයක් උසය. කොඩි යොදුන් තුන්සියයක් උසය. කොබෝලීල ගසේ විපාකයෙන් හාත්පස යොදුන් සියයක් වට ඇති යොදුන් පහලොවක් කඳ ඇති පාරිජාත ගස පහළ විය. පාසාණ ඵලකයේ පිනින් පාරිජාත ගස මුල සැට යොදුනක් ඇති පාණ්ඩුකම්බල ශිලාසනය පහළ විය. සුධම්මාගේ කර්ණික ගසේ පිනින් තුන් යොදුනක්වූ සුධම්මා දේවසභා ශාලාව ඇතිවිය. නන්දාගේ පොකුණේ පිනෙන් පනස් යොදුන් වූ නන්දා නම් පොකුණ පහළ විය. චිත්‍රාගේ මල්ගස් රෝපනයේ පිනෙන් සැටයොදුන් වූ චිත්‍රලතා වන නම් වූ උද්‍යානය පහළ විය.

සක්දෙව් රජ සුධම්මා දෙව් සභායෙහි යොදුනක් වූ රන් පලඟෙහි හුන්නේ, තුන් යොදුන් සේසත දරණු ලබන ඒ දෙවියන් දේව කන්‍යාවන් කෝටි දෙසිය පනහක් ......දෙදෙව්ලොව දෙවියන් පිරිවරන ලද්දේ මහත් සම්පත් බලන්නේ සත්‍රින් තිදෙනා දැක මේ අය පෙනේ, සුජාතා කොහේදැයි බලන්නේ මැය මගේ වචනය නො අසා ගිරිකඳුරෙහි කෙකිණියක්ව උපන්නා යයි දැක, දෙව්ලොවින් බැස ඈ සමීපයට ගියේය. ඕ තොමෝ දැක හැඳින බිම බලාගත්තාය. මෝඩියේ දූන් කිම හිස නොඔසවන්නේ ? තී මා කී දේ නොකොට ශරීරය ම සරසමින් සිටියෙහිය. සුධම්මා, නන්දා, චිත්තා මා සමීපයෙහි උපන්නාහ. එව අපේ සම්පත් බලවයි දෙව්ලොවට පමුණුවා නන්දා පොකුණෙහි බැහීය. ඉක්බිති ආසනයෙහි හිඳ ගත්තේය. නාටක සත්‍රිහු මහරජ කොහේ ගියේදැයි ඇසූහ. හේ නොකියනු කැමැත්තේ ද ඔවුන් නොපෙළා සුජාතා ලඟට යයි කීය. මහරජතුමණි. ඉපදී සිටින්නේ කොහේද? කඳුරු පාදයක. දූන් කොහේද? නන්දා පොකුනට මං ගෙනත් දැම්මා. එන්න පින්වතියනි, අපගේ ආර්යාව දකිමු යයි සියල්ලෝ එහි ගියහ. ඕ තොමෝ පෙර සියල්ලටම දෙවුව සිට ඔවුන්ට අවමන් කළාය. දූන් ඔව්හු ඇය දැක, බලන්න පින්වතියනි, අපේ ආර්යාවගේ කට, කකුළුවන් විදින උලක්වගේ ආදිය කියන්නියෝ කවටකම් කළහ. ඕ අතිශයින් ලජ්ජාවට පත් වූයේ සක්දෙව් රජුට කීවාය. මහරජ, මේ රන්රිදී මැණික් විමාන හෝ නන්දා පොකුණ හෝ මට මොනව කරන්නද? මහරජ සත්‍වයන්ට උපන් බිමම සැපයි. මං ඒ කන්දර පාදයටම ගිහින් දාන්න. සක්‍රයා ඇය එහි දමා මගේ වචනය කරන්නෙහි දැයි ඇසීය. මහරජතුමණි, කරන්නෙමි. පන්සිල් ගෙන කඩ නොකොට ආරක්‍ෂා කරව. කීප දවසකින් ඔබ මොවුන්ට දෙවු කරන්නෙමි. ඕ එසේ කළාය. සක්‍රයා කීප දවසකට පසු සීලය රැකීමට හැකිදැයි එහි ගොස් මසකුගේ රූපයෙන් උඩුකුරුව ඈ ඉදිරියේ ජලය මත පැමිණෙයි. ඕ මළ මසෙකැයි ගොස් හිස ගත්තාය. මසා නඟුට සෙලවී පණ ඇතැයි සිතා ජලයෙහි හළේය. සක්‍රයා අහසෙහි සිට සාදු සාදු සිකපද රකිහි. මෙසේ සික්‍ෂාපද ආරක්‍ෂා කළහොත් කීප දවසකින්ම නාටිකාවන්ගේ දෙවු කරන්නෙමි යි කීය. ඇයට ද පන්සිය වසක් ආයු විය. එක් දිනක්වත් කුසපුරවාගත නොහැකි විය. වේලී තදින් වේලී මැලවී යන්නේ ද සීලය අඛණ්ඩව කොට කලුරිය කර බරණැස කුඹල් ගෙයක උපන්නාය. සක්‍රයා කොහේ ඉපදුනාදැයි බලන්නේ දැක එයින් මෙහෙ ගෙනෙන්ට නොහැකි යයි ජීවිත වෘත්තියක් ඇයට පෙන්වමියි රන් කැකිරිවලින් යානයක් පුරවා ගම මැද මහළු වේශයකින් හිඳ කැකිරි ගන්නැයි ශබ්ද

කෙළේය. සියළු ගම්වැසියෝ පැමිණ පියාණෙනි, දෙන්න යැයි ඉල්ලූහ. මම සිල් රකින අයට දෙමි. ඔබලා සිල් රකින්නහුද? පියතුමණි. සිල් මොනවාදැයි අපි නොදනිමු. මුදලට දෙන්න. සිල් රකින අයටමයි මා දෙන්නේ. අඬේ වරෙව්, කවුද මේ කැකිරි මහල්ලා යයි සියල්ලෝම නැවතුනහ. ඒ දූරිය විචාළාය. අම්මේ ඔබලා කැකිරි සඳහා ගොස් හිස් අතින් එන්නේද? දුවේ ඒ මහල්ලා සිල් රකින අයට දෙන්නේ යයි කියයි. ඒකාන්තයෙන් මේ දූරිය සිල් සමාදන් වී සිටින්නියකි. අපි සිල් නොදනිමු. ඕ තොමෝ ගෙනෙන ලදැයි ගොස් පියාණනි, කැකිරි දෙන්නැයි ඉල්ලුවාය. දරුව ඔබ සිල් රකිනවද? එසේය පියාණනි, රකිමි. මෙය මවිසින් ඔබ සඳහාම ගෙනෙන ලදැයි යානාව සමග තබා ගියේය. ඕ ද යවදිවි සිල් රැක වේපචිත්ති අසුරයාගේ දුවව උපන්නාය. සීලයේ පිනින් පැහැපත් විය. හෙතෙම දුවගේ විවාහ මංගල්‍යය කරන්නෙමියි අසුරයන් රැස්කරවීය. සක්‍රයා කොහේ ඉපදුනාදැයි බලන්නේ අසුරභවනෙහි ඉපදී අද ඇගේ විවාහ මංගල කරන්නේයයි දැක, දූන් කිසිවක් කොට ගෙන එන්නෙමියි අසුර වර්ණයක් මවාගෙන පැමිණ අසුරයන් අතරෙහි සිටියේය. ඔබේ සවාමියා තෝරා ගන්නැයි ඇගේ පියා ඇය අතට මල්දමක් දුන්නේය. යමෙකුට කැමති නම් ඔහු තබන්න යයි කීය. ඕ තොමෝ බලන්නී සක්‍රයා දැක පෙර ඇසුරෙන් ඇති වූ ආදරය ඇත්තේ තෙමේ මාගේ සවාමියා යයි ඔහු මත්තෙහි මල්දම තැබුවාය. හේ ඇය අතින් ගෙන අහසට නැංගේය. එකෙණෙහි අසුරයෝ හැඳින ගත්හ. ඔව්හු ගනිවු ගනිවු ජරා සක්‍රයා, අපේ හතුරා අපි මොහුට දූරිය නොදෙමුයි ලුහු බැන්දහ. වේපචිත්ති ඇසූවිට මහරජ ජරා සක්‍රයාය කීහ. අවසේස අයගෙන් මොවුන් ශ්‍රේෂ්ඨය. ඉවත්වේව් යයි කීය. සක්‍රයා ඇය පමුණුවා කෝටි දෙසිය පනහක් නාටිකාවන්ගේ ජ්‍යෙෂ්ඨ ස්ථානයෙහි තැබීය. ඕ සක්‍රයාගෙන් වරයක් ඉල්ලීය. මහරජ, මට මේ දිව්‍යලෝකයෙහි මව හෝ පියා හෝ සහෝදරයා හෝ සහෝදරිය හෝ නැත. ඔබ යන තැන මාත් එක්ක යන්න. සක්‍රයා මැනවැයි පිළිණ දුන්නේය. මෙසේ මචල ගමේ මසමානවක කාලයෙහි පටන් ඔහුගේ පිරිසිදු බව භාග්‍යවතුන් වහන්සේ බලන්නේ දීඝරත්තං විසුද්ධො බො යක්ඛො'' දිගුකලෙක සිට මේ දෙවියා පිරිසිදුයයි කීහ. අත්ථසංහිතං - අර්ථ නිශ්‍රිතය-ප්‍රයෝජන සහිතය. කාරණ නිශ්‍රිතය. කරුණු - හේතු සහිතය.

පළමු බණවර වැනුම නිමි.

Scanned with CamScanner

**කිං සංයොජනං** - කුමන බැම්මකින්. කුමන බැම්මකින් බැඳී. **පුථුකායා** - බොහෝ දෙනා. **අවෙරා** - ගැටීම් නැති. **අදණ්ඩා** - ආයුධ, ධන දඬුවම්වලින් වෙන් වූ. **අසපත්තා** - සතුරු නැති. **අව්‍යාපජ්ඣා** - දොම්නස් නැති. **විහරෙමු අවෙරිනො** - කිසිවකු සමග වෛර නැතිව වාසය කරමු. කිසිවකු කෙරෙහි කෝපය නූපදවා අප්සරාවන් ගැනීම, ඡංස දහසක් සමග පරිභෝජනය කෙරෙමු යයි දත් දී පූජාකොට ප්‍රාර්ථනා කරති. **ඉති ච තෙසං හොති** - එසේ ම ඔවුන්ගේ මේ ප්‍රාර්ථනාව ද වේ. **අථ ච පන** - මෙසේ ප්‍රාර්ථනා ඇති කල්හි. **ඉස්සා මච්ඡරිය සංයෝජනා** - අනුන්ගේ සම්පත් පිරිහෙළීම් ලක්ෂණකොට ඇති ඊර්ෂ්‍යාව, තමන්ගේ සම්පත් අනුන්ගේ සාධාරණභාවයට නොඉවසීම ලක්ෂණ කොට ඇති මසුරුකම, ඉසිද මසුරු ද යෙදීම ඉස්සා මච්ඡරිය සංයොජනා වේ. මෙය මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් වනාහි ඊර්ෂ්‍යාව, මසුරුකම අභිධර්මයෙහි කියන ලද්දේමය. මෙහි ආවාස මසුරුකමින් යකෙක් හෝ ප්‍රේතයෙක් හෝ වී ඒ ආවාසයේ කසල හිසින් ඔසවා හැසිරෙයි. කුල මසුරුකමින් ඒ කුලයෙහි අන්‍යයන් දානමානාදිය කරනවා දක මගේ මේ කුලය විනාශ වේ යයි සිතීමෙන් කටින් ලේ වමනය කරයි. බඩ විරේචන ද වේ. බඩවැල් ද කැඩී කැඩී නික්මෙයි. ලාබ මසුරුකමින් සංඝයාගේ හෝ ගණයාගේ ලාභයෙහි මසුරු වී පෞද්ගලික පරිභෝගයෙන් පරිභෝග කොට යකෙක් හෝ ප්‍රේතයෙක් හෝ මහා පිඹුරෙක් වී උපදී. ශරීර වර්ණය, ගුණ වැනුම මසුරු කමින් ද පරියත්ති ධර්ම මසුරු කමින් ද තමාගේ වර්ණනය කරයි. අනුන්ගේ මොන වැනුම් ද මොහුගේ ඒ ඒ දොස් කියන්නේ බණ පොතකුදු කාටවත් නොදෙන්නේ අවලස්සනයෙක් හෝ ගොලු බිහිරෙක් වේ. තව ද ආවාස මසුරුකමින් ලෝහ ගෙයි පැසේ. කුල මසුරුකමින් ලැබීම් නැත්තෙක් වේ. ලාභ මසුරුකමින් ගූථ නිරයෙහි උපදී. වර්ණ මසුරුකමින් භවයෙහි උපන් විට වර්ණයක් නොවේ. දහම් මසුරුකමින් කුක්කුල නිරයෙහි උපදී. මේ ඉස්සා මච්ඡරිය යෙදීම සෝවාන් මගින් ප්‍රහීන වේ. එය ප්‍රහීන වනතුරු මිනිසුන් වූ අවෙරාදිය ප්‍රාර්ථනා කළත් වෛරාදියෙන් නො මිදෙති.

**තිණ්ණා මෙත්ථ කංඛා** - මේ ප්‍රශ්නයෙහි ඔබගේ වචනය අසා සැක දුරු වී යයි කියයි. මේ සැක දුරු වීම මාර්ග වශයෙන් නොදක්වයි. **විගත කථං කථා** - මේ මේ යයි මෙය ද දුරු විය. **පියාප්පිය නිදානං** - ඊර්ෂ්‍යාව ප්‍රියසත්ත්ව සංඛාරයට නිදානයයි. මසුරුකම අප්‍රිය සත්ව සංඛාරයට නිදානයයි. දෙකම දෙකටම නිදානයයි. පැවිද්දෙකුට සද්ධිවිහාරිකාදීහු ද

ගිහියෙකුට පුතුන් ආදීන් ඇත් අස් ආදිය මමත්‍වයෙන් ප්‍රියවෙති. මොහොතකුදු ඒවා නොදකින්නේ ඉවසීමට නොහැකි වෙති. හේ අන්‍යයෝ එවැනි ප්‍රිය වස්තු ලබනවා දැක ඊර්ෂ්‍යා කරයි. මෙයින් අපට වැඩක් ඇත. ටිකකට මේක දෙන්න යයි ඉල්ලූ විට දීමට නොහැකි වේ. කලාන්ත වන්නේය හෝ කලකිරෙන්නේය. ආදිය කියා මසුරුකම් කරයි. මෙසේ දෙදෙනාගේ ම ප්‍රිය සත්ත්ව නිදානය වේ. භික්ෂූන්ගේ වනාහි පා සිවුරු පිරිකර ආදිය. ගිහියන් ගේ අලංකාර ආදි උපකරණ ප්‍රිය වේ. මනාප වේ. හේ අනිකෙකුට එබඳු දේ උපදිනවා දැක මොහුට මෙය නොවේවයි ඊර්ෂ්‍යා කරයි. ඉල්ලූවිට මා තවම එය පරිභෝග කළේ නැත දිය නොහැකි යයි මසුරුකම් කරයි. මෙසේ දෙකම ප්‍රිය සංඛාරයට නිදාන වේ. අප්‍රියෙනි වනාහි කියන ලද ආකාරයෙන් සතුන් ද සංඛාර ද ලැබ ඉදින් ඔහුට ඔවුන් අමනාප නම් එසේම කෙලෙස් විපරීත වශයෙන් තබා වෙන කවුද මං වගේ මේවා ලබන්නේ යයි ඊර්ෂ්‍යා හෝ කරයි. ඉල්ලන විට තාවකාලිකවත් නොදී මසුරුකම හේ කරයි. මෙසේ මේ දෙකම අප්‍රිය සත්ව සංඛාරයට නිදාන වේ. ඡන්ද නිදානං - මෙහි සෙවීම ඡන්දයයි - ඡන්දය - පටිලාභ, පරිභොග, සන්නිධි, විසජ්ජන, පරියෙසන යයි පස් ආකාරය. රූපාදි විසය පස් සොයයි. ධනය සොයයි මේ පරියෙසන ඡන්දයයි. පටිලාභ ඡන්දය යනු ඉහත වස්තූන් ලැබීමෙන් තෘප්තිමත් නොවීමයි. ඉහත වස්තු පරිභොග කිරීමෙන් ඇතිවීමක් නොමැතිවීම පරිභෝග ඡන්දයයි. සන්නිධි ඡන්දය කුමක්ද ? ඇතමෙක් ආපදාවෙහි වන්නේ යයි ධනය රැස්කර තබයි. විසජ්ජන ඡන්දය කුමක්ද? ඇතමෙක් අතෘප්තිමත්ව ධනය වියදම් කරයි. ඇතරුවන්ට අසරුවන්ට රථිකයන්ට දුනුවායන්ට මොවුන් මා රකින්නෝය, ආරක්ෂා කරන්නෝය ප්‍රිය කරන්නේය, පිරිවරා සිටින්නේය යන සිතින් වියදම් කරයි. මේ පස්විධ ඡන්දය මෙහි තෘෂ්ණාමාත්‍රයකි. ඒ සඳහා මෙය කියන ලදී. **විතක්ක නිදානො** - මෙහි ලාභය නිසා විනිශ්චය. මෙසේ කියන විනිශ්චය විතක්කය - විතක්ක වේ.

**විනිච්ඡයො** - තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් විනිශ්චය දෙකකි. එකසිය අටක් තෘෂ්ණා හැසිරීම් තෘෂ්ණා විනිශ්චයයි. හැට දෙකක් වූ දෘෂ්ටි. දෘෂ්ටි විනිශ්චයයි. මෙසේ කියන ලද තෘෂ්ණාව විනිශ්චය වශයෙන් ඉටු අනිටු ප්‍රිය අප්‍රිය නියමය වේ. යම් දෙයක් කෙනෙකුට ඉටුවිය හැකිය. එය අනෙකෙකුට අනිටු විය හැකිය. ප්‍රත්‍යන්ත රාජ මධ්‍යම දේස රජවරුන්ට ගැඩවිල් මුවසෙවල මෙන්, එහි තෘෂ්ණා විනිශ්චයෙන් විනිශ්චිත

කල්හි ලැබූ වස්තුවෙහි රූප ශබ්දාදියට මෙපමණ මෙපමණ වන්නේ යයි නියම කිරීම විතක්ක විනිච්ඡය නම් වේ. එයින් කීහ. ''ඡන්දො බො දෙවානමින්දා විතක්ක නිදානො'' යයි පපඤ්ච සඤ්ඤා සංඛා නිදානො - තෘෂ්ණා මාන දෘෂ්ටි තුන පපඤ්ච වේ. එහි එකසිය අටක් තෘෂ්ණා හැසිරීම් තෘෂ්ණා පපඤ්චය. නව විධ මාන මාන පපඤ්චය. දෘෂ්ටි හැට දෙක දෘෂ්ටි පපඤ්ච වේ. ඒවායින් මෙහි තෘෂ්ණා පපඤ්ච අදහස් කරයි.

කුමන අර්ථයකින් පපඤ්ච වේද ? මත්වීමට පමාවට පත්කරන අර්ථයෙන් ප්‍රපඤ්ච සම්ප්‍රයුක්ත සංඥාව - පපඤ්ච සඤ්ඤා සංඛා යයි කියනු ලැබේ. ''සංඥාවේ නිදානය ප්‍රපඤ්ච සංඛා'' පපඤ්ච සඤ්ඤා සංඛා නිදානො - මෙන් ප්‍රපඤ්ච සංඥා කොටඨාශ නිදානය විතක්ක යන අර්ථයයි. සාරූප්ප ගාමිනී - මේ ප්‍රපංච සංඥා සංඛාවෙන් යම් නිරෝධ ව්‍යපසමයක් වේද එය සාරූප්‍යද එහි ගමනදැයි විපස්සනාව සමග මාර්ගය විචාරයි. ඉක්බිති ඔහු භාග්‍යවතුන් වහන්සේ "සොමනස්සං පහං" ත්‍රිවිධ වේදනා ආරම්භ කළහ. කිම ? භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරණ ලද්ද නොවිචාරණ ලද්ද අනුසන්ධි සහිත ද අනුසන්ධි රහිත ද කියන ලදද ? දෙවියන් වනාහි රූපයට වඩා අරූපයෙන් ප්‍රකටය. අරූප අතර ද වේදනාව ප්‍රකටය. කුමක් හෙයින් ද? දෙවියන් ගේ කරජකය සියුම්ය. කර්මජය. කරජකය සියුම් බැවින් කර්මජ බැවින් බලවත් බැවින් එක් ආහාර වේලක් ඉක්ම ගියහොත් නොසිටී. රත් වූ ගලක ලූ පිඬක් මෙන් විසිරී යයි. ඒ සියල්ල බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාවේ කියන ලද නයින් දත යුතුය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සක්‍රයාට තුන් වේදනා දේශනා කිරීමට ආරම්භ කළහ. රූප අරූප වශයෙන් කමටහන් දෙපරිදිය. මෙයම රූප පරිග්ගහ අරූප පරිග්ගහ යයි කියනු ලැබේ. එහි භාග්‍යවතුන් වහන්සේ යමෙකුට රූපය ප්‍රකට වේ නම් ඔහුට සංක්ෂෙප මනසිකාර වශයෙන් හෝ විස්තර මනසිකාර වශයෙන් හෝ චතු ධාතු වවත්ථානය විස්තර කරන්නේ රූප කමටහන් වදාරති. දෙවියන් වනාහි අරූපය ප්‍රකට නිසා අරූප කමටහන් වශයෙන් වේදනාව ආරම්භ කළහ. අරූප කමටහනෙහි පිවිසුම ඵස්ස, වෙදනා, චිත්ත වශයෙන් තෙපරිදිය. කෙසේද ? ඇතමෙකුට කෙටියෙන් හෝ දිගුවෙන් හෝ රූප කමටහන ගත් කල්හි ඒ අරමුණෙහි චිත්ත චෛතසික පළමුවෙන් අබිමුවෙහි වැටෙන්නේ ඒ අරමුණ ස්පර්ශ කරමින් උපදින්නේ ඵස්සය. ප්‍රකට වේ. ඇතමෙකුට ඒ අරමුණ අනුභවයෙන් වේදනාව ප්‍රකට වේ. ඇතමෙකුට ඒ අරමුණ පරිග්‍රහණය කොට විඤ්ඤාණ ප්‍රකට වේ. එහි යමෙකුට ඵස්ස ප්‍රකට

වුවත් හුදකලාව ඵසස පමණක් නූපදී. එය සමග ඒ අරමුණ සපර්ශ කරමින් ඵසසය ද දැන ගැනීමෙන් සංඥාව ද චේතනා කරමින් චේතනාවද විජානනය කරමින් විඤ්ඤාණය ද උපදී. ඵසස පංචකය ගනී. යමෙකුට විඤ්ඤාණය ප්‍රකටවේද විඤ්ඤාණය තනිකර නූපදී. එය සමට එය අරමුණු සපර්ශ කරන ඵසසය ද අනුභව කරන වේදනාව ද දැනගන්න සංඥාවද චේතනය කරන චේතනාවද උපදී. ඵසස පංචකයම ගනී. මේ ඵසස පංචමක ධර්ම කුමක් ඇසුරු කෙරේදැයි පරීක්‍ෂා කරන්නේ වස්තු නිශ්‍රය කෙරේ යයි දැනගනී. වස්තු නම් කරජකයෙහි යමක් සඳහා කියන ලදී. ''මේ විඤ්ඤාණ මෙහි ඇළුණෝ මෙහි බැඳුනේ එය අර්ථ වශයෙන් භූතරූපද උපාදාය රූපද මෙසේ මෙහි වසතුරූපය වේ. ඵසස පංචමක නාම නාමරූප පමණක් බලයි. මෙහි රූපය රූපස්කන්ධ වේ. නාමය සතර අරූප සකන්ධ වේ. නාමරූපවලින් වෙන්ව පංචස්කන්ධයක් හෝ පංචස්කන්ධයෙන් වෙන්ව නාමරූප හෝ නැත. ඒ මේ පංචස්කන්ධය කුමක් හේතුකොට ගෙන ඇද්දැයි පරීක්‍ෂා කරන්නේ අවිජ්ජා හේතුක යයි දකියි. එයින් ප්‍රත්‍යය ද ප්‍රත්‍යවලින් උපන් දෙයද හැර මෙය අන්‍ය සත්වයෙක් හෝ පුද්ගලයෙක් නොවේ. සුද්ධ සංස්කාර පුංජයක් (පිඬක්) ම යයි ප්‍රත්‍ය සහිත නාමරූප වශයෙන් ත්‍රි ලක්‍ෂණයට නගා විදර්ශනා පිළිවෙළින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි සම්මර්ශනය කරන්නේ (ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ) හැසිරෙයි. හේ අද අදම ප්‍රතිවේධය බලාපොරොත්තු වන්නේ එබඳු දවසෙහි උතු (ඍතු) පුද්ගල, භෝජන, ධර්ම ශ්‍රවණ සප්පාය (ගැළපෙන දේ) ලබා එක් අසුනක හුන්නේ විදර්ශනාව මුදුන් පමුණුවා රහත්බවෙහි පිහිටයි. මෙසේ මේ තුන්දෙනාටම රහත් බව දක්වා කමටහන් කියන ලද්දේ වේ.

මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ අරූප කමටහන් වදාරන්නේ වේදනා වශයෙන් වදාළේය. ඵසස වශයෙන් හෝ විඤ්ඤාණ වශයෙන් වදාරන්නේ මොහුට ප්‍රකට නොවේ. අන්ධකාරයක් මෙන් හැඟේ. වේදනා වශයෙන් වනාහි ප්‍රකට වේ. කුමක් හෙයින් ද? වේදනාව හට ගැනීම ප්‍රකට බැවින්, සැප දුක්වේදනා ඇතිවීම ප්‍රකටය. සැපක් මුළු සිරුර කළඹමින් වැඩෙමින් පැතිරෙමින් ගලායමින් සියක්වර පිරිසිදු කළ ගිතෙල් අනුභව කරන මෙන් සියක්වර පිසූතෙල ඇඟ ගල්වන්නාක් මෙන් කළ දහසකින් දැවිල්ල නිවන්නාක් මෙන් අහෝ සැපයි අහෝ සැපයි යන වචන පිටකරමින් උපදී. දුක මුළු සිරුර කළඹමින් මඩිමින් පතුරුවමින් ගලායමින් හීී තලයක් මෙන් වියළි තෘණ ගස් මත වනයෙහි දර හුළු එලි

තබන්නාක් මෙන් අහෝ දුකයි අහෝ දුකයි විලාප නගනවා මෙන් උපදී. මෙසේ සැප දුක් පහළවීම ප්‍රකට වේ.

අදුක්ඛමසුඛ වනාහි දක්වීම අපහසුය. අඳුරෙන් අප්‍රකටය. එය සැපදුක් ඉවත් වූවිට ප්‍රිය අප්‍රිය ප්‍රතික්ෂේප වශයෙන් මධ්‍යස්ථාකාර වූයේ අදුක්ඛමසුඛ වේදනා නයින් ගන්නහුට ප්‍රකට වේ. කුමක් සේද? යම්සේ අතරතුර ගලක් උඩින් පලාගිය මුවකුගේ අඩි සලකුණු අනුව යන මුව වැද්දෙක් ගලේ එහා කොනේ ද මෙහා කොනේද පා සලකුණු දැක මැද නොදක්නේ නමුත් මෙයින් නැග මෙයින් බැස ගලේ මැද මේ හරියෙන් යන්න ඇතැයි නය වශයෙන් දනී. මෙසේ ගොඩ වු තැන සලකුණු මෙන් සැප වේදනාවේ පහළවීම ප්‍රකටය. බැස්ස තැන පා ලකුණු මෙන් දුක් වේදනාව ප්‍රකට වේ. මෙතනින් නැග මෙතනින් බැස මැදින් ගියේ යයි කය අනුව ගැනීම මෙන් සැපදුක් අපගම යෙහි ප්‍රිය අප්‍රිය ප්‍රතික්ෂෙප වශයෙන් මධ්‍යස්ථාකාර වූ අදුක්ඛ වශයෙන් වේදනාවයයි යන වශයෙන් ගන්නහුට ප්‍රකට වේ. මෙසේ භගවත්හු පළමු රූප කමටහන දෙසා පසුව අරූප කමටහන වේදනා වශයෙන් නො වෙළා දක්වූහ. හුදෙක් මෙහි පමණක් මෙසේ දක්වූවා නොවේ. මහා සතිපට්ඨානයෙහි මැදුම්සඟි සතිපට්ඨානයෙහි චූල තණ්හා සංඛය මහා තණ්හාසංඛය චූලල වේදලලයෙහි මහාවෙදලලයෙහි මාගන්දිය සූත්‍රයෙහි ධාතු විභංගයෙහි ආනෙඤ්ජ සප්පායෙහි සියළු වෙදනා සංයුත්තයෙහි යයි මෙසේ නොයෙක් සූත්‍රවල පළමුව රූප කමටහන දේශනා කොට පසුව අරූප කමටහන වේදනා වශයෙන් ලිහිල්කොට දක්වූහ. ඒවායෙහි මෙන් මෙහි සක්‍ර ප්‍රශ්නයෙහි පළමුව රූප කමටහන දේශනාකර පසුව අරූප කමටහන වේදනා වශයෙන් ලිහිල් කොට දේශනා කළහ. රූප කමටහන වනාහි මෙහි වේදනාවේ අරමුණ පමණක්ම කෙටිකරන ලදී. පෙළෙහි නොඑන්නේය. අරූප කමටහනෙහි ඔහුට යමක් ප්‍රකට නම් වේදනා වශයෙන් පිවිසීම් වශයෙන් එයම දක්වීමට ''සොමනසසපහං දෙවානමින්ද'' යනාදිය කීහ.

එහි දුවිධෙන - දෙපරිද්දෙන්. කොටස් දෙකකින් යන අර්ථය වේ. එවරූපං සොමනසසං න සෙවිතබ්බං - මෙබඳු වූ පස්කම් සුව ආශ්‍රිත සොම්නස නොසෙවිය යුතුය. ගෙහසිත සොමනසස නම් ''එහි ගෙහසිත සොම්නස් හය කවරේද? චක්ඛු විඤ්ඤාණ වූ රූපයන්ගේ ඉටු කාන්ත මනාප මනෝරම ලෝක ආමිස ලැබීම හෝ ලැබීම සිහි කරන්නේ

ඇලීම ඇති වී සොම්නස උපදී. එබඳු වූ සොම්නස ගෙහසිත සොම්නස යයි කියනු ලැබේ. මෙසේ දොරවල සයේ කියනලද කාමගුණ නිශ්‍රිත සොම්නස. එවරූපං සොමනසසං සෙවිතබබං - මෙබඳු නෙකඛමමසිත සොම්නස සෙවිය යුතුය. නෙකඛමමසිත සොම්නස නම්. ''එහි නෙකඛමමසිත සොම්නස් හය කවරේද? රූපවල අනිත්‍යබව දැක විපරිනාම විරාග නිරෝධ පෙර මෙන් දුන් සියළු රූප අනිත්‍ය දුකඛ වෙනස්වන ස්වභාවයයි මෙසේ ඒවායෙහි යථා සවරූපය සම්‍යක් ඥාණයෙන් දකින්නේ සොම්නස උපදී. මෙබඳු වූ සොම්නස නෙකඛමමසිත සොම්නස වේ. මෙසේ දොරවල් සයේ ඉටු අරමුණක් පැමිණි කල්හි අනිත්‍යාදි වශයෙන් විදර්ශනාව පිහිටුවා උත්සාහ කරවන්ට සමර්ථ වූවහුට මවිසින් විදර්ශණාව උත්සාහවත් කරවීය යයි සොම්නස් ඇති වූ විට පහළ වූ සොම්නස සෙවිය යුතු යයි මෙය නෙකඛමම වශයෙන් විපසසනා වශයෙන් අනුසසති වශයෙන් ප්‍රථමධ්‍යානාදි වශයෙන් ද උපන් විතර්ක සහිත වූ විචාර සහිත වූ සොම්නස යයි දන්නේය. ''යෙ අවිතකෙක අවිචාරෙ තෙ පණිතතරෙ'' මේ දෙකෙහි යමක් අවිතකක අවිචාර ද එය ප්‍රණීතතර යන අර්ථයයි. මෙයින් කුමක් කියන ලද්දේ වේද? දෙකම රහත් බව කියන ලදී. කෙසේද ? එක් භික්‍ෂුවක් අවිතකක අවිචාර සොම්නසෙහි විදර්ශනාව පිහිටුවා කියනලද නයින්ම රහත් බවෙහි පිහිටයි. එහි අභිනිවෙස වේ. සොම්නසෙහි ද සවිතකක සවිචාර විදර්ශනාවට වඩා අවිතකක අවිචාර විදර්ශනාව ප්‍රණීත කර වේ. සවිතකක සවිචාර සොම්නස් විපසසනාවට වඩා අවිතකක අවිචාර විපසසනාව ප්‍රණීතතර වේ. සවිතකක සවිචාර සොම්නස් ඵල සමාපත්තියට වඩා අවිතකක අවිචාර සොම්නස් ඵලසමාපත්තිය ප්‍රණීතතර වේ. එයින් කීහ. භගවත්හු: යම් අවිතකක අවිචාරයක් වේද එය ප්‍රණීතකර වේ. එවරූපං දොමනසසං න සෙවිතබබං - එබඳු වූ ගේහසිත දොම්නස නො සෙවිය යුතුය. ගෙහසිත දොමනසස නම් එහි ගේහසිත දොම්නස් හය කවරේද? චකඛු විඤ්ඤාණ රූපයන්ගේ ඉෂට කාන්ත මනාප මනෝරම ලෝකාමිෂවලින් යුත් නොලැබීම් හෝ නොලැබුණු හෝ සිහිකරන්නේ පෙර හෝ ලබන නිරුද්ධ වූ අතීතයේ වෙනස්වීම සිහිකරන්නේ දොම්නස උපදී. එබඳු වූ දොම්නස ගේහසිත දොම්නස වේ. මෙසේ දොරවල් සයෙහි ඉටු අරමුණු අනුභව නොකෙළෙම්. අනුභව නොකරන්නෙමි. අනුභව නොකෙළෙම්. විතකක කරන කල්හි උපදින්නේ කාම ගුණ නිශ්‍රිත වූ දොම්නසයි.

**එවරූපං දොමනසසං සෙවිතබබං** - එබඳු වූ නෙකඛමම නිශ්‍රිත දොම්නස සෙවිය යුතුය. නෙකඛමමසිත දොම්නස නම් නෙකඛමමසිත දොම්නස් සය කවරේද? රූපාදියෙහි අනිත්‍යතා දූන පෙර රූපද දූන් සියළු රූප ද අනිත්‍ය දුකඛ වෙනස්වන සවභාවය ඇතැයි මෙසේ ඒවායේ යථාර්ථය සම්‍යක් ප්‍රඥාවෙන් දූක අනුත්තර වූ විමොක්‍ෂයෙහි කැමැත්ත යොදයි. කවදා මං ඒ ආයතනයට පැමිණ වාසය කරම්ද ආර්යයෝ මේ ආයතනයට පැමිණ වාසය කරති. මෙසේ අනුත්තර වූ විමොක්‍ෂයෙහි කැමැත්ත නගා තබන්නේ කැමැත්ත ප්‍රත්‍යකොට දොම්නස් උපදී. එබඳු වූ යම් දොම්නසක් නෙකඛමමසිත දොම්නස යයි කියනු ලැබේ. මෙසේ දොරවල් සයේ ඉටු අරමුණු පැමිණි කල්හි අනුත්තර විමෝක්‍ෂ සංඛ්‍යාත ආර්ය ඵල ධර්ම කෙරෙහි කැමැත්ත ඇතිකර එය අවබෝධය සඳහා අනිත්‍යාදි වශයෙන් විදර්ශනාව පිහිටුවා උත්සාහවත් වීමට නොහැකි තැනැත්තාට මේ පක්‍ෂයෙහි ද මේ වාසයෙහි ද මේ අවුරුද්දෙහි ද විදර්ශනාව උත්සාහවත් කොට ආර්යභූමියට පැමිණීමට නොහැකි වී යයි සෝකයෙන් උපන් දොම්නස සෙවිය යුතු යයි මෙය නෙකඛමම වශයෙන් විපසසනා වශයෙන් අනුසසති වශනේ ප්‍රථමධ්‍යානාදි වශයෙන් උපදවන දොම්නස ඇසුරු කළයුතු නම් වේ.

**තත්‍ථ යඤෙච සවිතකකං සවිචාරං** - ඒ දෙපරිදි දොම්නසෙහි ගෙහසිත දොම්නසම සවිතකක සවිචාර දොම්නස නම්, නෙකඛමම විපසසනා අනුසසති ප්‍රථම ද්විතීය ධ්‍යාන වශයෙන් උපන් දොම්නස වනාහි අවිතකක අවිචාර දොම්නස යයි දත යුතුය. නිෂ්පරියායෙන් අවිතකක අවිචාර දොම්නසක් නැත. දොම්නස් ඉන්‍ද්‍රියෙහි එක් අංශයකින් අකුසලය සවිතකක සවිචාරය ද ඒ භික්‍ෂුවගේ හැඟීම් වශයෙන් සවිතකක සවිචාර ද අවිතකක අවිචාර ද කියන ලදී. එහි නය මෙසේය. මෙහි භික්‍ෂුව දොම්නස් ප්‍රත්‍යය ඇති කල්හි සවිතක්ක සවිචාර ධර්මයෙහි ද අවිතක්ක අවිචාර ධර්මයෙහි ද දොම්නස් ප්‍රත්‍යයෙන් උපන් මාර්ගවල ධර්මයෙහි ද අනිත් ප්‍රතිපත්ති දර්ශන වශයෙන් දොම්නස යයි ගෙන කවදා මම සවිතක්ක සවිචාර දොම්නසෙහි විපසසනාව පිහිටු වන්නේද කවදා අවිතක්ක අවිචාර දොම්නසෙහි ද කවදා සවිතක්ක සවිචාර දොම්නස් ඵලසමාපත්තිය නිපදවන්නේ ද කවදා අවිතකක අවිචාර දොම්නස් ඵලසමාපත්ති යයි සිතා, තුන් මාසිකව සය මාසිකව නව මාසිකව හෝ ප්‍රතිපදාව ගනී. තුන් මාසිකව ගෙන පළමුවන මාසයෙහි එක් යාමයක් ප්‍රතිපදාව රකියි. යාම දෙකක් නින්දට අවකාස දෙයි. මැද

Scanned with CamScanner

මාසයෙහි යාම දෙකක් ප්‍රතිපදාව රකියි. එක් යාමයක් නින්දට අවසර දෙයි. අවසාන මාසයෙහි සක්මන් කිරීම් හිඳ ගැනීම් වලින් ම යැපෙයි. ඉදින් මෙසේ රහත් වී නම් යෙහෙකි. නො පැමිණියේ නම් විසේස කොට හය මාසිකව ගනියි. එහි ද මාස දෙක බැගින් කියනලද ක්‍රමයෙන් පිළිපැද රහත් බවට පැමිණීමට නොහැකි වන්නේ විශේෂකොට නව මාසිකව ගනියි. එහි ද මාස තුන බැගින් එසේම පිළිපැද රහත්වීමට නොහැකි වන්නේ සබ්‍රහමචාරීන් සමග විසුද්ධි පවාරණයෙන් පවාරණය කිරීමට මට ලැබෙන්නේ නැතැයි ආවර්ජනය කරන්නේ දොම්නස උපදී. කඳුළු වගුරවමින් ගාම අන්ත පර්වත වාසී මහා සිව තෙරුන් මෙන්:

තෙරුන් වහන්සේ වනාහි අටළොස් මහගණයකට උගන්වයි. උන්වහන්සේ ගේ අවවාදයෙහි සිට තිස් දහසක් භික්ෂූන් වහන්සේ රහත් බවට පැමිණියහ. ඉක්බිති එක් භික්ෂූන් වහන්සේ නමක් මාගේ අභ්‍යන්තරයෙහි අප්‍රමාණ ගුණ ඇත. මාගේ ආචාර්යයන් වහන්සේ කෙබඳු ගුණ ඇතිදැයි ආවර්ජනා කරන්නේ පෘථග්ජන භාවය දැක අපගේ ආචාර්යන් වහන්සේ අන් අයට උදව් වේ. තමාට උදව් වීමට නොහැකි වේ. උන්වහන්සේට අවවාද දෙමියි අහසින් ගොස් විහාර සමීපයෙහි බැස දිවා ස්ථානයෙහි සිටින ආචාර්යන් වහන්සේ සමීපයට පැමිණ වත් දක්වා එකත් පසෙක උන්නේය. කුමක් නිසා පැමිණියේ දැයි තෙරහු පුළුවුත්හ. එක් අනුමෝදනාවක් ගන්නෙමියි සිතා පැමිණියෙමි. ඇවැත්නි ඉඩක් නැත. ස්වාමීනි විතක්ක මාලකයෙහි සිටින විට අසමි. එතැන අන්‍යයෝ විචාරති. පිඬු සිඟායන මාර්ගයෙහි එතැන ද අන් අය අසති. දෙපට සිවුර හඳන තැන, සඟල සිවුර පෙරවන තැන අන්‍යයෝ විචාරති. පාත්‍රය බැහැර කරන ගමෙහි, හැසිර ආසන සාලාවෙහි කැඳ වැළඳූ කළ, එතැන අටුවා ඇදුරෝ තමන්ගේ සැකහැර ගනිති. ඇතුළු ගමට නික්මුණු කාලයෙහි, අතරමග භෝජන සාලාවෙහි බත්කිස අවසානයේ, දිවා ස්ථානයෙහි පා සෝදනකල, මුව සෝදන කාලයේ, මුව සෝදා ආපසු එන කාලයෙහි, සෙනසුනට පිවිස සිටින කාලයෙහි ඒ ස්ථානවල ද අන්‍යයෝ, විචාරති. ස්වාමීන් වහන්ස, මුව සෝදා සෙනසුනට පිවිස අසුන් තුන හතරක් උණුසුම් කරවා යෝනිසෝ මනසිකාරයෙහි ක්‍රියා කරන්නාට අවකාශයක් තිබිය යුතු නොවේද ස්වාමීනි, මරණයටවත් අවස්ථාවක් වන්නේද? ස්වාමීනි පෝරුවක් මෙන් අන්‍යයාට උපකාර වේ. තමාට උපකාරවීමට නොහැකි වේ. ඔබවහන්සේගේ අනුමෝදනාවෙන්

මට ප්‍රයෝජනයක් නැතැයි අහසට පැන නැගී ගියේය. තෙරුන් වහන්සේ මේ භික්ෂූන් වහන්සේ ගේ පරියත්තියෙහි වැඩ නැත. මට වනාහි අකුස්සක් වන්නෙමියි ආවේ යයි දැන, දැන් අවකාස නැත. අළුයම් කාලයෙහි යන්නෙමි යි සිතා පා සිවුරු සමීපයෙහි තබා, මුළු දිවාකාලයේ ද පළමු මැදියම් යාමවල උගන්වා පැසුළු යමෙහි එක් භික්ෂුවක් කෙරෙහි උද්දේසය ගෙන නික්මෙන්නේ පා සිවුරු ගෙන ඔහු සමග නික්මෙන්නේ, සිටි අතෙනවාසිකයා ආචාර්වරයා කිසියම් පමාවීමකින් නික්මෙන්නේ යයි සිතීය. නික්මුණු තෙරුන් වහන්සේ කිසියම් සමාන හැසිරෙන භික්ෂුවකට සංඥා කළහ. තෙරුන් වහන්සේ වනාහි මා වැන්නෙකුට රහත් බව නම් කුමක්ද? දෙතුන් දවසකින් රහත් බවට පැමිණ ආපසු එමියි අන්තේවාසිකයන්ට නොදන්වාම ඇසල මස පුර පක්ෂයෙහි සොළොස්වක තිථියෙන් නික්මෙන්නේ ගම කෙළවර පර්වතයට ගොස් සක්මනට නැගී කමටහන මෙනෙහි කරන්නේ ඒ දවස රහත් වීමට නොහැකි විය. පොහොය දිනය පැමිණි කල්හි දෙතුන් දවසකින් රහත් බව ගන්නෙමියි පිටතට පැමිණියෙමි ගැනීමට නොහැකි විය. තුන් මාසයක් තුන් දවසක් මෙන් මහා පවාරණයේ දී දැනගන්නෙමියි වස් එළඹ ගත නොහැකි විය. පවාරණ දිනයෙහි සිතීය. මම දෙතුන් දිනකින් රහත් බව ගන්නෙමියි පැමිණියෙමි. තුන් මාසයකින් ද නොහැකි විය. සබ්‍රහමචාරීහු විසුදධි පවාරණයෙන් පවාරණය කරති. මෙසේ සිතන්නේ කඳුළු වැගිරිණි.

ඉන්පසු මට සිව් ඉරියව්වෙන් මාර්ගඵල ලැබේ යයි නොසිතමි. දැන් රහත් නොවී ඇඳෙහි පිට දිග නොහරිමි පා ධෝවනය නොකරන්නෙමි යි ඇඳ ඔසවා තැබීය. නැවත ඇතුළු වසෙහි රහත් බව ගැනීමට නොහැකි විය. එකුන් තිස් පවාරණයන්හි කඳුළු ධාරා වැගිරිණ, ගම්දරුවෝ තෙරුන්ගේ පාදවල පැළුණු තැන් කටුවලින් මහති. ක්‍රීඩා කරන්නෝ ද මහා සීව තෙරුන්ගේ මෙන් පාද වේවායි ක්‍රීඩා කරති. තෙරුන් වහන්සේ තිස්වන අවුරුද්දෙහි මහා පවාරණ දිනයෙහි එල්ලෙන පෝරුව නිසා සිටියේ දැන් මම තිස්වසක් මහණදම් පුරන්නේ රහත් වීමට නොහැකි වීමි. මේ ආත්මභාවයෙහි මාර්ගයක් හෝ ඵලයක් හෝ මට නොලැබේ. සබ්‍රහමචාරීන් සමග විසුදධ පවාරණයෙන් පවාරණය කිරීමට මට නොලැබේයයි සිතුහ. මෙසේ සිතන්නේ දොම්නස ඇතිවිය. කඳුළු වැගිරිණ. ඉක්බිති නුදුරු තැනක එක් දෙව් දුවක් අඬමින් සිටියාය. කවුද මෙතන අඬන්නේ ? සවාමීනි මම දෙව්දුවක්මු. කුමක් නිසා

Scanned with CamScanner

අඬන්නෙහි ද? ඇඬීමෙන් මගපල උපදවන කල්හි මම ද මාර්ගඵල එකක් දෙකක් උපදවන්නෙමි යි සිතා අඬමි සවාමීන් වහන්ස.

ඉක්බිති තෙරුන් වහන්සේ, එම්බා මහාසීවය.... ඔබ සමග දෙවතාවියොත් කවට කථා කරති එය සුදුසු නොවේ යයි විපස්සනාව වඩා රහත් වූහ. උන්වහන්සේ දූන් නිදාගන්නෙමියි සෙනසුන පිළියෙළ කර ඇඳ සකස් කොට දිය ගෙනවුත් තබා පා දොවන්නෙමියි සෝපාන පුවරුවෙහි හිඳ ගත්තේය. උන් වහන්සේ ගේ අතවැසියෝ, අපගේ ආචාර්යන් වහන්සේ මහණදම් කිරීමට ගොස් තිස් වසක් ගතවිය. විසේසයක් ඉපදවීමට හැකිවීදූයි නැද්දූයි අවර්ජනා කරන්නෝ රහත්බවට පැමිණ පා දෙවීමට හුන්නේ යයි දූක, අපගේ ආචාර්යතුමා අප වැනි අනෙතවාසිකයෝ සිටිත්දී තමාම පා සෝදා ගැනීම නොකළ යුතුයයි මම සෝදමි මම සෝදමියි තිස් දහසම අහසින් අවුත් වැඳ පා සෝදමු සවාමින් වහන්ස යයි කීහ. ඇවැත්නි, දූන් අවුරුදු තිහක් මගේ පා නොසේදූවෙමි. ඔබලා නවතින්න, මම සෝදන්නෙමි. සක්‍රයාද ආවර්ජනා කරන්නේ, මාගේ ආර්ය මහාසීව තෙරුන් වහන්සේ රහත්බවට පැමිණ පා සේදීමට පැමිණි තිස්දහසක් අන්තේවාසිකයන්ට පා සේදීමට නොදෙති. මා වැනි උපසථායකු සිටිද්දී තමාම පා සෝදා ගැනීම යුතු නොවේ. මම සෝදන්නෙමියි සනිටුහන් කොට සුජාතා දේවිය සමග බික් සඟන සමීපයෙහි පහළ විය.

ඒ සුජා අසුරකත පෙරටු කොට ස්වාමින් වහන්ස අයින්වනු මැනවි. ගැහැණියක් යයි ඉඩ ලබාගෙන තෙරුන් වෙත පැමිණ වැඳ ඉදිරියෙහි උක්කුටුකයෙන් සිට ස්වාමීන් වහන්ස, පා සෝදන්නෙමියි කීය. කෝසිය, දූනට අවුරුදු තිහක් මාගේ පා සෝදා නැත. දෙවියෝ වනාහි මිනිස් සිරුරේ ගඳ පිළිකුල් කරති. යොදුන් සියයකින් ඈත සිටිය ද ගෙලබැඳි කුණක් මෙන් වේ. ස්වාමීනි මම සෝදමි. මම ම සෝදමි. මේ ගඳ නොදූනේ. ඔබ වහන්සේගේ සිල් සුවඳ වනාහි සදෙව්ලොව ඉක්මවා ඉහළ භවාග්‍රයට පැමිණ සිටී. සිල් සුවඳට වඩා වෙනත් උසස් සුවඳක් නම් නැත. සවාමින් වහන්ස, ඔබවහන්සේගේ සිල් සුවඳින් පැමිණියෙමි. වම් අතින් ගොප් ඇට සන්ධිය ගෙන දකුණතින් පා තල පිරිමැද්දේය. පොඩි ළමයෙකු ගේ පා මෙන් විය. සක්‍රයා පා සෝදා වැඳ දෙව්ලොවටම ගියේය.

මෙසේ සබ්‍රහමචාරීන් සමග විසුද්ධ පවාරණයෙන් පවාරණය කිරීමට නොලබමියි ආවර්ජනය කරන්නාට උපන් දොම්නස නිසා භික්ෂුවගේ හැඟීම් වශයෙන් විපස්සනා අරමුණ ද විපස්සනා මාර්ගය ද ඵලය ද සවිතක්ක සවිචාර දොම්නස ද අවිතක්ක අවිචාර දොම්නස ද කියන ලදැයි දතයුතුය. එහි එක් භික්ෂුවක් සවිතක්ක සවිචාර දොම්නසෙහි විදර්ශනාව පිහිටුවා මේ දොම්නස කුමක් නිශ්‍රිතදැයි පරීක්ෂා කරන්නේ වස්තු නිශ්‍රිත යයි දැනගනී. ඵස්ස පංචමකයෙහි කියන ලද නයින් පිළිවෙළින් රහත් බවෙහි පිහිටයි. එක්කෙනෙක් අවිතක්ක අවිචාර දොම්නසෙහි විපස්සනාව පිහිටුවා කියන ලද නයින්ම රහත් බවෙහි පිහිටයි. එහි පිවිසි දොම්නසෙහිම සවිතක්ක සවිචාරයට වඩා අවිතක්ක අවිචාරය ප්‍රණීතතර වේ. සවිතක්ක සවිචාර දොම්නස් විපස්සනාවට වඩා අවිතක්ක අවිචාර දොම්නස් විපස්සනාව පණීතතර වේ. සවිතක්ක සවිචාර ඵල සමාපත්තියට වඩා අවිතක්ක අවිචාර ඵලසමාපත්තිය ප්‍රණීතතර වේ. එයින් කීහ. භගවත්හුඃ ''යම් අවිතක්ක අවිචාරයක් වේ ද එය පණීතතර වේ'' **එවරූපා උපෙක්ඛා න සෙවිතබ්බා** - මෙබඳු වූ ගෙහසිත උපේක්ෂාව නොසෙවිය යුතුය. ගෙහසිත උපේක්ෂාව නම් එහි ගෙහසිත උපේක්ෂාව නොසෙවිය යුතුය. ගෙහසිත උපේක්ෂාව නම් එහි ගෙහසිත උපේක්ෂා සය කවරේද? ඇසින් රූපය දැක, මෝඩයාට, මුළා වු අයට, පෘථග්ජනයාට ඔධිය ජය නොගත්තාට, (රහත් නොවූවහුට) විපාක ජය නොගත්තහුට (රහත් නොවූ) ආදීනව නොදකින්නාට අශ්‍රැතවත් පෘථග්ජනයට උපේක්ෂාව උපදී. එබඳු උපේක්ෂාව රූපය නො ඉක්මවයි. ඒ උපේක්ෂාව ගෙහසිත උපේක්ෂාවයි. මෙසේ සදොරෙහි ඉටු අරමුණෙහි ආපාථගත සකුරු පිඬුවෙහි සැඟවුණු මැස්සකු මෙන් රූපාදිය නො ඉක්මවමින් එහිම ඇලෙන ඇළුණු කාමගුණ නිශ්‍රිතව උපන් උපේක්ෂාව නො සෙවිය යුතුය. **එවරූපා උපෙක්ඛා සෙවිතබ්බා** - එබඳු නෙක්ඛම්මසිත උපේක්ෂාව සෙවිය යුතුය. නෙක්ඛම්ම සිත උපේක්ෂාව නම් ''එහි නෙක්ඛම්ම සිත උපේක්ෂා සය කවරේද? රූපවල අනිත්‍යතා විපරිනාම, විරාග නිරෝධය දැන පෙර හා දැන් ඒ සියළු රූප අනිත්‍ය දුක්ඛ විපරිනාම සවභාවය යයි මෙසේ ඒවායේ යථාතත්වය සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නාට උපේක්ෂාව උපදී. එබඳු වූ ඒ උපේක්ෂාව රූප ඉක්මවා යයි. එහෙයින් ඒ උපේක්ෂාව නෙක්ඛම්ම සිත යයි කියනු ලැබේ. මෙසේ සදොරෙහි ඉටු ආදී අරමුණුවලට පැමිණ ඉටු අරමුණෙහි නොඇලෙන අනිටු අරමුණෙහි නොගැටෙන මුළා නොවන්නාට අසමව දකින්නාට උපන් ඤාණ සම්ප්‍රයුක්ත උපේක්ෂාව නෙක්ඛම්ම සිත වේ.

තවද වේදනා සභාග වූ තත්‍රමජ්ඣත්ත උපේක්‍ෂාව ද මෙහි උපේක්‍ෂාව වේ. එහෙයින් එය සෙවිය යුතුය. මෙය නෙක්ඛම්ම වශයෙන් විපස්සනා වශයෙන් අනුස්සති වශයෙන් පළමු දෙවන තෙවන සිව්වන ධ්‍යාන වශයෙන්ද උපදින උපේක්‍ෂාව සෙවිය යුතුය. මෙහි යඤ්චෙ **සවිතක්කං සවිචාරං** - එය ද නෙක්ඛම්ම සිත උපේක්‍ෂාව වේ. නෙක්ඛම්ම වශයෙන් විපස්සනා වශයෙන් අනුස්සති වශයෙන් පළමු ධ්‍යානය වශයෙන් උපන් සවිතක්ක සවිචාර උපේක්‍ෂාව යයි දන්නේය. **යඤ්චෙ අවිතක්කං අවිචාරං** - දෙවන ධ්‍යානාදිය වශයෙන් උපන් අවිතක්ක අවිචාර උපේක්‍ෂාව යයි දන්නේය. **යෙ අවිතක්කෙ අවිචාරෙ තෙ පණීතතරං** - මේ දෙකෙහි යමක් අවිතක්ක අවිචාර වේ ද එය ප්‍රණීතතර යන අර්ථයයි. මෙයින් කුමක් කියන ලද්දේ වේද? රහතන් වහන්සේලා දෙදෙනා ගැන කියන ලදී. කෙසේද? එක් භික්‍ෂුවක් සවිතක්ක සවිචාර උපේක්‍ෂාවෙහි විදර්ශනාව පිහිටුවා මේ උපේක්‍ෂාව කුමක් නිශ්‍රිතදැයි පරීක්‍ෂා කරන්නේ වස්තු නිශ්‍රිත යයි දැනගනී. ඵස්ස පංචකයෙහි කියන ලද නයින් පිළිවෙළින් රහත් බවෙහි පිහිටයි. කෙනෙක් අවිතක්ක අවිචාර විපස්සනාව පිහිටුවා කියනලද නයින්ම රහත් බවෙහි පිහිටයි. එහි පිවිසි උපෙක්ඛාව ද සවිතක්ක සවිචාරයට වඩා අවිතක්ක අවිචාරය පණීතතර වේ. සවිතක්ක සවිචාර විපස්සනාවට වඩා අවිතක්ක අවිචාර විපස්සනාව පණීතතර වේ. සවිතක්ක සවිචාර උපේක්ඛා ඵල සමාපත්තියට වඩා අවිතතක අවිචාර උපේක්ඛා ඵලසමාපත්තිය පණීතතර වේ. එයින් කීහ භගවත්හු "යෙ අවිතක්ක අවිචාරෙ තෙ පණීතතරෙ" දෙව්මහරජ මෙසේ පිළිපන් භික්‍ෂුව පපඤ්ච සඤ්ඤා සංඛා නිරෝධ සාරුප්ප ගාමිනී ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේ රහත් බව කුළුගැන්වීමෙන් දේශනාව අවසන් කළහ. සක්‍ර තෙමේ වනාහි සෝවාන් ඵලයෙහි පිහිටියේය. බුදුවරුන් ගේ අදහස සැඟවූයේ නොවේ. උත්කෘෂ්ඨම වේ. එක්කෙනෙකුට ද බොහෝ දෙනෙකුට ද ධර්මය දේශනා කරන්නේ රහත් බවින් ම කුළුගන්වති. සත්‍වයෝ වනාහි තමන්ගේ අනුරූප උපනිශ්‍රයෙහි සිටියේ කිසිවෙක් සෝවාන් වෙති. ඇතමෙක් සකදාගාමී වෙති. ඇතමෙක් අනාගාමී වෙති. ඇතමෙක් රහත් වෙති. භාග්‍යවතුන් වහන්සේ රජු මෙනි. විනේය ජනයා රාජ ළමයින් වෙති. යම්සේ රජතුමා භෝජන කාලයෙහි තමාගේ ප්‍රමාණයෙන් පිඬු උදුරා රජකුමරුවන් එලවයි. ඔව්හු තමන්ගේ කටේ ප්‍රමාණයට පිඬු කරති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අත්තජ්ඣාසය (තමාගේ අදහස) අනුරූපයෙන් දේශනාව රහත් බවින් කුළු ගන්වති. විනේය ජනයෝ තමන්ගේ උපනිශ්‍රය ප්‍රමාණයෙන් එයින් සෝවාන් ඵලය

Scanned with CamScanner

පමණක් හෝ සකදාගාමි අනාගාමි අරහත්පලම හෝ ගනිති. සක්‍රයා වනාහි සෝවාන් වූයේය. සෝවාන්ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සැව තරුණ සක්‍රයෙක් ම උපන්නේය. චුතවන්නා වූ දෙවියන් ගේ ආත්මයේ (ශරීරයේ) ගිය ආ තැන් නොපෙනේ. පහන් සිළුවේ ගමන මෙන් වේ. එනිසා සෙසු දෙවියෝ මෙය නොදනගත්හ. සක්‍රයා තමා චුත වූ බව භාග්‍යවතුන් වහන්සේ අප්‍රතිහත ඤාණභාවයෙන් ම දනගත්හ.

ඉක්බිති සක්‍රයා සිතීය. භාග්‍යවතුන් වහන්සේ විසින් මට තුන්පලක උපන් පලම කියන ලදී. මේ මාර්ගය හෝ ඵලය හෝ පක්ෂියෙකු මෙන් ඉගිලී ගැනීමට නොහැකිය. පැමිණිය යුතු පූර්වභාග ප්‍රතිපදාවක් විය යුතුය. මම රහතන් වහන්සේ ගේ ඉහළ පූර්වභාග ප්‍රතිපදාව විචාරමියි එයින් විචාරන්නේ "මාරිස, කෙසේ පිළිපන්නේද" යනාදිය කීය. **පාතිමොක්ඛ සංවරය** - උතුම් ජෙෂ්ඨ සීල සංවරය සඳහා කාය සමාචාරය, පීති ආදි සෙවිය යුතු කාය සමාචාරාදි වශයෙන් ප්‍රාතිමොක්ෂ සංවරය දක්වීම සඳහා කියන ලදී. මේ සීලකථාව නම් කම්මපථ වශයෙන් හෝ ප්‍රඥපති වශයෙන් හෝ කිව යුතු වේ. ප්‍රඥපති වශයෙන් කියන්නා විසින් පළමුව නොසෙවිය යුතු කාය සමාචාරය වන ප්‍රාණඝාත අදත්තාදාන මිථ්‍යාචාර වශයෙන් කිව යුතුය. ප්‍රඥපති වශයෙන් කියන්නා විසින් කාය ද්වාරයෙහි පණවන ලද ශික්ෂාපද ව්‍යාතික්‍රමණ වශයෙන් කිවයුතුය. සෙවිය යුතු කාය සමාචාරය පාණාති පාතාදි වෙන්වීම ද කාය ද්වාරයෙහි පණවන ලද ශික්ෂාපද ව්‍යාතික්‍රමණයෙන් ද කිව යුතුය. නොසෙවිය යුතු මුසාවාදාදි වචී දුෂ්චරිතයෙන් ද වචී ද්වාරයෙහි පණවන ලද ශික්ෂාපද ව්‍යාතික්‍රමණයෙන් ද කිව යුතුය, සෙවිය යුතු විසමාචාර මුසාවාදාදියෙන් වෙන්වීම ද වචී ද්වාරයෙහි පණවන ලද ශික්ෂාපද ව්‍යාතික්‍රමණයෙන් ද කිව යුතුය. පරියෙසන නම් කාය වචී පරියෙසනම වේ. එය කාය වචී සමාචාර ගහණයෙන් ගන්නා ලද්දේ වේ. ආජීවාෂ්ටමක ශීලයද මේ දොරවල් දෙකේ උපදී. අහසෙහි නොවේ. එහෙයින් ආජීවාෂටක ශීලය දක්වීම සඳහා වෙන්ව කියන ලදී. එහි නොසෙවිය යුතු පරියේසන වූ අනාර්ය පරියෙසනය කිව යුතුය. ආර්ය පරියේෂණය සෙවිය යුතුය. මෙය කියන ලදී, ''මහණෙනි මේ පරියෙසනය කවරේද ? මහණෙනි, මෙහි ඇතමෙක් තමාගේ ජාති සවභාවය මෙන් ජාති ස්වභාවය සොයති. තමාගේ ජරා සවභාවය මෙන් ජරා සවභාවය සොයති. තමාගේ ව්‍යාධි සවභාවය, මරණ සවභාවය, සෝක සවභාවය කිලිටි ස්වභාවය මෙන් ඒ ඒවා සොයති. මහණෙනි. ජාති ස්වභාවය යයි කුමක් කියව්ද? මහණෙනි

අඹුදරුවන්, දාසි දාසයන්, එළුබැටළුවන් කුකුළු සූකරයන්. ඇත් ගව අස් වෙළඹුන්, රන් රිදී, යන මේවා ජාති සවභාවයයි හෙවත් ජාති ධර්ම වේ. මහණෙනි මේවා උපධිය මේවායෙහි වෙළී මූර්ජිතව බැස ගන්නෝය. තමා විසින් ජාතිධර්ම සොයනු ලැබේ. මහණෙනි, ජරාධර්ම මොනවාද? අඹුදරුවන්..........ජරා ධර්ම සොයනු ලැබේ. ව්‍යාධි ධර්ම මොනවාද? අඹුදරුවන් දාසි දාසයන්. එළු බැටළු කුකුළු හුරු, ඇත් ගව අස් වෙළඹුන් ව්‍යාධි ධර්ම වේ. මහණෙනි මේවා නැවත නැවත සසර ඉපදීමට හේතුවේ. මෙවායෙහි වෙළී, මුසපත්ව ගිලෙන්නෝය. මහණෙනි, මරණ ධමම යනු මොනවාද? අඹුදරුවන් රන් රිදී බඩු කහවනු සංක්ලෙස ධර්ම වේ. මේවා සසරට හේතු වේ. මේවායෙහි වෙළී, මුසපත්ව, ගිලෙන්නෝය. මහණෙනි, මේවා අනාර්ය සෙවීම් වේ. තවද කුහනාදි වශයෙන් පංචවිධය. අගෝචර වශයෙන් සයාකාරය. වෙදකම් ආදි වශයෙන් එක්විසි ආකාරය. මෙසේ පවත්වන සියල්ල අනරිය පරියේසනයයි දත යුතුය. මහණෙනි අරිය පරියෙසන කවරේද?

මෙහි මහණෙනි ඇතමෙක් තම ජාති ධර්මයට සමාන ජාතිධර්මවල ආදීනව දැන නූපදින අනුත්තර වූ යොගක්ෂෙම වූ නිවණ සොයති. තම ජරා ව්‍යාධි, මරණ, සෝක සංකිලෙස ධර්ම සමාන ජරා ආදියෙහි ආදීනව දැක නිර්මල වූ අනුත්තර වූ යොගකෙඛම වූ නිවණ සොයති. තව ද පංච කුහනාදියද සවැදෑරුම් අගෝචරය ද එක්විසි අනේසන ද හැර භික්‍ෂා චර්යාවෙන් දැහැමින් සෙමෙන් සෙවීමද අරියපරියෙසන යම යයි දත යුතුය. මෙහි යමක් නොසෙවිය යුතු යයි කියන ලදද ඒවා මුලින්ම ප්‍රාණඝාතාදියෙහි සමූහ පරියේසන ප්‍රයෝග කරන ගමන කාලයේ පටන් නොසෙවිය යුතුය. අනිත් එක මුල පටන් සෙවිය යුතුය. දවසට දෙතුන්වරක් තෙරුවන් කෙරෙහි උපස්ථාන ගමනාදි වශයෙන් පවත්වන ධමම සේනාපති (සැරියුත්) මහා මොගගලානාදි තෙරවරුන් ගේ මෙන් කාය සමාචාර සෙවිය යුතුය. දුනුවායන් යැවීම් ආදි වශයෙන් වචන කියූ දෙව්දත් ආදීන්ගේ මෙන් වචී සමාචාරය නොසෙවිය යුතුය. තෙරුවන් මෙන් වචී සමාචාරය සෙවිය යුතුය. අනාර්ය පර්යේෂණය කරන දෙව් ආදීන්ගේ මෙන් පරියේසන නොකළ යුතුය. අරියපරියේසනම සොයන දම්සෙනවි මහමුගලන් ථෙරාදීන් මෙන් සෙවීම් අනුගමනය කළ යුතුය. එවං පටිපනෙනා ච ඛො - මෙසේ නොසෙවිය යුතු කාය වචී සමාචාර පරියේසන හැර සෙවිය යුතු දෙයෙහි සම්පූර්ණයෙන් පිළිපත් භික්‍ෂුව දෙව්මහරජ,

ප්‍රාතිමොක්‍ෂ සංවරය සඳහා උතුම් දෙටු සීල සංවරය සඳහා පිළිපන්නේ නම් වේ යයි භාග්‍යවතුන් වහන්සේ රහතන් වහන්සේ ගේ පැමිණිය යුතු පූර්වභාග ප්‍රතිපදාව වදාළහ. දෙවන විචාරීමෙන් ඉන්ද්‍රි සංවරාය - ඉඳුරන්ගේ වැසීම සඳහා දොරටු රැකීම සඳහා දොරටු සංවරය සඳහා යන අර්ථය වේ. විසඳුමෙහි වනාහි ඔහුට ඇසෙන්නේ දෘනෙන්නේ රූපයයි ආදි වශයෙන් ඉන්ද්‍රිය සංවරය දක්වීම සඳහා කියන ලදී. එහි එවං වුතෙතා - යට සොම්නස් ආදි පැන විසඳුම් ආදිය ඇසූ බවද මෙයින් ද මේ ආකාරයෙන්ම විය යුතුයයි හටගත් ප්‍රතිභානය භගවත්හු විසින් මෙසේ කියන ලදැයි සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "එතං ඉමසස ඛො අහං භනෙත" ආදි වචන කීවේය. භාගවතුන් වහන්සේ ද ඔහුට ඉඩ දී නිශ්ශබ්ද විය. කීමට කැමති වූයේ නමුත් අර්ථය සම්පාදනය කිරීමට නොහැකිය යන අර්ථයයි. අර්ථය සම්පාදනය කිරීමට නොහැකි නිසා හෝ කීමට කැමති නොවේ. එසේ නම් සක්‍රයාට ඉඩ නොදේ. මෙය වනාහි කියනු කැමැත්තේ ද අර්ථය සම්පාදනයට හැකි වේ. එයින් භාග්‍යවතුන් වහන්සේ ඔහුට අවකාස දුන්හ.

එහි මෙබඳු වූ නොසෙවිය යුතු යයි ආදියෙහි මේ සංක්‍ෂෙපයයි. යම් රූපයක් දකින්නේ රාගාදිය උපදී ද එය නො සෙවිය යුතුය. නොදත යුතුය නොබැලිය යුතුය. යන අර්ථයයි. යමක් දකින්නේ අසුභ සංඥාවෙහි හෝ පිහිටයි ද ප්‍රසාදය හෝ උපදීද අනිත්‍ය සංඥා ප්‍රතිලාභය හෝ වේද එය සෙවිය යුතුය. යම් චිත්‍රාක්‍ෂරයක් චිත්‍ර ව්‍යඤ්ජනයකද ශබ්දය අසන්නේ රාගාදිය උපදියිද මෙබඳු වූ ශබ්දය නොසෙවිය යුතුය. යමක් වනාහි අරුත් ඇසුරු කළ දහම් ඇසුරු කළ කලම්ඩි ගීතයක්ද අසන්නේ ප්‍රසාදය හෝ උපදීද විරාගයෙහි හෝ පිහිටයිද එබඳු වූ ශබ්දය සෙවිය යුතුය. යම් ගඳක් ආඝ්‍රානය කිරීමෙන් රාගාදිය උපදියි ද එබඳු ගඳ නො සෙවිය යුතුය. යම් ගඳක් ආඝ්‍රානය කිරීමෙන් අසුභ සංඥා ප්‍රතිලාභය වේ ද එබඳු ගඳ සෙවිය යුතුය. යම් රසයක් විඳින්නේ රාගාදිය උපදියිද එබඳු වූ රසය නො සෙවිය යුතුය. යම් රසයක් විඳින්නේ ආහාරයෙහි පිළිකුල් දැනීමද උපදී. රසවිඳි හේතුවෙන් කාය බලය නිසා ආර්ය භූමියට ඇතුළු වීමට හැකිවේ. මහාසීව තෙරුන්ගේ බෑණා වූ සිව සාමණේරයන්ගේ මෙන් වළඳද්දීම කෙලෙස් ක්‍ෂය විය. එබඳු වූ රසය සෙවිය යුතුය. යම් ස්පර්ශයක් පහස්නේ රාගාදිය උපදීද එබඳු වූ රසය සෙවිය යුතුය යම් ස්පර්ශයක් පහස්නේ රාගාදිය උපදීද එබඳු ස්පර්ශ නො සෙවිය යුතුය. යමක් පහස්නේ සැරියුත් හිමි ආදින්ට මෙන් ආශ්‍රව ක්‍ෂය වීමෙන්ම

Scanned with CamScanner

විරිය ද ඇතිවී පැසුළු ජනතාවට දෘෂ්‍යාන්ත වශයෙන් චරිතයෙන් අනුග්‍රහයක් වේ. එබඳු වූ ස්පර්ශය සෙවිය යුතුය. මහ මුගලන් තෙරද එසේය. සැරියුත් හිමි තිස් වසරක් ඇඳක පිට දිග නොහැරියේය. මහකසුප් තෙර විසි වසක් ද අනුරුද්ධ තෙර පනස් පස් වසක්ද, භද්දිය තෙර තිස් වසක්ද සෝණ තෙර අටළොස් වසක්ද රට්ඨපාල තෙර දොලොස් වසක් ද ආනන්ද තෙර පසළොස් වසක්ද රාහුල තෙර දොළොස් වසක් ද බකකුල තෙර අසූවසක් ද නාලකතෙර පිරිනිවන් පාන තුරු ද ඇඳක පිට දිග නොහැරියහ. (නිදා නොගත්හ). යම් මනො විඤ්ඤාණ ධර්මයක් සිහිකරන්නාට රාගාදිය උපදීද ''අන්‍යයන්ට අයත් යම් යම් ධනයක් තමන් පිණිස'' ආදි නයින් හෝ දූඩි ලෝභාදිය සිතට පැමිණේ නම් මෙබඳු වූ ධර්ම නොසෙවිය යුතුය. ''සියළු සත්වයෝ අවෛර වෙත්වා'' මෙසේ මෙතතාදි වශයෙන් වූ මෙබඳු දේ සෙවිය යුතුය. තෙරුන් තිදෙනා මෙනි. තෙරුන් තුන්නමක් වනාහි වස් එළඹෙන දිනයෙහි කාම විතක්කාදි අකුසල විතර්කයෝ විතර්කනය නොකළ යුත්තෝයහි කතිකාවක් කළහ. ඉක්බිති පවාරණ දිනයෙහි සංඝ ථෙර සංඝනවකයන් විචාළේය. ඇවැත්නි මේ තුන්මාසය තුළ කොපමණ තැන් දුවන්නට සිතට ඉඩ දුන්නේද? කාමරයෙන් පිටට දුවන්න ඉඩ නුදන්නෙමි. දෙවැන්නාගෙන් විචාළේය. ඇවැත්නි ඔබගේ කෙසේද? ස්වාමීනි නිවාස ගෙයින් බැහැරට යන්ට ඉඩ නොදුන්නෙමි. ඉක්බිති ඔව්හු තෙරුන් විචාළහ. සවාමීනි ඔබවහන්සේගේ ? තමා අයත් අජ්ඣත්ත ස්කන්ධ පංචකයෙන් පිට දිවීමට නුදුන්නෙමි. සවාමීනි ඔබවහන්සේ දුෂ්කර දෙයක් කළහ. මෙබඳු වූ මනෝ විඤෙඤයය ධම්ම සෙවිය යුතුය. **එකනතවාදා** - එකම අන්තයක් ඇති වාදය. මොවුන්ගේ ද්විධවාද නැත. ඒකාන්ත වාද එකක්ම කියයි. විචාරයි. **එකනත සීලා** - එක හැසිරීමක්. **එකනතචඡනදා** - එක ලබ්ධියක්. **එකනත අජෙඣා සානා** - එක අවසානයක්. **අනෙක ධාතු නානාධාතු ඛො දෙවානමිඥ ලොකො** - දෙව් රජතුමණි, මේ ලෝකය අනේක අදහස්ය. නානා අදහස්ය, එකෙක් යනු කැමත්තේ එකෙක් සිටිනු කැමැත්තේය. එකෙක් නිදනු කැමැත්තේ වේ. දෙන්නෙකුට එක් අදහසක් නම් දුලබය. **තසමිං අනෙකධාතු නානා ධාතුසමිං ලොකො යං ය දෙව ධාතුං** - යම් යම්ම අදහස්. **සතතා අභිනිවිසනති** - ගනිති. **තං තදෙව ථාමසා පරාමසා** - බලයෙන් ද පරාමර්ශනයෙන් ද **අභිනිවිසස වොහරනති** - හොඳින් ගෙන වහරති, කියති. දක්වති ගුණ කියති. **ඉදමෙව සචචං මොඝමඤඤං** - මේ අපගේ වචනය සත්‍ය වේ. අන්‍යයන් ගේ වචන මෝඩය, හිස්ය. නිරර්ථකය. **අචචනත නිට්ඨා** - අත්තය

විනාශයයි කියනු ලැබේ. අච්චන්තං අතීතං නිට්ඨා එතෙසං අච්චන්ත නිට්ඨා - යම් ඒ මේ අවසානයක් යම් පරමාශ්වාද නිර්වාණය එය සියළු විනාශ ඉක්මවූ නිත්‍යදැයි විචාරයි. යොගක්ඛෙම යනු ද නිවණට නමකි. අත්‍යන්ත යොගක්ඛෙමය මොවුන්ටයි අච්චන්ත යොගක්ඛෙමී - ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහ්ම වූ ආර්ය මාර්ගයෙහි හැසිරේ යයි බ්‍රහ්මචාරී වේ. අත්‍යන්ත අර්ථයෙන් ද බ්‍රහ්මචාරී වූයේ අච්චන්ත බ්‍රහ්මචාරී වේ. පරියොසනා ද නිවණටම නමකි. අච්චන්තං පරියොසානං එතෙසන්ති - අත්‍යන්ත වූ අවසානය මෙයටයි. අච්චන්ත පරියොසාන - වේ.

**තණ්හා සංඛය විමුත්තා** - තණ්හා සංඛය යනු මාර්ගයද නිවණ ද, මාර්ගය වේ. තෘෂ්ණාව ක්ෂය කරයි. විනාශ කරයි යනු තණ්හා සංඛය වේ. එනම් නිවණයි. යම් හෙයකින් එය පැමිණ තෘෂ්ණාව ක්ෂය කරයි විනාශ කරයි. එහෙයින් තණ්හා සංඛය වේ. තණ්හාසංඛය මර්ගයෙන් විමුක්ත වූයේ තණ්හා සංඛයේ හෝ නිර්වාණයෙහි විමුක්ත වූ අධිමුක්ත වූයේ - තණ්හා සංඛය විමුත්ත වේ. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් තුදුස් මහා ප්‍රශ්න විස්තර කරන ලද්දේ වේ. තුදුස් මහා ප්‍රශ්න නම් ඉස්සා මච්ඡරිය එක් ප්‍රශ්නයකි. ප්‍රියා ප්‍රිය එකකි. ඡන්දය එකකි. විතක්ක එකකි. පපඤ්ච එකකි. සොමනස්ස එකකි. දොමනස්ස එකකි. උපෙක්ඛා එකකි. කාය සමාචාර එකකි. වචී සමාචාර එකකි. පරියෙසන එකකි. ඉන්ද්‍රි සංවර එකකි. අනේක ධාතු එකකි. අච්චන්ත නිට්ඨා එකකි.

**එජා** - චලනය වන අර්ථයෙන් තෘෂ්ණාව එජා යයි කියනු ලැබේ. එය පෙළෙන අර්ථයෙන් රෝගයකි. ඇතුළත දූෂණය කරන බැවින් ගඩුවකි. අනු පිවිසීම් අර්ථයෙන් උලකි. **තස්මා අයං පුරිසො** - යම් හෙයකින් ඒජාව තමා විසින් කළ කර්මානු රූපයෙන් පුරුෂයා ඒ ඒ තැන ඉපදවීම සඳහා ආදී එහෙයින් මේ පුරුෂයා ඒ ඒ භව වශයෙන් උස් පහත් බවට පැමිණේ. බඹලොව උස්ය. දෙව්ලොව පහත්ය. දෙව්ලොව උස්ය. මිනිස් ලොව පහත්ය. මිනිස් ලොව උස්ය. අපාය පහත්ය. **යෙසානං භන්තෙ** - සවාමිනි මම යථා දේවල් කෙරෙයි. **සෙසු අහං භන්තෙ. යථාසුතං පරියත්තං** - මා විසින් යම් සේ අසන ලද්දේ ද උගත්තා ලද්දේ ද. **මෙසේ ධම්මං දෙසෙමි ධම්මං දෙසෙමි** - සත් පද දහමක් දෙසමි. **නචාහං තෙසං** - මම වනාහි ඔවුන්ගේ ශ්‍රාවකයකු බවට නොපැමිණෙමි. **අහං ඛො පන භන්තෙ** - ආදියෙ තමාගේ සෝවාන් බව දන්වයි. **වෙදපටිලාභං** - සතුටු ලාභය. **දෙවාසුර සංගාමො** - දෙවියන්ගේ ද

අසුරයන්ගේ ද සංග්‍රාමය. **සමුපබ්බුළ්හො** - පැමිණ, නලලින් නලල ගැටෙනාකාරයෙන් පැමිණියාක් මෙන්. මොවුන්ගේ වනාහි කිසි දිනක මහ සමුදුර උඩ යුද්ධය වේ. එහි කැපීම් විදීම් ආදිය ඔවුනොවුන් ඝාතනයක් නැත. දූව බැටළු යුද්ධයක් මෙන් ජය පරාජය පමණක් වේ. ඇතැම් කලක දෙවියෝ දිනති. ඇතැම් කලක අසුරයෝ දිනති. එහි යම් යුදයක දෙවියෝ දරුවන්ගේ පැමිණීම සඳහා අසුරයන් දිනුහ. ඒ සඳහා තසමිං බො පන භනෙත යයි කීය. **උභය මෙතං** - මේ දෙකම. ඕජස දිවිධය. එහි දෙව්ලොව දෙවියෝම වළඳති. මෙසේ ආවර්ජනා කරන්නාට බලවත් ප්‍රීති සොම්නස් ඉපදුනේය. **සදණ්ඩාවචරො** - දඬු සහිතව හැසිරෙන්නේ. දඬු ගැනීම ආයුධ ගැනීම සහිත විය. බහා නොතැබූ ආයුධ දඬු ගැනීම ආයුධ ගැනීම සහිත විය. බහා නොතැබූ ආයුධ දඬු දක්වයි. **එකනතනිබබිදාය** - සසරෙහි ඒකාන්තයෙන් කලකිරීම සඳහා. සියල්ල මහා ගෝවිඳ සූත්‍රයෙහි කියන ලද්දේමයි. **පවෙදෙසි** - දක්වීය, කීවේය. **ඉධෙවා** - මෙම අවකාශයෙහිම. **දෙවභූතසස මෙ සතො** - දෙවියන්ගේ සත් වූ මට. **පුනරායුව මෙ ලදෙධා** - නැවත වෙනත් කර්ම විපාකයකින් මගේ ජීවිතය ලැබුවෙමි. මෙයින් තමාගේ චුතභාවය ද උපන් බවද ප්‍රකට කරයි. **දිවියා කායාති** - දිව්‍ය ආත්මභාවය. **ආයුං හිතවා අමානුසං** - දිව්‍ය ආයුෂ හැර. **අමුළ්හො ගබභමිසසාමි** - නියත ගතික බැවින් නුමුළා වී. යම් තැනක. මගේ සිත ඇලෙන්නේ ද එබඳු වූ ක්‍ෂත්‍රිය කුලාදියෙහි ගැබට යන්නෙමි. සත්වරක් දෙව්වද මිනිස්ව දූයි මේ අර්ථය දක්වයි. **ඤායෙන විහරිසසාමි** - මිනිසුන් කෙරෙහි උපන්නේ ද මව මැරීම ආදි ප්‍රභවය බැවින් සම කරුණුවලින් ජීවත් වන්නෙමි යන අර්ථයයි. **සමෙබාධි වෙ භවිසසති** - දූන් සකදාගාමි මාර්ගය සඳහා කියයි. ඉදින් සකදාගාමි වන්නෙමි යයි දක්වයි.

**අඤඤාතා විහරිසසාමි** - අඥාතව නො දනගනු කැමතිව වාසය කරන්නෙමි. **සෙවව අනෙතා භවිසසති** - එයම මාගේ මනුෂ්‍ය ලෝකයෙහි කෙළවර වන්නේය. **පුන දෙවො භවිසසාමි දෙවලොකසමිං උතතමො** - නැවත දිව්‍යලෝකයෙහි සක්දෙව් රජ වන්නෙමියි කියයි. **අනතිමෙ වතතමානමහි** - අන්තිම භවය පවත්නා කල්හි. **සො නිවාසො භවිසසති** ආයුෂයෙන් ද ප්‍රඥාවෙන් ද යම් ඒමේ අකනිටාව සියළු දෙව්ලෝවලින් සෙට ද පණීතතර ද වේ. අවසානයෙහි එය මාගේ නිවාසය වන්නේය. මෙයවනාහි ඒ සක්‍රාත්ම භවයෙන් චුත වී ඒ ආත්ම භවයෙහි අනාගාමි මාර්ගය ලැබූ බැවින් උද්ධංසොත අකනිටයගාමීව අවිහාදියෙහි උපදින්නේ

අවසානයෙහි අකනිට්ඨාවෙහි උපදින්නේය. ඒ සඳහා මෙසේ කීය. මොහු වනාහි අවිහයෙහි කල්ප දාහක් වසන්නේය. අතප්පයෙහි කල්ප දෙදහසක් ද සුදස්සයෙහි කල්ප හාර දහසක් ද සුදස්සියෙහි කල්ප අටදහසක්ද අකනිට්ඨාවෙහි කල්ප සොළොස් දහසක් දැයි කල්ප තිස් එකක් බ්‍රහම ආයු අනුභව කරන්නේය. සක්දෙව් රජ, අනේපිඬු සිටුතුමා, විසාඛා මහා උපාසිකාව යනමේ තුන්දෙනා ද එක ප්‍රමාණ ආයුෂ ඇත්තෝය. මෙසේ සසරෙහි ඇළුණු සත්වයෝ නම් මොවුන් හා සමාන සැප ඇත්තෝ නොවෙති. **අපරියොසිත සඞ්කප්පො** - නොනිමි පැතුම්. **යසසු මඤ්ඤාමි සමණෙ** - විවේක විහාරි ශ්‍රමණයන් සිතමි. **ආරාධනා** - සම්පාදනය **විරාධනා** - අසම්පාදනය. **න සමෙහානති** - සම්පාදනය කොට කීමට නොහැකි වෙති. **ආදිච්ච බන්ධුනං** - හිරු ද ගෞතම ගොත්‍ර භාග්‍යවතුන් වහන්සේ ද ගෞතම ගොත්‍ර වේ. එහෙයින් මෙසේ කීය. **යං කරොමසෙ** - පෙර බ්‍රහමයෝ යම් නමස්කාරයක් කළෝද, **සමං දෙවෙහි** - දෙවියන් සමග මෙතන් පටන් දූන් අපගේ බ්‍රහ්ම නමස්කාරය නැතැයි දක්වයි. **සාමං කරොම** - නමස්කාර කරමු. **පරාමසිත්වා** - සතුටු සිතැත්තේ යහළුවන් අතින් අත පහස්නාසේ (අතට අත දෙන්නාසේ) පොළොව පහරා සාක්ෂිභාවය පිණිස හෝ භාග්‍යවත්නි යම්සේ ඔබ නිසලද මමද එසේය. **අජ්ඣිට්ඨ පඤ්හා** - අධ්‍යෙසිත ප්‍රශ්න. ප්‍රාර්ථිත ප්‍රශ්න. සෙසු සියල්ල පැහැදිලි වේමය.

**සක්ක පඤ්හ සූත්‍ර වර්ණනාව නිමි.**

# 2-22

## මහාසතිපට්ඨාන සූත්‍ර වර්ණනාව

මහා සතිපට්ඨාන සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. එහි අපූර්ව පද වර්ණනාව මෙසේය. **එකායනො අයං භික්ඛවෙ මග්ගො** - භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා මේ සූත්‍රය වදාළසේක්ද? කුරුරට වාසීන්ගේ ගැඹුරු දහම් පිළිගැනීමේ සමත්කම නිසාය. කුරුරට වාසීහු

වනාහි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවෝ ඍතු ප්‍රත්‍ය සම්පන්න බැවින් ඒ රටෙහි සත්ප්‍රාය වූ ඍතු ප්‍රත්‍ය වශයෙන් නිතර මහා ශරීර ද මනා සිත් ද වේ. ඔව්හු සිත හා ශරීර යහපත් බැවින් අනුග්‍රහිත ප්‍රඥා බලයෙන් ගැඹුරු කථා පිළිගැනීමට සමත් වෙති. ඔවුන් ගේ මේ ගැඹුරු දේශනා පිළිගැනීමේ සමත්කම බලත්නාවූ භාග්‍යවතුන් වහන්සේ එක්විසි තැනක කමටහන් රහත් බවෙහි බහා මේ ගැඹුරු අරුත් ඇති මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාව වදාළහ.

පුරුෂයෙක් යම්සේ රන් කරඬුවක් ලැබ එහි නොයෙක් මල් බහා තබන්නේය, රන් පෙට්ටියක් හෝ ලැබ සත්රුවන් බහා තබන්නේය. එසේම භාග්‍යවතුන් වහන්සේ කුරුරටවාසී පිරිස ලැබ ගැඹුරු දහම් දේශනා කරති. එහෙයින් ම මෙහි අනිකුදු ගැඹුරු අරුත් ඇත. මෙම දීඝනිකායෙහි මහානිදාන සූත්‍රය, මජ්ඣිම නිකායෙහි - සතිපට්ඨාන, සාරොපම, රුක්ඛූපම, රට්ඨපාල, මාගන්ඩිය, ආනෙඤ්ජ සප්පාය යන අනිත් සූත්‍ර දේශනා කළහ. තවද ඒ ජනපදයෙහි සිව් පිරිස් ස්වභාවයෙන් ම සතිපට්ඨාන සූත්‍ර භාවනාවේ යෙදී වාසය කරති. යටත් පිරිසෙයින් දාස් කම්කරු සේවකයෝ ද සතිපට්ඨාන සංයුක්ත කථාම කරති. දිය තොටෙහි නූල් කටින සථානවල ද නිරර්ථක කථා නොපවත්වති. ඉදින් කිසිවෙක් ස්ත්‍රියකට අම්මේ, ඔබ අද කවර සතිපට්ඨාන භාවනාවක් සිහි කෙරෙහි දැයි ඇසූවිට කිසිවක් නැතැයි කියයි. ඇයට ගරහන්නී තිට නින්දා වේවා. තී ජීවත්වුනත් මළ එකියක වගේය. ඉක්බිති ඇයට නැවත මෙසේ නොකරන්නැයි අවවාද දී එක්තරා සතිපට්ඨානයක් උගන්වයි. ඕ වනාහි මම අසවල් සතිපට්ඨානය සිහිකරමි යි කියයි ද ඇයට සාධු යයි සාධුකාර දී ඔබේ ජීවිතය යහපත්ය. ඔබ නම් මිනිසත් බවට පැමිණියක. ඔබ සඳහා සම්බුදුහු උපන්හ. ආදියෙන් ප්‍රශංසා කරති. හුදෙක් මිනිසුන් පමණක් සතිපට්ඨාන මෙනෙහි කිරීමෙන් යුක්ත වූවෝ නොවෙති. ඔවුන් ඇසුරුකර වසන තිරිසන්නු ද එසේ කරති. එහි මේ වස්තුව වේ. එක්තරා නාට්‍ය කණ්ඩායමක් ගිරා පැටියෙකු ගෙන හික්මවන්නේ හැසිරෙති. ඔව්හූ භික්ෂුණී උපස්සයක් ඇසුරු කොට වාසය කර යනවිට ගිරා පැටියා අමතක කර ගියහ. ඌ සාමණේරියෝ ගෙන පෝෂණය කළහ. බුද්ධරක්ඛිත යයි ඌට නමක් තැබීය. එක් දිනක් ඌ ඉදිරියෙහි සිටිනවා දැක මහ තෙරණියො මෙසේ කීය. බුද්ධරක්ඛිත ආර්යයෙනි කුමක්ද, ඔබ කිසියම් භාවනාවක් මෙනෙහි කරනවාද ? ආර්යෙනි, නැත. ඇවැත්නි, පැවිද්දන් ලඟ වෙසෙන්නත් විසිරුණු

ආත්මභාවයෙන් වීම නොවටිනේය. කිසි මෙනෙහි කිරීමක් කැමති විය යුතුය. ඔබට වෙන මොකවත් නො හැකිනම් අට්ඨී අට්ඨී යයි සජ්ඣායනා කරන්න. හේ තෙරණිය ගේ අවවාදයෙහි සිට අට්ඨී අට්ඨී යයි සජ්ඣායනා කරන්නේ හැසිරෙයි. හේ එක් දිනක් උදේම තොරණ අග හිඳ තරුණ හිරු රැස් විඳින්නේ එක් පක්ෂියෙක් නිය පඳුරෙන් ගත්තේය. හේ කී හැටි ශබ්ද කෙළේය. සාමණේරියෝ අසා, ආර්යයෙණි බුද්ධරක්ඛිත පක්ෂියකු විසින් ගන්නා ලද්දේය. ඔහු මුදවමු. ගල්කැට දඬු ආදිය ගෙන ලුහු බඳින්නේ මිදවූහ. ඌ ගෙනවුත් ඉදිරියේ තබන ලද්දේ තෙරණිය කීවාය. බුද්ධරක්ඛිත පක්ෂියා විසින් අල්ලාගත් කාලයෙහි කුමක් සිතුවෙහි ද? ආර්යෙනි, වෙන දෙයක් සිතුවේ නැහැ. ඇට සමුහයක් ඇට සමූහයක් විසින් ගෙන යනු ලබනවා යයි සිතුවෙමි. සාධු සාධූ බුද්ධරක්ඛිත. අනාගත භව ක්‍ෂය සඳහා ප්‍රත්‍ය වන්නේය. මෙසේ එහි තිරිසන්ගතව ද සතිපට්ඨාන මෙනෙහි කිරීමෙන් යුක්තය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සතිපට්ඨානයෙහි බුද්ධියම පහළ කරන්නේ මේ සූත්‍රය වදාළහ. එහි එක් මාර්ගය. එකායනො - මාර්ගයෙනිඃ

මග පන්‍ථ පථ පදී - අංජස වටුම අයනය
නැව උතුරු හේ සහ - පහුරු පඩවි යන්නෙ එහි

මෙහි බොහෝ නම් ඇත. මෙහි අයන නමින් කියන ලදී. එහෙයින් "එකායනො භික්ඛවෙ මග්ගො" මෙහි මහණෙනි මේ එකම මග මාර්ගයයි. මාර්ග දෙකක් නොවේ යයි මෙසේ අර්ථය දත යුතුය. නැතහොත් පිළිපැදිය යුතු එකායනො - එකකින්. සමූහයාගෙන් වෙන්ව හුදකලාව විවේකයෙන් පිළිපැදිය යුතු, අයංවා එතෙනාති - අයනො - මාර්ගය, සසරින් නිවනට යයි යන අර්ථයයි. එකසස අයනො - එකායනො, එකසස යනු ශ්‍රේෂ්ඨයාගේ - සියළු සත්‍වයන්ට ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ එහෙයින් භගවතො යයි කියන ලද්දේ වේ. කිම අනිත් ඒවාත් අයන වේද? මෙසේ ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේම ඒ අයනය උපදවන ලබ බැවින් කීයඃ සො හි බ්‍රහමණ භගවා අනුප්පන්නසස මග්ගසස උප්පාදෙතා" බමුණ භාග්‍යවතුන් වහන්සේ නූපන් මග ඉපද වූ සේකඃ ආදිය වේ. අයතීති - අයනො, යයි පවත්වයි යන අර්ථ වේ. එකසමිං අයනො එකායනො, එකෙක්හි ම අයනය. ධර්ම විනයෙහි මෙයම පවත්වයි. වෙනත් තැනක නොකියන ලද්දේ වේ. යම් සේ කීයඃ සුභද්‍ර, මේ ධර්ම විනයෙහි ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලැබේ. දේශනා

භේදයෙන් මිස අර්ථයෙන් වනාහි එකමය. තව ද එකං අයතීති - එකායනො. පූර්ව භාගයෙහි විවිධ භාවනාවන් පැවැත් වූයේ ද අපරභාගයෙහි එකම නිවනට යයි. කියන ලද්දේ වේ. යම්සේ කීය. සහම්පති බ්‍රහ්මයා විසින්:

දුක අයන දෑ වැය - දනී මග හිත කුළුණෙන්
තැරූ පෙර මෙ මගින් - තරති ඕඝ මතු තරති

කිසිවෙක් පරතෙරට නොයති. ගාථා නයින් යම්සේ එක් වරක් නිවන් යයි. එහෙයින් ඒකායන යයි කියති. එය නොයෙදේ. මේ අර්ථයේ වරක් අයන යයි ව්‍යඤ්ජනය විය යුතුය. ඉදින් එක් අයනයක් නම් එක ගති පවතී. මෙසේ අරුත් යොදා කියන්නේ නම් ව්‍යඤ්ජනය යෙදෙන්නේය. අර්ථය දෙවිධියෙන් ම නොයෙදේ. කුමක් හෙයින්ද මාර්ගයේ පූර්වභාගය අභිප්‍රේත බැවින්, කායාදි සතර අරමුණු පවතින සතිපට්ඨාන මාර්ගයේ පූර්වභාගය මෙහි අපේක්‍ෂා කෙරේ. ලෝකෝත්තරය නොවේ. අනේක වාරයක් මාර්ගය වේ. මෙහි අනේක මාර්ග වේ. පෙර ද මේ පදයෙහි මහතෙරවරුන් ගේ සාකච්ඡාවක් ඇති වූයේමය. ත්‍රිපිටක චූලනාග ස්ථවිරයන් වහන්සේ පූර්වභාග සතිපට්ඨාන මාර්ග යයි කීහ. ආචරිය ත්‍රිපිටක චුලල සුමම ස්ථවිරයන් වහන්සේ මිශ්‍රක මාර්ගයයි කීහ. සවාමින් වහන්ස පූර්වභාගයද? ඇවැත්නි මිශ්‍රකය. ආචාර්යන් වහන්සේ නැවත නැවත කියන කල්හි වලක්වා නිශ්ශබ්ද විය. ප්‍රශ්නය විනිශ්චය නොකොට ම නැඟී සිටියහ. ඉක්බිති ආචරිය තෙරුන් නාන කොටුවට යන්නේ මා විසින් මිශ්‍රක මාර්ගය කියන ලදී. චූලනාග පූර්වභාග පූර්වභාග මුලපිටපත් පෙරළෙන්නේ "යො කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්ත වස්සානි" යන මේ ස්ථානයෙහි සැලකීය. ලෝකෝත්තර මාර්ගය ඉපිද සත් වසක් සිටින්නේ නම් නැත. ම විසින් කියන ලද මිශ්‍රක මාර්ගය නො ලැබේ. චූලනාග විසින් දකින ලද පූර්වභාග මාර්ගයම ලබා යයි දැන අටවක්දින ධර්මශ්‍රවණය සඳහා ඝෝෂණය කළ විට එළඹියේය. පුරාණ තෙරවරු ධර්මශ්‍රවණය ප්‍රිය වෙති. ශබ්දය අසාම මම පළමුව මම පළමුව යයි එකවිටම රැස්වෙති. ඒ දිනයෙහි චූලනාග තෙරුන්ගේ වාරයයි. ධර්මාසනයෙහි විජිනිපත ගෙන පූර්ව ගාථා කී කල්හි තෙරුන් වහන්සේ ගේ ආසනය පිටිපස සිටියහුට මෙසේ සිත් විය. රහසිගතව සිට කියන්නෙමි. පොරාණ තෙරවරු අසන්නෝ වෙති. තමාට රුචි උක්හරක් මෙන් ඔසවා

නොහැසිරෙති. කරුණුම ගනිති. නො කරුණු අත් හරිති. එහෙයින් තෙරුන් වහන්සේ, ඇවැත්නි චූලලනාග යයි කීය. හේ ආචාර්යන් වහන්සේ ගේ ශබ්දය වගේ යයි ධර්මය නවත්වා ස්වාමීනි කිමද්දයි ඇසීය. ඇවැත්නි චූලලනාග, මා විසින් කියන ලද මිශ්‍රක මාර්ගය නොලැබේ. ඔබ විසින් කියන ලද පූර්වභාග සතිපට්ඨාන මාර්ගය ම ලැබේ යයි. සුළුනා තෙර සිතී. අපගේ ආචාර්යන් වහන්සේ සියළු පරියත්තිකය. ත්‍රිපිටකධරය, සුත බුද්ධය. එබඳු වූ භික්ෂූන් වහන්සේ මේ ප්‍රශ්නය කළඹයි. අනාගතයෙහි මාගේ සහෝදරයන් මේ ප්‍රශ්නය කළඹන්නාහ. සූත්‍රය ගෙන මේ ප්‍රශ්නය නිශ්චල කරන්නෙමි යයි පටිසම්භිදා මාර්ගයෙන් එකායන මාර්ගය කියනු ලැබේ. පූර්වභාග සතිපට්ඨාන මාර්ගය

සස් කෙරෙන් සිව්සස් - අටඟමග වෙයි මගිනුත්
දහමින් විරාගය - දෙපදයින් සෙට බුදුහිමි

මෙයම මග වෙන නැත - දසුනට ද පිරිසිදුවට
මරසෙන් පැරදුමට - පිළිපදිනු මෙම මග හැම
පිළිපන් ඔබ මෙයට - දුක් කෙළවර කරන්නෙය.

සූත්‍රය ගෙනහැර තැබීය. මගෙගා - කුමන අර්ථයකින් මාර්ගය වේද? නිවන් ගමන අරුතෙන්. නිවන් කැමැත්තවුන් විසින් මාර්ගයට පමුණුවන බැවින් ද සත්තානං විසුද්ධියා - රාගාදි කිලුටෙහි ද අභිධ්‍යා විෂම ලෝභයෙහි ද උපක්ලේශවලින් කිලිටි සිත් ඇති සත්වයින් ගේ පිරිසිදු බව සඳහා, එසේම මේ මාර්ගයෙන් ම මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට පෙර එකම කල්පයක උපන් තණ්හංකර, මෙධංකර, සරණංකර, දීපංකර නම් බුදුවරුන් ආදිකොට සාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ අවසන්කොට ඇති අනේක සම්මා සම්බුදුවරු නොයෙක් සිය ගණන් පසේ බුදුවරු සත්වන පථය ඉක්මවන ආර්ය ශ්‍රාවකයෝ ද මේ සියළු සත්වයෝ සිත්වල සියළු කිලිටි සෝදාහැර පරම පවිත්‍රත්වයට පත්වූහ. රූප කිලිටි වශයෙන් වනාහි කිලිටි පිරිසිදු පැණවීම් නැත.

රූව කිලිටි වීමෙන් - මිනිසුන් කිලිටි වේ යයි
රූව විසුදුයෙන් විසුදු - වන බව් නොකී මුනිතුම

Scanned with CamScanner

සිත කිලිටිවීමෙන් - කිලිටිවෙත් මානවයෝ
සිත විසුදයෙන් - විසුදුවන බව් කී මුනි

යම්සේ කීහ: ''මහණෙනි, සිත කිලිටිවීමෙන් සත්‍වයෝ කිලිටි වෙති. සිත පිරිසිදු වීමෙන් 'විසුද්ධ වෙති'' ඒ සිතේ පිරිසිදුවීම මේ සතිපට්ඨාන මාර්ගයෙන් වේ. එයින් කීය: සත්‍වයින්ගේ විසුද්ධිය පිණිස සෝක පරිදේවයන්ගේ ඉක්වීම සඳහා සොකපරිද්දවානං සමතික්කමාය - සෝකයන්ගේද පරිදේවයන්ගේ ද සමතික්‍රමණය ප්‍රහානය යන අර්ථය සඳහා,

මේ මාර්ගය භාවිත කිරීමෙන් සන්තති මහාමාත්‍යාදීන් මෙන් සෝක නැති කිරීම සඳහා ද, පරිදේව නැති කිරීම සඳහා ද පටාචාරාදීන් මෙන් පවතී. එයින් කීහ: ''සොකපරිද්දවානං සමතික්කමාය'' සෝක පරිදේව ඉක්මවීම සඳහා සන්තති මහ ඇමති -

පෙර යම් කෙලෙස් වෙද - පිරිසිදු කරනු මැනවින්
මැද නොගන්නෙහි නම් - හැසිරෙහි නිවුනකු ලෙසින්

මේ ගීය අසා සෝවාන් පලයෙහි පිහිටියේය. කාය වේදනා චිත්ත ධර්මවල කිසියම් ස්වභාවයක් පරාමර්ශනය නොකොට භාවනා නම් නැත. එහෙයින් ඔබලා ද මේ මාර්ගයෙන් සෝක වැලපීම් ඉක්මවන්නේ යයි ඔබලාද දත යුතුය. දුක්ඛ දොමනස්සානං අත්ථංගමාය - කායික දුක් ද මානසික දොම්නස් ද යන මේ දෙකේම නැති කිරීම සඳහා, නිරෝධය සඳහාය යන අර්ථය වේ. මේ මාර්ගය භාවිත කළ තිස්ස තෙරුන් මෙන් දුක්ඛය ද දොම්නසද නැතිකිරීම පිණිස පවතී. එහි අර්ථය දැක්වීම මෙසේය. :

සැවැත් නුවර තිස්ස නම් කෙළෙඹි පුත්‍රයෙක් හතලිස් කෝටියක් අමුරන් හැර පැවිදිව අගාමක වූ අරණ්‍යක වාසය කරයි. උන්වහන්සේගේ කනිටු සහෝදරයා ගේ බිරිය උන්වහන්සේ මරවනු පිණිස සොරුන් පන්සියයක් යැව්වාය. ඔව්හු ගොස් තෙරුන් වහන්සේ වට කොට සිටියහ. තෙරුන් වහන්සේ කීහ. උපාසකයිනි, කුමක් නිසා පැමිණියහුද? ඔබේ ජීවිතය තොර කිරීමටය. උපාසකයෙනි මාගේ ඇපය ගෙන අද රැට ජීවිතය දෙන්න. මහණ ඔබට මේ ස්ථානයේ තිබෙන ඇපය කුමක්ද?

Scanned with CamScanner

තෙරුන් වහන්සේ විශාල ගලක් ගෙන කලවා ඇට දෙක බිඳදමා උපාසකවරුනි, ඇපය වටිනවා දැයි ඇසූහ. ඔව්හු ඉවත්ව සක්මනෙහි ගිනි දල්වා නිදාගත්හ. තෙරුන් වහන්සේ තම වේදනාව යටපත් කොට සීලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ පිරිසිදු සීලය නිසා ප්‍රීති ප්‍රමෝදය ඇතිවිය. එයින් පිළිවෙළින් විදර්ශනාව වඩන්නේ තුන්රැ මුළුල්ලේ මහණදම් පුරා අරුණු නැගෙන විට රහත් බවට පැමිණ මේ උදන් ඇනූහ.

බිඳදමා පා දෙක - සංයම වීමි සතුටින්
රාගයුත් මරණය - පිළිකුල්ය ලජ්ජා වෙමි

මේ ලෙසින් සිතමින් - දක්කෙමි සැබෑ තත්වය
අරුණු නැගෙනා කල - පසක් විය අරහත් බව

තව ද භික්‍ෂූන් තිස් නමක් බුදුරදුන්ගෙන් කමටහන් ගෙන අරණ වෙහෙරක වස් එළඹ "ඇවැත්නි, තුන්යම් රාත්‍රියේ මහණදම් කළයුතුය. ඔවුනොවුන් ගේ සමීපයට නොපැමිණිය යුතු යයි කියා වාසය කළහ. උන්වහන්සේලා මහණදම් කොට අළුයම් වේලෙහි නිදා වැටෙන්නාවූ එක් එක් භික්‍ෂූන් ව්‍යාඝ්‍රයෙක් ඇවිත් ගෙන යයි. කිසිවෙක් ව්‍යාඝ්‍රයෙක් මා ගත්තේ යයි වචනයකුදු පිට නොකෙළේය. මෙසේ භික්‍ෂූන් පසළොස් දෙනෙකු කෑ කල්හි පොහෝ දිනයෙහි, ඇවැත්නි, අනික් අය කොහේදැයි විචාරා දැන, දැන් ගත්තහු ගනිමු යයි කියා විසූහ. ඉක්බිති එක්තරා දහර භික්‍ෂුවක් පෙර විදියටම ව්‍යාඝ්‍රයා ගත්තේය. හේ ස්වාමීනි ව්‍යාඝ්‍රයායි කීය. භික්‍ෂූහු සැරයටි සහ හුළුඑළි රැගෙන මුදාගන්නෙමු යයි ලුහු බැන්දහ. ව්‍යාඝ්‍රයා භික්‍ෂූන් එන බව දැක බිඳුණු පර්වත පාදයකට නැග ඒ භික්‍ෂුවගේ පා ඇඟිලිවල සිට කෑමට පටන් ගත්තේය. සත් පුරුෂය දැන් අපට කරන්නට දෙයක් නැත මෙබඳු ස්ථානයේ භික්‍ෂූන්ගේ විශේෂය පෙනේ යයි කීහ. උන්වහන්සේ ව්‍යාඝ්‍ර මුඛයේ සිටම ඒ වේදනාව යටපත් කොට විදර්ශනා වඩා ගොප් ඇටය කන වෙලාවේ සෝවාන් වී දනහිස් කන වේලෙහි සකදාගාමිව නාභිය කන වෙලාවේ අනාගාමිව හෘදය වස්තුව කෑමට පෙර සිව්පිළිසිඹියා සහිත රහත්ව මේ උදන් ඇනූහ.

Scanned with CamScanner

සිල්වත්ව එකතින් - සුසමාහිතව නුවණින්
මොහොතක් පමා වී - සිරකළ සිතින් වගයා
සීලයෙන් මෙහෙයූ - පජරෙයි ඇටකටු බලා
ඇට නහර රිසිසේ - කනහැටි දකිමින් වගා
කෙලෙසුන් දුරු කෙළෙමි - විමුත් සුව පහසන්නෙමි

තව ද ප්‍රීතිමලලක ස්ථවිරයන් නමැති ගිහි කාලයෙහි රටවල් තුනක කොඩි ගෙන තම්බපණ්ණි දිවයිනට පැමිණි රජු දැක රජු විසින් කරන ලද අනුග්‍රහ ඇතිව එක් දිනක් කලාල් අවුණු දොරින් යන්නේ ''මහණෙනි, රූපය ඔබේ නොවේ, එය අත්හරින්න. එය අත් හැරීම බොහෝ කාලයක් හිත සුව පිණිස පවතී''. ඔබගේ වාක්‍ය අසා සිතීය. රූපය තමාගේ නොවේ. වේදනාව තමාගේ නොවේ. එයම අංකුසයක් කොට නික්මී මහවෙහෙරට ගොස් පැවිද්ද යැද පැවිදිව උපසපන්ව මාතිකා දෙකක් ප්‍රගුණ කොට භික්ෂූන් තිස්නමක් ගෙන ගුගුරුවැලි මලුවට ගොස් මහණදම් කෙළේය. පා අවසඟ වූ විට දනිස්වලින් සක්මන් කරයි. එම රැයෙහි එක් මුව වැද්දෙක් මුවකැයි උන්වහන්සේට පහර දුන්නේය. සැත විනිවිද ගියේය. උන්වහන්සේ ඇවිය හැරදමා පැහැරි තුවාලයට තෘණවලින් පුරවා ගලමත සිරුර සතපවා ඉඩ සලසා විදර්ශනා වඩා සිව්පිළිසිඹියා සහිතව රහත් වි උගුර පෑදූ හඬින් භික්ෂූන්ට පැහැදිලි කොට මේ උදානය ඇනීය.

ලොවටම දෙන ඔවා - සෙට බුදුරදුන් බස නම්
"මහණෙනි මෙ කය තොපෙ - අයත් නැත හැර දමව් එය"
සකර නිත් නැතිමය - ඉපදෙන නැසෙන දහමකි
ඉපදී නැසෙන සුළු - සැපයකි එයින් වෙන්වුම

ඉක්බිති භික්ෂූහු උන්වහන්සේට කීහ සවාමීන් වහන්ස, ඉදින් සම්බුදු හිමි නීරෝග වූයේය. ඒකාන්තයෙන් ඔබ මුහුදමතින් අත දිගුකර හිස පිරිමදින්නේය. මෙසේ මේ මාර්ගය තිස්ස තෙරුන් ආදීන්ට මෙන් දුක් නැති කිරීම සඳහා පවතී. සක්දෙව් රජ තමා ගේ පස් ආකාර පෙර නිමිති දැක මරණ භයින් තර්ජිතව දොම්නස් වී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ විචාළේය. හේ උපේක්ෂා ප්‍රශ්න විසඳීම් අවසානයෙහි අසූ දහසක් දෙවියන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඒ උපත ද නැවත ප්‍රකෘතිමත් විය.

Scanned with CamScanner

සුබ්‍රහ්ම දිව්‍ය පුත්‍රයා ද දෙවඟනන් දහසක් පිරිවරණ ලද්දේ ස්වර්ග සම්පත් අනුභව කරයි. එහි අප්සරාවෝ පන්සීයක් ගස්වලින් මල් නෙලන්නෝ සැම නිරයෙහි උපන්නාහ. හේ කිම කල් ගන්නේ යයි පරීක්ෂා කරන්නේ ඇලා නිරයෙහි උපන් බව දැන මගේ ආයුෂ කොපමණදැයි පරීක්ෂා කරන්නේ තමාගේ ද ආයු ක්ෂයවන බව දැන සැව ඒ නිරයෙහි ම උපදිනා බව දැක බියට පත් වූයේ අතිශයින් දොම්නසට පැමිණ මගේ මේ දොම්නස ශාස්තෘන් වහන්සේ ඉවත් කෙරේ යයි අවශේෂ අප්සරාවන් පන්සීය ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ප්‍රශ්නයක් විචාළේය.

සිත මනස නිතරම - තැතිගත් නොපත් කිසවල
උපත්හිද කියමැන - ඇත්නම් නොතැතිගැන්මක්

ඉක්බිති තථාගතයන් වහන්සේ ඔහුට කීහ.

බොජඟ තපස ඉඳුරු - සංවර සමග සියළුම
හැර දමුම හැර වෙන - නොදනිමි සුවය සතහට

හේ දේශනාවසානයෙහි අප්සරාවන් පන්සියය සමග සෝවාන් පලයෙහි පිහිටා ඒ සම්පත් තහවුරු කර දෙව්ලොවටම පැමිණියේය. මෙසේ මේ මාර්ගය භාවිත කළ සක්‍රාදීන් මෙන් දොම්නස ඉවත්වීම සඳහා පවතී යයි දත යුතුය. ඤායසස අධිගමාය - ඤාය යයි කියනු ලබන්නේ ආර්ය අෂ්ඨාංගික මර්ගයයි. එහි අධිගමය - පැමිණීම සඳහා යයි කියන ලද්දේ වේ. මෙය පූර්වාගයෙහි ලෞකික සතිපට්ඨාන මාර්ග භාවිතය ලෝකෝත්තර මාර්ග අවබෝධය පිණිස පවතී. එයින් කීහ "ඤායසස අධිගමය". නිබබාණසස සචඡිකිරියාය - තෘෂ්ණා නම් වාන විරහිත බැවින් නිබ්බාන යයි ලද නම් ඇති අමෘතය සාක්ෂාත් කිරීම සඳහා ආත්ම ප්‍රත්‍යක්ෂතා යයි කියන ලද්දේ වේ. මේ මාර්ගය භාවිතා කරන්නේ පිළිවෙළින් නිවන අවබෝධ කිරීම සිදු කරයි. එයින් කීහ "නිබබානසස සචඡිකිරියාය" එහි කිසියම් සත්ත්වයින්ගේ විසුදධිය පිණිස යයි කී කල්හි සෝක ඉවත්වීම් ආදිය අර්ථ වශයෙන් සිදු වේ. සාසන යුක්ති දක්ෂයන් හැර අන් ඒවා ප්‍රකට නොවේ. භාග්‍යවතුන් වහන්සේ ජනයා සාසන යුක්ති දක්ෂයන් කොට පසුව දහම් නොදෙසති. ඒ ඒ සූත්‍රයෙන් ම ඒ ඒ අර්ථ දක්වති. එහෙයින් මෙහි යම් යම් අර්ථ ඒකායන

මාර්ගය සාදයි. ඒවා ප්‍රකට කොට දක්වන්නේ ''සොකපරිද්දවානං සමතික්කමාය'' යනාදිය කීහ.

යම් හෙයකින් හෝ සත්ත්වයින්ගේ යම් විසුද්ධියක් ඒකායන මාර්ගයෙන් පවතී ද එය සෝක විලාපයන්ගේ ඉක්මවීමෙන් වේ. සෝක පරිදේව ඉක්මවීම දුක් දොම්නස්වල විනාශයෙන් ද දුක් දොම්නස්වල විනාශය ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අධිගමයෙන් ද එහි අධිගමය නිර්වානය සාක්‍ෂාත් කිරීමෙන් ද වේ. ඒ නිසා මේ පිළිවෙළ දක්වන්නේ සත්ත්වයින්ගේ විසුද්ධිය පිණිස යයි කියා සෝක පරිදේවයන්ගේ ඉක්මවීම සඳහා යනාදිය කීහ. තව ද ඒකායන මාර්ගයේ වර්ණනා කිරීම යම්සේ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ධර්මය දේශනා කරන්නෙමි. මුලින් යහපත්ව මැදින් යහපත්ව අවසානයෙහි යහපත්ව අර්ථ සහිතව ව්‍යඤ්ජන සහිතව තනිකර සම්පූර්ණව පිරිසිදුව බ්‍රහ්ම චර්යාව ප්‍රකාශ කරන්නෙමි, යම් මේ ''ඡ ඡක්කානි'' යනුවෙනි. ඡ ඡක්ක දේශනාවේ පද අටකින් වර්ණනාව වදාළහ. ''අරියවංස'' දේශනාව වගේම. ''මහණෙනි ආර්ය වංශයෝ සතර දෙනෙකි. ශ්‍රේෂ්ඨ වූ වංශවත් වූ පෞරාණික වූ අසංකීර්ණ වූ අසංකීර්ණ පූර්ව වූ නිසැක වූ සැක නොකරන්නා වූ ශ්‍රමණයින් ගෙන් බ්‍රාහමණයන් ගෙන් නුවණැත්තන්ගෙන් නින්දා නොලැබුවා වූ යයි පද නවයකින් වර්ණනා ලැබූ අරියවංස සතරකි. මෙසේ මේ ඒකායන මාර්ගය ද සත්තානං විසුද්ධියා ආදි පද සතකින් වර්ණනාව වදාළහ. ඉදින් එය කුමක් සඳහා ද ? ඒ භික්‍ෂූන් ගේ උත්සාහය දනවීම සඳහාය.

වර්ණනා කිරීම අසා ඒ භික්‍ෂූහු මේ මාර්ගය වනාහි සිතට තැවුල් ගෙන දෙන සෝකය, වචනයේ විප්‍රලාපය වූ වැලපීම, කායික අම්හිර වූ දුක, චෛතසික අම්හිර වූ දොම්නසයි උවදුරු සතර ඉවත් කෙරේ. විසුද්ධිය ඤාණය නිබ්බානය යන විශේෂ තුන ගෙන දේ යයි උත්සාහවත්ව මේ ධර්ම දේශනාව උගත යුතු යයි පුහුණු කළයුතු යයි දරාගත යුතු යයි පිරිවැහිය යුතු යයි මේ මාර්ගය වැඩිය යුතු යයි සිතති, මෙසේ ඒ භික්‍ෂූන්ගේ උත්සාහය ජනිත කරවීම සඳහා ගුණය වදාළහ. රෙදි වෙළෙන්දෝ රෙදිවල හොඳ කියන්නාක් මෙන් යම්සේ ලක්‍ෂයක් අගනා රතු කම්බිලියක් වෙළෙන්දා විසින් ගන්න කම්බිලිය ගන්නැයි කෑ ගසනු ලැබුවත් අසවල් කම්බිලි යයි මිනිස්සු තවම නොදනිති. කෙස් කම්බිලි ව්‍යාල කම්බිලි ආදියෙහි දුර්ගන්ධය, රළුබව, කම්බිලියයි කියති. යම් කලක ගන්ධාර රතු කම්බිලිය සුඛුමය දිලිසේ සියුම් පහසයයි කෑ

Scanned with CamScanner

ගැසුවොත් පොහොසත් අය එය ගනිති. පොහොසත් නැතත් එය බලති. එසේම මහණෙනි, මේ ඒකායන මාර්ගය යයි කී කල්හි අසවල් මාර්ගය යයි එය ප්‍රකට නොවේ. නානාප්‍රකාර නෛර්යානිත නොවන මාර්ගවලට ද මාර්ගය කියති. ''සත්වයින් ගේ විසුද්ධිය පිණිස තුන් විශේෂය ගෙන දෙයි යයි උත්සාහවත්ව මේ මාර්ගය වැඩිය යුතුයයි සිතන්නාහ. වර්ණනාව කියන්නේ සත්‍වයන් ගේ විසුද්ධිය පිණිස යනාදිය කීහ.

යම්සේ ලක්‍ෂයක් අගනා රතු කසාවත් කම්බිලි, වාණිජ උපමාවන්ය. රුවන් ජාම්බෝනද, ස්වර්ණ දිය පහදන මැණික් රත්නය පිරිසිදු මුතු රුවන් ප්‍රවාල ආදි වාණිජ උපමා මෙහි ගෙනහැර දක්විය යුතුය. යදිදං යනු නිපාතයකි. යම් මේවා යන එහි අර්ථයයි. චත්තාරො - ගණන සීමා කිරිමය. එයින් වැඩි හෝ අඩු නොවේ. සතිපට්ඨාන ගණන දක්වයි. සතිපට්ඨාන - සතිපට්ඨාන තුන සිහියට ගෝචර වූ ද තුන් ආකාරයකින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ඇති කල්හි ශාස්තෲන් වහන්සේ ගේ පටිඝය අනුනය ව්‍යතික්‍රම වූ මේ ප්‍රීතිය ඇති වේ. මහණෙනි, සතර සතිපට්ඨානයන්ගේ ඇතිවීම ද අස්තංගමය (නැතිවීම) ද දේශනා කරන්නෙමි. එය අසන්න.... මහණෙනි කයෙහි පහළවීම කුමක්ද? ආහාරයේ පහළවීම කයේ පහළවීමය, යනාදිය සිහියට ගෝචර වූ සතිපට්ඨාන යයි කියනු ලැබේ. එසේම කාය වැටහීම, සිහිය නොවේ. සිහිය වැටහීමම සති ගාථා ආදියෙහි ඒ අර්ථයෙහි පිහිටියේ මෙය යයි පිහිටීම, කවරක් පිහිටාද, සතියයි. සතියේ පිහිටීම, සතිපට්ඨානං, හත්ථිට්ඨාන අස්සට්ඨානාදියේ මෙන් සතිපට්ඨාන තුන ආර්යයා සේවනය කරයි. ආර්යයා සෙවිනා ශාස්තෘන් වහන්සේ ගණය අනුසාසනා කිරීමට සුදුසු යයි මෙහි තුන් අයුරින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ශාස්තෘවරයාගේ පටිඝ අනුනය ඉක්මවා ඇති බව සතිපට්ඨානයයි කියනු ලැබේ. ඒ අර්ථය පිහිටවිය යුතුය යනු පට්ඨාන වේ. පිහිටවිය යුතුය යන අර්ථයයි. කුමකින් පිහිටුවිය යුතුද... සිහියෙන්, සිහියෙන් පිහිටුවීම - සතියා පට්ඨානං - සතිපට්ඨාන වේ. සතර සතිපට්ඨාන භාවිත කරන්නේ බහුලව කරන්නේ සත් බොධ්‍යංග සම්පූර්ණ කෙරේ යනාදියෙහි සතියම - සිහියට - සතියයි, කියනු ලැබේ. එහි අර්ථය පිහිටා යයි පට්ඨාන වේ. උපට්ඨාති - ශබ්දකර පැන පවත්වයි යන අර්ථයයි. සතියම සතිපට්ඨානයයි. එසේ නැතහොත් පට්ඨානය ද - සතිපට්ඨානං වේ.

Scanned with CamScanner

මෙහි මෙය අපේක්ෂිතය, ඉදින් මෙසේ කුමක් හෙයින් සතිපට්ඨානා යයි බහු වචනය වේද ? ආරම්මන භේදයෙන් බොහෝ තිබෙන නිසා, මග්ගා යයි කුමක් හෙයින් ඒක වචන වීද ? මාර්ග අර්ථයෙන් එකක් නිසා, මේ සිහිය සතරාකාර වූවද මාර්ග අර්ථයෙන් එකක් ම වේ. මෙය කියන ලදි. කුමන අර්ථයකින් මාර්ගවේද ? නිවන් ගමන අර්ථයෙන් නිවන් කැමැත්තවුන් විසින් මාර්ග නියම අර්ථයෙන් හෝ චේතනා සතර පසුව කායාදි කෘත්‍ය සිදුකරමින් නිවනට යයි. මුල සිටම නිවන කැමත්තවුන් විසින් මාර්ගයේ යනු ලැබෙයි. එහෙයින් හතරම එකම මාර්ග යයි කියනු ලැබේ. මෙසේ ඇති කල් හි ද වචනයෙන් සම්බන්ධ කිරීමෙන් සම්බන්ධය සහිත වූ දේශනා වේ. "මහණෙනි, ඔබලාට මාරසේනාව මර්දනය කළ මාර්ගය දේශනා කරන්නෙමි. එය අසන්න.... මහණෙනි, මාරසේනාව මර්දනය කළ මාර්ගය කුමක්ද? එය මේ සප්ත බොජ්ඣංග ය'' යි ආදියෙහි මෙන් මාරසේනා මර්දනය ද සතත බොජ්ඣංගය ද අර්ථ වශයෙන් එකය. මෙහි වචන පමණක් වෙනස් වේ. මෙසේ ඒකායන මාර්ගය ද සතර සතිපට්ඨානය ද අර්ථ වශයෙන් එකය. වචන පමණක් වෙනස් වේ. එහෙයින් මාර්ග අර්ථයෙන් එකක් නිසා ඒක වචනය, අරමුණු භේදය ඇති කල්හි බොහෝ වන බැවින් බහු වචන වේ යයි ද දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් අඩු වැඩි නැතිව සතිපට්ඨාන හතරක් දේශනා කරන ලද්දේ කුමක් නිසාද? විනේය (හික්මවිය යුතු) ජනයන් අනුව දෙසන ලද බැවිනි. තණ්හා චරිත, දිට්ඨි චරිත, සමථයානික, විපස්සනායානිකයන් කෙරෙහි මඳ හා තියුණු වශයෙන් දෙවිධියක් සිටින විනේය ජනයන්, මඳ නුවණැති තෘෂ්ණා චරිතය ඇත්තාට ඕලාරික වූ කායානුපසසනා සතිපට්ඨාන පිරිසිදුවීමට මාර්ගය වේ. තියුණු නුවණ ඇත්තාට සියුම් වූ වෙදනානු පස්සනා සතිපට්ඨානය ද මන්ද දිට්ඨි චරිතයාට ප්‍රභේද නැති චිත්තානු පස්සනා සතිපට්ඨානය ද තියුණු නුවණ ඇත්තාට අති ප්‍රභේද වූ ධම්මානු පසසනා සතිපට්ඨානය ද පිරිසිදුවීමට මාර්ගය වේ. මන්ද සමථයානිකයාට අපහසුවකින් අවබෝධවීමට හේතුවන පළමු සතිපට්ඨානය වන කායානුපසසනාවද තියුණු සමථයානිකයාට ඕලාරික අරමුණෙහි නොපිහිටන නිසා දෙවන සතිපට්ඨානය වන වේදනානු පස්සනාව ද පිරිසිදුවීමට මාර්ගය වේ. මන්ද විපසසනායානිකයාට ප්‍රභේද රහිත තුන්වන සතිපට්ඨානය වූ චිත්තානුපසසනාවද තියුණු විපසසනායානිකයාට අති ප්‍රභේදගත සතරවන සතිපට්ඨානය වූ ධම්මානුපස්සනාව ද පිරිසිදුවීමට මාර්ගය වේ. මෙසේ සතරක්ව කියන ලදී. අඩු වැඩි නැතිව එය කියන

Scanned with CamScanner

ලදී. තවද සුභ සුඛ නිච්ච අත්තභාව යන විපර්යාසව ගැනීම දුරු කිරීම සඳහා ද සතිපට්ඨාන සතරක් දේශනා කරන ලදී. කය යනු අසුභයකි. එහි ද සත්ත්වයෝ සුභ ය යන විපර්යාස අර්ථය ගත්තාහු වෙති. ඔවුන්ට එහි අසුභභාවය දැකීමෙන් ඔවුන්ගේ විපර්යාස දැකීම දුරු කිරීම සඳහා පළමු සතිපට්ඨානය කියන ලදී. සැප, නිත්‍ය, ආත්ම වශයෙන් විපර්යාශව ගත් සත්ත්වයින් ගේ ඒ විපර්යාශ දෘෂ්ඨිය ප්‍රහාණය කිරීම සඳහා වේදනාව දුකයි, සිත අනිත්‍යයයි, ධර්මය අනාත්මයයි අවබෝධ කරවීමට ඉතිරි සතිපට්ඨාන තුන දේශනා කරන ලදී. මෙසේ සුභ සුඛ නිච්ච අත්තභව යන විපර්යාශ ප්‍රහානය සඳහා ද අඩුවැඩි නැතිව සතිපට්ඨාන සතරක් දේශනා කරන ලදී. විපර්යාශ දෘෂ්ඨී ප්‍රහානය කිරීම සඳහාම පමණක් සතිපට්ඨාන සතරක් දේශනා කරන ලද්දේ නොවේ. තවද සතර ඕඝ, සතර යෝග, ආසව, ග්‍රන්ථ, උපාදාන, අගති ප්‍රහාණය සඳහා ද සතරාකාර අවබෝධය සඳහා ද සතරක් කියන ලදැයි දත යුතුය. ප්‍රකරණවල එන නය ක්‍රමය මෙසේය. අටුවාවල වනාහි සරණ වශයෙන් ද එකක්ව එකතු කිරීම් වශයෙන් ද සතිපට්ඨාන එකක් ම වේ. අරමුණ වශයෙන් සතරක් යයි මෙය කියන ලදී. යම් සේ දොරටු සතරක් ඇති නගරයෙහි නැගෙනහිරින් එන්නේ නැගෙනහිර උපදවන භාණ්ඩ රැගෙන නැගෙනහිර දොරටුවෙන් නගරයට පිවිසෙති, දකුණු දිසාවෙන් බටහිර දිසාවෙ උතුරු දිසාවෙන් එන්නෝ ඒ ඒ දිසාවේ උපදවන භාණ්ඩ රැගෙන ඒ ඒ. දිසාවේ දොරටුවලින් නගරයට පිවිසෙති. නිවන නගරය මෙනි. කායාදි සතිපට්ඨාන සතර, සතර දිසාවේ දොරටු මෙනි. අරි අටැඟි මග, ලෝකෝත්තර මාර්ගය දොරවල් මෙනි. පෙරදිගින් එන්නෝ පෙරදිග උපයන භාණ්ඩ රැගෙන පෙරදිග දොරටුවෙන් නගරයට පිවිසෙන්නාක් මෙන් කායානුපසසනාවෙන් එන්නා තුදුස් ආකාර කායානුපස්සනාව වඩා කායානුපසසනා භාවනාවේ ආනුභාවයෙන් නිපදවන, ආර්ය මාර්ගයෙන් එකම නිවණට බැසගනී. යම්සේ දකුණු දිසාවෙන් එන්නා දකුණු දිසාවේ උපදවන භාණ්ඩ රැගෙන දකුණු දොරටුවෙන් නගරයට පිවිසෙයි. මෙසේ වේදනානු පසසනාව අනුව පැමිණෙන්නා නවවිධ වේදනානුපසසනාව වඩා වේදනානුපසසනා ආනුභාවයෙන් නිපදවන ලද ආර්ය මර්ගයෙන් එකම නිවනට පිවිසේ. බටහිර දිසාවෙන් පැමිණෙන්නා බටහිර දිසාවේ උපදවන භාණ්ඩ රැගෙන බටහිර දොරටුවෙන් නගරයට පිවිසේ. එසේ චිත්තානුපස්සනාව අනුව එන්නා සොළොස් ආකාර චිත්තානුපස්සනාව වඩා චිත්තානුපස්සනා භාවනාවේ ආනුභාවයෙන් නිවන් ආර්ය මාර්ගයෙන් එකම නිවනට පිවිසේ. උතුරු

Scanned with CamScanner

දිසාවෙන් එන්නා උතුරු දිසාවේ නිපදවන භාණ්ඩ රැගෙන උතුරු දොරටුවෙන් නගරයට පිවිසේ. එසේ ධම්මානුපස්සනාව අනුව පැමිණෙන්නා පස් ආකාර ධම්මානුපස්සනාව වඩා ධම්මානුපස්සනා භාවනා ආනුභාවයෙන් නිවන් ආර්ය මාර්ගයෙන් එකම නිවනට පිවිසේ. මෙසේ සරණ වසයෙන් මෙන්ම එකට එකතු කිරීම් වශයෙන් ද එකම සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් ව කියන ලදැයි දත යුතුය.

කතමෙ චත්තාරො - කියනු කැමතිව විචාරයි. ඉධ - මේ සාසනයෙහි. භික්ඛවෙ - මෙය ධර්ම ප්‍රතිග්‍රාහක පුද්ගලයින් ඇමතීමකි. භික්ඛු - මෙය පිළිවෙත් සපුරන පුද්ගල දැක්වීමකි. සෙසු දෙවියෝ ද මිනිස්සු ද පිළිවෙත් පුරති. පිළිවෙතින් ශ්‍රේෂ්ඨ නිසා භික්ෂු බව දැක්වීම් වශයෙන් භික්ඛු යයි කීහ. භාග්‍යවතුන් වහන්සේ ගේ අනුසාසනා පිළිගන්නන් අතරෙහි සියළු ම අනුසාසනාවල භාජනය වන්නා වූ භික්ෂූහු ශ්‍රේෂ්ඨයහ. උන්වහන්සේලා ගැනීමෙන් සෙස්සෝ ගත්තාහු වෙති. රජගමන්වල දී රජු ගැනීමෙන් සෙසු පිරිස වෙති. යමෙක් මේ ප්‍රතිපත්තිය පිළිපදිද ඒ භික්ෂුව නම් වේ යයි ප්‍රතිපත්තියෙන් භික්ෂුභාවය දැක්වීමෙන් ද භික්ඛු - යයි කීහ. පිළිපන්නේ දෙවි හෝ මනුසස හෝ වේවා යන සංඛ්‍යාවට යති. යම්සේ කීහ:

ලකර සම හැසිරුම - දමුණු නියත බඹසර ද
හැර දඬු හැම සතම - හෙ බමුණු සමණ බිකු වේ

කායෙ - රූප කයෙහි. මෙහි රූපකාය නම් අඟපසඟ කේසාදිය ද ස්වභාවයන්ගේ සමූහ අර්ථයෙන් ඇත්කය රථකය මෙන් කය යයි අදහස් කෙරේ. යම්සේ සමූහ අර්ථයෙන්, මෙසේ පිළිකුල් වූ දේ එකතු වීම් අර්ථයෙන් පිළිකුල් දෙයෙහි ඉතාමත් පිළිකුල් වූ ඒ එකතුව ද කය යයි උපන් දෙසකි. මේ එහි වචනාර්ථයයි. ආය නම් එයින් ද ආය වේ. කායානුපස්සි - කය අනුව බලන සීලයයි. කය අනුව බලන්නේ හෝ කය යයි කියා ද නැවත කායානුපස්සි යයි දෙවන වර කය ගැනීම අසම්මිශ්‍ර වශයෙන් විස්තරය ඝනවූ විනිබ්භොගාදිය දැක්වීම සඳහා 'කරන ලදැයි දත යුතුය. එහෙයින් කයෙහි වෙදනානුපස්සී හෝ චිත්ත ධම්මානු පස්සී හෝ නොවේ. කායානුපස්සීම යයි කාය සංඛ්‍යාත වස්තුවෙහි කායානුපස්සනාකාරයම දැක්වීමෙන් අසම්මත වශයෙන් වෙන්කොට දක්වන ලද්දේ වේ. එසේ කයෙහි අඟපසඟවලින් වෙන්ව කයක් නැත.

කෙස් ලොම්වලින් වෙන්ව ස්ත්‍රී පුරුෂ භාවයක් නොපෙනේ. කොළ මල් ආදියෙන් වෙන් වූ කෙසෙල් කඳක් මෙනි. ඉක්බිති රථ සම්භාරය දකින්නා මෙන් අඟපසඟ සමූහය දකී. නගරයේ අවයව දකින්නා මෙනි. හිස්මිට වෙළන්නාක් මෙන් ද භූත උපාදය රූප සමූහය බලන්නා මෙන් ද නොයෙක් ආකාරයෙන් සමූහ වශයෙන් කාය සංඛාර වස්තුව දැකීමෙන් ඝනවූ වෙළුහැරීම දකින්නේ වේ. සමූහ විනිර්මුත්තව කයක් හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අන්කිසිවෙක් හෝ දක්නා නොලැබේ. කියන ලද ධර්ම සමූහ මතම ඒ ඒ සත්‍වයෝ වැරදි ඇතුළත්වීම කරති. එයින් කීහ පුරාණයෝ:

බැලූ දෙය වෙනම දකී - දුටු දෙය නොපෙනේමය
මුළාවෙන් බැඳේ දද - බැඳෙන්නේ නොමිදේමය.

එකක් වසයෙන් සලකන සන්තති ආදිය කොටස්වලට බෙදීම දැකීම පිණිස කියන ලදී. මෙහි ආදි ශබ්දයෙන් මේ අර්ථය ද දත යුතුය. මෙය වනාහි මේ කයෙහි කය අනුව බැලීම මිස අනිත් ධර්මය අනුව බැලීමක් නැත. කුමක් කියන ලද්දේ වේද? යම්සේ ජලය නැතත් මිරිඟුවෙන් ජලය දකින්නෝ වෙති. මෙසේ මේ කයෙහි අනිත්‍ය දුක්ඛ අනාත්ම අසුභ මිස නිත්‍ය සුඛ ආත්ම සුභ බවක් නොපෙනේනේ යයි කියන ලද්දේ වේ. එසේ නැතහොත් යමෙක් මෙය පසුව ''මහණෙනි, මෙහි භික්ෂුවක් වනයට ගියේ හෝ.... හෙතෙම සිහියෙන් ආශ්වාස කරයි'' ආදි නයින් ආශ්වාස ප්‍රශ්වාස ආදි කය සුණු වූ ඇටවලින් අවසන් වේ යයි කියන ලදී. ''මෙහි යමෙක් පෘථිවි කය, ආපෝ තෙජෝ, වායෝ, කේස, ලෝම, ඡවි, චම්ම, මංස, රුහිර, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජ කාය අනිත්‍ය වශයෙන් දකින්නේ '' යයි පටිසම්භිදාවෙහි කාය කියන ලදී. ඒ සියල්ලම මේ කයෙහි බැලීම් වශයෙන් ''කායෙ කායානුපසසී'' යයි අර්ථය දත යුතුය. එසේ නැතහොත් යම්කිසිවෙක් නො දැකීමෙන් මේ කයෙහි මමය හෝ මාගේ යයි හෝ ගන්නේ වී නමුත් මේ කය දැකීමෙන් කෙස් ලොම් ආදි නා නා සවභාව සමූහයක් යයි පෙනේ. මෙසේ කයෙහි කෙසාදි සවභාව සමූහය යයි මෙසේ ද අර්ථය දත යුතුය.

තවද මේ කය පිළිබඳව අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය වශයෙන් නොවේ. යනාදි අනුක්‍රමයෙන් පටිසම්භිදාවෙහි ආ සියළු අනිත්‍ය ලක්ෂණාදිය ආකාර සමූහ සංඛ්‍යාත වූ කයේ බැලීමෙන් කායෙ කායානුපසසි

Scanned with CamScanner

- යයි මෙසේ ද අර්ථය දත යුතුය. එසේම මේ ශරීරයෙහි කායානුපස්සනා ප්‍රතිපදාවට පිළිපන් භික්ෂුව මේ සිරුර අනිත්‍යානුපසසනාදි සත් අනුපසසනා වශයෙන් අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය වශයෙන් නොවේ. සැප වශයෙන් නොව දුක් වශයෙන් බලයි. ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් බලයි. සතුටුවීම් වශයෙන් නොව කලකිරීම් වශයෙන් බලයි. ඇලීම් වශයෙන් නොව නො ඇලීම් වශයෙන් බලයි. සමුදය වශයෙන් නොව නිරෝධ වශයෙන් බලයි. ගැනීම් වශයෙන් නොව අත්හැරීම් වශයෙන් බලයි. හෙතෙම සිරුර අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍ය සංඥාව දුරුකරයි. දුක් වශයෙන් බලන්නේ සැප සංඥාව දුරුකරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරුකරයි. කලකිරෙන්නේ ආශාව අත්හරියි. නොඇලෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධවන්නේ සමුදය දුරුකරයි. අත්හරින්නේ ගැනීම දුරුකරයි යයි දත යුතුය.

විහරති - ඉරියව් පවත්වයි. ආතාපි - තුන් භවයෙහි කෙලෙසුන් තවයි යනු - ආතප, වීර්යට මෙය නමකි. ආතපයෝ මොහුට ඇත්තේනුයි ආතාපී වේ. සමපජානො - සමපජඤ්ඤ සංඛ්‍යාත වූ නුවණින් යුක්ත වූයේ. සතිමා - කය විමසන සිහියෙන් යුක්ත වූයේ. මේ වනාහි මේ සිහියකින් අරමුණු ගෙන නුවණින් බලයි. සිහිය නැතිව අනුපස්සනාවක් නම් නැත. එහෙයින්ම කීහ: මහණෙනි, සිහිය සැම දෙයටම ප්‍රයෝජන යයි කියමි" එහෙයින් මෙහි කයෙහි කය අනුව බලමින් වාසය කරයි යයි ද මෙපමණකින් කායානුපසසනා සතිපට්ඨාන කර්ම සථානය කියන ලද්දේ වේ. එසේ නැතහොත් යම් හෙයකින් වීර්ය නැතිව ඇතුළත හැකිලී ගියේ අනතුරු කරන්නේ වේ. නුවණ නැතිවූයේ උපාය පරිග්‍රහනය ද අනුපාය පරිවර්ජන යේ ද මුළාවේ. මුළා වූ සිහිය උපායෙන් යුක්තවීම ද අනුපාය අපරිග්‍රහයේ ද අසමත් වේ. එහෙයින් ඔහුට ඒ කර්මසථානය සිදු නොවේ. එහෙයින් යම් ධර්මයක බලයෙන් එය සිදුවේද එය දැක්වීමට ආතාපි සමපජානො සතිමා - මෙය කියන ලදැයි දත යුතුය.

මෙසේ කායානුපසසනා සතිපට්ඨානය යෙදිය යුතු දේ දක්වා දන්නා ප්‍රහානය කළ යුතු අංග දැක්වීමට විනෙය්‍ය ලොකෙ අභිජඣා දොමනසසං යයි කියන ලදී. එහි විනෙය්‍යාති - තදංග වශයෙන් හෝ විෂකමබන වශයෙන් හෝ දුරුකොට. ලොකෙ ඒ කයෙහිම. කය වනාහි මෙහි කැඩෙන බිඳෙන අර්ථයෙන් ලෝකයයි අදහස් කරයි. අභිධ්‍යා, දොම්නස් කයෙහි පමණක් නොව වේදනාදියෙහි ද දුරුවෙයි. ප්‍රහීණ

Scanned with CamScanner

කරයි. එහෙයින් උපාදාන ස්කන්ධ පහම ලෝකයයි විභංගයෙහි කියන ලදී. ලෝක සංඛ්‍යාත බැවින් ද ඒ ස්වභාවයන්ගේ අරුත් ඉදිරිම් නයින් මෙය කියන ලදී. එය කිහඃ "එහි ලෝකය කුමක්ද? ඒ කයම ලෝකයයි. මෙහි මේ අර්ථයයි. ඒ ලෝකයෙහි අභිධ්‍යා දොම්නස් දුරුකොටයයි මෙසේ සම්බන්ධය දත යුතුය. මෙහි යම් හෙයකින් අභිධ්‍යාව ගැනීමෙන් කාමච්ඡන්දය ද, දොම්නස ගැනීමෙන් ව්‍යාපාදය සංග්‍රහ වේ. එහෙයින් නීවරණවලට ඇතුළත් බලවත් වූ ධර්ම දෙක දක්වීමෙන් නීවරණ ප්‍රහානය ද කියන ලදයි දත යුතුය. විශේෂයෙන් මෙහි අභිධ්‍යාව දුරු කිරීමෙන් කාය සවිමත් මුල් වූ අනුරෝධයද දොම්නස දුරු කිරීමෙන් කාය විපත් මුල් වූ විරෝධය ද අභිධ්‍යාව දුරු කිරීමෙන් කය කෙරෙහි ඇලීමද දොම්නස දුරු කිරීමෙන් කාය භාවනාවෙහි නොඇලීමද අභිධ්‍යා විනයෙන් කයෙහි නැති සුභ සුඛ ආදිය ප්‍රතික්ෂෙපයද දොමනසස විනයෙන් කයෙහි ඇති අසුභ දුක් ආදිය ලබා ගැනීමේ ප්‍රහානය ද කියන ලදී. එහෙයින් යෝගාවචරයාගේ යෝගානුභාවය ද යෝගයෙහි (භාවනාවෙහි) සමත් බවද දක්වන ලදී. යෝගානුභාවය වන මෙය අනුරොධ හා විරොධයෙන් මිදුණු අරති රති සයකයෙක්ද අභූත ප්‍රතික්ෂෙප ලබාගැනීම් නැති ලක්‍ෂණ ඇතිවේ. මෙසේ භාවනාවෙහි සමත් වේ.

තවද න්‍යායක කායෙ කායානුපසසී - මෙහි අනුව බැලීම සඳහා කමටහන කියන ලදී. විහරති - මෙහි කියන ලද විහරණයෙන් කර්මස්ථානිකයාගේ කාය පරිහරණය වේ. ආතාපී - ආදියෙහි වනාහි වීර්යවත් වූ සම්‍යග් ප්‍රධාන සිහිනුවණින් සියල්ල සිදුකරණ කර්මස්ථානය, කර්මස්ථාන පරිහරණ උපාය හෝ සිහියෙන් හෝ කය අනුව බැලීම් වශයෙන් ලබන ලද සමථය විදර්ශනා ඥානයෙන් අභිධ්‍යා දොම්නස් දුරුකිරීමෙන් භාවනා ඵලය කියනු ලැබේ යයි දත යුතුය. විභඞගයෙහි වනාහි "අනුපසසී" යයි එහි අනුපස්සනාව කිම? යම් නුවණක් දැනීම..... සම්‍යග් දෘෂ්ඨිය මෙය අනුපස්සනා යයි කියනු ලැබේ. මේ අනුපස්සනාවෙන් යුක්ත වූයේ මොනවට යුකත වූයේ එළඹියේ හොඳින් එළඹියේ ඉපදවූයේ යුක්ත වූයේ එයින් අනුපස්සනා යයි කියනු ලැබේ. විහරති - ඉරියව් පවත්වයි, පාලනය කරයි, යැපෙයි, හැසිරෙයි, වාසය කරයි, එයින් විහරති යයි කියනු ලැබේ. ආතාපී එහි ආතපප යනු කුමක්ද? "යමෙක් චෛතසික වීර්ය ආරම්භ කරන ලද්දේ ද ඒ සම්‍යක් ව්‍යායාමය, මෙය ආතපප යයි කියනු ලැබේ. මේ වීර්යයෙන් යුක්ත වූයේ වේ.... සමනනාගත වූයේ ආතාපී යයි කියනු ලැබේ. සමපජානො

Scanned with CamScanner

- එහි සම්පජඤ්ඤ යනු කුමක්ද? යම් නුවණකින් දැනගනීද....සම්‍යක් දෘෂ්ටිය මෙය සම්පජඤ්ඤ යයි කියනු ලැබේ. මේ නුවණින් යුක්ත වූයේ........සමන්නාගත වූයේ එයින් සම්පජාන යයි කියනු ලැබේ. සතිමා - එහි සිහිය නම් කුමක්ද? යම් සිහියක් අනුව බැලීමක්.... මනා සිහිය, මෙය සිහිය යයි කියනු ලැබේ. විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං - එහි ලෝකය කුමක්ද? ඒ කයම ලෝකයයි. උපාදාන ස්කන්ධ පහ ලෝකයයි. මෙය ලෝකය යයි කියනු ලැබේ. එහි අභිධ්‍යාව කුමක්ද? යම් රාගයක්, රාග සහිත වීමක්, ඇලීමක්, අනුරෝධයක් (අනුකූලත්වය) බැඳීමක්, බැඳීම් රාගයක් වේද මෙය අභිධ්‍යාව යයි කියනු ලැබේ. එහි දොමනස්සං - කුමක්ද? යම් චෛතසිකයක් අමිහිරිද දුක්ද සිත හා ගැටීමෙන් උපන් අමිහිරි දුක් වේදනාව, මෙය දොම්නස යයි කියනු ලැබේ. මෙසේ මේ අභිධ්‍යාව ද දොම්නස ද මේ ලෝකයෙහි විනීත වේ. ප්‍රතිවිනීත වේ. සාන්ත වේ. සමනය වේ. ඉවත් වේ, අස්තයට ගියේ, විනාශ වූයේ ඇතුළට වැදුනේ වියළුණේ අවසන් කරන ලද්දේ එයින් විනාශය වේ යයි කියනු ලැබේ. මෙසේ මේ පදවල අර්ථය කියන ලදී. එය සමග මේ අටුවා නයයි. මේ තවම කායානුපස්සනා සතිපට්ඨානයෙහි උද්දේසයේ අර්ථ වර්ණනාවයි.

දැන් ''වේදනාවල චිත්ත-ධර්මවල ධර්මය අනුව බලමින් වාසය කරයි....අභිධ්‍යා දොමනස්ස දුරු කරන්නේය යන'' මෙහි වේදනාවල වේදනාව වේදනාව අනුව බලන්නේ යයි මේ ආදියෙහි වේදනාදීන් ගේ නැවත වචනයෙහි ප්‍රයෝජනය කායානුපස්සනාවෙහි කියන ලද ආකාරයෙන්ම දත යුතුය. වේදනාවල වේදනාව අනුව බලන්නේ සිතෙහි සිත අනුව බලන්නේ ධර්මවල ධර්මය අනුව බලන්නේ යයි මෙහි වනාහි වෙදනා - තුන් වේදනාය. ලෞකික සිත ද ලෞකිකය. ඒවායෙහි විභාගය නිද්දේස වාරයෙහි ප්‍රකට වන්නේය. හුදෙක් මෙහි යම්සේ වේදනාව අනුව බැලිය යුතු ද එසේ එය බලන්නේ වේදනාව අනුව බලන්නේ යයි දත යුතුය. චිත්ත, ධර්මවලද මෙම නයම වේ. වේදනාව අනුව බලන්නේ කෙසේද? පළමුව සැප වේදනාව දුක් වශයෙන්, දුක් වේදනාව උලක් මෙන්, අදුක්ඛමසුඛ වේදනාව අනිත්‍ය වශයෙන් යම් සේ කීහ:

යමෙක් සුව දුක සේ - දකී දුක උල සේ ඔහු
අදුක් අසුව - අනිත් - ලෙස ඔහු එය දකින්නේ
යහ සේ දකින බිකු - හැසිරෙයි උපසාන්තව

Scanned with CamScanner

සියළුම සිතිවිලි දුක් යයි ද අනුව බැලිය යුතුය. මෙය කියන ලදී'' යම් කිසිවක් විඳියි ද ඒ සියල්ල දුක්යයි කියමි'' සැපය දුක් වශයෙන් ද බැලිය යුතුය. යම්සේ කීහ: ''සැප වේදනාව ස්ථිතිය සැපය. වෙනස්වීම දුකය'' යයි සියල්ල විස්තර කළයුතුය. තව ද අනිත්‍යාදි සත අනුපස්සනා වශයෙන් ද අනුව බැලිය යුතුය. සෙස්ස නිද්දේස වාරයෙහි ප්‍රකට වන්නේය. චිත්ත ධර්මවල ද පළමුව සිත ආරම්මණ අධිපති, සහජාත භූමි කම්මවිපාක කිරියාදි නානාවිධ භේදයන්ගේ අනිත්‍යාදි අනුපස්සනාවන්, නිද්දේස වාරයෙහි එන සරාගාදි භේදයන් ගේ ද වශයෙන් අනුව බැලිය යුතුය. ධර්ම ස්වලක්ෂණ සාමාන්‍ය ලක්ෂණයන්ගේ ශූන්‍යතා ධර්මයේ අනිත්‍යාදි සත් අනුපස්සනාවන්ගේ නිද්දේස වාරයෙහි සනත අසනතාදි භේදයන් ගේ ද වශයෙන් බැලිය යුතුය. සෙස්ස කියන ලද්ද අනුවමය. කාය සංඛ්‍යාත ලෝකයෙහි යමෙකුගේ අභිධ්‍යා දෝමනස්ස ප්‍රහීනවේද වේදනාදි ලෝකයෙහි ද ඔහුගේ අභිධ්‍යා දොමනස්ස ප්‍රහීන වේ. නානා පුද්ගල වශයෙන් වනාහි නානා චිත්තක්ෂණික සතිපට්ඨාන භාවනා වශයෙන් ද සැමතැනම කියන ලදී. යම් හෙයකින් එක් තැනක ප්‍රහීන නම් සෙස්සෙහි ද ප්‍රහීන වේ. එහෙයින් ඔහුගේ එහි ප්‍රහානය දැකීම ද කියන ලද යයි දත යුතුය.

උද්දේසවාර කථා නිමි.

දූන් යම්සේ දක්ෂ කුළුපොත්තෙක් (උණ බට පතුරුවලින් භාණ්ඩ සාදන්නා වූ) විශාල කලාල, මෘදු කලාල කූඩපෙට්ටි, පෙට්ටි, ගොටු ආදි උපකරණ කරනු කැමැත්තේ ලොකු උණ ගසක් ලැබ කැබලි හතරට කපා එක එක කැබැල්ලක් ගෙන පලා ඒ ඒ උපකරණ කරන්නේය. එසේම භාග්‍යවතුන් වහන්සේ සතිපට්ඨාන දේශනාවෙන් සත්වයින් ගේ නොයෙක් ආකාර විශේෂාධිගමය කරනු කැමැත්තේ එකම සම්මා සතිය සතර සතිපට්ඨානය, කවර නම් සතරක්ද? මෙහි මහණෙනි, කයෙහි කය අනුව බලන්නේ වාසය කරයි ආදී නයින් අරමුණු වශයෙන් සතරකට බෙදා එයින් එක එක සතිපට්ඨානය ගෙන බෙදන්නේ, මහණෙනි. කෙසේද? ආදි විස්තර කරනු කැමතිව විචාරීමයි. මෙය වනාහි මෙහි සංක්ෂේප අර්ථයයි. මහණෙනි. කුමන අයුරකින් භික්ෂුව කයෙහි කය අනුව බලන්නේ හැසිරේදැයි. සියළු ප්‍රශ්නවාරවල මෙම නයයි. **ඉධ භික්ඛවේ භික්ඛු** - මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුව, මෙහි මේ ඉධ ශබ්දය සියළු ආකාර කායානුපස්සනා උපදවන පුද්ගලයාට ආධාරවන

Scanned with CamScanner

සාසනය දක්විමයි. අන්‍ය සාසනවල එසේ වීම ප්‍රතිසේධනය ද එය කියන ලදී. මහණෙනි, මෙහිම ශ්‍රමණයා. අන්‍ය සාසන ශ්‍රමණයන්ගේ හිස් වේ. මේ සාසනයෙහි භික්ෂුව යයි එසේ හෙයින් කියන ලදී. අරඤ්ඤගතො වා රුක්ඛ මූලගතොවා සුඤ්ඤාගාර ගතොවා - යයි මෙය ඔහුගේ සතිපට්ඨාන භාවනානුරූප සෙනසුන පිළිගැනීම දක්වීමයි. මේ භික්ෂුවගේ බොහෝ කාලයක් රූපාදි අරමුණුවල ඇලී පැවති සිත කමටහන් අරමුණට බැසීමට අකමැති වේ. කුළුගොනෙකු යෙදූ රථය මෙන් කැලයට දුවයි. යම් හෙයකින් වනාහි ගවපාලකයෙක් කුළුදෙනකු ගේ සියළු කිරි බී වැඩුණු කුළු වස්සකු මෙල්ල කරනු කැමැත්තේ මහත් වූ කණුවක් සිටුවා එලදෙනගෙන් වෙන්කොට ලණුවකින් බඳින්නේය. ඉක්බිති ඒ වස්සා ඔබිනොබ පැන පලායෑමට නොහැක්කේ ඒ කණුව ලඟම හිඳින්නේය හෝ වැතිරෙන්නේය හෝ වේ. එසේම මේ භික්ෂුව විසින් බොහෝ කාලයක් රූපාදි අරමුණු නමැති රසපානවලින් වැඩුණු දුෂ්ට සිත හික්මවනු කැමැත්තේ රූපාදි අරමුණුවලින් බැහැර කොට වනයෙහි හෝ රුක්මුලක් හෝ පාලු නිවසක හෝ ඇතුළුව එහි දී සතිපට්ඨාන අරමුණ නමැති කණුවෙහි (ටැඹෙහි) සිහි නමැති ලණුවෙන් බැඳිය යුතුය. මෙසේ ඔහුගේ සිත එහෙ මෙහෙ පනිමින් සිට පෙර පුරුදු අරමුණු නොලබන්නේ සිහි නැමැති යොත සිඳ පලායෑමට නොහැක්කේ එම අරමුණම උපචාර අර්පණා වශයෙන් ලඟ හෝ ලඟ වැතිර සිටී. එයින් පුරාණ තෙරහු කීහ.

ටැඹෙහි කුළු වස්සෙකු - බැඳ හික්මවයි මිනිසා
එසේ සිය සිත සති - රැහැනින් බඳියි දැඩිසේ

මෙසේ ඔහුට මේ සෙනසුන භාවනාවට අනුරූප වේ. එහෙයින් කියන ලදී: ''මෙය ඔහුට සතිපට්ඨාන භාවනාවට අනුරූප වූ සෙනසුන් ලබා ගැනීම විස්තර''යයි. තව ද යම්හෙයකින් මේ කායානුපස්සනාවෙහි මුදුන් පැමිණි සියළු බුදු පසේබුදු සව්වන්ගේ විශේෂ අධිගම මෙලොව සැප විහරණ පදනම් වූ ආනාපාන සති කර්මස්ථානය, ස්ත්‍රී පුරුෂ ඇත් අස් ආදි ශබ්දවලින් සමාකුල වූ ග්‍රාමාන්තය අත්නොහැර ශබ්ද සහිත බැවින් ධ්‍යානය සම්පාදනය කිරීම පහසු නොවේ. ගම නොවන ආරණ්‍යයෙහි පහසු වේ. යෝගාවචරයා විසින් මේ කර්මස්ථානය ලබාගෙන අනාපාන චතුර්ථ ධ්‍යානය නිපදවා ඒ ධ්‍යානය පාදක කරගෙන සංස්කාරයන් සම්මර්ශනය කර අග්‍රඵලය වූ රහත් බවට පැමිණීමට අනුරූප

Scanned with CamScanner

සේනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ "අරඤ්ඤ ගතො වා" යයි කීහ. වාස්තු විද්‍යා ආචාර්යවරයෙකු මෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ වාසතු විද්‍යා ආචාර්යවරයා යම් සේ නගර භූමියට පැමිණ යහපත් සේ පරීක්ෂා කොට මෙහි නගරයක් නිර්මාණය කරවන්නැයි උපදෙස් දෙයි. (පෙන්වති) යහපත් සේ නගරය නිමිකල්හි රාජකුලයෙන් මහත් සත්කාර ලබයි. එසේම යෝගාවචරයාගේ අනුරූප වූ සෙනසුන පරීක්ෂා කර මෙහි කමටහණ වැඩිය යුතුයයි නියම කරයි. ඉක්බිතිව ඒ කර්මස්ථානයෙහි යෙදෙන යෝගියා අනුක්‍රමයෙන් රහත් වූ කල්හි සම්මා සම්බුද්ධ වූ ඒ භාග්‍යවත් තථාගතයන් වහන්සේ මහත් සත්කාර ලබති. මේ භික්ෂූන් වනාහි දිවියා හා සමාන යයි කියනු ලැබේ. යම්සේ මහා දිවි රජ වනයෙහි තෘණ ගොල්ලක හෝ ගස් ගොන්නක හෝ පර්වතයක හෝ ඇසුරු කොට සැඟවී වන මීවුන් ගෝන ඌරු ආදි මෘගයන් ගනී. එසේම මේ තෙමේ අරන්‍යාදියෙහි කර්මසථානයේ යෙදෙන්නේ පිළිවෙළින් සතර මග ද ආර්ය ඵල ද ගනී. එයින් කීහ පුරාණයෝ :

සැඟව දිවි ගොදුරු - විලස බුදුපුතු විදසුන්
පිවිස වන බවුනින් - උතුම් රහත් පල ගනී

එහෙයින් උන්වහන්සේට පරාක්‍රම ජව යෝග්‍ය භූමිය ලෙස ආරණ්‍ය සේනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ, "අරඤ්ඤගතො වා" යයි කීහ. මින් පසු මෙහි ආනාපාන කොටසෙහි යම් කිවයුතු දෙයක් වේ නම් එය විසුද්ධිමාර්ගයෙහි කියන ලද්දේමය. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො භමකාරොවා - මෙය උපමාවක් පමණකි. ඉති අජ්ඣත්තං වා කායෙ - මෙය අර්පණාව පමණකි. එහි නොපැමිණි වචන දක්වමි. සෙස්ස ආවේය. එහි නොපැමිණි දක්ඛො - දක්ෂ වූ දීඝං වා අඤ්ඡනෙතා - විශාල වූ බෙර වීණා ආදිය ලියවන කාලයෙහි අත්පා දිගු කොට අදින්නේ. රස්සං වා අඤ්ජනෙතා - දත් ඉදිකටු එතීම් ආදිය ලියවන කාලයෙහි මඳ මඳව කෙටියව අදින්නේ එවමෙව බො - මේ මේ භික්ෂුව ද දීර්ඝ වශයෙන් හෝ සවල්ප වශයෙන් හෝ පවත්වන්නා වූ ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් දීර්ඝ වශයෙන් ආශ්වාස කරන්නේ දීර්ඝව ආශ්වාස කරමි දනියි..... ප්‍රශ්වාස කරමියි හික්මෙයි. මෙසේ හික්මෙන්නා වූ ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්තෙහි සතර දැහැන් උපදී. හේ ධ්‍යානයෙන් නැගී සිට ආශ්වාස ප්‍රශ්වාසයෙහි හෝ ධ්‍යානාංගයන් හෝ පරීක්ෂා කරයි. එහි ආශ්වාස ප්‍රශ්වාස කම්මිකයා ආශ්වාස ප්‍රශ්වාස කුමක් ඇසුරු කෙරේද?

Scanned with CamScanner

වස්තු ඇසුරු කෙරේ. වසතු නම් කරජ කයයි. කරජ කය නම් සතර මහා භූත සහ උපාදාය රූපයයි. මේ රූප පරීක්‍ෂා කරයි. ඉක්බිති ඒ අරමුණෙහි ඵසස පස්වැනි කොට ඇති නාමයයි. නාම රූප පරීක්‍ෂා කොට එහි ප්‍රත්‍ය සොයන්නේ අවිජ්ජා ආදි පටිචච සමුප්පාදය දක ප්‍රත්‍යය ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම මාත්‍රය පමණක් මිස අන්‍ය සත්‍වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි නිසැක වූයේ ප්‍රත්‍ය සහිත නාමරූපයන් ත්‍රි ලක්‍ෂණයට නගා විදර්ශනා වඩන්නේ පිළිවෙළින් රහත් බවට පැමිණේ. මෙය එක් භික්‍ෂුවකගේ රහත්භාවය දක්වා පමුණුවන මුඛයයි. ධ්‍යාන කම්මිකයා ද මේ ධ්‍යානාංග කුමක් ඇසුරු කෙරේද? වස්තු නිශ්‍රිත යයි වස්තු කරජ කයයිද. ධ්‍යානාංග නම් කරජකායයි. රූප යනු නාම රූපය. පරීක්‍ෂා කොට සොයන්නේ අවිද්‍යා දි ප්‍රත්‍යාකාරය දක එය ප්‍රත්‍යය ප්‍රත්‍යය සමුත්පන්න ධර්ම මාත්‍රය සේ අන්‍ය සත්‍වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි සැක නැත්තේ ප්‍රත්‍ය සහිත නාමරූපයන් ත්‍රිලක්‍ෂණයට නගා විදර්ශනා වඩන්නේ පිළිවෙළින් රහත් බවට පැමිණේ. මෙය එක් භික්‍ෂුවකගේ රහත් බව දක්වා පමුණුවන මාර්ගයයි.

**ඉති අජඣත්තං වා** - මෙසේ තමාගේ හෝ ආශ්වාස ප්‍රශ්වාස කයෙහි කය අනුව බලමින් වාසය කරයි. **බහිද්ධා වා** - අනුන්ගේ හෝ ආශ්වාස ප්‍රශ්වාස කයෙහි. **අජඣත්ත බහිද්ධා වා** - කලකින් තමාගේ කලකින් අනුන්ගේ ආශ්වාස ප්‍රශ්වාස කයෙහි. මෙයින් ඔහුගේ ප්‍රගුණ කර්මසථානය තබා එහා මෙහා හැසිරෙණ කාලය කියන ලදී. එක් කාලයක මේ දෙකම නොලැබේ. **සමුදය ධම්මානුපසසී වා** - යම් සේ ලෝකුරුවාගේ මයින හමද එහි නාලය ද උත්සාහය ද නිසා වායුව ඔබනොබ හැසිරෙයි. එසේ භික්‍ෂුවගේ කරජකය ද නාස් පුඩු ද සිත ද නිසා ආශ්වාස ප්‍රශ්වාස කය ඔබිනොබ හැසිරෙයි. කායාදි ධර්ම සමුදය ධර්ම වේ. ඒවා බලන්නේ කයෙහි සමුදය ධර්ම බලන්නේ වාසය කරන්නේ යයි කියනු ලැබේ. **වය ධම්මානුපසසී වා** - යම්සේ මයින හමෙන් ඉවත් කරන එහි නාලය බිඳුණු බැවින් ද උත්සාහය නැති කල ඒ වාතය නොපවත්වයි. එසේම කය බිඳුණු කල නාස්පුඩු විනාශ වූ කල්හි සිත ද නිරුද්ධ වූ විට ආශ්වාස ප්‍රශ්වාස කය නොපවත්වයි. කායාදිය නිරෝධය ආරෝග්‍ය ප්‍රශ්වාස නිරෝධය වේ. මෙසේ බලන්නේ කයෙහි වය ධම්මානු පසසීව වාසය කෙරේ යයි කියනු ලැබේ. **සමුදය වය ධම්මානුපසසී** - කාලයකින් සමුදය කාලයකින් වය අනුව බලන්නේ. **අත්‍ථි කායොති වා පනසස** - කය ඇත. ආත්මයක් නැත. තමාට අයත්

Scanned with CamScanner

දෙයක් නැත. මම නැත. මගේ නැත. කිසිවෙක් නැත. කිසිවෙකුගේ දක්වීම හා විස්තර කිරීම වේ. මෙය කියන ලදී. යම් ඒ සිහිය එළඹියේ වේ. එය අන් අර්ථයක් සඳහා නොවේ. එය ඥාණය සඳහාය. සරසට ඉහළින් ඉහළට ඥාණය මැනීම සඳහාය. සිහිය ප්‍රමාණ කිරීම සඳහාය. සිහි නුවණ වැඩීම සඳහා යන අර්ථයයි.

**අනිසසිතො ච විහාරති** - තෘෂ්ණා නිශ්‍රය දෘෂ්ටි නිශ්‍රය වශයෙන් අනිශ්‍රිතව වාසය කරයි. **න ච කිංචි ලොකෙ උපාදියත** - ලෝකයෙහි කිසි රූපයක්..... විඥඥාණයක් හෝ මෙය මගේ ආත්මය හෝ ආත්මයට අයත් යයි නොගනී. **එවම්පීති** - මතු අර්ථය ගෙන, 'පි' යන්න සම්පිණ්ඩන අර්ථය වේ. මේ පදයෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ 'ආනාපාන' දේශනා කොටස පමුණුවා පෙන්වා දෙති. එහි ආශ්වාස ප්‍රශ්වාස පරීක්ෂාවක් ඇති කල්හි දුකඛ සත්‍ය, එය හටගත් පූර්ව තෘෂ්ණාව වූ සමුදය සත්‍යය, ඒ දෙකේම නොපැත්ම වූ නිරොධ සත්‍යය දුක දන ගැනීමෙන් සමුදය ප්‍රහානයෙන් නිවන අරමුණු වූ ආර්ය මාර්ගය වූ මාර්ග සත්‍යය මෙසේ චතුස්සත්‍ය වශයෙන් උත්සාහවත් කොට නිවනට පමුණුවති. මෙය එහි ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් පිවිසි භික්ෂුගේ රහත් බව දක්වා නිවන් මගයි.

**ආනාපාන කොටස නිමි,**

මෙසේ ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් කායානුපසසනාව බෙදා දුන් ඉරියවු වශයෙන් බෙදීමට "පුනච පරං" යනාදිය කීහ. එහි බලු සිවල් ආදි සත්තු ද යන්නේ යන්නෙමුයි දනිති. මෙය වනාහි එබඳු වූ දැනීමක් සඳහා නො කියන ලදී. එබඳු වූ දැනීම වනාහි සතා යන දනුම අත් නොහරියි. ආත්ම සංඥාව ගලවා නොදමයි. කමටහන් හෝ සතිපට්ඨාන භාවනා හෝ නොවේ. මෙහි වනාහි භික්ෂුවගේ දැනීම සත්ව හැඟීම දුරු කරයි. ආත්ම සංඥාව ගලවා දමයි. කමටහන ද සතිපට්ඨාන භාවනාව ද වේ. මෙය වනාහි කවරෙක් යේ ද? කාගේ ගමනක්ද? කුමන කරුණක් නිසා යේදැයි මේවා දැනීම සඳහා කියන ලදී. ස්ථානාදියෙහි ද මෙම නයමැයි. එහි කවරෙක් ගමන් කෙරේද? සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ කිසිවෙක් නො යයි. කාගේ ගමනක් ද සත්වයෙකුගේ හෝ

Scanned with CamScanner

පුද්ගලයෙකුගේ හෝ කිසිවෙකුගේ ගමනක් නොවේ. කුමන කරුණක් නිසා යන්නේ ද චිත්ත කිරිය වායෝ ධාතු පැතිරීමෙන් යයි. එහෙයින් මෙතෙම මෙසේ දනී. යමි යයි සිතක් උපදී. එය මෙතෙම දනී. වායුව විඤ්ඤත්තිය උපදවයි. චිත්ත කිරිය වායෝ ධාතුව පැතිරීමෙන් සියළු කයේ ඉදියෙන් ඉදිරියට ගෙන ඒම ගමන යයි කියනු ලැබේ. ස්ථානාදියෙහි ද මෙම න්‍යායමයි. එහිද සිටිමි යයි සිතක් උපදී. එය ද මෙතෙම දනී. වායුව විඤ්ඤත්තිය උපදවයි. චිත්තකිරිය වායෝ ධාතුව පැතිරීමෙන් සියළු ශරීරයේ කෙළවරෙහි සිට ඔසවන ලද බව ස්ථානයයි කියන ලදී. හිඳිමියි සිතක් උපදී. එය ද මෙතෙම දනී. වායුව විඤ්ඤත්තිය උපදවයි. චිත්ත කිරිය වායෝ ධාතුව පැතිරීමෙන් යටිකයේ හැකිලීම උඩු කයේ නැගී සිටි බව හිඳීම යයි කියනු ලැබේ. නිදමි යයි සිතක් උපදී. එය ද මෙතෙම දනී. වායුව විඤ්ඤාත්තිය උපදවයි. චිත්තකිරිය වායෝ ධාතුව පැතිරීමෙන් සියළු ශරීරයේ හරහට ප්‍රසාරණය නිදීම යයි කියනු ලැබේ. ඔහුට මෙසේ දැනීමෙන් මෙසේ වේ. සත්‍ා යයි සත්වයා සිටියි. යයි කියයි. කිසි සත්වයෙක් යන්නේ හෝ සිටින්නේ හෝ නැත. යම් සේ වනාහි කරත්තය යයි, කරත්තය සිටියයි කියයි. යන හෝ සිටින කරත්තයක් නැත. ගොනුන් සතර දෙනෙකු යොදා දක්ෂ රියදුරකු පදවන කරත්තය සිටී යයි ව්‍යවහාර මාත්‍රයක් වේ. එසේම නොදැනීම් අර්ථයෙන් කරත්තය මෙන් ශරීරය. සිතින් උපන් වාතය ගොනුන් මෙනි. සිත රියැදුරා මෙනි. යමි යි සිටිමියි සිත උපන් කල්හි වායෝ ධාතුව විඤ්ඤත්තිය උපදවන්නේ උපදී. චිත්තකිරිය වායෝ ධාතුව පැතිරීමෙන් ගමනාදිය පවත්වයි. එයින් සත්වයා යයි. සත්වයා සිටියි. මම යමි. මම සිටිමි. යයි ව්‍යවහාර මාත්‍රයක් වේ.

නැව සුළඟ වේගෙන් - දුනුදිය වෙයින් ඊය ද
යන ලෙස කය ද මේ - සුළඟින් ගෙන යයි එසේ

නූලකින් යතුර සේ - මෙම සිත ද නූලක් සේ
යුතු සිරුර යතුර ද - යයි සිටියි හිඳ ගැනුම වේ

මෙහි කොද ඒ සතා - යම් හේතු ද පල විනා
තම තෙදින් වන එය - සිටී හෝ හැසිරේ වේ

Scanned with CamScanner

එහෙයින් මෙසේ හේතු ප්‍රත්‍ය වශයෙන්ම පවත්වන ගමනාදිය සලකන්නේ මෙතෙමේ යන්නේ හෝ යන්නෙමියි දනී. සිටින්නේ හෝ හිඳින්නේ හෝ - නිදන්නේ හෝ නිදන්නෙමියි දනී යයි දත යුතුය.

**යථා යථා වා පනසස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති** - මෙය සර්ව සංග්‍රාහික වචන වේ. මෙය කියන ලද්දේ වේ. යම් යම් ආකාරයෙන් ඔහුගේ කය සිටියේ වේද? ඒ ඒ ආකාරයෙන් එය දැනගනී. ගමනාකාරයෙන් සිටියේ යයි යයි දැනගනී. සිටින හිඳින-නිදන ආකාරයෙන් සිටියේ නිදන්නේ යයි දැනගනී. **ඉති අජ්ඣත්තං වා** - මෙසේ තමාගේ හෝ සිව් ඉරියව් පිරික්සීමෙන් කයෙහි කය අනුව බලමින් වාසය කරයි. **බහිද්ධා වා** - අනුන්ගේ හෝ සිව් ඉරියව් පිරික්සීමෙන් **අජ්ඣත්ත බහිද්ධා වා** - කලකින් තමාගේ කලකින් අනුන්ගේ සිව් ඉරියව් පරීක්‍ෂා කිරීමෙන් කයෙහි කය අනුව බලමින් වාසය කරයි. **සමුදය-ධම්මානුපසසී** - ආදියෙහි වනාහි අවිද්‍යා සමුදයෙන් රූප සමුදය වේ ආදි නයින් පස් ආකාරයකින් රූපස්කන්ධයේ හට ගැනීම ද විනාශය ද බැහැර කළයුතුය. ඒ සඳහා මෙහි ''සමුදය ධම්මානුපසසී'' යනාදිය කියන ලදී. **අත්ථිකායොති වා පනසස** - ආදිය කියන ලද පරිදිම වේ. මෙහි ද සිව් ඉරියව් පරික්සීම ඇති කල්හි දුක්ඛ සත්‍යය. එය හටගත් පෙර තෘෂ්ණාව වූ සමුදය සත්‍යය, දෙකම නොපැවතීම වූ නිරෝධ සත්‍යය, දුක දැන ගැනීම සමුදය ප්‍රහානය නිවන අරමුණුවීම වූ ආර්ය මාර්ග මාර්ග සත්‍යය වේ.

මෙසේ චතුසසත්‍යය වශයෙන් උත්සාහ කොට නිවනට පැමිණේ යයි මෙය සිව් ඉරියව් පරීක්‍ෂාකරන එක් භික්‍ෂුවකගේ රහත් බව දක්වා නිවන් මග වේ.

**ඉරියව් කොටස නිමි.**

මෙසේ ඉරියව් වශයෙන් කායානුපසසනාව වේද, දැන් සිව් විමසන නුවණ වශයෙන් බෙදීමට ''පුනච පරං'' යනාදිය කීහ. එහි ''අභික්කන්ත'' ආදිය සාමඤ්ඤ පලයෙහි වර්ණනා කරන ලදී. **ඉති අජ්ඣත්තං වා** - මෙසේ සිව් විමසන නුවණ පිරික්සීමෙන් තමාගේ හෝ කයෙහි අනුන්ගේ හෝ කයෙහි කලෙක තමාගේ හෝ කලෙක අනුන්ගේ හෝ කයෙහි කය

Scanned with CamScanner

අනුව බලමින් වාසය කරයි. මෙහි ද "සමුදය ධම්මානු පස්සී" යනාදියෙහි රූපස්කන්ධයේම සමුදය ද නිරෝධයද බැහැර කළ යුතුය. සෙස්ස කියන ලද පරිදිමය. මෙහි සිව් විමසන නුවණ පිරික්සීම ඇති කල්හි දුක්ඛ සත්‍යය, එය හටගන්නා පෙර තෘෂ්ණාව වූ සමුදය සත්‍යය. දෙකම නොපවතින නිරෝධ සත්‍යය කියන ලද ආකාර ආර්ය මාර්ග වූ මාර්ග සත්‍යය වේ. මෙසේ සිව්සස් වශයෙන් උත්සාහ කොට නිවණට පැමිණේ. මෙය සිව් විමසන නුවණ පිරික්සන එක් භික්‍ෂුවකගේ රහත් බව දක්වා නිවන් මගයි.

**සිව් විමසන නුවණ කොටස නිමි.**

මෙසේ සිව් විමසන නුවණ වශයෙන් කායානුපස්සනාව බෙදා දුන් පිළිකුල් මෙනෙහි කිරීම් වශයෙන් බෙදීමට "පුන ච පරං" යනාදිය කීහ. එහි **ඉමමෙව කායං** - යනාදියෙහි යමක් කිව යුතු වන්නේ නම් ඒ සියල්ල සියළු ආකාරයෙන් විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කායගතා සති කමටහන්හි කියන ලදී. **උභතො මුඛා** - යටද උඩදයි මුඛ දෙකකින් යුක්තවූ, **නානා විහිතස්ස** - නා නා විධ වූ. මෙහි මෙය වනාහි උපමා සංසන්දනයයි. උභතො මුඛ මල්ලක් මෙන් සිව් මහා භූත කයයි. එහි මිශ්‍ර කොට බහාලන ලද නා නා විධ ධාන්‍ය මෙන් කේසාදි දෙතිස් කොටස්. ඇති මිනිසා මෙන් යෝගාවචරයා. ඔහුගේ ඒ මල්ල ලිහා බලන්නාට නා නා විධ ධාන්‍ය ප්‍රකට කාලය මෙන් යෝගියාට දෙතිස් කොටස් ප්‍රකට කාලය දත යුතුය.

**ඉති අජ්ඣත්තං වා** - මෙසේ කෙස් ආදිය පිරික්සීමෙන් තමාගේ කයෙහි හෝ අනුන්ගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනුන්ගේ හෝ කයෙහි කය අනුව බලමින් වාසය කරයි. මින්පසු කියන ලද පිළිවෙළමය. හුදෙක් මෙහි දෙතිස් කොටස් පිරික්සීමක් ඇති කල්හි දුක්ඛ සත්‍යයයි මෙසේ යෝජනා කොට නිවන් මග දත යුතුය. සෙස්ස පෙර ඒවාට සමාන වේමය.

**පිළිකුල් මෙනෙහි කිරීම කොටස නිමි.**

මෙසේ පිළිකුල් මෙනෙහි කිරීම් වශයෙන් කායානුපස්සනාව බෙදා දූන් ධාතු මෙනෙහි කිරීම් වශයෙන් බෙදීමට ''පුනච පරං'' යනාදිය කීහ. එහි මේ උපමා සංසන්දනය සමග අර්ථ වර්ණනාවයි. යම් සේ කිසියම් ගෝ ඝාතකයෙක් හෝ ඔහුගෙන් බත් වැටුප් ලබන ඝාතක අතවැසියෙක් හෝ එළ දෙනක මරා සිදුරු කොට සිව් අතට මහා පාරවල් ගිය වීථි මාර්ග සංඛ්‍යාත සතර මහා සන්ධියක කොටස් කොටස් කොට සිටින්නේය. එසේම භික්ෂුව සිව් ඉරියව්වලින් යම් ආකාරයකින් සිටියේ යම්සේ සිටි යම්සේ සිටි බවින්ම යම්සේ පිහිටුවන ලද කය, මේ කයෙහි පඨවි ධාතු අපෝ ධාතු තේජෝ ධාතු වායෝ ධාතු ඇතැයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරයි. කුමක් කියන ලදද? යම්සේ ගෝ ඝාතකයා දෙන පෝෂණය කරන්නේ ද ඝාතනයට ගෙන යන්නේ ද ගෙන ගොස් එහි බැඳ තබන්නේ ද වධයට පමුණුවන්නේ ද වධයෙන් මළ දෙන බලන්නේ ද තවමත් එළදෙන යන සංඥාව අතුරුදහන් නොවේ. මළ සිරුර කපා සිදුරු කරන තුරුද ඒ සංඥාව පවතී. බෙදා කොටස් කළවිට දෙන යන සංඥාව අතුරු දහන් වේ. එවිට මස් යන සංඥාව පවතී. එවිට ඔහුට ''මම එළදෙන විකුණමි. මේ එළදෙන ගෙනයමි'' යන සංඥා ඇති නොවේ. මම මස් විකුණමි. මේ මස් ගෙනියන්නේ ද වේ'' යන සංඥා ඇති වේ. එසේම මේ භික්ෂුවගේ ද පෙර බාල පෘථග්ජන කාලයේ ගිහි වූයේ ද පැවිදි වූයේ ද සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ යන සංඥාව අතුරුදහන් නොවේ. යම්තාක් මේ කය යම්සේ සිටියේ යම්සේ පිහිටුවන ලද ඝන වූ කය වෙන්කොට ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා නොකෙරෙයිද එතෙක් සත්ත්වයෙක් පුද්ගලයෙක් යන සංඥාව පවතී. ධාතු වශයෙන්ම සිත සිටී. එයින් කීහ භගවත්හු: මේ කයම යම්සේ සිටියේ යම්සේ පිහිටුවන ලද්දේ ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරයිද? මේ ශරීරයේ පඨවි ධාතු ආපෝ ධාතු තෙජෝ ධාතු වායෝ ධාතු ඇත. මහණෙනි, යම්සේ වනාහි දක්ෂ ගෝඝාතකයෙක් හෝ.... වායෝ ධාතු'' යයි. යෝගියා ගෝඝාතකයා මෙනි. සත්ත්ව සංඥාව එළදෙන යන සංඥාව මෙනි. සිව් ඉරියව් සිව්මහා පථ මෙනි. ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කිරීම සිදුරු වශයෙන් බෙදා සිටින්නා වැනිවේ. මේ මෙහි පෙළ වර්ණනාවයි. කමටහන් කථාව වනාහි විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. **ඉති අජ්ඣත්තං වා** - මෙසේ සිව් ධාතු පරීක්ෂා කරන්නේ තමාගේ කයෙහි හෝ අනුන්ගේ කයෙහි හෝ කලක තම කයෙහිද කලක අනුන්ගේ කයෙහි ද කය අනුව බලමින් වාසය කරයි. මෙයින් පසු කියන ලද පිළිවෙළම වේ. හුදෙක් සතර ධාතු පරීක්ෂා කරන කල්හි දුක්ඛ සත්‍යයයි

Scanned with CamScanner

මෙසේ යොදාගෙන නිවන් මග දත යුතුයි. සෙස්ස පෙර කියන ලද්දට සමාන වේ.

### ධාතු මෙනෙහි කිරීම නිමි.

මෙසේ ධාතු මනසිකාර වශයෙන් කායානුපස්සනාව බෙදා දූන් නව ආකාර වූ අමුසොහොනෙහි මෘත ශරීර කොටස් බෙදීමට "පුනවපරං" යනාදිය කීහ. **සෙය්‍යථාපි පසෙසය්‍ය** - එහි යම්සේ බලන්නේය. **සරීරං** - මළ සිරුර. සොහොනෙහි හැරදමූ. මැරී එක් දිනක් ඇත්තේ **එකාහමතං** - වේ. දෙදවසක් ගියේ **ද්වීහමතං** - වේ. තුන් දවසක් ඇත්තේ **තීහමතං** - වේ. මයින හමක් මෙන් වායුවෙන් ඔසවන ලද ජීවිතය අවසන් වූ පිළිවෙළින් ඉදිමී ගිය බැවින් උස්වගිය ඉදිමුණු බැවින් උද්ධුමාත, උද්ධුමාතක ඉදිමී ගිය බැවින් උස්වගිය ඉදිමුණු බැවින් උද්ධුමාත, පිළිකුල් බැවින් හෝ පිළිකුල් උද්ධුමාතයයි **උද්ධුමාතකං** - වේ. විනීල යනු වෙනස්ව බිඳුණු වර්ණයයි. විනීලම විනීලක වේ. පිළිකුල් බැවින් හෝ පිළිකුල් වූ විනීලය **විනීලකං** - වේ. මස් වැඩිතැන්වල රතු වූ සැරව වැඩිතැන්වල සුදු වර්ණ වූ බොහෝ සෙයින් නිල් වර්ණයේ නිල් ස්ථානයෙහි නිල් වස්ත්‍රයක් පෙරවූ මෙන් මෘත ශරීරයටම අධි වචනයකි. බිඳුණු තැන්වලින් වන මුඛ නවයකින් හෝ වැගිරෙන්නාවූ සැරව විපුබ්බ වේ. විපුබ්බයම **විපුබ්බකං** - වේ. පිළිකුල්බැවින් හෝ පිළිකුල් වූ විපුබ්බක **ජාතං** වේ. **සො ඉමමෙව කායං** - ඒ භික්‍ෂුව තමාගේ ශරීරය එය සමග නුවණින් ම එක් කරයි. පමුණුවයි. කෙසේද? **අයංපි ඛො කායො එවං භාවි එවං ධම්මො එතං අනතීතො** - මේ කයද මෙසේ වන්නේය. මේ සවභාවය වේ. මේ තත්වය නො ඉක්මවයි.

මෙය කියන ලද්දේ වේ. ආයුෂය, උෂ්ණය, විඤ්ඤාණය යන මේ ධර්ම තුනේ ඇතිතාක් මේ කය සිටීම් ගමනාදියට හැකි වේ. මෙවා වෙන්වීමෙන් මේ කයද මේ සවභාවය වේ. මේ කුණු සවභාවය වේ. **එවං භාවී** - මෙසේ උද්ධුමාතකාදි භේදය වන්නේය. **එතං අනතීතො** - මේ උද්ධුමාතකාදි ස්වභාවය නො ඉක්මවන්නේය. **ඉති අජ්ඣත්තං වා** - මෙසේ උද්ධුමාතකාදි පිරික්සීමෙන් තමාගේ කයෙහි හෝ අනුන්ගේ කයෙහි හෝ කලක තමන්ගේ හෝ කලක අනුන්ගේ හෝ කයෙහි කය අනුව බලමින් වාසය කරයි.

Scanned with CamScanner

බජ්ජමානං - උදර ආදියෙහි හිඳ බඩ මස තොල්මස ඇස්කූප ආදිය උදුර උදුරා කනු ලබන්නේ, සමංස ලොහිතං - සේස වූ අවසේස මස් ලේ වලින් යුත්. නිම්මංස ලොහිතමක්ඛිතතං - මස් ක්ෂීණ වූයේ ද ලේ නොවියලේ. ඒ සඳහා කියන ලදී. අඤ්ඤෙන - අන්‍ය පැත්තකින්, හත්ථට්ඨිකං - හැටහතරක් භේද වූ ද අත් ඇට වෙන වෙනම විසුරුණා වූ. පා ඇටවල ද මෙම නයම වේ. තෙරො වස්සිකානි - ඉකුත් වූ අවුරුදු ඇති, පූතීනි - අභ්‍යවකාසයෙහි පැවති වායුව අව්ව වැස්ස ස්පර්ශයෙන් අවුරුදු ගණන් ගත වී කුනු වේ. පොළොව ඇතුලේ මේ කියන ලද නයින්ම කණු ලබන ආදීන්ගේ වශයෙන් යොදා ගත යුතුය. ඉති අජ්ඣත්තං වා - මෙසේ කනු ලබනු ආදිය පිරික්සීමෙන් කුඩුවීම දක්වා තමාගේ හෝ කයෙහි අනුන්ගේ හෝ කයෙහි කලක තමාගේ කයෙහි කලක අනුන්ගේ කයෙහි කය අනුව බලමින් වාසය කරමි. මෙහි සිට නවසීවථික එකතු කළ යුතුයි. එකාහමතං වා යනාදි නයින් කියන ලද සියල්ල එකය[1]... කාකෙහි වා බජ්ජමානා ආදිය එකකි[2]....අට්ඨිකසංඛලිකං සමංස ලොහිතං නහාරු සම්බන්ධං එකකි[3]. නිම්මංස ලොහිතමක්ඛිතතංනහාරු සම්බන්ධං එකකි [4]. අපගත මංසලොහිතං නහාරු සම්බන්ධං එකකි[5]. අට්ඨිකානි අපගත සම්බන්ධානි එකකි[6]. අට්ඨිකානි සෙතානි සංඛවණ්ණුපතිභානි එකකි[7]. අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරො වස්සිකානි එකකි[8]. අට්ඨිකානි පූතීනි චුණ්ණක ජාතානි එකකැ[9] යි මහණෙනි, මෙසේ මේ නවසීවථික දක්වා කායානුපස්සනාව අවසන් කරන්නේ කීහ. එහි නවසීවථික පරීක්ෂා කරන කල්හි දුක්ඛ සත්‍යය එය උපදවන පෙර තෘෂ්ණා සමුදය සත්‍යය, දෙකේම නොපැවැත්ම නිරෝධ සත්‍යය දුක දැනගැනීම සමුදය දුරුකිරීම නිරෝධය අරමුණු කිරීම ආර්ය මාර්ගය වූ මාර්ග සත්‍ය යන මෙසේ සිව්සස් වශයෙන් උත්සාහවත් කොට නිවණට පැමිණේ යයි නවසීවථික පිරික්සන භික්ෂූන් ගේ රහත් බව දක්වා නිවන් මග වේ.

### සීවථික කොටස නිමි.

මෙපමණකින් ආනාපාන කොටස, ඉරියව් කොටස, සිව් විමසන නුවණ කොටස, පිළිකුල් මෙනෙහි කරන කොටස, ධාතු මෙනෙහි කරන කොටස, නව සීවථික කොටස යයි කොටස් තුදුසකින් කායානුපසසනාව නිමියේ වේ. එහි අනාපාන කොටස පිළිකුල් මෙනෙහි කරන කොටස

යන මේ කොටස් දෙක අර්පණා කමටහන් වේ. සීවථික වනාහි ආදීනව අනුපසසනා වශයෙන් කියන ලද බැවින් සෙසු දොලොස උපචාර කමටහන්ම වේ.

කායානුපසසනාව නිමි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුදුස් ආකාරයකින් කායානුපසසනා සතිපට්ඨානය කියා දැන් නවාකාර වූ වෙදනානු පසසනාව කීමට "කථඤච භික්ඛවෙ" යනාදිය කීහ.

එහි සුඛං වෙදනං - කායික හෝ චෛතසික සැප වේදනාවක් විඳිනු ලබන්නේ මම සැප වේදනාවක් විඳිමියි දැන ගනී යන අර්ථය වේ. එහි උඩුකුරුව හෝනා දරුවෝ කිරිබොන කාලයෙහි සැප වේදනා විඳිමියි දනිති. මෙය එබඳු වූ දැනීමක් සඳහා නොකියන ලදී. එබඳුරූප වූ දැනුම සත්‍වයා යන විශ්වාසය දුරු නොකරයි. ආත්ම සංඥාව නො උදුරයි. කමටහනක් හෝ සතිපට්ඨාන භාවනාවක් හෝ නොවේ. මේ භික්‍ෂුව ගේ දැනුම වනාහි සත්‍වයා යන ඇදහීම දුරුකරයි. ආත්ම සංඥාව උදුරා දමයි. කමටහනක් මෙන්ම සතිපට්ඨාන භාවනාවක් ද වේ. මෙය කවරෙක් විඳීද? වේදනාව කාගේද? කුමක් නිසා වේදනාව වීද? මෙසේ විමසන නුවණින් දැනීම සඳහා කියන ලදී. එහි කවරෙක් විඳීද? කිසි සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නොවිඳී. කාගේ වේදනාවකද? කිසි සත්‍වයෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ වේදනාව නොවේ. වේදනාවට හේතුව කිමද ? වස්තු අරමුණු හෝ මේ වේදනාවට හේතු වේ. මෙතෙම මෙය කෙසේ දැනගනීද? ඒ ඒ සැප ආදිය වස්තු අරමුණු කොට වේදනාව විඳීයයි සලකන්නේ හේ සැප වේදනා විඳිමියි දැනගනී යයි දත යුතුය.

සිතුල්පව්වෙහි එක්තරා තෙර නමක් මෙන්, තෙරුන්වහන්සේ වනාහි බලවත් වේදනාවෙන් අපහසු කාලයෙහි කෙඳිරිගාමින් එහාට මෙහාට පෙරළෙයි. එක් දහරෙක් උන්වහන්සේට කීය. සවාමීනි රිදෙන්නේ කොතනද? ඇවැත්නි වෙනම රිදෙන තැනක් නම් නැත. වසතු අරමුණු කොට වේදනාව විඳී. මෙසේ දන්නා කාලයේ පටන් ඉවසීමට යෙහෙකි. තෙරුන් වහන්සේ ඉවසූහ. වාතය හෘදය වසතුව පැළීය. ඇඳෙහි

බඩවැල් එකතු විය. තෙරහු දහරාට පෙන්වූහ. ඇවැත්නි පෙමණ ඉවසීම වටීද? දහරා නිශ්ශබ්ද විය. තෙරුන් වහන්සේ වීර්ය සමථය යොදා සිවු පිළිසිසියා සහිත රහත් බවට පැමිණ පිරිනිවන් පෑහ. යම්සේ සැප ද එසේම දුක.... නිරාමිස අදුක්ඛමසුඛ වේදනා විඳින්නේ නිරාමිස අදුක්ඛමසුඛ වේදනා විඳිමියි දැනගනී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූප කමටහන් කියන්නේ යම් හෙයකින් ස්පර්ශ වශයෙන් හෝ සිත් වශයෙන් හෝ කියනු ලබන්නේ ප්‍රකට නොවේ. අඳුරක් මෙන් හැඟෙයි. වේදනා වනාහි උපත ප්‍රකටය, ඒ වේදනාව වශයෙන් ප්‍රකට වේ. එහෙයින් සක්‍ර ප්‍රශ්නයෙහි මෙන් මෙහි ද වේදනා වශයෙන් වේදනා අරූප කමටහන කීහ. එහි රූප අරූප වශයෙන් කමටහන් දෙයාකාරය යනාදි කථා මාර්ගය සක්‍ර ප්‍රශ්නයෙහි කියන ලද අයුරින්ම දත යුතුය.

එහි සැප විඳිති ආදියෙහි මෙය අන්‍ය වූ විශේෂ ධර්ම පරියායකි. **සුඛං වෙදනං වෙදියාමීති පජානාති** - සැප වේදනා ඤාණයෙහි දුක්වේදනාවේ අභාවයෙන් සැප වේදනාව විඳින්නේ සැප වේදනාවම විඳිමි යයි දැනගනී. එයින් පෙරවූ දුක් වේදනාව දැන් නොමැති හෙයින් ද මේ සැප වේදනාව මෙයින් පෙර නොවූ හෙයින් වේදනාව නම් අනිත්‍යය, ස්ථිර නැත. වෙනස්වන සවභාවය ඇත්තේ වේ. මෙසේ මෙහි දැනීම ඇත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කියන ලදී. "ගිනිවෙස්න, යම්කලක සැප වේදනාව විඳියි ද ඒ කාලයෙහි දුක්වේදනාව නොවිඳී. අදුක්ඛමසුඛ වේදනා" නොවිඳී සැප වේදනාවම ඒ කාලයෙහි විඳී. ගිනිවෙස්න, යම්කලක දුක්... අදුක්ඛමසුඛ වේදනාව විඳීද එසමයෙහි සැප වේදනාව නොවිඳී, දුක් වේදනාව නොවිඳී. එසමයෙහි අදුක්ඛමසුඛ වේදනාවම විඳී. ගිනිවෙස්න සැප වේදනාව ද අනිත්‍ය වේ. සංඛතය පටිච්ච සමුප්පන්නය, ක්ෂය ධර්මය, ව්‍යය ධර්මය, විරාග නිරෝධ සවභාවය වේ. දුකද.... ගිනිවෙස්න, අදුක්ඛමසුඛ වේදනාව ද අනිත්‍යය.... නිරෝධ ස්වභාවය වේ. ගිනිවෙස්න, මෙසේ බලන්නේ, අසන්නේ ආර්ය ශ්‍රාවකයා සැප වේදනාවෙහි ද කලකිරේ. දුක් වේදනාවෙහි ද කලකිරේ. අදුක්ඛමසුඛ වේදනාවෙහි ද කලකිරේ. කලකිරීම විරාගය පිණිස පවතී. විරාගය මිදීම සඳහා පවතී. මිදීම මිදුනෙමි යන ඤාණය වේ. ජාතික්ෂීණ විය. බඹසර වැස නිමියේය. කළයුතු දේ කොට අවසන් විය. මෙලොව මින්මතු කළයුත්තක් නැතැයි දැනගනී. සාමිස සැප හෝ යනාදියෙහි සාමිස සැප නම් පඤ්චකාම ගුණ මිශ්‍ර වූ ගේහසිත සොම්නස් හයේ වේදනාවය, නිරාමිස සැප නම් නෙක්ඛම්ම සොම්නස් වේදනා හයය,

Scanned with CamScanner

සාමිස දුක් නම් ගෙහසිත දොම්නස් වේදනා හයය. නිරාමිස දුක් වේදනා නම් නෙක්ඛම්ම දොම්නස් වේදනා හයයි, සාමිස අදුක්ඛමසුඛ නම් ගෙහසිත උපේක්‍ෂා වේදනා හයයි, නිරාමිස අදුක්ඛමසුඛ වේදනා නම් නෙක්ඛම්ම උපේක්‍ෂා වේදනා හයයි. ඒවායේ විභාගය සක්ක පඤ්හයේ කියන ලදමය. මෙසේ සැප වේදනාදිය පිරික්සීමෙන් තමාගේ වේදනාවල අනුන්ගේ වේදනාවල කලක තමාගේ, වේදනාවල කලක අනුන්ගේ වේදනාවල වේදනාව අනුව බලමින් වාසය කරයි. සමුදය වයධම්මානු පස්සීවා - මෙහි වනාහි අවිද්‍යාව ඇතිවීමෙන් නැතිවීමද දකින්නේ වේදනාවල සමුදය ධම්මානුපස්සීව හෝ වාසය කරයි. වේදනාවල වය ධම්මානු පස්සීව හෝ වාසය කරයි. වේදනාවල කලක සමුදය ධම්මානු පස්සීව හෝ කලක වයධම්මානු පස්සීව හෝ වාසය කෙරේ යයි දත යුතුය. මින්පසු කායානුපස්සනාවේ කී පරිදිමය. හුදෙක් මෙහි වේදනා පරීක්‍ෂා කරන කල්හි දුක්ඛ සත්‍යයයි මෙසේ යොදාගෙන වේදනා පිරික්සන භික්‍ෂුවගේ නිවන් මග දත යුතුය. සෙස්ස එලෙසින්ම වේ.

## වේදනානුපස්සනාව නිමි.

මෙසේ නව ආකාරයකින් වේදනානුපස්සනා සතිපට්ඨානය කියා දූන් සොළොස් ආකාර චිත්තානුපස්සනාව කීමට ''කථඤ්ච භික්ඛවෙ'' යනාදිය කීහ. එහි සරාගං - අට ආකාරය, ලොභ සහගතය. වීතරාගං - ලෞකික කුසල අව්‍යාකෘත මෙය වනාහි ධම්ම සම්මර්ශන, න ධම්ම සමොධාන, වශයෙන් වේ. එහෙයින් මෙහි එක පදයකවත් ලෝකොත්තරය නො ලබයි. සෙසු අකුසල් සිත් සතර පෙර පද හෝ පසු පද හෝ ඇසුරු නොකරයි. සදොසං - දෙයාකාරය. දොම්නස් සහගතය. වීත දොසං - ලෞකික කුසල අව්‍යාකතය. සෙසු දස අකුසල සිත් පෙර පද හේ පසුපද හෝ භජනය නොකරයි. විචිකිච්ඡා සහගත ද උද්ධච්ච සහගත දැයි දෙයාකාරය. යම්හෙයකින් වනාහි මෝහය සියළු අකුසල සිත්වල උපදී. එහෙයින් සෙසු ඒවාද මෙහි වටීමය. මේ දෙකෙහි දොලොස් අකුසල් සිත් ඇතුළත් වේ. වීතමොහං - ලෞකික කුසල අව්‍යාකත. සංඛිත්තං - ථීන මිද්ධ පතිත වූ මෙය හැකුළුණු සිත නම් වේ. උද්ධච්ච සහගත වූ මෙය විසුරුවන ලද සිතය. මහග්ගතං - රූපාවචර සහ අරූපාවචර, අමහග්ගතං - කාමාවචර. සඋත්තරා - කාමාවචර, අනුත්තරං - රූපාවචර අරූපාවචර. එහි ද ස උත්තර

Scanned with CamScanner

රූපාවචර ද අනුත්තර අරූපාවචර ද වේ. සමාහිතං - යමෙකුට අර්පනා සමාධි හෝ උපචාර සමාධි ඇත. අසමාහිතං - උභය සමාධි විරහිත. විමුත්තං - තදංග වික්ඛම්භන විමුක්තියෙන් මිදුනාවූ. අවිමුත්තං - උභය විමුක්ති විරහිත වූ, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ විමුක්තීන්ගේ වනාහි මෙහි අවකාසයක් නැත. ඉති අජ්ඣත්තං වා - මෙසේ සරාගාදි පරීක්ෂාවෙන් යම් යම් ක්ෂණවල යම් යම් සිතක් පවතී. එය සලකන්නේ තමාගේ සිතේ හෝ අනුන්ගේ සිතේ හෝ කලක තමාගේ කලක අනුන්ගේ හෝ සිතේ සිත අනුව බලමින් වාසය කරයි.

**සමුදය වය ධම්මානුපස්සී** - මෙහි වනාහි අවිද්‍යා සමුදයෙන් විඤ්ඤාණ සමුදය යයි මෙසේ පස් පස් ආකාරයෙන් විඤ්ඤාණයේ සමුදය ද විනාශයද බැහැර කළයුතුය. මෙයින් පසු කියන ලද පිළිවෙළමය. හුදෙක් මෙහි සිත පිරික්සන කල්හි දුක්ඛ සත්‍ය යයි මෙසේ යොදාගෙන සිත පරීක්ෂා කරන භික්ෂුව ගේ නිවන් මග දත යුතුය. සෙස්ස එපරිදිමය.

**චිත්තානු පස්සනාව නිමි.**

මෙසේ සොළොස්විධ වූ චිත්තානු පස්සනා සතිපට්ඨානය කියා දැන් පංචවිධ වූ ධම්මානු පස්සනාව කීවේ ''කථං ච භික්ඛවෙ'' යනාදිය කීහ. තවද භාග්‍යවතුන් වහන්සේ කායානුපස්සනාව සුද්ධ පිරික්සීමෙන් දේශනා කළහ. වේදනා චිත්ත පස්සනා සුද්ධ අරූප පිරික්සීමෙන් දේශනා කළහ. දැන් රූපාරූප මිශ්‍රව පිරික්සීමෙන් දේශනා කිරීමට ''කථං ච භික්ඛවෙ'' යනාදිය කීහ. කායානුපස්සනාවෙන් හෝ රූපස්කන්ධ පරීක්ෂාව කියන ලදී. වේදනානු පස්සනාවෙන් වේදනාස්කන්ධ පරීක්ෂාවද චිත්තානු පස්සනාවෙන් විඤ්ඤාණස්කන්ධ පරීක්ෂාව ද දැන් සඤ්ඤා සංකාරස්කන්ධ පරීක්ෂාවද කීමට ''කථං ච භික්ඛවෙ'' යනාදිය කීහ. එහි සන්තං - නිතර හැසිරීම් වශයෙන් විද්‍යාමාන වූ, අසන්තං - හැසිරීම් වශයෙන් නොවන. හෝ ප්‍රහීනභාවයෙන් හෝ අවිද්‍යමාන, යථාවා යම් කාරණයකින්. **කාමච්ඡන්දස්ස උප්පාදො හොති, තංච පජානාති** - ඊට කරුණු දනී. මෙසේ මේ නයින් සියළු පදවල අර්ථ දත යුතුය.

එහි සුභ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්දය උපදී. සුභ නිමිත්ත නම් සුභ දේද සුභ නිමිත්තකි. සුභ අරමුණ ද සුභ

Scanned with CamScanner

නිමිත්තකි. අයොනිසොමනසිකාරය නම් උපාය රහිත මෙනෙහි කිරීමයි. අමාර්ග මෙනෙහි කිරීමයි. අනිත්‍යයෙහි නිත්‍යයයි හෝ දුකෙහි සැපයයි හෝ අනාත්මයෙහි ආත්මයයි හෝ අසුභයෙහි සුභ යයි හෝ මෙනෙහි කිරීමයි. එය එහි බහුලව පැවැත්වීමෙන් කාමච්ඡන්දය උපදී. එයින් කීහ භගවත්හු: මහණෙනි සුභ නිමිත්තක් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම් බහුල බව පිණිස මහත්බව පිණිස මෙය ආහාරය වේ. අසුභ නිමිත්ත නම් අසුභය ද අසුබ අරමුණද වේ. නුවණින් මෙනෙහි කිරීම නම් උපාය මෙනෙහි කිරීමය. අනිත්‍යයෙහි අනිත්‍යයයි හෝ දුකෙහි දුක යයි හෝ ආත්මයෙහි අනාත්මයයි හෝ අසුභයෙහි අසුභයයි හෝ මෙනෙහි කිරීමය. එය බහුල වශයෙන් පවත්වන්නේ කාමච්ඡන්දය ප්‍රහීන වේ. එයින් කීහ භාග්‍යවතුන් වහන්සේ: මහණෙනි අසුභ නිමිත්තක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් කාමච්ඡන්දයේ නූපදීම සඳහා උපන් කාමච්ඡන්දයේ ප්‍රහානය පිණිස මෙයම හේතුවේ. තවද ධර්ම සයක් කාමච්ඡන්දයේ ප්‍රහානය පිණිස පවතී. අසුභ නිමිත්ත දැනගැනීම, අසුභ භාවනානු යෝගය, ඉන්ද්‍රියවල වැසූ දොරවල් ඇතිබව (ඉන්ද්‍රය සංවරය) භෝජනයෙහි පමණ දැනීම, කලණමිතුරන් සේවනය, සත්ප්‍රාය වූ කථා යනුවෙනි. දසවිධ වූ අසුභ නිමිති ඉගෙන ගන්නාට ද කාමච්ඡන්දය ප්‍රහීන වේ. භාවනා කරන්නාටද ඉන්ද්‍රිය සංවරය ඇත්තාටද සතර පස් පිඩකට ඉඩ තබා ජලය පානය කොට යැපෙන පමණකට භොජනයෙහි පමණ දැනීමද එයින් කීහ:

හතර පස් පිඩකට ඉඩතබා දිය බීමෙන්
පහසුය විහරණය බිකු දිවි කෙලෙස් හරනට

අසුභකම්මික තිස්ස තෙරුන් මෙන් අසුභ භාවනාවෙහි ඇලුණු කල්‍යාණ මිත්‍රයකු ඇසුරු කරන්නාටද කාමච්ඡන්දය ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වල දස අසුභ නිශ්‍රිත කථාවෙන් ද ප්‍රහීන වේ. එයින් කියන ලදී. "ධර්ම සයක් කාමච්ඡන්දය ප්‍රහීන වීම පිණිස පවතී". මේ ධර්ම හයෙන් ප්‍රහීන වූ කාමච්ඡන්දය රහත් මාර්ගයෙන් මතුවට නොඉපදවීම වේ යයි දැනගනී.

පටිඝ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් ව්‍යාපාදය (තරහ) ඉපදීම වේ. එහි ගැටීම ද ගැටීම් නිමිත්ත ද ගැටීම් අරමුණ ද ගැටීම් නිමිති වේ. නුනුවණින් මෙනෙහි කිරීම සියළු තැන එකම

Scanned with CamScanner

ලක්ෂණය වේ. එය ඒ නිමිත්තෙහි බහුලව පැවතීමෙන් ව්‍යාපාදය උපදී. භාග්‍යවතුන් වහන්සේ එයින් කීහ: මහණෙනි, පටිඝ නිමිත්තක් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් වූ හෝ ව්‍යාපාදයේ ඉපදීම පිණිස උපන්නා වූ හෝ ව්‍යාපාදයේ බොහෝ බව පිණිස මහත් බව පිණිස මෙය හේතුවන්නේය. මෛත්‍රී සහගත චේතනා විමුත්තයෙන් යයි කී කල්හි අප්පමාණ ද උපචාරය වටී. චෙතොවිමුත්ති - අර්පණාව, නුවණින් මෙනෙහි කිරීම කියනලද ලක්ෂණම වේ. එය එහි බහුලව පවත්වන්නේ ව්‍යාපාදය ප්‍රහීන වේ. එයින් කීහ: ''මහණෙනි, චේතෝවිමුත්ති මෛත්‍රිය ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් ව්‍යාපාදයේ නූපදීම පිණිස උපන් ව්‍යාපාදයේ ප්‍රහානය පිණිස එයම හේතුවේ. තවද ව්‍යාපාද ප්‍රහානය පිණිස කරුණු හයක් පවතී. මෛත්‍රී නිමිත්ත ඉගණීම, මෛත්‍රී භාවනානු යෝගය, කළ ක්‍රියා ප්‍රත්‍යවෙක්ෂා කිරීම, සිහි කිරීම් බහුල වීම, කල්‍යාණ මිත්‍රත්‍වය. සප්පයා කථා යනුවෙනි. වෙන්කළ වෙන්නොකළ, දිසා පැතිරවීම් ආදි එක්තරා ආකාරයකින් මෛත්‍රිය ඉගෙණ ගන්නාට ද ව්‍යාපාදය ප්‍රහීන වේ. නිම කළ නොකළ පැතරවීම් වශයෙන් මෛත්‍රිය වඩන්නාටද, ඔබ මොහු කිපී කුමක් කරන්නද? කිම ඔහුගේ සීලාදිය නැසීමට හැකිවේද? ඔබ ඔබේ කර්මයෙන් ඇවිත් තමාගේම කර්මයෙන් යන්නේ නොවේද? පිළි නොගත් ත්‍යාගයක් මෙන් උඩු සුළඟට දමූ දූවිලි මිටක් මෙන් මේ ක්‍රෝධය ඔහු මතට වැටෙන්නේය, මෙසේ තමාගේ ද අනුන්ගේ ද කළ ක්‍රියා ප්‍රත්‍ය වෙක්ෂා කරන්නාටද, දෙගොල්ලන් ගේ කළක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කොට සිහිකිරීමේ සිටියාටද? අසසගුත්ත තෙරුන් මෙන් මෛත්‍රී භාවනාවේ ඇළුණු කල්‍යාණ මිත්‍රයකු සෙවිනාහට ද ව්‍යාපාදය ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වල මෛත්‍රී නිශ්‍රිත සප්පාය කථාවෙන් ද ප්‍රහීන වේ. එයින් කියන ලදී. ඡ ධමමා ව්‍යාපාදසස ප්‍රහීනවීම පිණිස පවතී. මේ ධර්ම හයෙන් ප්‍රහීන වූ ව්‍යාපාදය අනාගාමි මාර්ගයෙන් මතුවට නො ඉපදීම වේ යයි දනගනී.

නොඇලීම් ආදියෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් ථීන මිද්ධයාගේ ඉපදීම වේ. අරතිය නම් කලකිරීම් බවය. තන්දි නම් කයේ අලස බවය. විජම්භිකා නම් කයෙහි මැලි බවය. භත්ත සමමදො නම් බත්මතය, බත් දැවිල්ලය. සිතේ ලීන බව නම් සිතේ සැඟවුණු ආකාරයයි. මේ අරති ආදියෙහි නුනුවණින් මෙනෙහි කිරීම් බහුල වූයේ ථීනමිද්ධ උපදී. එයින් කීහ. මහණෙනි, අරතිය තන්දිය විජම්භිකා භත්ත සමමදො

Scanned with CamScanner

චෙතසො ලීනත්තං ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම් බහුල වූයේ නූපන් ථීනමිද්ධයේ ඉපදීම පිණිස උපන් ථීනමිද්ධ යේ බොහෝ බව මහත් බව පිණිස මේවා හේතු වේ. ආරම්භ ධාතු ආදියෙහි නුවණින් මෙනෙහි කිරීමෙන් එහි ප්‍රහානය වේ. ආරම්භ ධාතු නම් පළමු ආරම්භ වීර්යයි. නික්කම ධාතු නම් කුසීත බවින් නික්මෙන හෙයින් ඊට වඩා බලවත් වේ. පරක්කම ධාතු නම් තව තවත් ස්ථාන ආක්‍රමණය කරන බැවින් ඊටත් වඩා බලවත් වේ. මේ තුන් ආකාර වීර්යයෙහි නුවණින් මෙනෙහි කිරීම බහුලව පැවැත්වීමෙන් ථීන මිද්ධ ප්‍රහීන වේ. එයින් කීහ: මහණෙනි, ආරම්භ ධාතු නික්කම ධාතු පරක්කම ධාතු ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් හෝ ථීනමද්ධ නොඉපදීම පිණිස උපන් ථීනමිද්ධ ප්‍රහානය පිණිස හේතුවේ. තවද කරුණු සයක් ථීනමිද්ධ ප්‍රහානය පිණිස පවතී. අතිභෝජනයෙහි නිමිති ගැනීම, ඉරියව් මාරු කිරීම, ආලෝක සංඥාව මෙනෙහි කිරිම, අභ්‍යවකාසයෙහි විසීම, කල්‍යාණ මිත්‍ර සම්පත්තිය, සංවාස කථා යනුවෙනි. ආහාර අතින් ගැනීම (උගුරේ ආහාර අතින් ගැනීම) කාපු තැනම වැතිරීම, කෑ පසු වස්ත්‍ර කයේ රඳවා ගැනීමට නොහැකිවීම, කවුඩන් උගුරේ ආහාර ගැනීම, කෑ දේ වමනය කිරීම. ආහාර වළඳා රාත්‍රි ස්ථාන දිවා ස්ථානවල සිට මහණදම් කරන්නාට ථීනමිද්ධ මහ ඇතකු මෙන් බසිමින් එයි. හතර පස් පිඩකට අවකාස තබා පැන් බී යැපෙන සුළු භික්‍ෂුවට එය නොවේ. මෙහි අති භෝජනයෙහි නිමිති ගන්නාට ථීනමිද්ධ ප්‍රහීන වේ. යම් ඉරියව්වක ථීනමිද්ධ බැසගනීද එයින් ඉරියව් මාරු කිරීමෙන් ද රාත්‍රියේ සඳ එළිය පහන් එළිය හුළු එළිය දාවල් හිරු එළිය මෙනෙහි කරන්නාට ද අභ්‍යවකාශයෙහි වාසය කරන්නාට ද මහා කාශ්‍යප තෙරුන් සමාන ප්‍රහීන ථීනමිද්ධ ඇති කල්‍යාණ මිත්‍රයකු සේවනය කරන්නාට ද ථීනමිද්ධ ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වල ධූතංග නිශ්‍රිත සප්පායා කථාවද ථීන මිද්ධ දුරු කරයි. මේ කරුණු සයෙන් ප්‍රහීන වූ ථීන මිද්ධ රහත් මගින් මතු නොවන සේ නැති වේ යයි දනගනී.

සිතින් ව්‍යපසමනය නොවූ කල්හි නුනුවණින් මෙනෙහි කිරීමෙන් උද්ධච්ච ඉපදීම වේ. අවුපසම නම් අවුපසන්තාකාරයයි. එය අර්ථ වශයෙන් උද්ධච්ච කුක්කුච්චයම වේ. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලව පැවැත්වීමෙන් උද්ධච්ච කුක්කුච්චය උපදී. එයින් කීහ: මහණෙනි, සිතින් සංසිඳීමක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් උද්ධච්ච කුක්කුච්චයේ නූපදීම සඳහා උපන් උද්ධච්ච කුක්කුච්චයේ ප්‍රහාණය

Scanned with CamScanner

සඳහා මෙයම හේතුවේ. තව උද්ධච්ච කුක්කුච්චයේ ප්‍රහාණය පිණිස කරුණු හයක් පවතී. බහුශ්‍රුතභාවය, විමසීම් ඇති බව විනයෙහි ප්‍රකෘති දන්නා බව, වෘද්ධයන් සෙවිනා බව, කල්‍යාණ මිත්‍රයන් ඇසුර සප්පාය කථා. බහුශ්‍රුතයා විසින් එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ හතරක් හෝ පහක් හෝ නිකායන් පෙළවශයෙන් ද අර්ථ වශයෙන් ද ඉගෙන ගන්නාටද උද්ධච්ච කුක්කුච්ච ප්‍රහීන වේ. කැප අකැප විචාර බහුලයාට ද විනය ප්‍රඥප්තිවල පුරුදු කරන ලද වසීබව ඇත්තාට ද කරුණු දන්නා මහළු තෙරවරුන් කරා එළඹ අසන්නාට ද උපාලි තෙරුන් සමාන විනය ධර කල්‍යාණ මිත්‍රයකු ඇසුරු කරන්නාට ද උද්ධච්ච කුක්කුච්ච ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වල කැප අකැප නිශ්‍රිත සප්පාය කථාවලින් ද ප්‍රහීන වේ. එහෙයින් කියන ලදී: "ඡ ධම්මා උද්ධච්ච කුක්කුච්චස්ස පහානාය සංවත්තන්ති" උද්ධච්ච කුක්කුච්ච ප්‍රහාණය පිණිස ධර්ම සයක් ඇත. මේ ධර්ම හයෙන් ප්‍රහීන වූ උද්ධච කුක්කුච්චයෙහි උද්ධච්චය රහත් මගින් ද කුක්කුච්චය අනාගාමී මගින්ද නිරවශේෂයෙන් ප්‍රහීන වේ යයි දැනගනී.

විචිකිච්ඡාව ඇතිවන ස්ථානවල නුනුවණින් මෙනෙහි කිරීමෙන් විචිකිච්ඡාව උපදී. විචිකිච්ඡාව ඇතිවන ස්ථාන නම් නැවත නැවත විචිකිච්ඡාවට හේතු වූ සැකයම වේ. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලව පවත්වන්නේ විචිකිච්ඡාව උපදී. එයින් කීහ. "මහණෙනි විචිකිච්ඡාව ඇතිවන දහම් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලවන්නේ නූපන් විචිකිච්ඡාව ඉපදීම පිණිස උපන් විචිකිච්ඡාව බොහෝ බවට මහත් බවට මෙයම හේතුවේ. කුසලාදි ධර්මවල නුවණින් මෙනෙහි කිරීමෙන් මෙය ප්‍රහාණය වේ. එයින් කීහ. මහණෙනි. කුසලා අකුසල ධම්ම සාවජ්ජ අනවජ්ජ ධම්ම සෙවිතබ්බ අසෙවිතබ්බ ධම්ම හීනපණීත ධම්ම කණ්හ සුක්ක සප්පටිභාග ධම්ම ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් විචිකිච්ඡාව නූපදීම පිණිස උපන් විචිකිච්ඡාව ප්‍රහාණය පිණිස ඒවාම හේතු වේ. තවද විචිකිච්ඡාව ප්‍රහාණය පිණිස කරුණු හයක් පවතී. බහුශ්‍රුතබව, විමසනබව, විනයෙහි දැනුම, සජීරබව, කලණ මිතුරන් ඇති බව, සප්පාය කථා යන මේවාය. බහුශ්‍රුතයා විසින් එකක් හෝ.... පහක් හෝ නිකායන් පෙල වශයෙන් ද අර්ථ වශයෙන් ද ඉගෙණ ගන්නාට විචිකිච්ඡාව ප්‍රහීන වේ. තුණුරුවන් අරබයා ප්‍රශ්න ඇසීම්, විනයෙහි පුරුදු පුහුණුව, තුනුරුවන් කෙරෙහි ඔකප්පනිය ශ්‍රද්ධා සංඛ්‍යාත අචලබව, ශ්‍රද්ධාවෙන් යුත් වක්කලි තෙරුන් සමාන කලණ මිතුරන් සේවනය කරන්නාට ද විචිකිච්ඡාව ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වල තෙරුවන්

Scanned with CamScanner

ගුණ නිසසිත සපපාය කථාවෙන් ද ප්‍රහීන වේ. එහෙයින් කියන ලදී: ෂ ධමමා විචිකිචඡා පහානාය සංවතතනත, මේ ධර්ම සයෙන් ප්‍රහීන වූ විචිකිච්ඡාව සෝවාන් මාර්ගයෙන් ඉදිරියේ නො ඉපදීම වේ යයි දැනගනී. **ඉති අජඣතතං වා** - මෙසේ පංච නීවරණ පරීක්ෂා කරන්නා විසින් තමාගේ ධර්මවල අනුන්ගේ ධර්මවල කලෙක තමාගේ කලෙක අනුන්ගේ ධර්මවල ධර්ම අනුව බලමින් වාසය කරයි. මෙහි සමුදය වය සුභ නිමිත්ත අසුභ නිමිත්ත ආදියෙහි අයෝනිසො මනසිකාර යෝනිසො මනසිකාර වශයෙන් කියන ලද නයින් පංච නීවරණ බැහැර කළ යුතුය. හුදෙක් මෙහි නීවරණ පරීක්ෂා කරන සිහිය දුකඛ සත්‍යය මෙසේ යොදාගෙන නීවරණ පරීක්ෂා කරන භික්ෂුවගේ නිවන් මග දත යුතුය.

## නීවරණ කොටස නිමි.

මෙසේ පංච නීවරණ වශයෙන් ධමමානුපසසනාව බෙදා දැන් පංචසකනධ වශයෙන් බෙදීමට ''පුනචපරං'' යනාදිය කීහ. **පංචසුපාදානකඛනෙධසු** - උපාදානයාගේ ඛනධ - උපාදානකඛනධා. උපාදානයට හේතු වූ. **ධමම පුංජය** - ධමමරාශිය යන අර්ථයයි. මෙහි මෙය සංක්ෂේපයයි. විස්තර වශයෙන් වනාහි ස්කනධ කථා විසුදධිමගගයෙහි කියන ලදී. **ඉති රූපං** - මේ රූපය, මෙපමණ රූප. මෙයින් පසු රූප නැතැයි සවභාව වශයෙන් රූප දැනගනී. වේදනාදියෙහි ද මෙම නයමයි. මෙහි මෙය සංක්ෂේපයයි. රූපාදිය විස්තර වශයෙන් වනාහි විසුද්ධි මගගයෙහි ඛනධ කථාවෙහි කියන ලදී. **ඉතිරූපසස සමුදයො** - මෙසේ අවිද්‍යා සමුදයාදි වශයෙන් පස් ආකාරයකින් රූපයේ හට ගැනීම වේ. **ඉති රූපසස අතථංගමො** - මෙසේ අවිද්‍යා නිරොධාදි වශයෙන් පස් ආකාරයකින් රූපයේ අසතගමය (නැතිවීම) වේ. වේදනාදියෙහි ද මෙම නයමය. මෙහි මෙය සංක්ෂෙපයයි. විස්තර විසුදධිමගගයෙහි උදයබබය ඤාණ කථාවේ කියන ලදී. **ඉති අජඣතතං වා** - මෙසේ පංචස්කනධය පරීක්ෂා කිරීමෙන් තමාගේ ධර්මවල අනුන්ගේ ධර්මවල කලෙක තමාගේ කලෙක අනුන්ගේ ධර්මවල ධර්මානුපසසීව වාසය කරයි. මෙහි සමුදය වය අවිජ්ජා සමුදයො රූප සමුදයො යනාදීන්ගේ පංච ස්කනධවල කියන ලද ලක්ෂණ පනහක් වශයෙන් බැහැර කළ යුතුය. මෙයින් පසු කියන ලද පිලිවෙළමය. හුදෙක් මෙහි ස්කනධ

Scanned with CamScanner

පිරික්සීම ඇති කල්හි දුක්ඛ සත්‍යයයි. මෙසේ යොදා ගෙන ස්කන්ධ පිරික්සන භික්ෂුවගේ නිවන් මග දත යුතුය. සෙස්ස එසේමය.

**ඛන්ධ නිමි.**

මෙසේ පංචස්කන්ධ වශයෙන් ධම්මානුපස්සනාව බෙදා දූන් ආයතන වශයෙන් බෙදීමට ''පුනච පරං'' යනාදිය කීහ. එහි ඡසු **අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු** චක්ඛු සොත ඝාන ජිව්හා කාය මන මේ අජ්ඣත්තික හයෙහි ද රූප සද්ද ගන්ධ රස පොට්ඨබ්බ ධම්ම මේ බාහිර හයෙහිද ඇස ද දනී යන චක්ඛුප්පසාදය ඉඩ ලැබෙන පරිදි ස්ව ලක්ෂණ වශයෙන් දූනගනී. **රූපෙ ච පජානාති** - බාහිර චතු සමුට්ඨානික (පඨවි ආදි සතරින් හටගත්) රූපයෙහි ද යථාවසර සව ලක්ෂණ වශයෙන් දූනගනී. **යංච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං** - ඇස ද රූපය ද යන දෙක නිසා කාමරාග සංයෝජන පටිඝ-මාන-දිට්ඨි-විචිකිච්ඡා -සීලබ්බත පරාමාස-භවරාග-ඉස්සා-මච්ඡරිය-අවිජ්ජා සංයෝජන යයි දස ආකාර සංයෝජන උපදී. එය ද යථාවසර සව ලක්ෂණ වශයෙන් දූනගනී. මේවා උපදින්නේ කෙසේද? පළමුව චක්ඛුද්වාරයෙහි ආපාථගත ඉෂ්ඨ අරමුණ කාමාශ්වාද වශයෙන් ආශ්වාදනය කිරීමෙන් සතුටුවීමෙන් කාමරාග සංයෝජනය උපදී. අනිට්ඨාරම්මණයෙහි කිපීමෙන් පටිඝ සංයෝජනය උපදී. මා හැර මේ අරමුණ විභාවනය කිරීමට සමර්ථයෙක් ඇද්දැයි හඟින්නාට මාන සංයෝජනය උපදී. මේ රූපාරම්මණය සත්වයෙක් ද සත්වයෙකුගේද්දැයි සැක කරන්නාට විචිකිච්ඡා සංයෝජනය උපදී. දූන් භවයෙහි මෙය ඉපදීමට සුලභ නොවේ යයි භවය ප්‍රාර්ථනා කරන්නාට භවරාගය උපදී. අනාගතයේ ද මේ රූපය සීලබ්බතය සමාදන් වී ලැබීමට හැකියයි සීලබ්බතය සමාදන් වන්නාට සීලබ්බත පරාමාස සංයෝජනය උපදී. අහෝ ඒ රූපය උපදී. තමා ලද රූපාරම්මණය අනිකකුට සඟවන්නේ මච්ඡරිය සංයෝජනය උපදී. සියලුම උපදින්නන් සමග නොදූනීම් වශයෙන් අවිජ්ජා සංයෝජනය උපදී. **යථා ච අනුප්පන්නස්සා** - යම් කරුණකින් නො හැසිරීම් වශයෙන් නූපන්නා වූ දසාකර වූ සංයෝජන උපදී යන ඒ කරුණ ද දූනගනී. **යථා ච උප්පන්නස්ස** - අප්‍රහීන අර්ථයෙන් හැසිරීම් වශයෙන් හෝ උපන්නා වූ ඒ දසවිධ වූ සංයෝජන උපදින්නේ වේ යයි ඒ කරුණ ද දූනගනී. තදංග වික්ඛම්භන ප්‍රහාන වශයෙන් ප්‍රහීන වූ ඒ දසවිධ සංයෝජන යම් කරුණකින් ඉදිරියේ

Scanned with CamScanner

නුපදීමක් වේද ඒ කරුණ ද දනගනී. කුමන කරුණකින් මෙය අනාගතයේ නුපදීද? දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස ඉසසා මච්ඡරිය භේදයේ පළමුව පංච විධ වූ සංයෝජන සෝවාන් මාර්ගයෙන් ආයතිකයෙහි අනුප්පාද වේ. කාමරාග පටිඝ සංයෝජන දෙකේ ඕලාරික බව සකදාගාමී මාර්ගයෙන්. අනුසස සහගත වූ අනාගාමී මාර්ගයෙන්. මාන භවරාග අවිජ්ජා සංයෝජන තුන අරහත් මාර්ගයෙන් ආයති අනුප්පාද වේ. **සොතං ච පජානාති** සදෙඩ - ආදියෙහි ද මේ නයමය. තවද එහි ආයතන කථා විස්තර වශයෙන් විසුද්ධිමග්ගයෙහි ආයතන නිදෙදසයේ කියන ලද නයින්ම දතයුතුය. **ඉති අජ්ඣත්තං වා** - මෙසේ අජ්ඣත්ත ආයතන පරීක්ෂා කිරීමෙන් තමාගේ ධර්මවල බාහිර ආයතන පිරික්සීමෙන් අනුන්ගේ ධර්මවල කලක තමාගේ හා කලෙක අනුන්ගේ ධර්මවල ධම්මානුපස්සීව වාසය කරයි. මෙහි සමුදය වය වනාහි ''අවිජ්ජා සමුදයෙන් චක්ඛු සමුදය'' යයි රූපායතනයේ රූපස්කන්ධයෙහි ද අරූපායතනවල මනායතනයෙහි විඤ්ඤාණ ස්කන්ධයේ ධර්මායතනයේ සෙසු ස්කන්ධවල කියන ලද නයින් පවත්වා ගත යුතුය. මෙයින් පසු කියන ලද පිළිවෙළමය. හුදෙක් මෙහි ආයතන පිරික්සන්නාවූ භික්ෂුව ගේ නිවන් මග දත යුතුය.

ආයතන නිමි.

මෙසේ අධ්‍යාත්මික බාහිර ආයතන වශයෙන් ධම්මානු පස්සනාව සයකට බෙදා දූන් බොජ්ඣඞ්ග වශයෙන් බෙදීමට ''පුන ච පරං'' යනාදිය කීහ. එහි **බොජ්ඣංගෙසු** - අවබෝධ කරන සත්වයාගේ අංගවල. **සන්තං** - අවබෝධ ලැබීම් වශයෙන් පවතින. **සතිසම්බොජ්ඣංගං** - සිහිය නැමති සම්බෝධි අංගය. මෙහි ආරම්භ කරන ලද විදර්ශකයාගේ සිට යෝගාවචරයා දක්වා අවබෝධය. හේ යම් සති ආදියෙන් සත් දහම් සමගියෙන් අවබෝධ කරයි. කෙලෙස් නින්දෙන් නැගිටියි. සත්‍ය විනිවිද දකියි. ඒ ධර්ම සාමග්ගිය අවබෝධය වේ. ඒ සම්බෝධයට හෝ ඒ සම්බෝධියේ හෝ අංග යයි සම්බොජ්ඣංග වේ. එයින් කියන ලදී. " සති සංඛ්‍යාතං සම්බොජ්ඣංගං" සති සංඛ්‍යාත වූ සම්බොජ්ඣංගය සෙසු සම්බොජ්ඣංගවල ද මේ නයින් වචනාර්ථය දත යුතුය. **අසන්තං** - නොලැබීම් වශයෙන් අවිද්‍යාමාන. **යථා ච අනුප්පන්නස්ස** - යනාදියෙහි වනාහි සති සම්බොජ්ඣංගයේ පළමුව, මහණෙනි සති සම්බොජ්ඣගයට අයත් දහම් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බොහෝ ආකාර වූයේ,

Scanned with CamScanner

නූපන් සති සම්බෝජ්ඣංගයේ ඉපදීම සඳහා උපන් සතිසම්බොජ්ඣංගයේ බොහෝ බව පිණිස මහත් වූ භාවනාවේ සම්පූර්ණවීම පිණිස පවතී. මෙසේ ඉපදීම වේ. එහි සිහියම සති සම්බොජ්ඣංග ඨානීය දහම් වේ. නුවණින් මෙනෙහි කිරීම කියන ලද ලක්‍ෂණම වේ. එය එහි බහුලව පැවැත්වීමෙන් සති සම්බොජ්ඣංගය උපදී. තවද දහම් සතරෙක් සති සම්බොජ්ඣංග යේ ඉපදීම පිණිස පවතී. විමසන සිහි නුවණ, මුළාසිහි ඇති පුඟුලන් දුරු කිරීම, එළඹ සිටි සිහි ඇති පුඟුලන් සේවනය, එහි අධික ලෙස යෙදුණ බව ප්‍රිය මනාප සතුන් අතරෙහි සිහි නුවණින් ආහාර අත්හරින කවුඩන් සේ සිහිමුළා පුඟුලන් දුරු කිරීමෙන් තිස්ස තෙරුන් අභය තෙරුන් වැනි එළඹ සිටි සිහි ඇති පුඟුලන් සේවනය, කිරීමෙන් සිටින හිඳින තැන්වල සිහිය පිහිටුවීම සඳහා ගැඹුරින් නැමුණු සිත් ඇති බැවින් සති සම්බෝජ්ඣංගය උපදී මෙසේ සතර කරුණින් උපන් එය රහත් මාර්ගයෙන් භාවනාව සම්පූර්ණ වේ යයි දැනගනී.

ධම්මවිචය සම්බොජ්ඣංගය වනාහි "මහණෙනි, කුසලාකුසල දහම් ඇත.... කළු සුදු සප්පටිභාග දහම්. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ, නූපන් ධම්මවිචය සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස උපන් ධම්මවිචය සම්බොජ්ඣංගයේ බොහෝ බව මහත් බව පිණිස භාවනාව සම්පූර්ණ වීම පිණිස පවතී. මෙසේ ඉපදීම වේ. තවද කරුණු සතක් ධම්මවිචය සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී. විමසනබව, වසතු විසද ක්‍රියා, ඉන්ද්‍රිය සමතත ප්‍රතිපාදනය, අනුවණ පුඟුලන් දුරු කිරීම, නුවණැති පුඟුලන් සේවනය කිරීම, ගැඹුරු නුවණැති හැසිරීම් ප්‍රත්‍යවේක්‍ෂා කිරීම, එහි දැඩි ලෙස යෙදීම ඒ කරුණු සතයි. එහි පරිපුච්ඡනතා යනු ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය බල බොජ්ඣංග මාර්ගාංග ධ්‍යාන සමථ විපසසනාවල අර්ථ ඇසුරු කළ විමසීම් බහුල බව. වස්තු විසද ක්‍රියා නම් අජ්ඣත්ත බාහිර වසතුවල පැහැදිලි කිරීම. ඔහුගේ කෙස් ලොම් නිය අතිදීර්ඝ වේ නම් ශරීරයේ හෝ උත්සන්න දෝෂ වේ නම් දහඩිය කුණු වැකී ඇත්නම් එවිට අජ්ඣත්තික වසතු අවිසද වේ. අපිරිසිදු වේ. සිවුර කිලිටි දුගඳ වේ නම් සෙනසුන හෝ කුණු කසලින් යුත් නම් එවිට බාහිර වසතු අපිරිසිදු වේ. එහෙයින් කේසාදිය කැපීමෙන් උඩ විරේචන අධෝ විරේචන ආදියෙන් සරීරය සැහැල්ලු කිරීමෙන් ඇඟ ඉලීම් ස්නානය කිරීමෙන් ද අජ්ඣත්තික වසතු පැහැදිලි කරගත යුතුය. මැසීම් සේදීම් වර්ණ ගැන්වීම් පිරිබඩ ගැනීම් ආදියෙන් බාහිර වසතු පිරිසිදු කරගතයුතුය. මේ අජ්ඣත්තික බාහිර වසතුවල අපිරිසිදුව

Scanned with CamScanner

අපැහැදිලිව පවතින විට චිත්ත චෛතසිකවල ඥාණය ද අපිරිසිදු වේ. අපිරිසිදු පහනවැටිය තෙල්නිසා පහන් දැල්ලේ එළිය මෙන් වේ. අජ්ඣත්තික බාහිර වස්තු විසද වූ විට චිත්ත චෛතසික ඥාණය ද විසද වේ. පිරිසිදු පහන වැටිය තෙල් නිසා උපදින පහන් දැල්ලේ එළිය මෙන් වේ. එහෙයින් කියන ලදී ''වස්තු විසද ක්‍රියා ධම්මවිචය සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී''. ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා නම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රිවල සමභාවයට පැමිණවීමයි. ඉදින් සද්ධා ඉන්ද්‍රිය බලවත් වේ නම් ඉතිරි ඒවා මඳ වේ නම් විරිය ඉන්ද්‍රියෙන් උනන්දු කරවීම සති ඉන්ද්‍රියෙන් එළඹි සිහිය ඇති කිරීම සමාධි ඉන්ද්‍රියෙන් එකග්ගතා ඇති කිරීම ප්‍රඥා ඉන්ද්‍රියෙන් දැකීම් කෘත්‍ය කිරීම යන මේවා නොහැකි වේ. එහෙයින් ඒ දහම් සවභාවය ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමෙන් හෝ යථාපරිදි මෙනෙහි කිරීමෙන් හෝ බලවත් වේ නම් මෙනෙහි නොකිරීමෙන් අඩුකළ යුතුය. වක්කලී තෙර වත මෙහි නිදර්ශනයයි. ඉදින් විරිය ඉන්ද්‍රියබලවත් වේ නම් එවිට සද්ධා ඉන්ද්‍රියට එකඟ කර ගැනීම් කළ නොහැක. ඉතිරි ඉන්ද්‍රියන්ට ද තමා අයත් කාර්ය කළ හැකි නොවේ. එහෙයින් පස්සද්ධි ආදි භාවනාවෙන් අඩු කළ යුතුය. එහිද සෝණ තෙරුන්ගේ වත දැක්විය යුතුය. මෙසේ සෙස්සෙහි ද එකක් බලවත් වූ කල ඉතිරි ඒවාට තමාගේ කෘත්‍යවල අසමත්බව දත යුතුය. මෙහි විශේෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥාවලද ශ්‍රද්ධා විරියවල ද සමතාව ප්‍රශංසා කරති. බලවත් සද්ධා සහ මන්‍ද පඤ්ඤාව වේ නම් මුදුනින් පැහැදුනේ වේ. අවස්තුවල ද පහදී. ප්‍රඥාව බලවත්ව සද්ධා මඳවූයේ නම් කෛරාටික වේ. බෙහෙතින් නැගිය යුතු රෝගය මෙන් බෙහෙත් කළ හැකි නොවේ. චිත්තුප්පාද මාත්‍රයෙන් කුසල් වේ යයි අතිධාවනය කර දානාදිය නොකරන්නේ නිරයේ උපදී. දෙකේම සමතාව නියම වස්තුවල පහදී. සමාධිය බලවත්ව විරිය මඳවූවහොත් සමාධියේ කුසීත පක්‍ෂයට බරවේ. වීර්ය බලවත්ව සමාධිය මඳවූවහොත් වීර්ය උද්ධච්ච පක්‍ෂයව නැඹුරු වේ. සමාධිය වීර්යයෙන් සංයෝජනය වූ විට කුසීතබව පතිතවීමට ඉඩ නැත. වීර්ය සමාධියෙන් යෙදුණු විට උද්ධච්චය නොවැටේ. එනිසා ඒ දෙක සමාන කළ යුතුය. උභය සමතාවෙන් අර්පණ වේ. තවද සමාධි කම්මිකයාගේ ඒකග්ගතාව බලවත් වීම වටී. මෙසේ හේ අප්පනාවට පැමිණේ. විප්පස්සනා කම්මිකයාගේ පඤ්ඤාව බලවත්වීම වටී. මෙසේ ඔහු ලක්‍ෂණ ප්‍රතිවේධයට පැමිණේ. දෙකේ සමතාවෙන් අප්පනා වේ. මෙසේ සිහිය සැමතැනම බලවත්වීම වටී. සතිය සිහිය සිතේ උද්ධච්ච පක්‍ෂය සද්ධා විරිය පඤ්ඤා වශයෙන් උද්ධච්චය වැටීමෙන් ද කුසීත පක්‍ෂයෙන් සමාධිය කුසීත බව වැටීමෙන්

රකී. එනිසා එය (සිහිය) සියළු ව්‍යාඤ්ජනවල ලුනු මෙන්ද සියළු රාජ්‍ය කෘත්‍යවල සබ්බකම්මික ඇමතියා මෙන් ද සියළු තැනම කැමති විය යුතුය. එයින් කීහ: සිහිය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සැමතැනම කියන ලදී. කරුණු කීමෙන් සිත සිහිය පිළිසරණ කොට ඇත. ආරක්‍ෂාව පිහිටියේ වේ. සිහිය නොමැතිව සිතේ පහාන නිග්ගහ කෘත්‍ය නොවේ. අනුවණ පුඟුලන් දුරුකිරීම යනු ස්කන්ධාදි භේදවල බැස නොගත් නුවණ නැති පුද්ගලයන් දුරින්ම දුරුකළ යුතුය. නුවණැතියන් සේවනය නම් සම පනස් ලක්‍ෂණ පිරික්සන උදයබ්බය නුවණින් යුක්ත පුද්ගලයින් ඇසුරු කිරීම. ගම්භීර ඤාණ චරිය පච්චවෙක්ඛණා නම් ගැඹුරු ස්කන්ධාදියෙහි පවත්වන ගැඹුරු ප්‍රඥාවේ ප්‍රභේද ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම. තදධිමුත්තතා නම් සිටින හිඳින තැන්වල ධම්මවිචය සම්බෝජ්ඣංගය නගාසිටුවීම සඳහා නැඹුරු වූ සිත් ඇති බව, මෙසේ උපන් මෙය රහත් මග නුවණින් භාවනාව සම්පූර්ණ වේ යයි දනගනී. විරිය බොජ්ඣංගයේ, මහණෙනි, ආරම්භයද, නික්කම ධාතු, පරක්කම ධාතු ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ නූපන් විරිය සම්බෝජ්ඣංගයේ ඉපදීම පිණිස, උපන් වීර්ය සම්බොජ්ඣංගයේ බොහෝ බව මහත් බව පිණිස භාවනාව සම්පූර්ණවීම සඳහා පවතී. මෙසේ ඉපදීම වේ. තවද දහම් (කරුණු) එකොලොසක් විරිය සම්බොජ්ඣගයේ ඉපදීම පිණිස පවතී. අපායභය පච්චවෙක්ඛනතා ආනිසංස දස්සාවිතා, ගමනවීථි පච්චවෙක්ඛනතා. පිණ්ඩපාත පචායනතා, දායජ්ජ මහත්ත පච්චවෙක්ඛනතා. ජාතිමහත්ත පච්චවෙක්ඛනතා. සත්ථු මහත්ත පච්චවෙක්ඛනතා, සබ්‍රහමචාරිමහත්ත පච්චවෙක්ඛනතා අරූප විරිය පුග්ගල සේවනතා තදධිමුත්තතානි යන එකොළොසයි.

එහි නිරයෙහි පස් ආකාර වධ බන්ධන කරන කාලයේ පටන් මහ දුක් අනුභව කරන කාලයෙහි ද තිරිසන් යෝනියෙහි දැල්වල කෙමන්වල ගන්නාලද කාලයෙහි ද කෙවිට් කටු සැමිට් ආදියෙන් පහරින් නැමුණු ශරීර ඇතිව කරත්ත ආදිය උසුලන කල්හිද ප්‍රේත විෂයෙහි නොයෙක් වර්ෂ දහස් ගණන් ඒක බුද්ධාන්තරයක් ද සා පිපාසාවෙන් පෙළෙන කාලයෙහි ද කාලකඤ්ජන අසුර විෂයෙහි හැට රියන් අසූරියන් ප්‍රමාණ ඇටසම් පමණක් ඇති ආත්මභාවයෙන් ප්‍රපාතවලට වැටෙමින් දුක් අනුභව කරන කාලයෙහි ද වීර්ය සම්බොජ්ඣංගය ඉපදවීමට නොහැකිය. ඒ භික්‍ෂූහු වීර්ය කරනකාලය මෙයම වේ. මෙසේ අපාය භය අනුව වීර්ය කරනු ලැබේ. ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට ද වීර්ය සම්බොජ්ඣංගය උපදී.

කුසීතකමින් නවලොවුතුරා සදහම් ලැබීමට නොහැකිවේ. පටන්ගන්නා ලද වීර්යයෙන්ම හැකි වේ. වීර්යයේ මේ ආනිශංස යයි මෙසේ ආනිශංස දකින්නාට ද විරිය සම්බෝජ්ඣංගය උපදී. සර්වඥ බුදුධ පච්චෙක බුද්ධ මහා සාවකයන් විසින් ම ගන්නා ලද මාර්ගයේ යා යුතු හේ ද කම්මැලිකමින් යෑමට නොහැකි වේ. මෙසේ ගමන් මාර්ගය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාටද උපදී. යමෙක් ඒ පිණ්ඩපාතාදියෙහි උපස්ථාන කරන්නේ ද ඒ මේ මනුෂයෝ නෑයෝ නොවෙති. දාස කම්කරුවෝ නොවෙති. ඔහු නිසා ජීවත්වන්නෝ ද නොවෙති. ඔව්හු ප්‍රණීත වූ සිව්රු ආදිය දෙති. ඉක්බිති තමාගේ ක්‍රියාවල මහත්පල බලාපොරොත්තු වන්නේ දෙති. ශාස්තෘන් වහන්සේලා ද මේ ප්‍රත්‍යය වළඳා කාය දෑවිලි බහුලව සැපසේ වාසය කරන්නේ යයි මෙසේ බලමින් ඔබට ප්‍රත්‍ය අනුමත කෙළේ නැත. ඉක්බිති හේ මෙය වළඳන්නේ මහණදම් කොට සසරින් මිදෙන්නේ යයි උන්වහන්සේලා ඔබට ප්‍රත්‍යය අනුදූන වදාළහ. එහෙයින් ඔබ දූන් කුසීතව වාසය කරන්නේ පිණ්ඩපාතය ගුරුවන්නේය. මෙසේ පිණ්ඩපාත ගරු කිරීම ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාටද උපදී. ආර්යමිත්‍ර තෙරුන් මෙනි. තෙරුන් වහන්සේ වනාහි කස්සක නම් ලෙනේ වාසය කරයි. උන්වහන්සේගේ නොදුරු ගමෙහි එක්තරා මහා උපාසිකාවක් තෙරුන් වහන්සේ පුතකු කොට පෝෂණය කරයි. ඕ තොමෝ එක් දිනක් වනයට යන්නී, දුවට කීවාය. දුවේ, අසවල් තැන පැරණි සහල්, අහවල් දෙයෙහි කිරි, අසවල් භාජනයෙහි ගිතෙල් අසවල් භාජනයෙහි පැණි. ඔබේ සහෝදර ආර්ය මිත්‍ර තෙරුන් පැමිණි කල බත් උයා කිරි ගිතෙල් පැණි සමග දෙන්න. ඔබ ද අනුභව කරන්න. මම ඊයේ පිරිවෙස් බතක් කැඳ සමග අනුභව කෙළෙමි. අම්ම දවල්ට මොනවද අනුභව කරන්නේ? පලා කොල දමා හුණු සාලින් ඇඹුල් කැඳක් පිස තබන්න දුවේ. තෙරුන් වහන්සේ සිවුරු පොරවා පාත්‍රය බැහැර කරන්නේ ම ඒ ශබ්දය අසා තමාට අවවාද දුන්නේය. මහා උපාසිකාව වනාහි කැඳ සමඟ පිරිවෙස් බත අනුභව කළාය. දවාලට ද කොළ ඇඹුල් කැඳක් අනුභව කරන්නීය. ඔබ සඳහා වනාහි පරණ සහල්වලින් ආදිය කියයි. එය සඳහා ඕ තොමෝ කුඹුරක් වස්තුවත් බත් වස්ත්‍ර බලාපොරොත්තු නොවේ. තිවිධ සම්පත් ප්‍රාර්ථනා කරමින් දෙයි. ඔබ ඇගේ ඒ සම්පත් දීමට හැකිවන්නෙහි ද නොහැකි වන්නෙහි ද? මේ පිණ්ඩපාතය ඔබ විසින් රාග සහිතව දෝස සහිතව මෝහ සහිතව ගැනීමට නොහැකිය. පාත්‍රය පසුම්බියෙහි බහා ගැටමුදා නැවතී කස්සක ලෙනටම ගොස් පාත්‍රය ඇඳයට තබා සිවුර වැලෙහි තබා රහත් බවට නොපැමිණ

නොනික්මෙන්නෙමි'යි වීර්ය අධිෂ්ඨාන කොට හිඳගන්නේය. බොහෝ කලක් අප්‍රමාදව වාසය කළ භික්ෂුව විදර්ශනා වඩා පෙරබත් වේලාවේම රහත් බවට පැමිණ නෙළුම් මලක් පිපෙන්නාක් මෙන් මහා ක්ෂීණාශ්‍රව මඳ සිනා ඇත්තේ හුන්නේය. ලෙන දොර රුකෙහි වසන දේවතාවා:

**සෙට පුරිස ඔබහට - මගෙ මෙම වැඳුම වේවා**
**කෙලෙස් ඔබෙ හීනය - පිංවත දක්ඛිණෙය්‍ය වේ**

උදානය උදන් අනා සවාමීණි, පිඬු හැසිරෙන ඔබවහන්සේ වැනි රහතන් වහන්සේට භික්ෂාව පූජාකර මහළු කාන්තාව, දුකින් මිදෙන්නේ යයි කීය. තෙරුන් වහන්සේ නැගී සිට දොර ඇර වෙලාව බලන්නේ කල් ඇතැයි දැන පා සිවුරු ගෙන ගමට වැඩියේය. දූරිය ද බත් පිළියෙල කර දූන් මගේ සහෝදරයා එන්නේය. දූන් මගේ සහෝදරයා එන්නේ යයි දොර දෙස බලමින් උන්නාය. තෙරුන් දොරකඩට පැමිණි විට ඕ තොමෝ පාත්‍රය ගෙන ගිතෙල් පැණී යෙදූ කිරි පිණ්ඩපාතයෙන් පාත්‍රය පුරවා අතේ තැබීය. තෙරුන් වහන්සේ සුවපත් වේවායි අනුමෝදනා කොට වැඩියේය. ඕ තොමෝ ද උන්වහන්සේ බලමින් සිටියාය. එවිට තෙරුන් වහනසේ ගේ අතිශයින් පිරිසිදු සිවි වර්ණය ඇතිවිය. ඉන්ද්‍රිය ඉතා ප්‍රසන්නය. මුහුණු මිදුණු තල්ගෙඩියක් මෙන් අතිශයින් බැබළුණේය. මහා උපාසිකාව ආරණ්‍යයෙන් පැමිණ, දූවේ ඔබේ සහෝදරයා ආවේදූයි ඇසුවාය. ඕ තොමෝ ඒ සියළු පවත් දූන්වූවාය. උපාසිකාව මගේ පුතාට පැවිදි කිස මස්තකප්‍රාප්ත යයි දැන සතුටු වන්නී, දූවේ ඔබේ සොයුරා බුදුසසුනේ නොකලකිරේ යයි කීවාය.

මේ ශාස්තෘ දායාදය ඉතා මහත් වේ. යම් මේ සප්ත ආර්ය ධනය කුසීතකමින් ගත නොහැකිය. යම් සේ නොමගට ගිය පුතා මව්පියෝ අපේ පුතකු නොවේ යයි බැහැර කරති. හේ ඔවුන්ගේ ඇවෑමෙන් දායාදය නො ලබයි. එසේම කුසීතයා ද මේ ආර්යධන දායාදය නොලබයි. පටන්ගත් වීර්ය ඇත්තාම ලබන්නේ යයි දායාජ්ජ මහත් බව ප්‍රත්‍යවෙක්ෂා කරන්නාට උපදී. මහත් වූ ඒ ශාස්තෘන් වහන්සේ මව්කුස පිළිසිඳගන්නා කාලයෙහි ද අභිනිෂ්ක්‍රමණයෙහි ද අභිසම්බෝධියෙහ ද දම්සක් පවත්වන යමාමහ පෙළහර, දේවාරෝහනය, ආයු සංස්කාරය හැරීමෙහි ද පිරිනිවන්පාන කාලයෙහි කුසීත වීමට යුතු වේදූයි මෙසේ ශාස්තෘ මහත්වය මෙනෙහි කරන්නාට ද උපදී. ඔබ දූන් ජාතියෙන් ද ලාමක

නොවේ. අසම්භින්නාතාවෙන් මහා සම්මත ප්‍රවේණියෙන් පැමිණි ඔක්කාක රාජවංශයෙහි ඉපදුණු සුදොවුන් මහරජුන්ගේ සහ මහාමායා දේවියගේ ද මුණුබුරෙකි. රාහුල භද්‍රයන්ගේ බාල සහෝදරයාය වූ මෙබඳු ජින පුත්‍රයකු වූ ඔබ විසින් කුසීතව විසීම යුතු නොවේ යයි මෙසේ ජාති මහත්වය මෙනෙහි කරන්නාට ද උපදී. සාරිපුත්තමොග්ගල්ලාන රහතන් වහන්සේලා ද අසූමහ ශ්‍රාවකයෝ ද වීර්යයෙන්ම ලෝකෝත්තර ධර්මය අවබෝධ කළහ. ඔබ මේ සබ්‍රහමචාරීන්ගේ මග පිළිපදින්නෙහිද නොපිළිපදින්නෙහිද. මෙසේ සබ්‍රහමචාරි මහත්වය මෙනෙහි කරන්නාට ද උපදී. කුස පුරා ආහාර ගෙන පිඹුරකු සේ සිටි අත්හරින ලද කායික චෛතසික වීර්ය ඇති කුසීත පුද්ගලයන් දුරු කරන්නාට ද අරඹන ලද වීර්ය ඇති පුද්ගලයන් ඇසුරු කරන්නාට ද සිටින හිඳින තැන්වල වීර්ය ඉපදවීම නැඹුරු වූ සිත් ඇත්තාට ද වීර්ය සම්බොජඣංගය උපදී. මෙසේ උපන් විරිය බොජ්ඣංගය අර්හත් මාර්ග භාවනාවෙන් සම්පූර්ණ වේ යයි දැන ගනී.

පීති සම්බොජඣංගයේ "මහණෙනි, පීති සම්බොජඣංගයට ආධාරවන දහම් ඇත. එහි යොනිසෝ මනසිකාරය බහුලාකාර වූයේ, නූපන් පීති සමබොජඣංගයේ ඉපදීම පිණිස උපන් පීති සම්බෝජඣංගයේ බොහෝ බව විපුලබව භාවනාව සම්පූර්ණවීම සඳහා ඒවාට හේතුවේ. (අයමාහාරො) මෙසේ ඉපදීම වේ. එහි පීතියම පීති වේ. සම්බෝජඣංගට්ඨානියා ධම්ම නම් එහි ඉපදවීම් මෙනෙහි කිරීම නුවණින් මෙනෙහි කිරීම නම් වේ. තව ද කරුණු එකොළොසක් (එකාදස ධම්මා) පීති සම්බොජඣංගයේ ඉපදීම පිණිස පවතී. බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති. දෙවානුස්සති, උපසමානුස්සති, ලූඛපුග්ගල පරිවජ්ජනතා සිනිද්ධ පුග්ගලසෙවනතා, පසාදනිය සුත්තන්ත පච්චවෙක්ඛනතා, තදධිමුත්තතා යනුවෙනි.

බුදුගුණ සිහිකරන්නාට ද උපචාර දක්වා මුළු සිරුරෙහි පැතිරෙමින් පීති සම්බෝජඣංගය උපදී. ධම්ම සංඝ ගුණ සිහිකරන්නාට ද දීර්ඝ කාලයක් අඛණ්ඩ කොට රක්නා ලද සිව්පිරිසිදු සිල් මෙනෙහි කරන්නාට ද ගිහියෙකුට දස සීලය පන්සිල් ප්‍රතිවෙක්ෂා කරන්නාටද දුබික් බිය ආදියෙහි ප්‍රණීත භෝජන සබ්‍රහමචාරීන්ට දී මෙවැන්නක් දුන්නෙමියි ත්‍යාගය ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ද යම් ගුණයකින් යුක්තව දේවත්වයට පත් වූවෝ එබඳු වූ ගුණ තමා කෙරෙහි ඇතැයි ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ද

සමාපත්තියෙන් විෂ්කම්භණය කළ කෙලෙස් හැට හැත්තෑවසක් නොහැසිරේ යයි ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ද සෑ බෝධි තෙරුවන් දකීමෙහි සකසා නොකළ කිරියාවෙන් රැස්කරන ලද රළුබවෙහි බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාද සෙනග නොමැති බැවින් කොටළු පිටෙහි රජු සේ රළු පුගලන් දුරු කරන්නාටද බුද්ධාදීන් කෙරෙහි පැහැදීම් බහුල වූ මෘදු සිත් ඇති සිනිඳු පුඟුලන් සෙව්නා හට ද සිටින හිඳින තැන්වල පීතිය ඉපදවීම සඳහා නැඹුරු සිත් ඇත්තාට ද තෙරුවන් ගුණ විස්තර කරන පහදවන සූත්‍රාන්ත සිහි කරන්නාට ද පීති සම්බොජ්ඣංගය උපදී. මෙසේ උපන් එය රහත් මාර්ගයෙන් භාවනා සම්පූර්ණ වේ යයි දනගනී.

පස්සද්ධි සම්බොජ්ඣංගයේ "මහණෙනි, කය සංසිඳීම සිත සංසිඳීම ඇත." එහි නුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ, නූපන් පස්සද්ධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස උපන් පීති සම්බොජ්ඣංගයේ බොහෝ බව මහත් බව භාවනාව සම්පූර්ණ වීම පිණිස මෙය පවතී. මෙසේ ඉපදීම වේ. තවද කරුණු සතක් (සත්ත ධම්මා) පස්සද්ධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී. පණීත භොජන සේවනතා, උතුසුඛ සෙවනතා, ඉරියාපථ සුඛ සෙවනතා. මජ්ඣත්ත පයොගතා, සාරද්ධකාය පුග්ගල පරිවජ්ජනතා, පස්සද්ධ පුග්ගල සෙවනතා, තදධිමුත්තතා යනුවෙනි. ප්‍රණීතභාවයෙන් යුත්. සිනිඳු සප්පායා භෝජන වළඳන්නාට ද සීත උෂ්ණ ස්ථානාදියෙහි ද ඉරියව්වලට සප්පාය සෘතු ද ඉරියව් ද සේවනය කරන්නාට ද පස්සද්ධි උපදී. යමෙක් මහා පුරුෂයෙක් නම් සියළු සෘතුවලට ඉරියව් ගැලපේ. මජ්ජඣත්ත පයොග යයි කියන්නේ තමාගේ ද අනුන්ගේ ද කරන ලද ප්‍රත්‍යවේක්ෂා කිරීම. මේ මධ්‍යස්ථ ප්‍රයෝගයෙන් උපදී. ගල්කැට දඬුවලින් අනුන් වෙහෙස කරවමින් හැසිරෙන සාරද්ධකාය පුද්ගලයින් වර්ජනය කරන්නාට ද සංයමය වූ අත් පා ඇති පස්සද්ධිකාය පුද්ගලයින් ආශ්‍රය කරන්නාට ද සිටින හිඳින තැන්වල සංසිඳීම් ඉපදවීම පිණිස නැඹුරු වූ සිත් ඇත්තාට ද පස්සද්ධි සම්බොජ්ඣංගය උපදී. මෙසේ උපන් එය අර්හත් මාර්ගයෙන් භාවනා සම්පූර්ණ වේ යයි දනගනී.

සමාධි සම්බොජ්ඣංගයේ "මහණෙනි, සමථ නිමිත්ත, සැක රහිත නිමිත්ත ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ නූපන්නා වූ හෝ සමාධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස උපන්නා වූ හෝ සමාධි සම්බෝජ්ඣංගයේ බොහෝ බව මහත් බව භාවනා සම්පූර්ණ වීම පිණිස එයම හේතු වී පවතී. මෙසේ ඉපදීම වේ. සමථයම සමථ

නිමිත්ත වේ. විකෙෂප නොවන අර්ථයෙන් ද සැක රහිත නිමිත්ත වේ. තවද කරුණු එකොළොසක් සමාධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී. වත්‍ථු විසද කිරියතා, ඉන්‍ද්‍රිය සමත්ත පටිපාදනතා, නිමිත්ත කුසලතා, සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා, සමයෙ සම්පහංසනතා, සමයෙ අජ්ඣුපෙක්ඛනතා, අසමාහිත පුග්ගල පරිවජ්ජනතා, සමාහිත පුග්ගල සේවනතා, ඣාන විමොක්ඛ පච්චවෙක්ඛණතා, තදධිමුත්තතා යනුවෙනි. අරමුණෙහි ප්‍රකට බව, ඉන්‍ද්‍රිය සංවරව පවත්වා ගැනීම, සටහන පිළිබඳ දක්‍ෂතාවය, සුදුසු අවස්ථාවේ සිත දැඩිකර ගැනීම, සුදුසු අවස්ථාවේ සිත යටපත් කරගැනීම, සිත දිරිමත් කිරීම, සිත මනාව මැදහත්ව තබා ගැනීම, සමාධිගත නොවන පුද්ගලයන් දුරු කිරීම, සමාධිගත වන පුද්ගලයන් ඇසුරු කිරීම, ධ්‍යාන විමෝක්‍ෂය මෙනෙහි කිරීම එහි සිත දැඩි කර ගැනීම කියනලද නයින් ම දත යුතුය. නිමිත්ත කුසලතා නම් කසිණ නිමිත්ත ඉගනීමෙහි දක්‍ෂතා, සමයෙ චිත්තස්ස පග්ගණ්හතා නම් යම් වේලාවක ඉතා ලිහිල් විරියබව නිසා සිත ලීන (සැඟවේ) වේ. ඒ වෙලාවේ ධම්මවිචය විරිය පීති සම්බොජ්ඣංග නගා සිටුවීමෙන් ඒ සිත උනන්‍දු කළ යුතුය. යම් කලෙක තද වීර්ය නිසා විසිරුණු සිත් ඇති වේ. ඒ කාලයේ පස්සද්ධි සමාධි උපෙක්ඛා සම්බෝජ්ඣංග පිහිටුවා සිතට නිග්‍රහ කළ යුතුය. යම් කලක සිත ප්‍රඥා ප්‍රයෝග මඳ බැවින් නො උපසම සැප නො ලැබීමෙන් හෝ ආශ්වාද රහිත වේද? ඒ කාලයෙහි සංවේග වස්තු අට සිහි කිරීමෙන් සංවේග කෙරේ. සංවේග වස්තු අට ජාති ජරා ව්‍යාධි මරණ අපාය දුක් අතීත සසරදුක් අනාගත සසර දුක් වත්මන් ආහාර ගවෙටයී දුක යන මේවාය. තෙරුවන් ගුණ සිහිකිරීමෙන් ද පැහැදීම ඇති කරයි. සුදුසු කාලයෙහි උනන්දු කරවීම මෙය යයි කියනු ලැබේ. සමයෙ අජ්ඣුපෙක්ඛණතා නම් යම් කාලයක යහපත් ප්‍රතිපදාවට පැමිණ නො සැඟවී නොවිසිරී ආශ්වාද රහිතව අරමුණෙහි මනාව පවත්නා සමථ විථියට බට සිත වේ. එකල ඊට පග්ගහ නිග්ගහ සම්පහංසන ව්‍යාපාර නොපැමිණේ. මනාව පවතින අසුන් යෙදූ රථයක රියැදුරා මෙන් පවතින මේ සමය අජ්ඣුපෙක්ඛන යයි කියනු ලැබේ. අසමාහිත පුග්ගල පරිවජ්ජනතා නම් උපචාර හෝ අර්පනා හෝ නොපැමිණි වික්‍ෂිප්ත සිත් ඇති පුද්ගලයන් දුරුකිරීම. සමාහිත පුග්ගල සේවනතා නම් උපචාරයෙන් හෝ අර්පනාවෙන් සමාහිත සිත් ඇති පුද්ගලයන් ඇසුරු කිරීම භජනය, පයිරුපාසනයයි. තදධි මුත්තතා නම් සිටින හිඳින තැන්වල සමාධි ඉපදවීම සඳහාම ඉතා තදින් නැඹුරු වූ (නින්න පොණපබ්භාර) සිත් ඇති

බව. මෙසේ පිළිපදින්නාට සමාධි සම්බොජ්ඣංගය උපදී. මෙසේ උපන් එය අර්හත් මාර්ගයෙන් භාවනා සම්පූර්ණවන බව දැනගනී.

උපෙක්ඛා සම්බොජ්ඣංගයේ ''මහණෙනි, උපෙක්ඛා සම්බොජ්ඣංගයට ආධාර වූ ධර්ම ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ නූපන් උපේක්ෂා සම්බෝධ්‍යංගයේ ඉපදීම සඳහා උපන් සම්බෝධි අංගයේ බොහෝ බව මහත් බව භාවනාව සම්පූර්ණවීම පිණිස ඒවාම හේතුවේ. මෙසේ ඉපදීම වේ. එහි මැදහත් බව උපෙක්ඛා සම්බොජ්ඣංග ඨානීය ධම්ම නම් වේ.

තවද කරුණු පහක් උපෙක්ඛා සම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. සත්තමජ්ඣත්තතා, සංඛාර මජ්ඣත්තතා, සත්ත සංඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතා, සත්ත සංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනතා, තදධිමුත්තති. එහි දෙයාකාරයකින් සත්ව මැදහත් බව පිහිටුවයි. ඔබ තමාගේ කර්මයෙන් පැමිණ තමාගේ කර්මයෙන් ම යන්නෙහි ය. ඔබ කාට මමත්වය දක්වන්නේ ද? මෙසේ කම්මකතා ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ද පරමාර්ථ වශයෙන් සත්වයෙක් නම් නැත. එනිසා කාට මමත්වය දක්වන්නෙහිද මෙසේ සත්වයෙක් නැතිබව මෙනෙහි කිරීමෙන් දෙයාකරයාකින් වේ. මේ සිවුර ක්‍රමයෙන් වර්ණ විකාරයටද දිරුණු බවට ද පැමිණ පා පිසින රෙදි කඩක්ව කෙවිටි අගින් හැරදමන්නාක් බවට පත් වේ. ඉදින් ඊට ස්වාමියෙක් වූයේ නම් එසේ නැසෙන්නට ඉඩ නොදේ යයි මෙසේ අස්වාමික භාවය මෙනෙහි කිරීමෙන් ද තිර නොවන තාවකාලික යයි මෙසේ තාවකාලික බව මෙනෙහි කිරීමෙන් දැයි සිවුරෙහි මෙන් පාත්‍රාදියෙහි ද යොදා ගතයුතුයි. සත්ත සංඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතා යනු මෙහි යම් පුද්ගලයෙක් ගිහි වූයේ හෝ තමාගේ දූ පුතුන් ආදීන් ද පැවිද්දෙක් වූයේ නම් තමාගේ අතවැසි සමානාචරියකයන් ද කෙරෙහි මමායනය කෙරේ. සියතින් ම කෙස් කැපීම්, මැසීම්, සිවුරු සේදීම්, රඳන් කිරීම්, පාත්‍ර පිසීම්/ඔපගැන්වීම් ආදිය කරයි. මොහොතක් හෝ නොදක්නේ නම් අසවල් සාමණේරයා කෙසේද? අසවල් දරුවා කොහේදැයි බිය වූ මුවකු මෙන් ඔබිමොබ බලයි. අනෙකෙකු විසින් කෙස් කැපීම් ආදියට මොහොතකට අසවලා එවන්නැයි ඉල්ලා සිටියේ ද අපි අපේ වැඩත් නොකර ඔබට ඔහු දී ක්ලාන්ත වෙමුදැයි නොදෙයි. මෙය සත්ත කෙලායන නම් වේ. යමෙක් වනාහි සිවුරු පාත්‍ර තැටි සැරයටි ආදිය කෙරෙහි මමායනය කරයි. අනිකකුට ඇල්ලීමටවත්

නොදෙයි. තාවකාලිකව හෝ ඉල්ලුවිට ආදරේ නිසා මමවත් මෙය පරිභෝග නොකෙළෙමි. ඔබට කොහොම දෙන්නදැයි කියයි. මෙය සංස්කාර කේලායනයයි. යමෙක් වනාහි ඒ දෙයාකාර වස්තු කෙරෙහි මධ්‍යස්ථ වේ උදාසීනවේ සත්ව සංඛාර මධ්‍යස්ථභාවයයි. මෙසේ උපෙකඛා සම්බොජ්ඣංගය මෙබඳු වූ සත්ව සංඛාර මමත්වය දක්වන පුද්ගලයන් දුරින් ම දුරු කරන්නාට ද සත්ව සංඛාර මැදහත් පුඟුලන් සෙවිනාහට ද සිටින හිඳින තැන්වල එය ඉපදවීම සඳහා ඉතා තදින් නැමුණු සිත් ඇත්තාට ද උපදී. මෙසේ උපන් එය අර්හත් මාර්ගයෙන් භාවනාව සම්පූර්ණ වේ යයි දැනගනී. **ඉති අජඣත්තං වා** - මෙසේ තමාගේ හෝ අනුන්ගේ සත්ත බොජ්ඣංග පරීක්‍ෂා කොට කලක තමාගේ කලක අනුන්ගේ බොජ්ඣංග පරීක්‍ෂා කොට ධර්මයන් කෙරෙහි ධර්මානුපස්සීව වාසය කරයි. මෙහි සමුදය වය බොජ්ඣංග නිපදවීම නිරෝධ වශයෙන් ම දතයුතුය. මින් පසු කී අයුරින්ම හුදෙක් බොජ්ඣංග පිරික්සීම ඇති කල්හි දුකඛ සත්‍යයයි මෙසේ යොදා බොජ්ඣංග පිරික්සන භික්‍ෂුව ගේ නිවන් මග දත යුතුය.

බොජ්ඣංග නිමි.

මෙසේ සත්තබොජ්ඣංග වශයෙන් ධම්මානුපස්සනාව බෙදා දැන් චතුසච්ච වශයෙන් බෙදීමට ''පුනචපරං'' යනාදිය කීහ. එහි **ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති** - තණ්හාව හැර ත්‍රෛභූමක ධර්මයෙහි මෙය දුක යයි යථා ස්වභාවයෙන් දැනගනී. ඒ දුකෙහිම ජනිතවීම හටගැනීම් කළ පෙර තණ්හාව වූ මෙය දුකඛ සමුදය වේ. දෙකම නොපවතින නිවන වන මෙය දුකඛ නිරෝධයයි. දුක දැන ගන්නා සමුදය දුරුකරන නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කරන ආර්ය මාර්ගය වූ මෙය දුකඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි යථා ස්වභාවයෙන් දැනගනී යන අර්ථයයි. අවසේස ආර්ය සත්‍ය කථා හැර ජාති ආදි පදභාජන කථා විසුද්ධිමගගයෙහි විස්තර කරන ලද්දේමය. පදභාජනයෙහි වනාහි "කතමා ච භික්ඛවෙ ජාති" යයි මහණෙනි ජාතිය කිමෙක්ද? මහණෙනි, යම් ජාතියක් දුක යයි මෙසේ කියන ලද ඒ ජාතිය කුමක්දැයි මෙසේ සියළු පුච්ඡාවල අර්ථය දත යුතුය. **යා තෙසං තෙසං සත්තානං** - මේවායේ මේ නාම නියම අභාවයෙන් සියළු සත්වයන් ගැනීමෙන් වචනය, **තමහි තමහි සත්ත නිකායා** - මෙය ද සියළු සත්ව නිකාය හාත්පසින් ගන්නා වචන වේ, ඉපදවීම, ජාතියයි. රූපය සහිතව පළමුවෙන් ඉපදවූ ස්කන්ධවලට මෙය නමකි. **සංජාති** - මෙය මෙහිම

උපසර්ගයෙන් යුත් අධිවචනයකි. එයම ප්‍රවේශවන ආකාරයෙන් බැසගන්නා අර්ථයෙන් **ඔක්කන්ති** - වේ. ඉපදීම් සංඛ්‍යාත අභිනිබ්බත්තන අර්ථයෙන් **අභිනිබ්බත්ති** - වේ. මෙසේ මේ සතරද සම්මුති කථා නම් වේ. **ඛන්ධානං පාතුභාවො** - මෙය වනාහි පරමාර්ථ කථා නම් වේ. ඒක වෝකාරභවවල ඒක චතු පංච (වොකාර) ස්කන්ධවලම පහළවීම වේ. පුද්ගලයෙකුගේ පහළවීම නොවේ. පුද්ගලයෙක් පහළවූයේය යනු ව්‍යවහාර මාත්‍රයකි. **ආයතනානං පටිලාභො** - ආයතන පහළවේ යනු ලැබූ නම වේ. එය ඒවායේ පහළවීම සංඛ්‍යාත ප්‍රතිලාභය යන අර්ථයයි. **ජරා** - සවභාවය පෙන්වීමයි. **ජීරණතා** - ආකාරභවය දක්වීමය. **ඛණ්ඩිච්චං** - වෙනස්වන අයුරු වෙන්වීමය. ළදරු කාලයේ දත් සුදුය. වයස යනවිට පිළිවෙළින් වර්ණය දුර්වර්ණ වී ඒ ඒ තැනින් වැටේ. ඉක්බිති වැටුණු තිබෙන ඒවා ඇසුරු කොට ඛණ්ඩිත දත් වේ. කැඩුණු එවායේ ස්වභාවය **ඛණ්ඩිච්චං** - වේ. අනුක්‍රමයෙන් සුදු වූ කෙස්ලොම් පලිත නම් වේ. පලිත ඒවායේ සවභාවය **පාලිච්චං** වේ. ජරා වාත ප්‍රහාරයෙන් වියලුණු මස් ලේ වලින් රැලි වලින් හමෙහි ඔහුගේ - වලිතතචො - එහි භාවය - **වලිතතචතා** - වේ. මෙපමණකින් දත් කෙස් ලොම් දත්වල වෙනස් කම් පෙන්වීම් වශයෙන් ප්‍රකට වූ ප්‍රකට ජරා දක්වන ලදී. යම්සේ ජලයේ හෝ වාතයේ හෝ ගින්නේ හෝ තෘණ වෘක්‍ෂ ආදියේ බිඳීගිය පැලීගිය හෝ දැවී ගිය හෝ ගියමග ප්‍රකට වේ. ගිය මගෙහි ඒ ජලය ආදිය නැත. එසේම ජරාවෙන් දත් ආදියෙහි කැඩීයෑම් වශයෙන් ගියමග ප්‍රකටය. ඇසහැර ගනී. කැඩුණු ආදියෙහි ජරා නැත. ජරාවට චක්ඛු විඤ්ඤාණය නැත. ජරා පැමිණි විට ආයු පිරිහේ. එහෙයින් ජරා **ආයුනො සංහානි** - යයි පලුපචාර වශයෙන් කියන ලදී. ළමාකාලයෙහි ප්‍රසන්න වූ සියුම් වූ තමාගේ විෂය පහසුවෙන් ගැනීමෙහි සමත් ඇස් ආදි ඉඳුරන් පැසී ජරාවට පැමිණ කැලඹී අවසංඥාය (අපැහැදිලිය) ඕලාරික ද වේ. තමාගේ විසය ගැනීමට අසමත් වේ. (ඇසට පෙනීම ගන්න අපහසු මෙනි). එනිසා ඉන්ද්‍රියන් **ඉන්ද්‍රියානං පරිපාකො** - පැසුණේ යයි පලුපචාර වශයෙන් කියන ලදී. මරණය සඳහා නපුංසක නිර්දේශයෙන් යම් මරණයක් චුති යයි කියනු ලැබේ. **චවනතා** - යයි ද කියනු ලැබේ. **චුති** - සවභාවය දක්වීමයි. **චවනතා** - ආකාරභාවය දක්වීමය. මරණයට පැමිණියහුගේ ස්කන්ධ බිඳී අතුරුදහන් වේ. නොදක්මට යයි. එහෙයින් එය **භෙදො අන්තරධානං** - යයි කියනු ලැබේ. **මච්චුමරණං** - ක්‍ෂණික මරණ නොවේ. **කාලකිරියා** - මරණ, කාලකිරියාව මේ සියල්ල සම්මුති කථාය. **ඛන්ධානං භෙදො** - මෙය පරමාර්ථ කථාවකි. ඒකවෝකාර භව ආදියෙහි එක චතු

පංච භේද වූ ස්කන්ධයන්ගේ බිඳීම මිස පුද්ගලයෙකුගේ නොවේ. එසේ ඇති කල්හි පුද්ගලයෙක් මළේ යයි ව්‍යවහරය පමණක් වේ. කලෙබරසස - නික්ඛෙපො - ආත්මභාවයේ හැරදැමීම. මරණයට පැමිණිය තැනැත්තාට පලක් නැති දරකඩකට ආත්මභාවය වැටේ. එහෙයින් එය කලෙබරසස නිකෙඛපො - යයි කියනු ලදී. ජීවිතේන්ද්‍රියේ කැඩීම වනාහි සියළු ආකාරයෙන් පරමාර්ථ මරණයකි. එයම සමමුති මරණය යයි ද කියනු ලැබේ. ජීවිතේන්ද්‍රිය උපචෙඡදය ම ගෙන ලෝකයා තිස්ස මලේය ඵුස්ස මළේයයි කියයි. ව්‍යසනෙන - ඤාති ව්‍යසනාදියෙහි යම්කිසි ව්‍යසනයකින් දුක්ඛධමෙමන - යදමින් බැඳීම් (මාංචු දැමීම) ආදි දුක් කරුණින්, ඵුටඨසස - වසා පැතුරුණු, මඩින ලද. සොකො - යමෙක් ඤාති ව්‍යසන ආදියෙහි හෝ වෙනත් දෙයක් ඇති කල්හි එයින් මැඩුණේ සෝක කිරීම් ලක්‍ෂණ ඇති සෝකය උපදී. සොචිතං - සෝක කළ බව. යම් හෙයකින් මෙය අභ්‍යන්තරය වියලන්නේ හැම පැත්තෙන්ම වියලන්නේ උපදී. එහෙයින් අනෙතා සොකො අනෙතා පරිසොකො - යයි කියනු ලැබේ. මගේ දුව මගේ පුතා යයි මොවුන් උදෙසා වැලපේ. අඬයි. මේවායින් වේ යයි ආදෙවො - ඒ ඒ ගුණ කියා වැලපීම පරිදෙව - වේ. කාය කායිකං - ප්‍රසාද වස්තු දුක් යන අර්ථයෙන් දුක්ඛං. අසාතං - මිහිරි නොවූ, කාය සමඵසසජං දුක්ඛං - කාය ස්පර්ශයෙන් හටගත් දුක. අසාතං වෙදයිතං - අමිහිරි විඳීම. චෙතසිකං - චිත්ත සම්ප්‍රයුක්තවූ. සෙසු දුක් කියන ලද නය වේ. ආයාසො - පසුබට වූ සිතේ ක්ලාන්ත ගතිය. බලවත් ආයාසය උපායාසො - වේ.

ජාති ධමමානං - ජාති ස්වභාවයන් ගේ. ඉචඡා උපපජජති - තෘෂ්ණාව උපදී. අහොවත - ප්‍රාර්ථනා. න ඛො පනෙතං ඉචඡාය - මෙසේ ජාතියේ නොපැමිණීම හැර මාර්ග භාවනාව තෘෂ්ණාවෙන් නො පැතිය යුතුය. ඉදම්පි - මෙයද, මතු සියල්ල ගෙන 'පි' කාරය. යමපිචඡං - යම් සවභාවයකින් නොලැබිය හැකි වස්තු කැමැති වන්නේ නො ලබයි. නොලැබිය හැකි වස්තුවල කැමැත්ත දුකකි. සියළු තැන මෙම නයයි.

ඛන්ධ නිද්දේසයෙහි - රූපය ද උපාදාන ස්කන්ධය ද යයි රූපුපාදානකඛන්ධා. සියළු තැන මෙසේය. යායාං තණ්හා - යම් මේ තෘෂ්ණාවක්. පොනොභවිකා - පුනබ්භවය කිරීම. පුනබ්භවයයි. පුනබ්භව සවභාවය මොහුට වේ යයි පොනොභවිකා වේ. නන්දිරාග සහගතා - නන්දි රාගයෙන් යුක්ත වූ. නන්දි රාගය සමග අර්ථ වශයෙන් එකතත බවට ගියේ යයි කියන ලද්දේ වේ. ආත්මභාවය යම් යම් තැන්වල විද

ඒ ඒ තැන්වල රූපාදියෙහි හෝ අරමුණුවල ඇලීම, ඒ ඒ තැන්වල ඇලීම. රූපවල ඇලීම, ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධම්ම (සිතුවිලි) වල ඇලීම යන අර්ථයයි. කාමයෙහි තෘෂ්ණාව කාම තණ්හා - වේ. භව ප්‍රාර්ථනා වශයෙන් ඉපදුණු සාස්වත දෘෂ්ටි සහගත රූප අරූප භව රාගයේ ද ධ්‍යාන තෘෂ්ණාවට මෙය අධි වචනයකි. (සමාන) විභවයෙහි තෘෂ්ණාව විභව තණ්හා - වේ. උච්ඡෙද දෘෂ්ටි සහගත රාගයට මෙය අධි වචනයකි. දැන් ඒ තෘෂ්ණාවේ වස්තු විස්තර වශයෙන් දැක්වීමට "සා ඛො පනෙසා" යනාදිය කීහ. එහි උප්පජ්ජති - උපදී. නිවිසති - නැවත නැවත පැවැත්ම වශයෙන් පිහිටයි. යං ලොකෙ පිය රූපං සාත රූපං - ලෝකයෙහි ප්‍රිය වූද මිහිරි වූ ද යම්. "චක්ඛු ලොකෙ" යනාදියෙහි ලෝකයෙහි ඇස් ආදිය කෙරෙහි මමත්වයෙන් පිවිසුණු සත්වයෝ සම්පත්තියෙහි පිහිටි තමාගේ ඇස කණ්ණාඩි ආදියෙන් බැලීමෙන් විප්‍රසන්න වූ පංචප්‍රසාද රන්විමක අරින ලද මිණි කවුළුවක් මෙන් හඟිති. කන රන් පණාලිකයක් මෙන් පාමංග සූත්‍රයක් (නූලක්) මෙන් සිතත්. තුඟු නාසයයි ව්‍යවහාරවන සාණය වටකොට තබන ලද රන්සිරියල් වැටියක් මෙන් හඟිති. දිව රන් කම්බිලි පටලයක් මෙන් මෘදු සිනිඳු මිහිරි රස දේ යයි හඟිති. කය තරුණ සල් ගසක් මෙන් රන් තොරණක් මෙන් හඟිති. මනස අන්‍යයන්ගේ මනසින් අසමාන යයි උසස්ව හඟිති. රූපය රන්වන් කිණිහිරි ආදි වර්ණ මෙන් ශබ්දය මත් කොවුල් කුරවීක මඳ සේ නාදය මිණි වස් නාදයක් මෙන් කවරෙකුට මෙසේ ඇත්දැයි සිතති. ඔවුන් ගේ මෙසේ හඟිනු ලබන ඒ ඇස් ආදි ප්‍රිය රූපද මිහිරි රූප ද වේ. ඉක්බිති එහි ඔවුන්ගේ නසනන්නා වූ ද තෘෂ්ණාව උපදී. උපන්නා වූ තෘෂ්ණාව නැවත නැවත පැවැත්වීම් වශයෙන් නිවිසති වේ. එහෙයින් භගවත්හු "චක්ඛු ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති" ආදිය කීහ. එහි උප්පජ්ජමානා - උපදින විට මෙහි උපදීය යන අර්ථයයි. සියළු තැනම මෙම නයයි.

"අසෙස විරාග නිරොධ" ආදි සියල්ල නිවනෙහි පර්යාය වචන වේ. නිවනට පැමිණ තෘෂ්ණාව නිරවශේෂයෙන් නො ඇලේ. නිරුද්ධ වේ. එහෙයින් එය "තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො" යයි කියනු ලැබේ. නිවනට පැමිණ තෘෂ්ණාව අත්හරියි. මිදේ, නො ඇලේ. එහෙයින් නිවන චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො යයි කියනු ලැබේ. එකම නිවනේ නම් වනාහි සියළු සංඛත නාම ප්‍රතිපක්ෂ වශයෙන් අනෙක් වේ. කෙසේ ද යත් ? අසෙස විරාගො, අසෙස නිරොධො,

චාගො, පටිනිසසග්ගො, මුත්ති, අනාලයො, රාගක්ඛයො, දොසක්ඛයො, මොහක්ඛයො, තණ්හක්ඛයො, අනුප්පාදො, අප්පවත්ත, අනිමිත්තං, අප්පණිහිතං, අනායුහනං, අප්පටිසායි. අනුප්පත්ති, අගන අගාතං, අජරං, අව්‍යාධිං, අමතං, අසොකං, අපරිදෙවං, අනුපායාසං, අසංකිලිට්ඨං ආදියයි. දූන් මාර්ගයෙන් සිඳින ලද නිවනට පැමිණ අප්පවත්තියම පැමිණියේ ද යම් වස්තුවල උත්පත්තිය තණ්හාවෙන් දක්වූයේ ද එහිම අභාවය දක්වීමට "සා ඛො පනෙසා" යනාදිය කීහ. එහි යම්සේ පුරුෂයෙක් කෙතෙහි හටගත් තිත්ත ලබුවැලක් දැක අගසිට මුල පරීක්ෂා කොට සිඳින්නේය. එය ක්‍රමයෙන් මැලවී නොපෙනීමට යන්නේය. ඉන්පසු ඒ කෙතෙහි තිත්ත ලබු නිරුද්ධ වූයේය. ප්‍රහීන වූයේ යයි කියන්නේය. ඒවාගේම කෙතෙහි තිත්ත ලබුවැල මෙන් ඇස් ආදියෙහි තණ්හාව ආර්ය මාර්ගයෙන් මුලින් සිඳින ලද්දේ නිවනට පැමිණි නොපැවැත්මට යයි. මෙසේ වූ විට කෙතෙහි තිත්ත ලබුවැල මෙන් ඒ වස්තුවල නො පෙනේ. යම්සේ කැලෑවෙන් සොරුන් ගෙනවුත් නගරයේ දකුණු දොර නසන්නේ නම් ඉන්පසු වනයෙහි සොරුන් මළහයි හෝ මරණ ලදැයි හෝ කියන්නාහුය. එසේම චක්ෂු ආදියෙහි තෘෂ්ණාව වනයෙහි සොරුන් මෙනි. එය දකුණ දොර සොරුන් මෙන් නිවනට පැමිණ නිරුද්ධ වූ බව නිවනෙහි නිරුද්ධය. එසේම ඒ වසතුවල තෘෂ්ණාව නිරුද්ධ වූ බව නිවනෙහි නිරුද්ධය. එසේම ඒ වසතුවල තෘෂ්ණාව නිරුද්ධවීම වනයෙහි සොරුන් මෙන් නොපෙනේ. එහෙයින් එහි එහිම නිරෝධය දක්වන්නේ "චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමාන පහීයති එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣතීති" යනාදිය කීහ. අයමෙව - අන්‍ය මාර්ග ප්‍රතික්ෂෙප කිරීම සඳහා නියමය. අරියො - මාර්ග බාධක වූ ඒ ඒ කෙලශයන්ගෙන් ආරක්ෂා කරන බැවින් ද ආර්ය වේ. "දුක්ඛෙ ඤාණං" යනාදියෙන් චතු සත්‍ය කර්මස්ථානය දක්වන ලදී. එහි පළමු සත්‍ය දෙක සසරය. දෙවන දෙක නිවනය. භික්ෂූහු ඒවායින් සසර ඒවායේ කමටහනට ඇතුළත් වෙති. නිවනෙහි කමටහන් වශයෙන් ඇතුළත් වීමක් නැත. පෙර සත්‍ය දෙක පංචක්ඛන්ධ, දුක්ඛං තණ්හා සමුදයො යයි මෙසේ සංක්ෂේපයෙන් ද පංචස්කන්ධයෝ කවරේද? රූපස්කන්ධය යනාදි නයින් විස්තර වශයෙන් ආචාර්යවරයා සමීපයෙහි ඉගෙන වචනයෙන් නැවත නැවත කියා යෝගාවචරයා ක්‍රියා කරයි. ඉතිරි සත්‍ය දෙකෙහි නිරෝධ සත්‍ය ඉෂ්ඨය, කාන්තය, මනාපය. මාර්ග සත්‍යය ඉෂ්ඨය, කාන්තය මනාපය, මෙසේ කනින් ද ක්‍රියා කරයි. හේ මෙසේ කරන්නේ චතුරාර්ය සත්‍යය එක් ප්‍රතිවේධයෙන් අවබෝධ කරයි. සමුදය ප්‍රහාන

ප්‍රතිවේධයෙන් ද නිරෝධය සාක්ෂාත් ක්‍රියා ප්‍රතිවේධයෙන්ද මාර්ගය භාවනා ප්‍රතිවේධයෙන් අවබෝධ කරයි. දුක පරිඥඥා අභිසමයෙන් ද මාර්ගය භාවනාභිසමයෙන් ද අවබෝධ කරයි. මෙසේ ඔහුගේ පූර්වභාගයෙහි සත්‍ය දෙකෙහි ඉගැනීම, ප්‍රශ්න ඇසීම, සවන් දීම, දැරීම, විමසන ප්‍රතිවේධය වේ. සවණ පටිවෙධ දෙකම අපරභාගයෙහි කෘත්‍ය තුනක ප්‍රතිවේධය වේ. නිරෝධ අරමුණෙහි ප්‍රතිවේධය, ප්‍රත්‍යවේක්ෂාව වනාහි පැමිණි සත්‍යයේ වේ. මෙය ද ආදි කර්මිකයාටය. එහෙයින් එය මෙහි නොකියන ලදී. මේ භික්ෂුව වනාහි පෙර ගන්නා ලද දුක දැනගනිමි. සමුදය දුරු කරමි. නිරොධය සාක්ෂාත් කරමි, මාර්ගය වඩමි යයි සිතා බැලීම, එක්තැන් කිරීම, මෙනෙහි කිරීම, ප්‍රත්‍යවෙක්ෂා කිරීම් නැත. පිළිගැනීමේ පටන් වේ. අපරභාගයෙහි වනාහි දුක දැනගත්තේමය. මාර්ගය වැඩුවේය. එහි ඔහුට සත්‍ය දෙක දැකීමට අපහසුය. ගැඹුරුය. දෙකක් ගැඹුරු නිසා දැකීමට අපහසුය. දුකඛ සත්‍යය උපතේ සිට ප්‍රකටය. කණු කටු පහරවලදී අහෝ දුකයි යයි කීමට ද පැමිණේ. සමුදය ද කනු කැමති වළඳනු කැමති ආදි වශයෙන් උපතේ සිට ප්‍රකටය. ලක්ෂණ ප්‍රතිවේධයෙහි දෙකම ගැඹුරුය. මෙසේ ඒවා දුර්දශය, ගැඹුරුය. ඉතිරි දෙක වනාහි දක්වීම සඳහා ප්‍රයෝගය භවග්‍රහණය සඳහා අත දිග හැරීමක් මෙන් අවීචිය ස්පර්ශයට පා දිග හැරීමක් මෙන් සිය ආකාරයකින් බිඳුණු හිස කේ අග පිළියෙළ කිරීමක් මෙන් ද දැකීමට අපහසු නිසා ගැඹුරු ද ගැඹුරු නිසා දැකීමට අපහසු ද වේ. සිව්සස්වල ඉගෙනීම වශයෙන් පූර්වභාග ඥාණය ඉපදීම සඳහා ඉදං දුකෙඛ ඥාණං'' යනාදිය කියන ලදී.

ප්‍රතිවේධ ක්ෂණයෙහි එකවිටම ඒ ඥාණය වේ. නෙකඛමම සංකපප ආදිය කාම ව්‍යාපද විහිංසා විරති සංඥාවන් ගේ පූර්වභාගයෙහි විවිධය. මාර්ග ක්ෂණයෙහි මේ ස්ථාන තුනෙහි උපන් අකුසල සංකල්පයේ පද ඡේදවලින් අනුපපතති සාධන වශයෙන් මාර්ගාංගය පුරන්නේ කුසල සංකල්පය එකට උපදී. මෙය සමමා සංකපපය නම් වේ. මුසාවාදා වේරමණී ආදිය ද මුසාවාදාදීන් ගේ විරමන සංඥාව නානාබව. පූර්ව භාගයෙහි විවිධය. මාර්ග ක්ෂණයෙහි මේ සථාන හතරෙහි උපන් අකුසල දුස්සීල චේතනාව නොකිරීමෙන් පද වෙන්කිරීමෙන් නූපන් සාධන වශයෙන් මාර්ගාංගය පුරනු ලබන්නේ කුසල වේරමනිය එකට උපදී. මෙය සමමා වාචා නම් වේ. පාණාති පාතා වෙරමනි ආදිය ද පාණාතිපාතාදියෙන් වෙන්වන සංඥාවද විවිධය. පූර්වභාගයෙහි විවිධ

වේ. මාර්ග ක්‍ෂණයෙහි වනාහි මේ ස්ථාන තුනේ උපන් අකුසල දුස්සීල චේතනාවෙන් නොකිරීමෙන් පද ඡේද වශයෙන් අනුප්‍රාප්ත සාසන වශයෙන් මාර්ගාංගය පුරන්නේ එකලාව කුසල වේරමණිය උපදී. මෙය සම්මා "කම්මන්ත නම් වේ. **මිච්ඡා ආජීවං** - කෑ යුතු පියයුතු ආදි දේවල් කෙරෙහි පවත්වන කාය වචී දුච්චරිත. **පහාය** - වර්ජනය කොට. **සම්මා ආජීවෙන** - නුවණැත්තන් ප්‍රසංසා කරන ජීවත්වීමෙන්. **ජීවිකං කප්පෙති** - ජීවිත පැවැත්ම පවත්වයි. සම්මා ආජීවය ද කුහනාදි වෙන්වන සංඥා විවිධය. පූර්වභාගයේ නා නා වේ. මාර්ගක්‍ෂණයෙහි වනාහි මේ ස්ථාන සතරෙහි උපන් මිථ්‍යා ආජීව දුස්සීල චේතනාවෙන් පද ඡේද වශයෙන් නූපන් සාධන වශයෙන් මාර්ගාංගය පුරන්නේ එකලාව කුසල වේරමණිය උපදී. මෙය සම්මා ආජීව නම් වේ. **අනුප්පන්නානං** - ඒක භවයක එබඳු වූ හෝ අරමුණෙහි තමන් නූපන්න නමුත් අන්‍යයා හෝ උපදිනවා දක අහෝ මේ එබඳු වූ පාප අකුසල ධර්මවලින් නො ඉපදෙත්වායි මෙසේ නූපන් පාප අකුසල ධර්මවල නොඉපදීම සඳහා **ඡන්දං ජනෙති** - ඒ ඒ නූපන් ප්‍රතිපත්ති සාධක වීර්ය කැමැත්ත උපදවයි. **වායමති** - උත්සාහ උත්සාහ කරයි. **විරියං ආරභති** - වීර්ය පටන් ගත් නිසා. **පදහති** - සම් නහර ඇට ඉතිරි වේවා මස්ලේ වියලේවා. ප්‍රධන් වීර්ය පවත්වයි. **උප්පන්නානං** - හැසිරීම් වශයෙන් තමාගේ ඉපදීමට පෙර, දූන් එබඳු ඉපදීම් නැතැයි ඒවායේ ප්‍රහානය පිණිස කැමැත්ත දනවයි. **කුසලානං** - නොලද ප්‍රථමධ්‍යානාදිය, **උප්පන්නානං** - ඒවායේ ම ලැබීම. **ඨිතියා** - නැවත නැවත උත්පත්ති ප්‍රබන්ධ වශයෙන් සිටීම පිණිස. **අසම්මොසාය** - අවිනාසනය සඳහා. **භීයොභාවාය** - ඉහළ බව සඳහා. **වෙපුල්ලාය** - මහත් බවට. **භාවනා පාරිපූරියා** - භාවනාවේ පරිපූරණය සඳහා.

මේ සම්මා වායාමය ද නූපන් අකුසලයන් ගේ නොඉපදීම් ආදි සිත්වල නානාත්වය පූර්වභාගයෙහි විවිධය. මාර්ග ක්‍ෂණයෙහි මේ ස්ථාන සතරෙහි කෘත්‍ය සාධන වශයෙන් මාර්ගාංග සම්පූර්ණ කරමින් එකම කුසල වීර්ය උපදී. මෙය සම්මා වායාම නම් වේ. සම්මා සතියද කායාදි විමසන සිත්වල නානාත්වය පූර්වභාගයෙහි විවිධය. මාර්ග ක්‍ෂණයෙහි වනාහි ස්ථාන සතරෙහි කෘත්‍ය සාධන වශයෙන් මාර්ගාංගය පූරණය කරමින් එකම සිහිය උපදී. මෙය සම්මා සති නම් වේ. ධ්‍යාන පූර්වභාගයෙහි ද මාර්ග ක්‍ෂණයෙහි ද විවිධය. පූර්වභාගයෙහි සමාපත්ති වශයෙන් විවිධය. මාර්ග ක්‍ෂණයෙහි මාර්ග වශයෙන් විවිධය. එක්කෙනෙකුගේ ප්‍රථම මාර්ගය ප්‍රථම ධ්‍යානික වේ. දෙවන මාර්ග

ආදිය ප්‍රථම ධ්‍යානික හෝ ද්විතීය ධ්‍යානාදියෙහි අන්‍යතර ධ්‍යානික හෝ, කෙනෙකුගේ ප්‍රථම මාර්ගය ද්විතියා දී අන්‍යතර ධ්‍යානික වේ. දුතියාදිය ද දුතියාදීන් ගේ අර්ථය සඳහා අන්‍යතර ධ්‍යානික හෝ ප්‍රථම ධ්‍යානික හෝ වේ. මෙසේ මාර්ග සතරම ධ්‍යාන වශයෙන් සමාන හෝ අසමාන හෝ එක් අතකින් සමාන වේ. මෙය එහි විශේෂයකි. පාදක ධ්‍යාන නියමයෙක් වේ. පළමුව පාදක ධ්‍යාන නියමයෙන් ප්‍රථම ධ්‍යානලාභියා ප්‍රථම ධ්‍යානයෙන් නැගිට විදර්ශනාවෙන් උපන් මාර්ගය ප්‍රථම ධ්‍යානික වේ. මෙහි මාර්ගාංග බොජ්ඣංග වනාහි සම්පූර්ණ වූයේ වේ. ද්විතීය ධ්‍යානයෙන් නැගිට විදර්ශකයාට උපන් දවිතීය ධ්‍යානික වේ. මෙහි මාර්ගාංග සතක් වේ. තෘතීය ධ්‍යානයෙන් නැගිට විදර්ශනා වඩන්නට උපන් තෘතීය ධ්‍යානක වේ. මාර්ගාංග වනාහි සතත බොජ්ඣං වලින් හයක් වේ. චතුර්ථ ධ්‍යානයේ පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය දක්වා මෙම න්‍යායම වේ.

අරූපපයෙහි චතුර්ථ ධ්‍යානය ද උපදී. එය ද ලොකෝත්තරය. ලෞකික නොවේ. මෙහි කෙසේද? මෙහි ද ප්‍රථම ධ්‍යානාදියෙහි යම්සේ නැගිටියේ ද සෝවාන් මාර්ගය ලැබ අරූප සමවත් වඩා යමෙක් අරූප්පයෙහි උපන්නේ තෘතිය ධ්‍යානික වූයේ එහි මාර්ග තුන උපදියි. මෙසේ පාදක ධ්‍යානයම නියමය වේ. සමහර තෙරුන් වහන්සේලා විපසසනාවෙන් අරමුණු වු ස්කන්ධ නියම යයි කියති. ඇතමෙක් පුද්ගල අධ්‍යාශය නියම යයි කියති. ඇතමෙක් වුට්ඨාන ගාමිනී විපසසනය නියමයයි කියති. ඔවුන් ගේ වාද විනිශ්චය විසුද්ධිමග්ගයෙහි වුට්ඨානගාමිනී විපසසනා අධිකාරයෙහි කියන ලද නයින්ම දත යුතුය. අයං වුච්චති **භික්ඛවෙ සම්මා සමාධි** - මෙය පූර්වභාගයෙහි ලෞකිකය. අපරභාගයෙහි ලොකෝත්තර සම්මා සමාධිය යයි කියනු ලැබේ. **ඉති අජ්ඣත්තං වා** - තමාගේ හෝ සත්‍ය සතර පරීක්‍ෂා කොට ධර්මයෙහි ධම්මානුපස්සීව වාසය කරයි. මෙහි සමුදය වය වනාහි චතුසසත්‍යයන් ගේ සම්භව වූ පරිද්දෙන් උපත නැවැත්ම වශයෙන් දත යුතුය. මින්පසු කියන ලද පිළිවෙළමය. හුදෙක් මෙහි චතු සංඝ විමසීම ඇති කල්හි දුක්ඛ සත්‍ය යයි මෙසේ යොදාගෙන සත්‍ය විමසන භික්ෂුව ගේ නිවන් මග දතයුතුය. සෙස්ස එලෙසමය.

**චතුසච්ච නිමි.**

මෙපමණකින් ආනාපාන, චතු ඉරියාපථ, චතු සම්පජඤ්ඤ, ද්වත්තිංසාකාර, චතුධාතු වවත්ථාන, නවසීවථිකා, වෙදනානු පස්සනා, චිත්තානුපස්සනා, නීවරණ පරිග්ගහ, ඛන්ධපරිග්ගහ, ආයතන පරිග්ගහ, බොජ්ඣඞ්ග පරිග්ගහ, සච්චපරිග්ගහ යයි එක්විසි කමටහන් වේ. ඒවා අතර ආනාපාන ද්වත්තිංසාකාර, නවසීවථික එකොළොස අර්පණා කර්මස්ථාන වේ. දීඝභාණක මහාසීව තෙරුන් වහන්සේ වනාහි නවසීවථිකා ආදීනවානු පස්සනා වශයෙන් කියන ලදැයි කීය. එහෙයින් උන්වහන්සේ ගේ මතයෙන් අර්පණා කර්මස්ථාන දෙකක් වේ. සෙස්ස උපචාර කමටහන්ය. කිම? මේ සියල්ලෙහි ම අභිනිවේශය ඇතිවේද? නොවේද? ඇතිවේ. ඉරියාපථ සම්පජඤ්ඤ නීවරණ බොජ්ඣංගවල අභිනිවේශය ඇති නොවේ. සෙස්සෙහි ඇතිවේ යයි මහාසීව තෙරහු කීහ. මේවායෙහි ද අභිනිවේශය ඇතිවේ. මෙය වනාහි මගේ සිව් ඉරියව් ඇත්ද? නැතහොත් නැත්ද? මගේ සිව් විමසන නුවණ ඇත්ද නැතහොත් නැත්ද, මගේ පංච නීවරණ ඇත්ද නැතහොත් නැත්ද, මගේ සත් බොජ්ඣංග ඇත්ද නැතහොත් නැත්ද? මෙසේ පිරික්සයි. එහෙයින් සැමතැනම අභිනිවේශය ඇතිවේ. යොහි කොචි භික්ඛවෙ - මහණෙනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ එවං භාවෙය්‍ය - මුලපටන් කියනලද භාවානාව අනුක්‍රමයෙන් වඩන්නේය. පාටිකංඛං - බලාපොරොත්තු විය යුතුය. කැමති විය යුතුය. අවශ්‍යවීය යන අර්ථයයි. අඤ්ඤා - රහත් බව. සති වා උපාදි සෙසෙ - ගැනීම් ඇති කල්හි හෝ ක්ෂීණ නොවූ කල්හි. අනාගාමිතා - අනාගාමි භාවය.

මෙසේ සත් වසක් වශයෙන් ශාසනයේ නෛර්යානිකභාවය දක්වා නැවත එයින් අල්පතර කාලයක් දක්වන්නේ ''තිට්ඨන්තු භික්ඛවෙ'' (මහණෙනි තිබේවා) යනාදිය කීහ. මේ සියල්ල ද මධ්‍යම විනේය පුද්ගලයෙකුගේ වශයෙන් කියන ලදී. තියුණු ප්‍රඥාවන්තයන් සඳහා වනාහි අළුයම අනුසාසනා කරන ලද්දේ සවස කිසියම් අධිගමයක් වන්නේය. සවස අනුශාසනා කරන ලද්දේ අළුයම යම්කිසි අධිගමයක් වන්නේ යයි කියන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, මගේ ශාසනය මෙබඳු නෛර්යානික යයි දක්වා එක්විසි ස්ථානයෙහි රහත්බව කුළු ගැන්වීමෙන් දේශනා කරන ලදී. දේශනාව බාරදෙන්නේ ''භික්ඛවෙ මගෙගා.... ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං''- යනාදිය කීහ. සෙස්ස නොගැඹුරු අරුත් වේ. දේශනාව අවසානයෙහි වනාහි තිස් දහසක් භික්ෂූන් වහන්සේ රහත් පලයෙහි පිහිටියහ.

මහා සතිපට්ඨාන සූත්‍රය නිමි.

# 2-23
## පායාසි සූත්‍ර වර්ණනාව

පායාසි මවිසින් මෙසේ අසන ලදී. මේ එහි අපූර්වපද වර්ණනාවයි. ආයසමා - මෙය ආමන්ත්‍රණයේ ප්‍රිය වචනයකි. කුමාර කසසපො - උන්වහන්සේ ගේ නාමය. කුමාර කාලයෙහි පැවිදි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් "කාශ්‍යප කැඳවන්න," මේ පලතුරු හෝ කෑ යුතු දේ කාශ්‍යපට දෙන්නැයි කී කල්හි, මොන කාශ්‍යපටද? කුමාර කාශ්‍යපට යයි මෙසේ ගන්නා ලද නාම මාත්‍රයෙන් එතැන් සිට වයසට පැමිණි කල්හිද කුමාර කසසප යයි කියනු ලැබේ. තව ද රජ විසින් පෝෂණය කළ පුත් බැවින් උන්වහන්සේ කුමාර කසසප යයි හැඳින් වුහ. උන්වහන්සේ වනාහි පූර්ව යෝගයේ පටන් ප්‍රකට කථා ඇත්තේය. තෙරුන් වහන්සේ වනාහි පියමතුරා බුදුන් කාලයෙහි සිටු පුතෙක් විය. ඉක්බිති එක් දිනක භාග්‍යවතුන් වහන්සේ තමාගේ ශ්‍රාවකයකු චිත්‍රකථිකථික භික්ෂූන් ගෙන් අග්‍රසථානයෙහි තබනවා දක භාග්‍යවතුන් වහන්සේට සතියක් දන් දී භාග්‍යවතුන් වහන්ස, මම ද මේ චිත්‍රකථික සවාමින් වහන්සේ මෙන් අනාගතේ බුදු කෙනෙකුන්ට ශ්‍රාවකයෙක් වන්නෙමියි ප්‍රාර්ථනා කොට පින් කරන්නේ කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව විශේෂයක් උපදවා ගැනිමට නොහැකි විය. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි සාසනය පිරිහෙන කල්හි භික්ෂූන් වහන්සේ පස්නමක් ඉණිමගක් බැඳ පර්වතයට නැගී මහණදම් පිරූහ. නායක තෙර තුන්වන දිනයෙහි රහත් වී අනුතෙර සතරවන දිනයෙහි අනාගාමි විය. ඉතිරි තිදෙනා විශේෂයක් ඉපදවීමට නොහැකිව දෙව්ලොව උපන්හ. එක්කෙනෙක් එක් බුද්ධාන්තරයක් දෙව්ලොව ද මිනිස් ලොව ද සම්පත් අනුභව කරන්නේ එක්කෙනෙක්, තක්ෂිලාවේ රාජ කුලයෙහි ඉපදී පුක්කුස නම් රජ වී භාග්‍යවතුන් උදෙසා පැවිදි වී රජගහ නුවරට එන්නේ කුඹල්හලක භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාව අසා අනාගාමි ඵලයට පැමිණියේය.

එක්කෙනෙක් එක් මුහුදු පටුනක කුලගෙයක ඉපදී නැවට නැගී දරහැව හැඳ ලාභ සම්පත්තියට පැමිණ මම රහත්මි සිත් උපදවා, ඔබ රහත් වී නැත. ශාසතෲන් සමීපයට ගොස් ප්‍රශ්න අසන්නැයි. අර්ථ කැමති දෙවියෙකු විසින් මෙහෙයවන ලද්දේ එසේ කොට රහත් ඵලයට

පැමිණියේය. එක්කෙනෙක් රජගහනුවර කුලදූරියකගේ කුස උපන්නේය. ඕ තොමෝ ද පළමුව මාපියන් යැද පැවිද්ද නොලබන්නේ සවාමි කුලයකට ගොස් ගැබ පිහිටි බව නොදන්නී සවාමියා සතුටු කොට ඔහුගේ අනුදැනුමෙන් භික්ෂුණීන් කෙරෙහි පැවිදි විය. ඇගේ ගැබිනි බව දැක භික්ෂුණීහු දෙව්දත් තෙරුන් විචාළහ. හේ අසසමණී යයි කීය. දසබල ශාස්තෘන් විචාළහ. ශාසතෘන් වහන්සේ උපාලි තෙරුන්ට භාරදුන්හ. තෙර සැවැත්නුවර වැසි කුලවත් විසාඛා උපාසිකාව කැඳවා පිරිසිදු කරන්නේ ගැබ පෙර ලබන ලදැයි පැවිද්දට හානි නැතැයි කීය. ශාස්තෘන් වහන්සේ නඩුව හොඳින් විනිසන ලදැයි තෙරුන්ට සාධුකාර දුන්හ. ඒ භික්ෂුණිය රන් පිළිමයක් සේ පුතකු වැදූවාය. පසේනදී කොසොල් රජ ඔහු ගෙන වැඩුවේය. ඔහුට කසසප යයි නම් කොට පසු කාලයේ අලංකාර කොට ශාස්තෘන් සමීපයට පමුණුවා පැවිදි කරවීය. මෙසේ ඔහු රජු විසින් පෝෂණය කරන ලද බැවින් කුමාර කසසප යයි හැඳින්වූහ. එක් දිනක් ඔහු අන්ධවනයෙහි මහණදම් පුරන්නේ අරුත් කැමති දෙවියෙක් ප්‍රශ්න උගන්වා මේ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේගෙන් අසන්නැයි කීය. තෙරුන් වහන්සේ ප්‍රශ්න අසා පැණ විසඳුම් අවසානයෙහි රහත් බවට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ ද උන්වහන්සේ චිත්‍රකථික භික්ෂූන් අතරෙහි අග්‍රසථානයේ තැබූහ. "සෙතව්‍යා" ඒ නගරයේ නමය. **උත්තරෙන සෙතව්‍ය** - සෙතව්‍ය නගරයෙන් උතුරෙහි **රාජඤ්ඤො** - අභිෂේක නොලත් රජ. **දිට්ඨිගතං** - දෘෂ්ටියම. දිට්ඨියෙව දිට්ඨි ගතං. **ඉතිපි නත්ථි** - ඒ ඒ කරුණු පෙන්වා මෙසේ ද නැතැයි කියයි. **පුරා.....සඤ්ඤාපෙති** සංඥාවක් නොකරන තුරු. **ඉමෙ භො කසසප චන්දිම සූරියා** - හේ වනාහි තෙරුන් විසින් විචාරන ලද්දේ සිතීය. මේ ශ්‍රමණයා පළමුව සඳහිරු දැක්වීය. සඳහිරු සමාන වන්නේය. ප්‍රඥාවෙන් අන්‍යයන් අභිබවනීය වේ. ඉදින් මම වනාහි සඳහිරු මේ ලෝකයේ යයි කියන්නෙමි. ඔවුන් කුමක් නිශ්‍රිතද ප්‍රමාණය කොපමණ කෙතරම් උඩද ආදියෙන් වෙළන්නේය. මම වනාහි වෙළුම් හැරීමට නොහැකි වෙමි. පරලොව්හි මෙසේ කතා කරන්නෙමි. එහෙයින් මෙසේ කීය. භාග්‍යවතුන් වහන්සේ ඊට පෙර සුධා භොජන ජාතකය වදාළහ. එහි සඳෙහි සඳ දෙව්පුත්ය. හිරුගේ හිරු දෙව්පුත් යයි ආවේය. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ජාතකයක් හෝ සූත්‍රාන්තයක් හෝ සියළු දඹදිව ප්‍රකටය. එහෙයින් හේ මෙහි වාසය කරන දෙවියෝ නැතැයි කිව නොහැකි යයි සිතා ඔව්හු දෙවියෝ, මිනිසුන් නොවෙතියි කීය. **අත්ථි පන රාජඤ්ඤ පරියායො** - කරුණක් ඇද්දැයි විචාරති. **ආබාධිත** -

විෂභාග වේදනා සංඛ්‍යාත ආබාධයෙන් යුක්ත වූ. දුක්ඛිතා - දුකට පත්. බාළ්හගිලානා - අධික සේ ගිලන් වූ. සද්ධායිකා - මම ඔබ අදහමි. ඔබ මා විශ්වාස කරන්න. පච්චයිකා - මම ඔබ විශ්වාස කරමි. ඔබ මා විශ්වාස කරන්න. උද්දසෙසත්වා - ඔවුන්ගේ අස්කොට තැබූ භාණ්ඩයක් දක්වා. පිළිගන්වාගෙන යන අර්ථය වේ. විප්පලපන්තස්ස - මගේ පුතා මගේ දුව මගේ ධනය යයි විවිධ විලාප නගන්නට. නිරය පාලෙසු - නිරයෙහි වැඩකරන සතුන් කෙරෙහි. කර්මය ම කම්ම කරණ වේ. කිරීම නැත. නිරය පාලයෝ යයි කියති. ඔව්හු "මහණෙනි, මේ නිරය පාලයෝ" යයි දේවදූත සූත්‍රය පිළිවහති. මිනිස් ලොවේ රජකුලවල කරවන මිනිසුන් මෙන් නිරයෙහි නිරයපාලයෝ වෙති. වෙලුපෙසිකාහි - උණ පතුරුවලින්. සුනිම්මජ්ජථ - හොඳින් පිසදාන්න. ඉවත්කරව යන අර්ථයි. අසුචි - මනාප නැති. අසුචි සංඛාතො - අසුචි කොටස්. අසුචි යයි දන හෝ. දුග්ගන්ධො - කුණු ගඳ. ජෙගුච්ඡො - පිළිකුල් කළයුතු. පටික්කූලො - දැකීමෙන් ම තරහ ඇතිවේ. උබ්බාහති - දවසට දෙවරක් ස්නානය කොට තුන්වරක් ඇඳුම් මාරුකොට අලංකාර කළ සරසන ලද සක්විති ආදී වූද මිනිසුන්ගේ ගඳ යොදුන් සියයක් ඇතින් සිටි දෙවියන් ගේ බෙල්ලේ බැඳි කුණපයක් මෙන් බාදා කරයි. නැවත පාණාතිපාතාදි පංචසීලය සමාදන්ව සිටින්නන් වශයෙන් කියයි. තාවතිංසානං - මෙය ද දුර උපන්. තවම නොඒවා. මෙය කුමක්හෙයින් නොඑතිද්දයි කියයි. ජච්චන්ධූපමො මඤ්ඤෙ පටිභාසි - ජාත්‍යන්ධයකු මෙන් වැටහුනේය. අරඤ්ඤ වනපත්ථානි - අරණ්‍යක අංගයුත් අරණෙහි. මහවනයෙන් ගැවසුණ නිසා වනපත්ථානි වේ. පන්තානි - ඈත එපිට. කල්‍යාණ ධම්මෙ - ඒ සීලයෙන් ම කලණ දහමෙහි. දුක්ඛපටික්කූලෙ - දුක් නොපතන සෙය්‍යො භවිස්සති - පරලෙව් සුගතිසැප වන්නේ යයි අභිප්‍රායයි.

උපවිජඤ්ඤා - වදන කාලය එළඹ මේරූ ගැබ. ඉක්මනින් වදන්නේය යන අර්ථයයි. ඔපභොගගා භවිස්සති - බිරිය වන්නේය. අනයව්‍යසන - මහදුක්. අයො - සැප. න අයො - අනයො. එය සියළු ආකාර සැප වනසයි. අවුල් කරයි. ව්‍යසන මෙසේ අනයො එව ව්‍යසනං අනයව්‍යසනං - මහාදුක්ඛ යන අර්ථයයි. අයොනිසො උපාය රහිතව. අපක්කං න පරිපාචෙන්ති - පරිත්ත නොවූ ආයුෂ ක්ෂීණ නොවී අතරමග කඩති. පරිපාකං ආගමෙන්ති - ආයුෂ මේරූ කාලය පැමිණෙයි.

මෙය දම්සෙනෙවි කියන ලදී.

තුටු නොවෙමි මරණය - දිවිය ද තුටු නොවෙමි මම
කල් බලමි කුලියට - කුලීකරුවකු විලසින්

උබ්භින්දිත්වා - මැටි ආලේපය බිඳ. රාමණෙය්‍යකං - රමණීය බව. කෙළායිකා - බාල දූරිය. කොමාරිකා - තරුණ දූරිය. තුය්හං ජීවං - හීන දකින වෙලාවෙ නික්මෙන හෝ පිවිසෙන ජීවය දකිනවාද? මෙහි සිතේ හැසිරීම ජීවය යයි ගෙන කීය. හේ ද එහි ජීව සංඥීය. ජියා - දුනුදිය. බෙල්ල වෙළා යන අර්ථයයි. පත්‍යීනතතරො - දූඩිසේ තද. මෙයින් කුමක් දක්විද? ඔබ ජීවත්වන කාලයෙහි සත්‍වයාගේ පංචස්කන්‍ධය යි කියයි. චුතවන කාලයෙහි රූපසකන්‍ධය පමණක් ඉතිරි වේ. ස්කන්‍ධ තුනක් නොපවතින්නේ වේ. විඤ්ඤාණ ස්කන්‍ධය යි. ඉතිරි රූපස්කන්‍ධයෙන් ඉක්මනින් විය යුතුය. ගරුතර ද වේ. එහෙයින් කිසිවෙක් කොහෙවත් නොගියේ යයි මෙම අර්ථය දක්වයි. නිබ්බුතං - උෂ්ණය නැතිවීම. අනුපහච්ච - විනාශ නොකොට. අමතො හොති - අඩක් මළ. මරණයට පටන් ගත්තේ වේ. ඔබුනාථ - මෙතෙරෙන් කරන්න. සන්‍ධුනාථ - එතෙරින් කරන්න. නිදධුනාථ - එතෙරින් මෙතෙරින් කරන්න. තඤ්චායතනං න පටිසංවෙදෙති - ඒ ඇසින් ඒ රූපායතනය ප්‍රකාශ නොවේ. සියළු තැන මෙම නයයි.

සංඛමෙමා - සක් පිඹින්නා. උපලායිත්‍වා - පිඹ. අගගිකො - ගිනි පුදන්නා. ආපාදෙය්‍යං - නිෂපාදනය කරන්නේය. උපදවන්නේය හෝ ආයුෂ හෝ පමුණුවන්නේය. පොසෙය්‍යං - භෝජනාදියෙන් පෝෂණය කරන්නේය. වඩන්නේය. වඩෙඪය්‍යං - වෘද්ධිභවයට පමුණුවන්නේය. අරණි සහිතං - අරණි යුගල (ගිනිගානා දඬුදෙක) තිරොරාජානොපි - වෙන ජනපදයක රජවරු දනිති. අව්‍යතෙතා - විසද නොවූ. දක්‍ෂ නොවූ. කොපෙනපි - ඔව්හු මට මෙසේ කියති. ඔවුන් කෙරෙහි උපන් කෝපයෙන් ද මේ දෘෂටිගතිය හරින්නෙමි. පරිහරිසසාමි - ගෙන විචාරන්නෙමි. මකෙබන - ඔබ කියන ලද හොඳ කරුණ. ආලේප ලක්‍ෂණයෙන් ආලේපයෙන්. පලාසෙන - ඔබ සමග එකට එක කිරීමේ ලක්‍ෂණය වූ විලාසයෙන්. හරිතපණ්ණං - යම්කිසි හරිතයක්. අඩුතරමින් තෙත තෘණ පමණක් ද නොවේය යන අර්ථයයි. පනද්ධ කලාපං - සන්නද්ධ දුනු සමූහ. ආසිතෙතාදකති වටුමානි - පිරුණු ජලමාර්ගය ද කඳුරද. බහුනිකඛතතරො - බොහෝ නික්මෙත්නේ. යථා කතෙන භණ්ඩෙන - තෘණ කාෂ්ට භාණ්ඩ ආරෝපනය කොට එයින්

ගෙනෙනු ලැබීමෙන් රෝපනය කිරීමෙන් යම්සේ ගැනීමෙන් යන අර්ථයයි. **අප්පසාරානි** - අගය අඩු **පණියානි** - භාණ්ඩ. **උග්ඝරන්තං** - ඉහළට උතුරන. **පග්ඝරන්තං** - පහළට පෙරෙන. **තුම්හෙහක්ඛව්‍යා භණෙ** - මෙහි ඔබලා යහළුවනේ. **තථාහි පන මේ සූකර හත්තං** - එසේ වීම මතින් මේ ගූථො සූකරයාගේ බත්ය. **ආගතාගතං කලිං ගිලති** - ආ ආ අය පරාජය නමැති සකුරු ගිලිති. **පජොහිස්සාමි** - බිලිකර්මයක් කරන්නෙමි යන අර්ථයයි. **අකෙඛහි දිබ්බිස්සාම** - බෝලයෙන් සෙල්ලම් කරන්නෙමු.

**ලිත්තං පරමෙන තෙජසා** - පරම විසෙන් ආලේපකොට. **ගාමපට්ටනං** - වැසිවට ගම්පෙදෙසක් කියනු ලැබේ. **ගාම පදං** - යනුද පාඨයකි. මේ අර්ථයම වේ. **සානභාරං** - හණ වැහැර. **සුසන්නද්ධො** - හොඳින් බඳනා ලද්දේ. **ත්වං පජානාහි** - ඔබ දැන ගන්න. යනු කැමති නම් ගන්න. **ඛොමං** - බෝම වැහිරි. **අයං** - කලු ලෝහ. **ලොහං** - තඹ ලෝහ. **සජ්ඣු** - රිදී. **සුවණ්ණං** - රන් මාසකය. **අභිනන්දිංසු** - සතුටු වූහ. **අත්තමනො** - තුටු සිතැත්තෝ **අභිරද්ධො** - පැහැදුනේ. **පඤ්හ පටිභානාති** - ප්‍රශ්න වැටහේ. **පච්චනීකං කත්තබ්බං** - ප්‍රතිවිරුද්ධ මෙන් කළ යුතුය. ප්‍රතිලෝම **අමඤ්ඤිස්සං** - වශයෙන් ගෙන සිටියෙමි යන අර්ථයයි. **සංඝාතං ආපජ්ජන්ති** - විනාශයට මරණයට පැමිණෙති. **න මහප්ඵලං** - විපාක වශයෙන් මහත්පල නොවේ. **න මහානිසංසො** - ගුණ ආනිසංස වශයෙන් මහානිසංස නොවේ. **න මහා ජුතිකො** - ආනුභාව බැබළීමෙන් මහා බැබළීම ඇත්තෙක් නොවේ. **න මහා විප්ඵාරො** - පැතිරීම් වශයෙන් මහා පැතිරීමක් නොවේ. **බීජ නඞ්ගලං** - බීජ ද නගුල් ද **දුක්ඛෙත්තෙ** - දුෂ්කර කෙතෙහි. නිසරු කෙතෙහි. **දුබ්භූමෙ** - විසම භූමියෙහි. **පතිට්ඨාපෙය්‍ය** - වපුරන්නේය. **ඛණ්ඩානි** - සිඳුණු බිඳුණු. **පූතීනි** - නිසරු **වාතාතප හතානි** - වාතයෙන් ද අව්වෙන් ද නසන ලද හාත්පසින් මඩින ලද තේජස් ඇති. **අසාරාදානි** - සහල් සරුදාන විරහිත විපාක. **අසුඛ සයිතානි** - සැප නින්දක් නැති. **අනුපට්වෙච්ඡෙය්‍ය** - **අනුපවිසෙසෙ** - මනාව නො වැසීම. අඩමසක් දස දිනක පස් දිනක් අනුව නො වසන්නේය යන අර්ථය වේ. **අපිනු තානි** - මෙසේ කෙතෙහි බීජ වැපුරූ දොසක් ඇති කල්හි ඒ බීජ අංකුර මුල් පත්‍ර උඩ වැටේ. යට වැඩුණු හාත්පස මහත්බවට පැමිණෙන්නේද? **එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො** - රාජඤ්ඤය, දානය මෙබඳුය. අන්‍යයන් ඝාතනයෙන් උපදවන ප්‍රත්‍යයෙන් ද දෙන්නාගෙන් ද පිළිගන්නාගෙන් ද අපිරිසිදු බැවින් මහත්ඵල නොවේ.

රාජඤ්ඤය, දානය මෙබඳු ස්වරූප ඇත්තේය. පර ඝාතනයෙන් තොරව උපන් ප්‍රත්‍යයෙන් ද පරඝාතනයෙන් තොර සිල්වත් දායකයාගෙන් ද සම්‍යක් දෘෂටි ආදි ගුණ සම්පන්න ප්‍රතිග්‍රාහකයාගෙන් ද මහත්පල වේ. ඉදින් අතිරේක ගුණයෙන් යුත් නිරෝධයෙන් නැගිටි ප්‍රතිග්‍රාහකයකු ලබයිද චේතනාව මහත් වේ ද දිටඨි ධම්ම වශයෙන් මේ ජීවිතයේ ම විපාක දෙයි. සථවිරයන් ගේ මේ ධර්ම කථාව අසා පායාසි රාජඤ්ඤ තෙරුන්ට ආරාධනා කොට සත් දිනක් මහදන් දී එතැන් පටන් සියළු දෙනාට දන්වැට පිහිටු වීය. ඒ සඳහා "අථඛො පායාසි රාජඤ්ඤ" ආදිය කියන ලදී. එහි කණාජකං - කඩ සහල් වූ නො තැම්බුණු බත් බිලංග දුතියං - කැඳ දෙවැනි කොට ථෙරකානි ච වත්ථානි - මහත් වූ වසත්‍ර පිඬු දාවලු. ගුලවාලකානි - පිඬු පිඬු වශයෙන් සිටි මහත් දාවලු යන අර්ථ වේ. එවමනුද්දිසති - මෙසේ පෙන්වා දෙයි. පාදපි - පාදයෙන් ද අසක්කච්චං - ශ්‍රද්ධා නැති අශ්‍රද්ධා දානය. අසහත්ථෙන - සියතින් නොවේ. අචිත්තී කතං - ගෞරව නැතිව. ගෞරවයද නොඑලවා පහන් සිතක් ද නැතිව දුන්නේය. අපවිද්ධං - හැරදමන ලද. විසිකරණලද, වැටුණු. විනාශයට වැටුණු සුඤ්ඤං සෙරිසසකං - සේරිස්සක නම් හිස් වූ එක් රිදී විමානයකට එළඹියේය. එහි දොරකඩ මහා මහරිගසෙක් විය. එහෙයින් සේරිස්සක යයි කියනු ලැබේ.

ආයසමා ගවම්පති - ස්ථවිරයන් වහන්සේ වනාහි පෙර මනුෂ්‍ය කාලයෙහි ගොපලු දරුවන්ගේ නායකයෙක්ව මහත් වූ මහරි ගසක් මුල පිරිසිදු කොට වැලි ඉස එක් පිණ්ඩපාතික තෙර නමක් ගසමුල හිඳුවා තමා ලත් අහර පූජා කොට එයින් චුතව මහරි ගස විමන්දොර සිටියේය. එය පනස් වසකින් පලගනී. එයින් පනස්වසක් ගතවී යයි දෙවියා සංවේගයට පැමිණේ. හේ පසුකාලයේ අපගේ භාග්‍යතුන් වහන්සේගේ කාලයෙහි මිනිසෙක්ව ඉපදී ශාස්තෲන් වහන්සේගේ බණ අසා රහත් විය. පෙරපුරුදු වශයෙන් වනාහි දිවා විහරණය සඳහා ඒ විමානයට නිතර යයි. එහි වනාහි සෘතු සැපය වේ. ඒ සඳහා "තෙන ඛොපන සමයෙනායසමා ගවම්පති" ආදිය කියන ලදී. සො සක්කච්චං දානං දත්වා - හේ අනුන් සන්තක වූ ද් දානය ගෞරවයෙන් පූජා කොට එවමාරොචෙසි - ගෞරවයෙන් දන් දෙවයි ආදි නයින් දූන්වීය.

තෙරුන් ගේ ඒ දූන්වීම අසා මහජනයා ගෞරවයෙන් දන් දී දෙව්ලොව උපන්හ. පායාසි රාජඤ්ඤගේ සේවිකාවෝ ද ගෞරවයෙන්

දන් දී ඇල්ම වශයෙන් ගොස් ඔහුගේ සමීපයේ ම උපන්නාහ. දිසා චාරිකාවූ ඒ විමානය වට්ටනි වනයෙහි විය. ඒ පායාසි දෙව්පුත් තෙමේද එක් දිනක් වෙළෙන්දන්ට පෙනී තමා කළ පින කීවේය.

**පායාසි සූත්‍ර වර්ණනාව නිමි.**

**මහාවර්ග වර්ණනාව සමාප්තයි.**

# 24
## පාථික සූත්‍ර වර්ණනාව

**එවමෙම සුතං.....මලෙලසු විහරති** - පාථික සූත්‍රයයි. එහි පෙර නොවූ පද වර්ණනාවයි. **මලෙලසු විහරති** - මල්ල නම් ජනපදවාසී රජකුමාරවරු ඔවුන් ගේ නිවාසය එකම ජනපදයක පිහිටුවා ගත්හ. ඒ ජනපදයට රූඪී වශයෙන් මල්ල යයි කියනු ලැබේ. ඒ මල්ල ජනපදයෙහි. **අනුපියං නාම මලලානං නිගමො** - අනුපිය යයි මෙබඳු නමක් ඇති මල්ලයින් ගේ ජනපදයේ එක් නිගමයකි. එය ගොදුරු ගම කොට සෙවන සහ ජලය ඇති එක් වන ලැහැබක වාසය කරයි යන අර්ථයයි. ''අනොපියං'' යනු ද පාඨයකි. **පාවිසි** - පිවිසියේය. භාග්‍යවතුන් වහන්සේ තවම පිවිසියේ නැත. පිවිසෙමියි නික්මුණු බැවින් පාවිසි යයි කියන ලදී. කුමක් වාගේද? යම්සේ ගමට යමි. නික්මෙන පුරුෂයා ඒ ගමට නොපැමිණියේ ද මෙසේ කොහිදයි කී කල්හි ගමට ගියේ යයි කියනු ලැබේ. **මෙසේ එතදහොසි** - ගම සමීපයෙහි සිට හිරු බලන්නහුට මෙය විය. **අතිප්පගොබො** - බොහෝ වේලාසනය, තවම ගෙවල්වල කැඳබත් ඉදී නැත. කිම? භාග්‍යවතුන් වහන්සේ කාලය නොදන නික්මුණු සේක්ද? නොදන නොවේ. පාන්දරම භාග්‍යවතුන් වහන්සේ නුවණ දැල එලා ලොව බලන්නේ බුද්ධ ඤාණය භාර්ගව ගෝත්‍ර ජත්ත පිරිවැජියා තුළට පිවිසි බව දැක අද මම මේ පිරිවැජියාට මවිසින් පෙර කළ කාරණා ගෙනහැර දක්වා ධර්මය කියමි. ඒ ධර්ම කථාව මා කෙරෙහි ප්‍රසාද ප්‍රතිලාභ වශයෙන් සපල වන්නේයයි දැන පිරිවැජි අරමට පිවිසෙනු කැමතිව මෙසේ සිත ඉපදවීය. **එතදවොච** - භාග්‍යවතුන් වහන්සේ දැක මානයෙන් තද නොවී පෙරගමන් කොට සවාමින් වහන්ස එනුමැනවි

ආදි වචන කීවේය. ඉමං පරියායං - මේ වාරය. අද මේ පැමිණි වාරය යන අර්ථය. කිම භාග්‍යවතුන් වහන්සේ මීට පෙර ද එහි ගියවිරීද? නැත. ලෝක හැසිරීම් වශයෙන් මෙසේ කීය. ලෝකයා වනාහි බොහෝ කාලයකින් පැමිණියේ ද නොපැමිණිවිරි වූවද මනාප සවභාවයෙන් පැමිණෙනු දැක පින්වත බොහෝ කාලයකින් පැමිණියේ යයි කෙසේද ඔබ මෙහාට එන්න පාර දැනගත්තේ කිම පාර වැරදුනේ නැද්ද ආදිය කියති. එහෙයින් මෙයද ලෝක හැසිරීම් වශයෙන් මෙසේ කීයයි දත යුතුය.

ඉදමාසනං - තම හිඳි අසුන පිසදමා දෙමින් මෙසේ කීය. **සුනකඛතෙතා ලිචඡවි පුතෙතා** - සුනකඛත්ත නම් ලිච්ඡවි රාජ පුත්‍රයාගේ වනාහි ඔහුගේ ගිහි කාලයේ යාළුවෙකි. කලින් කල ඔහු සමීපයට යයි. **පචචකඛාතො** - සවාමීනි මම දැන් බගවතුන් අත්හරිමි. මම දැන් සවාමීනි බගවතුන් උදෙසා නොහැසිරෙමි. මෙසේ අත්හලේ, **භගවනතං උදදිසස** - භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාසතෘවරයාය. මම අවවාද අනුගමනය කරමි. මෙසේ පෙන්වා **පචඡාචිකඛති** - යාචකයෙක් හෝ ඉල්ලා ගත්දෙය ප්‍රතික්ෂෙප කරන්නේය. ඉල්ලාගත් දෙය යාචකයා හෝ ප්‍රතික්ෂෙප කරන්නෝය. ඔබ යාචකයෙක් ද නොවේ. යාචිතකද නොවේ. මෙසේ ඇතිකල්හි හිස් මිනිහො, කවරෙක් සමානව, කවරෙක් ඇතිව ප්‍රතික්ෂේප කරයි ද දක්වයි. **පසස මොඝපුරිස** - හිස් මිනිහො බලපන්. **යාවඤච තෙ ඉදං අපරදධං** - යම්පමණ ඔබගේ මේ කළ අපරාධය වෙයිද ඔබගේ අපරාධය යම් පමණ ද එපමණ දෝසය වේ. භාර්ගවය, මම මෙසේ ඔහුට දෝසය ආරෝපනය කෙළෙමියි නම් දැක්වීය. **උතතරිමනුසස ධමමා** - පන්සිල් දසසිල් සංඛ්‍යාත මනුෂ්‍ය ධර්මවලින් ඉහල. **ඉදධිපාටිහාරියං** - ඍද්ධියෙන් යුත් ප්‍රාතිහාර්යය. **කතෙ වා** - කළකල්හි හෝ, **යසසත්‍ථාය** - යම් දුකක් කෙළවර කිරීම සඳහා. **නීය්‍යාති තකකරසස** - ඒ ධර්මය, එය කරන්නාට, මවිසින් යම්සේ ධර්මය දේශනා කරන ලදද එසේ කරන්නාට, මනාව පිළිපන් පුද්ගලයාට සියළු සසර දුක් කෙළවර කිරීම පිණිස අමෘතමහා නිර්වාණය සාක්ෂාත් කිරීමට යන්නේද නොයන්නේද පවතීද නොපවතීද විචාරයි.

**තත්‍ර සුනකඛතත** - සුනකඛත්ත, මා විසින් දේශනා කරන ධර්මයෙහි එය කරන්නාට මනාව දුක් අවසන් කිරීමට පවතින කල්හි කිම උතුරු මිනිස්දම්වලට ඍද්ධි ප්‍රාතිහාර්යයෙන් කුමක් කෙරේද එය කිරීමෙන් කුමන ඵලක්ද? යන අර්ථයයි. එය කළත් නොකළත් මාගේ සාසනයේ

පිරිහීමක් නැත. දෙව්මිනිසුන් අමෘතමහා නිර්වාණයට පැමිණවීමට මම පාරමිතා පිරුවෙමි. ප්‍රාතිහාර්ය කිරීම සඳහා නොවේ. ප්‍රාතිහාර්යයේ නිරර්ථක භාවය දක්වා ''බලව හිස් මිනිස'' යයි දෙවන දෝෂය ආරෝපනය කළහ.

අගගඤ්ඤං - ලෝකයාගේ පැණවීම. මෙය වනාහි ලෝකයේ අග්‍රයයි මෙසේ දත යුතුය. ආර්ය වාදයෙහි මෙය අග්‍ර යයි නොපවතියි කියයි. මෙහි සෙස්ස අනනතර වාර අනුසාරයෙන් දත යුතුය. අනෙක පරියායෙන බො - මෙය කුමක් නිසා පටන් ගත්තේද? සුනකඛත්ත වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ගුණය මකන්නෙමි. දොස් දක්වන්නෙමියි මෙපණකින් විරුද්ධව කථාකොට භාග්‍යවතුන් වහන්සේගේ කථාව අසමින් නොපිහිටියේ විය.

ඉක්බිති භාග්‍යවතුන් වහනසේ සුනකඛතත, මෙසේ ඔබ ගුණමකු බවේ සිටියේ තමාම ගැරහීමට පැමිණෙන්නේයයි ගුණමකු බවෙහි ආදීනව දක්වනු පිණිස ''අනෙක පරියායෙන'' යනාදිය කීහ. එහි අනෙක පරියායෙන - නොයෙක් කරුණුවලින් වජ්ජිගාමෙ - වජ්ජි රජවරුන්ගේ ගමේ, විසාලා නගරයෙහි නො විසහි - නොහැකි විය. සො අවිසනෙතා - ඒ සුනකඛත්ත පෙර තුණුරුවන් වර්ණනා කරන විට මුව නො සෑහුනේ විය. දැන් ඒ මුවින් ම අගුණ කියයි. ඒකාන්තයෙන් නොහැකි වන්නේ. බ්‍රහමචර්යාවේ හැසිරීමට නොහැකි වන්නේ තමාගේ බාල බැවින් අගුණ කියා ගිහි බවට පැමිණියේය. බුදුන් වහන්සේ වනාහි මනාව බුදුවූයේමය. ධර්මය මනාව දේශනා කරන ලද්දේමය. සංඝයා සුපටිපන්නය. මෙසේ තුනුරුවන්ට ස්තුති කරන්නා වූ මිනිස්සු ඔබගේ ම දොස් දක්වති. ඉති බො තෙ - සුනකඛත්ත, මෙසේ ඔබගේ දොස් සතරක් වන්නේය. එයින් මෙසේ දොස් ඇති වූ කල්හි ශාස්තෘන් වහන්සේ අතීත අනාගත පසු නොබසින ඤාණයෙන් මාගේ මෙසේ දොස් ඇතිවන්නේ යයි දැනගෙනද කලින් නො කීවේය. කීමට නො ලබන්නේ යයි දක්වයි. අපකකමෙව - ඉවත්වන්නේමය. ඉවත්වන්නේ හෝ චුත වේ යන අර්ථයයි. යථා තං අපායිකො - අපායේ ඉපදීමට සුදුසු සත්‍වයා ඉවත් වන්නේ ය. එසේම ඉවත්වේ යන අර්ථයයි. එකමිදාහං - මෙයින් කුමක් දක්වේද? මේ සූත්‍රය පද දෙකකින් ආරම්භ කරන ලදි. ඍද්ධි ප්‍රාතිහාර්ය නොකෙරේ යයි ද අග්‍ර දෙය නොපණවයිද යනුවෙනි. එහි ''අග්‍ර දේ නොපනවයි'' යන පදය සූත්‍රය අවසානයේ දක්වයි. ''ප්‍රාතිහාර්ය නොකරයි'' මේ පදයේ අනුසනධි දක්වීම් වශයෙන් මේ දේශනාව ආරම්භ කරන ලදී.

එහි එකමිදාහං - එක් දවසක මම සමයං - කාලයෙහි. එක් කාලයක මම යන අර්ථයයි - බුලු යන ජනපදයෙහි කත්‍ථ විහරාමි, කත්‍ථ විහරාමි, උත්තරකා නාම - සත්‍රී ලිංග වශයෙන් උත්තරකා යයි මෙසේ නමක් වූ බුලු ජනපදයේ නිගමො ඒ නියම්ගම ගොදුරුගම කොට,

අචෙලකො - නග්න කොරකඛත්තියො - ඇතුළත වක්වූ පා ඇති ක්‍ෂත්‍රියා. කුකකුරවතිකො - සමාදන් වූ සුනඛ වත් ඇත්තේ, සුනඛයකු මෙන් ඉවකොට කයි. ලිප් බොක්කේ නිදයි. අනිත් සුනඛ ක්‍රියා කරයි. චතුකුණඩිකො චතු සංඝාටික. දෙදණ දෙවැලමිට පොළොවෙහි තබා ඇවිදියි. ඡමා නිකකිණෙණ - පොළොවෙහි විසුරුවන ලද තබන ලද භකඛාසං - කෑයුතු හෝ බුදියයුතු ආහාරයක්. මුඛෙනෙව - අතින් ස්පර්ශ නොකර කෑ යුතු දේ කටින්ම කයි. සාදුරූපො - රන්රුව. අරහං සමණො - මේ රහත් ශ්‍රමණයෙකි. එහි වත - ප්‍රාර්ථනා අර්ථයෙහි නිපාතයකි. ඔහුගේ ප්‍රාර්ථනාව මෙසේ විය. මේ ශ්‍රමණයා හා සමාන වෙන ශ්‍රමණයෙක් නැත. මෙතෙමේ අපිස් බව නිසා වසත්‍ර නො අඳියි. පමාවකියි සිතමින් භික්‍ෂා භාජනයක් පරිහරණය නොකරයි. බිමදාපු දෙයම කයි. මොහු ශ්‍රමණයෙකි. අප මොන ශ්‍රමණයෝද? මෙසේ සර්වඥ බුදුන් පසු පස යන්නේ මේ පච්කාර දේ හිතයි. එතදවොච - භාග්‍යවතුන් වහන්සේ සිතූහ. මේ සුනකඛත්ත පාප අදහස් ඇත්තෙකි. මෙසේ දැක සිතුවේ ඇයි? ඉක්බිති මෙසේ සිතන්නේ ඔහුගේ අදහස් දැන මේ හිස් මිනිසා මා වැනි සර්වඥ කෙනෙකුගේ පස්සෙන් එන්නේ නග්නයා රහතෙකැයි සිතයි. මෙහිම මේ මෝඩයන් නිග්‍රහ කිරීම සුදුසුය. නො නැවතීම මෙය ''ත්‍වමපි නාමා'' යනාදි වචන කීහ. එහි ත්‍වමපි නාමා - 'පි' කාරය ගරහ අර්ථයෙහිය. ඔහුට ගරහන්නේ භාග්‍යවතුන් වහන්සේ ත්‍වමපි නාමා යයි කීහ. ඔබ නම් මෙසේ හීන අදහස් ඇත්තේය. මම ශ්‍රමණ සාක්‍ය පුත්‍රයයි මෙසේ දැනගනීයයි යන මෙය මෙහි අදහසයි. කිං පන මෙ භනෙත - සවාමිනි මට, ගැරහීම නිසා මෙසේ අසයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට පැහැදිලි කරන්නේ, නනු තෙ - යනාදිය කීහ. මචඡරායති - අනිත් රහතකු ගැන නොවේවා. කිම භගවත්හු මෙබඳු රහතකුට මසුරු කරන්නාහුදැයි අසයි. න බො අහං - හිස් මිනිහො, මම දෙවියන් සහිත ලෝකයාට රහත් බව ලබාදීමටම බලාපොරොත්තු වෙමි. ඒ අර්ථය සඳහාම බොහෝ දුෂ්කර දේ කරමින් මා විසින් පාරමිතා සම්පූර්ණ කරන ලදී. න බො අහං මොඝ පුරිස අරහනතසස මචඡරායාමි ''පාපකං දිටඨිගතං'' රහත් නොවූවෙක් රහත්

කෙනෙකැයි ද රහත් වූවෙක් රහත් නොවූයේ යයි ද මෙසේ ඔහුට දෘෂටියක් ඇතිවිය. ඒ සඳහා පාපකං දිට්ඨි ගතං යයි කීහ.

යං ඛො පන - මේ තෙමේ මේ නග්නයා ගැන මෙසේ සිතයි. සත්තමං දිවසං - සත්වෙනි දවසෙහි. අලසකෙන - අලසක නම් රෝගයෙන්. කාලංකරිස්සති - බඩ ඉදිමී මැරෙන්නේය. කාලකඤ්ජක - ඒ අසුරයින් ගේ නම, ඔවුන්ගේ වනාහි ගවු තුනක් පමණ ශරීරය වේ. මස් ලේ රහිතය, වියලි කොල සමානය. කකුළුවන් ගේ මෙන් ඇස් එලියට පැන හිසෙහි පිහිටයි. කට ඉදිකටු මලක් මෙනි. එයින් නැමී ගොදුරු ගනී. බීරණත්ථම්භකෙ - ඒ සොහොනෙහි බීරණ තෘණ ගසක් ඇත. ඒ නිසා ඒ නම ඇතිවිය. තෙනුපසංකමි - භාග්‍යවතුන් වහන්සේ මෙපමණක් කියා ඒ ගමෙහි පිඩු පිණිස හැසිර විහාරයට වැඩිය කල්හි විහාරයෙන් පිටත්ව පැමිණියහ. යෙන ත්වං - යම් කරුණකින් ඔබ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ අන්දමින්ම යන අර්ථයයි. මත්තමත්තං - ප්‍රමාණ යුක්ත, ප්‍රමාණ යුක්ත. මනත්වා මනත්වා යනු ද පාඨයි. ප්‍රඥාවෙන් පරීක්ෂාකොට යන අර්ථය වේ. යථා සමණස්ස ගොතමස්ස - ගෞතම ශ්‍රමණයාගේ වචනය බොරුවන ලෙස කරන්නැයි කීය. මෙසේ කී කල්හි අචෙලකයා (නග්නයා) ලිප ලඟ හොත්තේ හිස ඔසවා ඇස් දල්වා බලන්නේ, මොනවා කියනවද? ශ්‍රමණ ගෞතමයා අපගේ වෛරක්කාරයාය. විසභාගයාය. ශ්‍රමණ ගෞතමයා අපට මෙසේ කියන්නේය. අනිත් විදියකින් හෝ කියන්නේය. සතුරා කෙසේ නම් බොරු කාරයෙක් නොවේද? ඔබ යන්න. මම මීට කළයුතු දේ දනිමි. මෙසේ කියා නැවත හොත්තේය. එක ද්වීහි කායා - එකක් දෙකක් කොට ගණය. යථා තං - යම්සේ විශ්වාස නොකරන්නේ කිසිවෙක් ගණින්නේ. එසේ ගැන්නේය. දවසට තුන්වරක් පැමිණ එක දවසක් ගියේය. දින දෙකක් ගියේයයි දැන්වීය. සත්තමං දිවසං - හේ වනාහි සුනක්ඛත්ත ගේ වචනය අසා දින හතක් නිරාහාරව සිටියේය. ඉක්බිති ඔහුට සත්වන දවසෙහි එක් උපසථායකයෙක් අපගේ කුලුපග ශ්‍රමණයන්ට ගෙයකට නොයන අද හත්වෙනි දවස අපහසු ඇතිවී යයි හුරු මසක් උයවා බත් රැගෙන ගොස් ඔහු ඉදිරියේ බිම දැමීය. එය දැක අචේලයා සිතුවේය. ශ්‍රමණ ගෞතමයාගේ කථා ඇත්ත හෝ බොරු හෝ වේවා. ආහාර අනුභවකර සැපවත් වූ මාගේ මරණයද හොඳ මරණයක් වේ යයි දෙ අත් දෙදණ බිම තබා කුසපුරා කෑවේය. හේ රාත්‍රිභාගයෙහි දිරවීමට නොහැකි වන්නේ අලසක රෝගයෙන් කලුරිය කෙළේය. ඉදින් ඔහු

නොකන්නේ යයි සිතන්නේය. එසේ වතුදු ඒ දිනයේ කා අලසක රෝගයෙන් කලුරිය කරන්නේය. දෙයාකාරයක් නැති කථාගත වචන.

**බීරණත්ථමහකෙ** - තීර්ථකයෝ වනාහි කෝරකඛත්තියා කලුරිය කෙළේ යයි අසා දවස් ගැණ මෙය පළමු සත්‍ය විය. දූන් ඔහු වෙන තැනක හැරදමා ශ්‍රමණ ගෞතමයන්ට බොරුවෙන් නිග්‍රහ කරන්නෙමු යයි ගොස් ඔහුගේ ශරීරය වැල්වලින් බැඳ අදින්නේ මෙතන දමන්නෙමු මෙතන දමන්නෙමු යයි යන්නේ ගිය ගිය තැන බාධාවක්ම වෙයි. ඔව්හු අදින්නේ බීරණත්ථමහක සොහොනට ම ගොස් සොහොන බව දූන වෙන තැනකට දමමු යයි ඇද්දහ. ඉක්බිති ඒ වැල් කැඩුණේය. පසුව සෙලවීමට නොහැකි විය. ඔව්හු එහිම හැර දූමූහ. එයින් කියන ලදී. **බීරණත්ථමහකෙ සුසානෙ ඡඩ්ඩසුං තෙනුපසංකම්** - කුමක් හෙයින් පැමිණියේද? හේ වනාහි සිතීය. තවම සෙසු ඒවා ශ්‍රමණ ගෞතම වචනයට සමානය. මියගිය අය නැගිට අන්‍යයන් හා කථා නැත. මම ගොස් අසමි. ඉදින් කථා කෙළේ නම් සුන්දරය. නොඑසේ නම් ශ්‍රමණ ගෞතමයන්ට බොරුවෙන් නිග්‍රහ කරන්නෙමි යි මේ කරුණින් පැමිණියේය. **ආකොටෙසි** - පහර දූන්නේය. **ජානාමි ආවුසො** - මතක කලේබරයක් නැගිට කථා කිරීමට සමර්ථ නම් නැත. මෙය කෙසේ කථා කෙළේද? බුද්ධානුභාවයෙන්. භාග්‍යවතුන් වහන්සේ වනාහි කොරකඛත්තියා අසුරයෝනියෙන් ගෙන්වා ශරීරය ආවෙශ කරවා කථා කරවීය. ඒ ශරීරයම හෝ කථා කරවීය. බුද්ධවිසය නොසිතිය හෙන්නේය. **කථෙව තං විපාකං** - උන්වහන්සේ ගේ ඒ වචනයේ විපාක එසේම වීද නැතහොත් නොවීද? ලිංග විපර්යාශය කරන ලදී. ඒ විපාකය එසේමය යන අර්ථය වේ. **කිසිවෙක් විපකකං** - යයි කියයි. ඉපදෙති යන අර්ථයවේ.

මෙහි සිට ප්‍රාතිහාර්ය එක් කළ යුතුය. ප්‍රාතිහාර්ය සියල්ලම පහක් වේ. සත්වන දවසෙහි මැරෙන්නේ යයි කියන ලදී. හේ එසේම මළේය. මේ පළමුවන ප්‍රාතිහාර්යකි. අලසක රෝගයෙන් කියන ලදී. අලසක රෝගයෙන්ම මළේය. මේ දෙවැන්නයි. කාලකඤ්ජිකයන් කෙරෙහි උපදී යයි කියන ලදී. එසේම ඉපදුනේය. මේ තෙවැන්නයි. බීරණත්ථම්භක සොහොනෙහි දමන්නේ යයි කියන ලදී. එසේම දමන ලදී. මේ සිව් වැන්නය. උපන් තැනින් අවුත් සුනකඛත්ත සමග කථා කරන්නේ යයි කියන ලදී. හේ කථා කෙළේය. මේ පස්වන ප්‍රාතිහාර්ය යයි.

**කළාරමට්ඨුකො** - තෙරා ඇති දත් නිසා හෝ මේ නාමය ඔහුට වේ. **ලාභග්ගපත්තො** - අග්‍ර වූ ලාභය පැමිණි. **යසග්ගපත්තො** - අග්‍ර පිරිවර ඇති යි කියන ලදී. වතපදානි, ව්‍රතතම. කොටස හෝ. **සමත්තානි** - ගන්නා ලදී. **සමාදින්නා** - එහිම වේවචනයකි. **පුරත්ථිමෙන වෙසාලියා** වේසාලිය ආසන්නයේ පෙර දිශාව. **චෙතියං** - යක්ෂ චෛත්‍ය ස්ථානය. සියළු තැන මෙම නයයි. **යෙන අචෙලකො** - භාග්‍යවතුන් වහන්සේ වත්කොට කලාරමට්ඨු වෙත ගියහ. **පඤ්හං පුච්ඡි** - ගැඹුරු වූ ත්‍රිලක්ෂණය ගෙනෙන ප්‍රශ්නයක් විචාළේය. **න සම්පායාසි** - මනාව ඤාණ ගතියට නොගියේය. (දැන නොගත්තේය) අන්ධයකු මෙන් ඒ ඒ තැනට පැකිලී මුලක් අගක් නො දැක්කේය. නැතහොත් න සම්පායාස සම්පාදනය නො කෙළේය. සම්පාදනය කොට කීමට නොහැකි විය. **අසම්පායන්තො** - මිශ්‍ර වර්ණයෙන් ඇස කරකවා බලන්නේ සික්ෂිත නොවූවෙක් ලඟ සිටියෙහි. අනවකාශයෙහි ද පැවිද්දන් ප්‍රශ්න විචාරමින් හැසිරෙහි. පහවෙව. මෙතන නො සිටවයි. කියන්නේ. **කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුවාකාසි** - කිපෙන ආකාරය කෝපයයි. නොඉවසනාකාරය දෝසයයි. අසතුටු ආකාර වූ දොම්නස් සංඛ්‍යාත අප්‍රත්‍යාකාරය ද ප්‍රකට කෙළේය. **ආසාදිමහසෙ** - නො ඉවසන්නේ ගැටුණේය. **මා වත නො අහොසි** - අහෝ, ඒකාන්තයෙන් මා නොවන්නේ නම් ''මා නොවූයේ නම්'' යනු ද පාඨයි. එහි 'මං' යනු සාමි අර්ථයේ කර්ම වචනයි. අහොසි ඒකාන්තයෙන් මා නුවූයේ නම් අර්ථයයි. මෙසේ ද සිතා උක්කුටිකයෙන් හිඳ සවාමීනි මට සමාවන්නැයි ඔහු කමා කෙළේය. හේ ද මෙතැන් පටන් අනිත් කිසිම ප්‍රශ්නයක් නම් නො අසන්නේද? එසේය නො අසන්නෙමි. ඉදින් මෙසේ යන්න. ඔබට සමාවුනෙමි ඔහු පිටත් කෙළේය. **පරිහිතො** - පරිදහිත ඇඳගත් වස්ත්‍ර ඇත්තේ. **සානුචාරිකා** - අනුව හැසිරෙන්නීයයි සිය බිරිය කියනු ලැබේ. සමග හැසිරීමෙන් සානුචාරික. ඔහු බඹසර හැර භාර්යාව සහ යයි අර්ථයයි. **ඔදන කුම්මාසං** - සුරා මස්වලට අතිරේකව බත් ද පිට්ටුද අනුභව කරන්නේ. **යසා නික්කිණ්ණො** - ලාභග්ග යසග්ගයට පැමිණ එයින් පිරිහී. **කතං හොති උත්තරිමනුස්ස ධම්මා ඉද්ධිපාටිහාරියං** - මෙහි සප්ත ව්‍රතපද ඉක්මවීම් වශයෙන් සප්ත ප්‍රාතිහාර්ය දතයුතුය.

**පාථික පුත්තො** - පාථික හේ පුතා. **ඤාණවාදෙන** - ඤාණවාදය සමග. **උපඩ්ඪ පථං** - අප අතරෙහි යොදුනක් වන්නේය. ගෞතම අඩ යොදුනකි. මම අඩ යොදුනකි. මේ පිළිවෙළයි අඩ යොදුන් ආදියෙනි.

එක් පියවරක්වත් ඉක්මවා ගියේ නම් ජය වන්නේය. නොයන්නා පරාද වන්නෙහිය. තෙ තත්‍ථ - ඒ අපි එහි ආරම්භ කරන ස්ථානයේ. තද්දිගුණං - එයින් එයින් දෙගුණ දෙගුණ කොට මම කරන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ සමග ඍද්ධි ප්‍රාතිහාර්ය කිරීමට අසමත් බව දැනගෙන ද උතුම් පුරුෂයකු සමග පිහිටුවා නොහැකි වූවද ප්‍රශංසා වේ යයි දැන මෙසේ කීය.

නගරවාසීහුද එය අසා අසමර්ථයෙක් නම් මෙසේ ගර්ජනා නොකෙරේ. මේ තෙමේ ද ඒකාන්තයෙන් රහතෙක් වන්නේ යයි ඔහුට මහත් සත්කාර කළහ. යෙනාහං තෙනුපසංකමි - සුනක්ඛත්ත වනාහි පාථික පුත්‍රයා මෙසේ කියතියි ඇසීය. ඉක්බිති ඔහුගේ පහත් අදහසින් පහත් දර්ශනයෙන් සිතක් උපන්නේය. ඒ භාග්‍යවතුන් වහන්සේට වත් කොට භාග්‍යවතුන් වහන්සේ ගඳකිලියට පිවිසි කල්හි පාථිකා පුත්‍රයා සමීපයට ගොස් විචාළේය. ඔබ මෙබඳු කථාවක් කෙළේද? ඔව්. එය එසේ නම් බිය නොවන්න. විශ්වාසයෙන් නැවත නැවත එසේ කියව. මම ශ්‍රමණ ගෞතමයාගේ උපස්ථායකයෙකි. උන්වහන්සේ ගේ විෂය දනිමි. ඔබ සමග පෙළහර පෑමට නොහැකි වන්නේය. මම ශ්‍රවණ ගෞතමයන්ට කියා බිය උපදවා ඔහු වෙතින් තැනකට ගෙන යමි. ඔබ බිය නොවන්න. ඔහු සනසා භාග්‍යවතුන් වහන්සේ ලඟට ගියේය. එහෙයින් කියන ලදී. ''යෙනායං තෙනුපසංකමි''. තං වාචං - ආදියෙහි මම අබුද්ධොව බුදුවීමියි හැසුරුනෙමි. නොවූ දෙයක් මම කීමි. මම බුදුනොවෙමි යි කියන්නේ ඒ වචනය දුරුකරයි. රහසිගතව හිඳ සිතන්නේ මම මෙපමණ කලක් අබුද්ධොව බුදුවීමයි හැසුරුණෙමි. මෙතැන් පටන් මම බුදු නොවේ යයි සිතන්නේ ඒ සිත දුරුකරයි. මම මෙපමණ කලක් බුදු නොවී බුදුවීමියි පවිටු දිටුගෙන හැසිරුණෙමි. මෙතැන්පටන් එම දෘෂ්ඨිය අත්හරිමියි ඒ දෘෂ්ඨිය අත්හරියි නම්. මෙසේ නොකරන්නේ ''ඒ වචනය අත්නොහැර ඒ සිත අත්නොහැර ඒ දෘෂ්ඨිය අත්නොහැර'' යයි කියනු ලැබේ. විපතෙය්‍ය - නැට්ටෙන් මිදුණු තල්ගෙඩියක් මෙන් බෙල්ලෙන් වැටෙන්නේය. සත් කඩකට හෝ පැලෙන්නේය. රක්ඛතෙතං - මෙය රකීවා. එකංසෙන - ඒකාන්තයෙන් ඔවදිතා - කියන ලදී. අචෙලො ච භනෙත පාථික පුතෙතා - මෙසේ ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන් අවවාද දීමෙන්. ඉදින් අචෙල පාථික පුත්‍රයා. විරූප රූපෙන - වෙනස් වූ රූපයෙන්. පිළිකුල් වූ සවභාවයෙන් තමාගේ රූපය හැර අදෘෂ්‍යමාන ශරීරයෙන්, සිංහ ව්‍යාඝ්‍ර සවභාවයෙන් හෝ විවිධ වූ රූපයෙන් හමුවීමට එන්නේය. තදසස භගවතො මුසා - මෙසේ

සවාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ඒ වචනය බොරු වන්නේය. මුසාවාදයෙන් නිග්‍රහ කරයි. මෙය හැර අනිකකින් භාග්‍යවතුන් වහන්සේ මුසාවාදයෙන් නිග්‍රහ නොකළවිරිය. **දවයං ගාමිනී** - සවරූපයෙන් අර්ථයෙන් ඇතිබව හා නැතිබව මෙසේ දෙයාකාර ගමන. බොරු හිස් නිෂ්ඵල වචනයෙන් යන්නට මෙය අධිවචනයකි.

**අජිතොපි නාම ලිච්ඡවීනං - සෙනාපති** - හේ වනාහි භාග්‍යවතුන් වහන්සේග් උපසථායකයෙක් විය. හේ කලුරිය කෙළේය. ඉක්බිති ඔහුගේ සිරුර කිස කොට මිනිස්සු පාථික පුත්‍රගෙන් ඇසූහ. ඉපදුනේ කොහිද? සෙනාපති. හේ කීය. මහ නිරයෙහි ඉපදුණේය. මෙය කියා නැවත කීය. තොපහේ සෙනවිපතියා මා සමීපයට පැමිණ. මම ඔබගේ වචනය නොගෙන ශ්‍රමණ ගෞතමයන්ගේ වාදයෙහි පිහිටා නිරයේ ඉපදුනෙමියි ඇඬුවේය. **තෙනුපසංකමි දිවාවිහාරාය** - මෙහි ප්‍රාතිහාර්ය කිරීම සඳහා යයි කුමක් නිසා නොකීවේද? නැතිහෙයිනි. හමුවීමක් ද ඔහු සමග නැත. කුමන ප්‍රාතිහාර්ය කිරීමක්ද? එහෙයින් එසේ නොකියා 'දිවා විහරණය' යයි කීහ. **ගහපති නෙචයිකා** - ගෘහපති මහාසාලයෝ. ඔවුන්ගේ මහත් වූ ධන ධාන්‍ය රැස්කිරීම වේ. එහෙයින් ''නෙචයිකා'' යයි කියනු ලැබේ. **අනෙක සහසසා** - දහසකින් ද ප්‍රමාණ කළ නොහැකි ගණන මෙසේ මහත් වූ පිරිස සුනකඛත්ත හැර අනිකෙක් ව රැස්කරවීමට සමර්ථ නොවේ. එනිසා භාග්‍යවතුන් වහන්සේ පෙමණ කලක් සුනක්ඛත්ත ගෙන හැසුරුණාහ. **භයං** - සිතේ උත්‍රාසය. **ඡම්භිතත්තං** - සියළු සිරුර වෙව්ලීම. **ලොමහංසො** - ලොම් කෙලින් සිටීම. හේ වනාහි සිතීය. මම ඉතා විශාල කථාවක් කොට දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගලයකු සමග ප්‍රාතිහාර්ය දක මහජනයා ඔබ ප්‍රාතිහාර්ය කිරීමට නොහැකි වන්නේ කුමක් හෙයින් තමාගේ ප්‍රමාණය නොදන ලෝකයෙහි අග්‍ර පුද්ගලයකු සමග ප්‍රතිමල්ලව වී ගර්ජනා කෙළෙහිද? කැට කැබලිති දඬුවලින් මට තලන්නේ යයි එයින් ඔහුට මහාජන සන්නිපාතය හා භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම අසා භය වෙව්ලීම ලොමු දැහැගැන්ම ඇතිවිය. හේ ඒ දූකින් මිදෙනු කැමත්තේ තින්දුකඛානුක පිරිවැජි අරමට ගියේය. එම අදහස දක්වීම සඳහා ''අථඛො භගවා'' යනාදිය කීය. **එහි උපසංකමි** - හුදෙක් නොකර එළඹියා නොවේ. එළඹ වනාහි පිරිවැජි අරමට අඩ යොදුනක් අතරෙහි පිවිසියේ, එහි සිතට ආශ්වාදයක් නොලබන්නේ අතිශයින්ම කැළඹී ආරාමය පිටුපස එක් ගොටුවක් සලකා ගැල්ලැල්ලක හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිතුහ.

ඉදින් මේ මෝඩයා කිසිවෙකුගේ කථාව අසා මෙහි එන්නේ නම් මෝඩයා නොනැසේවායි හුන් ගල්ලෑල්ල ඔහුගේ ශරීරයෙහි ඇලේවායි අධිෂ්ඨාන කළහ. අධිෂ්ඨාන සිත සමග එහි ඔහුගේ ශරීරයෙහි ඇලුනේය. හේ මහා දම්වැලකින් බැඳුනාක් මෙන් සිදුණු පා ඇත්තකු මෙන් ද විය. **අසෙසාසි** - පාථික පුත්‍රයා එහෙ මෙහෙ සොයන පිරිස ඔහුගේ පා අනුව ගොස් හිඳින තැන දන පැමිණ එක්තරා පුරුෂයෙකු විසින් ඔබ කවුරු සොයන්නේද? පාථික පුත්‍රයා තින්දුකඛාණුක පිරිවැජි අරමෙහි හුන්නේයයි කී වචනයෙන් ඇසීය. **සංසප්පති** - ගිලෙයි. එහිම හැසිරෙයි. **පාවුලා** - තට්ටම් දෙක යයි කියනු ලැබේ. **පරාභූත රූපො** - පැදුණු රූපය, විනාශ වූ රූපය හෝ ගො යුගෙහි - ගොනුන් යුත්. සියයකින් හෝ දහසකින් හෝ යුගයෙහි **ආවිජෙඣයා මා** - අදිනු ලබන්නෙමු. **ඡිජ්ජරං** - කැඩෙන්නේය. පාථික පුත්‍රයා බැන්ද තැන හෝ කැඩෙන්නේය. **දාරු පතතිකනෙතවාසි** - දර ගෙන යන්නෙකුගේ අතවැසියෙක්. ඔහුට වනාහි මෙබඳු අදහසෙක් විය. ප්‍රාතිහාර්ය තිබියේය. ශ්‍රමණ භවත් ගෞතමයා අචෙල පාථික පුත්‍රයා ආසනයෙන්වත් නො නැගිටින්නේ යයි කීහ. මම ගොස් යම්කිසි උපායකින් ඔහු ආසනයෙන් නැගිටුවම්. එපමණකින් ශ්‍රමණ ගෞතමයාව පරාජය වන්නේය. එහෙයින් මෙසේ කීය.

**සීහසස** - සිංහයෝ සතර දෙනෙකි. තිණ සීහ, කාලසීහ, පණ්ඩුසීහ කෙසර සීහ යනුවෙනි. ඒ සිංහයෝ හතර දෙනාගෙන් කේසර සිංහයා උතුම් බවට ගියේය. ඔහු මෙහි අදහස් කරයි. **මිගරඤෙඤා** - සියළු සිවුපාවුන් ගේ රජුය. **ආසයං** - නිවස, **සීහනාදං** - අභීත නාදය. **ගොචරාය පකකමෙයා** - ආහාරය සඳහා පිටත් වන්නේය. **වරං වරං** - උත්තම උත්තමා මහත් මහත් වූ. **මුදු මසෙහි** - මෘදු වූ මස්. මධුමාංස ය ද පාඨයකි. මිහිරි මස් යනු අර්ථය වේ. **අජඣුපෙයයං** - යන්නෙ නම් සීහනාදං නදිත්වා දුර්වල සතුන් පලායෙත්වා, තමාගේ සූරභාවය නිසා කරුණාවෙන් නාද කොට. **විඝාස සංවඩෙඪා** - කා ඉතිරි දෙයින් වැඩුනේ. **දිතතො** - ආඩම්බරව, ස්ථූල ශරීරයද. **බලවා** - බලසම්පන්න. **එතද හොසි** - කුමක් හෙයින් ඇතිවීද? තමා යන මාන දෝසයෙන්.

එහ පිළිවෙල කතාව මෙසේය: එක් දවසක් ඒ සිංහයා ගොදුරෙන් නැවතුනේ බියෙන් පලායන ඒ සිවලා දැක කරුණාව ඇති වී, යහළුව බිය නොවන්න. සිටින්න. ඔබ කවුදැයි ඇසීය. සවාමීනි මම ජමබුකයෙක්මි.

යහළුව ජම්බුකය, මෙතැන් පටන් මට උපස්ථාන කරන්ට හැකිවෙයිද? ස්වාමීනි උපස්ථාන කරමි. හේ එතැන් පටන් උපස්ථාන කරයි. සිංහයා ගොදුරු ගෙන එන්නේ මහත් මහත් මස් කැබලි ගෙනෙයි. හේ ඒවා ගිලදමා තුදුරු ගල්තලාවෙහි වසයි. කීප දිනකින් ථූල ශරීරව මහත් ස්කන්ධයක් ඇතිවිය. ඉක්බිති සිංහයා ඔහුට කීහ. යහළු ජම්බුකය, මම ඇඟ ප්‍රාණවත් කරන වෙලාවේ ලඟ සිට ස්වාමි බැබලේවා ස්වාමි බැබලේවා කියන්ට හැකිවෙයිද? ස්වාමීනි හැකිවන්නෙමි. හේ සිංහයා ඇඟ කිලිපොලන කාලයෙහි එසේ කරයි. එයින් සිංහයාගේ අතිරේකව තමා ගැන මානයක් ඇතිවිය. ඉක්බිති දිනක ජර සිවලා ජල කෙමියක පැන් බොන්නේ තමාගේ ඡායාව බලන්නේ තමාගේ ස්ථූල ශරීරය ද මහත් කඳද දූක්කේය. දූක ජර සිගාල යයි නොසිතා මම ද සිංහයෙක් වීමියි සිතීය. ඉක්බිති තමා තමාටම මෙසේ කීය. යහළු ජම්බුකය, ඔබ මේ ආත්මභාවයේ අනුන්ගේ ඉඳුල්කෑම යුතුද? කිම ඔබ පුරුෂයෙක් නොවේද? සිංහයාටද පා සතරකි. දළ දෙකකි. කන් දෙකකි. එක නගුටකි. ඔබටද ඒ සියල්ල ඇත. හුදෙක් ඔබට කේසර පමණක් නැත. එසේ සිතනවිට මානය වැඩිණි. ඉක්බිති ඔහුට ඒ මාන දෝෂයෙන් මේ ''කොවාහං'' ආදි හැඟීම් ඇතිවිය. **කොවාහං** - මම කවුද? සිංහ මහරජු කවුද? මගේ නෑයෙක් නොවේ. මගේ ස්වාමියා නොවේ. ඇයි මම ඔහුට යටත් පහත් වන්නේ යන අදහසයි. **සිගාලකං යෙව** - සිගාල ශබ්දයම. **හෙරණ්ඩකං යෙව** - අප්‍රිය අමනාප ශබ්දයම, **කො ච ජවෙ සිගාලො** - ලාමක සිවලා කවුද? **කොපන සීහනාදො?** සිංහ නාදය කොහෙද? සිවලාගේ ද සිංහ නාදයේ ද සම්බන්ධය කුමක්ද යන අදහසයි. **සුගතාපදානෙසු** - සුගත ලක්ෂණවල. සුගතයන්ගේ අනුශාසනාව වූ ත්‍රිවිධ ශික්ෂාවෙහි. මෙහි එහි කෙසේ නම් ජීවත් වේද? ඔහුට වනාහි සිව්පසය දෙමින් සීලාදි ගුණ සම්පන්න බුද්ධාදීන්ට දෙමුයි දෙති. ඔවුන් මොහු අබුද්ධව බුද්ධාදීන්ට නියමිත ප්‍රත්‍ය වළඳන්නේ සුගත චරිතයන්හි ජීවත් වෙති. **සුගතානි රිත්තානි** - ඔවුන් වනාහි භෝජනාදිය දෙන්නේ බුදුන්ටද බුද්ධ ශ්‍රාවකයින් ට ද දී පසුව ඉතිරි ඒවා හවස් යාමයෙහි දෙති. මෙසේ සුගතාතිරිත්ත වළඳයි නම් වේ. **තථාගතො** - තථාගත, අරහත් සම්බුදුන් අපහාස කළ යුතුය. ගැටිය යුතුය. නොහොත් තථාගතෙ යනාදිය කර්ම වචනමය. ආසාදෙ තබ්බං මෙයද බහුවචනම වේ. ඒක වචන මෙන් කියන ලදී.

**ආසාදනා** - මම බුදුන් සමග ප්‍රාතිහාර්ය කරන්නෙමි.

ගැනෙන්නෙමි. **සමෙක්ඛියානං** - සමාන කොට බලා සිතා යන අර්ථයයි. **අමඤ්ඤිං** - නැවත සිතිය. **කොත්ථු** - සිවලා. **අත්තානං විසාසෙ සමෙක්ඛිය** ගල්කෙමෙහි ඉඳුල් වතුරෙහි සවුල ශරීර බලා. **යාවත්තානං න පස්සති** - මම සිංහයාගේ ඉඳුල්වලින් වැඩුණු ජර සිවලා යයි යථාර්ථ වූ තමා නොදකී. **ව්‍යග්ඝෙසාති මඤ්ඤ** - සිංහයෙක් විය සිතයි. සිංහයා හා සමාන බල ඇති මම ව්‍යාඝ්‍රයෙක් වෙමියි සිතයි. **භුත්වාන භෙකෙ** - වලවල්වල ගෙම්බන් කා. **බල මුසිකායො** - කලව්ටෙහි මීයන් කා. **සුසානෙ ඛිත්තානි ච කොණපානි** - සොහොනෙහි දමන ලද කුණප කා. **මහාවනෙ** - මහ වනයෙහි. **සුඤ්ඤවනෙ** - හිස් වනයෙහි. **විවඩ්ඪො** - වැඩුනේ. **තථෙව සො සිගාලකං අනදි** - මෙසේ වැඩුනේ ද මිගරජ මම යයි සිතා ද පෙර දුර්වල කාලයෙහි මෙන් එසේම සිවල් හඬම නැගීය. මේ ගාථාවෙන් ද ගෙඹි ආදීන් කා වැඩුණු සිවලා මෙන් ලාභ සත්කාරයට ගිජු වූ ඔබ පාථික පුත්‍රයාම ගැටිය. ඇතුන් විසින්. **මහා බන්ධනා** - මහත් කෙලෙස් බැම්මෙන් මිදී **මහාවිදුග්ගා** - මහා විදුර්ග නම් සතර ඕඝ, ඒවායින් එතර වී නිවන් තලයෙහි පිහිටුවා.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ කථාමාර්ගයෙන් ප්‍රාතිහාර්ය නොකෙර් යයි පදයේ අනුසන්ධිය දක්වා දැන් ''අග්‍රබව නොපනවමි''යි මේ අනුසන්ධිය දක්වන්නේ ''අග්ගඤ්ඤං චාහං'' යන දේශනාව ඇරඹූහ. එහි **අග්ගඤ්ඤං චාහං** - භාර්ගව, මම අග්‍රබව දනිමි. ලොකොත්පත්ති හැසිරීම් පරම්පරාවද දනිමි. **තං ච පජානාමි** - අග්ගඤ්ඤය පමණක් නොව ඒ අග්ගඤ්ඤය ද ඊට උත්තරීතර වූ සීල සමාධිවල සිට සර්වඥ ඥානය දක්වා දනිමි. **තං ච පජානං න පරාමසාමි** - එය ද දැනගන්නේ මම මෙය දනිමියි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් පරාමර්ෂණය නොකරමි. තථාගතයන්ට පරමාසයක් නැතැයි දක්වති. **පච්චත්තංයෙව නිබ්බුති විදිතා** - තමාම තමා කෙරෙහි වූ කෙලෙස් නිවීම දැන ගන්නා ලදී. **යදභිජානං තථාගතො** - යම් කෙලෙස් නිවුමක් දැන ගන්නේ තථාගතයන් වහන්සේ. **නො අනයං ආපජ්ජති** - නිවන නොදත් තීර්ථකයන් මෙන් විපත් දුක් ව්‍යසනවලට නො පැමිණෙති.

දැන් තීර්ථකයෝ යම් අග්ගඤ්ඤ බවක් පනවත් ද එය දක්වන්නේ ''සන්ති භග්ගවා'' යනාදිය කීහ. එහි **ඉස්සර කුත්තං බ්‍රහ්ම කුත්තං** - ඊශ්වරයා කළ. බ්‍රහ්මයා කළ. ඊශ්වරයා නිර්මාණය කළ බ්‍රහ්මයා නිර්මාණය

කළ යන අර්ථයයි, බ්‍රහමයාම මෙනි ආධිපත්‍ය භවයෙන් ඊශ්වර යයි දත යුතුය. ආචරියකං - ආචාර්ය භාවය. ආචරිය වාදය. එහි ආචරිය වාද අග්ගඤ්ඤයන් නැත. අග්ගඤ්ඤය වනාහි මෙහි දේශනා කරන ලදයි එය ද අග්ගඤ්ඤයෙහි ම කියන ලදී. කුමකින් යෙදුනේද? කිම පිළියෙළ වීද. සෙස්ස බ්‍රහමජාලයෙහි විස්තර කළ නයින් ම දත යුතුය.

බිඩඩා පදුසිකං - බිඩඩා පදුසික මුල් ඇති. අසතා - අවිද්‍යාමානයෙන්, සංවිද්‍යාමාන නොවූ යන අර්ථයයි. තුච්ඡා හිස් වූ කෙළවර, සාර විරහිතයෙන් මුසා - මුසාවාදෙයන්. අභූතෙන - ඇති බවත් නොමැතිවීමෙන්. අබ්භාචික්ඛනති - අභි ආචික්ඛන්ති අසත්‍ය දෙයින් දොස් නගති. විපරීතො - විපරීත සංඥාව, විපරීත සිත. භික්ඛවො ච ශ්‍රමණ පමණක් නොව ගෞතමයාමද යමෙක් ගැලපීම් කෙරෙත් ද, ඒ භික්‍ෂූහු ද විපරීතය. ඉක්බිති, යමකු සඳහා විපරීත යයි කියත්ද ඔහු දැක්වීමට "සමණො ගොතමො" යනාදිය කියන ලදී. සුභං විමොක්ඛමං - වර්ණ කසිණ. සුභාතෙතව - සුබද අසුබද සියල්ල සුබයයි හැඳින ගනී. සුභාතෙතව තසමිං සමයෙ සංජානාති - සුබම යයි ද එසමයෙහි දැනගනී. අසුබ නොවේ යයි දැනගනී. භික්ඛවො ච - යමෙක් මෙසේ කියති. ඔවුන්ට භික්‍ෂූහු අනෙතවාසික ශ්‍රමණයෝ විපරීතය. වෙනස් වේ. පහොසි - සමර්ථ, ප්‍රතිබල. දුක්කරං ඛො - මේ පිරිවැජියා මෙසේ පැහැදුනේ සවාමීනි මම යනාදිය කීය. එය සඨබවින් කුහකබවින් කීය. මෙසේ ඔහුට අදහසෙක් විය. ශ්‍රමණ ගෞතමයා මට මෙපමණ ධර්මකථා කීවේය. මම එය අසාද පැවිදිවීමට නොහැකි වෙමි. මවිසින් මේ සාසනයට පිළිපන්නකු සේ වීමට වටීයයි එයින් ඔහු කට්ට බැවින් කුහක බැවින් මෙසේ කීය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහුට මම ගැටෙන්නේ මෙන් භාර්ගවය මෙය දුෂ්කරය. අන්‍ය දෘෂ්ඨිකයකු වූ ඔබ විසින් යනාදිය කීහ. එය පොට්ඨපාද සූත්‍රයෙහි කියන ලද අර්ථය ම වේ. සාධුකමනුරක්ඛ - රැකීම යහපත්. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රසාද මාත්‍රය රැකීමෙහි පිරිවැජියා යෙදවූහ. හේද මෙසේ මහත් වූ සූත්‍රාන්තයක් අසාද කෙලෙසුන් නැසීමට නොහැකි විය. දේශනාව වනාහි මතු වාසනාව සඳහා ප්‍රත්‍ය විය. සෙසු සියල්ල නොගැඹුරු වේ.

පාථික සූත්‍ර වර්ණනාව නිමි.

# 25

## උදුම්බරික සූත්‍ර වර්ණනාව

මා මෙසේ අසන ලදී යනු උදුම්බරික සූත්‍රයයි. මේ එහි පෙර නොවූ පද වර්ණනාවයි. **පරිබ්බාජකො** - ඡන්න පිරිවැජියාය. **උදුම්බරිකාය පරිබ්බාජකාරාමෙ** - උදුම්බරික දේවියට අයත් පිරිවැජි අරමෙහි. **සන්ධානො** - ඔහුගේ නම වේ. මේ තෙමේ මනා අනුභාව ඇත්තේය. පිරිවර සමග හැසිරෙන්නේය. උපාසකවරුන් පන්සියයකට නායක පුරුෂයාය. අනාගාමි වූවෙකි. භාග්‍යවතුන් වහන්සේ මහ පිරිස් මැද මෙසේ වර්ණනා කරන ලදී. ''මහණෙනි, අංග හයකින් යුක්ත සන්ධාන ගෘහපතියා තථාගතයන් කෙරෙහි නිෂ්ඨාවට ගියේ සද්ධර්මයෙහි පැහැදුනේය. කවර නම් සයකින් ද? බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් ධර්මය කෙරෙහි අචලප්‍රසාදයෙන් සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් ආර්ය සීලයෙන්, ආර්ය ඤාණයෙන්, ආර්ය විමුත්තියෙනි, මහණෙනි, මේ කරුණු හයෙන් යුත් සන්ධාන ගෘහපතියා තථාගතයන් කෙරෙහි නිෂ්ඨාවට ගියේ ධර්මය කෙරෙහි පැහැදුනේය.

හේ අළුයම උපෝෂථාංග අධිෂ්ඨාන කොට පෙරවරුයෙහි බුදුන් ප්‍රමුඛ සංඝයාට දන් දී භික්ෂූන් විහාරයට ගිය කල්හි කුඩා දරුවන්ගේ ගෘහස්ථ අයගේ ශබ්දයෙන් කරදරයට පත්ව ශාස්තෲන් සමීපයෙහි ධර්මය අසමියි නික්මෙන්නේ එයින් කියන ලදී. මහ දවල් රජගහ නගරයෙන් නික්මෙන්නේ එහි දිවා දිවසස - මධ්‍යහ්නයෙහි නික්මේ. එහි දවල් කාලයද ඉක්ම වූ මධ්‍යම වෙලාවෙහි නික්මුනේය යන අර්ථයයි. **පතිසලලීනො** - ඒ ඒ රූපාදි ගෝචරවලින් සිත වලක්වා සැඟවුනේ ධ්‍යානයෙහි ඇලී සේවනය වශයෙන් ඒකීයභාවයට ගියේය. **මනොභාවනීයානං** - මනස වඩන්නන්ගේ යම් ආවර්ජනයකින් මෙනෙහි කිරීමෙන් සිත නීවරණ රහිත වූවේ. උසස් වේ. වැඩේ. **උනනාදිනියා** - ආදිය පොට්ඨපාද සූත්‍රයෙහි විස්තර කළ පිළිවෙළින් දත යුතුය. **යාවතා** - යම් පමණ. **අයං තෙසං අඤ්ඤතරො** - මෙතෙමේ ඔවුන්ගේ අභ්‍යන්තර එක් ශ්‍රාවකයෙකි. භාග්‍යවතුන් වහන්සේගේ ගිහි අනාගාමි ශ්‍රාවකයෝ පන්සියයක් රජගහ නුවර වෙසෙති. ඔවුන්ගේ එකිනෙකාට පිරිවර පන්සියය බැගින් වේ. ඔවුන් සඳහා මේ තෙම ඔවුන්ගෙන් එක්කෙනෙකුයි කීය.

අපෙපවනාම - ඔහුගේ පැමිණීම ප්‍රාර්ථනා කරමින් කීය. ප්‍රාර්ථනා කරුණු පොට්ඨපාද සූත්‍රයෙහි කියන ලදමය. එතදවොච - එන්තේ අතරමග ඔවුන්ගේ කතාව අසනලද බැවින් මෙය "අඤ්ඤථා ඛො ඉමෙ" යනාදි වචන කීවේය. එහි අඤ්ඤතිත්ථියා දර්ශනයෙන් ද ආකල්පවලින් පැවැත්මෙන්ද ආචාරයෙන් ද විහරණයෙන් ද ඉරියව්වලින් ද අන්‍ය වූ හෙයින් අන්‍ය තීර්ථක වේ. සංගමම සමාගමමා - හිඳින තැන්වල සමූහ වී. අරඤ්ඤ වන පත්ථානි - ගම් උවසරින් මිදී දුර සේනාසන. අප්පසද්දානි - වසන උපචාරයෙන් යන්නා වූ මගින්ගේ ද මද ශබ්ද ඇති පනතානි - ඉතා දුර වූ. අප්පනිගෙඝාසාති - භාවිතා නොකිරීමෙන් මද ඝෝසා ඇති. විජනවාතා - ඇතුළත හැසිරෙන ජනයාට සුළඟ නැති. මනුසසරාහ සෙය්‍යකානි - මිනිසුන්ගේ රහස් කරුණුවලට යුතු සුදුසු. පටිසල්ලාන සාරුප්පානි - එකඟබව අනුරූප වූ. මෙසේ සන්ධාන ගෘහපතියා අහෝ මාගේ ශාස්තෘවරයා මෙබඳු වූ සේනාසනයක් සේවනය කෙරේ යයි ඇඳිලි බැඳ සිරසෙහි තබා මේ උදානය පවත්වමින් සිටියේය.

එවං වුතෙත - මෙසේ සන්ධාන ගෘහපතියා විසින් උදානය පවත්වමින් කී කල්හි නිග්‍රොධ පිරිවැජියා මේ ගෘහපති මා ලඟ ඉඳගෙන ද තමාගේ ශාස්තෘවරයාටම ප්‍රශංසා කරයි. උසස් ලෙස ගුණ වණයි. මම සිටිනවාද කියාවත් නොහඟියි. මොහු කෙරෙහි උපන් කෝපය ශ්‍රමණ ගෞතමයන් මත හෙළන්නෙමියි සන්ධාන ගෘහපතියාට මෙසේ කීය. යගෙඝ - චොදනාර්ථ යෙහි නිපාතයකි. ජානෙය්‍යාසි - අවබෝධ කරගන්නේද? බලන්නේද? කෙන සමණෙ ගොතමො සද්ධිං සල්ලපති - කුමන කරුණකින් කුමන පුද්ගලයකු සමග ශ්‍රමණ ගෞතමයෝ කථා කෙරෙත්ද? කියයිද බෙණෙයිද? කුමක් කියන ලද්දේ වේද? ඉදින් කිසියම් කතා කිරීමක් වන්නේද එසේ නැතහොත් ශ්‍රමණ ගෞතමයන් ලඟට කතා කිරීමට කැමති කිසිවෙක් යන්නේද කතා කරන්නේය. එබඳු කරුණක් නැත. උන්වහන්සේ ලඟට කිසිවෙක් නොයයි. ශ්‍රමණ ගෞතම සමග කතා කරන්නේ කවුද? කතා නොකරන්නේ කෙසේ නාදයක් ඇතිවන්නේද. සාකච්ඡා - සැසඳීම පඤ්ඤාවෙය්‍යත්තියං - උත්තර ප්‍රතිඋත්තර නයින් නුවණැති බව. සුඤ්ඤාගාරගතා - ශූන්‍යාගාරවල නටුවෝ. ශ්‍රමණ ගෞතමයා විසින් බෝමැඩදී අප්‍රමාණ වූ ප්‍රඥාවක් අවබෝධ කෙළේය. එයද ශූන්‍යාගාරවල එකළකා සමග හිඳීමෙන් නැතිවිය. ඉදින් මා මෙන් ගණයා සමග එක්වී හුන්නේ නම් ප්‍රඥාව

විනාශ නොවන්නේ යයි දක්වයි. අපරිසාවචරෝ - අවිසාරද බැවින් පිරිස හැසිරවීම නො හැකිය.

නාලං සලලාපාය - අල්ලාප සල්ලාපයේ යෙදීමට අසමර්ථය. අනතමනතානෙව - කිසිවෙක් මගෙන් ප්‍රශ්න විචාරයි. ප්‍රශ්නයට බිය වී ඈතින් ඈතින් තිබෙන ප්‍රාන්ත සේනාසන සේවනය කරයි. ගොකාණා - එක් ඇසක් නට කණ එළදෙන. ඇය වනාහි කෙළවර හැසිරෙන්නී වේ. ඈත ඈතම සේවනය කරයි. ඇය කණ ඇස් ඇති බැවින් වනාන්තරය අභිමුඛ වූවද යැමට නොහැකි වේ. කුමක් හෙයින්ද? යම්හෙයකින් පත්‍රයකින් හෝ ශාඛාවකින් හෝ කටුවකින් හෝ පහරට බිය වේ. ගොනුන් අබිමුවට යැමට ද නොහැකි වේ. කුමක් හෙයින්ද? යම් හෙයකින් අඟින් හෝ කනෙන් හෝ වලිගයෙන් හෝ පහරට බියෙනි. ඉංඝ - චෝදනාර්ථයෙහි නිපාතයකි. සංසා දෙය්‍යාම - එක් ප්‍රශ්නයක් අසන විටම ගිලීගිය විසාදයට පැමිණේ. තුචජකුමභී ව නං - ඔහු හිස් කළයක් මෙනි. ඔරොධෙය්‍යාම - වෙලන්නෙමු. පිරුණු කළය එහෙමෙහෙ පෙරළා ඔතා බැඳීමක් නොවන්නේය. හිස් කළය රුචි සේ පෙරළා වෙලීමට හැකිවේ. එසේම නසන ලද ප්‍රඥාව ඇති හිස් කළය සමාන ශ්‍රමණ ගෞතමයා වාද වෙළීමෙන් හාත්පසින් වෙලන්නෙමු යයි කියයි. මෙසේ පිරිවැජිය, ශාස්තෘන්ගේ රන්වන් නලාට මණ්ඩලයට නින්දා කරන්නේ දසබල බුදුන්ගේ පරාමුඛයෙහි තමාගේ බලය දක්වන්නේ අසම්භින්න වූ ක්‍ෂත්‍රිය කුමාරයාට ජාතියෙන් ගටන්නේ සැඩොල් පුතකු මෙන් බියනැති කේසර සිංහ මෘග රජුගේ වීර්යයෙන් ගටන ජර සිවලකු මෙන් ද නානාප්‍රකාර හිස් ගැජුම් ගැජී, (ශබ්ද පැවැත්වී) උපාසක ද සිතීය මේ පිරිවැජියා අතිශයින් ගර්ජනා කරයි. අවීචිය ස්පර්ශ කිරීමට පයද භවාග්‍රය ගැනීමට අත ද ප්‍රසාරණය කරන්නා මෙන් නිරර්ථකව උත්සාහ කරයි. ඉදින් මාගේ ශාස්තෘන් වහන්සේ මෙතනට පැමිණෙන්නේ නම් මේ පිරිවැජියාගේ භවාග්‍රය දක්වා ඔසවා ඇති මාන කොඩිය ස්ථාන වශයෙන් පාත් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ ද මේ කථා සල්ලාපය ඇසූවේමය. එහෙයින් කියන ලදී: ''අසොසාසි ඛො ඉමං කථා සලලාපං'' සුමාගධාය - සුමාගධා නම් පොකුණ. එහි ඉවුරෙහි සිටින්නේ. එක්තරා පුරුෂයෙක් පියුම්නාල අතරෙන් අසුරභවනයට පිවිසෙන අසුර සේනාව දැක්කේය. මොරනිවාපො - නිවාප යනු බත්ය. මොනරුන්ට අභය සමග නිවාප දුන් සථානය යන අර්ථයයි. අබෙභාකාසෙ - මිදුලෙහි අසසාසපපතතා - සතුටට පැමිණ, සොම්නසට පැමිණ අජඣාසයං - උතුම් නිශ්‍රය වූ. ආදි

බ්‍රහමචරියං - පුරාණ ආදි බ්‍රහම චරිය වූ ආර්ය මාර්ගය, පුරා රහත් අධිගම වශයෙන් සතුටට පැමිණ දැනගනී. විපපකතා - මාගේ පැමිණීමේ හේතුවෙන් අවසන් නොවී සිටී. කියව මම එය අවසන් කොට මුදුන් පමුණුවා දක්වමියි සර්වඥ පවාරණයෙන් පැවරූහ.

දුජ්ජානං බො

භාග්‍යවතුන් වහන්සේ පිරිවැජියාගේ වචනය අසා මේ පිරිවැජියා මා විසින් ශ්‍රාවකයන්ට දෙසිය යුතු දහම් ඔවුන් විසින් පුරනු ලබන ප්‍රතිපත්ති විචාරයි. ඉදින් මම ඔහුට මුල් පටන් කියන්නේ එසේ කීවද නොදැන ගන්නේය. මෙතෙම වනාහි වීර්යයෙන් පාපයට පිළිකුල් කරන වාද ඇත්තෙකි. මම ඔහුගේ විෂයෙන්ම ප්‍රශ්නයක් විචාරා වෙන් වූ ශ්‍රමණයන්ගේ ලබ්ධියේ නිරර්ථකභාවය දක්වන්නෙමි. ඉන්පසු මේ ප්‍රශ්නය පැහැදිලි කරන්නෙමියි සිතා ''දුජ්ජානං'' යනාදිය කීහ. එහි සකෙ ආචරියකෙ - තමාගේ ආචරිය වාදයෙහි. අධිජෙගුච්ඡෙ - වීර්යයෙන් පාප ජිගුච්ඡනය. පව් දුරු කිරීම. පරිපුණ්ණා - පිරිසිදු. කථං අපරිපුණ්ණා - කෙසේ අපිරිසිදුවේදැයි මෙසේ විචාරයි.

යත්‍රහි නාම - යමෙක් නම්, අප්පසද්දකත්වා - රාවය නැති අල්ප ශබ්ද කොට, හේ සිතීය. ශ්‍රමණ ගෞතමයා එක ප්‍රශ්නයක්වත් නොකියයි. ඔහුගේ සල්ලාප කථාද බොහෝ නැත. මොව්හු වනාහි මුල පටන් ම ශ්‍රමණ ගෞතමය අනුව පවතිත් ප්‍රශංසා ද කරත්. මම මොවුන් නිශ්ශබ්ද කොට තමාම කියමි. හේ එසේ කෙළේය. එහෙයින් ''අප්ප සද්ද කත්වා''යි කියන ලදී. තපොජිගුච්ඡවාදා - ආදියෙහි තපො ජිගුච්ඡ කියමි. මනසද එයම සාරකොට ගෙන හැසිරෙමු. කයින් ද එහිම ඇලී නානාප්‍රකාර අත්තකිලමථානු යුක්තව වාසය කරමු යන අර්ථයයි.

තපස්සි - තප නිශ්‍රිත වූ, අචෙලකො - ආදිය සීහනාද සූත්‍රයෙහි විස්තර කළ නයින්ම දත යුතුය. තපං සමාදියති - අචෙල භාවාදිය සිදුකරන තපස මනාව ගනියි. දැඩිසේ ගණියි. අත්තමනො හොති - මට වගේ මේ තපස ඇති වෙන කෙනෙක් සිටීදැයි තුටු සිතැත්තේ වේ. පරිපුණ්ණ සංකප්පො - මෙපමණකින් ඇතැයි මෙසේ අවසන්වූ අදහස් ඇති. මෙයද තීර්ථකයන්ගේ වශයෙන් ආවකි. සාසනාවචරයෙන්ද දැක්විය යුතුය. ඇතමෙක් ධූතාංග සමාදන් වෙති හේ එම ධූතාංගයෙන් මා වැනි ධූතාංගධරයෙක් වෙන කවුදැයි පිරුණු අදහස් ඇති නිසා සතුටු

වේ. **තපසසිනො උපක්කිලෙසො හොති** - තපස්හුගේ මේ උපක්ලේශය දෙවිධියකින් යුක්තය. මෙපමණකින් මේ තපස උපක්ලේශයකැයි කියමි. **අත්තානුක්කංසෙති** - කවරෙක් මා හා සමාන වේදැයි තමා උසස් කරයි. උසස්ව තබයි. **පරං වමෙහති** - මෙතෙම මා හා සමාන නොවේ යයි අනුන් බහා තබයි. පහත්කොට තබයි. **මජ්ජති** මාන මද කරණයෙන් මත් වේ. **මුච්ඡති** - මුසපත් වේ. **පමාදමාපජ්ජති** - මෙයම සාරය යයි පමාවට පැමිණ, සාසනයේ පැවිදි වූයේ ද ධුතංග ශුද්ධික වේ. කමටහන් ශුද්ධික නොවේ. ධුතංගයම රහත් බව මෙන් සාර වශයෙන් පැමිණේ. **ලාභසක්කාර සිලොකං** - මෙහි සිව්පසය ලැබේ යයි ලාභ වේ. ඒවාම මනාකොට පිළියෙළ කොට ලැබුයේ සත්කාරය වේ. වර්ණනා කරන්නේ සිලෝක වේ. **අභිනිබ්බත්තෙති** - අචේලකාදි භවය හෝ තෙළෙස් ධුතංග සමාදානය හෝ නිසා මහා ලෝභයක් උපදී. එහෙයින් අභිනිබ්බත්තෙත යයි කියන ලදී. මෙහි සෙස්ස පෙරවාරයෙහි නයින්ම දෙයාකාර තපස්සීහු වශයෙන් දත යුතුය. **වොදාසං ආපජ්ජති** - දෙයාකාරව පැමිණේ. දෙකොටසක් කරයි. **ඛමති** - කැමති වේ. **නඛමති** - නො කැමති වේ. **සාපෙක්ඛො පජහති** - තෘෂ්ණාව සමග දුරුකරයි. කෙසේද? උදේම කිරිබත් අනුභව කරන ලද්දේ වේ. ඉක්බිති ඔහුට මස් භෝජන පිළිගන්වයි. ඔහුට මෙසේ අදහස් වේ. දැන් මෙබඳු දෙයක් කවදා ලැබේද? ඉදින් මා දන්නේ නම් උදේම කිරිබත් නොවළඳන්නෙමි. කුමක් කරන්නටද? පින්වත යන්න ඔබ වළඳන්න. ජීවිතය අත්හරින්නාක් මෙන් අපේක්ෂා සහිතව දුරුකරයි. **ගථිතො** - දෘඪ ලෝභය හටගත්තේ, **මුච්ඡිතො** බලවත් තෘෂ්ණාවෙන් මූර්ජිත වූයේ, සිහි නැති වී **අජ්ඣාපන්නො** - ආමිශයෙහි අතිශයින් ඇලුනේ. ඇවැත්ති වළඳවයි ධර්ම නිමත්තතයකුදු නොකොට මහත් මහත් පිඩුකරයි. **අනාදීනව දස්සාවී** - ආදීනව මාත්‍රයකුදු නො දකියි. **අනිස්සරණ පඤ්ඤො** - මෙහි පමණ දන්නා බව අපේක්ෂා රහිත ප්‍රත්‍යවේක්ෂා පරිභෝග මාත්‍රයකුදු නොකරයි. **ලාභ සක්කාර සිලොක නිකන්ති හෙතු** - ලාභාදියෙහි තෘෂ්ණා හේතු **සංභක්ඛෙ** - මනාසේ විකා කයි. **අසනිවිචක්කං** - ගුලි සටහණක් ඇති හෙනය. මෙය කියන ලද්දේ වේ. **හෙනගුලිය** - මෙහි දත්කුළු මුල බීජාදියෙහි කිසිවක් නොබිඳියි. ඉක්බිති ව වනාහි ශ්‍රමණ ප්‍රවාදයෙන් ශ්‍රමණ යයි දැනගනීයයි මෙසේ නින්දා කරති. පහත්කොට තවයි. මෙය තීර්ථක වශයෙන් ආවේය. භික්ෂු වශයෙන් වනාහි මෙහි මේ යෝජනාවේ: තමා විසින් ධුතංගධර වේ. හේ අන්‍යයන්ට මෙසේ නින්දා කරයි. කිම ශ්‍රමණයෝ නම්, මොව්හු ශ්‍රමණයෝ යයි කියති. ධුතංග මාත්‍රයකුදු නැත. උද්දේශ බත්

ආදිය සොයන්නේ ප්‍රත්‍ය බහුලව හැසිරෙති. ලුඛා ජීවිං අචේලකාදි වශයෙන් හෝ ධුතාංග වශයෙන් හේ රළු දිවි පැවැත්ම. ඉසසාමච්ඡරිය - අනුන්ගේ සත්කාරාදි සම්පත්වලට දොස් නැඟීම් ඊර්ෂ්‍යාවය. සත්කාරාදි කිරීම් ආක්‍රමණ ලක්‍ෂණය මසුරු බවය. ආපාථක නිසාදි හොති - මිනිසුන්ගේ ආපාථයෙහි දර්ශනාදිය හිඳියි. යම්තැනක ඔව්හු බලත් ද එහි සිට වවුලා මෙන් ඔහු හැසිරෙයි. පංචතාපයෙන් තැවෙයි. එක් පයින් සිටියි. හිරු නමදියි. සාසනේ පැවිදිවූයේ ද සමාදන් වූ ධුතාංගය මුළු රෑ නිදා මිනිසුන්ට පේන්ට තපස් රකියි. සවස් කාලයෙහි සිවුරු කුටි කරයි. හිරු උදා වූ කල්හි හකුලයි. මිනිසුන් ආ බව දැන ලීයෙන් පැහර සිවුර මත තබා සක්මනට බසී. මුසුන ගෙන විහාරමළුව අමදියි. අත්තානං - තමාගේ ගුණ. අදසසයමානො - මෙහි අ කාරය නිපාත මාත්‍රයකි. දක්වන්නේ යනු අර්ථය වේ. ඉදමපි මෙ තපසචි - මගේ මේ ක්‍රියාවද මගේම තපසකි. හේද අසවල් තැන අචේලකයෙක් ඇත. මුතතාචාර ආදිය අසා ඒ න්‍යාය අපගේය. හේ අතවැසියෙකි ආදිය කියයි. අසවල්තැන වනාහි පංසුකූලික භික්‍ෂුවක් ඇත. ආදිය අසා එය අපගේ තපසකි. හේ අතවැසියෙකියි ආදිය කියයි. කිංචිදෙව - කිසි වරදක්. දෘෂ්ටිගත හෝ, පටිච්ඡනනං සෙවති - අනිත් අයට නොදැනෙන්න සේවනය කරයි. අඛමමානං ආහ ඛමති - අකමැත්තේ ද කැමති යයි කියයි. තමා විසින් කරන ලද මහත් වරදක් සුළුකොට පෙන්වයි. අනුන් කළ දුෂ්කර මාත්‍රාවක් ඉක්වීමද පාරාජික සමාන කොට දක්වයි. අනුඤ්ඤෙය්‍යං - අනු දත යුතු අනුමෝදනා විය යුතු. කොධනො හොති උපනාහි - කිපෙන ලක්‍ෂණ ක්‍රෝධයෙන් වෛරය ඉවත් නොකිරීම් ලක්‍ෂණයෙන් වූ උපනාහයෙන් ද යුක්ත වූ, මකඛි හොති පලාසි - අනුන් ගුණ මකන ලක්‍ෂණයෙන් මකුබවින් එකට එක කිරීම් ලක්‍ෂණයෙන් වූ පලාසයෙන් ද යුක්ත වූ, ඉසසුකී හොති මච්ඡරී - පර සත්කාර ආදියෙහි දොස් දැක්වීම ලක්‍ෂණය වූ ඊර්ෂ්‍යාවෙන් ආවාස කුල ලාභ වර්ණනා ධර්මවල මසුරුවන ලක්‍ෂණයෙන් පංචවිධ මසුරුබවින් ද යුක්ත වූයේ වෙයි. තදෙධා හොති අතිමානී - ස්නෙහ නැති කරුණා නැති ලක්‍ෂණය වූ ථම්භයෙන් ඉක්මවා හඟින ලක්‍ෂණ වූ අති මානයෙන් යුකතව සඨො හොති මායාවි - කෛරාටික ලක්‍ෂණය වූ සඨබවින් කරන ලද වැසීම් ලක්‍ෂණය වූ මායාවෙන් ද යුක්ත වූයේ වෙයි. පාපිචෙඡා හොති - නැති දෙයක් දැක්වීම ප්‍රාර්ථනා ලක්‍ෂණයෙන් පව්ටුබවින් යුක්ත වූයේ වෙයි. පාපිකානං - එබඳු වූ ලාමක ආශාවන්ගේ වසඟයට ගියේ. මිචඡා දිට්ඨිකො - නත්‍ථිදින්නං දුන් දෙයින් පලක් නැත ආදි නය පැවතීමෙන් වූ අයථා

දෘෂ්ඨියෙන් යුක්ත වූ. අනතගගාහිකො යා - ඒ දෘෂ්ඨියම උච්ඡේද අන්තය ගත් බැවින් අනතගගාහික යයි කියනු ලැබේ. එය යුක්ත වූයේය යන අර්ථයයි. ''සංදිට්ඨි පරාමාසි'' ආදියෙහි තම දෘෂ්ඨිය සංදිට්ඨි වේ. සංදිට්ඨියම පරාමර්ශනය කොට හැසිරේ යයි සංදිට්ඨි පරාමාසි වේ. ආධානං දෘඪසේ තබන ලද යයි කියනු ලැබේ. එසේ කොට ගණී යයි ආධානගාහී වේ. කවුඩා මෙන් අත්හැරවීම නො හැකි වේ යයි දුපපටිනිසසගගි - වේ. යදිමෙ - යදි ඉමෙ. ඉදින් මොව්හු. ඉද නිග්‍රොධ තපසසි - මෙසේ භාග්‍යවතුන් වහන්සේ අන්‍ය තීර්ථකයින් විසින් ගන්නා ලද ලබ්ධිය ඔවුන් විසින් රක්නා ලද තපස සියල්ලම කිලිටි යයි උපක්ලේශ පෙල දක්වා දැන් පිරිසිදු පෙල දැක්වීමට දේශනය ආරම්භ කරන්නේ ''ඉධ නිගෙගාධ'' යනාදිය කිහ. මෙහි ''න අතතමනො'' ආදිය කී කල්හි විපක්ෂ වශයෙන් දැනගත යුතුය. එවං සො තසමිං ඨානෙ පරිසුදෙධා හොති - මෙසේ හේ තම සිත සම්පූර්ණ සංකල්පනාව සංඛ්‍යාත කරුණින් පිරිසිදු කෙලෙස් නැති වේ. ඉදිරියට උත්සාහ කරන්නේ කමටහන් ශුද්ධිකයෙක්ව රහත් බවට පැමිණේ. මෙම නයින් සියළු වාරවල අර්ථ දත යුතුය.

අදධා ඛො භනෙන - සවාමීනි මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් ම වීර්යයෙන් පාපජිගුච්ඡන වාදය පිරිසිදුවේ යයි අනුදන්නේ ද? මෙයින් ඉහළට අග්‍රබව හෝ සාරබව හෝ නොදන්නේ අගගපපතතා සාරපපතතා යයි කීය. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ සාරපපතතභාවය ප්‍රතිසෝධනය (ඉවත දමන්නේ) කරන්නේ ''න ඛො නිගෙගාධා'' යනාදිය කීහ. පපටික පතතා හොති - හරවත් ගසක හරය පොතු ද එලය ද ඉක්මවා දැකිය යුතුය. පාප ජිගුච්ඡ පිරිසිදු බව බාහිර පපටිකා (පොතු) දක්වයි. අගගං පාපෙතු - දේශනා වශයෙන් අගට පමුණුව දේශනා කරනු මැනවි. සාර බවට පමුණුවා දේශනා කරනු මැනවි යයි දසබල බුදුන් අයදියි. චාතුයාම සංවර සංවුතො - සතරාකාර සංවරයෙන් වසන ලද. න පාණමතිපාතෙ ති - ප්‍රාණ නො නසති. න භාවිතමාසිංසති - භාවිතය නම් ඔවුන්ගේ සංඥාවෙන් පංචකාම ගුණය ඔවුහු න ආසිංසති - සේවනය නොකෙරේ යන අර්ථයයි. අදුං චසස හොති - මෙය ද දැන් කියනු ලබන හේ අත්නොහරියි ආදි ලක්ෂණ. තපසසිතාය - තපස්බවෙහි වේ. එහි සො අභිහරති - හේ ඒ සීලය රකියි. ඉහළට ඉහළට වඩයි. සීලය සම්පූර්ණ වී තපස අරඹන ලද්දේ මෙතෙකින් ඇතැයි වීර්ය අත් නොහරියි. සො හීනයාවතතති - හීන වූ ගිහී භාවයට නොපැමිණේ.

සීලයෙන් ඉහළට විශේෂ අධිගමය සඳහා වීර්ය කරන්නේමය. මෙසේ කරන්නාවූ හේ විවේක සේනාසනය භජනය කරයි. අරඤ්ඤං - ආදිය සාමඤ්ඤඵල සූත්‍රයෙහි විස්තර කරන ලද්දේමය. "මෙත්තා සහගතෙන" ආදිය විසුද්ධි මග්ගයෙහි වර්ණනා කරන ලදී.

තචප්පත්තා - පොතුවලින් ඇතුළට සුඹුල පැමිණේ. ඵෙග්ගුප්පත්තා සුඹුලුවලින් ඇතුළට එළය පැමිණේ. ඵලය හා සමානය යන අර්ථය වේ. එත්තාවතා ඛො නිග්‍රොධ තපො ජිගුච්ඡා අග්ගප්පත්ත හොති සාරප්පත්තාච. මෙය භාග්‍යවතුන් වහන්සේ තීර්ථකයන් ගේ වශයෙන් කීහ. තීර්ථකයන් ගේ ලාභ සත්කාර ගසක අතු කොල සමානය. පංචශීලය පමණක් පොතු හා සමානය. අෂ්ඨ සමාපත්ති මාත්‍රය තච (සිවිය) හා සමානය. පුබ්බෙනිවාස ඤාණය අවසන් කොට ඇති අභිඥා එලය හා සමානය. දිවැස වනාහි ඔවුහු රහත් යයි ගෙන හැසිරෙති. එයින් ඔවුන්ගේ එය ගසේ හරය හා සමානය. සාසනයෙහි වනාහි ලාභ සත්කාර අතු කොල සමානය. සිල සම්පදාව පොතු හා සමානය. ධ්‍යාන සම්පත් සිවිය හා සමානය. ලෞකික අභිඥා එලය හා සමානය. මාර්ගඵල සාර යයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමාගේ සාසනයේ ඵලහරිතව නැමුණු ගසකට උපමා කරන ලදී. දේශනා කුසලතාවෙන් මෙයින් තච සාරයට වඩා මාගේ සාසනය උත්තරීතර ද ප්‍රණීතතර ද වේ. එය ඔබ කවදා දැනගන්නේදැයි තමා ගේ දේශනාවේ විශේෂභාවය දක්වීමට "ඉතිඛො නිග්‍රොධ" යයි දේශනාව ආරම්භ කරයි. තෙ පරිබ්බාජකා ඔහුට තිහක් පමණ වූ පරිබ්බාජක පිරිසක් පිරිවර වශයෙන් සිටියහ. එත්ථ මයං අනස්සාමා - මෙහි අචේලක පෙල ආදියෙහි. මෙය කියන ලදී: අපගේ අචෙලක පෙල පමණක්ද නැත. අරඤ්ඤවාසාදිය කොයින්ද? අරඤ්ඤ වාසයද නැත. නීවරණ ප්‍රහාණාදිය කොයින්ද? නීවරණ ප්‍රහාණාදිය නැත. බ්‍රහමවිහරාදිය කොයින්ද? බ්‍රහමවිහරාදිය නැත. ප්‍රබ්බෙනිවාසාදිය කොයින්ද? පුබ්බෙනිවාසඤාණ මාත්‍රයකුදු නැත. අපට දිවැස් කොයින්ද? මෙහි අපි ආචාර්යවරුන් සමග සඅාචරියකා නටුවෝ වෙමු. ඉතො භීයො උත්තරී තරං මෙයින් බොහෝ සෙයින් උත්තරීතර මෙයින් දිවැස් ඤාණ අධිගමයට වඩා අන්‍ය උත්තරීතර විශේෂ අධිගමයක් ඇසීම් වශයෙන් වත් නොදනිමු යයි කියති.

අථ නිග්‍රොධං පරිබ්බාජකං - මෙසේ වනාහි ඔහුට ඇති විය. මේ පිරිවැජියෝ දැන් භාග්‍යවතුන් ගේ භාෂණය අසති. මේ නිග්‍රෝධ

විසින් භාග්‍යවතුන් වහන්සේ නැති තැන කර්කශ වූ ලංවීමට පහසු නොවූ වචන කියන ලදී. දැන් මේ තෙමේද ඇසීමට කැමති විය. මොහුගේ මාන කොඩිය පහත හෙළා භාග්‍යවතුන්ගේ සාසනය ඔසවා තැබීමට දැන් මට කාලයයි. ඉක්බිති නිග්‍රොධ පිරිවැජියාට මෙසේ කීය. තවද ඔහුට මෙසේ ඇතිවිය. මෙතෙම මා කථා නොකරන කල්හි ශාස්තෲන් වහන්සේ ක්‍ෂමා නොකරන්නේය. එය ඔහුට අනාගතයෙහි අහිත පිණිස දුක් පිණිස පවතී. මා විසින් කියනු ලබන කල්හි ක්‍ෂමා කරන්නේය. එය ඔහුට බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස පවත්නේය. ඉක්බිති නිග්‍රොධ පිරිවැජියාව මෙසේ කීය. **අපරිසාවචරං පන නං කරොථ** - මෙහි පන නිපාතයකි. ඉක්බිති ඔහු අපරිසාවචරං වා මෙය කරව. ගො කාණාදි හෝ අනිකක් යයි අර්ථයයි. **ගොකාණං** - මෙහි ද ගෝකණ කෙළවර හැසිරෙන්නී මෙන් කරව යයි අර්ථය වේ.

**තුණ්හී භූතො** - නිශ්ශබ්ද බවට පැමිණියේ. **මංකුභූතං** - නිෂ්තේජස් බවට පැමිණියේ **පත්තකඛන්ධො** - බෙල්ල නමා **අධො මුඛො** - මුහුණ යටට හරවා **බුද්ධො සො භගවා බොධාය** - තමා අවබෝධ කොට සත්වයන්ට ද චතුසත්‍ය අවබෝධය සඳහා ධර්මය දේශනා කරයි. **දමෙතා** - චක්ඛු ආදී ඉන්ද්‍රියන් ගේ දමනය **දමථාය** - අන්‍යයන්ගේ දමනය සඳහා. **සනෙතා** - රාගයෙන් සාන්ත වූ බැවින් සාන්තය. **සමථාය** - මහාජනයාගේ රාගාදිය සමනය සඳහා දහම් දෙසයි. **තිණ්ණො** - සිව් ඕසවලින් එතර විය. **තරණාය** - මහාජනයාට ඕස තරණය සඳහා. **පරිනබබුතො** - කෙලෙස් පිරිනිවුමෙන් පිරිනිවන් පෑ. **පරිනිබ්බාණාය** - මහාජනයා ගේ ද සියළු කෙලෙස් පිරිනිවීම සඳහා දහම් දේසනා කරයි. **අවචයො** - ආදිය සාමඤ්ඤඵලයෙහි කියන ලදී. **උජුජාතිකො** - කාය වඞ්කතාදියෙන් විරහිත වූ හෙයින් සෘජු ස්වභාවය. **අහමනුසාසාමි** - මම එබඳු පුද්ගලයන්ට අනුසාසනා කරමි. ඔහුට ධර්මය දේශනා කරමි. **සත්තාහං** - සත් දවසක්. භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ලම දනිති. පුද්ගලයින් සඳහා කීහ. **අසඨො** - යනු නොරැවටීමයි. සෘජු ගති ඇති අය මොහොතකින් රහත් වීමට හැකිවන්නේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ "අසඨ" ආදි වචනයෙන් සඨයාට වංක වංකයාට මවිසින් ද අනුශාසනා කිරීමට නොහැකි යයි දක්වන්නේ පිරිවැජියා පාවලින් ගෙන මහාමේරු පර්වතය පාමුල දමුවාක් මෙන් විය. කුමක්හෙයින් ද මෙතෙම අති සඨයෙකි. වංක සිතැත්තෙකි. ශාස්තෲන් වහන්සේ මෙසේ ධර්මය දේශනා කරද්දී බුදුන් දහම් සඟුන් සිත නොයෙදේ. අධිමුවචනය සඳහා කන් යොමු

නොකරයි. කොහොත් බවෙහි සිටියේ ශාස්තෘෘ ක්‍ෂමා කරවමියි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ අදහස දැන ''එතු විඤ්ඤූ පුරිසො අසයො'' යයි ආදිය කීහ. සඨයාට අනුසාසනා නොකළ හැකි වේ. අනෙනවාසිකමායතා - අනෙතවාසික කැමැත්ත යනාදිය කීහ. අප අනෙනවාසිකයන් කැමති වන්නේ. එවමාහ - එතු විඤ්ඤූ පුරිස ආදිය කීහ. සො එව වො ආචරියො - ඔබගේ ප්‍රකෘති ආචාර්යා ඔහුමය. උද්දෙසා නො වා චෙතුකාමො - තමාගේ අනුශාසනාව ගන්වාගෙන අපට අපගේ කියාදීම කියනු කැමත්තේ. සො එව වො උද්දෙසො හොතු - ඔබගේ ප්‍රකෘති උද්දෙසය ඔහුටා වේවා. ඔබගේ විස්තරයෙන් මට අර්ථයක් නොවේ. ආජීවා - ආජීවයෙන්, අකුසල සංඛාත - අකුසල යන කොටසට පැමිණි. අකුසල ධම්මා - දොලොස් සිත් උපදින චෛතසික. තෘෂ්ණා යන විශේෂණයෙන් එය වනාහි පුනර්භවය ඇතිකරන බැවින් පොනොභවිකා - යයි කියන ලදී. සදරා - කෙලෙස් කරදරවලින් යුක්ත. ජාතිජරා මරණය - ජාති ජරා මරණවලට හේතු වූ සඞ්කිලෙසිකා ධම්මා - දොලොස් සිත් ඉපදීම වොදානියා - සමථ විපසසනා ධර්ම. ඒවා සත්වයන් පිරිසිදු කරයි. එහෙයින් වොදනියා යයි කියනු ලැබේ. පඤ්ඤා පාරිපුරං - මාර්ග ප්‍රඥාව සම්පූර්ණ වීම. වෙපුලලතං - ඵල ප්‍රඥා විපුල බව, දෙකම හෝ ඔවුනොවුන් වේවචන වේ. මෙය කියන ලදී: ''එයින් ඔබ මාර්ග ප්‍රඥාවද ඵල ප්‍රඥාවද ඉහාත්මයෙහි ම තෙමේ දැනගෙන සාක්‍ෂාත් කොට පැමිණ වාසය කරන්න. භාග්‍යවතුන් වහන්සේ මෙසේ පිරිවැජියන් අරබයා තමන් වහන්සේගේ අවවාද අනුසාසනාව බලය පෙන්වන්නේ රහත් බවින් කුළුගන්නවා දේශනාව අවසන් කළහ.

යථා තං මාරෙන - මාරයා විසින් නැගී සිටි සිතින් හිඳියි. එසේම නිශ්ශබ්ද වූයේ....නොවැටහී සිටියෝය. මාරයා වනාහි, ශාස්තෘෘ අතිශයින් ගර්ජනා කරන්නේ බුද්ධබලය පෙන්වා මේ පිරිවැජියන්ට ධර්ම දේශනා කරති. කිසිවෙක් ධර්මාභි සමය වන්නේය හන්ද ''මම නැගී සිටිමි'ය ඒ සිත් නැගී සිටියේය. අප්‍රහීන විපල්ලාස සිත් මාරයාට කැමති දෙයක් කළහැකි වේ. මාරයා විසින් නගා සිටුවන ලද ඒ සිත්ද එහි අංග ප්‍රත්‍යංග මෙන් නිශ්ශබ්දව....නොවැටහී හුන්හ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ මේ පිරිවැජියෝ අතිශයින් ශබ්ද රහිතව හුන්නෝය. කුමක් නිසාදැයි ආවර්ජනා කරන්නේ මාරයා විසින් නගා සිටුවන ලද බව දැන ගත්හ. එහි ඵුටයා පාපිමතා පාවිටු මාරයා විසින් ස්පර්ශ කරන ලදී. යත්‍ර හි නාමා - යමෙකගේ නම්. අඤ්ඤාණත්ථමපි - දැනගත්තේද. කිං කරිසසත

සත්තාහො - ශ්‍රමණ ගෞතමයා විසින් පිරිසිදු දක්වන ලද සත් දවස අපට කිසි අපහසුවක් කරන්නේද? එසේ නම් අපි සත් දවසක් ඇතුළත මේ ධර්මය සාක්‍ෂාත් කිරීමට හැකිවේවි නොවේවා දන්නා වූ බ්‍රහමචරියාවේ හැසිරෙමු. එසේ නැතහොත් ඔහුගේ ධර්මය දනිමු. එක් දවසක් එක් වාරයක් දන්නේද ඔවුන්ගේ සිත තූපන්නේය. දවස් හත වනාහි මේ කුසීතයන්ට කුමක් කෙරේද? කිම ඔව්හු සත් දිනක් සම්පූර්ණ කිරීමට හැකිවන්නෝද? යනු මෙහි අර්ථයයි. සීහනාදං - පරවාද සිඳන සියවාද එසවීම ද වූ බිය නැති නාදය නාදකොට. පිහිටියේ. තාවදෙව - එකෙනෙහි රාජගහං පාවිසි - රජගහනුවරටම ඇතුළු වූයේය. ඒ පිරිවැජියන් ගෙන් කිසිවෙක් මේ සූත්‍රය අසා විශේෂයක් නොඉපවූයේය. ඔවුන්ගේ ආයති වාසනාවට ප්‍රත්‍ය වන්නේය. සෙසු සියල්ල පැහැදිලිය.

උදුම්බරික සූත්‍ර වර්ණනාව නිමි.

## 3-26
## චක්කවත්ති සූත්‍ර වර්ණනාව

එවං මෙ සුතං - චක්‍ර වර්ති සූත්‍රය. මෙය එහි ගැඹුරු පද වර්ණනාවයි. මාතුලායං - එසේ නම් ඇති නගරයෙහි. ඒ නගරය ගොදුරු ගම කොට නුදුරු වන ලැහැබෙහි වාසය කරයි. ''එහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූහ''. මෙහි මේ පිළිවෙළ කථාවය. මේ සූත්‍රය දේශනා කරන දිනයෙහි පාන්දර මහා කරුණා සමාපත්තියෙන් නැගිට ලොව බලන්නේ මේ අනාගත වංශය ආලෝක කරන සූත්‍රාන්ත කථාවෙන් මාතුල නගරවාසී අසූහාර දහසක් දෙනාට ධර්මාවබෝධය වන බව දැන උදේම විසි දහසක් භික්ෂූන් පිරිවරා මාතුල නගරයට පැමිණියහ. මාතුල නගරවාසී ක්‍ෂත්‍රියෝ භාග්‍යවතුන් වහන්සේ වැඩියේ යයි අසා පෙර ගමන් කොට බුදුරදුන්ට ආරාධනා කොට මහත් සත්කාරයෙන් නගරයට වැඩමවා වැඩසිටින ස්ථානයක් පිළියෙළ කොට මහාර්ඝ ආසනයක වඩා හිඳුවා බුදුන් ප්‍රමුඛ මහා සංඝයාට මහා දානයක් දුන්හ. භාග්‍යවතුන්

වහන්සේ වළඳා අවසානයෙහි සිතූහ. ඉදින් මේ සථානයෙහි මේ මිනිසුන්ට ධර්මය දේශනා කරන්නෙම් නම් මේ ප්‍රදේශය සම්බාධ සහිතය. මිනිසුන්ට සිටගෙන සිටීමට හෝ හිඳගැනීමට අවකාශයක් නැත. රාජකුලයන්ට භුතතානු මෝදනා නොකොට පාත්‍රය ගෙන නගරයෙන් නික්මුණහ. මිනිස්සු සිතූහ. ශාස්තෲන් වහන්සේ අපට අනුමෝදනාවක්වත් නොකොට වඩිති. ඒකාන්තයෙන් දානය අවසානයේ අමනාපයක් ඇතිවීම පෙණය සහිත නයෙකුගේ බෙල්ලෙන් ඇල්ලීම හා සමාන වේ. එන්න පින්වත්නි, තථාගතයන් වහන්සේ සමාකර ගනිමුයයි සියළු නගරවාසීහු භාග්‍යවතුන් වහන්සේ සමග නික්මුණේ වඩින බුදුන් වහන්සේ මගධ කෙතෙහි නැවතුනහ. අතු වෙලෙපින් යුත් පැතිරුණු සෙවන කිරියක් (අමුණු සතරක පමණ) පමණ විහිදී ඇති එක් අත්තන ගසක් දක මේ ගසමුල හිඳ දහම් දේශනා කරන්නේ නම් මහජනයාට සිටීමට හිඳගැනීමට අවකාශ ඇතිවන්නේ යයි නැවතී මාර්ගයෙන් ඉවත්ව ගස මුලට පැමිණ ධර්ම භාණ්ඩාගාරික අනඳ හිමි දෙස බැලූහ. තෙරුන් වහන්සේ බැලූ සංඥාව හිඳගනු කැමත්තේ යයි දන සුගත් මහ සිවුර පණවා දුන්නේය. පණවන ලද ආසනයෙහි වැඩහිඳි කල්හි ඉදිරියෙන් මිනිස්සු හිඳගත්හ. දෙපස හා පිටුපස භික්ෂු සංඝයා ද අහසෙහි දෙවියෝද සිටියහ. මෙසේ මහ පිරිස් මැද වූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූහ. **තෙ භික්ඛු** - එහි පිවිසි ධර්ම ප්‍රතිග්‍රාහක භික්ෂූහු. **අත්තදීපා** - තමා පහනක්, රැකීමක්, පරායණයක් ප්‍රතිෂ්ඨාවක් කොට වාසය කරත් යන අර්ථය වේ. **අත්තසරණා** - මෙය එහිම පර්යාය වචනයකි. අනිකෙකුට අනිකෙකුගේ පිහිටක් නැත. යනු අනඤ්ඤ සරණවේ. මෙය අන්‍ය සරණ ප්‍රතික්ෂෙප කරන වචන වේ. අනිකෙක් අනිකෙකුට සරණ නොවේ. අනෙකෙකුගේ උත්සාහයෙන් අනෙකකුට සිද්ධ නොවේ. කියන ලදීඃ තමාගේ නාථයා තමාමය. අන්‍ය වූ නාථයෙක් කොහි වේද? එහෙයින් ''අනඤ්ඤ සරණා'' යයි කීහ. මෙහි අත්තා කවුරුද? ලෞකික ලෝකෝත්තර ධර්ම වේ. එයින් කීහඃ ධම්මදීපා, ධම්මසරණා අනඤ්ඤ සරණා.

''කායෙ කායානුපස්සී'' යයි මහා සතිපට්ඨාන සූත්‍රයෙහි විස්තර කරන ලද්දේය. **ගොචරෙ** - හැසිරීමට සුදුසු සථානයෙහි **සකෙ** - තමා සන්තකයෙහි. **පෙත්තිකෙ විසයෙ** - පියාගෙන් පැමිණි විෂයෙහි **චරතං** - හැසිරෙන්නන්ගේ. ''චරන්තං'' යන පාඨයි. ඒ අර්ථයම වේ. **න ලච්ඡති** - නො ලබන්නේය. නො බලන්නේය. **මාරො** - දේවපුත්ත මාර, මෘත්‍යු මාර, කිලෙස මාර තිදෙනා. **ඔතාරං** - රන්ධ්‍ර, සිදුරු, විවර. මෙය

වනාහි මෙහි ගලවැටෙන ස්ථානයෙන් නික්ම තොරණෙහි හිඳ තරුණ හිරුරස් තපින්නේ කැටකුරුල්ලා ගෙනහුන් උකුසු කුරුළු වස්තුව දැක්විය යුතුය.

මහණෙනි, පෙර උකුස්සෙක් වහා බැස කැටකුරුල්ලකු ඩැහැගත්තේය. මහණෙනි, ඉක්බිති කැටකුරුල්ලා උකුස්සා ගෙනයනු ලබන්නේ මෙසේ වැලපුනේය. මගේම අවාසනාව, මගේ පින් අඩුකම මම අගෝචර පර විෂයෙහි හැසුරුනෙමි. ඉදින් අද මම මගේ පියවරුන්ගේ විෂයෙහි හැසිරුනේ නම් උකුස්සාගේ දඬුවමට අසු නොවන්නේය, ලාපය, ඔබේ ගොචර පියාගේ විෂය කොහේද එය මේ නගුලෙන් හාන ලද ගලක් විසිකරන දුර. ඉක්බිති මහණෙනි, උකුස්සා, ස්වකීය බලයෙහි උඩඟු නොවී ස්වකීය බලයෙහි හේතු රහිතව කුරුල්ලා මුදා හැරියේය. ලාපය, යව, එහි ගොස් නොමිදෙව, මහණෙනි ඉක්බිති කැට කුරුල්ලා හාන මැටි තිබෙන ස්ථානයට ගොස් ලොකු මැටි කැටයකට නැගි උකුස්සාගෙන් බේරීමක් නැතිව සිටියේය. උකුස්සා, දැන් එයි දැන් එයි. උකුස්සා සිය බලයෙහි උඩඟු නොවී උභය පක්ෂවලින් සන්නද්ධව කැටකුරුල්ලා ලඟට වහා පැමිණියේය. මහණෙනි, කැට කුරුල්ලා උකුස්සා පැමිණියේ යයි දැන මැටි කැටයේ ඇතුළට පැමිණියේය. ඉක්බිති උකුස්සා ඒ මැටිකැටයේ ම පපුව ගැව්ය. මහණෙනි, මෙය මෙසේ විය. මහණෙනි අගෝචර පරවිෂයෙහි නොහැසිරෙන්න. මහණෙනි, අගෝචර පර විෂයෙහි හැසිරෙන විට මාරයා ඉඩ ලබන්නේය. සිදුරු ලබන්නේය. අරමුණු ලබන්නේය. මහණෙනි. භික්ෂූන්ට අගොචර පරවිෂය කුමක්ද? යම් මේ පංචකාම ගුණ කුමන පසක්ද? ඇසෙන් දකින රූප. ඉෂ්ඨ කාන්ත, මනාප ප්‍රියරූප, කාමයට හේතුවන ඇලෙන.... කයෙන් දැනෙන ස්පර්ශ.... ඇලෙන, මහණෙනි. මෙය භික්ෂූන්ට අගොචර පර විෂය වේ. ගොචරයෙහි මහණෙනි. හැසිරෙන්න. එහි මාරයාව අරමුණු නො ලැබේ. තමාගේ පියාගේ විෂය වූ ගෝචරය කුමක්ද? මේ සතර සතිපට්ඨානයයි. ඒ සතර මොනවාද මහණෙනි, මෙහි භික්ෂුව කයේ කය අනුව බලමින් වාසය කරයි.... සවකීය පියාගේ විෂයයි. **කුසලානං** - අනවද්‍ය ලක්ෂණයන්ගේ, **සමාදාන හෙතු** - සමාදන්ව පවත්වන හේතු. **එවමිදං පුඤ්ඤං පවඩ්ඪති** - මෙසේ ලෞකික ලෝකෝත්තර පින්ඵල වැඩේ. **පුඤ්ඤඵල** යයි මතු මත්තෙහි පින්ද පින් විපාක ද දත යුතුය. එහි කුසල් දෙයාකාරය. සසර ගමනට හේතුවන සහ නිවනට හේතුවන වශයෙනි. එහි වට්ටගාමි කුසලය නම් මාපියන් දූ පුතුන් කෙරෙහි ද දූ

පුත්තු මාපියන් කෙරෙහිද සෙනේහ වශයෙන් මෘදු මද්දව සිතයි. විවට්ටගාමී කුසල නම් සතර සතිපට්ඨානයාදි වූ සත්තිස් බෝධි පාක්ෂික ධර්ම වේ. ඒවායින් වට්ටගාමී කුසලයේ අවසාන පලය මනුෂ්‍යලෝක යෙහි සක්විති සැපතයි. විවට්ටගාමී කුසලයේ අවසාන පලය මාර්ගඵල නිර්වාණ සම්පත්. එහි විවට්ටගාමී කුසලයේ විපාක සූත්‍රය අවසානයේ දක්වන්නේය. මෙහි වනාහි වට්ටගාමී කුසලයේ විපාක දැක්වීම සඳහා මහණෙනි, දූ පුත්තු මව්පියන් ගේ අවවාදයෙහි නොසිටියාහු ද එකල ආයුෂයෙන් ද වර්ණයෙන් ද සම්පත්තියෙන් ද පිරිහුනහ. සිටියාහු නම් එකල වැඩේයයි කියා වට්ටගාමී කුසලයේ අනුසන්ධි වශයෙන් ''භූත පුබ්බං භික්ඛවෙ'' යන දේශනාව ඇරඹූහ.

එහි චක්කවත්ති ආදිය මහා පදාන සූත්‍රයෙහි විස්තර කරන ලද්දේමය. **ඔසක්කිතං** - ටිකක් පසුබැස. ඨානාචුතං - ස්ථානයෙන් සම්පූර්ණයෙන් ඉවත් වූ. ඒ සත්රුවන වනාහි ඇතුළු පුර දොරටුවෙහි අකුරු ගැසුවාක් මෙන් අහසෙහි සිටියේය. ඉක්බිති එහි දෙපස කිහිරි කණු සිටුවා සක්රුවන් මත නේමිය ඉදිරියේ එක් නූලක් බැන්දහ. යට භාගයෙහි ද එකක් බැන්දහ. ඒවායින් උඩනූලෙන් සවල්පයක් පහළට වූ සක්රුවන **ඔසක්කිතං** - නම් වේ. එය අතිශය බලවත් දෝෂයක් ඇති කල්හි ද මෙසේ වේ. නූලද අඟලක් දෙකක් පමණ බඳින ලද තැනින් වෙනස් වේ. ඒ සඳහා කියන ලදී. ''ඕසක්කිතං ඨානං චුතං'' අථ මෙ **ආරොචෙය්‍යාසි** - දරුව, ඔබ අද ඉඳලා දවසට තුන්වරක් සක්රුවනේ උපස්ථානයට යන්න. මෙසේ යනවිට යම් දවසක සක්රුවන සවල්පයක් හෝ වෙනස් වී තිබුණොත් මට දන්වන්න. මගේ ජීවිතය ඔබේ අතේ තබා ඇත. **අද්දසා** - අප්‍රමාදව දවසට තුන්වරක් ගොස් බලන්නේ එක් දවසක් දැක්කේය. **අථ ඛො භික්ඛවෙ** - මහණෙනි, ඉන්පසු දළහනෙමි රජු සක්රුවන මදක් වෙනස් වී ඇතැයි අසා උපන් බලවත් දොම්නස් ඇත්තේ, දැන් මම කලක් ජීවත් නොවන්නේය, මගේ ආයුෂය සවලප වේ. දැන් මම කාම සැප නොවිඳිය යුතුය. දැන් පැවිදිවන කාලය යයි හඬා වැලප දෙටු පුත් කුමරා අමතා මෙසේ කීය. **සමුද්ද පරියන්තං** - වටකරන ලද මුහුදය. මෙය කුල සන්තක සක්වල කෙළවර කොට ඇති පින් සෘද්ධියෙන් පහළ වූ, මෙය දිය නොහැකිය. කුලසන්තකය වනාහි මුහුද අවසන් කොට ඇත්ත පමණය.

**කෙසමස්සුං** - තාපස පැවිද්දෙන් පැවිදි වන්නාටද පළමුව කෙස්

රැවුල් හැරදමයි. ඉන්පසු වැඩුණු කෙස් බැඳ හැසිරෙයි. **කාසායානි** - කසට රස පෙවූ. මුලින් මෙසේ කොට පසුව වැහැරි (පට්ටාවලින් වියූ සිවුරු) ද දරයි, **පබ්බජි** - පැවිදි වී, පැවිදි වී ද තමාගේ මඟුල් උයනේ ම වාසය කරයි. **රාජිසිමහි** -රාජ ඉසිමහි, පැවිදි වූ බ්‍රාහමණයෝ බ්‍රාහමණිසයො යයි කියනු ලැබේ. සේසත හැර පැවිදි වූ රජ රාජිසි වේ. **අනතරධායි** - අතුරුදහන්. නිවුණු පහන් දල්ලක් මෙන් අභාවයට පැමිණ. **පටිසංවෙදෙසි** - හඬන්නේ වැලපෙන්නේ දන්විය. **පෙතතිකං** - පියාගෙන් පැමිණ දායාදයක් නොවේ. කුසීතකමින් හීන වීර්යයෙන් දස අකුසල ධර්ම සමාදානයෙන් හා පැවතීමෙන් පැමිණිය හැක්කක් නොවේ. තමාගේ යහපත් ක්‍රියා නිසා දස විධවූ හෝ දොළොස් විධ වූ සක්විති වත් පිරීමෙන් ම ඊට පැමිණිය යුතු යයි දක්වයි. ඉක්බිති ඔහු තම වත් පිළිවෙත් ගැන චෝදනා කරන්නේ ''ඉංස තවං'' ආදිය කීය. **අරියෙ** - එහි නිර්දෝෂ වූ **චකකවතති වතෙත** - සක්විතීන් ගේ වතෙහි. **ධමම** - දසවිධ කුසල කර්මපථ ධර්ම. **නිසසාය** - එය අධිෂ්ඨානයෙන් සිතින් එය ම හේතු කොට, **ධමමංසකකරොනෙත** - ධර්මය හොඳින් පිළිපැදීමෙන්. **ධමමං ගරුකරොනෙතා** - ඊට ගෞරවයෙන් ගරු කරමින් **ධමමං මානෙනෙතා** - ඒ ධර්මයට ප්‍රිය භාවයෙන් වාසය කරන්නේ **ධමමං අපචයමානො** - ඒ ධර්මයට ඇඳිලි බැඳීම් ආදියෙන් යටත් පහත් පැවතුම් ඇත්තේ **ධමමකෙතු** - ඒ ධර්මය කොඩියක් මෙන් පෙරටු කොට ආවුධයක් මෙන් ඔසවා පැවතීම. **ධමමාධිපතෙයෙයා** - ධර්මාධිපති වූ. පැමිණීම වශයෙන් ධර්මයෙන් සියළු ක්‍රියා කිරීමෙන් ධර්මාධිපතිව ධාර්මික වූ රක්‍ෂාවරණගුත්තිය සංවිධාන කරයි. ධර්මය මොහුට ඇතැයි **රකඛාවරණගුතති** වේ. එහි අනුන් රකින්නේ තමා රකී යයි වචනයෙන් ඉවසීම ආදිය රැකීමය. මෙය කියන ලදීඃ ''මහණෙනි, අනුන් රකින්නේ තමා රකිතියි කියන්නේ කෙසේද? ඉවසීමෙන්, අවිහිංසාවෙන් මෛත්‍රී සිත් ඇති බැවින් දයාවෙන්'' යයි හඳින පෙරවන ගෙහාදිය **ගුතති** - වේ. ඒ සියල්ල ද සංවිධාන කොට පැවතීම යන අර්ථය වේ. එය සංවිධාන කළයුතු ස්ථාන දක්වන්නේ. **අනෙතා ජනසමිං** - ආදිය කීහ. එහි සංක්‍ෂෙපාර්ථය මෙසේය. ඇතුළ ජනයාට අයත් ඔබේ අඹුදරුවන් සීල සංවරයෙහි පිහිටුවන්න. ඇඳුම් සුවඳමල් ආදිය දෙන්න. ඔවුන්ගේ සියළු උපද්‍රව වලක්වන්න. බලකාය ආදියෙහි ද මෙම පිළිවෙළමය. මෙය විශේෂයකි. බලකාය කාලය නොඉක්මවා බත් වැටුප් සම්පාදනයෙන් ද අනුග්‍රහ කළයුතුය. අභිෂේක කළ ක්‍ෂත්‍රියෝ භද්‍ර ආජානීය අශ්ව ආදීන්ට රන් රුවන් දීමෙන් උපහාර කළයුතුය. අනුයුක්ත ක්‍ෂත්‍රියන්ට ඔවුන්ට

අනුරූප යාන වාහන සපයා දීමෙන් ද සතුටු කළ යුතුය. බ්‍රාහමණයෝ ආහාරපාන වස්ත්‍රාදි දෙය ධර්මයෙන් ගෘහපතියෝ බත් බිජු නගුල් හරක් යනාදිය සැපයීමෙන් එසේම නගරවාසීහු ජනපදවාසීහු සැලකිය යුත්තාහ. සමණය කළ පාප ඇති ශ්‍රමණයන් දුරුකළ පව් ඇති බ්‍රාහමණයින්ද ශ්‍රමණ පරීක්ෂාකාරාදියෙන් සත්කාර කළ යුතුය. මෘග පක්ෂීන්ට අභයදානය දීමෙන් සැනසිය යුතුය.

**විජිතෙ** - තමාගේ ආඥාව පවතින ස්ථානයේ. **අධම්මකාරො** - අධර්ම ක්‍රියා. **මා පවත්තිත්ථ** - නො පවතින ලෙස සංවිධාන කරව. **සමණබ්‍රාහමණා** - මහණ බමුණන්. **මදප්පමාදා පටිවිරතා** - නවවිධ මාන මදය, පස්කම් ගුණ කෙරෙහි සිත මුදාහැරීම් සංඛ්‍යාත ප්‍රමාදය වලක්වන බව. **ඛන්ති සොරච්ච නිවිට්ඨා** - ඉවසන ක්‍ෂාන්තියද සුරත බවෙහි පිහිටි බව. **එකමත්තානං** - තමන්ගේ රාගාදීන්ගේ දමනය කිරීම් ආදියෙන් තමාගේ ජීවිතය දමනය කරයි. සමනය කරයි. පිරිනිවීමට පත් කරයි යයි කියනු ලැබේ. **කාලෙන කාලං** - කලින් කල. **අභිනිවජ්ජෙය්‍යාසි** - අසූචි මෙන් විස මෙන් ගිනි මෙන් ද මනාව අත්හරින්නේය. **සමාදාය** - දිවමල් දමක් මෙන් අමෘතය මෙන් ද මනාව ගෙන පවත්වන්නෙහිය. මෙහි සිත වත් සමනය කළ යුතුය. ඇතුළත් ජනයා කෙරෙහි බලකාය කෙරෙහි ක්‍ෂත්‍රියයන් කෙරෙහි අනුයුක්තයන් කෙරෙහි බ්‍රාහ්මණ ගෘහපතීන් කෙරෙහි නිගම ජානපදිකයන් කෙරෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි මෘග පක්ෂීන් කෙරෙහි අධාර්මික ආකාරය ප්‍රතික්‍ෂෙප කරන්නේ නිර්ධනිකයන්ට ධනය දීමෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත එළඹ ප්‍රශ්න ඇසීම්, මෙය දස ආකාර වේ. ගෘහපතියන් හා පක්ෂි ජාතීන් වෙන්කොට ගන්නහුට දොලොස් ආකාර වේ. පෙර නොකියා හෝ ගන්නහු විසින් අධර්මයෙහි ඇලීමද විෂම ලෝභයද ප්‍රහාන වශයෙන් දොළොස් ආකාරය. **ඉද ඛො තං** - මේ දස විධ වූ හෝ දොළොස් විධ වූ හෝ සක්විති වත් නම් වේ. **වත්තමානස්සා** - පුරා සිටියහුට. **තදහුපොසථෙ** - ආදිය මහා සුදස්සන සූත්‍රයෙහි කියන ලදී. **සමතෙනා** - තමාගේ අදහසින්. **සුදං** - නිධානය. **පසාසති** - අනුසාසනා කරයි. මෙය කියන ලදී: පුරාණ රාජවංශය, රාජප්‍රවේණිය, රාජ ධර්මය හැර තමාගේ මති මාත්‍රයෙහි සිට ජනපදයට අනුසාසනා කරයි. මෙසේ අපි මඛාදේව වංශයට කිලුටක් මෙන් දළහනෙමි වංශ කඩවීමක් මෙන් අන්තිම පුරුෂයා වී උපන්නේ. පෙර **පුබ්බෙනාපරං** - කාලයෙහි මෙන් සමානව පසු කාලයෙහි ද. ජනපදය නොවැඩේ. **යථා තං පුබ්බකානං** - පෙර රජුන් මෙන් පෙර රජුන්

සමයෙහි පෙර ද පසු ද සමානව වැඩුනහ. කිසිවක් අඩුවූයේ නැත. කිසිවක් ශූන්‍ය වූයේ නැත. තෙල්, මී පැණි ආදියෙහි මෙන් කැඳබත් ආදියෙහි ද අඩුවක් නොවීය. දැන් එසේ නැත. සමහර ඒවා ශූන්‍ය වේ. **අමච්චා පාරිසජ්ජා** - ඇමතියෝ ද ඇමති පිරිවරද **ගණකමහාමත්තා** - පාඨ ගණකයන් සහ මහා මාත්‍යයෝද **අණීකට්ඨාලි** - හත්ථි ආචරිය ආදීන්ද **දොවාරිකා** - දොරටු රකින්නා **මන්තසසා ජීවිනො** - මන්තා යනු ප්‍රඥාවය. එය නිසා ජීවත්වන පණ්ඩිතයෝ, මහා මාත්‍යයෝ. ඔවුන්ට මෙය නමකි. **නො ච ඛො අධනානං** - බලවත් ලෝභය නිසා දිළිඳු මිනිසුන්ට ධනය නොදෙයි. **නානුප්පදෙය්‍යමානෙ** - නොදෙන කල්හි. මෙය පාඨවේ. **දාළිද්දියං** - දිළිඳු බව. **අත්තනාඤ්ච ජීවාති** - තමාද ජීවත් වේ. 'උද්ධගහිකං' යනාදියෙහි මතු මත්තෙහි ඇති භූමිවල පල දීම් වශයෙන් උද්ධගත ඔහුට ඇත්තේ හූය **උද්ධගගිකා** - වේ. ස්වර්ගයට තවත් එහි උපත ඇති කෙරේනුයි **සොවග්ගික** - නම් වේ. උපනූපන් තැන සැප විපාක ඔහුට වේ යනු **සුඛ විපාකා** - වේ. යහපත් වූ අග්‍ර වූ දිව්‍ය වර්ණාදි දස විශේෂ වූ ඉපදීමෙන් **සග්ගසංවත්තනික** - වේ. මෙසේ රූපය **දක්ෂිණාව** - දානය පිහිටුවයි යන අර්ථය වේ. **පවඩ්ඩීසසති** - වැඩේ. බොහෝ වේ. **සුතිසෙධං නිසෙධෙය්‍යං** - මනාව නිසේධනය කර නිසේධනය කරන්නේය. **මූලසච්චං** - මුලින්ම නැසූ. **ඛරසසරෙන** - එරුෂ ශබ්දයෙන් **පණවෙන** - වැරදි බෙරයෙන් සීසානි තෙසං ජිජ්ජිසසමි යටත් පිරිසෙයින් ඔවුන් ගේ මූලික හරින්නෙමි. එහිම ඔවුන්ගේ හිස් සිඳින්නෙමි. යම්සේ කිසිවෙක් ගෙනා බවද නො දන්නේය. දැන් අපි මෙහි කිම. රජ ද නැගිට අනුන් මරයි. මේ ඔවුන්ගේ අදහසයි. **උපක්කමිංසු** - ආරම්භ කළහ. **පන්ථදූහනං** - මාර්ගයේ පැවතුනාය. පාරේ සිට සොරකම. **නහි දෙවා** - හේ වනාහි සිතුවේය. මේ තෙමේ දේවයන් වහන්ස ඇත්ත. කට වචනයෙන් මරවයි. අදෝමැයි, බොරු කියයි. මරණ භයින් දේවයන් වහන්ස නොවේ යයි කීය. **එකදං** - මෙහිද ඉදං යනු නිපාතයකි. සමහර සත්තු යන අර්ථයයි. **චාරිත්තං** - වැරදි හැසිරීම. **අභිජ්ඣා ව්‍යාපාදො** - අභිධ්‍යාවද ව්‍යාපාදයද. **මිච්ඡා දිට්ඨි** - නත්ථි දින්නං ආදී අන්තගාමි වැරදි දෘෂ්ඨිය. **අධම්මරාගො** - මව නැන්දා මවගේ සහෝදරිය. පියාගේ සහෝදරිය ආදීන් කෙරෙහි අයුතු ස්ථානයෙහි රාගය. **විසම ලොභො** - පරිභොග කටයුතු සථානයෙහි ද අධික ලෝභය. **මිච්ඡා ධම්මො** - පුරුෂයන් ගේ පුරුෂයන් කෙරෙහි ස්ත්‍රීන්ගේ සත්‍රින් කෙරෙහි (සමලිඟු රාගය) ඡන්දරාගය. **අමත්තෙය්‍යතා** - ආදියෙහි මවට හිත වූයේ මත්තෙය්‍ය වේ. එහි භාවය මත්තෙය්‍යතා වේ. මව

කෙරෙහි යහපත් ප්‍රතිපත්තියට මෙය නමකි. එහි අභාවය (නොමැතිවීම) ඊට පටහැනි දේද අමත්තෙය්‍යතා - වේ. අපෙත්තෙය්‍යතාදිසු - අපෙත්තෙය්‍යතාදි යෙහි ද මෙම නයමැයි. න කුලජෙට්ඨපචායිතා - කුලයෙහි ජේෂ්ඨයන්ට ගරු නොකිරීම යටත් පහත් පැවැත්මක් නැතිවීම. යං ඉමෙසං - යම් කලෙක මේවා අලංපතෙය්‍ය - ස්වාමියාට දීමට සුදුසු. ඉමානි රසානි - ලොව මේවා අග්‍ර රසය. අතිව්‍යා දිපපිසසනති - අතිශයින් බැබළෙන්නේය. අයමෙව වා යනු ද පාඨයකි. කුසලනතිපි න භවිසසති - කුසල යන නමද නොවන්නේය. පැණවීම් මාත්‍රයකුදු නොපෙනෙන්නේය යන අර්ථය වේ. පුජ්ජා ච භවිසසති - පූජාරහ ද ප්‍රශංසාරහද වන්නේය. එකල වනාහි මනුෂ්‍යයෝ අසවල දෙයින් මවට පහර දෙන ලදී. පියාට පහර දෙන ලදී. ශ්‍රමණ බ්‍රාහමණයින් ගේ ජීවිත තොරකරන ලදී. කුලදෙටුවන් සිටින බවකුදු නොදනී. අන්‍ය පුරුෂයා යයි ඔහුම පුදන්නේය ප්‍රශංසා කරන්නේය. (මෙය ආත්මාර්ථයට බර වූ සමාජයේ ලක්‍ෂණය) න භවිසසති මාතාති වා - මේ මගේ මව යයි ගෞරව සිතක් ඇති නොවන්නේය. ගෙදර ගැහැණියක් මෙන් නොයෙක් අසභ්‍ය කථා කියමින් නොසුදුසු ගෙවලට එළඹෙන්නේය. මවගේ සහෝදරී ආදියෙහි මෙම නයම වේ.

මෙහි ද මාතුච්ඡා - මවගේ සහෝදරී, මාතුලානි - මාමාගේ බිරිය. ආචරිය භරිය - ශිල්පායතනවල උගන්වන ගුරුවරයාගේ බිරිඳ. ගරූනං දාරා - සුළුපිය මහපිය ආදීන්ගේ බිරිඳ. මිශ්‍ර බව. මරියාදා භෙදං වා - ඉක්මවා හැසිරීමේ භේදය හෝ තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතොභ විසසති - බලවත් කෝපය නැවත නැවත හටගන්නේය. අපරාති යනු ද මෙයටම සමාන වචනයකි. කොපො වනාහි සිතය. විනාශ කරයි යනු ව්‍යාපාදො - වේ. සිත කිලිටි කිරීම මනොපදොසො - වේ. තිබ්බං වධක චිත්තං - මැරෙන්නාටද අනුන් මරනු සඳහා වධක සිත් වේ. ඒ වස්තුව දක්වීමට "මාතාපි පුත්තම්හි" ආදිය දක්වූහ. මාගවිකසස - මුව වැද්දාට සත්ථන්තර කප්පො - ආයුධයෙන් අතුරු කපයයි. සංවට්ට කල්පයට නො පැමිණ, අතරතුර ලෝක විනාශය. මේ අතුරු කපඃ දුර්භික්‍ෂ අන්තර කල්පය, රෝග අනතර කල්පය, ආවුධ අනන්තර කල්පය යයි තුන් ආකාරය. එහි ලෝභය උස්සද වූ ප්‍රජාව දුර්භික්‍ෂ අනතර කල්පය වේ. මෝහය උසසන් වූ ප්‍රජාව රෝග අනතර කලපය වේ. ද්වේශය උත්සන්න වූ ප්‍රජාව ආවුධ අනතර කල්පය වේ. එහි දුර්භික්‍ෂ අන්තර කල්පයෙහි විනාශ වූවෝ බොහෝ සෙයින් ප්‍රේත විෂයෙහි උපදිත්. ආහාර ආශාව

බලවත් බැවිනි. රෝග අනතර කල්පයෙහි විනාශ වූවො බොහෝ සෙයින් සවර්ගයෙහි උපදිති. කුමක් හෙයින්ද? ඔවුන්ට වනාහි අනේ අනිත් සත්‍වයන්ට මෙබඳු රෝගයක් නොවේවායි මෙත් සිත උපදී. ආවුධ අන්තර කල්පයෙහි නටුවෝ බොහෝ සෙයින් නිරයේ උපදිත්. කුමක් නිසාද? ඔවුනොවුන් බලවත් ඝාතනයෙන් යුක්ත නිසා. **මිග සඤ්ඤං** - මේ මුවෙකි. මේ මුවෙකි සංඥාව. **තිණානි සත්‍ථානි හත්‍ථෙ පාතුභවනති** - ඔවුන්ගේ මනා අත ස්පර්ශ වූ පමණින් යම් කිසිවක් යටත් පිරිසෙයින් තණපතක් උවද ආවුධයක් වන්නේය. **මාචමෙහ කොචි** - අපගෙන් කිසි එක් පුරුෂයෙකු ද ජීවිතයෙන් තොර නොකරව. **මා ච මයං කඤ්චි** - අපි කිසි පුරුෂයෙකු ද ජීවිතයෙන් තොර නො කරමු. **යනනූන මයං** - මේ ලෝක විනාශය ආරම්භ විය. දෙදෙනෙකුට එකතැන සිට ජීවිතය ගලවාගත නොහැකි යයි මෙසේ සිතුහ. **වනගහනං** - වන සංඛ්‍යාත පඳුරු වැල් ආදියෙන් ගහන පිවිසීමට අපහසු තැනක්. **නදී විදුගගං** - ගංගා අතර යෑමට අපහසු තැන්. **පබ්බත විසමං** - පර්වතවලින් විසම වූ තැන්. පර්වතවල හෝ විෂම වූ තැන. **සභාගයිසසනති** - යම්සේ මම ජීවත්වෙම්ද ඔබද එසේ ජීවත් වන්න යයි මෙසේ සතුටු කථාවෙන් තමාගේ සභාගය කරන්නේය. **ආයතං** - මහත් වූ **පාණාතිපාතා විරමෙය්‍යාම** - ප්‍රාණඝාතයෙන් ඉවත්වෙමු. පාණාතිපාත විරමෙය්‍ය කියාද සජ්ඣායනය කරති. එහි ප්‍රාණඝාතය දුරුකරමු යන අර්ථයයි. **වීසති වසසායුකා** - මව්පියෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝය. පුතුන් විසිඅවුරුදු ආයුෂ වූයේ ඇයි ? ක්ෂේත්‍ර විසුද්ධිය නිසාය. ඔවුන්ගේ මාපියෝ සීලවත්ව උපන්නාහුය. මෙසේ සීලය ඇතිව ගැබ වැඩුණු බැවින් මේ ක්ෂේත්‍ර විසුද්ධියෙන් දීර්ඝ ආයුෂ වූහ. ඔව්හු කලුරියකර එහිම උපන්නාවූ ඔව්හු තමන්ගේ සීල සම්පත්තියෙන් දීර්ඝායුෂ්ක වූහ. **අසසාම** - වන්නෙමු. **චත්තාරි සංවසසායුකා** - ආදියෙන් කොටස අදින්නාදානයෙන් වෙන් වූ වශයෙන් දත යුතුය. **ඉච්ඡා** - මට බත් දෙවයි. මෙසේ උපදින තෘෂ්ණාව. **අනසනං** - ආහාර දිරවනතුරු කයේ ඇතිවන අලස බව. ආහාර ගත්විට බත්මතය හේතුවෙන් නිදාගැනීමට සිතෙන කාය දුබලබව යන අර්ථයයි. **ජරා** - ප්‍රකට ජරාව. **කුකකුට සමපාතිකා** - එක ගමක වහලය මතට නැගී අනිත් ගමක වහලයෙන් බැසීම් සංඛ්‍යාත කුකුල් සම්පාතය මොහුට ඇත්තේ දැයි - කුකකුට සමපාතිකා වේ. කුකකුට සමපාදිකා යනුද පාඨයි. ගමකින් ගමකට කුකුළන්ගේ පාවලින් යෑම් සංඛ්‍යාත කුකකුටසමපාද ඔහුට ඇතැයි යන අර්ථයයි. මේ දෙකම නිවාස බහුල බව පෙන්වයි. **අවීචිමඤ්ඤෙ පූරෙය්‍යා භවිසසති** - අවීචි මහ

නරකයෙහි මෙන් නිතරම පිරී පවතින්නේය. අසීති වස්ස සහස්සා යුකෙසු භික්ඛවෙ මනුසෙසසු මෙතෙතයෙය්‍යා නාම භගවා ලොකෙ උපපජ්ජිස්සති - වැඩෙන වර්ෂයේ යයි නොකියන ලදී. වැඩෙන ආයුකාලයෙහි බුදුවරු පහළ නොවෙති. ආයු පිරිහෙන කාලයෙහි උපදිති. යම් කලෙක ඒ ආයු වැඩී අසංඛෙය්‍යව පැමිණ නැවත බසින කාලයේ අසූදහස් වසරයට පැමිණ සිටී. ඒ කාලයෙහි උපදින්නේය යන අර්ථයයි. පරිහරිස්සති - මෙය පිරිවරා හැසිරෙන්නන්ගේ වශයෙන් කියන ලදී. යූපො - ප්‍රාසාදය. රඤ්ඤා මහාපනාදෙන කාරාපිතො - රජු හේතුකොටගෙන ඔහු සඳහා සක්දෙව් රජු විසින් විස්කම් දෙව්පුතු යවා කරවන ලදී.

පෙර නලකාර පිය පුත් දෙදෙනෙක් පසේ බුදු කෙනෙකුට නලවලින් ද දිවුල්වලින් ද පන්සලක් කරවා උන්වහන්සේ එහි වාසය කරවා සිව් පසයෙන් උපස්ථාන කළහ. ඔව්හු කලුරිය කොට දෙව්ලොව උපන්හ. පියා දෙව්ලොව සිටියේ. පුතා දෙව්ලොවින් චුතව සුරුචී රජුගේ සුමෙධා දේවිය කුසින් ඉපදී මහාපනාද නම් කුමාරයා විය. හෙතෙම පසුකාලයෙහි සේසත් නගා මහාපනාද රජ විය. ඉක්බිති ඔහුගේ පින් බලයෙන් සක්දෙව් විස්කම් දෙව්පුතු රජුට පහයක් කරවයි යැවීය. හේ ඔහුට පස්විසි යොදුනක් උස සත්රුවන් මුවා සත්බුමු පහයක් නිර්මාණය කෙළේය. ඒ සඳහා ජාතකයෙහි කියන ලදී:

උස දහස් යොදුනකි. පළලින් සොළොස් යොදුනකි
පනාදනම් රජුගේ - පහයද රන්මුවා විය

දහස් කොන් වටකුරු - වහල ද සිය දද බිහිලි
එහි නළු ගඳබ මුළු - ස දහස් අයුරු වන්නේ

එකල විය එ මෙසේ - කියූ ලෙසින් භද්‍රජී
සක් එදා මමමය - කළ වතාවත් බලයෙන්

ඒ රජතුමා ආයු ඇති තෙක් එහි වාසය කොට එයින් සැව දෙව්ලොව උපන්නේය. ඔහු දෙව්ලොව උපන් කල්හි ඒ පහය ගංගා නම් ගඟේ අනුසෝතයට වැටුනේය. එහි ධුර සෝපානය හමු වූ තැන පයාග පතිට්ඨාන නම් නගරයක් නිර්මාණය කරන ලදී. කොත හමු වූ තැන

කෝටි ගම නම් විය. පසුව අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ ඒ නලකාර දිව්‍ය පුත්‍රයා දෙව්ලොවින් චුතව මනුෂ්‍ය ලෝකයෙහි භද්‍රජී නම් සිටුවරයාව ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි පැවිදිව රහත් බවට පැමිණියේය. උන්වහන්සේ නැවෙන් ගඟතරණය කරන දිනයෙහි භික්ෂු සංඝයාට ඒ ප්‍රාසාදය දක්වූහ යි වස්තුව විස්තර කළ යුතුය. මේ පහය අතුරුදහන් නොවූයේ ඇයි ? අනිකාගේ අනුභාවය නිසා, ඔහු සමග පින්කම් කොට දෙව්ලොව උපන් කුලපුත්‍රයා අනාගතයෙහි සංඛ නම් රජ වන්නේය. ඔහුගේ පරිභෝගය සඳහා ඒ ප්‍රාසාදය නැගී සිටින්නේය. එනිසා අතුරුදහන් නොවීය. **උස්සාපෙත්වා** - ඒ ප්‍රාසාදය ඔසවා. **අජ්ඣාවසිත්වා** - එහි වැස.

**දදිත්වා විස්සජ්ජෙත්වා** - ඒ පහය දන් වශයෙන් දී නිරපෙක්ෂාව පරිත්‍යාග වශයෙන් අත්හැර මෙසේ දුන්නේ කාටද? ශ්‍රමණාදීන්ටයි. එයින් අසන ලදී. **සමණබ්‍රාහමණ කපණ ද්ධික වණිබ්බක යාචකානං දානං දත්වා** - එකම පහය බොහෝ දෙනාට දුන්නේ කෙසේද? මෙසේ සිතක් ඔහුට උපන්නේය. මේ පහය වෙන් කළහොත් කැබලි කැබලි වශයෙන් වෙන් කරන්නේය. ඔහු ඊට නොකැමතිව යම් ප්‍රමාණ කැමති වේ නම් ඒ ප්‍රමාණය ගනීවායි දාන වශයෙන් අත්හරින්නේය. එයින් කියන ලදීඃ දන්දී මෛත්‍රිය භාග්‍යවතුන් වහන්සේට.... වාසය කරන්නේය''යි මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ සසරගාමී කුසලයට අනුසන්ධි දක්වන්නේ නැවත **අත්තදීපා භික්ඛවෙ විහරථ** - යනාදිය කීහ. **ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො ආයුස්මිං** - මහණෙනි, මම ආයුෂයෙන් ද වඩන්නහු යයි යමක් ඔබට කීවෙම්ද, එහි මේ භික්ෂුවගේ ආයුෂයෙහි මේ ආයු කරණ යයි යන අර්ථය වේ. එහෙයින් ආයුෂයෙන් වැඩීමට කැමති ඔබ විසින් මේ සතර ඉද්ධිපාද වැඩිය යුතුයයි දක්වන්නාහ. **වණ්ණස්මිං** - වර්ණයෙන් ද වඩන්න යයි මම යමක් ඔබට කීවෙම්ද, එහි වර්ණ කරණය. සිල්වතා ගේ විපිළිසර නොවීම් වශයෙන් ශරීර වර්ණය ද කීර්ති වශයෙන් ගුණ වර්ණයද වැඩේ. වර්ණයෙන් වැඩීමට කැමති ඔබ විසින් සීලසම්පන්න විය යුතුයයි දක්වන්නාහ. **සුඛස්මිං** - සැපයෙන් වඩන්න යයි යමක් මම කීවෙම් නම් එය මෙහි විවේකයෙන් හටගත් පීති සැප ආදි නානා ආකාර ධ්‍යාන සැප. ඔබ සැපෙන් වැඩීමට කැමති නම් මේ සතර ධ්‍යාන වැඩිය යුතුය. **භොගස්මිං** - භෝගයෙන් වැඩෙන්න යයි යමක් මම කීවෙම් නම්. එය නම් අප්‍රමාණ සත්වයින්ගේ ප්‍රියභාවයට, සැප සයනාදී ආනිසංස එකොලොසක් ඇති බ්‍රහම විහාර භොගයයි. භෝගයේ වැඩීමට

බ්‍රහම විහාර වැඩිය යුතුයි. **බලසම්ං** - බලයෙන් වැඩෙන්න යයි යමක් කීවෙම් නම් එය ආසවකඛය අවසානයෙහි උපදින අරහත් ඵල සංඛ්‍යාත බලයයි. ඒ බලයෙන් වැඩීමට කැමති ඔබ රහත් බවට පැමිණීමට හේතුවන යෝග කළ යුතුය.

**යථඉදං භිකඛවෙ මාරබලං** - යම් මේ දෙව්පුත් මාර, මරණ මාර, කෙලෙස් මාර ආදීන් ගේ බලය ඉවසිය නොහෙන දුරුකළ නොහැකි එවැනි බලයක් ලොව නොදනිමි. ඒ බලයද මේ රහත් බලයෙන් මැඩපවත්වයි. ඉක්මවයි, වසාගෙන පැතිරෙයි. එහෙයින් මෙහි යෝග (භාවනා) කළ යුතු යයි දක්වයි. **එවම්දං පුඤ්ඤං** - මෙසේ මේ ලෝකෝත්තර පින්ද ආසවකඛය දක්වා වැඩේ යයි සසරගාමී කුසල සන්ධිය නිමා කරන්නේ රහත් බව කුළු ගැන්වීමෙන් දේශනාව නිමා කළහ. සූත්‍ර අවසානයෙහි විසිදහසක් භික්ෂූහු රහත් ඵලයට පැමිණියහ. අසූහාර දහසක් ප්‍රාණීහු අමෘතපානය කළහ.

**චකකවතති සූත්‍ර වර්ණනාව නිමි.**

# 27

## අගගඤ්ඤ සූත්‍ර වර්ණනාව

**එමං මෙ සුතං** - අගගඤ්ඤ සූත්‍රය. මේ එහි ගැඹුරුපද වර්ණනාවය. **පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ** - මේ පිළිවෙළ කථාව මෙසේය. කල්ප ලක්ෂයකට පෙර එක් උපාසිකාවක් පියුමතුරා බුදුන්ට ආරාධනා කොට බුදුන් ප්‍රමුඛ භික්ෂූන් ලක්ෂයකට දානයක් දී භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැතිරී අනාගතයෙහි ඔබ වහන්සේ වැනි බුදුන් වහන්සේ කෙනෙකුට අග්‍ර උපසථායිකාව වන්නෙමියි ප්‍රාර්ථනාවක් කළාය. ඕ තොමෝ කල්ප ලක්ෂයක් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අපගේ බුදුන් වහන්සේගේ කාලයෙහි භද්දිය නගරයෙහි මෙණ්ඩක සිටුතුමාගේ

පුත්‍ර ධනඤ්ජය සිටුවරයාගේ ගෙයි සුමනා සිටුදේවිය කුස පිළිසිඳ ගත්තාය. උපන් කාලයෙහි ඇයට විසාඛා යයි නම තැබූහ. බුදුන් වහන්සේ භද්දිය නගරයට වැඩිය විට ඕතොමෝ දූරියන් පන්සියයක් සමග පෙරගමන් කොට පළමු දකීමෙන් ම සෝවාන් වූවාය. පසු කාලයෙහි සැවැත් නුවර මිගාර සිටු පුත් පුණ්‍යවර්ධන සිටුකුමරා සමග විවාහ වූවාය. එහි දී ඕ මිගාර සිටුවරයා විසින් මව් තනතුරෙහි තබන ලදී. එහෙයින් මිගාරමාතා යයි කියනු ලැබේ. පතිකුලයට යනවිට ඇයට ඇගේ පියා මහාලතා පසාධනය (මහාලතා ඇඳුම) කරවීය. ඒ ඇඳුමෙහි දියමනති නැලි හතරක් උපයෝගී විය. මුතු එකොළොස් නැලියක් ද පබළු දොලොස් නැලියක් ද මැණික් තිස්තුන් නැලියක් ද මෙසේ මේවායින් ද අන්‍ය වූ සප්ත රත්නවලින් නිමවීය. එය හිසෙහි පැළඳගත් කල දෙපතුල දක්වා වැටේ. ඇතුන් පස් දෙනෙකුගේ බල ඇති ස්ත්‍රියකට ම එය දූරිය හැකි විය. ඕ තොමෝ පසු කාලයෙහි දසබල බුදුන්ගේ අග්‍ර උපසථායිකාව වී ඒ පසාධනය විකුණා නව කෝටියකින් භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවන්නී අමුණු සතරක භූමි භාගයක ප්‍රාසාදයක් කරවීය. එහි උඩුමහලෙහි කුටි පන්සියයක් විය. පහත මාලයෙහි පන්සියක් විය. ඒ අනුව එය කුටි දහසකින් යුක්ත විය. ඕ තොමෝ තනි ප්‍රාසාදය පමණක් ලස්සන නැතැයි එය පිරිවරා ගෙවල් දෙසිය පනහක්ද කුඩා ගෙවල් දහසක් ද දික් සාලා පන්සියයක් ද කරවීය. විහාර පූජෝත්වය භාරමාසයකින් නිමවිය. ස්ත්‍රියක්ව සිටි විසාඛා මෙන් බුද්ධ සාසනයෙහි ධන පරිත්‍යාග කළ වෙනත් ස්ත්‍රියක් නැත. පිරිමියෙක්ව සිට අනේපිඩු සිටුතුමා මෙන් වෙන කවුරුවත් නැත. ඒ සිටුතුමා සිව්පනස් කෙළක් ධනය වියදම් කොට සැවැත්නුවර දකුණු භාගයෙහි අනුරාධපුර මහා විහාරය මෙන් සථානයක ජේතවනාරාම මහා විහාරය කරවීය. විසාඛා සැවැත්නුවර පෙරදිග උත්තම දේවි විහාරය පිහිටි තැන මෙන් ස්ථානයක පූර්වාරාම නම් විහාරය කරවූවාය. බුදුන් වහන්සේ මේ කුළ දෙකට අනුකම්පාවෙන් සැවැත්නුවර නිසා වැඩ වස්නේ මේ විහාර දෙකෙහි නිබද්ධ වාසයෙන් වැඩසිටියහ. එක් ඇතුළු වසක් ජේතවනයෙහි වසති. එක් ඇතුළු වසක් පුබ්බාරාමයෙහි වසති. එක් සමයක වනාහි භාග්‍යවතුන් වහන්සේ පුබ්බාරාමයෙහි වාසය කරති. එහෙයින් කියන ලදී. ''පුබ්බාරාමෙ මිගාර මාතු පාසාදේ''.

**වාසෙට්ඨ භරද්වාජෝ** - වාසෙට්ඨද සාමණේර භාරද්වාජද භික්ඛුසු **පරිවසන්ති** - තීර්ථක පරිවාස නොවේ. ඇවැත් පිරිවෙස් ද නොවේ.

භික්ෂුභාව ප්‍රාර්ථනා කරමින් වසති. ඒ දෙදෙනාම සතලිස් කෙළක් ධනය ඇති බ්‍රාහමණ මහාසාල කුලයෙහි උපන්හ. තුන් වේදයෙහි පරතෙරට ගියහ. මජ්ඣිම නිකායෙහි වාසෙට්ඨ සූත්‍රය අසා සරණ ගියහ. තෙවිජ්ජ සූත්‍රය අසා පැවිදි වූහ. මේ කාලයෙහි භික්ෂුභාවය බලාපොරොත්තුවෙන් පිරිවෙස් පුරති. **අබ්භොකාසෙ වංකමති** - උතුරු දකුණින් පළල් වූ ප්‍රාසාදයේ ඉදිරිපස ප්‍රාසාදය ඡායාවෙහි යන්තර ලනුවලින් අදිනු ලබන සත්රියන් උස රන් ඇගෑවක්මෙන් අහසෙහි දිවෙන සවණක් බුදුධ රශ්මිවලින් අලංකාර කරන්නේ එහා මෙහා සක්මන් කරයි. **අනුචංකම්ංසු** - ඇඳිලි බැඳ නැමුණු ශරීර ඇත්තේ අනුවර්තනය වෙමින් සක්මන් කළහ. **වාසෙට්ඨං ආමන්තෙසි** - හේ ඔවුන්ගේ පණ්ඩිතතරයයි ගත යුතුය. විසඳිය යුත්ත ද දනී. එහෙයින් ඔහු ඇමතූහ. **තුම්හෙ බවඨා** - ඔබ කවරෙක්වේද? **බ්‍රාහමණ ජච්චා** - බ්‍රාහමණ ජාතිකයෙකි. **බ්‍රාහමණ කුලිනා** - බ්‍රාහමණයන් අතර කුලීනයෙකි, කුලසම්පන්නයෙකි. **බ්‍රාහමණ කුල** - භවභොග සම්පත් ඇති බ්‍රාහමණ කුලයට හැර යන අර්ථයයි. **න අකෙකාසනති** - දසවිධ වූ ආක්‍රොශ වසතුවලින් ආක්‍රොශ නොකරති. අපහාස නොකරති. දූනගන්නට අසයි. කවර හෙයින්ද? පළමුවෙන් මා නොඇසුයේ නම් කථා නොකරති. කථා නොකළ කල්හි කතා පටන් නොගනී. කතා පටන් ගැනීම සඳහා **තගසා** - ඒකාන්ත වචනයෙහි නිපාතයකි.

ස්වාමීනි, ඒකාන්තයෙන්ම අපට ආක්‍රොශ කරති නින්දා කරතියි කියනලද්දේ වේ. **අතතරූපාය** - තමාට අනුරූපව, **පරිපුණ්ණාය** - කැමති පද අකුරු නගා සම්පූර්ණ කිරීමෙන්. **නො අපරිපුණ්ණාය** - අතර නොතබා පවත්වමින්. මේ සාමණේරයන්ට පිහිටක් නැති බවෙන් ආකෝශ කරන්නේ කුමකින්ද ? මේ සාමණෙරවරු ප්‍රධාන බ්‍රහමණයින්ගේ පුත්තු වෙති. තුන්වේදයෙහි පරතෙරට ගියහ. දඹදිව බමුණන් අතර ප්‍රකටයහ. බුහුමනට පත් වූහ. ඔවුන් පැවිදි වූ බැවින් අන්‍ය බමුණු පුත්තු පැවිදි වූහ. ඉක්බිති බමුණෝ අපට පිහිටක් නැතිව ගියේ යයි පිහිට නැතිබැවින් ගම්දොර ද ඔවුන් දූක ඔබලා විසින් බ්‍රාහ්මණ සමය බිඳින ලදී. මුඩු මහණාගේ පසු පස්සේ රසයට ලොල්වී හැසිරෙවු ආදියෙන්ද පෙලෙහි ආ බමුණෝම ශ්‍රේෂ්ඨයහ ආදියෙන් ද ආක්‍රොශ කරති. සාමණේරයෝ ඔවුන් ආක්‍රොශ කරන කල්හි ද කෝපයක් හෝ වෛරයක් හෝ නොකොට හුදෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරන ලද්දේ අපට සවාමීනි බ්‍රහමණයෝ ආක්‍රොශ කරති නින්දා කරතියයි දූන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආක්‍රොශ කරන ආකාරය ඔවුන්ගෙන් විචාරන්නේ ඒ කෙසේදූයි

විචාලහ. ඔව්හු කියත්තෝ. ස්වාමීනි බමුණෝ යනාදිය කීහ. එහි **සෙට්ඨො වණෙණා** - ජාති ගෝත්‍ර ආදිය පනවන අවස්ථාවෙහි බමුණෝම ශ්‍රේෂ්ඨ යයි දක්වයි. **හීනා අඤ්ඤේ වණ්ණා** - ඉතිරි වර්ණ තුන හීනය, ලාමකයයි කියති. **සුක්කො** - සුදු, **කණ්හා** - කළු. **සුජ්ඣන්ති** - ජාති ගෝත්‍රාදිය පනවන ස්ථානයන්හි සුදධවෙති. **බ්‍රහමුණො පුත්තා** - මහා බ්‍රහමයාගේ පුත්තු. **ඔරසා මුඛතො ජාතා** - උරෙහි වැස මුවින් පිටවූබැවින් ලයෙහි තබා වැඩූ බැවින් හෝ ඕරසා වේ. **බ්‍රහමජා** - බ්‍රහමගෙන් උපන්නෝ **බ්‍රහම නිම්මිතා** - බඹු විසින් නිර්මාණය කරන ලද්දෝ, **බ්‍රහම දායාදා** - බඹුගේ දායාද. **හීනමත්ථවණ්ණං අජ්ඣුපගතා** - හීන වර්ණයට පැමිණියේ යන අර්ථයයි. මුණ්ඩකයයි සමණක යයි නින්දා කරන්නේ පිළිකුල් කරන්නේ කියති. **ඉබ්භෙ** - ගෘහපතීන්. **කණ්හෙ** - කළුවූවන්. **බන්ධු** - මාරයාගේ බන්ධු වූ, මාරපාක්ෂිකයන්. **පාදාපච්චෙ** - මහ බඹුගේ පාවලින් දරු වූ. පාවලින් ඉපදුණාවුන් යන අදහසයි. වාසෙට්ඨයිනි! ඔබගේ බමුණෝ පුරාණය ඉතිහාසයට සිහි නොකරමින් මෙසේ කීහ. මෙහි වෙන නිපාත මාත්‍ර ඡට්ඨී වචනයි. ඔබලාගේ බ්‍රාහමණයෝ යන අර්ථයයි. **පොරාණං** - පුරාණ වූ අග්ගඤ්ඤ ලෝකොත්පත්ති වංශය. **අස්සරන්තා** - සිහි නොකරමින් මෙය කියන ලද්දේ වේ. වාසෙට්ඨයෙනි, ඔබලාගේ බ්‍රහමණයෝ පුරාණ වූ ලෝකෝත්පත්තිය සිහි නොකරන්නේ, නොදන්නෝ මෙසේ කියති. **දිස්සන්ති ඛො පනානි** - මේ ආදීවූ ඔවුන්ගේ ඇදහීම බිඳීමට කියන ලදී. එහි **බ්‍රාහමණියො** - බ්‍රාහමණයින් ගේ පුත්‍ර ප්‍රතිලාභය සඳහා ආවාහ විවාහ වශයෙන් කුලයට කැඳවාගෙන එන ලද බැමිණියන් පෙනෙත්. ඔව්හු වනාහි පසු කාලයෙහි ඍතු වූවෝ වෙති. හටගත් මල් යන අර්ථයි. **ගබ්භිනියො** - හටගත් ගැබ් ඇත්තේ. **විජායමානා** - දූ පුතුන් උපදවන්නෝ. **පායමානා** - දරුවන්ට කිරිපොවන්නියෝ. **යොනිජාව සමානා** - බැමිණියන් ගේ මුත්‍ර මාර්ගයෙන් උපන්නා හා සමාන. **එවමාහංසු** - මෙසේ කියති. බමුණෝම ශ්‍රේෂ්ඨ වර්ණ වන්නේ කෙසේද? බ්‍රහ්මයාගෙන් උපන්නේය යන වචන සැබෑවන්නේ නම් බැමිණියන්ගේ කුස මහබඹුගේ උරය වන්නේය. බැමිණියන් ගේ මුත්‍ර මාර්ගය මහබඹුගේ මුඛය වන්නේය. මෙය මෙසේ නොදත යුතුය. එහෙයින් කියන ලදී ''ඔව්හු මහා බ්‍රහමයාට නින්දා කරති'' යනාදිය. මෙපමණකින් අපි බ්‍රහමයාගේ උරයෙහි වාසය කොට මුඛයෙන් නික්මුනෙමුයි කියන්නට නොලබත්වායි මෙය කට කඩන වාරය කියා නැවත සිව් වණම කුසල දහම් සමාදන්ව පවතින්නෝ ම සුදධවෙති දක්වීම සඳහා ''වාසෙට්ඨායෙනි මේ වර්ණ සතර'' යයි යනාදිය කීහ.

**අකුසල සංඛ්‍යාත** - අකුසල සංඛ්‍යාත, අකුසල කොටස් වූ සියළු තැන මෙම නයයි. **න අලමරියා** - ආර්යභාවයෙහි අසමර්ථ වූ **කණහා** - ප්‍රකෘති කාලවර්ණය. **කණහ විපාකා** - ඔවුන්ගේ විපාකය ද කළුය. දුක් යන අර්ථයයි. **ඛත්තියෙපි තෙ** - ක්‍ෂත්‍රිය වූ ද ඔව්හු. **එකචෙව** - ඇතමුන් කෙරෙහි. **සුකකා** - නික්ලේශ බැවින් සුදු වූ **සුකකවිපාකා** - ඔවුන්ගේ විපාකය ද සුදුය. සැපය යන අර්ථයයි. **උභය වෙය්‍යාකිණෙණසු වත්‍තමානෙසු** - දෙකෙහි මිශ්‍ර පවතින කල්හි. කිනම් දෙකකද? කළු සුදුවල. නුවණැත්තන් විසින් ගරහන ලදද පසස්නා ලදද. **යදෙත්‍ථ බ්‍රාහමණා එවමාහංසු** - මෙහි මේ කළු සුදු ධර්මවල පවත්නා කල්හි ද බ්‍රාහ්මණයෝ එයම මෙසේ කියති. බමුණෝම සෙට යයි ආදිය. ඒවා නුවණැත්තෝ අනුනොදනිති. ලෝකයේ වෙසෙන පඬිවරු අනුමත නොකරති. ප්‍රශංසා නොකරති යන අර්ථයයි. ඊට හේතු කවරේද යත් මේවායෙහි වාසෙට්ඨ ආදියෙහි මේ සංක්‍ෂේප අර්ථයයි. අනුබ්‍යඤජන නොවේ යයි යමක් කියන ලද නම් එය කුමක් සඳහා ද ? යම්සේ මේ සිව් වර්ණයන්ගෙන් යම් භික්‍ෂූන් රහත් වේද..... මිදුණු බව මනාව දන්නා ලද්දේ ද හෙතෙම ඔවුන්ගෙන් අග්‍රයයි කියයි. ඔව්හු මෙබඳු නොවේ. එහෙයින් නුවණැත්තෝ ඔවුන් අග්‍ර යයි අනු නොදනිති.

**අරහං** - ආදි පදවල මෙහි කෙලෙසුන්ගේ දුරුවීම් කරණාදියෙන් අරහ වේ. ආස්‍රවයන් ක්‍ෂය කරනලද බැවින් ඛීණාසව වේ. සේකයින් සත් දෙනා ද කල්‍යාණ පෘථජනයාද බඹසරෙහි වසන්නෝ වෙති. මෙය වනාහි වසන ලද වස් ඇත්තේ **වුසිතවා** - නම් වේ. සිව් මගෙහි සිවු සස්හි දැනීම් ආදි කළයුතු දේ කරන ලද්දේ මොහුය යන තේරුමෙන් **කතකරණීයො** - වේ. **ඔහිතො** - බහාතැබූ සුන්දර අරුත හෝ සිය අරුත **සදත්‍ථ** - නම් වේ. පැමිණෙන ලද සදත්‍ථ ඇත්තේ **අනුපපතත සදත්‍ථො** - වේ. **භව සඤෙඤාජනං** - තෘෂ්ණාව කියයි. එය ක්‍ෂීණ වූයේ මොහුටනුයි **පරික්ඛීණ භව සංයෝජනො** - වේ. **සමමදඤඤා විමුතෙතා** - මනාව හේතු නයින් කරුණු දැන මිදෙන ලද්දේ. **ජනෙසම්ං** - මේ ජනයා කෙරෙහි. මේ අත්බැව්හි ද යන අර්ථයයි. **දිටෙඨ චෙව ධමෙම අභිසමපරායං ච** - මේ අත්බැව්හි ද පර අත්බැව්හිද **අනනතරා** - අන්තරයක් නැති. තමාගේ කුලයෙන් සමානය යන අර්ථයයි. **අනුයුතතා** - අනුව වසන්නේ. **නිපචචකාරං** - මහළු පිළිවෙළින් යටහත් බව දක්වති. වඩා දහර වූවෝ අභිවාදනාදිය කරති. එහි **සාමීචි කමමං** - ඒ ඒ වත් ආදි සුදු ක්‍රියා. **නිවිටඨ** - ප්‍රවෙශ වූ. අචලව සිටි කාට වනාහි මෙබඳු ශ්‍රද්ධාවක් වේද?

සෝවාන් පුද්ගලයාටය. හේ ශ්‍රද්ධාවට පිවිසියේ කඩුවෙන් බෙල්ල කපන විට ද බුදුරදුන්ට අබුද්ධ යයි හෝ ධර්මය අධර්මය යයි හෝ සංඝයා අසංඝ යයි හෝ නො කියයි. පිහිටන ලද ශ්‍රද්ධා ඇත්තේ වේ. සූරම්බට්ඨ මෙනි.

හේ වනාහි ශාස්තෘන් වහන්සේ ගේ ධර්ම දේශනාව අසා සෝවාන්ව ගෙට පැමිණියේය. ඉක්බිති මාරයා දෙතිස් ලකුණු ප්‍රතිමණ්ඩිත වූ බුද්ධ රූපයක් මවා ගෙයි දොරකඩ සිට ශාස්තෘන් වහන්සේ වැඩියේ යයි පණිවිඩ යැවීය. සූරම්බට්ඨ සිතීය. මම දැන් ශාස්තෘන් සමීපයෙන් බණ අසා ආවේ වෙමි. කුමක් වන්නේද? පැමිණ ශාස්තෘන් සංඥාවෙන් වැඳ සිටියේය. මාර කීය. අම්බට්ඨය, මා විසින් රූපය අනිත්‍යය.... විඤ්ඤාණය අනිත්‍ය යයි කියන ලද එය වැරදි කථනයකි. කරුණු නොසලකා මා විසින් එය කියන ලදී. එහෙයින් ඔබ රූපය නිත්‍යය... විඥානය නිත්‍ය යයි ගනුව. සූරයා සිතීය. බුදුවරු නොසලකා ප්‍රත්‍යක්ෂ නොකොට යමක් යම් කිසිවක් කියන්නේ නම් එය නොවිය හැකිය. ඒකාන්තයෙන් මේ මා බුදුරදුන්ගෙන් වෙන්කිරීම සඳහා මාරයා පැමිණියේය. ඉක්බිති ඔහුට තෝ මාරයා මෙහි යයි කීය. හේ බොරුකීමට නොහැකි විය. එසේය, මාරයා වෙමියි පිළිතුරු දුන්නේය. කුමක් හෙයින් ආවෙහිද? ඔබේ ශ්‍රද්ධාව සෙලවීමට යයි කීය. කළු පවිට, තෝ එකෙක් සිට තා වැනි මාරයන් සියයක්ද දහසක්ද දස දහසක් ද මාගේ ශ්‍රද්ධාව සෙලවීමට සමත් නොවෙති. මාර්ගයෙන් පැමිණි ශ්‍රද්ධාව සථිරය. සීල පොළොවෙහි පිහිටියේ මහමෙර මෙන් අචලය. කිම තෝ මෙතන යයි අසුරු සත් කෙළේය. මාරයා සිටීමට නොහැක්කේ එහිම අතුරුදහන් විය. එබඳු වූ ශ්‍රද්ධාවක් සඳහා මෙය කියන ලදී. **මූලජාතා පතිට්ඨිතා** - මාර්ග මූලය හටගත් බැවින් ඒ මුලින් පිහිටන ලදී. **දළ්හා** - සථිර. **අසංහාරියා** - මනාව සිට වූ ඉන්ද්‍රඛීලය මෙන් කිසිවෙකුටත් සෙලවිය නොහැකි වන්නේය.

**තසෙසතං කල්ලං වචනාය** - ඒ ආර්ය ශ්‍රාවකයට මෙය කීමට යුතුය. කිම භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ මේ ආදි. හේ වනාහි භාග්‍යවතුන් වහන්සේ නිසා ආර්ය භූමියෙහි ඉපදුනේ යයි **භගවතො පුත්තො** - වේ. පපුවෙහි වාසය කොට කටින් පිටවන ධර්ම ඝෝෂාව වශයෙන් මාර්ගඵලවල පිහිටි බැවින් **ඔරසො පුත්තො මුඛතො ජාතො** - වේ. ආර්ය ධර්මයෙන් උපන් බැවින් ආර්ය ධර්මයෙන් නිර්මිත බැවින්

- ධම්මජො ධම්ම නිම්මිතො - වේ. නව ලෝකෝත්තර ධර්ම දායාදයට සුදුසු වේ යයි ධම්ම දායාදො - වේ. **තං කිස්ස හෙතු** - මෙතෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පුත්‍ර යයි කියා ධම්මජො ධම්ම නිම්මිතො යයි කියන ලදී. ඒ කුමක් නිසාද? දැන් එහි අර්ථ දක්වන්නේ තථාගතයන් වහන්සේගේ මෙය යයි ආදිය කීහ. එහි ධම්මකාය මෙසේ යයි කුමක් හෙයින් තථාගතයන් වහන්සේ ධම්මකාය යයි කියන ලදද? තථාගතයන් වහන්සේ ත්‍රිපිටක බුද්ධ වචනය හෘදයෙන් සිතා වචනයෙන් දක්වූහ. එහෙයින් මේ කය ධර්මයම බැවින් ධර්මය මෙන්. මෙසේ ධම්මකාය මෙයටයි - ධම්ම කායො- කියනු ලැබේ. **ධම්මභූතො** - ධර්මයෙහි සවභාවය ධර්මකාය බවම බ්‍රහමකායො - වේ. එසේම ධර්මය ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහම යයි කියනු ලැබේ. මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රේෂ්ඨ ඡේදක වාදය දක්වා වෙනත් න්‍යායකින් එයම දැක්වීමට වාසෙට්ඨය, කාලය වේ යයි යනාදිය කීහ. එහි සංවට්ට විවට්ට කථා බ්‍රහමජාල සූත්‍රයෙහි විස්රකර ඇත. **ඉත්ථත්තං ආගච්ඡන්ති** - මිනිස් බවට පැමිණෙති. **තෙධ හොන්ති මනොමයා** - ඔව්හු මේ මිනිස් ලොවෙහි උපදින්නෝද ඕපපාතිකව සිතින්ම උපදින්නෝ මනෝමය වෙති. බඹ ලොවෙහි මෙන් මෙහි ද ඔවුන්ගේ ප්‍රීතියෙන් ම අහර කිස සදතියි **පීතිභක්ඛා** - වෙති. මේ නයින් ම සයංපභා යනාදි ද දත යුතුය. **එකොදි භූතං** - සියළු සක්වලම එකම ජලයක් බවට පත්වේ. **අන්ධකාරො** - අඳුරය. අන්ධකරතිමිසා චක්ඛුවිඤ්ඤාණ උපත වැලකීමෙන් අඳබව ඇතිකරන ගන අඳුර. **සමතා** - පිහිටියේය. හාත්පස පැතිරී ගියේය. **පයසො තත්තස්ස** - උණු කිරි. **වණ්ණ සම්පන්නා** - වර්ණයෙන් යුත් කිණිහිරි මල් සමාන එහි වර්ණය විය. **ගන්ධ සම්පන්නා** - සුවඳින් යුත්. දිව සුවඳ හමයි. **රස සම්පන්නා** - රසයෙන් යුත්, බහන ලද දිව ඕජස් මෙන් විය. **ඛුද්ද මධුං** - කනවේ පැණි. **අනෙලකං** - නිදොස් මැස්සන් රහිත. **ලොලජාතිකො** - ලොල්බව. අතීත අතුරු කපෙහි ද ලොල් වූයේම වේ. **අමෙහා** - අසිරියක් ඇති වී යයි කීය. **කිමෙවිදං භවිස්සති** - මෙහි වර්ණය ද සුවඳද මනාපය. රසය කෙබඳු වන්නේද යන අර්ථය වේ. හේ එහි උපන් ලෝභය රස පොළොව ඇඟිල්ලෙන් සෑරීය. ඇඟිල්ලෙන් ගෙන දිවඟ තැබීය. **අච්ඡාදෙසි** - දිව තැබූ පමණින් රසනහර දහසක පැතිරී මනාපම සිටී. **තණ්හාචස්ස ඔක්කමි** - එහි ඔහුට තෘෂ්ණාව ඇතිවිය. **ආලුම්පකාරකං උපක්කමිංසු පරිභුඤ්ජිතුං** - පිඩුකොට පිඩු සිඳ කෑමට ඇරඹූහ. **චන්දිම සූරියා** - සඳද හිරුද **පාතුරහොසුං** - පහළ විය. මුලින් පහළ වූයේ කුමක්ද? කවරෙක් කොහි වෙසේද? කාට කුමන ප්‍රමාණයක්ද

ඉහළ කවුද? වේගයෙන් යන්නේ කවුද? වීථි කීයද? කෙසේ හැසිරෙත්ද? කොපමණ තැන් එලිය කරයිද? දෙදෙනාම එකට පහළවෙයි. හිරු මුලින්ම පෙනේ. ඒ සතුන්ගේ සිස එලිය නැතිවී අඳුර විය. ඔව්හු බියෙන් තැතිගත්තෝ එලිය පහළ වන්නේ නම් යහපත් යයි සිතුහ. ඉක්බිති ජනයාගේ සූරභාවය උපදවමින් හිරුමඬල නැග්ගෙයි. ඊට හිරු යයි නම් විය. එදින එලිය කොට නැවත අඳුර විය වෙනත් එලියක් ඇතිවූවොත් යහපත් යයි සිතුහ. ඉක්බිති සඳමඬල ඇතිවිය. ඊට සඳ යයි නම් විය. ඒනයින් සඳ ඇතුළු මැණික් විමනෙහි වසයි. ඔහු පිටත රිදියෙන් වටකරන ලද්දේ දෙකම සීතල වේ. හිරු ඇතුළත රන්විමණක වසයි. ඔහු බාහිරව පලිඟුවෙන් වසා ඇත. දෙකම උනුසුම්ය. ප්‍රමාණ වශයෙන් සඳ සෘජුව (විශ්ව කර්මය) එකුන් පනස් යොදුනකි. පරිමණ්ඩලය (පරිධිය) යොදුන් දෙසිය පනසෙකි. හිරු විෂ්කම්භය පනස් යොදුනකි. පරිධිය යොදුන් හයසිය පනහකි. සඳ යට, හිරු ඉහළ අතර යොදුනක් වේ. සඳේ පහළ සිට හිරුගේ ඉහළට යොදුන් සියයක් වේ. සඳ සෘජුව සෙමෙන් යයි. සරස්ව ඉක්මනින් යයි. දෙපැත්තෙහි නකත් තරු වේ. සඳ දෙන මෙන් වසු වූ ඒ ඒ නකත් තරු වෙත එළඹෙයි. නකත් තම තැන අත් නොහරියි. හිරුගේ සෘජු ගමන ඉක්මන්ය. හරස් ගමන මන්‍දය. එය කළු පක්‍ෂ පොහොයේ පාටිපද දවසේ යොදුන් ලක්‍ෂයක් සඳමඬල ඉක්මවා යයි. එවිට සඳ රේඛාවක් මෙන් පෙනේ. (චන්‍ද්‍රග්‍රහණය) පක්‍ෂයක දෙවන දිනයෙහි ලක්‍ෂය ලක්‍ෂය යොදුන් ඉක්මවා යයි. ඉක්බිති සඳ අනුක්‍රමයෙන් වැඩී උපෝෂථ දිනයෙහි සම්පූර්ණ වේ. නැවත පාටිපද දිනයෙහි (උපෝෂථ දින දෙකට පසු දිනය) යොදුන් ලක්‍ෂයක් දුව ගතියි. දෙවන දිනයෙහි ලක්‍ෂයක් මෙසේ උපෝෂථ දිනය දක්වා ලක්‍ෂය බැගින් දුව ගතියි. ඉක්බිති සඳ යට හිරු ඉහළ වෙයි. මහත් තලියක් කුඩා භාජනයක් මෙන් සඳ මඬල වසයි. මධ්‍යාහ්නයේ මෙය ඡායාව මෙන් සඳේ ඡායාව නොපෙනේ. එහි ඡායාව නොපෙනීමෙන් දුර සිටියහුට දිව පහනක් මෙන් තමා ද නොපෙනේ.

ඒවායේ වීථි කීයද? එහි වනාහි අජ වීථි, නාගවීථි, ගොවීථි යයි තුනකි. එහි එළුවන්ගේ ජලය පිළිකුල් වේ. ඇතුන් නාගයින්ට මනාපය. ගොනුන්ට සීත උෂ්ණ සමාන නිසා පහසු වේ. එහෙයින් යම් සඳහිරු අජ වීථියට නැංගේද? එකල එක් බින්දුවකුදු වැසි නොවසී. නාග වීථියට නැගෙන කල අහස බිඳුනා මෙන් වැගිරෙයි. ගො වීථියට පැමිණි කල සෘතු සමාන බවට පැමිණේ.

සඳහිරු මාස 6 ක් මහාමේරුවෙන් පිටත නික්මෙයි. සමසක් ඇතුළෙහි හැසිරෙයි. ඇසල මස මහා මේරුව සමීපයෙහි හැසිරෙයි. එයින් දෙවසක් ඉකුත් වී පිටත හැසිරෙන්නේ පළමු කාර්තික මාසයෙහි මැදින් යයි. එයින් සක්වල බලා ගොස් තෙමසක් සක්වල සමීපයෙන් හැසිර නැවත නික්මී චිත්‍ර (බක්) මාසයෙහි මැදින් ගොස් නැවත තව මාස දෙකක් මහමෙර දෙසට පැන නැවත ඇසල මස මහාමේරුව සමීපයෙන් හැසිරෙයි. කොපමණ තැන් ආලෝකය විහිදුවයිද? එකපහරින් දිවයින් තුනෙහි ආලෝකය විහිදුවයි. මේ දිවයිනෙහි හිරු උදාවන කාලයෙහි පූර්ව විදේශයෙහි මධ්‍යාහ්න කාලයයි. උතුරුකුරු දිවයිනෙහි හිරු බැසයන වෙලාවයි. අපර ගෝයානයෙහි මධ්‍යම යාමයයි. පූර්ව විදේහයෙහි උදාවන කාලයයි. උතුරුකුරුවෙහි මධ්‍යාහ්න කාලයයි. අපරගෝයානයෙහි හිරු බැසයන කාලයයි. මෙහි මධ්‍යම යාමයයි. උතුරුකුරු දිවයින්හි උදාවන කාලයයි. අපරගෝයානයෙහි මධ්‍යාහ්න කාලයයි. මෙහි බැසයන කාලය, පූර්ව විදේශයෙහි මධ්‍යම යාමයයි, අපරගෝයාන දිවයිනේ උදාවන කාලයයි. මෙහි මධ්‍යහ්න කාලය, විදේහ දිවයිනෙහි බැසයන කාලයයි. උතුරුකුරු දිවයින්වල මධ්‍යම යාමයයි.

**නක්ඛත්තානි තාරකරූපානි** - කාර්තික ආදි නක්‍ෂත්‍ර මෙන්ම සෙසු තාරකා රූප සඳහිරු සමගම පහළ විය. **රත්තිංදිවා** - එයින් හිරුබැස යෑමේ සිට අරුණු නැගීම දක්වා රාත්‍රියයි. අරුණ නැගීමේ සිට හිරු බැස යෑම දක්වා දවාලය. මෙසේ රෑ දාවල් පෙනී ගියේය. ඉක්බිති රාත්‍රි පහලොවක් අඩමසක් යයි අඩමස දෙකක් මාසයයිද මෙසේ මාස අඩමස් පෙනී ගියේය. ඉක්බිති මාස හතරක් උතු විය. උතු (සෘතු) තුනක් සංවත්සරයයි මෙසේ සෘතු සංවත්සර පෙනී ගියේය. **වණ්ණවෙවණ්ණතා** - වර්ණයේ විවර්ණ බව. **තෙසං වණ්ණාතිමාන පච්චයා** - ඒවාවේ වර්ණය අරබයා උපන් අතිමාන හේතුවෙන් **මානාතිමාන ජාතිකානං** - යළි යළි උපන් මාන අතිමාන සම්භාවනාවන්. **රසාය පඨවියා** - රස යයි නම් ලැබූ පොළොවෙහි. **අනුත්ථුනිංසු** - අනුව කථා කළහ. **අහොරසං** - අහෝ අපගේ මිහිරි රස අතුරුදහන් විය. **අග්ගඤ්ඤං අක්ඛරං** - ලෝකෝත්තපත්ති වංසකථාව. **අනුපදනති** - අනුව යති. **එවමෙවං පාතුරහොසි** - මෙසේ වී පැන නැංගේය. **අනෙතාවාපියං** - දිය සිඳුණු කල්හි සුදු කලල පටලයක් මෙන් පැන නැංගේය. **බදාලතා** - මිහිරි වූ එක් සොඳුරු වැලක්. **කලම්බුකා** - නැළියකි. **අහු වත නො** - අපගේ බදාලතා මිහිරි රස විය. **අහාසි වත නො** - එය දූන් අතුරුදහන් විය.

**අකට්ඨපාකො** - අකට්ඨ නම් භූමිභාගයෙහි පහළ වූ. **අකණො** - කුඩු නැති. **අථුසො** - පොතු නැති සුගන්‍ධො - දිව සුවඳ වැහෙයි. **තණ්ඩුලප්ඵලං** - පිරිසිදු සුදු සහල්ම පලගනියි. **පක්කං පටිවරූළ්හං** - සවස ගත් තැන උදේ පැසුනේ වේ. නැවත පැසී යයි. ගත් තැන නොපෙනේ. **නාපදානං පඤ්ඤායති** - නො කැපුවා මෙන් නො අඩුව පෙනේ. **ඉත්ථියාවා** - පෙර මනුෂ්‍ය කාලයෙහි ස්ත්‍රියක් නම් ඇයට ස්ත්‍රී ලිංගය පහළ වේ. පෙර මිනිසකු නම් ඔහුට පුරුෂ ලිංගය පහළ වේ. ස්ත්‍රියක් පුරුෂාත්මභාවය ලබන්නේ පිළිවෙළින් පිරිමිබවේ ධර්මයෙහි යෙදී එය පුරා ලබයි. පුරුෂයෙක් ස්ත්‍රී බව කාමමිථ්‍යාචාරය නිසා ලබයි. එකල වනාහි ප්‍රකෘතියෙන් ස්ත්‍රියට ස්ත්‍රී ලිංගයද පුරුෂයාට පුරුෂ ලිංගයද පහළ විය. **උපනිජ්ඣායතං** - නැවත සිහිකරන්නේ බලන්නේ, **පරිළාහො** රාග දැවීම **සෙට්ඨිං** - අළු. **නිබ්බුය්හමානාය** - පමුණුවමින්. **අධම්ම සම්මතං** - එය වනාහි පස් තැබීම් ආදිය අධර්මයයි සම්මතය. **තදෙතරහි ධම්ම සම්මතං** - එය දැන් ධර්ම යයි සම්මත ධර්මය ගෙන හැසිරෙති. එසේම එක් ජනපදයක කලහ කරමින් ස්ත්‍රීහු ඔබ කුමක් නිසා කථා කෙළෙහිද? ගොම පිඩක් පමණකුදු නොලැබූනයි කියති. **පාතබ්‍යතං** - සේවනය කළයුතු. **සන්නිධිකාරකං** - තබාගෙන. **අපදානං පඤ්ඤායිත්ථ** - සිඳුණු තැන් අඩුවම පෙනේ. **සණ්ඩ සණ්ඩා** - එක් එක් තැන්වල කොටස් කලාක්මෙන් පඳුරු පඳුරු විය. **මරියාදං ඨපෙය්‍යාම** - සීමා තබන්නෙමු. **යත්‍රහි නාම** - යමෙක් නම් **පාණිනා පහරිංසු** - තුන් වරක් වචනය නො ගැනීමෙන් අතින් ගැසූහ. **තදග්ගෙ ඛො පන** - එය අග්‍ර කොට. **ඛීයිතබ්බ ඛීයෙය්‍ය** - ප්‍රකාශ කළයුතුය. ප්‍රකාශ කරන්නේය. තැබිය යුතුය. තබන්නේය. ගෙනයා යුතුය. ගෙන යන්නේය. **යො නෙසං සත්තො** - යමෙක් මොවුන්ගේ සත්වයෙක් හේ කවරෙක්දැයි, අපගේ බෝධිසත්වයා. **සාලීනං භාගං අනුපදස්සාම** හැල්වලින් කොටසක් - අපි එක එක කුඹුරුවලින් අමුණා අමුණා ගෙන ඔබට හාල් කොටසක් දෙන්නෙමු. ඔබ කිසි වැඩක් නොකළ යුතුය. ඔබ අපේ ප්‍රධානයා වශයෙන් සිටින්න. **අක්ඛරං උපනිබ්බත්තං** - සංඛ්‍යා නම් පැනවීම ව්‍යවහාර ඇතිවිය. **ඛත්තියො ඛත්තියොතෙව දුතියං අක්ඛරං** - හුදෙක් අකුරු පමණක් නොව ඒ කුඹුරු හිමියෝ සක් තුනකින් අභිෂේකය ද කළහ. **රඤ්ජෙති** - සැප ගෙන දෙයි පිනවයි. **අග්ගඤ්ඤෙන** - අග්‍ර යයි දැනීමෙන්. අග්‍ර යයි හෝ දැනීමෙන් ලෝකෝත්පත්ති සමයෙහි ඉපදීමෙන් ඉපදුනේ විය. **වීතංගාරා වීතධූමා** - පිස කෑ බැවින් නැති වූ දුම් අඟුරු. **පණ්ණමුසලා** - කොටා පිසූ බැවින් වැටුණු මොහොල්. **ඝාසමෙසනා** - භික්ෂාවට

හැසිරීම් වශයෙන් කැඳබත් සොයන්නේ. තමෙන මනුසසා දිසවා - ඔව්හු මේ මිනිසුන් දැක. **අනභිසමභුණ මානා** - නො ඉවසන්නේ. නොහැක්කේ. **ගනෙථ කරොනතා** - ත්‍රිවේදය අභිසංස්කරනය කරන්නේද කියන්නේද. **අචඡනති** - වසති. **අචෙඡනති** - යයිද පාඨයි. එම තේරුම වේ. **හීන සමමතං** - මන්ත්‍ර දරති. මන්ත්‍ර කියති යයි වාසෙට්ඨය මෙය ඒ කාලයෙහි හීන සම්මතය. **තදෙතරහි සෙටඨ සමමතං** - එය දැන් මෙපමණ මන්ත්‍ර වාචනා කෙරේ යයි ශ්‍රේෂ්ඨ සම්මත වේ. **බ්‍රාහමණ මණ්ඩලසස** - බ්‍රාහමණ සමූහයාගේ. **මිථුනං සමාදාය** - මෛථුන ධර්මය සමාදන්ව. **විසසුත කමමනෙත පයොජෙසු** - ගවපාලන වෙළඳාම වැනි ප්‍රසිද්ධ කර්මාන්තවල යෙදුනහ. **සුදදා සුදදා** - එයින් නපුරු හැසිරීම් සුළු හැසිරීම් වලින්. **සුදදං සුදදං** - වහ වහා වැරදියට යති විනාශ වෙති යන අර්ථයයි. **අහු බො සකං ධමං ගරහමානො** - සේසත් නැගීමෙන් පමණක් පිරිසිදුවීමට නොහැකි වේ. මෙසේ තමාගේ ක්ෂත්‍රිය ධර්මවලට නින්දා කරමින්. සියළු තැන මෙම නයයි. **ඉමෙහි බො වාසෙටඨ චතුහි මණඩලෙහි** - මෙයින් මෙය දක්වයි. ශ්‍රමණ මණ්ඩලයයි වෙනම නැත. ජාතියෙන් මනාව පිරිසිදු විය නොහැක. තම තමාගේ හොඳ ප්‍රතිපත්තියෙන් පිරිසිදු වේ. එහෙයින් මේ මණ්ඩල හතරෙන් ශ්‍රමණ මණ්ඩලයේ ඉපදීම වේ. මේ මණ්ඩල ශ්‍රමණ මණ්ඩලය අනුව පවතී. පවත්නේද ධර්මයෙන් මිස අධර්මයෙන් නොවේ. සමණ මණ්ඩලයට පැමිණ මනාව ප්‍රතිපත්ති පුරා සුද්ධියට පැමිණෙති. දැන් යම්සේ ජාතියෙන් පිරිසිදු විය නොහැකිය. මනා ප්‍රතිපත්තියෙන්ම පිරිසිදු වේ. ඒ අර්ථය ප්‍රකට කරන්නේ ''ක්ෂත්‍රියෝද වාසෙට්ඨ'' යනාදි දේශනා ඇරඹූහ. එහි **මිචඡාදිටඨී කමමසමාදාන හේතු** - මිථ්‍යා දෘෂ්ටි වශයෙන් සමාදන් වූ කර්ම හේතු මිථ්‍යා දෘෂ්ටි කර්මයේ හෝ සමාදාන හේතු. **ද්වයකාරී** - කුසල් අකුසල් දෙකම කරන. **සුඛදුකඛ පටිසංවෙදි හොති** - එකක්ෂණයෙහි උභය විපාක ඥාන තැනක් නැත. යමෙකු විසින් අකුසල් බොහෝ කරන ලද්දේ ද කුසල් අල්පද හේ ඒ කුසලය නිසා ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රහමණ කුලයෙහි උපදී. ඉක්බිති ඔහු අකුසල කර්මයෙන් කණ කරයි. කුදු කරයි. අත්පා කොර කරයි (පිළු කරයි) හේ රජයට සුදුසු නොවේ. අභිෂේක නොකළ කාලයෙහි ද මෙසේ වීමෙන් භෝග පරිභෝජනයට නොහැකි වේ. පසුව මැරෙන වෙලාවෙහි දෙකම මල්ලවයන් මෙන් කුසල අකුසල කර්ම වැටහේ. ඒවායින් අකුසල බලවත් වූවොත් එය කුසල් අයින්කර තිරිසන් යෝනියෙහි උපදවයි. කුසල කර්මයෙහි ප්‍රවෘත්ති වේදනයෙන් ඔහු මඟුල් ඇතා මඟුල් අශ්වයා හෝ මඟුල් වෘෂභයා කරයි. හේ සම්පත් අනුභව කරයි.

මේ සඳහා කියන ලදී. ''සැප දුක් විඳින්නේ වේ.'' සත්තන්තං බොධිපක්ඛියානං - සතිපට්ඨාන ආදි කොට්ඨාශ වශයෙන් සත් පිළිවෙළින් සත්තිස් බෝධිපක්ෂික ධර්මයන්ගේ. භාවනමන්වාය - භාවනා අනුගමනය කොට. පිළිපැද යන අර්ථය වේ. පරිනිබ්බාති - කෙලෙස් පිරිනිවුනේ පිරිනිවේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සිව් වණ දක්වා චතුරාර්ය සත්‍ය ප්‍රතිවේද කළ රහතන් වහන්සේම දෙව්මිනිසුන් අතර ශ්‍රේෂ්ඨකොට දක්වූහ. දැන් එම අර්ථයම ලෝක සම්මත වූ බ්‍රාහමණයෝ ද වචනානාසාරයෙන් දෘඩිකොට දක්වන්නේ ''වාසෙට්ඨ, මොවුන්ගේ සිව් වර්ණය'' යනාදිය කීහ. බ්‍රහ්මුනා යනාදිය අම්බට්ඨ සූත්‍රයෙහි විස්තර කරන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙපමණකින් මේ කථා මාර්ගයෙන් ශ්‍රේෂ්ඨ ඡේදක වාරය දක්වා සූත්‍රාන්තර පෙරළා රහත් බව තුළ ගැන්වීමෙන් දේශනාව නිමවූහ අත්තමනා වාසෙට්ඨ භාරද්වාජා - වාසෙට්ඨ භාරද්වාජ සාමණේරයෝ ද සතුටු සිතැතිව සාධු සාධු යයි භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවට සතුටු වූහ. මේ සූත්‍රාන්තයම ආවර්ජනා කරන්නේ සිහි කරන්නේ සිව් පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියහ.

**අග්ගඤ්ඤ සූත්‍ර වර්ණනාව නිමි.**

# 28
## සම්පසාදනිය සූත්‍ර වර්ණනාව

එවමෙමසුතං - සම්පසාදනිය සූත්‍රය. මේ එහි ගැඹුරු පද වර්ණනාවය. නාලන්දායං - නාලන්ද නම් නගරයෙහි. ඒ නගරය ගොදුරු ගම් කොට. පාවාරිකම්බවනෙ - දූසසපාවාරික නම් සිටුවරයාගේ අඹ වනයෙහි. එය වනාහි ඔහුගේ උයන විය. හේ භාග්‍යවතුන් වහන්සේගේ දහම් අසා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී ඒ උයනෙහි කුටි ලෙණ මණ්ඩපාදියෙන් යුත් විහාරයක් කොට භාග්‍යවතුන් වහන්සේට

පූජා කෙළේය. ඒ විහාරය ජීවකම්බ වනය මෙන් පාවාරිකම්බවනය යයි ප්‍රසිද්ධ විය. ඒ පාවාරික අඹවනයෙහි වාසය කරති යන අර්ථයයි. **භගවන්තං එතදවොච එවං පසන්නො අහං භන්තෙ භගවති** - කුමක් හෙයින් මෙසේ කීවේද? තමාට උපන් සොම්නස ප්‍රකාශ කිරීම සඳහා. මේ එහි අනුපිළිවෙළ කථාවයි. තෙරුන් වහන්සේ වනාහි එදින කලින්ම සිරුර පිළිදගුම් කොට හැඳ පෙරවා පා සිවුරු ගෙන පැහැදුනා වූ සතුටු වූවාහු දෙව් මිනිසුන්ගේ ප්‍රසාදය ඇති කරවමින් නාලන්දා වාසීන් ගේ හිතසුව වඩමින් පිඬු පිණිස හැසිර පසු බතෙහි පිණ්ඩපාතයෙන් වෙන්වූයේ විහාරයට ගොස් ශාස්තෲන් වහන්සේට වත් දක්වා ගඳකිලියට පිවිස බුදුන් වැඳ තමාගේ දිවා ස්ථානයට පැමිණියේය. එහි සද්ධි විහාරික අතවැසි වත් දක්වා නික්මෙනවිට දිවා ස්ථානය හැමද සම්කඩ පණවා දිය කුඹින් ගත් දියෙන් අත් පා සීතල කොට තුන් සන්ධි ආසනයේ හිඳ කාලය නියම කර පල සමවතින් සිටියේය. හේ පිරිසිඳි කාල වශයෙන් සමාපත්තියෙන් නැගිට තමාගේ ගුණ සිහිකිරීමට පටන් ගත්තේය. ඉක්බිති උන්වහන්සේ ගේ ගුණය සිහි කරන්නේ සීලය සිහිවිය. ඉක්බිති පිළිවෙළින් සමාධි පඤඤා විමුතති ඤාණ දසසන ප්‍රථමධ්‍යාන......නේවසඤඤා නාසඤඤායතන සමාපතති, විපසසනා ඤාණය, දිබබ චකඛු ඤාණං, සොතාපතති මගග, සොතාපතති ඵල..... අරහතත මගග, අරහතත ඵල, අත්ථපටිසමභිදා, ධමමපටිසමභිදා, නිරුතතිපටිසමභිදා, පටිභාණ පටිසමභිදා, සාවක පාරමී ඤාණය. මෙතැන් සිට කල්ප ලක්ෂයකට අධික අසංඛයකට පෙර අනෝමදසසි බුදුන් පාමුල කරන ලද ප්‍රාර්ථනාව ආදිය දක්වා තමාගේ ගුණය සිහි කරන්නේ හිඳින පලඟ දක්වා ගුණ වැටහුණේය.. මෙසේ තෙරුන් වහන්සේ තමාගේ ගුණය සිහි කරන්නේ තමාගේ ගුණ ප්‍රමාණත් හෝ සීමාවක් හෝ දැකීමට නොහැකි විය. උන්වහන්සේ සිතූහ. ප්‍රදේශ ඤාණයෙහි සිටි මාගේ ගුණවල ප්‍රමාණවත් හෝ සීමාවක් නැත. මම වනාහි ශාස්තෲන් උදෙසා පැවිදි වූයෙමි. උන්වහන්සේ ගේ ගුණ කෙබඳුදැයි දසබල බුදුන්ගේ ගුණ සිහිකිරීමට පටන් ගත්හ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ සීලය නිසා සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, සතර මග, සතරඵල, සිව් පිලිසිඹියා සිව්යෝනි පිරිසිඳ දක්නා නුවණ, සතර අරියවංස නිසා දසබල ගුණ සිහි කිරීමට පටන් ගත්හ. එසේම පංච ප්‍රධාන අග, සමමා සමාධි, පංච ඉන්ද්‍රිය, පංචබල, පංච නිසසරණ ධාතු, පංච විමුතති ආයතන, පංච විමුතති පරිපාචනීය පඤඤා, සාරණීය ධමම සය, අනුසසතිඨාන සය, ගාරව සය, නිසසරණි ධාතු සය, සතතවිහාරි සය, අනුතතරිය සය, නිබෙබධ භාගිය

සය, අභිඤ්ඤා සය, අසාධාරණ ඤාණ සය, අපරිහානිය ධර්ම සත, අරිය ධන හත, බොජ්ඣංග සත, පුරිස ධම්ම සත, නිජ්ජර වත්‍ථු සත, පඤ්ඤා සත, දක්ඛිණෙය්‍ය පුග්ගල සත, ඛීණාසවබල සත, පඤ්ඤා පටිලාභ හේතු අට, සම්මත්ත අට, අටලෝ දහම් ඉක්මවීම, ආරම්භ වත්‍ථු අට, අක්ඛණ දෙසනා අට, මහා පුරිස විතක්ක අට, අභිභායතන අට, විමොක්ඛ අට, මනසිකාර මූලක ධම්ම නවය, පරිසුද්ධිපධාන අංක නවය, සත්තාවාස දෙසනා නවය, ආඝාත පටිවිනය නවය, සඤ්ඤා නවය, නානත්ත නවය, අනුපුබ්බ විහාර නවය, නාථකරණ ධම්ම දහය, සම්මත්ත දහය, අරියවංස දහය, අසෙඛ ධම්ම දහය, මෙත්තානිසංස එකොළහ, ධම්ම චක්කාකාර දොළහ, ධුතගුණ තෙළෙස, බුද්ධ ඤාණ තුදුස, විමුත්ති පරිපාචනීය ධම්ම පසළොස, සොළොස් ආකාර ආනාපාන සති, හතලිස් හතර, කුසල දහම් පනස, සත් සැත්තෑ ඤාණ වස්තු. කෝටි ලක්‍ෂ විසිහතරක් සමාපත්ති, සඤ්චාර මහා වජ්‍ර ඤාණය නිසා දසබල බුදුන්ගේ ගුණය සිහි කිරීමට ඇරඹුවේය. ඒ දිවා ස්ථානයෙහි සිටියේම "ස්වාමීනි, තවද මේ අනුත්තර ගුණ එන්නේ" යයි සොළොස් අපරාපරිය ධර්ම, ඒවා මාගේ ශාස්තෲන් වහන්සේ ආයතන ප්‍රඥපතියෙන් අනුත්තරයහ. ගර්භවක්‍රාන්තියෙහි අනුත්තරය. ආදේසන විධානයෙන් අනුත්තරය. දර්ශන සම්පත්තියෙහි අනුත්තරය. පුද්ගල ප්‍රඥප්තියෙහි අනුත්තරය, වීර්යයෙහි අනුත්තරය, ප්‍රතිපත්තිවල අනුත්තරය, කතා කිරීමෙහි අනුත්තරය, පුරුෂ ශීල සමාචාරයෙහි අනුත්තරය, ශාස්වත වාදයෙහි අනුත්තරය, පුබ්බෙනිවාසය ඤාණයෙහි අනුත්තරය, දිබ්බචක්ඛු ඤාණයෙහි අනුත්තරය, ඉද්ධිවිධ ඤාණයෙහි අනුත්තරය. මේ මේ දෙයින්ද අනුත්තර යයි මෙසේ දසබල ගුණ සිහිකරන්නේ භාග්‍යවතුන් වහන්සේ ගේ ගුණවල කෙළවරක් ප්‍රමාණයක් නො දක්කේය. තෙරුන් වහන්සේ තමාගේ ගුණවලද කෙළවරක් ප්‍රමාණයක් නොදක්කහ. භාග්‍යවතුන් වහන්සේගේ ගුණවලද කෙළවරක් ප්‍රමාණයක් නොදක්කහ. භාග්‍යවතුන් වහන්සේගේ ගුණවල කිම දකින්නේද? යමෙකුගේ යමෙකුගේ ප්‍රඥාව මහත් ද ඤාණය ප්‍රකට ද හේ බුදුගුණ මහත් බව අදහයි. ලෞකික මහාජනයා කිඹුහුන් ගියවිටද නමො බුද්ධානං යයි තම තමා ගේ උපනිශ්‍රයෙහි පිහිටා බුදුගුණ මහත් බව විශ්වාස මහත් බව අදහයි. සකදාගාමී වූවන්ගෙන් සීයකින් දාහකින් කෙනෙක් රහත් වී බුදුගුණ මහත් බව විශ්වාස කරයි. අසූමහ සව්වන්ගෙන් හතර දෙනෙක් ද හතර දෙනගෙන් අග්‍රශ්‍රාවක දෙනමද එයින් සැරියුත් මහ රහතන් වහන්සේද උන්වහන්සේගෙනුත් පසේබුදුන් වහන්සේද බුදුගුණ මහත් කොට සලකති. යම් හෙයකින් සියළු සක්වල ගැබ සිවුරු

කොනින් සිවුරුකොන ගෑවී යන ලෙස සිටින පසේ බුදුවරු බුදුගුණ සිහි කරන්නේ නම් ඒ සියල්ලන්ටම වඩා එක් සර්වඥ බුදුකෙනෙක් බුදුගුණ මහත්කොට සලකති. යම්සේ මහජනයා මහමුහුද ගැඹුරු යයි දැන ගැනීම සඳහා ලනු ගසන්නේය. එහි කිසිවෙක් බඹයක් පමණ ගසන්නේය. කිසිවෙක් බඹ දෙකක් කිසිවෙක් දස බඹයක් කිසිවෙක් විසි බඹයක්, කිසිවෙක් තිස් බඹයක්, කිසිවෙක් සතලිස් බඹයක්, කිසිවෙක් දහස් බඹයක්, කිසි අසූහාරදහස් බඹයක්. ඔව්හු නැවට හෝ නැගී මුහුදේ මතු වී ඇති පර්වතවල හෝ සිට තම තමාගේ රැහැන් පහළට බස්සවන්නේ නම් ඔවුනතරෙන් යමෙකුගේ රැහැන බඹයක් නම් බඹයක් පමණ තැන ජලය දනී.... යමෙකුගේ අසූහාර දහසක් නම් හේ අසූහාර දහසක් තැන ජලය දනී. ඉන් එහා ජලය මෙපමණයයි නොදනී. මහා සමුද්‍රයෙහි වනාහි ජලය මෙපමණ යයි නැත. අනනත අප්‍රමාණ වූ අසූහාර දහසක් යොදුන් ගැඹුරුය මහා සමුද්‍රය. එසේම එක බඹ රැහැනේ සිට නව බඹ රැහැනින් වූ ජල ඥාණය මෙන් ලෞකික මහජනයා දුටු බුදුගුණ විසිබඹ තැනක දුටු ජල ඥාණය මෙන් සෙදගැමියා දුටු බුදුගුණය. තිස් බඹයක් තැන ජලය දුටුවා මෙන් අනගැමියා දුටු බුදුගුණය. සතලිස් බඹයක තැන ජලය දුටුවා මෙන් රහතුන් දුටු බුදුගුණය. පනස් බඹයක තැන ජලය දුටුසේ අසූමහ සව්වන් දුටු බුදුගුණය. දහස් බඹයක තැන ජලය දුටු සේ මහමුගලන් හිමි දුටු බුදු ගුණය. අසූහාර දහස් බඹයක තැන දුටු ජලය සේ සැරියුත් හිමි දුටු බුදුගුණය. යම්සේ පුරුෂයෙක් මහා සමුද්‍රයේ ජලය නම් මෙපමණ යයි නොගෙන අනන්ත අප්‍රමාණ යයි ගනී. එසේම ආයුෂමත් සාරිපුත්ත රහතන් වහන්සේ ධර්ම පරම්පරාවෙන් ධර්ම පරම්පරා බුදධියෙන් අනුමානයෙන් නය ගැනීමෙන් ශ්‍රාවක පාරමී ඥාණයෙහි සිට දසබල ගුණ සිහිකරන්නේ බුදුගුණ අනන්ත අප්‍රමාණ යයි විශ්වාස කරති. තෙරුන් දුටු බුදුගුණයට වඩා ධර්මත්වයෙන් දුටු බුදුගුණ බොහෝ වේ. කුමක් මෙන් ද යම්සේ මෙයින් නවය මෙයින් නවයයි අටළොස් යොදුනක් පැතිරී යන චන්‍දභාගා මහා නදියෙන් මිනිසෙක් ඉදිකටු මලකින් ජලය ගන්නේය. ඉදිකටු මලින් ගත් දියට වඩා නොගත් ජලය බොහෝ වේ. යම් සේ මිනිසෙක් මහ පොළොවෙන් ඇඟිල්ලෙන් යම් පසක් ගන්නේද ඇඟිල්ලෙන් ගත් පසට වඩා නොගත් පසම බොහෝ වේ. ඇඟිල්ලෙන් වැසූ අහසට වඩා නොවැසූ අහස බොහෝ වේ. එසේම තෙරුන් විසින් දුටු බුදුගුණයට වඩා නොදුටු ගුණ බොහෝ වේ. කියන ලදමයඃ

ඉදින් බුදු කෙනකුන් - සිය ගුණ කප මුළුල්ලේ
දෙසුවද කප ගෙවේ - බුදුගුණ ඉතිරි වේ මය

මෙසේ තෙරුන් වහන්සේ තමාගේ ද බුදු රදුන්ගේ ද ගුණ සිහි කරන්නේ ගංගා දෙකක මහා ජලය මෙන් අභ්‍යන්තරයෙහි ප්‍රීති සොම්නස පැතිර යන්නේ මයින හමක වාතය මෙන් උඩට නගී. මහා විලකින් උඩට නැගුණු ජලය මෙනි සියළු සිරුර පිරවීය. ඉක්බිති තෙරහු මා කළ ප්‍රාර්ථනය ලැබුනේය. පැවිද්ද. මෙබඳු ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදි වූයේ ය. ආවර්ජනය කරන්නේ බලවත් ප්‍රීති සොම්නස් ඉපදුනේය. ඉක්බිති තෙරුන් වහන්සේ කාට නම් මේ ප්‍රීති සොමනස කියන්නේදැයි සිතන්නේ අන්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ මගේ මේ ප්‍රකාශ සුදුසුකොට පිළිගැනීමට නොහැකි වන්නේය. මම මේ සොම්නස ශාස්තෘන් වහන්සේට ම පවසන්නෙමි. ශාස්තෘන් වහන්සේ ද මාගේ සොම්නස පිළිගැනීමට හැකි වන්නේය. උන්වහන්සේ වනාහි මගේ ප්‍රීති සොම්නස තිබියේවා, මා වැනි සියයක හෝ දාහකගේ ප්‍රීති සොම්නස් ප්‍රකාශ කරනු ලැබීමට සියල්ල මනසෙන් ගැනීමට හැකිවන්නේය. යම්සේ අටළොස් යොදුනක් පැතිරෙමින් ගලන්නා වූ චන්‍ද්‍රභාගා නදිය කුඩා වලක් හෝ කඳුරක් පිළිගැනීමට නොහැකි වන්නේය. මහා සමුද්‍රයම ඒවා පිළිගනී. චන්‍ද්‍රභාගා නදිය තබා එවැනි නදී සියක් ද දාහක් ද ලක්‍ෂයක් ද මුහුද පිළිගනී. එයින් එහි අඩුවක් හෝ වැඩියක් හෝ නොවේ. එසේම මාගේ ශාසතෘන් වහන්සේ මා වැනි ශ්‍රමණයන් සියක ගේ ද දහසක ගේ ද ලක්‍ෂයකගේ ද සොම්නස ප්‍රකාශ කරන්නේද සියල්ල සිතින් ගැනීමට හැකිවෙති. සෙසු ශ්‍රමණ බ්‍රාහමණාදීහු චන්‍ද්‍රභාගාට කුඩාවලවල් කඳුරු මෙන් මාගේ සොම්නස පිළිගැනීමට නොහැකි වෙති. මාගේ ප්‍රීති සොම්නස ශාසතෘන් වහන්සේටම දන්වමියි පලඟින් නැගිට සම්කඩ ගසා දමා සවස මල් නැට්ටෙන් කඩා වැගිරෙන කාලයෙහි ශාසතෘන් වහන්සේ වෙත එළඹ තමාගේ සොම්නස ප්‍රකාශ කරන්නේ "සවාමීනි, මෙසේ පැහැදුනෙමි" යනාදිය කීහ. එහි එවං පසනෙනා - මෙසේ උපන් ශ්‍රද්ධාව, මෙසේ විශ්වාස කරමි යන අර්ථයයි. භීයොයා භිඤ‍ඤතරො - බොහෝ වූ අභිඤ‍ඤා, අධික වූ උත්තරීතර ඤාණය. සමෙබාධියං - සර්වඥතා ඤාණයෙහි රහත්මග ඤාණයෙහි හෝ අරහත්ත මාර්ගයෙන්ම බුදුගුණ නිෂ්ප්‍රදේශ වශයෙන් ගන්නා ලද්දේ වේ. දෙ අග සව්වෝ රහත් මගින්ම සාවක පාරමී ඤාණය ලබති. පසේ බුදුවරු පසේ බුදු ඤාණය ද බුදුවරු සර්වඥතා ඤාණය ද සියළු බුද්ධ ඤාණය ද යන සියල්ල රහත් මාර්ගයෙන් ම ඉටුවේ. එහෙයින් අර්හත් මාර්ග ඤාණය සම්බෝධි වේ. එයින් උත්තරීතරව භාග්‍යවතුන් විසින් කළ යුත්තක් නැත. එහෙයින්

කියන ලදී: ''භගවා භීයෝභිඤ්ඤතරො යදිදං සම්බොධියං'' සම්බෝධියට වඩා අභිඤ්ඤතරවූවක් භාග්‍යවතුන් වහන්සේට නැත.

උළාරා - ශ්‍රේෂ්ඨය. මේ උළාර ශබ්දය උළාරානි ඛාදනීයානි ඛාදනති ආදියෙහි මිහිරෙහි ආවේය. ''උළාරාය බලු භවං වච්ඡාය නො සමණං ගොතමං පසංසාය පසංසති'' ආදියෙහි ශ්‍රේෂ්ඨ අර්ථයෙහිය. ''අප්පමාණො උළාරො ඔභාසො'' ආදියෙහි මහත් බවෙහි එය මෙහි ශ්‍රේෂ්ඨ අර්ථයෙහි ආවේය. එහෙයින් කියන ලදී ''උළාරා සෙට්ඨා''. ආසභී - වෘෂභයාගේ ස්ථිර, කම්පා නොවීම, එකං සො ගහිතො - ඇසීමෙන් හෝ ඈදුරු පරපුරින් හෝ මෙසේ වී යයි හෝ පිටක සම්ප්‍රදායෙන් හෝ ආකාර පරිවිතකකයෙන් හෝ දෘෂ්ටි වශයෙන් වටහා ගැනීමෙන් හෝ තර්ක හේතුවෙන් හෝ නය හේතුවෙන් හෝ නොකියා ප්‍රත්‍යක්‍ෂ ඤාණයෙන් පිළිවිද මෙන් ඒකාන්ත වශයෙන් ගන්නා ලද්දේ නිශ්චය කථා කියන ලද යන අර්ථයි. සීහ නාදො - ශ්‍රේෂ්ඨ නාදය, මද බැවින් හෝ ගර ගර ශබ්දයෙන් නොව සිංහයකු මෙන් උතුම් නාදය නාද කෙළේය යන අර්ථයයි. ''සැරියුත් හිමි'' මේ දම් දෙසුම එසේ ඇරඹූයේ ඇයි ? අනුයෝග දීම සඳහා. ඇතමෙක් සිංහනාද කොට තමාගේ සිටින නාදයෙහි පිළිපැදීමට නොහැකිය. විචාරයට අපොහොසත් වේ. ලේපයෙහි වැටුණු වඳුරකු මෙන් වේ. අපිරිසිදු ලෝහ දවනවිට පිළිස්සී අඟුරු වන්නාසේ මෙසේ ඣාමංගාර වේ. ඇතමෙක් සිංහ නාදයෙහි අනුයෝග දෙවීමට හැකිවේ. විචාරයට හැකිවේ. නිදොස් ලෝහ දවන විට මෙන් අධිකව බබළයි, එබඳු තෙරුන්. එහෙයින් උන්වහන්සේ අනුයොග ක්‍ෂම යයි දැන සිංහ නාදයෙහි පිළිපැදීම දෙවීමට මේ ධර්ම දේශනාව බුදුහිමි ඇරඹීය. එහි සබෙබ තෙ - ඒ සියළු නය. ''මෙසේ සිල් යනාදියෙහි ලෞකික ලෝකෝත්තර වශයෙන් සීලාදිය විචාරයි. ඒවායේ විස්තර කථා මහාපදාන සූත්‍ර වර්ණනාවේ කියන ලදී. කිං පන සාරිපුත්ත යෙ තෙ භවිසසනති - අතීතය නිරුද්ධය. නොපැණවීම් බවට ගියාය. පහන් දැල්ලක් මෙන් නිවුනේය. මෙසේ නිරුද්ධ වූ කල්හි නො පැණවීම් බව ගිය කල්හි ඔබ කෙසේ දැන ගන්නෙහිද? අනාගත බුදුවරුන්ගේ ගුණ කිම ඔබ විසින් තමාගේ සිතින් පිරිසිඳ දන්නා ලදැයි අසන්නේ මෙසේ කීහ. කිම සාරිපුත්ත, අනාගත බුදුවරු පහළ නොවූහ. නො ඉපදුනහ. නූපන්හ. ඔව්හු ඔබ කෙසේ දන්නෙහිද? ඔවුන් ජනයන්ට අහසෙහි පියවර දක්වන්නා මෙනි. දැන් මා සමග එක විහාරයෙහි වසන්නේය. පිඬු පිණිස එකට හැසිරෙන්නෙහි, දම්දෙසනවිට දකුණු පස හිඳින්නෙහි,

කිම මාගේ ගුණ තමාගේ සිතින් පිරිසිඳ දන්නා ලදූයි අනුව යොදන්නේ මෙසේ කීහ. තෙරුන් වහන්සේ වනාහි විචාරණ විචාරණ දේ ස්වාමීනි එසේ නොවේ යයි ප්‍රතික්ෂේප කරති. තෙරුන් වහන්සේගේ ද දන්නා ලද දේද නො දන්නා ලද දේද කිම උන්වහන්සේ තමන් දන්නා ලද තැන ද නොදන්නා ලද තැන ප්‍රතික්ෂේප කෙරේද? දන්නා ලද තැන නොකරයි. නොදන්නා ලද තැනම කරයි. තෙරුන් වහන්සේ වනාහි අනුයෝගය ආරම්භ කරන කල්හිම මේ අනුයෝගය සාවක පාරමී ඤාණ නොවේ යයිද සර්වඥ ඤාණයෙහි යයි දූන ගන්නාහ. තමාගේ සාවක පාරමී ඤාණයෙහි ප්‍රතික්ෂේප නොකොට සබ්බඤ්ඤුත ඤාණයෙහි ප්‍රතික්ෂේප කරයි. එහෙයින් මෙයද දක්වයි. මාගේ භාග්‍යවතුන් වහන්සේ අතීත අනාගත වර්තමාන බුදුවරුන්ගේ සීල සමාධි පඤ්ඤා විමුත්ති කරුණු දූන ගැනීමට සමර්ථයහ. එත්ථ - මේ අතීතාදියෙන් යුත් බුදුවරුන් කෙරෙහි. අථ කිං චරහි - ඉක්බිති කුමක් හෙයින් මෙසේ ඤාණය නැති කල්හි ඔබ විසින් මෙසේ කියන ලදදූය කියයි. ධම්මන්වයො - ධර්මයේ ප්‍රත්‍යක්ෂයෙන්. ඤාණයේ අනුයෝග අනුගමනය කොට උපන් අනුමාන ඤාණයෙන් නය ගෙන දන්නා ලද්දේය. ශ්‍රාවක පාරමී ඤාණයෙහි සිට සබ්බඤ්ඤුත ඤාණය මේ ආකාරයෙන් දනම්යි කියයි. තෙරුන්ගේ, නය ගැනීම අප්‍රමානය, අපරියන්තය, සබ්බඤ්ඤුත ඤාණයට ප්‍රමානයක් හෝ කෙළවරක් නැති සේ මෙනි. ධම්මසේනාපතිගේ නය ගැනීම ද එසේය. එහෙයින් උන්වහන්සේ මෙයින් මෙවැනිය, මෙයින් අනුත්තරය යයි දූන ගනිති. තෙරුන්ගේ නය ගැනීම සබ්බඤ්ඤුත ඤාණ ගතික වේ. දූන් ඒ නය ගැනීම ප්‍රකට කිරීමට උපමාවක් දක්වන්නේ "සෙය්‍යථාපි භන්තෙ" යනාදිය කීහ. එහි යම් හෙයකින් මධ්‍යම ප්‍රදේශයේ නගරවල ආධාරක ප්‍රාකාරාදිය සවිර හෝ දුර්වල වෙත්වා. හැම ලෙසින් ම එසේ නොවේවා. සොර සැක නොවේ. එහෙයින් එය නොගෙන ප්‍රත්‍යන්ත නගරයයි කිය.

දළ්හුද්දාපං - ස්ථිර ප්‍රාකාර පාදය. දළ්හ පාකාර තොරණං - ස්ථිර ප්‍රාකාරයද ස්ථිර පිටධීසංඝාටය (දූවවලල්ල) ද. එකද්වාරං - කුමක් හෙයින් කීද? බොහෝ දොරවල් ඇති නගරයෙහි බොහෝ පණ්ඩිත දෝවාරිකයන් විය යුතුය. එක දොරක එක්කෙනෙක් වටනේය. තෙරුන් වහන්සේ ගේ ද ප්‍රඥාව හා සමාන අනිකෙක් නැත. එහෙයින් තමාගේ පණ්ඩිත බව උපමාවක් සඳහා එක් දෝවාරිකයකු දූක්වීමට එකං ද්වාරං යයි කීහ. පණ්ඩිතො - පාණ්ඩිත්‍යයෙන් යුක්ත. අනුපරියාය පථං - අනුපරියාය නම් ප්‍රාකාර මාර්ගය. පාකාර සන්ධිං - ගඩොල් කැට දෙකක්

ඉවත් කළ තැන. පාකාර විවරං - පවුර කැඩුණු තැන. චෙතසො උපකකිලෙසො - පංච නීවරණ සිත කෙළෙසති. කිලිටි කරති. තවත්, වෙහෙසති. එහෙයින් චෙතසො උපකකිලෙසෙහි කියනු ලැබේ. පඤ්ඤාය දුබ්බලී කරණෙ - නීවරණ උපදිමින් නූපන් ප්‍රඥාවට ඉපදීමට නොදේ. එනිසා නුවණ දුර්වල කෙරේ යයි කියනු ලැබේ. සුපතිට්ඨිත චිත්තා - සතර සීවටන්වල හොඳින් පිහිට වූ සිත, සත්තබොජ්ඣංගෙ යථාභූතං - සප්ත බොධ්‍යංග යථා සවභාවයෙන් වඩා. අනුත්තරං සම්මා සම්බොධිං - සර්වඥතා ඥාණය පිළිවිදියේ යයි දක්වයි.

තවද මෙහි සතිපට්ඨානා - විදර්ශනා සම්බෝධ්‍යංගය. අනුත්තර සම්මා සම්බෝධිය අරහත් වේ. සතිපට්ඨාන හෝ මාර්ග හෝ බොධ්‍යංග මිශ්‍ර වූ සම්මා සම්බෝධිය රහත්ම වේ. දීඝභාණක මහා සිව තෙරහු කීහ: සතිපට්ඨානයෙහි විපස්සනා යයි ගෙන බොජ්ඣඞ්ග මාර්ගයෙහි ද සබ්බඤ්ඤුත ඥාණ යයි ගත් කල්හි සුන්දර ප්‍රශ්නයක් වන්නේය. මෙසේ වනාහි නොගත යුතුයයි මෙසේ ස්ථවිරයන් වහන්සේ සියළු බුදුවරයින්ගේ නීවරණ ප්‍රහාණයෙහි සතිපට්ඨාන භාවනාවෙන් සම්බෝධිය ද මධ්‍යයෙහි බිඳුණු රන්රිදී මෙන් නානත්ත බව පෙන්වයි. මෙහි සිට උපමා සැසඳිය යුතුය. ආයුෂමත් සාරිපුත්ත හිමි ප්‍රත්‍යන්ත නගරය දැක්වීය. ප්‍රාකාරය දැක්වීය. පරියාය පථය දැක්වීය. ද්වාරය දැක්වීය. පණ්ඩිත දෝවාරිකයා දැක්වීය. නගරයට පිවිසෙන නික්මෙන ඕලාරික ප්‍රාණීන් දැක්වීය. පණ්ඩිත දෝවාරිකයාට ඒ ප්‍රාණීන් ප්‍රකට බව දැක්වීය. එහි කිම කුමකින් සමානදැයි, නගරය මෙන් නිවණ, ප්‍රාකාරය මෙනි සීලය. පරියාය පථය මෙනි සමථය, ද්වාරය මෙනි අරිය මග්ග, පණ්ඩිත දෝවාරික මෙනි ධම්මසේනාපති, නගරයට පිවිසෙන පිටවෙන ඕලාරික ප්‍රාණීන් මෙන් අතීත අනාගත වර්තමාන බුදුවරුන්ගේ සීලසමථාදියේ ප්‍රකට බව. මෙපමණකින් තෙරුන් භාග්‍යවතුන් වහන්සේට, මෙසේ මම සාවක පාරමී ඥාණයෙහි සිට ධර්මත්වයෙන් නය ගැනීමෙන් තමාගේ සිංහ නාදයට අනුයෝගය දෙන ලදී.

"ඉධාහං භන්තෙ යෙන භගවා" යයි මේ දේශනාව කුමක් හෙයින් ආරම්භ කරන ලද්දේද? සාවක පාරමී ඥාණය නිෂ්පත්තිය දැක්වීම සඳහා එහි අදහස මෙය: මම සාවක පාරමී ඥාණය ලබන්නේ හෝ වෙත පැමිණ නො ලැබුවෙමි. ඔබ වෙතම පැමිණ ඔබ ඇසුරු කරන්නේ ලැබුවෙමි, එහි ඉධ යනු නිපාත මාත්‍රයකි. ඔබවහන්සේ වෙත පැමිණියේ

චීවරාදි හේතු නිසා නොව ධර්ම ශ්‍රවණය සඳහාය. මෙසේ පැමිණ ශ්‍රාවක පාරමී ඤාණය ලැබුවෙමි. තෙරුන් කවදා ධම්ම සවණ සඳහා පැමිණියේද? සූකර කත ලෙනෙහි බෑණා වූ දීඝනඛ පිරිවැජියාට වේදනා පරිග්‍රහ සූත්‍රාන්තය දේශනා කරන දිනයේය. එදාම සාවක පාරමී ඤාණය ලැබීය. එ දවස ස්ථවිරයෝ තල්වැට ගෙන භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේ ඒ දේශනාව අසා එහිම සාවක පාරමී ඤාණය අත්පත් කෙළේය. **උත්තරුත්තර පණීත පණීතං** - වඩ වඩා උසස් සහ වඩ වඩා ප්‍රණීතව දෙසූහ. **කණ්හ සුක්ක සප්පටිභාගං** - කළු මෙන්ම සුදුද. එය ද විපාක සහිත කොට. කළුහැර සුදු සුදු හැර කළු යයි මෙසේ පටිබාග කොට කළු සුදු දෙසූහ. සුදු (හොඳ) දේශනා කරන්නේද උත්සාහ සහිතව විපාක සහිතව දෙසූහ. **තස්මිං ධම්මෙ අභිඤ්ඤා ඉධෙකච්චං ධම්මෙසු නිට්ඨමගමං** - මෙහි උන්වහන්සේ දෙසූ ධර්මයෙහි ඇතැම් සාවක පාරමී ඤාණය දැන ධර්මවල නිෂ්ටාවට එළඹේ. කවර නම් ධර්මවලද? චතුසච්ච ධර්මවල මෙහි මේ තෙරවරුන්ගේ සංවාදයකිඃ කළුවැල් වාසී සුමම තෙර පළමුව කියයි. චතුසත්‍ය ධර්මවල දැන් නිෂටාවට යෑමට කරුණක් නැත. අසසජි මහතෙරුන් දුටු දිනයේම උන්වහන්සේ පළමු මාර්ගයෙන් චතුසච්ච ධර්මවල නිෂ්ටාවට ගියහ. පසුව සූකරකත ලෙණෙහි ඉහළ තුන් මගින් චතුසච්ච ධර්මවල නිෂ්ටාවට ගියහ. මේ ස්ථානයෙහි බුදුගුණවල - නිෂ්ටාවට ගියහ. තිලොක නගරවාසි චූලසීව තෙර සියල්ල එසේ කියා මේ සථානයෙහි ධම්මෙසු - යනු රහත් බවෙහි නිෂ්ටාවට ගියහයි කීය. දීඝ භාණක තිපිටක මහාසිව තෙර වනාහි පළමු වාරය කියා මේ ස්ථානයෙහි ධම්මෙසු - සාවක පාරමී ඤාණයෙහි නිෂ්ටාවට ගියේ යයි කියා බුදුගුණ නය මගින් පැමිණියේ යයි කීහ.

**සත්ථරි පසීදිං** - මෙසේ ශ්‍රාවක පාරමී ධර්මවල නිෂ්ටාවට ගොස් භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ යයි ශාස්තෘන් වහන්සේ කෙරෙහි අතිශයින් පැහැදුනෙමි. **ස්වාක්ඛාතො භගවතා ධම්මො** - මනාව කියන ලද මනාව දේශනා කරන ලද මාර්ගයට පමුණුවන ඵලයට පමුණුවන රා දොස් මෝ - මැඩීමට සමත්ය. භාග්‍යවත් බුදුරදුන්ගේ සංඝයා වහන්සේද වංක ආදි දොස් රහිත මනා පිළිවෙත්හි පිළිපන්නෝ ප්‍රසන්න වෙමි භාග්‍යවතුන් වහන්ස යයි දක්වයි. දැන් දිවා ස්ථානයෙහි හිඳ සමවැදුණු සොළොස් අපරම්පරිය ධර්ම දැක්වීමට, ''අපරමප භනෙත එතදානුත්තරියං'' යන දේශනා ඇරඹීය. එහි **අනුත්තරියං** - අනුත්තර

භාවය. **යථා භගවා ධම්මං දෙසෙති** - යම්සේ යම් ආකාරයකින් යම් දේශනාවක් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරති ද එය ඔබගේ දේශනාවට වඩා අනුත්තර යයි කියයි. **කුසලෙස ධම්මෙසු** - ඒ දේශනාවෙන් කුසල ධර්මයන් හිඳ භාග්‍යවතුන් වහන්සේම අනුත්තර යයි දක්වයි. ඒ දේශනාව එහි භූමින් දක්වන්නේ කුසල ධර්මයන්හි යයි කීය. **තත්‍රිමෙ කුසලා ධම්මා** - එහි කුසල ධර්මයන්හි කී පදයෙහි මේ කුසලදහම් නමැයි දතයුතු. එහි නිරෝග අර්ථයෙන් නිරවද්‍ය අර්ථයෙන් දක්‍ෂභාව අර්ථයෙන් විවේක අර්ථයෙන් සැපවිපාක අර්ථයෙන් කුසල් පස් අයුරු යයි දතයුතුය. ඒවායින් ජාතක පරියායට පැමිණ ආරෝග්‍ය අර්ථයෙන් කුසල යයි කියනු ලැබේ. සූත්‍රාන්ත පර්යායට පැමිණ අනවද්‍ය අර්ථයෙන් අභිධර්ම පර්යායට පැමිණ දක්‍ෂභාව, විවේක, සැපවිපාක අර්ථයෙන්. මේ ස්ථානයෙහි බාහිය සූත්‍රාන්ත පර්යායෙන් අනවද්‍ය අර්ථයෙන් කුසල යයි දත යුතුය.

**චත්තාරො සතිපට්ඨානා** - තුදුස් අයුරු කායානු පසසනාව, නවවිධ වේදනානු පස්සනාව, සොළොස් අයුරු චිත්තානුපසසනාව, පංචවිධ ධම්මානු පස්සනාව සතිපට්ඨානයයි. මෙසේ නානා නයවල බෙදා සමථ විපසසනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව සතර සතිපට්ඨාන දේසනා කරන ලදී. ඵල සතිපට්ඨානය මෙහි අභිප්‍රේත නොවේ. **චත්තාරො සම්මප්පධානා** - උදව්දීම් අර්ථයෙන් ඒක ලක්‍ෂණය. කෘත්‍ය වශයෙන් නානා විධය. මෙහි භික්‍ෂුව නූපන්නා වූ පව් අකුසල දහම් නො ඉපදීම් සඳහා යයි ආදි නයින් සමථ විපසසනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව සතර සම්‍යක් ප්‍රධාන දේශනා කරන ලදී. **චත්තාරො ඉද්ධිපාදා** - සමෘද්ධිවීම් අර්ථයෙන් එක් සංග්‍රහයකි. ඡන්දාදි වශයෙන් නානා ස්වභාව වේ. ''මෙහි භික්‍ෂුව ඡන්ද, සමාධි, පධාන සංඛාර යුකත ඉද්ධිපාද වඩයි'' ආදි නයින් සමථ විපස්සනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව සතර ඍද්ධිපාද දේශනා කරන ලදී. **පඤ්චින්ද්‍රියානි** - අධිපති අර්ථයෙන් ඒක ලක්‍ෂණ වේ. අධිමොක්ඛාදි සවභාව වශයෙන් නානාභාව වේ. සමථ විපස්සනා මග්ග වශයෙන් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව ශ්‍රද්ධාදි පංච ඉන්‍ද්‍රිය දේශනා කරන ලදී. **පඤ්ච බල** - උපස්ථම්භක අර්ථයෙන් කම්පා නොවන අර්ථයෙන් ඒක සංග්‍රහය. ස්ව ලක්‍ෂණ වශයෙන් නානා ස්වභාව වේ. සමථ විපසසනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව ශ්‍රද්ධාදි පංච බල දේශනා කරන ලදී. **සත්තබොජ්ඣංගා** - පැමිණවීම් අර්ථයෙන් ඒකවිධය. උපස්ථාන ආදි ස්වලක්‍ෂණයෙන් විවිධ වේ. සමථ විපස්සනා මග්ග

වශයෙන් ද ලෞකික ලෝකෝත්තර වශයෙන්ද සත්ත බොජ්ඣංග දේශනා කරන ලදී. **අරියො අට්ඨංගිකො මග්ගො** - හේතු අර්ථයෙන් ඒකවිධය. දර්ශනා දි සව ලක්‍ෂණයෙන් නානා ස්වභාව වේ. සමථ විපස්සනා මාර්ග වශයෙන්ම ලෞකික ලෝකෝත්තර මිශ්‍රව අරිය අට්ඨංගික මග්ගය දේශනා කරන ලදී. "ස්වාමීනි මෙහි භික්‍ෂුව ආශ්‍රවයන්ගේ කළ ක්‍ෂය පිණිස" මෙය කුමක් ආරම්භ කරන ලදද? සාසනයේ අවසාන දැකීම සඳහා හුදෙක් සාසනයේ මාර්ගයෙන්ම අවසානය නොවේ. රහත් ඵලයෙන් වේ. එනිසා එය දැක්වීමට මෙය ආරම්බ කරන ලදැයි දත යුතුය. **එතදානුත්තරියං භන්තෙ කුසලෙසු ධම්මෙසු** - ස්වාමීනි මේ කුසල ධර්මවල මේ දේශනා අනුත්තරිය වේ. **තං භගවා** - භාග්‍යවතුන් වහන්සේ ඒ දේශනා සියල්ල නිරවශේෂයෙන් දැනගන්නාහ. **තං භගවතො** - ඒ දේශනා භාග්‍යවතුන් වහන්සේ ගේ නිරවශේෂ දැන ගැනීමටය.

**උත්තරිං අභිඤ්ඤෙය්‍යං නත්ථි** - ඉහළට දැනගත යුතු දෙයක් නැත. මෙය නම් මෙයින් අන්‍ය වූ ධර්මයක් හෝ පුද්ගලයෙක් හෝ භාග්‍යවතුන් වහන්සේ නො දන්නේ යයි මෙය නැත. **යදභිජානං අඤ්ඤො සමණො වා** - ඔබ විසින් නොදන්නා ලද යමක් අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ දැනගන්නේ භගවත්හු ඊට අධිකව අභිඤ්ඤතරව ප්‍රඥාවන්ත වන්නාහ. **යදිදං කුසලෙසු ධම්මෙසු** - මෙහි යදිදං නිපාත වේ. කුසල ධර්මයන්හි භාග්‍යවතුන් වහන්සේට වැඩි තරම් උත්තරීතර කෙනෙක් නැතැයි මෙහි අර්ථයයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේට කුසල ධර්මයන්හි අනුත්තර යයි දක්වන්නේ මේ කරුණින් ද මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූ යෙම් යයි දක්වති. මෙයින් පසුව "අපරං පන" ආදියෙහි විශේෂ තැන්ම වර්ණනා කරමි. පෙරවාර සමාන ඒවා කියන ලද නයින්ම දත යුතුය.

**ආයතන පණ්ණත්තිසු** - ආයතන පැනවීම් ආදියෙහි දැන් ඒ ආයතන පැණවීම් දක්වන්නේ "ඡ ඉමානි භන්තෙ" යනාදිය කීහ. මේ ආයතන කථා වනාහි විසුද්ධි මාර්ගයෙහි විස්තර වශයෙන් කියන ලදී. **එතදානුත්තරියං භන්තෙ ආයතන පණ්ණත්තීසු** - යමෙක් ආයතන පැණවීම්වල අජ්ඣත්ත බාහිර විස්තර වශයෙන් මෙසේ කරන දේශනා එතදානුත්තරිය වේ. සෙස්ස කියන ලද නයින්මය. **ගබ්භාවක්කන්තිසු** - ගැබට බැස ගැනීමෙහි (පිළිසිඳීමෙහි) ඒ ගැබට පිවිසීම් දක්වන්නේ "ස්වාමීනි මෙය සතරකැයි යනාදිය කීහ. එහි **අසම්පජානා** - නොදන්නේ,

මුළා වී ''මව්ගැබට බසී'' පටිසන්ධි වශයෙන් පිවිසෙති, ඨාති - වසයි. නික්ඛමති - නික්මෙන්නේද නොදන්නේ මුළාව නික්මෙයි. අයං පඨමා - පළමුවැන්න වේ. මාතුකුච්ඡි ඔක්කමති - පිවිසීම දන්නේ මුළා නොවී පිවිසේ. මේ දෙවැන්නයි. මෙය අසූමහ තෙරවරුන්ගේය. සාමාන්‍ය මනුෂ්‍යයින්ගේ පළමු වැන්නය. ගැබට සමපජානො - පිවිසීම. ඔව්හු පිවිසීම දනිති. විසීම සහ නික්මීම නොදනිති. මේ තුන්වැන්නයි. මේ අගසාවක දෙනම පච්චෙක බෝධි සත්‍වයින් ද මේ තුන්වන ගැබ් පිවිසීමෙන් පිළිසිඳ ගනිති. ඔව්හු කර්මජ වාතයෙන් හිස යටට පා උඩට නොයෙක් සිය පුරිස් ප්‍රමාණ ප්‍රපාත මෙන් යොනි මුඛයට වැටී යතුරු සිදුරෙන් ඇතකු මෙන් සම්බාධ වූ යොනි මුඛයෙන් නික්මෙන්නේ අනන්ත දුක්වලට පැමිණෙති. එහෙයින් ඔවුන්ට අපි නික්මෙමු යයි දැනුමක් නැත. මෙසේ පුරන ලද පාරමී ඇති සත්වයන්ටද මෙබඳු ස්ථානයෙහි මහත් දුක් උපදී. ගැබ් විසීමෙහි කලකිරීමට වටීමය. නො ඇලීමට වටීමය. අයං චතුත්ථා - මෙය සර්වඥ බෝධිසත්‍වයන්ගේ වශයෙන් සිව්වැනි ගැබ් පිවිසීමයි. සර්වඥ බෝධිසත්‍වයා මව්කුස පිළිසිඳ ගන්නේ ද දනී. එහි වසන්නේද දනී. නික්මෙන්නේද දනී. නික්මෙන කාලයෙහි ද ඔහු කර්මජ වාතයෙන් පා උඩට හිස පහතට කොට තැබීමට නොහැකි වේ. දෑත් දිගු කොට ඇස් දල්වා සිටියේම නික්මෙයි, භවාග්‍රය හා අවීචිය අතර අනිත් තුන් කාලයෙහි දන්නෝ නම් නැත, සබ්බඤ්ඤු බෝධිසත්‍වයා හැර. එහෙයින්ම උන්වහන්සේ මව්ගැබට පිවිසෙන විටද නික්මෙන විටද දස සහශ්‍රී ලෝක ධාතුව කම්පා වේ. මෙහි සෙස්ස කියන ලද නයින් දත යුතුයි.

ආදෙසන විධාසු - ආදේශන කොටස්ථාශවල දූත් ඒ ආදේශන විධි දක්වන්නේ ''චතසෙසා ඉමා'' යනාදිය කීහ. නිමිත්තෙන ආදිසති - පැමිණ නිමිත්තෙන් ගිය නිමිත්තෙන් සිටි නිමිත්තෙන් හෝ මෙය සිදුවන්නේ යයි කියයි. මේ එහි වස්තුවයි: එක් රජෙක් මුතු තුනක් ගෙන පුරෝහිත විචාළේය. ඇදුර, මගේ අතේ මොනවාද? එක් හූනෙක් මැස්සකු ඇල්ලීමට පැන්නේය. මැස්සා පළා ගියේය. ඒ එක් මැස්සාගේ මිදීම බැවින් මහරජ මුතු යයි කීය. මුතු තමා කීයද? හේ නැවත නිමිති බැලීය. ලඟ කුකුළකු තෙවරක් හැඬලීය. බමුණා මහරජ, තුනයි කීය. මෙසේ ඇතමෙක් පැමිණ නිමිත්තෙන් කියයි. මේ උපායෙන් ගිය සිටි නිමිතිවලින් ද කියත් යයි දත යුතුය. අමනුස්සානං - යක් පිසස් ආදීන්. දෙවතානං - චාතුම්මහා රාජිකාදීන්. සද්දං සුත්වා - අන්‍යයාගේ සිත දූන

කියන්නන්ගේ ශබ්දය අසා. **විතක්කවිප්ඵාර සද්ද** - විතක්ක විප්ඵාර වශයෙන් උපන් දොඩවන්නන්ගේ නිදාගැනීම් ප්‍රමාදාදියේ ශබ්ද **සුත්වා** - ඒ ශබ්දය අසා සිතන්නේ ඔහුගේ ඒ ශබ්දය උපන්නේ ඔහුගේ වශයෙන් මෙසේ ද ඒ මනස යයි කියයි. **මනො සංඛාර පණිහිතා** - චිත්ත සංඛාර මනාව පිහිටුවන ලදී. **විතක්කෙස්සති** - සිතන්නේය පවත්නේ යයි දනී. දන්නේ ද පැමිණීමෙන් දනී. පූර්වභාගයෙහි හොඳයි. සමාපත්තිය කෙළවර සිත බලා දනී. **ආගමනෙ න ජානාති** - කසිණ පරිකම්ම කාලයේම යම් ආකාරයකින් මේ කසින භාවනා ආරම්භ කරන ලදද ප්‍රථම ධ්‍යානය හෝ.... චතුර්ථ ධ්‍යානය හෝ අෂ්ඨ සමාපත්ති හෝ නිපදවන්නේ යයි දනී. **පුබ්බයොගෙ ජානාති** - පළමු විපස්සනාවෙන් ඇරඹුයේම දනී. **යෙන** - යම් ආකාරයකින්. මෙතෙම විපස්සනාව අරඹන ලද්දේ සෝවාන් මාර්ගය හෝ නිපදවන්නේ යයි දනී. ඇතුළු සමාපත්ති යම් ආකාරයකින් මේ මනෝ සංඛාර මනාව පිහිටුවන ලද්දේ මෙනම් සිතට අනතුරුව මෙනම් සිතුවිල්ල සිතන්නේ යයි මෙයින් නැගී සිටි කල මොහුට හානභාගිය හෝ ඨිතිභාගිය හෝ, විශේෂ භාගිය හෝ නිබ්බේධ භාගිය හෝ සමාධිය වන්නේය. අභිඥා හෝ උපදවන්නේ යයි දනී.

එහි චෙතොපරිය ඤාණලාභී පෘථග්ජනයා පෘථග්ජනයාගේ සිතම දනගනී. ආර්යයන් ගේ නොවේ. ආර්යන් කෙරෙහිද පහළ පහළ වූවෝ ඉහළ ඉහළ ආර්යන්ගේ දන නොගනිති. ඉහළ ආර්යන්ට පහළ ආර්යන්ගේ සිත් දනගත හැකිය. ආර්යන් කෙරෙහි ද සෝවාන් පුද්ගලයා සෝවාන් ඵල සමාපත්තියට සමවදී. සකදාගාමී අනාගාමී-අරහා අරහත්තඵල සමාපත්තියට සමවදී. ඉහළ වූවෝ පහළ සමාපත්තිවලට සම නොවදිත්, **තථෙව තං හොති** - මෙය ඒකාන්තයෙන්ම එසේම වේ. චේතෝපරිය වශයෙන් දන ගන්නා ලද්ද වෙනත් ආකාරයකට නොවේ. සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුය. **ආතප්පමන්වාය** - යනාදිය බ්‍රහ්මජාලයෙහි විස්තර කරන ලද්දේමය. මෙය වනාහි එහි සංක්ෂේපයයි. **ආතප්පං** - වීර්ය එය සඳහාම උත්සාහ කරනු ලබන්නේ පධාන - වේ. අනුව යෙදි යුත්තේ අනුයොග - වේ. **අප්පමාදං** - සිහිය වෙනස් නොවීමය. **සම්මා මනසිකාරං** - අනිත්‍යයෙහි අනිත්‍යයයි ආදි වශයෙන් පවත්නා උපාය මනසිකාරයයි. **චෙතො සමාධිං** - ප්‍රථම ධ්‍යාන සමාධිය. **අයං පඨමා දස්සන සමාපත්ති** - මේ දෙතිස් ආකාර පිළිකුල් බව මෙනෙහි කොට පිළිකුල් දසුන් වශයෙන් උපදවන ලද ප්‍රථම ධ්‍යාන සමාපත්ති පළමු දර්ශන සමාපත්ති නම් වේ. යම් හෙයකින් ඒ ධ්‍යානය පාදක

කොට සෝවාන් වේද මෙය නිෂ්පර්යායෙන් පළමු දසුන් සමාපත්ති වේ. **අතික්කම්ම ච** - ඉක්මවාද **ඡවිමංස ලොහිතං** - සිවියද මස් ද ලේ. **අට්ඨිං පච්චවෙක්ඛති** - ඇට ඇට යයි ප්‍රත්‍යවෙක්ෂා කරයි. ඇට ඇට යයි ප්‍රතිවේක්ෂා කොට ඇට අරමුණු කොට උපදවන ලද දිබ්බචක්ඛු පාදක ධ්‍යාන සමාපත්තිය දෙවන දසුන් සමාපත්ති නම් වේ. ඉදින් එම ධ්‍යානය පාදක කොට සකෘදාගාමි මාර්ගය නිපදවන්නේ ද මෙය නිෂ්පර්යායෙන් දෙවන දසුන් සමාපත්ති වේ.

කාල හාලක වැසි සුමම ථෙර තුන්වන මාර්ගය දක්වා සුදුසු යයි කීය. **විඤ්ඤාණ සොතං** - විඥාණයම වේ. **උභයතො අබ්බොච්ඡින්නං**- කොටස් දෙකින්ම නොසිඳුණු. **ඉධලොක පතිට්ඨිතඤ්ච** - ඡන්ද රාග වශයෙන් මෙලොව පිහිටන ලද. දෙවන පදයෙහි ද මෙම නයයි. කර්මය හෝ කර්මයෙන් එළඹෙන්න මේ ලෝකයෙහි පිහිටියේ නම් වේ. කර්ම භවය අඳිනු ලබන්න පරලොවෙහි පිහිටියේ නම් වේ. මෙයින් කුමක් කියන ලදද? සේඛ පෘථග්ජනයින් ගේ චේතොපරිය ඥාණය කියන ලදී. සේඛ පෘථග්ජනයින් හේ චේතොපරිය ඥාණය වනාහි තෙවන දසුන් සමාපත්ති නම් වේ. **ඉධ ලොකෙ අප්පතිට්ඨිතඤ්ච** - ඡන්දරාග නැතිනිසා මේ ලෝකයේ නො පිහිටන ලද්දේ වේ. දෙවන පදයෙහි ද මෙම නයයි. කර්මය හෝ කර්මයෙන් නොයන ලද්ද මේ ලෝකයෙහි නොපිහිටන ලද නම් වේ. කර්ම භවය නො අදනා ලද බැවින් පරලෙව්හි නොපිහිටන ලද නම් වේ. මෙයින් කුමක් කියන ලදද? රහතන් වහන්සේගේ චේතොපරිය ඥාණය සිව්වැනි දසුන් සමාපත්ති නම් වේ.

තව ද දෙතිස් ආකාරයෙහි ඇරඹූ විපස්සනාවද පළමු දසුන් සමාපත්ති වේ. ඇට අරමුණු කොට ඇරඹූ විපස්සනාව දෙවන දසුන් සමාපත්ති වේ. සෙඛ පෘථග්ජනයින් ගේ චෙතොපරිය ඥාණය රහතුන්ගේ චෙතොපරිය ඥාණය ද යන මේ දෙක වනාහි නිශ්චලය. අන්‍ය වූ නයක් ප්‍රථම ධ්‍යානය පළමු දසුන් සමාපත්ති වේ. ද්වීතීය ධ්‍යානය දෙවන දසුන් සමාපත්ති වේ. තෘතිය ධ්‍යානය තුන්වන දසුන් සමාපත්ති වේ. සතරවන ධ්‍යානය සතරවන දසුන් සමාපත්ති වේ. එසේම පළමු මාර්ගය පළමු දසුන් සමාපත්ති වේ. දෙවන මාර්ගය දෙවන දසුන් සමාපත්තිය ද තුන්වන මාර්ගය තෙවන දසුන් සමාපත්තිය ද සිව්වන මාර්ගය සිව්වන දසුන් සමාපත්තිය ද වේ. මෙහි සෙස්ස පෙර නය අනුව යෙදිය යුතුය.

**පුග්ගල පණ්ණත්තීසු** - ලෝක ව්‍යවහාර වශයෙන් සත්වයා, පුද්ගලයා මිනිසා, පුරුෂයා යයි මෙසේ ලෝක ව්‍යවහාරයෙහි පනවන ලදී. බුදුවරුන් ගේ වනාහි සමමුති කථා පරමත්ථ කථා යයි කථා දෙවර්ගයකි. මේ සම්මුති කථාය. දූන් යම් පුද්ගල පැණවීමෙහි භාග්‍යවතුන් වහන්සේ අනුත්තර වේ. ඔව්හු දක්වන්නෝ ''ස්වාමීනි පුද්ගලයෝ භාග්‍යවතුන් වහන්සේ අනුත්තර වේ. ඔව්හු දක්වන්නෝ ''ස්වාමීනි පුද්ගලයෝ සත් දෙනෙක් උභතොභාග විමුත්ත යයි'' යනාදිය කීහ. එහි **උභතො භාග විමුත්තො** - භාග දෙකින් මිදුණු අරූප සමාපත්තියෙන් රූප කායෙන් මිදුනේ වේ. මාර්ගයෙන් නාම කායෙන් මිදුනේ වේ. හෙතෙම අරූප සමාපත්ති සතරේ එකිනෙකින් නැගිට සංස්කාර සම්මර්ශනය කොට රහතුන්ගේ සතරේ නිරෝධයෙන් නැගිට රහත් බවට පැමිණි අනාගාමියා ද වශයෙන් පස්විධ වේ. මෙහි පෙළෙහි වනාහි ''උභතොභාග විමුත්ත පුද්ගලයා කවරේද මෙහි ඇතමෙක් අෂ්ට විමොක්‍ෂය කයින් ස්පර්ශ කොට වෙසෙති. නුවණින් දූක ඔවුන්ගේ ආශ්‍රව ක්‍ෂීණ වේ. මෙසේ අෂ්ට විමෝක්‍ෂලාභීන් වශයෙන් ආයේය. **පඤ්ඤා විමුත්තො** - ප්‍රඥාවෙන් මිදුණු හේ ශුෂ්ක විදර්ශක ද ධ්‍යාන සතරින් නැගිට රහත් වූ සතර දෙනාදූයි වශයෙන් පස් ආකාර වේ. පෙළෙහි වනාහි අට්ඨවිමොක්ඛ පටිපක්ඛ වශයෙන්ම ආයේය. යම්සේ කීහ: අෂ්ට විමෝක්‍ෂයෙහි කයින් පහසා නොවෙසේමය. ප්‍රඥාවෙන් දූක ආශ්‍රව පරික්ෂිණ වීය. මේ පුද්ගලයා ප්‍රඥා විමුත්තයා වේ. පහසින් සාක්‍ෂාත් කරන්නා **කාය සක්ඛි** - නම් වේ. යමෙක් ධ්‍යානය පළමුව ස්පර්ශ කර පසුව නිරෝධ නිර්වාණය සාක්‍ෂාත් කරන්නේ හේ සෝවාන් ඵලයෙහි සිට රහත් මාර්ගස්ථාන දක්වා සවැදෑරුම් වේ යයි දත යුතුයි. එහෙයින් කීහ: මෙහි එක් පුද්ගලයෙක් අෂ්ට විමෝක්‍ෂයන් කයින් ස්පර්ශ කර වෙසේ. නුවණින් ඔහු දූක ඇතමෙක් ආශ්‍රවයන් ක්‍ෂීණ කෙරේ. මේ පුඟුලා කාය සක්ඛි වේ. දෘෂ්ටියට පැමිණියේ දිට්ඨිප්පත්ත වේ. එහි සංක්‍ෂේප ලක්‍ෂණ මෙසේය: සංස්කාර දුක යයි නිරෝධය සැපයයි දන්නා ලදී. දක්නා ලද්දේ, දූනගන්නා ලද්දේ, සාක්‍ෂාත් කරන ලද්දේ ස්පර්ශ කරන ලද්දේ **දිට්ඨිප්පත්තයා** - වේ. මෙහි ද විස්තර වශයෙන් කායසක්ඛියා මෙන් සවැදෑරුම් වේ. එහෙයින් කියන ලදී: මෙහි ඇතැම් පුද්ගලයෙක් මෙය දුකයයි ඇති සැටියේ දූන ගනී.... මෙය දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාව යයි ඇති සේ දූනගනී. තථාගතයන් වහන්සේ දේසිත ධර්මය ප්‍රඥාවෙන් දක්නා ලද්දේ ප්‍රඥාවෙන් හැසිරෙන ලද්දේ මේ පුද්ගලයා දිට්ඨිප්පත්ත යයි කියනු ලැබේ. ශ්‍රද්ධාවෙන් මිදුනේ **සද්ධාවිමුත්ත** - යයි කියනු ලැබ්.

හේ ද කියන ලද නයින් ම සවැදෑරුම් වේ. එයින් කියන ලදී: මෙහි එක් පුද්ගලයෙක් මෙය දුක යයි.... මෙය දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාවයයි ඇති සැටියෙන් දැනගනී. තථාගත දේසිත ධර්මය ප්‍රඥාවෙන් දක්නා ලද්දේ ප්‍රඥාවෙන් හැසිරෙන ලද්දේ මේ පුද්ගලයා සද්ධාවිමුත්තයා යයි කියනු ලැබේ. මොවුන් අතරෙන් සද්ධා විමුත්තයාගේ මාර්ග ක්‍ෂණයෙහි පූර්භාගය අදහන්නාක් මෙන් විශ්වාස කරන්නාක් මෙන් ස්ථිර සේ පිහිටියාක් මෙන් ද කෙලෙසුන් ක්‍ෂය කෙළේ වේ. දිට්ඨිප්පත්තයාගේ මාර්ග ක්‍ෂණයෙහි පූර්වභාගය කෙලෙසුන් සිඳින ඥාණය අදනධව, තියුණු, සූරව උසුලයි. එහෙයින් නොතියුණු කඩුවකින් කෙසෙල් සිඳින්නේ සිඳුණු තැන් ඔප මට්ටම් නොවේ. කඩුව වහා නො උසුලයි. ශබ්දය ඇසේ. බලවත් උත්සාහයක් කළයුතු වේ. සද්ධාවිමුත්තයාගේ පූර්වභාග භාවනා මෙබඳු වේ. යම්සේ වනාහි ඉතා තියුණු කඩුවකින් කෙසෙල් කඳක් කැපූ තැන් ඔප මට්ටම් වේ. වහා කඩුව උසුලයි. ශබ්දය නො ඇසේ. බලවත් උත්සාහයක් අවශ්‍ය නොවේ. මෙබඳු රූප වූ ප්‍රඥා සද්ධාව විමුත්තයාගේ මාර්ග භාවනාවේ පූර්වභාගයයි දත යුතුය. ධර්මය සිහි කෙරේනුයි ධම්මානුසාරී - වේ. ධම්මො යනු ප්‍රඥාවයි. ප්‍රඥාව පූර්වංගම වූ මාර්ගය වඩයි යනු අර්ථය වේ. සද්ධානුසාරියෙහි ද මෙම නයයි. මේ දෙකෙහිම සෝවාන් මාර්ගස්ථයාම වේ. මෙය කියන ලදී: "යම් පුද්ගලයෙකු සෝවාන් පලය අවබෝධ කිරීම සඳහා පිළිපන්නේ පඤ්ඤින්ද්‍රිය අධික වේ නම් ප්‍රඥාවත් හේ ප්‍රඥා පෙරටු වූ ආර්ය මාර්ගය වඩයි. මේ පුද්ගලයා ධම්මානුසාරී යයි කියනු ලැබේ. එසේම සෝවාන් පලය අවබෝධ කිරීම සඳහා පිළිපන් යම් පුද්ගලයෙකුගේ සද්ධින්ද්‍රිය අධිකවේ නම් ශ්‍රද්ධාවත් වූ හේ ශ්‍රද්ධා පෙරටුවූ ආර්ය මාර්ගය වඩයි. මේ පුද්ගලයා සද්ධානුසාරී යයි කියනු ලැබේ. මෙය මෙහි සංක්‍ෂේපයයි. උභතෝභාගාදි මුත්ත කථා විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයේ පඤ්ඤාභාවනා අධිකාරයෙහි කියන ලදී. එහෙයින් එහි කියන ලද නයින්ම දතයුතුයි. මෙහි සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුයි.

පධානෙසු - මෙහි බලවත් උත්සාහ කිරීම වශයෙන් සත් බොජ්ඣංග පධානයෝ යයි කියන ලදී. ඒවායේ විස්තර කථාව මහා සතිපට්ඨාන සූත්‍රයේ කියන ලද නයින්ම දත යුතුය. මෙහි සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුය. දුක්ඛා පටිපදාදියෙහි මේ විස්තර නයයි. "එහි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා පඤ්ඤාව කවරේද? දුකසේ අපහසුවෙන් සමාධිය උපදවන්නාට ඒ ස්ථානය දන්ධව දැනගන්නා යම් ප්‍රඥාවක් දැන

ගැනීම (පජානනා). අමොහො ධම්මවිචය සම්මාදිට්ඨිය දන්ධ පටිපදාවෙන් දන්ධ අභිඥා ප්‍රඥාව වේ. දුක්ඛ ප්‍රතිපදාවේ ඛිප්පාභිඤ්ඤා ප්‍රඥාව කවරේද? දුකසේ අමාරුවෙන් සමාධිය උපදවන්නාට ඒ ස්ථානය වහා දැනගනීද ඒ දැනගැනීමේ ප්‍රඥාව...සම්මාදිට්ඨිය දුක්ඛ ප්‍රතිපදාවෙන් ඛිප්පාභිඤ්ඤ ප්‍රඥාව. මෙය දන්ධ ප්‍රතිපදාවේ ඛිප්පාභිඤ්ඤ ප්‍රඥාව වේ. එහි සුඛා පටිපදා දන්ධා භිඤ්ඤා ප්‍රඥාව කවරේද? සුවසේ පහසුවෙන් සමාධිය උපදවන්නාට ඒ ස්ථානය දන්ධව අභිජානනය කරන්නාගේ පජානනයයි. සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා කවරේද? සුවසේ පහසුවෙන් සමාධිය උපදවන්නේ ඒ ස්ථානය වහා වැටහේද ඒ ප්‍රඥාව වේ. **නචෙව මුසා වාදූප සංහිතං** - දොඩමලුවීමේ සිටින්නාද කථා මාර්ගය නොසිඳ කියන්නා ද මෙහි ඇතැම් භික්ෂූන් මුසාවාද උපසංහිතව නොකියයි. **නචවෙභූතියං** - දොඩමලුවීමේ සිටින්නා භේදකර වචන නො කියයි. **න පෙසුණියං** - එයටම මෙය පර්යාය වචනයකි. භේදකර වචනවලින් ප්‍රියභාවය නැතිකිරීමෙන් **පෙසුණියං** - යයි කියනු ලැබේ. මහාසීව තෙරුන් වහන්සේ කීහ: **න ච සාරමභජං** - සාරමභජ වූ වචන නොකියයි. ඔබ දුසිල්දැයි විචාල කල, ඔබගේ ඇදුරා දුසිල් යයි හෝ ඔබගේ ඇවත් යයි විචාල කල්හි මම පිඬු පිණිස හැසිර පැළලුප් නුවරට ගියෙමියි ආදි නයින් බාහිර වික්ෂෙප කථා ප්‍රවෘත්ති හෝ කරණුත්තරිය වචන නොකියයි. **ජයාපෙක්ඛො** - ජය පෙරටුව ජය අපේක්ෂාවෙන් නොකියයි. **මන්තා මන්තා ච වාචං භාසති** - මෙහි මන්තා යනු ප්‍රඥාව යයි කියනු ලැබේ. මන්තාය - ප්‍රඥාවෙන් නැවත මන්තා යනු පරීක්ෂා කොට මෙය කියන ලද්දේ වේ. දොඩමලුවීමෙහි සිටින්නා දවස මුළුල්ලේ කථා කරන්නේ ප්‍රඥාවෙන් පරීක්ෂා කොට යෝග්‍ය කථාව කියයි. **නිධානවතිං** - සිතේ තබා ගැනීමට සුදුසු **කාලෙන** - සුදුසු කාලයෙහි, මෙසේ කියන ලද වචන මුසා නොවේ. කේලාම් නොවේ. පරුෂ නොවේ. කයිරාටික නොවේ. ප්‍රලාප නොවේ. මෙබඳු වූ වචන චතුසසත්‍ය නිශ්‍රිත ද දසකථාවත්‍ථු නිශ්‍රිත සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නිශ්‍රිත ද ශික්ෂාත්‍රය නිශ්‍රිත ද තෙළෙස් ධුතාංග නිශ්‍රිත ද මාර්ග නිශ්‍රිද දැයි කියනු ලැබේ. එයින් කීහ: ''ස්වාමීනි මෙය අනුත්තරිය වේ. දොඩමලුවීමේ ඇලීමේ''. **සච්චො චසස සද්ධො චා** - සීලාචාරයෙහි සිටි භික්ෂුව සත්‍යවාදී වන්නේය, සත්‍ය කථා ඇත්තේද වේ. ශ්‍රද්ධා සම්පන්න ද වේ. යට සත්‍ය කීවා නොවේද? මෙහි නැවත කුමක් හෙයින් කියන ලදදද? යට වාක් සත්‍යය කියන ලදී. සීලාචාරයෙහි සිටින භික්ෂුව වනාහි යටත් පිරිසෙයින් හසස කථාවෙහි ද කෙළි කථාවෙහිද බොරු නොකියයි. යනු දැක්වීමට මෙහි කියන ලදී. දැන් හේ දහමින්

සෙමෙන් ජීවිත ගෙනයයි යනු දක්වීම සඳහා "න ච කුහකො" කුහකයෙක් නොවේය ආදිය කියන ලදී.

එහි කුහක ආදිය බ්‍රහමජාල සූත්‍රයෙහි විස්තර කරන ලදී. **ඉන්ද්‍රියෙහි ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ** - ඉන්ද්‍රියන් සයෙහි සංවරය, භොජනයෙහි ප්‍රමාණ දැනීම. **සමකාරී** - සමානව හැසිරීම කයින් වචනයෙන් මනසින් කාය වංකාදිය හැර සමානව හැසිරේ යන අර්ථයයි. **ජාගරියානුයොගමනුයුත්තො** - රෑදාවල් කොටස් හයක් කොට දාවල් සක්මනින් හිඳීමෙන් යයි කියන ලද නයින් යුක්ත ප්‍රයුක්තව වාසය කරයි. **අතන්ද්තො** - කම්මැලි නැති. ශරීර මැලි නැති. **ආරද්ධවිරියො** - කායික වීර්යයෙන් ද ආරද්ධ විරිය වේ. සමූහයාගෙන් ඈත්ව සතර ඉරියව්වෙහි අට ආරම්භ වස්තු වශයෙන් හුදකලා වාසය කිරීම. චෛතසික වීර්යයෙන් ද ආරද්ධ විරිය වේ. කෙලෙස් සමූහයා හැර විවේකීව අෂ්ට සමාපත්ති වශයෙන් එකලා විහරණය. තවද කෙලෙස් ඉපදීම වලක්වා චෛතසික වීර්යයෙන් ආරද්ධවිරිය වේ. **ඣායී** - අරමුණු ලක්ෂණ උපනිජ්ඣාන වශයෙන් ධ්‍යායී, **සතිමා** - කල්ගිය කතාද සිහි කිරීමට සමත් සිහියෙන් යුක්තව. **කල්‍යාණ පටිභාණො** - කථා කිරීමේ ශක්තියෙන් යුක්ත සහ වැටහීමේ ශක්තියෙන් යුක්ත. යුක්ත පටිභාන මිස මුත්ත සම්භාන නොවේ. .වංගීස තෙරුන් මෙන්. **ගතිමා** - ගමන සමර්ථ ප්‍රඥාවෙන් යුක්ත. **ධිතිමා** - ධාරණා සමත්කමින් යුත්. **මතිමා** - මෙහි මති යනු ප්‍රඥාව කියන ලදී. එහි යට ශ්‍රමණ ධර්ම කරණ වීර්ය කියන ලදී. මෙහි බුද්ධ වචන ගන්වන වීර්යයි. එසේම යට විදර්ශන ප්‍රඥාව කියන ලදී. මෙහි බුද්ධ වචන ගන්වන ප්‍රඥාවයි. **න ච කාමෙසු ගිද්ධො** - වස්තුකාම ක්ලේශ කාමයන්හි නො ඇළුණු. **සතො ච නිපකො** - ඉදිරියට යෑම ආපසු ඒම ආදි සථාන සතෙහි සිහියෙන් ද .නුවණින් ද යුක්තව හැසිරේ යන අර්ථය වේ. **නෙපක්කං** - එය ප්‍රඥාවෙන් යුක්තවූයේ නිපක යයි කියන ලදී. මෙහි සෙස්සද පෙරනයින්ම යෙදිය යුතුය. **පච්චත්තං යොනිසො මනසිකාරා** - තමාගේ උපාය මනසිකාරයෙන්. **යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා** - මා අනුසාසනා කළ සේ දෙනලද අනුසානාව අනු පිළිපදින්නෝ, "සංයෝජන තුන ක්ෂීණ කිරීම" යනාදිය කියන ලද අර්ථ වේ. සෙස්ස මෙහි පෙර සේ යෙදිය යුතුය.

**පරපුග්ගලවිමුත්ති ඤාණො** - සෝවාන් ආදි පරපුද්ගලයන්ගේ ඒ ඒ මගින් කෙලෙස් විමුත්ති ඤාණයෙන් මෙහි සෙස්ස පෙර පරිදි යොදන්න.

**අමුත්‍රාසි එවං නාමො** - කෙනෙක් පෙර වාසය සිහි කරන්නේ හාත්පසින් ගනු ලබමින් යති. කෙනෙක් පිරිසිඳු ස්කන්ධම සිහි කරති. කෙනෙකුට හැකි වේ. කෙනෙකුට නොහැකි වේ. එහි යමෙක් හැකිවේද ඔහු අනුව නොගෙන නොහැකි වූ තැනැත්තා අනුව ගන්නා ලදී. නොහැකි වූ තැනැත්තා කුමක් කෙරේද? සුදධ ස්කන්ධම සිහි කරමින් ගොස් නොයෙක් ජාති ලක්ෂයක් මත්තේ සිට නම්ගොත් හාත්පසින් ගනු ලබන්නේ බසී. එය දක්වන්නේ ''එවං නාමොති'' මෙසේ නම් යනාදිය කීහ. **සො එවමාහ** හේ දිට්ඨිගතිකව මෙසේ කීය. එහි කිසිවක් ''ශාස්වත'' යයි කියා ''ඒ සත්‍වයෝ හැසිරෙති'' කියන්නහුගේ වචන පෙර අපර නොගැලපේ. දිට්ඨිගතිකයා වනාහි මෙය නොසලකයි. දිට්ඨිගතිකයාගේ සථානයක් හෝ නියමයක් හෝ නැත. මෙය විසඳයි. මෙය විසඳා මෙය ගනී යයි මෙය බ්‍රහමජාලයෙහි විස්තාරිතය. **අයං තතියො සසසතවාදො** - සථවිරයෝ ලාභියාගේ වශයෙන් ශාසවත වාද තුන කීහ. භාග්‍යවතුන් තාර්කික වාදය ද ගෙන බ්‍රහම ජාලයෙහි සතරක් කියන ලදී. මේ වාද තුනේ විස්තර කථාව බ්‍රහමජාලයෙහි කී නයින් ම දත යුතුය. මෙහි සෙස්සද පෙර නයින් ම විස්තර කළ යුතුය. **ගණනාය වා** - පිඬුගණනින්. **සංඛාතෙන** - නොකැඩුණු මනෝගණනින්. දෙකම පිඬු ගණනම දක්වයි. මෙය කියන ලදී: ''වර්ෂයන් ගේ සියය වශයෙන් දහස වශයෙන් ලක්ෂය වශයෙන් කෝටි වශයෙන් පිඬු කොට ද මෙපමණ වර්ෂ සීයක් හෝ මෙපමණ වර්ෂ දාහක්, කෝටියක් හෝ යයි මෙසේ ගණනය කිරීමට නොහැකි වේ. ඔබ වනාහි තමාගේ දස පාරමිතා පුරන ලද බැවින් සර්වඥතා ඥානයෙහි මනාව අවබෝධ කරන ලද්දේ, යම් හෙයකින් අනාවරණ ඥාණය සුර ලෙස ලබාගනීද එහෙයින් අපට දේශනා ඥාණ හැකියාව පෙරටුව වර්ෂ ගණනාවක් ඇතුළත් කොට කල්ප ගණනාවක් පිරිසිඳ මෙපණක් දක්වව් යයි දක්වයි. පෙළෙහි අර්ථය ද කී ලෙසින්ම වේ. මෙහි සෙස්සද පෙර නයින්ම යෙදිය යුතුය. **එතදානුත්තරියං භනෙත සතතානං චුතුපපාත ඤාණෙ** - ස්වාමීනි මේ සත්වයන් ගේ යම් චුති පටිසන්ධි වශයෙන් ඥාණ දේශනා වේද ඒවා ඔබගේම අනුත්තර වූ අතීත බුදුවරයෝ ද මෙසේම දේශනා කළහ. අනාගතයේ ද මෙසේම දේශනා කරන්නාහ. ඔබවහන්සේ ඒ අතීත අනාගත බුදුවරයන්ගේ ඥාණය සමග සසඳාම දේශනා කරන ලදහ. මේ කාරණයෙන් මෙසේ ප්‍රසන්නවූ මම සවාමීනි ඔබ භගවත් යයි දක්වමි. පෙළෙහි අර්ථය වනාහි විස්තර කළයුතුමය. **සාසවා ස උපධිකා** - සදොස් වූ, දෝෂාරෝපනය. **නොඅරියාති වුචචති** - ආර්ය සෘද්ධිය යයි නොකියනු

ලැබේ. **අනාසවා අනුපධිකා** - නිදොස් වූ, දෝෂාරෝපන නොකිරීම. **අරියාති වුච්චති** - ආර්ය සෘද්ධිය යයි කියනු ලැබේ. **අප්පටිකූළ සඤ්ඤී තත්‍ථ විහරති** - කෙසේ අප්පටිකූල සඤ්ඤීව එහි වෙසේද? පිළිකුල් සතුන් කෙරෙහි මෛත්‍රිය පතුරයි. සංස්කාරවල ධාතු සංඥාව ලඟට පමුණුවයි. යම්සේ කීහ: ''පිළිකුළෙහි නොපිළිකුල් හැඟීම් ඇතිව වෙසෙන්නේ කෙසේද?'' ඉටු නොවූ වස්තුවෙහි මෛත්‍රිය හෝ පතුරුවයි. ධාතු වශයෙන් හෝ සිහිකරයි. **අප්පටිකූළෙ පටිකකුල සඤ්ඤී තත්‍ථ විහරති** - නො පිළිකුල් සතුන් කෙරෙහි අසුභ හැඟීම් ඇති කරයි. සංඛාරවල අනිත්‍ය සංඥාව එලවයි. එයින් කීහ: ''නො පිළිකුල් සතුන් කෙරෙහි පිළිකුල්ව වෙසෙන්නේ කෙද්ද?'' ඉටු අරමුණෙහි අසුභය පතුරවයි. අනිත්‍ය වශයෙන් බලයි. මෙසේ සෙසු පදවල ද අර්ථය දත යුතුය. **උපෙකඛ කො තත්‍ථ විහරති** - ඉටුවෙහි නො ඇලෙන්නේ, අනිටුවෙහි සිත නරක් නොකර ගන්නේ, අසමව බැලීමෙන් මෝහය උපදවයි. මෙසේ නූපදවමින් අරමුණු සයෙහි උපේක්ෂා සයෙන් බලන්නේ වාසය කරයි. **එතදානුත්තරියං භනෙත ඉද්ධි විධාසු** - සවාමිනි, යම් මේ සෘද්ධි දෙකෙහි මෙසේ දේශනා එතදානුත්තරිය වේ.' **තං භගවා** - භාග්‍යවතුන් වහන්සේ ඒ දේශනය නිරවශේෂයෙන් සියල්ල දැනගනිති. **තං භගවතො** - ඒ දේශනය නිරවශේෂයෙන් භාග්‍යවතුන් වහන්සේගෙන් දැනගනු ලැබීමෙන් **උත්තරිං අභිඤ්ඤෙයයං නත්‍ථි** - ඉහළට දැනගැනීමක් නැත. මෙය නම් මෙයින් අන්‍ය දහමක් හෝ පුඟුලෙක් හෝ භාග්‍යවතුන් වහන්සේ නොදන්නාක් නම් නැත. **යදභිජානං අඤ්ඤො න සමණො වා බ්‍රාහමණො වා** - ඔබ වහන්සේ විසින් අනිභිඥාන වූ යමක් අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දැන ගනි ද භාග්‍යවතුන් වහන්සේ එය ඔවුනට වඩා අධිකතරව දැන ගන්නේය. **යදිදං ඉද්ධිවිධාසු** - මෙහි යදිදං නිපාතයකි. සෘද්ධි විෂයෙහි භාග්‍යවතුන් වහන්සේට වඩා උත්තරීතරයෙක් නැත. අතීත බුදුවරු ද මේ සෘද්ධි දෙක දක්වන ලදහ. අනාගත බුදුවරුද මෙයම දක්වන්නාහ. ඔබ වහන්සේ උන්වහන්සේලාගේ ඤාණය සසඳා මෙය දේශනා කළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සෘද්ධි විෂයෙහි අනුත්තර යයි දක්වන්නේ මේ කරුණින්ද මෙසේ ප්‍රසන්න වූ මම ස්වාමීනි, භගවත් යයි දක්වයි. මෙපමණකින් ධම්මසේනාපති දිවා ස්ථානයේ හිඳ සොළොස් අපරම්පරිය ධර්මය සම්මර්ශනය කෙළේ එයම දක්වන ලද්දේය. දැන් අන්‍ය වූ ආකාරයකින් භාග්‍යවතුන් වහන්සේ ගුණ දක්වන්නේ ''යනතං භනෙත'' යනාදිය කීහ. එහි **සදෙධන කුලපුතෙතන** - ශ්‍රද්ධා කුල පුත්‍රයෝ නම් අතීත අනාගත වර්තමාන බෝධිසත්‍වයෝය. එහෙයින් යම් සබ්බඤ්ඤු

බෝධි සත්වයෙක් පැමිණිය යුතු යයි කියන ලද්දේ වේ. කුමකට පැමිණිය යුතුද? නව ලෝකෝත්තර ධර්මයට. ආරද්ධ වීරියෙන ආදියෙහි ථාමො යනාදි සියල්ල විරිය පරියාය වචන වේ. එහි ආරද්ධ විරියෙන - උදව් කරන වීර්ය. ථාමවත - ථාම සම්පන්න සපීර විරිය. පුරිසථාමෙන - ඒ වීර්යයෙන්. පුරුෂ වීර්යෙන් පැමිණිය යුතු යමක් කියන ලද්දේ වේ. අනතුරු පද දෙකෙහි ද මෙම නයයි.

පුරිසධොරයෙහනා - අසම ධුර වූ බුදුවරුන් විසින්ම ඉසිලිය යුතු ධූරය, ඒ ධුරය ඉසිලීම සමත් අරුතෙන් මහා පුරිසෙන වේ. අනුප්පත්තං භගවතා - අතීතානාගත බුදුවරුන් පැමිණිය යුතු සියල්ලට පැමිණ භගවත්හුගේ එක ගුණයක්වත් අඩු නැතැයි දක්වයි. කාමෙසු කාමසුඛලලිකානුයොගං - වස්තු කාමයන්හි කාම සැපයෙහි ඇලීම, යම්සේ කෙණිය ජටිලාදි අන්‍ය ශ්‍රමණ බ්‍රාහමණයෝ පරලෝකය කවරෙක් දනීද දූන්මේ පරිබ්බාජිකාවගේ මෘදු වූ ලෝම දෙඅත් සපර්ශය සැපයයි ඔව්හු කොණ්ඩ බැඳි පරිබ්‍රාජිකාවන් පිරිවරා සිටිති. පැමිණි පැමිණි අරමුණු රස විඳිමින් කාම සැපයෙහි යෙදෙති. එසේ නොවේ යයි දක්වයි. හිනං - ලාමක වූ. ගාමං - ගාමවාසීන්ගේ ධර්මතා. පොථුජ්ජනිකං පෘථග්ජනයා විසින් සෙව්නා ලද. අනරියං - නිද්දෝස වූ ආර්යන් විසින් නොසෙව්නා ලද. අනත්ථසංහිතං - අනර්ථයෙන් යුත්. අත්තකිලමථානුයොගං - තමාගේ තැවීම් පරිතාපනයෝගයෙන් යුත්. දුක්ඛං - දුකින් යුත්. සමහර ශ්‍රමණ බ්‍රාහමණයෝ මේ සුව විඳිමු යයි කාය කිලමථයට පැමිණෙති. එයින් මිදෙමුයයි කම්සුව කාම සැප ඔස්සේ දුවති. භාග්‍යවතුන් වහන්සේ එසේ නැත. භාග්‍යවතුන් වහන්ස් වනාහි මේ අන්ත දෙක දුරුකර "මහණෙනි, යම් මධ්‍යම ප්‍රතිපදාවක් ඇති නිසා එයින් තථාගතයන් විසින් අවබෝධ කරන ලද චක්ඛු කරණී ඇත. යහපත් ප්‍රතිපදාව මෙසේ කියන ලදී. එයින් පිළිපන්නේ එහෙයින් අත්ත කිලමථානු යෝගය නැතැයි යනාදිය කීහ. අභිචෙතසිකානං - කාමාවචර සිත් ඉක්මවා සිටී යන අර්ථයයි. දිට්ඨධම්මසුඛවිහාරං - මේ ආත්මභාවයෙහි ම සැපවිහරණවල. පොට්ඨපාද සූත්‍රයෙහි පීති සහගත ද්‍රුතිය ධ්‍යානික ඵලසමාපත්තිය කියන ලදී. පාසාදික සූත්‍රයෙහි මාර්ග සහිත විදර්ශනා පාදක ධ්‍යානය. දසුත්තර සූත්‍රයෙහි සතරවන ධ්‍යානික ඵලසමාපත්තිය. මේ සමපසාදනීය සූත්‍රයෙහි දිට්ඨධම්ම සුඛවිහාර ධ්‍යාන කියන ලදී. නිකාම ලාභී - කැමති දේ ලබන. අකිච්ඡලාභී - පහසුවෙන් ලබන. අකසිරලාභී - මහත් සේ ලබන එකිස්සා ලොකධාතුයා - දස දහසක්

ලෝකධාතු, ක්ෂේත්‍ර තුනකි. ජාති, ආඥා සහ විෂය ක්ෂේත්‍ර වශයෙනි. එහි ජාති ක්ෂේත්‍රය නම් දස දහසක් ලෝකධාතුව! එය වනාහි තථාගතයන් වහන්සේගේ මව්කුස පිළිසිඳ ගන්න, බිහිවන, අභිනිෂ්ක්‍රමණ කරන, බුදුවන, දම්සක් පවත්වන, ආයු සංස්කාරය හරින, පිරිනිවන්පාන අවසථාවල කම්පා වේ. කෝටි ලක්‍ෂයක් සක්වල වනාහි ආඥා ක්ෂේත්‍ර නම් වේ. ආටානාටිය, මොරපරිත්ත, ධජග්ග පරිත්ත, රතන පරිත්තාදියේ අණ මෙහි පවතී. විසය ක්ෂේත්‍රයෙහි පරිමාණයක් නැත. බුදුවරුන්ගේ වනාහි ඥාණය යම්තාක් ද එපමණ ඥෙයය (දතයුතු) වේ. ඥෙයය යම් පමණද එපමණ ඥාණය වේ. ඥාණය කෙළවර ඥෙයය වේ. ඥෙයය කෙළවර ඥාණය වේ. යන වචනයෙන් අවිසය වූවක් නම් නැත. මේ ක්ෂේත්‍ර තුණෙහි මේ සක්වල හැර අන්‍ය සක්වල බුදුවරු උපදිති යයි සූත්‍රයක් නැත. නො උපදිති යයි ඇත. පිටක තුණකි. විනය සුත්තන්ත අභිධම්ම. සංගීති තුනකි. මහා කසසප සංගීති, යසත්ථෙර සංගීති සහ මොග්ගලීපුත්ත තිස්සත්ථෙර සංගීති. මේ සංගීති තුනෙහි ආරූඪ කළ ත්‍රිපිටක බුද්ධ වචනයෙහි මේ සක්වල හැර අන්තැන්වල බුදුවරු උපදිතියයි සූත්‍රයක් නැත. නො ඉපදිති යයි ඇත. අපුබ්බං අචරිමං - පෙර පසු නොවී. එකට නො උපදිති. පෙර හෝ පසු හෝ උපදිතියි කියන ලද්දේ වේ. බෝ පලඟෙහි බුදු නොවී නො නැගිටින්නෙමියි හුන් කාලයෙහි සිට මව්කුස පිළිසිඳ ගන්නා කාලය දක්වා පෙර යයි නොදත යුතුය. ධාතු තිබෙනතුරු බුදුහු වැඩ සිටිති. එහෙයින් මේ අතර අන්‍ය බුදු කෙනෙකුගේ උපත නිවාරිතය. ධාතු පිරිනිවි කල්හි අන්‍ය බුදුවරයෙකුගේ උපත නිවාරිත නොවේ. අතුරුදහන් තුනකි. **පරියත්ති අන්තරධානං පටිවෙධ අන්තරධානං පටිපත්ති අන්තරධානං** - එහි පරියත්ති යනු තුන්පිටකයයි. පටිවෙධ - සත්‍ය ප්‍රතිවේධයයි. පටිපත්ති - ප්‍රතිපදාවයි. එහි පටිවේධය ද පටිපත්ති ද තිබුනත් නැතත් එක් කලෙක ප්‍රතිවේධකර භික්ෂු බොහෝ වෙති. මේ භික්ෂුව පෘථග්ජන යයි ඇඟිල්ල දික්කර දක්විය යුතුවේ. මේ ද්වීපයෙහි ම එක්වරක පෘථග්ජන භික්ෂුවක් නම් නොවීය. ප්‍රතිපදාව පුරන්නෝ සමහර කාලෙක බොහෝ වෙති. සමහර කාලෙක අල්ප වෙති. මෙසේ පටිවේධයද පටිපත්තිය ද තිබුණත් නැතත් සාසන පැවැත්මට පරියත්තිය ප්‍රමාණවත්ය. පණ්ඩිතයා ත්‍රිපිටකය අසා ඒ දෙක පුරති. අපේ බෝසතාණන් මෙන් ආළාර සමීපයේ පස් අභිඥා සත් සමාපත්ති උපදවා නේවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්තියට පරිකර්ම විචාළේය. හේ නොදනිමියි කීය. ඉක්බිති උද්‍රක සමීපයේ අවබෝධ කළ විශේෂය සසඳා නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට පරිකර්ම විචාළේය. හේ කීවේය. ඒ වචනය අතරතුරම

මහසත් තෙම එය ඉපද වීය. එසේම ප්‍රඥාවත් භික්‍ෂුව පරියත්තිය අසා ඒ දෙකම පුරයි, එහෙයින් පරියත්තිය පැවති විට සාසනය පැවතියේ වේ. යම් කලෙක එය අතුරුදහන් වේද? පළමුව අභිධම්ම පිටකය නැතිවෙයි. එහි සියල්ලට පළමුව පට්ඨානය අතුරුදහන් වෙයි. අනුක්‍රමයෙන් පසුව ධම්ම සංගනී එය අතුරුදහන් වූ කල ඉතිරි පිටක දෙක පවතින තුරු සාසනය පවතී. සූත්‍ර පිටකය අතුරුදහන් වනකල පළමුව අංගුත්තර නිකායේ ඒකාදසක නිපාතය පටන් ඒකක නිපාතය අතුරුදහන් වෙයි. අනතුරුව සංයුත්ත නිකාය, චක්ක පෙය්‍යාලයෙහි පටන් ඔඝතරණය දක්වා අතුරුදහන් වෙයි. ඉන් අනතුරුව මජ්ඣිම නිකාය ඉන්ද්‍රියභවන සූත්‍රයේ පටන් මූලපරියාය සූත්‍රය දක්වා අතුරු දහන් වෙයි. ඉන් අනතුරුව දීඝනිකායේ දසුත්තර සූත්‍රයේ සිට බ්‍රහ්මජාල සූත්‍රය දක්වා අතුරු දහන් වෙයි. කෙනෙක් ගාථා දෙකක් අසා මාර්ගයට යයි. සාසනය දුරීමට නොහැකි වෙයි. සභිය පුච්ඡා ආලවක පුච්ඡා මෙන් ද ඒවා වනාහි කාශ්‍යප බුදුන්ගේ කාලයේ අතරය. සාසනය දුරීමට නොහැකි වූහ. පිටක දෙක අතුරුදහන් වී විනය පිටකය තිබෙන තුරු සාසනය පවතී. පරිවාර ඛන්ධක උභතො විභංග අතුරුදහන් වී මාතිකා තිබෙනතුරු සාසනය පවතී. මාතිකාව නැසී ප්‍රාතිමොක්‍ෂ පබ්බජ්ජා උපසම්පදා පවතින තුරු ද සාසනය පවතී. ලිංගය (වේශය) මාර්ගයට යයි. සුදුවත් සාසන වංසය වනාහි කාශ්‍යප බුදුන්ගේ කාලයේ සිට සාසනය දුරීමට නොහැකි විය. පිළිසිඹියා පත්වූවන්ගෙන් වසර දහසක් පැවතියේය. සඩභිඥාවලින් වසර දහසක් ත්‍රිවිද්‍යාවෙන් වසර දහසක් ශුෂ්ක විදර්ශකවලින් වසර දහසක් ප්‍රාතිමොක්‍ෂයෙන් වසර දහසක්දයි (පන්දහසක්) සත්‍ය ප්‍රතිවේධයෙන් පසු සීල භේදයෙන් පසු සාසනය පසුබසී. එතැන් පටන් අන්‍ය බුදුවරයෙකුගේ උපත නොවලක්වන ලදී. පිරිනිවන් පෑම් තුනකි. කෙලෙස් පිරිනිවුම බෝධි පලලංකයේ (ආසනය) විය. ඛන්ධ පරිනිබ්බානය කුසිනාරාවෙහි විය. ධාතු පිරිනිවීම අනාගතයෙ වන්නේය. සාසනය නැසෙන කාලයෙහි මේ දිවයිනෙහි ධාතු (ලංකාව) රැස් වී මහාචෛතිය (රුවන්වැලිසෑය) වෙත යයි. මහ සෑයෙන් නාග දීපයේ රාජායතන චෛතිය වෙත එතැනින් මහාබෝධි පල්ලංකයට නාගභවන දෙව්ලෝ බඹ ලෝ ධාතු ද මහ බෝ පලඟට යයි. අබටැක් සා ධාතු ද අතර මග නොනසී. සියළු ධාතු මහ බෝ පලඟට රැස්ව රන් කඳක් මෙන් එකට ඝන වී සවනක් රස් විහිදුවයි. දස දහසක් සක්වලපැතිරෙයි. ඉන්පසු දස දහසක්වල දෙවියෝ රැස්වෙති. අද ශාස්තෲන් වහන්සේ පිරිනිවන්පාති.

අද සාසනය අවසන් වෙයි. දූන් අවසාන දර්ශනයයි. මේ අපගේ දශබල බුදුන්ගේ පිරිනිවි දවසයි. මහත් කරුණාව කරති. අනාගාමි ක්ෂීණශ්‍රාවයන් හැර සෙස්සෝ තමාගේ සවභාවයෙන් සිටීමට නොහැකි වෙති. ධාතුවලින් තෙජෝධාතු නැගී බඹලොව දක්වා උඩට යයි. අබටැක් පමණ ධාතු ද පවතින විට එකම ජාලයක් වේ. ධාතු විනාශයට ගිය කල්හි පැවැත්ම නවති. මෙසේ මහත් ආනුභාවයක් දක්වා ධාතු අතුරුදහන් වූ කල්හි සාසනය අතුරුදහන් වූයේ නම් වෙයි. මෙසේ අතුරුදහන් වනතුරු අචරිම - වේ. මෙසේ අපුබ්බ අචරිමව බුදුවරු නූපදිති. ආශ්චර්ය නොවන නිසා බුදුවරු ආශචර්ය මනුෂ්‍යයෝය කීහ: මහණෙනි එක් පුද්ගලයෙක් ලොව පහළ වේ. හේ ආශචර්ය මනුෂ්‍යයෙකි. කවුරුද? තථාගත අරහත් සම්මා සම්බුද්ධයන් වහන්සේය. ඉදින් දෙන්නෙක් හෝ සතර දෙනෙක් හෝ අට දෙනෙක් හෝ දහසය දෙනෙක් හෝ එකට උපදින්නාහු නම් ආශචර්ය නොවන්නේය. එක් විහාරයක චේතිය දෙකකට ලාභ සත්කාර මහත් නොවේ. භික්ෂු බොහෝ වේ නම් ආශචර්ය නොවන්නේය. එහෙයින් නූපදිති. දේශනාවේ විශේෂ භාවයෙන්ද යම්සේ සතිපට්ඨානාදි ධර්මය එක්කෙනෙක් දේශනා කරයි. අන්‍යයෙක් ඉපදුනොත් හේද දේශනා කරයි. එයින් අසිරිමත් නොවේ. එක් කෙනෙක් ධර්මය දේශනා කරනවිට ආශ්චර්ය වන්නේය. විවාද නැති වන්නේය. බොහෝ බුදුවරු පහළ වූ කල බොහෝ ආචාර්යවරුන් ගේ අතවැස්සන්. මෙන් අපගේ බුදුන් ප්‍රසාදිතය. අපගේ බුදුන් මධුරස්සරය, ලාභීය, පින්වන්තයයි වාද කරන්නාහුය. එහෙයින් මෙසේ නූපදිති.

තව ද මේ කරුණ මිලිඳු රජු ඇසුයෙන් නාගසේන හිමි විස්තර කෙළේය. එහි කියන ලදී: ස්වාමීනි නාගසේනයන් වහන්ස, භාගවතුන් විසින් මෙයද කියන ලදී. ''මහණෙනි, එකම ලෝකධාතුවක අරහත් සමමා සමබුද්ධ දෙනමක් පෙර පසු නොවී උපදින්නාහු නම් මෙය සිදු නොවේ.'' ස්වාමීනි, නාගසේනයන් වහන්ස, සියළු තථාගතවරු සත්තිස් බෝධිපාක්ෂික ධර්ම දේශනා කරති. චතුරාර්ය සත්‍ය කියති. ත්‍රිවිධ ශික්ෂාවෙහි ම හික්මවති. අප්‍රමාද ප්‍රතිපත්තියේම පිහිටීමට අනුසාසනා කරති. ස්වාමීනි නාගසේනයන් වහන්ස, සියළු තථාගතන්ගේ එකම දේශනාවය, එකම කථාවය, එකම ශික්ෂා පදය, එකම අනුසාසනාවය. ඒකක්ෂණයෙහි බුදුවරුන් දෙදෙනෙකු නූපදින්නේ කුමන කරුණකින්ද? එක බුදුවරයෙකුගේ පහළවීමෙන් මේ ලෝකය එළිය වැටුනේය. බුදුවරු දෙන්නෙක් පහළ වේ නම් දෙදෙනෙකු ගේ ප්‍රභාවෙන් මේ ලෝකය

බොහෝ සෙයින් එලිය වැටෙන්නේය. අවවාද දෙන්නේ ද බුදුවරු දෙදෙනෙකුට පහසු වන්නේය. අනුසාසනා කිරීමටද පහසු වන්නේය. එහි මේ කාරණය මගේ සැකය නැතිවෙන්න කියනු මැනවි. මහරජ, මේ දස දහසක් සක්වල එක බුදුවරයෙක් ම දරන්නේය. එක බුදුවරයෙකුගේ ගුණම දරන්නේය. ඉදින් බුදුවරු දෙන්නෙකු පහළ වේ නම් මේ දස දහසක් සක්වල නොදරන්නේය. එසේ වුවහොත් සැලෙන්නේය. කම්පා වන්නේය. නැමෙන්නේය. කරබාන්නේය. විශේෂයෙන් නැමෙන්නේය. විසිරෙන්නේය. විනාශ වන්නේය. නැසීමට පැමිණෙන්නේය. මහරජ යම්සේ නැවක් එක පුරුෂයකු සන්තරණය (ප්‍රවාහන) කිරීමට හැකි වන්නේය. දෙවන පුරුෂයෙක් පැමිණියොත් පළමු පුරුෂයා මෙන් ආයු වණ්ණ වය පමණ කිස ථූල සියළු අඟ පසඟ සමාන වන්නේය. හේ නැවට නැගෙන්නේය. ඉදින් මහරජ නැව දෙන්නාම දරාද? සවාමීනි නැත. සැලෙන්නේය. කම්පා වන්නේය. නැමෙන්නේය..... ජලයේ ගිලෙන්නේය. මහරජ එසේම මේ දස දහසක් සක්වල එක බුදුවරයකු දරන්නේය. එක්කෙනෙකුගේ ගුණ දරයි. ඉදින් දෙවන බුදු කෙනෙක් උපදින්නේ නම් මේ ලෝක ධාතුව නොදරන්නේය. සැලෙන්නේය. විනාශයට පත් වන්නේය. මහරජ යම්සේ පුරුෂයෙක් ඇති තරම් ආහාර ගන්නේය. උගුර ගාවට එනකම් පුරවන්නේය. නැමෙන්නට ද නොහැක්කේය. දේවයන් වහන්ස, නැවත එපමණ ආහාර ගතහොත් ඒ පුරුෂයාට පහසු වන්නේද? නැත ස්වාමීනි, තව වරක් කන්නේ නම් මැරෙන්නේය. මහරජ එසේම මේ දසදහස් ලෝක ධාතුව එක බුදුවරයෙක්ම දරන්නේය. විනාශයට පත්වන්නේය. ස්වාමීනි නාගසේනයන් වහන්ස, කිම අති ධමමභාරයෙන් පොළොව සැලේද? මහරජ මෙහි ගැල් දෙකක් කට ගාවට රත්වලින් පුරවන්නේය. ඉදින් එක ගැලකට ගැල් දෙකේම රත්පිරවූවොත් ඒ රත් දරාද? නැත සවාමීනි, ඒ ගැලේ නාභිය බිඳෙන්නේය. එහි ගරාදි බිඳෙන්නේය, එහි අලවංගුව විඳෙන්නේය. මහරජ, කිම අතිරත්න බරින් ගැල බිඳේද? එසේය ස්වාමීනි, මහරජ, එසේම අති ධමම බරින් පොළොව සැලේ.

තව ද මහරජ, බුද්ධබල දැක්වීම සඳහා මේ කරුණ විස්තර කරන ලදී. එහි වෙනත් අභිරූප කාරණයක් අසන්න, ඉදින් බුදුවරු දෙදෙනෙක් එකවර උපදින්නේ නම් පිරිස අතර වාද උපදින්නේය. ඔබලාගේ බුදුන්, අපේ බුදුන් වශයෙනි. දෙපක්ෂයකට බෙදෙන්නේය. මහරජ යම්සේ බලවත් ඇමතිවරුන් දෙදෙනෙකුගේ පිරිස් අතර ඔබලාගේ ඇමති අපේ

ඇමති වශයෙන් විවාද ඇතිවන්නේය. දෙපක්‍ෂයකම බෙදුනෝ වෙති. මහරජ, එසේම බුදුවරු දෙදෙනෙක් එකවර පහළ වූවහොත් අනුගාමිකයන් අතර ඔබලාගේ බුදුන් අපේ බුදුන් යයි විවාද ඇතිවන්නේය. දෙපක්‍ෂයකට බෙදෙන්නේය. බුදුවරු දෙදෙනෙක් පහළනොවීමට මේ පළමු කරුණ අසන්න.

තව ද බුදුවරු දෙදෙනෙක් එකවර නො ඉපදීමට තව කරුණක් අසන්න. මහරජ, ඉදින් බුදුවරු දෙදෙනෙක් එක්වර උපදින්නේ නම් අග්ගො බුද්ධො යන වචනය මිථ්‍යා වන්නේය. ජෙට්ඨො බුද්ධො, සෙට්ඨො බුද්ධො, උත්තමො බුද්ධො, පවරො බුද්ධො, අසමො බුද්ධො, අසමසමො බුද්ධො, අප්පටිසමො බුද්ධො, අප්පටිභාගො බුද්ධො, අප්පටි පුග්ගලො බුද්ධො යන වචන මිථ්‍යා වන්නේය. මහරජ මේ කාරණය ද ඔබ අර්ථ වශයෙන් පිළිගන්න. මහරජ තව ද බුදුවරුන් ගේ ස්වභාව ප්‍රකෘතිය බුදුවරු දෙදෙනෙක් එකවර නොඉපදීමය. කුමක් හෙයින්ද? බුදු ගුණයේ මහන්තතාව නිසාය. මහරජ, යමක් මහත්වේද එය එකක්ම වේ. මහරජ, පොළොව මහත් වේ. එය එකක්මය. සාගරය මහත් වේ. එය එකක්මය. මහාමේරු පර්වත රාජයා මහත් වේ. එකක්මය. බ්‍රහ්මයා මහත් වේ. එක්කෙනෙක්මය. යම් තැනක හේ පහළ වේ නම් අන්‍යයන්ගේ ආලෝකය නැත. එහෙයින් තථාගත අරහත් සම්මා සම්බුද්ධ එක්කෙනෙක් ම ලෝකයේ පහළවන්නේය. ස්වාමීනි, නාගසේනයන් වහන්ස, ප්‍රශ්නය, උපමා කරුණුවලින් ඉතා හොඳින් කියන ලද්දේය.

**ධම්මස්ස අනුධම්මං** - නව ලෝකෝත්තර ධර්මයේ අනුධර්මවල පූර්වභාග ප්‍රතිපදාව. **සහධම්මිකො** - කරුණු සහිතව. **වාදානුපාතො** - වාදයම. **උදායි** - උදායි නමින් තෙරුන් තිදෙනෙකි, එනම් ලාලුදායි, කාලුදායි, මහා උදායි. මෙහි මහා උදායි අභිප්‍රේතය, මේ සූත්‍රය මුලපටන් අවසානය දක්වා ඇසූ උන්වහන්සේට වනාහි පස්වණක් ප්‍රීතිය ඉපදී පාදයේ සිට හිස දක්වා යයි. හිසේ සිට පාදය දක්වා ආපසු එයි. දෙපස සිට මැදට එයි. මැද සිට දෙපසට යයි. නිතරම ප්‍රීතියෙන් ස්පර්ශ ශරීර ඇතිව බලවත් සොම්නසින් බුදුන්ගේ ගුණ කියන්නේ අච්ඡරියං භන්තෙ යනාදිය කීහ. **අප්පිච්ඡතා** - තෘෂ්ණා නැති. **සන්තුට්ඨිතා** - සිව් පසයෙහි තුන් ආකාර සන්තෝෂය. **සල්ලෙඛතා** - සියළු කෙලෙස් ලියා දැමූ බව. **යත්‍රහි නාම - යමෙක් නම් න අත්තානං පාතු කරිස්සති** - තමාගේ ගුණ ප්‍රකට නොකරන්නේය. **පටාකං පරිහරෙය්‍යුං** - අප හා සමාන කවරෙක්

සිටින්නේදැයි කියන්නේ, කොඩි ඔසවා නාලන්දාවේ හැසිරෙන්නේ. **පසස බො ත්‍වං උදායි තථාගතසස අපපිච්ඡතා** - උදායි, තථාගතයන්ගේ අපිස් බව, යම්බඳද ? තෙරුන් ගේ වචනය සඟවා කීය. භාග්‍යවතුන් වහන්සේ තමා මතු නොකරති. තමාගේ ගුණ නොකියති. නොකියන්නේද නොවේ. අපිස් බව ආදිය කිව යුතු තැන චීවර හේතුවෙන් නොකියති. එයින් කීහ: "බලන්න උදායි ඔබ තථාගතයන් වහන්සේගේ අපිස් බව". ආදි අවබෝධ කරන කෙනෙකු හමු වූ විට හික්මවීම් වශයෙන් කියයි.

නැත ඇදුරුවරයෙක් - සමානයෙකුදු නැත මට
දෙවියන් සහිත ලොව - නැත මෙමට පටි පුඟුලෙක්

මෙසේ තථාගත ගුණ ප්‍රකාශක බොහෝ ගාථා සූත්‍රාන්ත විස්තර කළයුතුය. **අභික්ඛණං භාසෙය්‍යාසි** - පුන පුනා කියන්නෙහි, පෙරවරු යෙහි කියන ලදැයි මධ්‍යහ්නයෙහි නොකිය යුතුය. අද කී නිසා අනිත් දවස්වල නොකිය යුතුය යන අර්ථය වේ. **පවෙදෙසි** - කීවේය. **ඉමසස වෙය්‍යා කරණසස** - ගාථා නැති නිසා මේ සූත්‍රය වෙය්‍යාකරණ යයි කියන ලදී. **අධිවචනං** - නාමය. මෙයද වනාහි ඉතිහිදං පද සංගීතිකරුවන් විසින් තබන ලදී. සෙසු සියළු තැන පැහැදිලිය.

**සම්පසාදන සූත්‍ර වර්ණනාව නිමි.**

# 29

## පාසාදික සූත්‍ර වර්ණනාව

පාසාදික සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. එහි මේ ගැඹුරු පද වර්ණනාවයි. **වෙධඤ්ඤා නාම සක්‍යා** - දුනු ශිල්පයෙහි කරන ලද පුහුණුව ඇති වෙධඤ්ඤ නම් එක් ශාක්‍යයෙක්, ඔවුන් ගේ අඹ වනයෙහි. **පාසාදෙ** - ඔවුන්ගේ අඹ වනයෙහි ශිල්ප ඉගණීම සඳහා කරන ලද දිග පහයක් ඇත. එහි වාසය කරති. **අධුනා කාලකතො** දැන් කළුරිය කෙළේ. **දෙවධික ජාතා** - **දෙවජ්ඣා ජාතා** - භාග දෙකක් හට ගත්තේය.

භාණ්ඩ ආදියෙහි භණ්ඩනං - වේ. පූර්ව භෝගයයි. කලහො - දඬුවම් දීම් වශයෙන් පණවා ඇති නීති උල්ලංඝනය කිරීම් වශයෙන් වර්ධනය වූ කලහ. ''මෙ ධර්ම විනය නොදන්නේද ආදී නයින් විරුද්ධ වචන විවාදො - වේ. විතුදන්තා - විදින්නේ. සහිතං මෙ - මගේ වචන අර්ථ සහිතය. ආචිණ්ණං තෙ විපරාවත්තං - ඔබේ ආචීර්ණ කාලයක් පුහුණු කළ එය මගේ වාදයට පැමිණ නැවැතුණේය. ආරොපිතො තෙ වාදො - ඔබ මත මවිසින් දෝෂය (වරද) ආරෝපනය කරන ලදී. චර වාදපමොක්ඛාය - බත් මුලක් රැගෙන තැන් තැන්වල ගොස් වාදයෙන් මිදීම සඳහා උත්තර සොයමින් හැසිරෙව. නිබ්බෙඨෙහි වා - නැතහොත් මවිසින් ආරෝපිත වරදින් තමා මුදවා ගනු. සචෙ පහොසි - ඉදින් හැකිවෙහි. වධොයෙව - මරණයම. නාථපුත්තියෙසු - නාථපුත්තගේ අතවැසියන් කෙරෙහි. නිබ්බින්න රූපා - කලකිරුණු සවභාවය. වැඳීම් ආදිය නොකරති. විරත්ත රූපා - ප්‍රේමය නැති. පටිවානරූපා - ඔවුන්ගේ සැලකීම්වලින් නැවතුණු සවභාව ඇති. යථාතං - යම්සේ නොමනා ලෙස කියන ලද ස්වභාව ඇති ධර්ම විනයෙහි කලකිරුණු, නොඇළුණු, පටිවානරූපවලින් විය යුතුය. එසේම ඇති වී යයි අරුත් වේ. දුරක්ඛාතෙ - නොමනා කී කල්හි. දුප්පවෙදිතෙ - නරක ලෙස කී කල්හි. අනුපසම සංවත්තනිකෙ - රාගාදිය සමනය කර ගැනීමට අසමත්. භින්නථූපය හේ බිඳින අදහස. එහෙයින් සනත ථූපෙ යයි කියන ලදී. අප්පටිසරණෙ - ඔහුගේ අභාවයෙන් පිළිසරණක් නැති. නාථ පුත්ත නාලන්‍ද වාසියකි. කුමක් හෙයින් හේ පාවාහි කළුරිය කෙළේද? හේ වනාහි උපාලි ගෘහපති විසින් පිළිවිදි සත්‍යයෙන් ගාථා දහයක් කී කල්හි බුදුගුණ අසා උණු ලේ දැමමේය. ඉක්බිති අපහසු වූ ඔහු ගෙන පාවා නගරයට පැමිණියහ. එහිදී ඔහු කළුරිය කෙළේය. කළුරිය කරන්නේම සිතීය. මගේ ලබ්ධිය අපාය පුරවන්නක් විය. ඉදින් මම මගේ සාසනය අනිර්යානිකයි කියන්නෙම් නම් නො අදහති. ඉදින් මම දෙදෙනෙකුට ඒකාකාරයෙන් නුගැන්වූවෙක් මගෙන් පසු ඔව්හු ඔවුනොවුන් වාද කරන්නාහ. ශාස්තෘන් වහන්සේ ඔව්හු සාසනයෙහි මහත් බව දන්නෝය.

ඉක්බිති එක් අන්තේවාසිකයෙක් පැමිණ ඔහුට කීය. සවාමීනි, ඔබ දුබලය. මේ ධර්මයෙහි සාරය මට කියන්න. අවැත්නි තෙපි මා ඇවෑමෙන් ''සාසවත'' යයි ගන්න, වෙනෙකෙක් ද පැමිණියේය. ඔහුට උච්ඡෙදය ගැන්විය. මෙසේ දෙදෙනා ඒක ලබ්ධික නොකොට බොහෝ විවිධ ආකාරවලින් උගන්වා කළුරිය කෙළේය. ඔව්හු ඔහුගේ ශරීර

කෘත්‍යය කොට රැස්වූවෝ ඔව්හු ඇසූහ. ඇවැත්ති සාරාංශය කීවේ කාටද? එකෙක් නැගිට මට යයි කීය. කුමක් කීවේද? සාසවතය. අනිකා ඔහු වලකා මට සාරය කීවේයයි කීය. මෙසේ සියල්ලෝම මට සාරය කීවේය. මට සාරය කීවේ යයි මම ජෙෂ්ඨයා යයි ඔවුනොවුන් විවාද කොට ආක්‍රොසද අපහාස ද අත්පා වලින් පහරදීම් ද පවත්වා එක මගින් දෙදෙනෙක් නොයන්නේ නොයෙක් දිසාවලට ගියහ.

අථ ඛො චුන්‍ද සමණුද්දෙසො - මේ ස්ථවිර ධම්මසේනාපති ගේ කනිටු සහෝදරයාය. ඒ භික්ෂුව අනුපසම්පන්න කාලයෙහි චුන්දො සමණුද්දෙසො යයි ව්‍යවහාර කොට ස්ථවිර කාලයෙහි ද එසේම ව්‍යවහාර කළහ. එහෙයින් චුන්දො සමණුද්දෙසො යයි කියන ලදී. පාවායෙහි වස් විසූ සමාගමේ ආනන්‍ද හිමියන් වෙත පැමිණියේය. කුමක් හෙයින් පැමිණියේද? නාථපුත්ත කළුරිය කල කල්හි දඹදිව මිනිස්සු ඒ ඒ තැන්වල කථා කළහ. නිගණ්ඨනාථපුත්ත එක් ශාසතෘවරයෙක් යයි ප්‍රසිද්ධය. ඔහුගේ කළුරිය කිරීමෙන් පසු ශ්‍රාවකයන් අතර මෙබඳු විවාදයක් ඇතිවිය. ගෞතමයෝ දඹදිව චන්‍ද්‍රයා මෙන් හිරු මෙන් ප්‍රකටය. ශ්‍රාවකයෝද ප්‍රකටය. උන්වහන්සේගේ පිරිනිවීමෙන් ශ්‍රාවකයන් අතර කෙබඳු විවාදයක් වන්නේදැයි කතා කළහ. චුන්‍ද ස්ථවිර තෙමේ ඒ කතා අසා සිතීය. මේ කථා දසබල බුදුන්ට දන්වන්නෙමි. ශාසතෘන් වහන්සේ මෙය මුල්කොට එක් දේසනයක් පවත්වන්නාහ. හේ නික්ම ආනන්‍ද හිමියන් වෙත පැමිණියේය. සාමගාමො - සාමයට කැමති බව උත්සන්න නිසා ඒ ගමට ඒ නම ඇතිවිය. යෙනායසමා ආනන්‍දො - කෙලින්ම භාග්‍යවතුන් වහන්සේ ලඟට නොගොස් ඔහුගේ උපාධ්‍යාය ආනන්‍ද හිමි වෙත පැමිණියේය.

බුද්ධකාලයෙහි වනාහි සැරියුත් හිමිද අනඳ හිමිද ඔවුනොවුන් මමායනය කළහ. සැරියුත් හිමි මා විසින් කළ බුද්ධ උපසථානය කෙරේ යයි අනඳ තෙරුන් මමායනය කෙළේය. අනඳ හිමි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන් ගේ අග්‍ර යයි සැරියුත් තෙරුන් මමායනය කෙළේය. කුලදරුවන් පැවිදි කරවා සැරියුත් තෙරුන් සමීපයේ උපාධ්‍යාය ගැන්වීය. සැරියුත් හිමිද එසේම කෙළේය. මෙසේ එක් එක්කෙනා තමාගේ පාසිවුරු දී පැවිදි කරවා උපාධ්‍යාය ගන්වන ලදී. පහ පහ භික්ෂූහු සීයක් වූහ. ආයුෂමත් ආනන්‍ද හිමි ප්‍රණීත චීවරාදිය ලැබ තෙරුන්ට ම දෙයි. එක් බ්‍රාහ්මණයෙක් සිතීය. බුද්ධ රත්නයට ද

සංඝරත්නයටද පූජා පැහැදිලි වේ. ධර්ම රත්නයට පූජා කෙසේ වේද? හේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එය ඇසීය. භාග්‍යවතුන් වහන්සේ කීහ. ඉදින් බ්‍රාහ්මණය, ධර්ම රත්නයට පුදනු කැමති නම් බහුසසුතයන්ට පූජා කරන්න. සවාමීණි බහුසසුතයන් කියනු මැනවි. භික්‍ෂු සංඝයාගෙන් අසන්න. හේ භික්‍ෂුන් ගෙන් ඇසීය. බමුණා, අනද තෙරුන් යයි කීහ. බමුණා අනද තෙරුන්ට දහසක් අගනා සිවුරක් පූජා කෙලේය. ස්ථවිර එය රැගෙන බුදුන් සමීපයට පැමිණියේය. භගවත්හු ආනන්‍ද කොයින් ලැබුනේදැයි ඇසූ. සවාමීනි එක් බ්‍රාහ්මණයෙක් දුන්නා. මෙය සැරියුත් හිමියන්ට දෙනු කැමත්තෙමි. ආනන්ද දෙන්න. චාරිකාවට ගොස්ය. පැමිණි කල දෙන්න. සවාමීණි ශික්‍ෂාපද පණවන ලදී. කී දවසකින් එන්නේද? දහ දවසකින් පමණ. "අනුජානාමි ආනන්‍ද දසාහ පරමං අතිරෙක චීවරං නිකඛිපිතුං - ආනන්ද, දස දවසක් අතිරේක සිවුරක් තබා ගැනීම අනුදනිමි. ශික්‍ෂාපදය පැණවීය. සැරියුත් හිමි ද එසේම මනාප දෙයක් ලැබූ විට අනඳ හිමියන්ට දෙයි. එහෙයින් තමාගේ කනිටු සහෝදරයා ද තෙරුන්ගේ සද්ධිවිහාරික ලෙස දුන්නේය. මගේ උපාධ්‍යයන් වහන්සේ මහා ප්‍රාඥයෙකි. එහෙයින් මේ කතාව ශාස්තෲන්ට දන්වති. ඉක්බිති බුදුහු ඊට අනුරූප දහමක් දෙසන්නාහ. කථාපාභතං - කතාවේ මුල, මූලයට පාභතං යයි කියනු ලැබේ. යම්සේ කීඃ

මද නුවණැති වුවත් - මුල්හි වියතෙක් වේ නම්
පිඹි ගිනි පුපුර සේ - තමා තුළ දල්වන්නෙය

භගවනතං දසසනාය - භගවතුන් දැකීම සඳහා කිම ඔහු විසින් භගවතුන් නොදක්නා ලද විරීද? නොදක්නා ලද විරී නොවේ. දවල් නවවරෙක රාත්‍රියේ නව වරෙකැයි දවසට අටළොස් වරක් උපසථානයට යයි. දවසට සියවරක් හෝ දහස් වරක් යනු කැමති වූවත් කරුණක් නැතිව නොයයි. එක් ප්‍රශ්නයක් අරගෙනම යයි. උන්වහන්සේ එදින ඒ කතාපුවත රැගෙන යනු කැමතිව කීය. චුන්‍ද මෙය මෙසේ වීද? භගවත්හු අනඳ තෙරුන් දූන්වූවද මේ කතාවේ හිමියා තෙර නොවේ. චුන්ද තෙර හිමියාය. හේ ම ආදි මධ්‍ය අවසාන දන්නේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහු සමග කතා කරන්නේ "එවං හෙතං චුන්‍ද හොති" ති කීහ. එහි අර්ථය මෙය මෙසේ වී ද වැරදි කීම් ආදි ස්වභාවය ඇති ධර්ම විනයෙහි ශ්‍රාවකයෝ දෙකොටසක්ව බිඳී අඬ දබර ආදි කොට මුව සැත්වලින් විදින්නේ වාසය කරති. දැන් එහෙයින් අනිර්යානික

සාසනයෙන්ම නෛර්යානික සාසනය ප්‍රකට වේ. එහෙයින් මුලින් අනෛර්යානික සාසනය දක්වන්නේ චුන්ද, මෙහි ශාස්තෲන් වහන්සේ ද සම්බුද්ධ නොවේ යනාදිය කීහ. එහි වොක්කමම තමහා ධම්මා වත්තති - නිතර නො පුරයි. ඉක්මවා ඉක්මවා අතරින් අතර පවතීය යන අර්ථයයි. **තසස ආවුසො ලාභා** - ඔහුට ඔබගේ මේ ධර්මානුධර්ම ප්‍රතිපත්ති ආදිය ලාභය වේ. **සුලද්ධං** - මනුෂ්‍යත්වය ද හොඳින් ලැබේ. **තථා පටිපජ්ජථ** - මෙසේ පිළිපදින්න. **යථා යථාව තෙ සත්‍ථාරා ධම්මො දෙසිතො** - ඔබට යම් ආකාරයකින් ශාස්තෲන් වහන්සේ විසින් ධර්මය කියන ලදද. යමෙක් සමාදන් කරවති. **යො ච සමාදපෙති** - යම් ඇදුරෙක් සමාදන් කරවති. **යං ච සමාදපෙි** - යම් අන්තෙවාසිකයකු සමාදන් කරවයි. **යො ච සමාදපිතො** - යමෙක් මෙසේ සමාදන් වූයේ අන්තේවාසිකයෙක් ආචාර්යවරයා සමාදන් කරවූ ලෙස පිළිපදී. **සබ්බෙ තෙ** - ඒ තිදෙනා ද මෙහි ආචාර්යවරයා සමාදන් කරවූ නිසා අකුසල් රැස්කරයි. සමාදන් වූ අන්තේවාසිකයා සමාදන් වූ නිසා, පිළිපන්නා පිළිපන් නිසා. එයින් කියන ලදී: "ඒ සියළු දෙනා බොහෝ අකුසල් රැස් කරති". මේ උපායෙන් සියළු වාරවල අර්ථය දත යුතුය.

තවද මෙහි **ඤායං පටිපන්නො** - කරුණු පිළිපන්නේ, **ඤායං ආරාධෙසසති** - කරුණු නිපදවයි. **විරියං ආරභති** - තමාගේ දුකසේ නිපද වූ වීර්ය කරයි. මෙය කියන ලදී: "මහණෙනි වැරදි ලෙස කියන ලද ධර්ම විනයෙහි යමෙක් වීර්ය ආර්ම්භ කරනලද්දේ හේ දුකසේ වාසය කරයි. යමෙක් කම්මැලි වූයේ හේ සුවසේ වාසය කරයි". මෙසේ අනෛර්යානික සාසනය දක්වා දැන් නෛර්යානික සාසනය දක්වන්නේ චුන්ද, මෙහි වනාහි ශාස්තෲන් වහන්සේ ද සම්මා සම්බුද්ධ යනාදිය කීහ. එහි නීය්‍යානික යනු මාර්ගය සඳහා ද ඵලය සඳහා ද පමුණුවයි. **විරියං ආරභති** - තමාගේ සැප සලසන වීර්ය අරඹයි. මෙය කියන ලදී: මහණෙනි, සවාකඛාත ධර්මවිනයෙහි යමෙක් කුසීතවූයේ හේ දුකසේ වාසය කරයි. යමෙක් පටන් ගන්නා ලද වීර්ය ඇත්තේ හේ සුවසේ වාසය කරයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ නෛර්යාතික සාසනයෙහි මනාව පිළිපන් කුලපුත්‍රයාට ප්‍රශංසාව දක්වා නැවත දේශනාව කරන්නේ "චුන්ද, මෙහි ශාස්තෲන් වහන්සේ ද ලොව පහළවිය" යනාදිය කීහ. එහි **අවිඤ්ඤාපිතතතා** - අනවබෝධ බව. **න සංගාහපදකතං** සංගාහ පද නොකරන ලද සියල්ල සංග්‍රහ නොකරන ලද යන අර්ථය වේ. **සඞ්ගාහපදගතනති පි පාඨො.** සඞ්ගාහපද කෙරෙහි නොගිය. එක් සංග්‍රහයක්

නොවූ යන අර්ථයයි. යාවදෙව මනුසෙසහි - දෙව්ලෝ සිට මිනිස් ලොව දක්වා මනාව ප්‍රකාශ කරන ලද අනුතපෙපා හොති - අනුව තැවීම කරන්නේ වේ. ශාස්තෘද ලෝකයෙහි නැත. මෙය ඔවුන්ගේ අනුතාප කරන දර්ශනාර්ථය කියන ලදී. අනණුතපෙපා හොති - ශාසතෲ වෙත පැමිණ ශ්‍රාවකයන් යමකට පැමිණිය යුතු ද ඊට පැමිණ තැවීමක් නොවේ. ථෙරො - සථිර වූයේ. ථෙර කාරක ධර්මයෙහි යුක්ත වූයේ. රතතඤ්ඤූ ආදිය පැහැදිලිය. එතෙහිචෙපි - මේවායින් යට කියන ලදින්. පතතයොගකෙඛම - යෝගයෙන් ක්ෂේම බව. මෙහි යොගකෙඛම නම් රහත් බවයි. එයට පැමිණියා යන අර්ථයයි. අලං සමකඛාතුං සදධමමසස - සම්මුඛව ගන්නා ලද බැවින් උන්වහන්සේ ගේ සද්ධර්මය මනාව කීමට සමර්ථය. බ්‍රහමචාරිනො - බ්‍රහමචරිය වාසයෙහි වසන ආර්ය ශ්‍රාවකයා. කාමභොගිනො - සෝවාන් වූ. ඉදධඤෙචචාති - යනාදිය මහා පරිනිබබාන සූත්‍රයෙහි විස්තර කරන ලදී. ලාභගගයසගගපතත - ලාබයෙන් අගතැන් මෙන්ම යසසින් ද අගතැන් පැමිණි. සනති බො පන මෙ චුන්ද එතරහි ථෙරා භිකඛු සාවකා - සැරියුත් මුගලන් ආදි තෙරවරුන්. භිකඛුනියො - ඛෙමා උප්පලවන්නා තෙරණියෝ. උපාසක සාවකා ගිහි ඔදාත වසනා බ්‍රහම චාරිනො - චිතත ගෘහපති හත්ථක ආලවකාදීහු. කාමභොගිණො - සුළු අනේපිඬු මහ අනේ පිඬු ආදීහු. සබබාකාර සමපනනං - සියළු කරුණුවලින් යුත්. ඉදමෙවතං - මෙහි බඹසර, මෙහිම දහම මනා හේතු නයින් කියනු ලබන්නේ කියන්නෝය. උදදකො සුදං - උදදක (උදුක) සුදං. පසසං න පසසති - දකින්නා නොදකියි. හේ වනාහි මේ ප්‍රශ්නය මහජනයාගෙන් ඇසීය. ඔව්හු නොදනිමු. ඇදුර අපට කියවයි කියන ලද්දේ කීය. මේ ප්‍රශ්නය ගැඹුරුය. ආහාර සපපාය ඇති කල්හි ටිකක් සිතා කීමට හැකිය. එයින් ඔව්හු හාරමසක් මහත් සත්කාර කළ කල්හි ඒ ප්‍රශ්නය කියන්නේ. ''කිසිවක් බලන්නේ නො පෙනේ'' යනාදිය කීය. තථා සාදුනිසසිතතු - පහසුවෙන් නිශ්‍රිත තියුණු. ඉතා සියුම් බුරය (කඩකැත්ත) වනාහි තලය පෙනේ. මුවහත නොපෙනේ යන මේ අර්ථයයි.

සංගමම සමාගමම - සංග්‍රහකොට පැමිණි. අත්‍ථෙන අත්‍ථං ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං - අර්ථය සමග අර්ථය. ව්‍යඤ්ජනය සමග ව්‍යඤ්ජනය. සමානව පමුණුවයි යන අර්ථය වේ. සංගායිතබබ - වාචනා කළයුතු සජඣායනා කළ යුතු. යථයිදං බ්‍රහමචරියං - යම්සේ මේ සියළු සාසන බ්‍රහමචර්යාව. තත්‍ර බො - එහි සඟමැද ඔහුට හෝ

කියන ලද. **අත්ථඤ්චෙව මිච්ඡා ගණ්හාති ව්‍යඤ්ජනානි ච මිච්ඡා රොපෙති ති චත්තාරො සතිපට්ඨානා** - මෙහි අරමුණ සතිපට්ඨාන යයි අර්ථ ගනී. **සතිපට්ඨානාති** - ව්‍යඤ්ජන රෝපනය කරයි. **ඉමස්සනු ඛො ආවුසො අත්ථස්ස** - සතිපට්ඨාන අර්ථ ඇති කල්හිම සතර සතිපට්ඨානයයි. මේ ව්‍යඤ්ජන කුමක් සඳහාද? නැතහොත් සතර සතිපට්ඨානද? මේවා හෝ ව්‍යඤ්ජන ද? මොනවාද? වඩා සුදුසු. මේ අර්ථයේ කුමන ව්‍යාඤ්ජන වඩා යුක්ත වේද? මොනවාද? වඩා සුදුසු. මේ අර්ථයේ කුමන ව්‍යඤ්ජන වඩා යුක්ත වේද? වඩා ඇලුණේද. **ඉමෙසං ව්‍යඤ්ජනානං** - සතර සතිපට්ඨානයයි. ව්‍යඤ්ජන (අකුරු) ඇතිවිට සතිපට්ඨාන වේ. මේ අර්ථය කුමක්ද? නැතහොත් අරමුණු සතිපට්ඨානද? මේ අර්ථයද **ඉමස්ස ඛො ආවුසො අත්ථස්ස** - අරමුණ සතිපට්ඨානයයි මේ අර්ථයේ. **යාචෙව එතානි** - යම් ඒවාද මවිසින් කියනලදී. **යො චෙව එසො** - යමෙක්ද මොහුද මවිසින් කියන ලදී. **සො නෙව උස්සාදෙතබ්බො** - නුඹලා විසින් පළමුව අර්ථයෙහි ද මනා ව්‍යඤ්ජනයෙහි ද සිටිය යුතුයි. හේ වනාහි අයින් නොකළ යුතුය. ඉවත් නොකළ යුතුය. **සඤ්ඤා පෙතබ්බො** - දැන්විය යුතුය. **තස්ස ච අත්ථස්ස** - සතිපට්ඨානයේ අර්ථය ඇති කල්හි. **තෙසඤ්ච ව්‍යඤ්ජනානං** - සතිපට්ඨානය ව්‍යඤ්ජනයන්ගේ **නිසන්තියා** - නිසමන අර්ථය, ධාරණ අර්ථය. මෙතැයින් සියළු වාරවල අර්ථය දත යුතුය. **තාදිසං** - ඔබවැනි **අත්ථුපෙතං** - අර්ථයෙන් යුත් අර්ථය දනවන. **ව්‍යඤ්ජනුපෙතං** - ව්‍යඤ්ජනවලින් යුත්, ව්‍යඤ්ජනයන්ගේ දැනවීම, මේ භික්ෂුවට ප්‍රශංසා කරන්න. මේ භික්ෂුව නුඹලාගේ ශ්‍රාවකයෙක් නොවේ. චුන්ද තමාගේ තත්වයෙහි තැබූහ. දැන් ඊට වඩා දේශනාව කරන්නේ "නවො අහං චුන්ද යනාදිය කීහ. එහි **දිට්ඨධම්මිකා ආසවානාම** - මේ ලෝකයෙහි ප්‍රත්‍ය හේතුවෙන් උපදින ආශ්‍රවයෝ. **සංවරාය** - ඒවා නොපිවිසේ. මෙසේ වැඩී ඇත. **පටිඝාතාය** - සහමුලින් නැසීමට. **සම්පරායිකා ආසවා** - පරලොව කලහ ගෙන වශයෙන් උපදින ආශ්‍රව. **අලං චො තං යාවදෙව සීතස්ස පටිඝාතාය** - එය ඔබගේ සීත වලැක්වීමට සමත්ය. මෙය කියන ලදී. තොපට මවිසින් සිවුර අනුදනිම් ද එය පෙරවා දර්පය හෝ මානය හෝ ඇති කරගෙන වාසය කරන්නයයි අනුමත නො කෙළෙම්. එය පෙරවා සීතාදිය වලක්වා සුවසේ මහණදම් නුවණින් කරන්න යයි අනුමත කෙළෙම්. සිවුර මෙන් පිණ්ඩපාතාදිය ද එසේය. මෙහි අනුපද වර්ණනාව විසුද්ධි මග්ගයෙහි කියනලද නයින් දත යුතුය. **සුඛල්ලිකානු යොගං** - සැපයෙහි ඇලීම් අනුව යෙදීම. සැප

සෙවුමෙහි කැමති යන අර්ථයයි. **සුඛෙති** - සැපවත් කරයි. **පීණෙති** - පිනවයි **අටඨීත ධමම** - නොපවත්නා සවභාවය. **ජිවහා නො අත්ථි** - කැමති කැමති දේ කියති. වෙලාවකට මාර්ගය කියති. වෙලාවක ඵලය, වෙලාවක නිවනයයි අදහසයි. **ජානතා** - සබ්බඤ්ඤුත ඤාණයෙන් දැනීමෙන්. **පසසතා** - පස් ඇස්වලින් බැලීමෙන්. **ගමභීරනෙමො** - ගැඹුරු භූමියට පිවිසුණු. **සුනිඛාතො** - හොඳින් හාරන ලද **එවමෙව ඛො ආවුසො** - මෙසේ ක්ෂීණාශ්‍රවයෝ පැවතීමට වසාගෙන පැතිරීමට, නුසුදුසුය. වසාගෙන පැතිරීමෙහි අචලය, නොසෙල්වේ. එහි සතකු බව දැන ජීවිතයෙන් තොරකිරීම් ආදියෙහි සෝවාන් පුද්ගලාදීහුද නුසුදුසුයහ. **කාමෙ පරිභුඤ්ජිතං** - වසතු කාමයෙහි ද ක්ලේශ කාමයෙහි ද තබාගෙන භුක්ති විඳීමට. **සෙය්‍යථාපි පුබෙබ අගාරික භූතො** - පෙර ගිහිව පරිභෝජනය කරයි. එසේ පරිභෝජනයට නොසුදුසුය. ගිහි ගේ වසන්නාවූ සෝවාන් ආදීහුද යාවජීව ගිහිව සිටිති. ක්ෂීණාශ්‍රවයා රහත් වී මිනිසෙක් නම් පිරිනිවන් පායි හෝ පැවිදි වෙයි. චතුමමහා රාජිකාදියෙහි කාමාවචර දෙවියන් අතර මොහොතක්වත් නොසිටිති. කුමක් හෙයින්ද? ඔවුන්ගේ වශයෙන් මේ ප්‍රශ්නය ආවේය. හිනන දෝසය බැවින් භික්ෂුභාවය දත යුතුය.

**අතීරකං** - **අතීරං** - අසීමිත, මහත්. **නොවෙඛො අනාගතං** - අනාගතය වනාහි මාර්ගය අරබයා. එසේ පෙන්විය නොහැක. අතීතයම ශ්‍රමණ ගෞතම දනී යයි හැඟේ. අනාගතය නොවේ. එසේ ඔහුට අතීතයෙහි මාර්ග සය, සියක් ජාති සිහි කිරීම් පෙනේ. අනාගතයෙහි බොහෝ සිහිකිරීම් නොපෙනේ. මේ අර්ථය සිතමින් මෙසේ කියන්නාහ. **තයිදං කිංසු** - අනාගතයෙහි නොදන්නේ කිම? **කථංසු** - කුමන කරුණකින්ද. නොදන්නේද නැතහොත් සිහි නොකරන්නේද. සිහිනොකිරීමට කැමැත්තේ සිහි නොකෙරේද. **අඤ්ඤවිහිතකෙන ඤාණදසසනෙන** - ප්‍රත්‍යක්ෂ මෙන් කොට දර්ශන සමර්ථභාවයෙන් දර්ශනය වූ ඤාණයෙන් අන් තැනක යෙදුණු ඤාණයෙන්. අනිකක් අරබයා පවතින. අන් තැනක යෙදුණු අනිකක් අරබයා පවතින ඤාණ දසසනය සංග්‍රහ කළ යුතුය. පෙන්විය යුතුයයි හඟිති. ඔවුහු ඇවිදින විටද සිටින විටද නිදන විටද ඇහැරගෙන සිටින විටද නිතර, නිරන්තරයෙන් ඤාණදසසනය වැටහේ යයි සිතති. එබඳු ඤාණයක් නම් නැත. එහෙයින් එබඳුම අව්‍යතත බාලයන් සිතතියි දත යුතුය.

**සතානුසාරී** - පූර්වනිවාස අනුසසතිය යුක්තව. **යාවතකං කංඛති** - යම්තාක් දැනීමට කැමතිද ඒතාක් දැනගන්නෙමියි ඤාණය යවයි. ඉක්බිති ඔහුගේ දුබල පත්‍ර සමූහයේ පසාකර ගෙන යන නාරස්සනය (යකඩ ඉන්න) මෙන් නොවලක්වන ලද ඤාණය යයි. එයින් යම්තාක් කැමති වේ ද ඒතාක් සිහි කරයි. **බොධිජං** - බෝධිමූලයේ හටගත්. **ඤාණං උප්පජ්ජති** - සිව් මග නුවණ උපදී. **අයමන්තිමා ජාති** - මේ අන්තිම ජාතියයි. **නත්‍ථිදානි පුනබ්භවො** - අන්‍ය ඤාණයක් උපදී. **අනත්‍ථසංහිතං** - මෙලොව හෝ පරලොව අර්ථය නිශ්‍රිත නොවූ. **නතං තථාගතො ව්‍යාකරොති** - එය භාරතයේ සීතාහරණ යුද්ධ සමාන අනිර්යානික කථා තථාගතයෝ නොකියති. **භූතං තච්ඡං අනත්‍ථසංහිතං** - රාජකථා ආදි තිරිසන් කථා. **කාලඤ්ඤූ තථාගතො හොති** - කාලය දනී. සහේතුක සකාරණව යුක්ත ප්‍රයුක්ත කාලයෙහි ම කියයි. **තස්මා තථාගතොති වුච්චති** - එහෙයින් යම්සේ කිවයුතුද එසේ කියන හෙයින් තථාගත යයි කියනු ලැබේ යන අර්ථයි. **දිට්ඨං** - රූපායතනය. **සුතං** - ශබ්දායතනය. **මුතං** - පැමිණ ගතයුතු හෙයින් ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන. **විඤ්ඤාණං** සැපදුක් ආදි ධම්මායතනය. **පත්තං** - සොයා බලා හෝ නොබලා හෝ පැමිණි. **පරියෙසිතං** - පැමිණ හෝ නොපැමිණ සොයාබලා. **අනුවිචරිතං මනසා** - සිතින් සැරිසරන ලද. මෙයින් මෙය දක්වයි. යම් අප්‍රමාණ ලෝකධාතුවල මේ සදෙව් ලෝකයේ මෙය දක්වයි. යම් අප්‍රමාණ ලෝකධාතුවල මේ සදෙව් ලෝකයේ නිල් කහ ආදි රූප අරමුණු චක්ඛුද්වාරයෙහි ආපාථයට පැමිණේ. මේ සත්වයා, මේ ක්‍ෂණයෙහි මෙනම් රූප අරමුණ දැක සතුට හෝ අසතුට හෝ මධ්‍යස්ථ හෝ ඇති වී යයි ඒ සියල්ල තථාගතයන් වහන්සේ මෙසේ අවබෝධ කරති. යම්සේ මේ අප්‍රමාණ ලෝකධාතුවල මේ සදෙව් ලොවේ බෙර ශබ්දය මුතිංග ශබ්දය ආදි ශබ්ද අරමුණ සෝතද්වාරයෙහි ආපාථයට එයි. මුල් ගඳ පොතු ගඳ ආදි ගඳ අරමුණු ඝාණද්වාරයෙහි ආපාථයට එයි. මුල්ගඳ පොතු ගඳ ආදි ගඳ අරමුණු ජිව්හා ද්වාරයෙහි ආපාථයට එයි. කර්කශ මෘදු ආදි පඨවි ධාතු තේජො ධාතු වායෝ ධාතු භේද ඇති පොට්ඨබ්බ අරමුණු කායද්වාරයෙහි ආපාථයට එයි. මේ සත්වයා මේ ක්‍ෂණයෙහි වෙනම් ස්පර්ශ අරමුණ ස්පර්ශ කොට සතුටු හෝ අසතුටු හෝ මැදහත් හෝ හටගත්තේය. ඒ සියල්ල තථාගතයන් හෝ මෙසේ අවබෝධය වේ. එසේ මේ අප්‍රමාණ ලෝකධාතුවල මේ සදෙව් ලොවේ සැපදුක් ආදි ප්‍රභේද වූ ධර්ම අරමුණු මනෝද්වාරයෙහි ආපාථයට එයි. මෙ සත්වයා

මේ ක්‍ෂණයෙහි මෙනම් දම් අරමුණ දැන සතුට හෝ අසතුට හෝ මැදහත් හෝ ඇති වී තථාගතයෝ අවබෝධ කරති. චුන්ද, මේ සත්‍වයින් ගේ යම් දුටු ඇසූ පහසු ඥාණ වේද එහි තථාගතයන් විසින් නුදුටු නොඇසූ නොපැහැසූ නොදත් දෙයක් නැත. මේ මහාජනයාගේ සොයාබලා පැමිණියක් ඇද්ද නොපැමිණියක් ඇද්ද සොයා නොබලා පැමිණියක් ඇද්ද නොපැමිණියක් ඇද්ද ඒ සියල් තථාගතයන්ගේ නො පැමිණියක් නම් නැත. ඥාණයෙන් අවබෝධ නොකළ දෙයක් නැති හෙයින් තථාගත යයි කියනු ලැබේ. යම්සේ හෝ ලෝකයා විසින් යම් යනු ලැබීමක් වේද ඊට එසේම ගිය බැවින් තථාගත යයි කියනු ලැබේ. පෙළෙහි වනාහි අභිසම්බුද්ධ යයි කියන ලදි. එය ගත ශබ්දයෙන් ඒකාර්ථය. මේ නයින් සියළු වාරවල තථාගතයයි නිගමනයේ අර්ථය දත යුතුය. එහි යුක්තිය බ්‍රහමජාල සූත්‍රයෙහි තථාගත ශබ්ද විස්තරයෙහි කියන ලද්දේමය. තමන් වහන්සේගේ අසමාන බව, අනුත්තර බව, ධම්මරාජත්‍වය කියා දැන් වෙන් වෙන් වූ ශ්‍රමණ බ්‍රාහමණයින් ගේ ලබ්ධිවල මවිසින් නොදක්නා ලද්දක් නොදන්නා ලද්දක් නම් නැතැයි සියල්ල මගේ ඥාණයට ඇතුළත්ව පෙරළේ යයි සිංහනාදය නාද කරන්නේ "ඨානං ඛො පනෙතං චුන්ද" යනාදිය කීහ.

එහි **තථාගතො** - සත්‍වයා. **න තෙන ආවුසො අත්ථ සංහිතං** - මෙහි මෙලොව පරලොව අර්ථ සංහිත (යුක්ත) නොවේ. **න ධම්ම සංහිතං** - ධර්ම යුක්ත නොවේ. නව ලෝකෝත්තර ධර්ම නිශ්‍රිත නොවේ. **න ආදි බ්‍රහමචරියකං** - සික්ෂාත්‍රය සංගෘහිත සක සත්‍ව බ්‍රහමචර්යා වේ ආදිභූත නොවේ. "මේ දුක යයි ආදියෙහි" තෘෂණාව හැර අවශේෂ ත්‍රෛ භූමික ධර්ම මේ දුක යයි විස්තර කරන ලදී. ඒ දුකේ ම ප්‍රභවය මව තෘෂණාව දුක්ඛ සමුදයයි කියන ලදී. දුක දැනගන්නේ සමුදය දුරු කරන්නේ නිරෝධය අවබෝධ කරන ආර්ය මාර්ගය දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාවයයි කියන ලදී. ඇවැත්නි මෙය අර්ථ යුක්තය. යනාදියෙහි මෙය මෙලොව පරලොව අර්ථ සන්නිශ්‍රිතව නව ලෝකෝත්තර ධර්ම නිශ්‍රිතව සියළු සාසන බ්‍රහමචර්යාවට ආද පටන් ගැන්ම, පූර්වංගම වූ යන අර්ථයි. දැන් මවිසින් නො කියන ලද එය නොදැන්මෙන් නොකියන ලදැයි මෙසේ නොසිතන්න. දැන ගෙනම මම මෙසේ මෙය කීමෙන් අර්ථයක් නැතැයි නොකීවේය. යමක් වනාහි කිය යුතු වූයේ නම් එය මවිසින් කියන ලද්දේමයි සිංහ නාද කරන්නේ නැවත "යෙපි තෙ චුන්ද"

යනාදිය කීහ. එහි දිට්ඨියම දිට්ඨිනිස්සයො - දිට්ඨිනිස්සිතතා දිට්ඨිගතිකයා යයි අර්ථ වේ. **ඉදමෙව සච්චං** - මෙයම දර්ශන සත්‍ය වේ. **මොඝමඤ්ඤං** - අන්‍යයන්ගේ වචන හිස්ය. **අසයකරො** - තමා නොකරන ලද. **තත්‍ර** - සෙසු ශ්‍රමණ බ්‍රාහමණයන් කෙරෙහි. **අත්ථිබො ඉදං ආවුසො වුච්චති** - ඇවැත්නි, ඔබ විසින් ආත්මය/සාසවතය ලෝකය සාස්වතයයි කියන ලදී. මෙය ඇත්ද නැතහොත් නැද්ද මෙසේ සවාමීනි අසයි යන අර්ථයයි. **යඤ්ච බො තෙ එවමාහංසු** - ඔබ මෙයම සත්‍යයයි අනිත්වා හිස්යයි කියති. එය ඔවුන්ට අනු නොදනිමි. **පඤ්ඤාවනතියා** - දෘෂ්ටි ප්‍රඥාවන්තයා. **සමසමං** - ඤාණයෙන් සම. **යදිදං අධි පඤ්ඤතති** - යමක් අධිපඤ්ඤතති නම් වේ. මෙහි මම බොහෝ උතතරීතර වේ. මා හා සමයෙක් නැත. මෙහි පඤ්ඤතතියා යයි යමක් අධිපඤ්ඤතති නම් වේ. මෙහි මම බොහෝ උත්තරීතර වේ. මා හා සමයෙක් නැත. මෙහි පඤ්ඤත්තියා යයි යමක් කියන ලදද යමක් අධිපඤ්ඤතති යයි කියන ලදද මේ දෙකම අර්ථ වශයෙන් එකය. භේද වශයෙන් පඤ්ඤත්ති අධිපඤ්ඤත්ති දෙකක් වේ. එහි **පඤ්ඤතති** - නම් දෘෂ්ටි ප්‍රඥප්තිය. **අධිපඤ්ඤතති** - ඛන්ධ පඤ්ඤතතිය, ධාතු පඤ්ඤතති, ආයතන පඤ්ඤතති, ඉන්ද්‍රිය පඤ්ඤතති, සච්ච පඤ්ඤතති, පුද්ගල පඤ්ඤතති යයි සයක් මෙසේ කියන ලදී. මෙහි වනාහි ''පඤ්ඤතතියා'' යයි පඤ්ඤතති මෙන්ම අධිපඤ්ඤතති ද අදහස් කෙරේ. ''අධිපඤ්ඤතතියා'' යයි මෙහිද භාග්‍යවතුන් වහන්සේ පඤ්ඤතතියද අනුත්තරය, අධිපඤ්ඤතතියද අනුත්තර එයින් කීහ: එහි මම ම යම් මේ අධිපඤ්ඤතති බොහෝය. **පහානාය** - දුරු කිරීම සඳහා **සමතික්කමාය** - එහිම පරියාය වචනයකි. **දෙසිතා** - කියන ලදී. **පඤ්ඤතතා** - තබන ලදී. සතිපට්ඨාන භාවනාවෙන් ඝන විනිබ්භාගය (වෙන්කර) කොට සියළු ධර්මවල යථාවත් වූ දක්වන ලද දේවල සුද්ධ සංඛාර පිඬක් මෙය සත්වයා නො ලබන්නේ යයි තීරණයෙන් සියළු දෘෂ්ටි නිශ්‍රය ප්‍රහාන වේ. එයින් කියන ලදී. ''දෘෂ්ටි නිශ්‍රය ප්‍රහානය පිණිස මෙසේ මවිසින් සතර සතිපට්ඨාන දේශනා කරන ලදයි පනවන ලදී. සෙසු සියළු තැන අරුත් පැහැදිලිය.

**පාසාදික සූත්‍ර වර්ණනාව නිමි.**

# 3 - 30

## ලක්ඛණ සූත්‍ර වර්ණනාව

ලකඛණ සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. එහි උතතාන නොවන පද වර්ණනාවයි. **ද්වතතිංසිමානි** - මේ දෙතිස. **මහා පුරිස ලකඛණානි** - මහා පුරිස ව්‍යඤ්ජන වේ. මහපුරිස ලකුණය. මහ පුරිස් නිමිතිය. මේ තෙමේ මහා පුරුෂයෙකැයි හඳුනා ගන්න කරුණුය. "යම් දේවලින් යුක්තවන්නේ මහා පුරුෂයාගේ" යයි ආදිය මහා පදාන සූත්‍රයෙහි විස්තර කළ නයින්ම දත යුතුය. බාහිර ඍෂීහු ද මේවා දරති. මේ කර්ම කළ බැවින් මේ ලක්‍ෂණ ලබති යි නොදනිත් ද. කුමක් හෙයින් කීවේද? අට්ඨුප්පත්ති වශයෙනි. අනුරූපහෙයිනි. මේ සූත්‍රය වනාහි අට්ඨුප්පත්තිකය. එය වනාහි අට්ඨුප්පත්ති කොහි පිහිටියේද? ඇතුළුගම මිනිසුන් අතරය. එකල වනාහි සැවැත් නුවර වාසීහු තම තමාගේ ගෙවල දොරකඩ නගර සාලාවල ද රැස් වී කථා සලලාපයෙනි (සමමන්ත්‍රණවල) යෙදුණාහ. භාග්‍යවතුන් වහන්සේගේ අසූ අනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා දෙතිස් උතුම් ලකුණුවලින් උන්වහන්සේ ගේ ශරීරය පිපීගිය මලින් යුත් පාරිජාත ගස මෙනි. පිපුණු නෙළුම් වනයක් මෙනි, නානා විචිත්‍ර රුවනින් පිරීගිය රන් තොරණක් මෙනි. තරු රසින් බබළන ගුවන් තලය සේ ඔබ මොබ දුවන සැලෙන සවණක් රස් විසුරු වන්නේ අතිශයින් බබළයි. භාග්‍යවතුන් වහන්සේ ද මෙනම් කර්මයෙන් මේ ලක්‍ෂණ පහළ වී යයි කියන ලද්දේ නොවේ. කැඳ කෙනෙස්සක් පමණ (ලොකු හැන්ද) ද බත් සරළුවක් (හැන්ද) පමණ ද පෙර දුන් හේතුවෙන් ම මේවා පහළ වී යයි භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදී. යම් හෙයකින් මේ ලකුණු පහළවීමට භගවත්හු විසින් කර්ම කෙළේද? ඉක්බිති ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් ඇතුළුගම හැසිරෙන්නේ මේ කථා සලලාපය අසා කරන ලද බත් කිස ඇත්තේ විහාරයට පැමිණ වතාවත් කොට බුදුන් වැඳ සිටියෝ, සවාමීනි මා විසින් ඇතුළුගමදී එක් කතාවක් අසන ලදයි කී. ඉක්බිති භාග්‍යවතුන් ආනන්ද, ඔබ ඇසූ කතාව කුමක්දැයි පුළුවුත් කල්හි සියල්ල දැන්වීය. ශාසතෲහු තෙරුන් ගේ වචනය අසා පිරිවරා සිටි භික්‍ෂූන් අමතා "මහණෙනි, මහා පුරුෂයාගේ මේ දෙතිස් ලකුණු" යයි පිළිවෙළින් ලක්‍ෂණ දක්වා කර්මයෙන් නිපදවන දේ දැක්වීමට මෙසේ කීහ. "පුරිමං ජාති" යනාදියෙහි පෙර විසූ සකන්ධ වශයෙන් **ජාති** - යයි කියන ලදී. එසේම වීම් වශයෙන් **භවො** - යයි කියන ලදී.

විසූ හෙයින් බැඳුණු හෙයින් හෝ නිකෙත - වේ. පද තුනම පෙර විසූ ස්කන්ධ සන්තානයෙහි සිටියේය යන අර්ථය වේ.

දැන් යම්හෙයකින් ඒ ස්කන්ධ සන්තානය දෙව්ලෝවලද පවති. ලක්ෂණ නිදපවීමට සමත් කුසලකර්ම වනාහි එහි පහසු නොවේ. මිනිස් වීමෙන්ම පහසු වේ. එහෙයින් යථාර්ථ වශයෙන් එයින් යම් කර්මයක් කරන ලදද එය දක්වන්නේ ''පෙර මිනිස් වූයේ'' යයි කීහ. මෙය සුදුසු නොවේද? ඇත් අස් මුව මහිස වානරාදි ජීවිතවලදී ද මහා පුරුෂයා පාරමී පිරුවේමය. එබඳු ආත්මභාවවල සිට කරන ලද කර්ම පහසුවෙන් දැක්වීමට නොහැකිය. මනුෂ්‍යභාවයෙහි සිට කරන ලද කර්ම පහසුවෙන් දැක්විය හැකිය. එහෙයින් ''පුබ්බෙ මනුස්සභූතො සමානො'' යයි කීහ. දළ්හ සමාදානො - ස්ථිර ග්‍රහණය. කුසලෙසු ධම්මෙසු - දස කුසල කර්ම පථවල. අවත්‍ථිත සමාදානො - නිසල ගැනීම. නොනැවතී ගැනීම. මහා සත්‍වයාගේ අකුසල කර්මයෙන් ගිනි ඇති වී කුකුළු පිහාට්ටක් මෙන් සිත හැකිලේ. කුසලට පැමිණ වියනක් මෙන් පැතිරේ. එහෙයින් දළහ සමාදානය වේ. කුසල සමාදානය බිඳීමට ශ්‍රමණ බ්‍රාහමණ දෙවි මර බ්‍රහම කිසිවෙකුට හැකි නොවේ. එහි මේ වස්තුව දැක්වේ. මහා පුරුෂය පෙර ලෙහෙන යෝනියෙහි ඉපදිණි, ඉක්බිති වැසිවැස මහා සැඩ පහරක් පැමිණ ලේන් කුඩුව ගහගෙන ගොස් මහ සමුදුරට පත්විය. මහා පුරුෂ පුතුන් හැරගන්නෙමියි නගුට තෙම තෙමා මුහුදින් දිය පිටත දැමීය. සත්වන දිනයෙහි ශක්‍රයා දැන එහි අවුත් කුමක් කරන්නේ දැයි ඇසීය. හේ ඔහුට කීවේය. ශක්‍රයා මහ සමුදුරින් දිය හැරදැමීම නොහැකි බව කීය. බෝධිසත්‍වයා තා වැනි කුසීතයකු සමග කතා කිරීමටද නොවටී. මෙහි නොසිටවයි පලවා හැරීය. ශක්‍රයා උතුම් පුරුෂයා විසින් ගන්නාලද ගැනීම අත්හැරවීමට නොහැකි යයි සතුටු ව ඔහුගේ පුතුන් ගෙනවුත් දුන්නේය. මහාජනක කාලයෙහි ද මහසමුදුර තරණය කරන්නේ, කුමක් හෙයින් මහසමුදුර ගැඹුරද පළලද දක්වා කවදා නම් තරණය කරන්නේදැයි විචාළේ කීය. මගේ අදහස මේ මහා සමුද්‍රය මෙනි ඒ අදහස අනුව මේ මහා සමුද්‍රය කුඩා ඇලක් මෙන් හැඟේ. ඔබටම මා දැකිය හැකි වන්නේය. සමුද්‍රය තරණය කොට මුහුදෙන් එතෙර ධනය ගෙන කුල සත්තක රටෙහි රාජ්‍යය ගෙන දන්දෙන්නා වූ මා, උතුම් පුරුෂයා ගන්නා ලද ගැනීම අත්හැරවීමට නොහැකි යයි දෙවියා බෝසතුන් වැළඳගෙන උයනෙහි සැතපවීය. හේ සේසත් ඔසවා දිනපතා පන් ලක්ෂයක් පරිත්‍යාග කොට පසු කාලයෙහි පැවිදිවීය. මෙසේ මහා සත්‍වයාගේ කුසල

සමාදානය වැලැක්වීමට කිසිවෙකුට නොහැක. දන් කුසල දහම්හි වෙනස් නොවන සමාදානය දැක්වීමට ''කායෙ සුචරිතෙ'' යනාදිය කීහ. දාන සංවිභාගෙ - මෙහි දානයම දීම් වශයෙන් දානයයි. සංවිධාන කිරීම් වශයෙන් සංවිභාගො - සීලසමාදාන පන්සිල් දසසිල් සිවපිරිසිදු සිල් සම්පූර්ණ කරන කාලයෙහි. උපොසථූපවාසෙ - තුදුස් ආකාර භේද වූ උපෝසථයේ උපවසන කාලයෙහි මත්තෙයාතා - මවට කළයුතු වතාවත්. සෙසු පදවලද මෙම නයයි. අඤ්ඤතරඤ්ඤතරෙසු - මෙබඳු වූ අනිත් ඒවායේ ද. අධිකුසලෙසු - මෙහි කුසල අදිකුසලා ඇත. කුසල් අකුසල් සියල්ල කාමාවචරය. අරූපාවචර අධිකුසලය. ඒ සියල්ල කුසල් වේ. සාවක පාරමී ඤාණයට හේතුවූයේ කුසල් සහ අධිකුසල්ය. ඒවා කුසල් නම් වේ. පසේ බුදු බව ලැබීමට හේතුවූයේ අධිකුසල් නම් වේ. ඒවාද කුසල් වේ. සබ්බඤ්ඤුත ඤාණයට හේතු වූ කුසල් මෙහි අධිකුසල් නම් වේ. ඒ අධිකුසල්වල සථිර සමාදානය විය. අවත්‍ථිත සමාදානය විය. කතත්තා උපචිතත්තා - මෙහි එක්වරක් කෙළේද ''කත'' ම වේ. නිතර කිරීමෙන්. වනාහි උපචිත වේ. උස්සන්නත්තා - පිණ්ඩිකතයා පිඬු කිරීම රාසි කිරිම කරම් උස්සන්නත්ත යයි කියනු ලැබේ. එහෙයින් උස්සන්නත්තයයි කියන්නේ මා කළ කර්මයට සක්වල අතිසම්බන්ධ භවාග්‍රය ඉතා පහළය. මෙසේ මාගේ උත්සන්න කර්ම දක්වයි. විපුලත්තා - අප්‍රමාණ භාවය. මෙයින් අනන්ත අප්‍රමාණ මා කළ කර්ම යයි දක්වයි. අදිගණ්හාති - අභිභවති. අන්‍ය දේවතාවන්ට වඩා අතිරේකව ලබයි යන අර්ථයයි. පටිලභති - ලබයි. ''සබ්බාවන්තෙහි පාදතලෙහි'' මෙය සමපාද පොළොවෙහි තබයි. මෙහි විස්තර වචනඃ එහි සබ්බාවන්තෙහි - සියළු පෙදෙස් සමානව. සියළු පෙදෙස් පා තැබූ විට එකවර ස්පර්ශ වේ. තථාගතයෝ නොයෙක් සිය ගණන් පුරුෂ නරක පාගම්යි පා ඔසවන කල වලගොඩැලි සම වී සමතලා පොලොව වන්නේය. ඉතාදුර අඩිය තබම්යි පාඔසවන විට මේරු පර්වතය පවා නැමී පා පිළිගත්තේය. එසේ යමා මහ පෙළහර පා යුගන්ධර පර්වතයට අඩිය තබම්යි පා ඔසවනවිට පර්වතය නැමී පා සමීපයට පැමිණියේය. එයට අඩිය තබා දෙවන පාදය තව්තිසා දෙව්ලොව තැබීය. පාදයේ චක්‍ර ලක්ෂණ තිසා පා තබන තැන් විෂමව තිබීමට නොහැකිය. කනු කටු ගල්බොරළු කැට මල මූ කෙල සොටු පාතැබිමට කලින්ම ඉවත් වේ. සිල්තෙදින් පින් තෙදින් දම් තෙදින් දස පාරමී ආනුභාවයෙන් මේ මහ පොළොව මනාව මෘදු මල්ගොන්නක් වේ. සාගර පරියන්තං - සාගර සීමා කොට. උන් වහන්සේ රාජ්‍ය කරන විට ගසක් හෝ කන්දක් හෝ ගඟක් හෝ සීමා

නොවේ. එනිසා සාගරපරියන්තං'' කියන ලදී. අඛිලමනිමිත්තමකණ්ටක - නිවෙච්චාරං සොරා වනාහි කර්කශ ස්පර්ශයෙන් ඛිලා උපද්‍රව හේතුවෙන් නිමිත්තා, විදීම් හේතුවෙන් කණ්ටක යයි කියනු ලැබේ.

ඉද්ධං - සමෘධිය. ඵීතං - සියළු සම්පත්තියෙන්, පිරී ගියාවූ. ඛෙමං - බියනැති. සිවං - නිරුපද්‍රවව. නිරබ්බුදං - අර්බුද රහිත. සමූහ සමූහ වී හැසිරෙන සොරුන්ගෙන් (විරෝදීන්ගෙන්) විරහිත. අවික්ඛම්භියො - අවික්ඛම්හනිය -කිසි තැනක් සෙලවීමට කිසිවෙකුට නොහැකි. පච්චත්ථිකෙන - ප්‍රතිපක්ෂ කැමත්තෙන්. පච්චමිත්තෙන - ප්‍රතිවිරුද්ධ අය විසින්. අමිත්‍රයින් විසින්. දෙකම සතුරු සමාන වචනය. අබ්භන්තරෙහි - ඇතුළතින් නැගිරාගාදීන් විසින්, බාහිරෙහි - ශ්‍රමණාදීන්. එසේම එය දෙව්දත් කෝකාලික ආදි ශ්‍රමණයන්ද සොණදණ්ඩ කූටදන්ත ආදි බ්‍රාහ්මණයෝද ශක්‍රයා සමාන දෙවියෝද සත්වසක් ලුහුබැන්ද මාරයාද බකාදි බ්‍රාහ්මණයෝද සෙලවීමට නොහැකි වූහ. මෙපමණකින් භාග්‍යවතුන් කර්මය ද කර්මය සමාන ලක්‍ෂණ ද ලක්‍ෂණානි සංසද කියන ලදී. කර්මය නම් සාරසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට වැඩි දැඩි වීර්යයෙන් කරනලද කර්මය. කම්ම සරික්ඛක නම් දැඩිකොට කරන ලද බැවින් දෙව්ලෝ සහිත ලෝකයා දූනගනිත්වායි මනාව පිහිටි පාදය මහා පුරිස ලක්‍ෂණයකි. ලක්‍ෂණ මනාව පිහිටි පා ඇති බව. ලක්‍ෂණ ආනිසංස නම් සතුරන් විසින් කම්පා කළ නොහැකි බව. තත්‍ථෙතං වුච්චති - එහි කීකල්හි, කර්මාදි භෙදයෙහි මෙයද කියනු ලැබේ. ගාථා බැඳුම් සඳහා කියන ලදී. මේ ගාථා වනාහි පෝරාණක තෙරවරු අනඳ තෙරුන් වෙනුවෙන් තබා වර්ණනාව කියා ගියේය. පසු කාලයේ තෙරවරු එක පදික අර්ථ උද්ධකරණය කෙළේ යයි කීහ. එහි සච්චෙ - වචී සත්‍යයෙහි ධම්මෙ - දසකුසල කම්ම පථ ධර්මයෙහි. දමෙ - ඉන්ද්‍රිය දමනයෙහි සංයමෙ - සිලසංයමයෙහි. සොචෙය්‍ය සීලාලයුපොසථෙච - මෙහි කයේ පිරිසිදුබව ආදි තුන් ආකාරය පිරිසිදුබව. සීලයම සම්මත්තචරි - උපෝසථය කර්ම උපෝසථෝ. අහිංසායා - අවිහිංසාවය. සමමත්තචරි - සියළු හැසිරීම්. ආනුභී - අනුභාවය. වෙය්‍යංජනිකා - ලක්‍ෂණ කියන්නෝ, පරාභිභූ - අන්‍යයන් අභිභවනය කිරීමට සමත් සත්තුහී - සතුරන් විසින් කම්පා කළ නොහැකි. න සො ගච්ඡති ජාතුක්කම්භනං - හෙතෙම ඒකාන්තයෙන් ම අග්‍ර පුද්ගලයෙකි. මැඩ පැවැත්විය යුතු බවට නොයයි. ඒසාහි තස්ස ධම්මතා - ඔහුගේ මේ ධර්මතාය. මේ ස්වභාවය වේ. උබ්බිග උත්තාසභයං - උබ්බෙ භයද උත්තාස භයද එහි සොරුන්ගෙන්

හෝ රජුගෙන් හෝ සතුරන්ගෙන් හෝ පැහැරගැනීම් බන්ධනාදිය නිසා භය උබ්බේගො - නම් වේ. චණ්ඩ හස්ති අශ්ව ආදින්ගෙන් හෝ සර්ප යක්ෂ ආදින්ගෙන් හෝ හේතුවෙන් රෝමෝද්ගමනාකාර භය උත්‍රාස භය - නම්වේ. ඒ සියල්ල නොපැමිණියේ සමනය වේ. සංවිධාතා - සංවිධිත වූ කෙසේද? වනයෙහි සැක සහිත තැන්වල දානශාලා කරවා එහි පැමිණියවුන් වළඳා මනුෂ්‍යයින්ට දී (අතිවාහෙති) ගෙනවුත් දෙයි. ඒ ස්ථානය පිවිසීමට නොහැකි වන්නේ මිනිසුන් යවා පිවිසෙයි. නගරාදියෙහි ද ඒ ඒ තැන්වල ආරක්ෂාව තබයි. මෙසේ සංවිදහති. සපරිවාරඤ්ච දානං අදාසි - ආහාර පානාදි දසවිධ දානවසතු. එහි අන්නං - කැඳ බත්. එය දෙන්නේ නුවර දොර සිට දුන්නේය. ඉක්බිති ඇතුළු නිවෙස්නෙහි ගෙනයන්නා පැමිණ තැන. ලද පස්මල් විසුරුවා ආසන පනවා වියන් බැඳ සුවඳ දුම් ආදියෙන් සත්කාර කොට භික්ෂු සංඝයා වඩා හිඳුවා කැඳ පිළිගැන්වීය. කැඳ දෙන්නේද ව්‍යඤ්ජන සහිතව දුන්නේය. කැඳ වළඳා අවසානයෙහි පා සෝදවා තෙල් ගල්වා නානා ප්‍රකාර වූ අප්‍රමාණ කැවිලි දී අවසානයෙහි නොයෙක් සුප නොයෙක් ව්‍යඤ්ජන ප්‍රණීත භෝජන දුන්නේය. පාන දෙන්නේ අඹ පැන් ආදි අටාකාර පැන් දුන්නේය. වසත්‍ර දෙන්නේ පිරිසිදු වසත්‍රම දුන්නේය. එකපට දෙපට ආදි ප්‍රමාණවත් වත් දී සූචි දුන්නේය. නූල් දුන්නේය. සූචිකර්ම කරන තැන භික්ෂූන්ගේ ආසනවල කැඳබත් පා ගල්වන පිටගල්වන දේ රජත පණ්ඩුපලාස රඳ දොණි (ඔරු) යටත් පිරිසෙයින් සිවුරු පඬු පොවන කප්පිය කාරකයකු ද දුන්නේය. යානං - උපාහන (සෙරෙප්පු) උපාහන දෙන්නේ උපාහන ථවික උපාහන දණ්ඩාදි එහි පිරිවරද දුන්නේය.

මාලා දෙන්නේද සුද්ධමාලා පමණක් නුදුන්නේය. ඉක්බිති ඒවා සුවඳින් මිශ්‍රකර අඩුතරමින් එහි සතරක් පිරිවර කොට දුන්නේය. බෝධිය චෛතිය ආසන පොත් ආදි පූජාකිරීම සඳහා මෙන්ම චෛතිය සර පූජාව සඳහා ද සුවඳ දෙන්නේද සුද්ධ සුවඳ පමණක් නොව සුවඳ සුණු කරන නිසදා (ගලද) ද තබන භාජනය සමග අඩුතරමින් මනෝසීල චීන පිටි (පවුඩර්) ආදි විලේපන භාජනය සමග යටත් පිරිසෙයින් පිරිවර හයක් කොට දුන්නේය. සෙය්‍ය - ඇඳ පුටු. ඒවා දෙන්නේද සුද්ධ ඇඳ පුටු පමණක් නුදුන්නේය. කොජ කම්බල ද අතුරන ඇඳ ඇතිරිලි සමග අඩු තරමින් ඇඳ මකුණන් සුද්ධකරන දණ්ඩආදි පිරිවර හතක් සමග දුන්නේය. ආවසථ දෙන්නේ ගෙය පමණක් නුදුන්නේය. ඉක්බිති මාලාකර්ම ලතාකර්ම යුක්ත පනවන ලද ඇඳපුටු ආදිය කරවා අඩුතරමින් පිරිවර

අටක් සමග දුන්නේය. පදීපෙය්‍යං පහන් තෙල්. එය දෙන්නේ චෛතියංගන බෝධියංගන ධම්මසවන ගෙය (බණමඩුව) ලැගුම් ගෙය පොත් කියවන තැන මෙයින් පහන් දල්වන්නැයි සුද්ධ තෙල් පමණක් දුන්නේය. වැටි දුම්කබල තෙල් භාජනාදිය සමග පිරිවර නවයක් කොට දුන්නේය. **සුවිභත්තන්තරානි** - සුවිභත්ත අනන්තරානි රාජානො - අභිෂේක කළ. **භොගියා** - භෝජකයා කුමාරා - රාජ කුමාරයෝ ඉධ **කම්මං** - පිරිවර සහිත දානය. **කම්ම සරික්ඛං** - පිරිවර සහිත කොට දානය දුන්නේය. මේ කාරණයෙන් දෙවියන් සහිත ලෝකයා දැනගනිත්වායි පහළ වූ චක්‍ර ලක්‍ෂණය **ලක්ඛණා** - නම් වේ. එයම චක්‍ර ලක්‍ෂණය වේ. **ආනිසංසො** - මහ පිරිවරය. **තත්ථෙතං වුච්චති** - මේ එම අර්ථය දක්වන ගාථා කියනු ලැබේ. ගාථා දවිධය. එම අර්ථය දැක්වීම ද විශේෂ අර්ථ දැක්වීමද යනුවෙනි. එහි පෙළෙහි ආ අර්ථය දැක්වීම තත් පරිදීපනය. පෙළෙහි නො ආ අර්ථ දැක්වීම් විසේසත්‍ථ පරිදීපන වේ. මෙය වනාහි තදත්‍ථ පරිදීපය. එහි **පුරෙ** - පෙර. **පුරත්‍ථා** - එහි පරියාය වචනයකි. **පුරිමාසු ජාතිසු** - මේ ජාතියට පෙර කරන ලද කර්ම ප්‍රතික්‍ෂේප දැක්වීම. **උබ්බෙග උත්තාසභයා පනූදනො** - උබ්බෙගය ද උත්තාසයද දුරුනොවූවේ **උසසුකො** - අධිකව, **සතපුඤ්ඤ ලක්ඛණං** - සීයෙන් සීයෙන් පින්කම්වලින් පහළ විය. එක එක ලක්‍ෂණය, මෙසේ ඇතිකල්හි කිසිවෙක් බුදුවීමට කැමති නොවූහ. අනන්තවූ සක්වල සියළු සත්‍වයෝ එක එක කර්මය සියක් වර කරන්නාහු ද මෙපමණ ජනයා විසින් කළයුතු කර්ම බෝසත්තුමා තනිවම එක එක සිය ගුණයක් කොට නිපදවිය. එහෙයින් සතපුඤ්ඤ ලක්‍ෂණ යයි මෙම අර්ථය කැමති වූහ. **මනුසසාසුරසත්තරක්ඛසා** - මනුෂ්‍යයෝ ද අසුරසත්‍වයෝද රාක්‍ෂයයෝද, **අන්තරා** - ප්‍රතිසන්ධියටත් චුතයටත් අතර මෙහි කම්ම නම් ප්‍රාණඝාතයෙන් වැලකීම කම්ම සරික්ඛක නම් ප්‍රාණඝාතය කරන්නා පා හඬ ඇසේය බියෙන් පා අගින් අගින් තබා ගොස් ප්‍රාණ ඝාතය කරති. ඉක්බිති මේ කරණයෙන් ඔවුන්ගේ කර්මය මහජනයා දැනගනීවා යයි ඇතුළත් වක් වූ පා හෝ පිටත වක්වූ පා හෝ වකුටු වූ පා හෝ අගින් වකුටු වූ හෝ මැදින් වකුටු වූ හෝ වේ. පා අගින් අතින් ගොස් අන්‍යයන් නොමැරූ බව වනාහි තථාගතයන්ගේ දෙවියන් සහිත ලෝකයා මෙය දනීවායි ආයත පණ්හි මහා පුරිස ලක්‍ෂණය පහළ විය. තවද අනුන් නසන්නා ශරීරය කෙළින් කර යෑමෙන් අනුන් දක්නට නැමීගෙන ගොස් අනුන් නසයි. ඔවුන් ගේ එසේ හෝ අනුන් නැසීමේ කර්මය අනුන් දකීවායි කුදු හෝ මිටි හෝ අත් පා කොර වූ හෝ වෙති. තථාගතයන් වහන්සේ ගේ වනාහි මෙසේ ගොස් අනුන් නොමැරූ බව

මේ කරුණයත් දෙවියන් සහිත ලෝකයා දැනගනිත්වායි බ්‍රහ්මුජ්ජාගත්ත මහා පුරිස ලක්‍ෂණය පහළ විය.

තව ද ඝාතකයෝ ආයුධයක් හෝ මුගුරක් හෝ ගෙන මිට මෙළවූ අතින් අනුන් නසති. ඔව්හු මෙසේ ඔවුන්ගේ අනුන් නැසූ බව මේ කරුණින් ජනයා දනිත්වායි කෙටි ඇඟිලි හෝ කෙටි අත් හෝ වක් වූ ඇඟිලි හෝ පෙණයක් වැනි අත හෝ වෙයි. තථාගතයන් වහන්සේ මෙසේ අනුන් නොනැසූ සදෙව් ලෝකයා මෙයින් දනිත්වායි දීඝ අංගුලි මහා පුරුෂ ලක්‍ෂණය පහළ විය. මෙය මෙහි කම්ම සරික්ඛකය. මේ ලක්‍ෂණ තුනම ලක්‍ෂණ නම් වේ. දීර්ඝ ආයුෂ ඇති බව ලක්‍ෂණ ආනිසංස වේ. **මරණවධභයත්තතො** - මෙහි මරණ සංඛ්‍යාත වධය මරණ වධ වේ. මරණවධයෙන් වන බිය - මරණ වධ භය වේ. එය තමාගේ **ජානිත්වා පටිවිරතො පරම්මරණාය** - යම්සේ මට මරණයෙන් බිය මගේ ජීවිතයට ප්‍රිය නිසාය. අනුන් ද එසේමයයි දැන අනුන් මැරීමෙන් වැලකුනේ වේ. **සුචරිතෙන** - පිරිසිදු ක්‍රියාවෙන්. **සග්ගමාගමා** - ස්වර්ගයට ගියේය. **චවිය පුනරියාගතො** - චුතවී නැවත මෙහි ආවේය. **දීඝපාසණ්හිකො** - දික් වූ විලුඹ. **බ්‍රහ්මාවසුජු** - බ්‍රහ්මයා මෙන් මනාව සෘජු. **සුභුජො** - සුන්දර වූ අත්. **සුසු** - මහළු කාලයේ ද තරුණ රූපය වේ. **සුසණ්ඨිතො** - මනා සටහනින් යුත් මුදු **තලුණඞ්ගුලියස්සා** - මෘදු ද (තරුන) - තලුණ ද ඇඟිලි ඔහුට. **තීහි** - තුනෙන්. **පුරිසවරග්ග ලක්ඛණෙහි** - උතුම් පුරුෂයාගේ අග්‍ර ලක්‍ෂණ වලින්. **චිරං යාපනාය** - චිර ජීවනය. **චිරං යපෙති** - චිර යැපෙයි. **චිරතරං පබ්බජති යදි තතොති** - එයින් චිරතරව ජීවත් වේ. ඉදින් පැවිදිවෙයි යන අර්ථයයි. වසීප්‍රාප්ත වී ඍද්ධි භාවනාවෙන් ජීවත්වෙයි. **රසිතානං** - රසයෙන් යුත්. **ඛාදනීයානං** - පිටි කඩා කෑ යුතු. පංච භෝජන. **සායනීයානි** - රස විඳිය යුතු ගිතෙල් වෙඬරු ආදිය. **ලෙහනීධානි** - ලෙවිය යුතු පිටි කැඳ ආදිය **පානානි** - අටපැන්.

මෙහි කර්ම නම් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකදී දෙන ලද ප්‍රණීත භෝජන දානයයි. කම්ම සරික්ඛ නම් රළු භෝජන කුසට ගියවිට රුධිරය වියලේ. මාංශ මැලවේ. එහෙයින් රළු දායකයින් සත්වයෝ මේ කරුණින් ඔවුහු රළු භෝජන දුන් බව ජනයා දැන ගනිත්වායි අල්පමාංශ අල්ප රුචිය මනුෂ්‍ය ප්‍රේතයන් මෙන් දුර්ලභ ආහාරපාන ලබති. ප්‍රණීත භෝජන කුසට වැටුණු කල මස් ලේ වඩයි. සම්පූර්ණ කය ප්‍රාසාදිත දර්ශනීය රූප වේ. එහෙයින් තථාගතයන් වහන්සේ බොහෝ කාලයක් ප්‍රණීත භෝජන

දෙන ලදී. මේ කරුණින් දෙවියන් සහිත ලෝකයා දූනගනිත්වායි සත්තුස්සද මහා පුරිස (සත්තැනකින් උස් වූ) ලක්ෂණය පහළවේ. ලක්ෂණය නම් සත්තුස්සද ලක්ෂණය ම වේ. ප්‍රණීත ලාභ ලැබීමේ ආනිසංසයයි. **ඛජ්ජභොජ්ජමථ ලෙය්‍ය පෙය්‍යායිතං** - ඛජ්ජ භෝජන ලෙහනීය සායනීය (ඛජ්ජ-අවුළුපත් කැවුම් කොකිස් ආදි භොජ්ජ-බත් මාළු ආදි බුදිය යුතු. ලේහනීය - කිරි ආදි ලෙවිය යුතු, සායනීය - වෙඬරු අටපැන් ආදි පිය යුතු ආහාර) **උත්තමග්ගරසදායකො** - උතුම් අග්‍ර රස දෙන්නෝ. උත්තමයින්ට අග්‍ර රස දෙන්නෝ. **සත්තුස්සදො** - සත් තැනක් උස් වූ. **තදත්ථජොතකං** - ඛජ්ජ භොජ්ජා ආදියේ බබළන - ඒවායින් ලාභ ලැබෙන. **පබ්බජ්ජම්පි වා** - පැවිදිවන්නේද. **තදධිගච්ඡති** - එය අවබෝධ කරයි. **ලාභිරුත්තමං** - ලැබීමෙන් උතුම් දානෙනාති - ආදියෙහි ඇතමෙක් දානයෙන්ම සංග්‍රහ කළයුතු වේ. දානයෙන් ඔහුට සංග්‍රහ කෙළේය. පැවිද්දන්ට පැවිදි පිරිකරවලින්. ගිහියන්ට ගිහියන්ට අයත් දේ දුන්නේය. **පෙය්‍ය වාචෙන** - ඇතමෙක් මෙය දිය යුතු යයි දෙයි. එකෙක් සියල්ල වචනයෙන් මකා විනාශ කරයි. කිම මෙම දානය කියන්නේ වේද? ඇතමෙක් කිසිම දානයක් නොදෙති. කියන්නා වනාහි තෙලෙන් මෙන් මකයි. මෙතෙම දෙන්නේ හෝ නැතා හෝ වචනය දහසක් අගී යයි කියන්නේ වේ. මෙබඳු පුද්ගලයා දානය ප්‍රාර්ථනා කරයි. ප්‍රිය වචනම ප්‍රාර්ථනා කරයි. ඔහු ප්‍රිය වචනයෙන් සංග්‍රහ කරයි. **අත්ථචරියාය** - ප්‍රයෝජනය වැඩ කරන කථා. ඇතමෙක් වනාහි දන් නොදෙති. ප්‍රිය වචන ප්‍රාර්ථනා නොකරයි. තමාගේ දියුණුව වර්ධනය පමණක් ප්‍රාර්ථනා කරයි. මෙබඳු පුද්ගලයා මෙය ඔබ කළයුතුය. මෙය ඔබ නොකළ යුතුය මෙසේ අර්ථ චර්යාවෙහි සංග්‍රහ කෙළේය. **සමානත්තතාය** - සමාන සැප දුක් බවෙන්, ඇතමෙක් දානාදියෙහි එකක්වත් ප්‍රාර්ථනා නොකරති. එක් අසුනෙහි හිඳීම. එක් ඇඳක සයනය, එකට ආහාර ගැනීම, මෙසේ සමාන සැපදුක් පතයි. එහි ජාතියෙන් හීනය, ධනයෙන් අධිකය සංග්‍රහ කිරීමට අපහසු වේ. හේ වනාහි මම ජාති සම්පන්න වෙමි''යි ධනවතුන් සමග එකට ආහාර ගැනීමට කැමති වේ. එසේ නොකරන කල්හි කිපේ. දෙකින්ම සමාන වූයේ සංග්‍රහ කළ හැකි වේ. භික්ෂූන් අතරෙහි දුසිල්වතාට සංග්‍රහ කළ හැකි නොවේ. එසේ නොකරන කල්හි කිපේ. නොකරන කල්හිද නොකිපේ. අන්‍යයන් තමා සමග පරිභොග නො කරන කල්හි නොකිපේ. අන්‍යයන් තමා සමග පරිභෝග නො කරන්නේද පවිටු සිතකින් නොබලයි. පරිභෝග කරන්නා ද ඔහු සමග පහසු වේ. එහෙයින්

මෙබඳු වූ පුද්ගලයාට සමානාත්මභාවයෙන් සංග්‍රහ කෙළේය. **සුසංග හිතාසස හොනති** - ඔහුට සංග්‍රහ කරති.

දුන්නා හෝ නොදුන්නා හෝ කෙරුවා හෝ නොකෙරුවා හෝ සංග්‍රහ කිරීමට පහසු වේ. **නහිජ්ජනති** - දිය යුත්තක් වේ නම් එය දෙයි. ඔහු විසින් නුදුන් දෙයක් නැතැයි දූත් හැගේ. කිම? මවිසින් දෙන්නාටම උවටැන් කරමි. නොදෙන්නාට නොකරන්නාට උවටැන් නොකරමියි මෙසේ සිතති. මෙහි කර්මය බොහෝ කාලයක් කරන ලද දානාදි සංග්‍රහ ක්‍රියාය. කර්ම සරික්ඛක නම් යමෙක් මෙසේ අසංග්‍රාහකයෙක් වේද හේ මේ කරුණින් ඔහුගේ අසංග්‍රහාක බව ජනයා දූනගනිත්වායි තද අත් පා ම වේ. විසමව සිටි බවම ලක්‍ෂණය වේ. තථාගතයන් වහන්සේගේ වනාහි බොහෝ කාලයක් සංග්‍රාහක බව දෙවියන් සහිත ලෝකයා මේ කාරණයෙන් දූනගනිත්වායි ලක්‍ෂණ දෙකක් පහළවිය. මේ ලක්‍ෂණ දෙකම හොඳින් සංග්‍රහ කිරීමේ ආනිසංසයයි. **කරියා** - කොට **චරියා** - හැසිර **අනවමනෙත** - අනවඤ‍ඤාතෙන- නොදූනගැනීමෙන් ''අනපවාදෙන'' යනුද පාඨයි. ප්‍රමාද නැති දින නැති ආඩම්බර නැති යන අර්ථය වේ. **චවියා** - චුතවී. **අතිරුචිරසුවගගු දසනෙය්‍යං** - අතිශයින් රුචිර වූ ද මනාව පහදවන යහපත් වචන ද ඉතා දක්‍ෂ වූ දර්ශනීය වූ ද දූකිය යුතු **සුකුමාරො** - සියුමැලිවූ.. **පරිජ්ජනසසවො** - කියන දේ කරන පිරිවර ජනයා. **විධෙය්‍යො** - කළයුතු කටයුතුවල කැමති සේ යටහත්ව පවතින. **මහිමං** - මේ පොලොව. **පියවදං හිත සුඛතං ජිගීයමානො** - ප්‍රිය වාදියෙක්ව දියුණු වද සැපය ද සොයන්නේ. **වචනපතිකරසසාභි-පසනනා** - ඔහුගේ වචන අනුව කරන ඉතා ප්‍රසන්න වූ. **ධම්මානුධම්මං** - ධර්මයද, අනුධර්මයද. **අත්‍ථූපසංහිතං** - මෙලොව පරලොව දියුණුවට නිශ්‍රය වූ. **ධම්මූපසංහිතං** - දසකුසල් කර්මපථ නිශ්‍රිත වූ. **බහුජනං නිදංසෙසි** - බොහෝ දෙනාට නිදර්ශන කථා කීවේය. **පාණිතං** - සත්‍වයින්ට අග්‍රයයි ආදි සියල්ල එකිනෙකේ සමාන වචන වේ.

මෙහි කර්මය නම් ඉහළට යෑම සඳහා බොහෝ කලක් කියන ලද වචනයයි. කර්ම සරික්ඛකය නම් යමෙක් මෙබඳු උසස් වචන නොකියයි ද හේ මේ කරුණින් උසස් වචන නොකීමෙන් ජනයා දූන ගනිත්වායි යටට පා ද ලෝ ම ද වේ. තථාගතයන් වහන්සේගේ වනාහි බොහෝ කලක් උසස් වචන භාවිත කළ බව දෙවියන් සහිත ලෝකයා දූනගනිත්වායි උස්ව ගිය පා ලකුණු ද උස්ව ගිය ලෝම ලකුණු ද පහළ

විය. ලක්‍ෂණ නම් මේ ලක්‍ෂණ දෙකමය. උස්ව ගිය බව ආනිසංසයයි. **එරයං** - කියන්නේ. **බහුජනං නිදංසයි** - බොහෝ ජනයාට දියුණුව දක්වීය. **ධම්මයාගං** - ධර්ම දාන යඥය. **උබ්භමුපපතිත ලොමවාසයො** - උන්වහන්සේගේ මෙසේ උඩට නැමුණු ලෝම හෝ වේ. **පාද ගණ්ඨි අහු** - පාවල වලලුකර විය. (ගොප් ඇට) **සාධු සණ්ඨිතා** - මනාව පිහිටියේය. **මංසලොහිතාචිතා** - මසින් ද රුධිරයෙන් එක් වූ. (රුස්කළ). **තචොත්ථටා** - සිවියෙන් වෙලීගත් (සැඟවූ). **වජති** - යයි. **අනොමනික්කමො** - උසස් විහරණය, ශ්‍රේෂ්ඨ විහරණය. **සිප්පාවා** යනාදියෙහි **සිප්ප** - නම් හීන ශිල්ප සහ උත්කෘෂ්ඨ ශිල්පයයි දෙපරිදිය. හීන ශිල්ප නම් නළකාර, කුම්භකාර (මැටිභාජන), පේෂකාර, කරණවෑම් (බාබර්) ශිල්ප වේ. උත්කෘෂ්ඨ ශිල්ප නම් ලේඛක, මුද්‍රණ හා ගණකාධිකාරි යනාදියයි. **විජ්ජා** - සර්ප විද්‍යා ආදි අනේකවිධය. **චරණං** - පන්සිල් දසසිල්, ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලය. **කම්මං** - කළකර්ම දැනගන්නා ප්‍රඥාව. **කිළිසෙසයුං** - කිලිටි කරන්නාහ. අතවැසි වත්නම් දුකය. ඔවුන්ට එය නොවේවායි සිතීය.

**රාජාරහානි** - රජුන්ට අනුරූප වූ ඇත් අස් ආදි ඒවායේම රජුගේ සේනාවට අග්‍ර වූ බැවින් රාජාරහ යයි කියනු ලැබේ. **රාජූපභොගානි** - රජුගේ උපභෝග පරිභෝග භාණ්ඩ මෙන්ම සප්ත රතනයෝද. **රාජානුච්ඡවිකානි** - රජුට සුදුසු වූ. ඔවුන් සියල්ලටම මේ ගහණ යයි **සමණාරහා** - ශ්‍රමණයින්ට අනුරූප වූ සිව්රු ආදිය. **සමණංගානි** - මහණුන්ගේ උපභෝග පිරිකර සමණුන්ගේ කොටසක් වූ සිවු පිරිස සමණූපභොගාන **සමණානුච්ඡවිකානි** - ඒවායේම සමාන වචනයකි.

මෙහි කර්මය නම් බොහෝ කාලයක් ශිල්පාදිය සකස්ව කීමය. කම්ම සරික්ඛ නම් යමෙක් ශිල්පාදිය සකස්ව නොකියන්නේ අතවැසියෝ උක්කුටිකයෙන් හිඳීමෙන් සහ ඇවිදීම් ආදියෙන් වෙහෙසට ක්ලාන්තයට පත්වෙති. කෙණ්ඩ මස්පිඩු ගැටී වැටුණාක් මෙන් ද වේ. තථාගතයන් වහන්සේගේ වනාහි සකසා මෙර වූ බැවින් දෙවියන් සහිත ලෝකයා මෙ කරුණින් දැනගනිත්වායි පෙර ඉගණුම් වැඩුහෙයින් **එණි ජංඝ** - (ඒණි මුවන්ගේ කෙණ්ඩය වැනි) ලක්‍ෂණය පහළ විය. ලක්‍ෂණය නම් මෙයම වේ. අනුරූප ලාභය ආනිසංසයයි. **යදුපඝාතාය** - යම් ශිල්පයක් කිසිවකු නැසීම පිණිස නොවේ. **කිලිසසනති** - ක්ලාන්ත වේ. **සුබුමනත වොත්ථටා** - සැපයෙන් යුක්ත වූයේ. වෙන කර්මයකින් වෙන ලක්‍ෂණ

ඇතිවේද? නැත. යමක් පහළ වන්නේ ඒ කර්මයේ කුඩා ලක්‍ෂණ ඇතිවය. එහෙයින් මෙය කියන ලදී. සමණංවා - සංසිඳුණු පව් ඇති අර්ථයෙන් ශ්‍රමණ හෝ බ්‍රාහමණං වා - බැහැර කරන ලද පව් ඇති බැවින්. බ්‍රාහමණ වේ. මහා පඤ්ඤා යනාදියෙහි මහා ප්‍රඥාදියෙන් යුක්ත වේ යන අර්ථය වේ. මහා පඤ්ඤාදියේ නා නා බව. එහි මහා ප්‍රඥාව කුමක්ද? මහත් වූ සීලස්කන්ධයෙහි ඇතුළත් වේනුයි මහා පඤ්ඤා, සමාධික්ඛන්ධයේ පඤ්ඤාක්ඛන්ධයේ, විමුක්තිස්කන්ධයේ විමුක්ති ඥානස්කන්ධයේ, ඇතුළත් නිසා මහා පඤ්ඤා වේ. මහත් වූ ස්ථාන අර්ථයෙන් මහා පඤ්ඤා වේ. මහා විහරණ සමාපත්තිය මහත් වූ ආර්ය සත්‍ය, මහත් වූ සතිපට්ඨානයෙහි, සම්මප්පධානයෙහි, ඍද්ධිපාදයෙහි, මහත් වූ ඉන්‍ද්‍රිය බල බොජ්ඣංගවල, මහත් වූ ආර්ය මාර්ගයෙහි සාමඤ්ඤ ඵලවල, මහා අභිඤ්ඤාවල, මහා පරමාර්ථ නිර්වාණයෙහි ඇතුළත් බැවින් මහා ප්‍රඥාව වේ. පුථු පඤ්ඤා කවරේද? නානා ස්කන්ධවල ඤාණය පවත්වන නිසා පුථු පඤ්ඤා වේ. නා නා ධාතුවල, නා නා ආයතනවල, නා නා පටිච්ච සමුප්පාද දේශනාවල, නා නා සුඤ්ඤතා අනු ලැබීම්වල, නානා අර්ථවල නානා ධර්මවල, නා නා නිරුක්තිවල, නා නා ප්‍රතිභානවල, නානා සමාධිවල, නා නා විමුත්තිවල, නා නා විමුත්ති දර්ශනවල, නොයෙක් ස්ථානවල, නොයෙක් විහරණ සමාපත්තිවල, නොයෙක් ආර්ය සත්‍යවල, සතිපට්ඨානවල, සම්මප්පධාන වල, ඉද්ධිපාදවල, ඉන්‍ද්‍රියවල, බලවල, බොජ්ඣංගවල, ආර්ය මාර්ගවල, සාමඤ්ඤ ඵලවල, අභිඥාවල, සාධාරණ ධර්ම ඉක්මවා පරමාර්ථ නිර්වාණයෙහි ඤාණය පැවැත්වීම නිසා පුථු ප්‍රඥා වේ.

හාසු ප්‍රඥාව කවරේද? මෙහි ඇතමෙක් හාසු (ඉක්මන් අවබෝධය) බහුලව, වෙද (දැනගනීව්) බහුලව, සතුටු බහුලව, ප්‍රීති බහුලව සීලය සම්පූර්ණ කරති. ඉන්‍ද්‍රිය සංවරය සපුරති, භෝජනයෙහි පමණ දැනීම, නිදිවැරීම, සිල් රැස, සමාධි රාසිය, පඤ්ඤා රාසිය, විමුත්ති රාසිය, විමුත්ති ඤාණ දස්සන රාසිය, සම්පූර්ණ කෙරේ යයි හාසු පඤ්ඤා වේ. හාසු බහුල.... ප්‍රීතිය බහුල ස්ථාන අස්ථාන අවබෝධ කෙරේ යයි හාසු පඤ්ඤා වේ. ජවන ප්‍රඥාව කවරේද? අතීත අනාගත වර්තමාන දුර වූ නො ලංවූ යම් රූපයක් වේ. ඒ සියළු රූප අනිත්‍ය වශයෙන් වහා ගමන් කිරීම ජවන පඤ්ඤා වේ. දුක් වශයෙන් වහා අනාත්ම වශයෙන් වහා දුව යයි. යනු ජවන පඤ්ඤා වේ. යම් වේදනාවක් අතීත අනාගත වර්තමාන යම්කිසි විඤ්ඤාණයක් වේද ඒ සියළු විඤ්ඤාණ අනිත්‍ය

වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් වහා දුවයි යනු ජවන පඤ්ඤා නම්. අතීත අනාගත වර්තමාන ඇස... ජරා මරණ අනිත්‍ය දුකඛ අනාත්ම වශයෙන් වහා දිවයෑම ජවන පඤ්ඤා වේ. අතීත අනාගත වර්තමාන රූපය ක්‍ෂයවීම් අර්ථයෙන් අනිත්‍ය වූ බියවීම් අර්ථයෙන් දුක්වූ අසාර අර්ථයෙන් අනාත්ම වී යයි තුලනය කොට විභාග කර නිරෝධ වූ නිර්වාණය කරා, වහා දිවයයි යනු ජවන පඤ්ඤා වේ. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ චකඛු ජරාමරණ අතීතාදි තුන් කාලයේ වූ මේවා ක්‍ෂයවීම් අර්ථයෙන් අනිත්‍ය වූ......ප්‍රකටව ජරාමරණ නිරෝධ වූ නිවනෙහි වහා දිවයේ යනු ජවන පඤ්ඤා වේ. අතීතානාගත වර්තමාන රූපය විඤ්ඤාණය ඇස..... ජරාමරණ අනිත්‍යය සංඛත වූ ප්‍රතීත්‍ය සමුත්පන්න වූ ක්‍ෂය ධර්ම වූ ව්‍යය ධර්ම වූ විරාග ධර්ම වූ නිරෝධ ධර්මය යයි තුලනය කර තීරණය කර ප්‍රකට කර ජරා මරණ නිරෝධ නිර්වාණයෙහි වහා දිවයෑම ජවන පඤ්ඤා වේ. තිකඛ පඤ්ඤාව කවරේද? ක්ලේශයන් වහා නසයි යනු තිකඛ පඤ්ඤා වේ. උපන් කාම විතකක (සිතිවිලි) ව්‍යාපාද විතකක, විහිංසා (හිංසා) විතකක උපන්නූපන් පාප අකුසල දහම් රාග, දොස, මොහ, ක්‍රොධ, උපනාහ මකුබව, පලාසය, (අනුන්ගුණ නැසීමේ සිත), ඉසසා (ඊර්ෂ්‍යාව) මසුරුකම, මායා, සාඨෙය්‍ය (කට්ටකම), ථමභ (තදබව) සාරමභ, මාන, අතිමාන, මද, පමාද සියළු කෙලෙස්, දුශ්චරිත සියළු අභිසංඛාර, සියළු භවගාමි කර්ම නො ඉවසයි. දුරු කරයි. නැති කරයි. විනාශ කරයි නූපදීමට පමුණුවයි. යනු තිකඛ පඤ්ඤා වේ. එක ආසනයෙහි සතර ආර්යමාර්ගයෙහි සතර ශ්‍රාමණ්‍ය ඵල, සිව්පිළිසිඹියා, ෂඩභිඥා අවබෝධ කරයි, ස්පර්ශ කළ දූනගනියි යනු තික්ඛ පඤ්ඤා වේ.

නිබ්බෙධික පඤ්ඤාව කවරේද? මෙහි ඇතමෙක් සියළු සංස්කාරවල සංවේග බහුල වෙති. උත්‍රාස, කලකිරීම් නො ඇලීම්, නිරාශා බහුල වෙති. සියළු සංස්කාරවල බාහිර ලක්‍ෂණයෙහි නොඇලේ. නොකැඩුණු විරූ නොපැලුණු විරූ ලෝභ ස්කන්ධ යෙහි කැඩේ. පැලෙයි යනු නිබ්බෙධික පඤ්ඤා වේ. පෙර නොකැඩුණු නොපැලුණු දොස ස්කන්ධය මෝහ ස්කන්ධය, ක්‍රොධ, උපභාග.... සියළු භවගාමික කර්මයෙහි කඩයි පලයි යනු නිබ්බෙධික පඤ්ඤාව වේ.

**පබ්බජිතං උපාසිකා** - උගත් පැවිද්දන් කරා එළඹ ඇසුරු කළ බව. **අඤ්ඤතරා** - යම්සේ ඇතමෙක් සිදුරු සොයන්නේ දෝෂාරෝපනය

කරන සිතින් දෝෂය ඇතුළත තබාගෙන ඇහුන්කන් දෙති. මෙසේ නො අසා අර්ථය අභ්‍යන්තරයේ කොට අර්ථ යුක්ත කථා ඇසීය. සලකා බැලීය. පටිලාභගතෙන - ලැබීම සඳහා ගියෙන්. උප්පාදනිමිත්ත කොවිද - ඉපදවීමෙහි ද නිමිත්තෙහි ද දක්‍ෂ වූ. අවෙච්ච දක්ඛති - දුන බලන්නේය. අත්ථානු සිට්ඨීසු පරිග්ගගෙසු -චා- යමෙක් අර්ථානුසාසනවල අල්වා ගැනීම, ලබා ගැනීමේ නුවණින් ඔවුන් කෙරෙහි යන අර්ථයයි. අක්කොධනො - අනාගාමි මගින් ක්‍රෝධය පහ නොවූ බැවින්, ඉක්බිති ඉදින් මට ක්‍රෝධය උපන්නේ නම් වහාම එය දුරුකරමි මෙසේ අක්‍රෝධය වසී කරන ලදී. නාභිසජ්ජි - වක් කටුවක් මෙන් ඒ ඒ තැන සම විදින්නාක් මෙන් නොලැගුනේය. කෝප නැති අව්‍යාපාද යනාදියෙහි පෙර උපන් කෝපය කොපො - ඊට වඩා බලවත් වූයේ ව්‍යාපාදො - ඊට වඩා බලවත් පතිත්ථියනය. ඒ සියල්ල නොකරන්නේ කෝප නොවේ. ව්‍යාපාද නොවේ. පතිත්ථිගත නොවේ.

අප්පච්චයං - දොම්නස. න පාත්වාකාසි - කාය විකාරයෙන් හෝ වාක් විකාරයෙන් ප්‍රකට නොකළේය. මෙහි කර්මය නම් බොහෝ කාලයක් මෛත්‍රී බවෙන් ද සියුම් ආසථරණාදි දානයද. කම්ම සරික්ඛක නම් ක්‍රෝධ කළාහුගේ සම අපිරිසිදුය. මුහුණ බැලිය නොහැකිය. අඳින වසත්‍රයක් මෙන් පැහැපත් නැත. එහෙයින් හේ මේ කරුණින් ඔහුගේ ක්‍රෝධාදි බව දුන ගනිත්වායි දුර්වර්ණවේ. අප්‍රසන්න පිහිටීම වේ. මහා සත්වයා කරුණු සතරකින් ප්‍රසන්න වේ. ආමිස දානයෙන්, වස්ත්‍ර දානයෙන්. මුසුන් දීමෙන් අක්‍රෝධනයෙන් හෝ මේ කරුණු සතරද බොහෝ කාලයක් තථාගතයන් විසින් කරන ලද්දේමය. එනිසා මේවා කළබව දෙවියන් සහිත ලෝකයා මේ කරුණින් දැනගනිත්වා යි සවර්ණ වර්ණවූ මහා පුරුෂ ලක්‍ෂණය පහළ විය. ලක්‍ෂණනය නම් මේ ලක්‍ෂණයම වේ. සියුමැලි ඇතිරිලි ආදිය ලැබීම අනිසංසය වේ. අභිවිසජ්ජි - හැරියේය. මහිම්වසුරො අභිවස්සං - සුර යනු වැස්සය. මහපොළොව තෙමන්නා වූ වැස්ස මෙන් සුරවර තරොරිව ඉන්‍ද්‍රා - දෙවියන්ගේ ඉතා උතුම් වූ ඉන්‍ද්‍ර මෙන්. ගිහිබව කැමති වන්නේ. මහතිමහිං - මහ පොළොව අච්ඡාදනවත්ථ මොක්ඛ පාපුරණානං - ඇඳීමද උතුම් පෙරවීමට ගන්නා වසත්‍ර ද. විනාසො - විනාශය. මාතරම්පි පුත්තෙන සමානෙතා අහොසි - මේ කර්මය රජයෙහි පිහිටුවීමෙන් කිරීමට නොහැකිය. එහෙයින් බෝධිසත්වයෝ රජය කරවන්නේ ඇතුළු නගරයෙහි සතර දිසාවේ දොරටු සතරෙහි ද පිටිනුවර සතර දිසාවෙහි මේ කර්මය කරවි යයි මිනිසුන් තැබූහ. ඔව්හු

මගේ පුතා කොහේදැයි පුතා නොදකිමියි විලාප කියමින් සොයමින් සිටි මව දැක, අම්මේ එන්න පුතා දක්ක හැකියයි ඇය ගෙන ගොස් නහවා කවා මැගේ පුතා සොයා දක්වන්න. මෙනයින් සියළු තැන. මෙහි කර්මය නම් බොහෝ කාලයක් නෑයින්ගේ එකතු කිරීම. කමමසරිකඛක නම් සමගි නෑයින් ඔවුනොවුන්ගේ වරද වැසීමය. ඔව්හු කලහ කාලයෙහි කලහ කරති. එකෙකුගේ වැරද්දක් වූ විට අනිත් අය දැනුවත් නොකරති. මෙය නම් ඔහුගේ වැරැද්ද යයි කී කල්හි සියල්ලෝ නැගීසිට කවුද දක්කේ? කවුද ඇසුවෙ? අපගේ නෑයින් අතර මෙබඳු අයෙක් නැත. තථාගතයන් ඤාති සංග්‍රහ කරන්නේ බොහෝ කාලයක් මේ වැරදි වසන කරමය කෙළේ වේ. ඉක්බිති දෙවියන් සහිත ලෝකයා මේ කරුණින් එබඳු කර්මයේ කළ බව දැන ගනිත්වායි කොසොහිත වත්ථගුයහ ලක්‍ෂණය පහළ විය. ලක්‍ෂණය මෙයම වේ. බොහෝ පුතුන් ඇතිබව ලක්‍ෂණයයි. **වත්ථච්ඡාදියං** - වසත්‍රයෙන් වැසිය යුතු වත්ථගුයහං වේ. **අමිත්තතාපන** - සතුරන්ගේ තැවීම. **ගිහිසස පීතිජනනතා** - ගිහියන්ට ප්‍රීතිය දනවීම, **සමං ජානාති** - මෙතෙම තාරුකඛට සමානය. මෙතෙම පොකඛරසාතිට සමානය. මෙසේ ඒ ඒ අය සමානව දනියි. **පුරිසවිසෙසං ජානාති** - මුං ඇට මෑ ඇටවලට සමාන නොකොට ගුණ විශිෂ්ඨයාගේ විසේසය දැනගනී. **පුරිසං ජානාති** - මේ තෙම ශ්‍රේෂ්ඨ සම්මත එය පුරුෂයා දැනගනී. **අයම්දමරහති** - මෙ පුරුෂතෙම මේ දානයට, පිදීමට, සත්කාරයට සුදුසුය. **පුරිස විසෙසකරො පුරෙ අහොසි** - පුරුෂ විශේෂය දැන ක්‍රියා කරන්නෙක් වේ. යමෙක් යමකු සුදුසුවේද ඔහුටම එය දෙයි. යමෙක් කහවනුවලට සුදුසු නම් අඩක් දෙයි. හේ ඉතිරි අඩ නොනසයි. යමෙක් කහවණු දෙකක් දෙයි. හේ තමාගේ කහවණු නසයි. එහෙයින් මේ දෙකම නොකොට යමෙක් යමෙක් සුදුසුවේද ඔහුට එයම දුන්නේය. **සදධා ධනං** - ආදියෙහි සම්පත් ප්‍රතිලාභ අර්ථයෙන් ශ්‍රද්ධාදිය ධනයයි දත යුතුය. මෙහි කර්මය නම් බොහෝ කාලයක් පුරුෂ විශේෂය දැන කරන ලද සංග්‍රහ කර්මයයි. කමම සරිකඛය නම් ඔහුගේ ඒ කර්මය දෙවියන් සහිත ලෝකය මේ කරුණින් දනිත්වායි මේ ලක්‍ෂණ දෙක උපදවයි. ලක්‍ෂණය නම් මෙම ලක්‍ෂණ දෙකමය. ආනිසංසය ධන සම්පත්තියයි. **තුලියා** - සසඳා. පවිචියා විමසා. **මහාජන සංගහන** - මහාජන සංග්‍රහය. **සමෙකඛමානො** - සමානව බලන්නේ. **අභිනිපුණාමනුජා** - අතිශයින් නිපුණ වූ සියුම් නුවණැති ලක්‍ෂණ පාඨක මනුෂ්‍යයෝ. **බහුවිධා ගිහීතදා හොති** - බොහෝ ආකාර වූ ගිහියන්ට සුදුසු වූ දේ ලබයි. **දහරො සුසු කුමාරො** - මේ ලදරු කුමරා. **පටිලභිංසු** - ලබන්නේ යයි ප්‍රකාශ කළහ.

මහිපතිසස - රජුට යොගකෙඛමකාමො - අභය කැමැත්තේ. පඤ්ඤාය - කළකම් දන්නා නුවණ. මෙහි කර්මය නම් මහාජනයාගේ දියුණුව කැමති බව. කමම සරිකඛකය නම් මහා ජනයාගේ දියුණුව කැමති බැවින් බලාපොරොත්තුවන බව වැඩුනේමය. දෙවියන් සහිත ලෝකය ඔහුගේ මේ කරුණින් දන ගනිත්වායි මේ හැම අතින්ම සම්පූණ් වූ අහීත වූ ලක්ෂණ තුන පහළ විය. ලක්ෂණ නම් මේ ලක්ෂණ තුනම වේ. ධනාදියේ මෙන්ම ශ්‍රද්ධාදියද නොපිරිහීම ආනිසංසයයි. සදධාය - ඕකපපන හා ප්‍රසාද ශ්‍රද්ධා වේ. සීලෙන - පන්සිල් දසසිල්වලින්. සුතෙන - ධර්මය ඇසීමෙන්. බුදධියා - මේවායේ බුද්ධියෙන් කිම මේවායින් වැඩෙන්නේද? මෙසේ සිතීය යන අර්ථයයි. ධමෙමන - ලෞකික ධර්මයෙන්. බහුහි සාධුහි - අන්‍ය වූ බොහෝ උත්තම ගුණවලින්. අසහාන ධමමතං - අසහන සවභාවය. සමාහිවාහිනියො - යම්සේ තල ඇටක් පමණ දවග තැබූ හැමතැනම පැතිරේ. මෙසේ සමානව උසුලයි. මෙහි කර්මය නම් නොපෙළන කර්මයයි. කමමසරිකඛක නම් - අත් ආදියෙන් පහර ලබන්නාගේ ලේ ලකුණු ඇති ගැට මතු වී ඇතුළත සැරව ගනී. ඇතුළ බිඳේ. මෙසේ ඔහුට බොහෝ රෝග ඇති වේ. තථාගතයන් වහන්සේ වනාහි බොහෝ කාලයක් මේ නිරෝගි කරන කර්ම කරන ලදී. දෙවියන් සහිත ලෝකයා මේ කරුණින් දනගනිත්වායි ආරෝග්‍ය කරවූ අගග රස ලක්ෂණය පහළ විය. ලක්ෂණය නම් මෙම ලක්ෂණයමය. රෝග අඩුබව ආනිසංසයයි. මරණ වධෙන - මොහු මරව්, මොහු ඝාතනය කරව් යයි මෙසේ අණ කරන්නා මරණ වධයෙන්. උබ්බාධනාය - බන්ධනාගාරයට පමුණුවා. කකුළුවකු මෙන් ඇස් එළියට නෙරා ක්‍රෝධ වශයෙන් නොබැලීය. නච විසාචි - වක් ඇස් කොනින් බැලීමක් නොවීය. නචපන විචෙය්‍ය පෙකඛිතා - විචෙය්‍ය බැලීම නම් යමෙක් කිපී අන්‍යයන් බලාද එවිට ඇස පියවේ. නොපෙනේ. නැවත යන්නේ කිපී බලයි. මෙබන්දක් නොවීය.

"විනෙය්‍ය පෙකඛිතා" යනුද පාඨයි. එම අර්ථයම වේ. උජුං තථාපසට මුදුමනො - ඍජු මනසින් යුක්තව ඍජුව බලන ලද්දේ විය. පියදසසනො - ප්‍රියවෙමින් බැලිය යුතු. මෙහි කර්මය නම් බොහෝ කාලයක් මහජනයා ප්‍රිය ඇසින් බැලීමේ කර්මය. කමම සරිකඛකය නම් කිපී බලන්නේ කණෙකු මෙන් කාක් ඇසක් මෙන් වේ. වක් වූ ඇස වනාහි කැළඹුනේ නො බොරපාට වේ. ප්‍රසන්න වූ සිතේ වනාහි බලන්නේ ඇස් පංචවර්ණ ප්‍රසාදයයි පෙනේ. තථාගතයන් වහන්සේ ද එසේ බැලුහ. බොහෝ කාලයක් ප්‍රිය ඇසින් බැළුබව දෙවියන් සහිත

ලෝකයා දැනගනිත්වායි මේ නෙත් සම්පත්වල දෙකේ මහ පුරිස් ලකුණු පහළ විය. ලක්ෂණ මේ ලක්ෂණ දෙකමය. ප්‍රිය දර්ශන බව ආනිසංසයයි.

**අභියොගිනො** - ලක්ෂණ ශාසත්‍රයෙන් යුක්ත. **බහුජන පුබ්බංග මො අහොසි** - බොහෝ දෙනාගේ පෙරටුව විය. ගණ දෙටුවෝ ඔවුන්ගේ දෘෂ්ඨානුගතිය අනිකකට පැමිණියහ. මෙහි කර්මය නම් පෙරටුව වූ බවයි. කම්ම පරික්ඛක නම් යමෙක් මුල් වී දානාදි කුසල කර්ම කරයි. හේ මතුනොවී හිස ඔසවා ප්‍රීති ප්‍රමෝද්‍යයෙන් පරිපූර්ණ වූ හිස් ඇත්තේ හැසිරෙයි. මහාපුරිසයෙක් වේ. තථාගතයන් වහන්සේ ද එසේ කළහ. ඉක්බිති දෙවියන් සහිත ලෝකයා මේ කරුණින් මොහුගේ මේ පෙර කර්මය දැනගනිත්වායි උන්හීස සීස ලක්ෂණය පහළ විය. මෙයම ලක්ෂණය වේ. මහ පිරිවර ආනිසංසයයි. **බහුනනං හෙසසති** - බොහෝ ජනයාට වන්නේය. **පටිභොගියා** - වතාවත් කරන්නෝ. මොහුට බොහෝ වතාවත් කරන්නෝ වන්නාහ යන අර්ථයයි. **අබිහරනති තදා** - ළදරු කාලයේම එකල්හි මෙසේ ප්‍රකාශ කරති. **පාටිහාරකං** - වතාවත් කරන බව. **උපවතතනි** - අදහසට අනුව පවතී. මෙහි කර්මය නම් බොහෝ කාලයක් සත්‍ය කීම. **කමම සරිකඛකය** - නම් බොහෝ කාලයක් දෙයාකාරයක් නැති කථාව..**අදෙවජඣ කථා** වේ. පිරිසිදු කථාය. එසේ කී බවට ලක්ෂණ ඌර්ණ රෝම ලක්ෂණය ද පහළ විය. මහජනයාගේ අදහස් අනුව පැවතීම ආනිසංසයයි.

**එකෙක ලොමුපචිතං ගතං** - එක එක ලොමින් යුත් සිරුර. **අභෙජ්ජ පරිසො** - නොබිඳිය හැකි පිරිස. මෙහි කර්මය නම් බොහෝ කාලයක් පිසුණු වචන නොකීමේ කථා. කමම සරිකඛකය නම් පිසුණු වචනය වනාහි සමගිබව බිඳීමෙන් දත් සම්පූර්ණ නොවේ. විරලද වේ. තථාගතයන් ගේ වනාහි බොහෝ කලක් අපිසුණ වචන බව දෙවියන් සහිත ලෝකයා දැන ගනිත්වායි මේ ලක්ෂණ දෙක පහළවිය. ලක්ෂණය මෙයමය. ආනිසංසය නොබිඳිගති පිරිස් ඇති බවය. **ආදෙය්‍ය වාචො හොති** - ගතයුතු වචන වේ. මෙහි කර්මය නම් බොහෝ කාලයක් ප්‍රියවචන කථා කිරීමය. (අඵරුසවාචා) කමම සරිකඛක නම්, ඵරුස වචන කථා කිරීමය. මේ කරුණින් ඔවුන් දිවවල් ඵරුස වචන කථා කිරීම ජනයා දැන ගනිත්වායි බැඳුණු දිව් ඇත්තේ හෝ සැඟවුණු දිව් ඇත්තේ හෝ වේ. තථාගතයන් ගේ ප්‍රිය වචන කී බව, සදේව ලෝකයා දැනගනිත්වා. පහුත ජිවහා (පළල් දිව) ලක්ෂණය පහල විය. ඵරුෂ වචන

කියන්නන් ගේ ශබ්දය බිඳෙයි. ඔව්හු ශබ්ද භේදය කොට ඵරුෂ වචන කී බව ජනයා දැන ගනිත්වයි සිඳුණු හඬ ඇත්තේ වේ. බිඳුණු ස්වර කාක් හඬ හෝ වේ. සවර භේදකර පරුෂවචන නොකියන්නේ ඔවුන්ගේ ශබ්දය මිහිරිද ප්‍රේමණීය ද වේ. එහෙයින් තථාගතයන්ගේ බොහෝ කලක් ශබ්ද මිහිරිද ප්‍රේමණීය ද වේ. එහෙයින් තථාගතයන්ගේ බොහෝ කලක් ශබ්ද භේදකර ඵරුෂ වචන නොකී බව දෙවියන් සහිත ලෝකයා දැන ගනිත්වායි බ්‍රහමසසර ලක්‍ෂණය පහළ විය. ලක්‍ෂණය මේ ලක්‍ෂණ දෙකමය. ගත යුතු වචන ඇති බව ආනිසංසයයි. උබ්බාධිකං - ආක්‍රෝස යුතත බැවින් ආබාධකරයි. බහුජනපමද්දනං - බොහෝ දෙනාගේ ප්‍රමාදය. අබාළහං ගිරං සො න භණි ඵරුසං - බලවත් අති ඵරුෂ. බාළහං ගිරං සො අභණී - අතිඵරුෂ වචන හේ කථා නොකෙළේය යනු මෙහි අර්ථයයි. සුසංහිතං - යහපත් ප්‍රේමය සහිත. සඛිලං - මෘදු. වාචා - වචන කණ්ණ සුඛා - කනට ප්‍රිය. වෙදයථා - දැන ගත්තේය. බ්‍රහමසසරතතං - බ්‍රහ්මස්සර බව. බහුනො බහුං - බොහෝ ජනයාගේ බොහෝ. බහුතං බහුං යනු ද පාඨයි. බොහෝ ජනයාගේ බොහෝ වෙති යන අර්ථයයි. ගුණ වශයෙන් හෝ සමාන වශයෙන් හෝ නැසීමට කීමට නොහැකි වන්නේය. මෙහි කර්මය නම් ප්‍රලාප කථා නොකීමය. කම්මසරිකඛ නම් යමෙක් ප්‍රලාප කියත්ද ඔව්හු මේ කරුණින් ජනයා දනිත්වායි ඇතුළට පිවිසි හනු හෝ ඇද හනු හෝ නැමුණු හනු හෝ වේ. තථාගතයන් වනාහි එබඳු කථා නොකීහ. එහෙයින් උන්වහන්සේගේ හනු සොලවා ප්‍රලාප කථා නොකී බව දෙවියන් සහිත ලෝකයා දැන ගනිත්වායි සීහහනු ලක්‍ෂණය පහළ විය. ලක්‍ෂණය මෙයම වේ. විනාශ කළ නොහැකි බව ආනිසංසයයි.

අවිකණ්ණ වචන ව්‍යප්පථො ච - නො විසිරුණු වචන මෙන් පෙර බෝසත්වරුන් ගේ වචන මෙන් නිෂ්පල නොවන වචන. දව්දුගම වරතර හනුත්‍ථාමලත්‍ථා - දෙදෙනා යන දව්දුගම - වේ. දෙකෙන් දෙක සතරය. සතර පා ඇත්තන්ට උතුම් වූ සිංහයා ගේ හනුබව ලැබුවා යන අර්ථයයි. මනුජාධිපති - මිනිසුන්ගේ අධිපති. තථාභො - එබඳු සවභාවය. සුචිපරිවාරො - පිරිසිදු පිරිවර. මෙහි කර්මය නම් යහපත් ජීවිතයයි. කම්මසරිකඛය නම් යමෙක් විෂමව කිලිටි ජීවිකාවෙන් දිවි ගෙවයි නම් ඔහුගේ දත්ද විෂමය. කිලිටිය. තථාගතයන් වහන්සේ වනාහි දැහැමිව පිරිසිදු ජීවිකාවෙන් දිවිගෙන ගිය බව දෙවියන් සහිත ලෝකයා, මේ කාරණයෙන් දනිත්වායි සමදත් ලක්‍ෂණය ද සුදු දළඳා ලක්‍ෂණය ද පහළ

විය. ලක්ෂණය නම් මේ ලක්ෂණ දෙකමය. පිරිසිදු පිරිවර ඇති බව ආනිසංසයයි. අවසසජ - අත් හලේය. තිදිවපුරවරසමො - ත්‍රිදශපුරයෙහි ශක්‍රයාට සමානව. ලපනජං - මුවින් උපන්. දනතනති - අර්ථය දවිජසමසුකකසුචිසොභන දනෙතා - දෙවරකදී උපත් බැවින් ද්විජ නම් ඇත්තේ. සුදු පිරිසිදු සෝභන හෝ දත් උන්වහන්සේට යයි දවිජසම සුකක සුචි සොභන දනෙතා වේ. නව ජනපදතුදනං - යමෙකුට සක්වල කෙළවර කොට ජනපද ඇත්තේ ඔහුට අනිකෙක් විදීම පෙළීම හෝ ආබාධයක් හෝ නැත. හිතමපිචබහුජන සුඛං වරං බහුජනයා සමාන සුඛ දුකඛ (සමාන සැප දුක්ඇතිව) ව හැසිරෙති. විපාපො - පහවූ පාප ඇති. විගත දරථකිලමථො - පහ වූ කායික කරදර අපහසු කම් ඇති. රාගාදි කෙලශයන් ගේ ද දෝස කිලිට්ද සියළු කෙලෙසුන් ද දුරුවෙයි. සෙසු සියල්ල කියන ලද අර්ථ ඇත්තේ වේ.

ලක්ඛණ සූත්‍ර වර්ණනාව නිමි.

## 3-31

## සිගාලක සූත්‍ර වර්ණනාව

මා විසින් මෙසේ සිගාලක සූත්‍රය අසන ලදී. එහි අනුත්තාන පද වර්ණනාව මෙසේය. වෙළුවනෙ කලන්‍දක නිවාපෙ - වෙළුවන යනු ඒ උයනේ නම වේ. එය වනාහි උනගස්වලින් වටකරන ලද්දේය. දහඅටරියන් පවුරෙන් හා ගෝපුර (දොරටුව) අට්ටාවලින් යුක්තව නිල්පාටින් බබළන මනරම් වූ එයින් වේළුවන යයි කියනු ලැබේ. ලෙහෙනුන්ට ද එහි ආහාර දුන්හ. පෙර වනාහි එක්තරා රජෙක් ක්‍රීඩා පිණිස එහි පැමිණියේ සුරා මතයෙන් නිදා ගත්තේය. පිරිවර ජනයාද රජ නිදි යයි මල්ඵලවලින් පොළඹවන ලද්දෝ එහෙ මෙහෙ ගියහ. ඉක්බිති සුරා ගඳින් එක්තරා සිදුරු ගසකින් කළු සර්පයෙක් නික්මී රජු අභිමුඛයට එයි. ඒ දුටු රුක් දෙවියා රජුට ජීවිතදානය කෙරෙමියි ලෙහෙනෙකුගේ වෙසින් පැමිණ කනමුල ශබ්ද කෙළේය. රජ අවදි විය. කළු සර්පයා නැවතුනේය. රජ උඟ දැක මේ කාලක විසින් කාල සර්පයාගෙන් මගේ ජීවිතය දෙන ලදයි, එහෙයින් එතැන් පටන් කලන්‍දක නිවාප යයි. ව්‍යවහාරයට පත්විය.

''කලන්දක'' යනු කාලකයින්ට (ලෙහෙනුන්ට) නමකි. තෙන ඛො පන සමයෙන - භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගොදුරුගම් කොට කලන්දක නිවාප වේළුවනයෙහි වාසය කරති. ඒ සමයෙහි, සිගාලකො ගහපති පුත්තො - සිගාල යනු ඔහුගේ නම වේ. ගහපති පුත්තො යනු, ගෘහපතියාගේ පුතාය. ඔහුගේ පියා වනාහි ගෘහපති මහා සාළයෙකි. නිදන්කොට තබන ලද ඔහුගේ ගෙයි සතලිස් කෝටියක් ධනය ඇත. හේ භාග්‍යවතුන් සිටින විට උපාසකව සෝවාන් වූයේය. ඔහුගේ බිරිය ද සෝවාන් වූවාය. පුත්‍රයා වනාහි අශ්‍රද්ධාවත් වේ, අප්‍රසන්න වේ. ඉක්බිති ඔහුට මාපියෝ නිතර ඔවදන් දෙති. දරුව, ශාස්තෘන් වහන්සේ වෙත යන්න. ධම්මසේනාපති (සැරියුත් හිමි) මහා මොග්ගල්ලාන, මහා කස්සප, අසූමහා සව්වන් කරා යන්න යයි උපදෙස් දෙති. එවිට හේ මෙසේ කියයි. ඔබලාගේ ශ්‍රමණයන් වෙත ගොස් මට වැඩක් නැත. ශ්‍රමණයන් ලඟට ගියවිට වැඳිය යුතු වේ. නැමී වඳිනවිට පිට රිදේ. දණහිස් රළු වේ. බිම හිඳගත යුතුය එහි හිඳගත් කල වස්ත්‍ර කිලිටි වේ. දිරයි. සමීපයේ සිටින කාලයේ පටන් කථා සල්ලාප වේ. එවිට විශ්වාසයක් ඇතිවේ. එයින් ආරාධනා කොට චීවර පිණ්ඩපාත ආදිය දිය යුතුය. මෙසේ ඇති කල්හි ධනය පිරිහේ. ඔබලාගේ ශ්‍රමණයන් වෙත එළඹීමෙන් මට වැඩක් නැත. මෙසේ ඔහුට දිවිතෙක් අවවාද කළමුත් සාසනයට පැමිණවීමට මව්පියෝ අසමත් වූහ. ඉක්බිති පියා මරණ මංචකයෙහි නිපන්නේ මගේ පුතාට අවවාද දීමට වටී යයි සිතා නැවත සිතීය. දරුව, ''දිසා නමස්කාර කරන්න'' මෙසේ අවවාද දෙන්නෙමි. ඔහු අර්ථය නොදන්නේ දිසා නමස්කාර කරන්නේය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ හෝ ශ්‍රාවකයන් වහන්සේ හෝ දැක කුමක් කරන්නෙහිදැයි විචාරන්නෝය. එයින් මගේ පියා දිසා නමස්කාර කරවයි අවවාද දුන්නේයයි කියයි. ඉක්බිති උන්වහන්සේලා ඔබගේ පියා මේ දිසා නමස්කාර කරවන්නේ නැත. මේ දිසා නමස්කාර කරවයි දම් දෙසති. හේ බුදු සසුනෙහි ගුණ දැන පින්කම් කරන්නේය. ඉක්බිති ඔහු අමතා දරුව, පාන්දර නැගිට සදිසා නමස්කාර කරන්නයැයි කීය. මරණ මඤ්චකයෙහි නිපන් අයගේ කථා නම් දිවිතෙක් සිහිකළයුතු වේ. එහෙයින් ඒ ගෘහපති පුත්‍රයා පියාගේ ඒ වචනය සිහි කරන්නේ එසේ කෙළේය. එහෙයින් වේලාසනින් නැගිට ''රාජගහා නික්ඛමිත්වා'' යනාදිය කියන ලදී.

පුථුදිසා - බොහෝ දැන් ඒවා දක්වන්නේ '' පුරත්ථිම දිසං'' යනාදිය කීහ. පාවිසි - තවම පිවිසියේ නැත. පිවිසෙන්නෙමියි නික්මුණු

බව වනාහි අතරමග පවතින විට ද මෙසේ කියනු ලැබේ. අද්දසා ඛො භගවා - දුන් පමණක් දුක්කා නොවේ. අළුයම් වේලෙහි ද බුදු ඇසින් ලොව බලන්නේ මෙසේ දිසා නමස්කාර කරන්නා දුක අද මම සිගාල ගෘහපති පුත්‍රයාට ගිහි විනය වූ සිගාලෝවාද සූත්‍රාන්තය කියන්නෙමි. මහාජනයාට ඒ කථාව ප්‍රයෝජන වන්නේය. මා එහි යා යුතුය. එහෙයින් උදෙන්ම නික්මී රජගහනුවර පිණ්ඩපාතේ වැඩියහ. පිවිසෙන්නේ ඔහු එසේම දුක්කහ. එයින් කියන ලදී "අද්දසා ඛො භගවා" යයි. එතදවොච - හේ වනාහි ලඟ සිටියද ශාස්තෲන් නොදුක්කේය. දිසාම නමස්කාර කරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට හිරුරැස් වැටී පිපෙන ලොකු නෙළුම් මලක් මෙන් මුව විවරකර ගෘහපති පුත්‍රය ඔබ කවුද යනාදි මේ වචන කීහ. "ස්වාමීනි, යථාකථංපන" හේ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඒ වචන අසා සිතීය. මගේ පියා සදිසා වැඳිය යුතු යයි කියන ලදී.

ඒවා මේවා, ආර්ය ශ්‍රාවකයා විසින් වැඳිය යුතු ඒවා වෙනත් ඒවාය. මම ද අරිය සාවකයා විසින් වැඳිය යුතු දිසා අසා වඳින්නෙමියි හේ ඒවා අසන්නේ "යථා කථං පන භනෙත" යනාදිය කීය. යථා - නිපාතයකි. කථමපන් - ඇසූපදය මෙයමම වේ. කම්මකිලෙසා - ඒවායින් සත්වයා කිලිටි කරන්නේය. එහෙයින් කම්ම කිලෙස යයි කියනු ලැබේ. ඨානෙහි - කරුණුවලින්. අපායමුඛානි - විනාශමුඛ සො - හේ සෝවාන් ආර්ය ශ්‍රාවකයා. චුද්දසපාපකාපසො - මේ තුදුස් පාපලාමකවලින් දුරු වී සදිසා වසන්නේ උභො ලොකවිජයාය - මෙලොව පරලොව දෙලොව දිනීම සඳහා අයංචෙව ලොකො ආරද්ධොහොති - එබඳු වූ මෙලොව පංච වෛර නැත. ඔව්හු ඔහුට මෙලොව ද පටන්ගන්නා ලද වේ. සතුටු කරන ලද මෙන්ම සම්පාදිත වූයේ ද වේ. පරලොවේ ද පංච වෛර නැත. එයින් ම පරලොවද ආරාධිත වේ. එහෙයින් හේ මරණින් පසු සුගති වූ ස්වර්ග ලෝකයට පැමිණේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේපයෙන් මාතෘකාව තබා දුන් එයම විස්තර කරන්නේ "කර්ම කෙලශ සතර කවරේද"යි යනාදිය කීහ. කම්මකිලෙසො - කර්මයද ඒ කෙලෙස් සම්ප්‍රයුක්තභාවය කෙලෙස් ද යයි කම්මකිලෙස වේ. කෙලෙස් සහිතවම ප්‍රාණඝාතය කරයි. කෙලෙස් නැත්තා නො නසයි. එහෙයින් "පාණාතිපාතය" කම්ම කිලෙසයයි කියන ලදී. අදින්නාදානා දියෙහි ද මෙම නයම වේ. අථාපරං - තව ද ඒ අර්ථයම විස්තර කරන්නේ ගාථා බැඳුම් කියන ලදයි අර්ථ වේ. පාපකම්මං කරොති - භාග්‍යවතුන් වහන්සේ මෙය යම් කරන්නෙක් දක්වන කල්හි ආකාරය ප්‍රකට වේ. එහෙයින්

පව්කම් නොකරයි යන මාතෘකාව තබන්නේ ද දේශනා කුසලයෙන් පළමුව කරන්නා දක්වන්නේ කීහ. එහි **ඡන්දාගතිං ගච්ඡන්තො** - කැමැත්තෙන් ප්‍රේමයෙන් අගතියට යන්නේ නොකළ යුත්තක් කරන්නේ. අනිත් පදවලද මෙම නයම වේ. එහි යමෙක් මේ මගේ මිත්‍රයා හෝ හක්තිමත්, දූකපුරුද, නෑයා යන අය විසින් මට අල්ලසක් දෙන්නේ යයි අසන්නේය, ස්වාමියෙක් ඡන්ද වශයෙන් අගතියට යන්නේ පව්කම් කරයි. හේ මගේ වෛරක්කාරයා යයි ප්‍රකෘති වෛර වශයෙන් හෝ එකෙණෙහි උපන් ක්‍රෝධ වශයෙන් හෝ ස්වාමියා අස්වාමිකයෙකු කරයි. මෙය දෝසයෙන් අගතියට යන්නේ පව්කම් කරයි. යමෙක් වනාහි අඥානයෙන් බැවින් මෝහයෙන් මුළා වී හෝ අසවාමිකයකු සවාමියකු කරයි. මෙතෙම මෝහාගතියට යන්නේ පව්කම් කරයි. යමෙක් වනාහි මෙතෙම රාජ වලලභයෙක් හෝ විසම නිශ්‍රිතවූ මට අනර්ථයක් කරන්නේ යයි බිය වී අසවාමිකයෙක් සවාමියකු කරයි. මෙතෙමේ බිය නිසා අගතියට යන්නේ පව්කම් කරයි. යමෙක් වනාහි යමක් බෙදන්නෙ මේ මගේ හුරුපුරුදු හෝ හක්තිමත් හෝ ප්‍රේමයෙන් අතිරේකයක් දෙයි. මේ මගේ විරුද්ධකාරයා යයි අඩුවෙන් දෙයි. යමෙක් මෝහයෙන් දුන් නොදුන් බව නොදන්නේ යමකුට අඩුවෙන් යමෙකුට වැඩියෙන් දෙයි. මොහුට නොදුන්නොත් මට අනර්ථයක් කරන්නේ යයි බිය වී කිසිවෙකුට අතිරේකයක් දෙයි. හේ සතර වැදෑරුම් අනුක්‍රමයෙන් ඡන්දාගති ආදිය කරන්නේ පව් කරයි. ආර්ය ශ්‍රාවකයා වනාහි දිවි ගියත් ඡන්දාගති ආදියට නොයයි. එයින් කියන ලදී: "මේ සතර තැන පව්කම් නොකරයි" **නිහීයති තසස යසො** - අගතිගාමී ඔහුගේ කීර්තියද පිරිවර ද පිරිහෙයි. **සුරාමෙරය මජජ පමාදට්ඨානුයොගො** - මෙහි සුරා පැනිරස, පිටි, බත් කිණණ, (ද්‍රව්‍ය, සුරාවට) සමභාර (සුරාවට ගන්නා ද්‍රව්‍ය) යන පංච සුරා. **පංචසුරා** - මල්යුෂ, ගෙඩියුෂ පැනි, සකුරු, සම්භාර පංච යුෂ, ඒ සියල්ල මත් කිරීම් වශයෙන් මද්‍ය වේ. **පමාදට්ඨාන** - පමාද කාරණ වූ, චේතනාවෙන් මද්‍ය පානය කරයි. එයට සමාන වචනයකි. **අනුයොගො** - ඒ සුරා මෙරය මජජ පමාදට්ඨානයේ අනු යෝගය නැවත නැවත කිරීම. මෙහි යෙදීමෙන් උපන් සම්පත් පිරිහෙයි. නූපන් සම්පත් නූපදී. එහෙයින් මෙය සම්පත්වල අපායමුඛයයි කියන ලදී. **විකාල විසිඛාචරියානුයොගො** - අවේලාවල වීථි සංචාරයෙහි යෙදෙන්නෝ. **සමජ්ජාභිචරණං** - නැටුම් ගැයුම් ආදිය (සංදර්ශන) බැලීමට යෑම. **ආලසසානුයොගො** - කයේ මැලිකම එයින් යුක්ත වූවෝ. මෙසේ සවැදෑරුම් අපායමුඛ මාතෘකා වශයෙන් තබා දූන් ඒවා බෙදන්නේ "ඡ ඛො මෙ ගහපති පුතත ආදීනවා"

යනාදිය කීහ. එහි **සන්දිට්ඨිකා** - තමාම බැලිය යුතු මෙලොව සිදුවන. **ධනජානි** - ධන හානිය. **කලහප්පවඩ්ඪනී** - වාක් කලහ මෙන්ම අතපය ආදි ඡේදනය පැමිණෙන්නේ මෙලොව පරලොව නින්දාවට පැමිණේ. **රෝගානං ආයතනං** - ඒ ඒ ඇස් රෝගාදිය. **අකිත්ති සංජනනං** - සුරා බී මවට පහර දෙති. පියාටද, අනිත් බොහෝ නොකිව යුතු දේ කියති. නොකළ යුතු දේ කරති. එයින් ගැරහීම ද දඬුවම් ද අත් පා ආදිය සිඳීමටද පැමිණෙන්නේ මෙලොව පරලොව නින්දාවටද පැමිණෙති. මෙසේ ඔවුන්ට ඒ සුරා නින්දාව උපදවයි. **කොපීන නිදංසනී** - වැසිය යුතු තැන් විවර වී ලජ්ජාව විනාශ වෙයි. එහෙයින් කොපී යයි කියනු ලැබේ. **පඤ්ඤාය දුබ්බලීකරණී** සාගල තෙරුන්ගේ මෙන් කම්මස්සකතා ප්‍රඥාව දුර්වල කරයි. මාර්ග ප්‍රඥාව දුර්වල කළ නොහැකිය. අවබෝධ කළ මාර්ග ඇති අයට එය මුඛය තුළට නොපිවිසේ. **ඡට්ඨං පදං** - කරුණු සය.

**අත්තාපිස්ස අගුත්තො හොති අරක්ඛිතො** - අවේලාවේ හැසිරෙන්නා කණුකටු ආදිය ඇනගනී (ඇක්මෙයි). සර්ප යකුන්ගෙන් හිරිහැර පමුණුවා ගනී. ඒ ඒ තැන්වලට යතියි දැන විරුද්ධකාරයෝ සැඟවී සිට අල්ලා ගනිති හෝ හානි කරති. මෙසේ තමාටද ආරක්ෂාවක් නැත. අඹුදරුවෝද අපගේ පියා මගේ ස්වාමියා රාත්‍රියේ හැසිරෙයි. තවම නැත්තේ ඇයි කියා දූ පුත්තුද භාර්යාවද එළියට බැස හැසිරෙන්නේ ව්‍යසනවලට ගොදුරු වෙති. අඹුදරුවෝද අනාරක්ෂිත වෙති. **සාපතෙය්‍යං** - ඔහුගේ අඹුදරුවන් පිරිවර ජනයා හැසිරෙන බව දැන සොරු හිස් ගෙයට පිවිස කැමති දෙයක් ගෙන යති. මෙසේ ඔහුගේ වස්තුවට ද රැකවරණයක් නැත. **සංකියො ච හොති** - අනුන් විසින් කරන ලද වැරදි ක්‍රියාවලට ද ඔහු සැක කරයි. **බහූනඤ්ච දුක්ඛ ධම්මානං** - මෙපමණ දුක්, මෙපමණ දොම්නස් යයි කිව නොහැක. වෙනත් පුද්ගලයන් නැතිකල්හි සියල්ල අවේලාවෙහි හැසිරෙන්නා කරපිට වැටේ. මෙසේ ඔහු බොහෝ දුක්වලට පුරෝගාමී වෙති. **ක්ව නච්චං** - නට නාටකාදි නෘත්‍ය තිබෙන්නේ කොහේදැයි අසා අසවල් ගමේ හෝ නියම්ගමෙහි යයි දැන යා යුතුය. හෙට නාට්‍ය සංදර්ශනයට යමියි අද වස්ත්‍ර මල් ආදිය පිළියෙළ කරන්නෙමි දවසම යොදාගනිමින් එදින වැඩ පාලු කරගනී. නාට්‍ය දර්ශනයෙන් එක් දිනක් හෝ දෙදිනක් එහිම වේ. ඉක්බිති වැසි ආදිය ලැබ වපුරන කාලයේ ඒවා නොකරන්නේ නූපන් භෝග නූපදී. ඔහු ගෙදර නැති බව දැන සොරු බඩු පැහැර ගනිති. එයින් ඔහුගේ

තිබෙන භෝග ද විනාශ වේ. **ඛව ගීතං** - යනාදියෙහි ද මෙම නයම වේ. ඒවායේ විවිධත්‍වය බ්‍රහ්මජාල සූත්‍රයෙහි කියන ලද්දේමය.

**ජයං වෙරං** - මා දිනන ලදැයි පිරිස මැද අනුන්ගේ සලුවක් හෝ හිස් වෙළුමක් (වෙය්ඨන) ගනී. ඔහු පිරිස මැද මට අවමන් කෙළෙහි යයි ඔහුට උගන්වන්නෙමියි එහි වෛර බඳියි. මෙසේ දිනන්නා ජය වෛරය වඩවයි. පැරදුණු තැනැත්තා (ජිතො) අනිකකු විසින් පරදවන ලද්දේ ඔහුගේ ජටාව හො සලුව හෝ වෙනත් රත්තරං ආදි ධනය ගන්නා ලදැයි සෝක කරයි. මෙසේ පැරදුන තැනැත්තා ධනය ගැන සෝක කරයි. **සභාගතසස වචනං න රූහති** - විනිශ්චය ස්ථානයෙහි සාක්ෂි විචාරන ලද්දේ ඔහුගේ වචනය නොපිළිගනී. මේ තෙමේ සූදුකාරයෙක් දූ කෙළින්නෙක් යයි ඔහුගේ සාක්ෂිය පිළිගත නොහැකැයි කියන්නෝ වෙති. **මිත්තාමච්චානං පරිභූතො හොති** - ඔහු මිත්‍රයෝ මෙසේ කියති. යහළුව, ඔබ නම් කුල පුත්‍රයෙකි. සූදුවට යන්නේ අසරණව හැසිරෙයි. මෙය ජාතිගෝත්‍රයට. අනුරූප නොවේ. මෙතැන් පටන් මෙසේ නොකරවයි කියයි. මෙසේ කීවද ඔවුන්ගේ වචන ගණන් නොගනී. ඉක්බිති ඔහු සමග එකතුව නොසිටිති. එකට හිඳ නොගනිති. ඔහුගේ කරුණු ගැන සාක්ෂි ඇසූවද නොකියති. මෙසේ මිත්‍රයින්ගෙන් නින්දා ලබන්නේ වේ. **ආවාහ විවාහකානං** - ආවාහක නම් යම් ගෙදරකින් දැරියක ගනු කැමැත්තේ. විවාහක නම් යම් ගෙදරකින් දැරියක දෙනු කැමැත්තේ. **අපත්ථිතො හොති** - කැමති නැත්තේ වේ. **නාලං දාර භරණාය** - අඹුවන් රැකීමට අසමර්ථය. මොහුට ගෙයි දැරිය දුන්නද මොහුට ගෙයින් ආවද අප විසින් පෝෂණය කළයුතු වන්නේමය. **ධූත්තා** - දූ කෙළියෙ ඇළුණු. **සොණ්ඩා** - ඉතිරි, බත්, කැවුම්, මුදල්වලට ලොල්, පිපාසා - බීමට ලොල්. නෙකතිකා පිළිරූවලින් වංචා කරන. වඤ්චනිකා ඉදිරියේ දී වංචා කරන. සාහසිකා එක් ගෙයක් වටකොට පැහැර ගැනීම් ආදි සාහසික ක්‍රියා කරන්නෝ. **ත්‍යාසසමිත්තා හොනති** - ඔහුට මිත්‍රයෝ වෙති, අනිත් පුරුෂයන් සමග. සුවඳමල් ආදියෙන් අලංකාර කොට උතුම් ඇඳක තැබූ ඌරා අසූචිවලට මෙන් පවිටු මිතුරන් කරාම යයි. එහෙයින් මෙලොව පරලොව බොහෝ අනර්ථවලට පැමිණෙයි. **අති සීතනති කමම න කරොති** - මිනිසුන් කලින්ම නැගිට හවත, එන්න කර්මාන්තවලට යමු යයි කියන ලද්දේ, ඉතා සීතලයි. තවම ඇට බිඳෙනවා වගේ. ඔබලා යන්න. පස්සේ බලන්නම්. ගිනිතැප සිටියි. ඔව්හු ගොස් කර්මාන්ත කරති. අනිකා ගේ කර්මාන්ත පිරිහෙයි, "අති

උණ්හං'' ආදියෙහි ද මෙ නයම වේ. **හොති පාන සඛා නාමා** - ඇතමෙක් බොන තැන සුරාගෙයි යහළුවෝ වෙති. පනනසඛාති පාඨයි. මෙම අර්ථයම වේ. **සම්මිය සම්මියො** - යාළුවේ කියන්නෝ ඉදිරියේ පමණක් යාළුවෝ වෙති. අනභිමුඛයෙහි වෛරක්කාරයන් මෙන් වැරදිම සොයති. **අත්ථෙසු ජාතෙසු** - එබඳු වැඩක් පැමිණි කල්හි. **වෙරප්පසංගො** - වෛර බහුල බව. **අනත්ථා** - අනර්ථ කරන බව. **සුකදරියතා** - තද මසුරුකම. **උදකම්ව ඉණං විගාහති** - පාෂාණයෙහි ජලය මෙන් ණය අමතක වේ. **රත්තිනුට්ඨාන දසසිනා** - රාත්‍රියෙහි අනුත්සාහ සීලයෙන් **අතිසායම්දං අහු** - දූන් ඉතා බඩගිනි ඇතැයි කියා වැඩ නොකරයි. **ඉතිවිසසට්ඨ කම්මනෙත** - මෙසේ කියා වැඩ අතහැරීම. **අත්ථා අච්චනති මානවෙ** - මෙබඳු වූ පුද්ගලයා අර්ථය (ධනය) හැර යයි. ඉක්මවයි. ඒවායෙහි නොසිටී. **තිණාභියො** - තෘණවලින් ඉහළ. **සො සුඛං විහායති** - ඒ පුරුෂයා, සැපය අත් නොහරියි. සැප සමඟම වේ. මේ කථා මගින් මේ අර්ථයම දක්වයි. ගිහි වීමෙන් මෙපමණ වැඩ නොකළ යුතුයි. කරන්නාට දියුණුවක් නැත. මෙලොව ගැරහීමට පැමිණේ. දූන් යමෙක් එසේ කරන්නේ අනර්ථ උපදී. අනිත් යම්කිසි බියක්. යම් උපද්‍රවයක්. විපතක් ඒ සියල්ල බාලයන් නිසා උපදී. එනිසා එබඳු බාලයන් නො සෙවිය යුතුය. බාල මිත්‍රයන් මිත්‍ර ප්‍රතිරූපකයන් දක්වීමට ''ගෘහපති පුත්‍රය මේ අමිත්‍රයින් සතර දෙනා'' යනාදිය කීහ. එහි **අඤ්ඤදත්ථුහරො** - තමා හිස් අතින් පැමිණ ඒකාන්තයෙන්ම යම්කිසිවක් ගෙනයයි. **වචීපරමො** - වචන පමණකි. වචන මාත්‍රයෙන් දෙන්නෙක් කරන්නෙක් වේ. **අනුප්පියභාණි** - අනුව කියයි. **අපාය සහායො** - සම්පත් විනාශයට සහාය වේ. මෙසේ සතර අමිත්‍රයන් දක්වා නැවත එහි එක එකෙහි කරුණු සතරකින් බෙදන්නේ ''ගෘහපති පුත්‍රය'' යනාදිය කීහ. එහි **අඤ්ඤදත්ථුහරො හොති** - ඒකාන්තයෙන්ම ගෙනියන්නෙක් වේ. යහළුවාගේ ගෙට හිස් අතින් පැමිණ හඳින සලු ආදියේ වර්ණනාව කියයි. මිත්‍රය ඔබ අධිකව මේ වසත්‍රයේ වර්ණනා කරයි කියා වෙන එකක් හැඳ එය ඔහුට දෙයි. **අප්පෙන බහුමිච්ඡති** - යම්කිසි සුළු දෙයක් දී ඔහුගෙන් බොහෝ බලාපොරොත්තු වේ. **භයසසකිච්චං කරොති** - තමාට බියක් ඇතිවුණ කල්හි දාසයෙකු මෙන් ඒ ඒ වැඩ කරයි. මෙතෙම සැමදා නොකරයි. භයක් වූ විට කරයි. ආදරයෙන් නොවේ. ඒ අමිත්‍රයෙක් වේ. **සෙවති අත්ථකාරණා** - මිතුරු දහමින් සේවනය (ආශ්‍රය) නොකරයි. තමාගේ ප්‍රයෝජනයම බලාපොරොත්තුවෙන් ආශ්‍රය කරයි. **අතීතෙන පටිසන්ථරති** - ඊයේ පෙරේදා ආවානම් අපගේ මේ වාරයෙහි

හැල් යව බීජාදිය තබාගෙන මගබලාගෙන සිටියෙමි. අද නම් ඔක්කොම අවසානයි. මෙසේ අතීතයෙන් සංග්‍රහ කරයි. **අනාගතෙන** - මේ වාරයේ අපගේ සස්‍ය බලාපොරොත්තු විය හැකිය. පලබරින් යුක්තය. හැල්ආදිය සස්‍ය සංග්‍රහ කළ කල්හි ඔබට සංග්‍රහ කිරීමට හැකි වන්නෙමු. මෙසේ අනාගතයෙන් සංග්‍රහ කරයි. **නිරත්ථකෙන** - ඇතුපිට හෝ අසුපිට සිටින්නේ යාළුවා දැක පින්වත එන්න මෙහි ඉඳගන්න යයි කියයි. මනාප සලුවක් පෙරවා මගේ යාළුවාට මෙය සුදුසු නැතැයි වෙන එකක් මට නැතැයි කියයි. මෙසේ නිරර්ථකව සංග්‍රහ කරයි. **පච්චුප්පන්න කිච්චෙසු ව්‍යසනං දසෙසති** - කරත්තෙන් මට වැඩක් තිබේ යයි කීකල්හි රෝදෙ කැඩිල අකුර බිඳිල ආදිය කියයි. **පාපකම්පිස්ස අනුජානාති** - ප්‍රාණාති පාතාදියෙහි යම් කිසිවක් කරමු යයි කී කල්හි හොඳයි යාළුවෙ කරමු යයි කියයි. අනුදනියි. යහපත් දේවල ද මෙසේය. **සහායො හොති** - අසවල් තැන සුරා බොති. එහි යමුයි කී කල්හි හොඳයි යමු යයි යයි. සියළු තැන මෙසේය. **ඉති විඤ්ඤාය** - මිත්‍ර ප්‍රතිරූපකයෝ මොවුන් යයි දක්වා මෙසේ දැන මෙසේ ආශ්‍රය නොකරන්න යයි පෙන්වා දැන් ආශ්‍රය කළයුතු කල්‍යාණ මිත්‍රයන් දක්වන්නේ නැවත ''ගෘහපති පුත්‍රය මේ සතර'' යනාදිය කීහ.

එහි සුහදා - සුන්දර හදවත. **පමත්තං රක්ඛති** - මත්පැන් බී ගම මැද හෝ ගම්දොර හෝ මාර්ගයෙහි හෝ වැටී නිදන්නා දැක මෙසේ වැද හොත්තාගේ ඇඳගෙන පෙරවගෙන ඇති ඇඳුම් ගෙනයන්නේ යයි සමීපයෙහි හිඳ ඇහැරුනාම ගෙන යයි. **පමත්තස්ස සාපතෙය්‍යං** - යහළුවා බැහැර ගියේ හෝ සුරා බී හෝ ප්‍රමාදයට පත්වූවහු හෝ ගෙය ආරක්ෂා නැත. කිසිවෙක් යම්කිසි ධනයක් හැරගෙන යන්නේ යයි ගෙට පිවිස ධනය රකියි. **භීතස්ස** - යම්කිසි බියක් ඇති වූ විට මා වගේ යාළුවෙක් ඉන්න කොට භයවන්න එපා යයි මොනවට බිය වෙනවාදැයි බිය නැති කරන්නේ පිළිසරණ වේ. **තද්දිගුණං භොගං** - තමාගේ සැඟවිය යුතු කථා අනුන්ට නොකියා ඔහුටම කියයි. **ගුය්හමස්ස පරිගුය්හති** - ඔහුගේ සැඟවිය යුතු දේ ඉතා හොඳින් රකියි. අනුන්ට එය දැනගැනීමට නොහැකි ලෙස රකී. **ආපදාසු න විජහති** - ආපදාවල දී අත් නොහරියි. **ජීවිතම්පිස්ස අත්ථාය** - තමාගේ ජීවිතය ද ඒ යාළුවාගේ අර්ථය සඳහා පරිත්‍යාග කරන්නේ වේ. තමාගේ ජීවිතය ගණන් නොගෙන ඔහුගේ වැඩ කරයි. **පාපා නිවාරෙති** - අප බලන කල්හි ඔබට මෙසේ කළ නොහැකි වේ. වෛර පහ දස අකුසල කර්ම පථ නොකරවයි වලක්වයි.

**කල්‍යාණෙ නිවෙසෙති** - කලණ දහම් වූ තුන් සරණයෙහි පන්සිල්හි දස කුසල කර්ම පථයෙහි පිහිටුවයි. දන් දෙන්න පින් කරන්න බණ අසන්න මෙසේ යහපතෙහි යොදවයි. **අසසුතං සාවෙති** - නොඇසූවිරූ සියුම් නිපුණ කරුණු අස්වයි. **සගගසස මගගං** - මේ කර්මය කර ස්වර්ගයෙහි උපදී යයි ස්වර්ගයට මගකියයි. **අභවෙනසස න නන්‍දති** - ඔහුගේ අභාවයෙන් දියුණු නොවීමෙන් අඹු දරුවන් හෝ පිරිවර ජනයා හෝ එබඳු වූ පිරිහීමක් දැක හෝ අසා හෝ සතුටු නොවේ අසතුටු සිතැත්තේ වේ. **භවෙන** - දියුණුවෙන් එබඳු වූ සසස සම්පත් හෝ ඓශ්වර්ය ලාභය හෝ දැක හෝ අසා හෝ සතුටු වේ. සිත සතුටු වේ. **අවණ්ණං භණමානං නිවාරෙති** - අභවලා විරූපය. අප්‍රසන්න අධුකුලයේ, දුස් සීලයෙකි කී කල්හි මෙසේ කතා කරන්න එපා යයි හේ රූපවත්ය ප්‍රසන්නය සුජාතය සිල්වත්ය ආදී වචනවල යහළුවා රැක අගුණ කියන්නා වළක්වයි. **වණ්ණ භනමානං පසංසති** - අභවලා ලස්සනය, ප්‍රසන්නය සුජාතය, සිල්වත්ය යයි කී විට අනේ හොඳයි යහපත් වචනම කතා කරයි එසේ ම මේ පුරුෂයා ලස්සනය. ප්‍රසන්නය, සුජාතය, සිල්වත්ය මෙසේ තමාගේ යාළුවා ගැන අනුන් වර්ණනා කරන කල ප්‍රසංසා කරයි. **ජලං අගගීව භාසති** - රාත්‍රියෙහි පර්වත මුදුනේ දිලිසෙන ගින්න මෙන් බබළයි. **භොගෙ සංහරමානසස** - තමාද අනුන් නොපෙළා භෝගයන් දියුණු කරන්නේද රැස් කරන්නේද **භරසෙසව ඉරීයතො** - මී මැස්සා වර්ණ නොතලා මල්වලින් තුඩ බහා රස උරා රෝදයක් පමණ මධුපටල කරයි. එසේ පිළිවෙළින් මහත් භෝග රාශියක් රැස්කරන්නේය. **භොගා සනනිචයං යනති** - ඔහුගේ භෝග රැස් කිරීම වේ. කෙසේද? වේයන් ක්‍රමක්‍රමයෙන් ගොඩනගන්නා වූ තුඹස මෙනි එයින් කීය. **වමමිකො වූපචීයති** - තුඹස ගොඩනැගෙයි. එසේම රැස්කරයි යන අර්ථයි. **සමාහනත්‍වා** - ගෙනවුත්. **අලමතථා** - යුක්ත ස්වභාවය. සමර්ථ වූ හෝ ගිහිගේ තැබීමට දක්ෂතාව. දූන් ගිහි ගෙදර තබාගත යුතු හැටි උපදෙස් දෙන්නේ'' සම්පත් හතරට වෙන්කරන්න'' යනාදිය කීහ. එහි **සචෙ මිතතානි ගණ්හති** - හේ මෙසේ බෙදන්නේ මිතුරු බැඳුම නොබිඳී තබා ගැනීමට සමර්ථ විය යුතුය අනිත්වා නොවේ. **එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය** - භෝගයෙන් එක කොටසකින් ජීවිකාව ගෙන යන්න. **දවිහි කමමං පයොජයෙ** - භෝග කොටස් දෙකක් කෘෂිකර්මය වෙළඳාම ආදි කර්මාන්ත වල යොදවන්න. **චතුත්ථඤ්ච නිධාපෙය්‍ය** - සතරවැනි කොටස තැන්පත් කරන්න. **ආපදාසු භවිසසති** - කුල වනාහි සැමදා එක සමානව නො පවතී. කලක ආපදාද ඇතිවේ. එහෙයින් එබඳු ආපදාවලදී

ගැනීමට එක් කොටසක් තැන්පත් කළයුතු යයි කීහ. මේ කොටස් සතරින් කුමන කොටසක් ගෙනකුසල් කළ යුතුද? ආහාර සඳහා ගන්නා කොටස යයි කියන ලද එයින් ගෙන භික්ෂූන්ට ද දිළින්දන්ටද දන් වශයෙන් දිය යුතුය. පේසකාර කරණවෑම් ආදීන්ට වේතන වශයෙන් දිය යුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙපමණ කථා මගින් ගෘහපති පුත්‍රයාට ආර්ය ශ්‍රාවකයා කරුණු සතරක අකුසලය හැර කරුණු සයකින් වස්තු විනාශ මුඛ දුරුකොට සොළොස් මිතුරන් සෙවිනේ ගිහි ගෙය සංවිධානය කර අඹුදරුවන් පෝෂණය කරන්නේ දැහැමින් සෙමෙන් ජීවත් වෙයි. හේ දෙව්මිනිසුන් අතර ගිනි කඳක් මෙන් බබළයි. අත්හළයුතු සවභාවයන් අත්හැරීම සඳහා සෙවිය ස්වභාවයන් සේවනය සඳහා ද අවවාද දී දූන් නමස්කාර කළයුතු සදිසා දක්වන්නේ ''කෙසේද ගෘහපති පුත්‍රය'' යනාදිය කීහ. එහි **ඡද්දිසා පටිච්ඡාදි** - යම්හෙයකින් සදිසාවලින් පැමිණෙන භය නැතිවේද කැළම වේ. මෙසේ වසන්නේ ඡද්දිසා පටිච්ඡාදි යයි කියනු ලැබේ. **පුරත්ථිමා දිසා මාතා පිතරො** - ආදියෙහි මව්පියන් පෙර උපකාර කළ හෙයින් පෙරදිග යයි දත යුතුය. ගුරුවරු දක්ෂිණා පිළිගැනීමට සුදුසු නිසා දකුණු දිසාවය. අඹුදරුවො පිටුපසින් පැමිණීම් වශයෙන් පැසුළු දිසාවය. මිතුරෝ දුකකදී එතෙර කරවන නිසා උතුරු දිසාවය. දාස කම්කරුවො පාමුල සිටින නිසා යට දිසාවය. ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ගුණයෙන් ඉහළ සිටින නිසා උඩ දිසාව යයි දත යුතුය. **භතො තෙසං භරිස්සාමි** - මම මාපියන් විසින් කිරිපොවා අත් පා වඩා මුහුණේ සොටු ඉවත් කර නහවා සරසා පෝෂණය කරනලදිමි. පිළිදැගුම් කරන ලදිමි. ඒ මම අද මහළු වූ ඔවුන් පා සෝදන නහවන කැඳබත් දීම් ආදියෙන් පෝෂණය කරන්නෙමි. **කිච්චං තෙසං කරිස්සාමි** - මම තමාගේ වැඩ නවත්වා මාපියන්ගේ රාජකුල ආදියෙන් දුන් වැඩ ගොස් කරමි. **කුලවංසං ඨපෙස්සාමි** - මාපියන් සතු කෙත්වත් හිරන්‍ය ස්වර්ණාදිය විනාශ නොකර රකින්නේ ද කුලවංස සංවිධානය කරමි. මාපියන් අධාර්මික දේවලින් හරවා ධාර්මික දේවල තබමි. කුලවංසය රකිමි. මේ සඳහා කියන ලදී. ''කුලවංශය තබන්නෙමි''. **දායජ්ජං පටිපජ්ජාමි** - මා පියෝ තමන්ගේ අවවාදයෙහි නො පිහිටන වැරදියට පිළිපන් දරුවන් විනිශ්චයට පැමිණ අපුත්‍රක කරති. ඔව්හු දායාදයට සුදුසු නොවෙති. අවවාදයෙහි පිහිටන විට කුල සන්තකයෙහි සවාමියන් කරති. මම එසේ පවතින්නෙමි. කැමැත්තෙන් දායාදය ලබමියි කියනලදී. **දක්ඛිණං**

**අනුපදස්සාමි** - ඔවුන්ට පින් අනුමෝදන් කරවා තුන්වන දිනයේ සිට දන් දෙන්නෙමි. **පාපා නිවාරෙන්ති** - පාණාතිපාතාදීන්ගේ මෙලොව පරලොව ආදීනව කියා දරුව, මෙබඳු දේ නො කරන්න යයි වලක්වති. ගරහන්නේ කෙසේද? අනේ පිඬු සිටුතුමා මෙන් අල්ලස් දී හෝ සීල සමාදානාදියෙහි පිහිටුවති. **සිප්පං සික්ඛාපෙන්ති** - තමාගේ අවවාදයෙහි සිටි බව දැන වංශයෙන් පැමිණි මුද්‍රා ගණකාදි ශිල්පයන්හි, හික්මවති. **පතිරූපෙන** - කුල සීල රූපාදියට ගැලපෙන. **සමයෙ දායජ්ජං නීයා‍‍ෂා දෙන්ති** - සුදුසු කාලයෙහි ධනය දෙති. එහි නිත්‍ය හා කාල යයි සමය දෙකකි. සුදුසු කාලයෙහි දෙයි යනු නැගිට මෙය ගන්න මෙය ඔබේ වියදමට වේ. මෙයින් කුසල් කරන්න යයි දෙති. කාල සමයෙහි දෙකි යනු ශික්ෂා තබන, ආවාහවිවාහ දී සමයෙහි දීමයි. තවද අවසාන කාලයෙහි මරණ මඤ්චකයෙහි නිපන්විට මෙයින් කුසල් කරවයි දෙන්නේ ද සමයේ දියති. **පටිච්ඡන්නා** - පෙරදිසාවෙන් භයක් එන්නේද එය නොපැමිණීමට මෙය වසන ලද්දේ වේ. ඉදින් පුත්තු වැරදියට පිළිපන්නෝ නම් මාපියෝ ළදරු කාලයේ දරුවෝ මනාව පිළිපැද මාපියෝ වැරදියට පිළිපන්නේ නම් මාපියන් අනුරූප නොවූ මේ භය එන්නේය. දෙපාර්ශවයම වැරදියට පිළිපන්නෝ නම් ඒ භය දවිධ වේ. යහපත් ලෙස පිළිපන්නෝ නම් ඒ සියල්ල නොවන්නේය. එහෙයින් කියන ලදී ''අභය බිය වැසී ඇත'' මෙසේ ද කියා භාග්‍යවතුන් වහන්සේ සිගාලකට මෙසේ කීහ: ගෘහපති පුත්‍රය, පියා ලෝක සම්මත පෙරදිග නො වඳවයි. මා පියන් පෙරදිගට සමානකොට නමස්කාර කරවයි. මේ ඔබේ පියා පෙරදිග කීවේ අතිකක් නොවේ.

**උපට්ඨානෙන** - ආසනෙන් නැගටීමෙන්, අතවැසියා විසින් ආචාර්වරයා ඇත එනවා දැක ආසනයෙන් නැගිට පෙර ගමන් කොට අතින් භාණ්ඩ ගෙන ආසනය පනවා හිඳුවා පවන් සැලීම් පා ධොවන තෙල් ගැල්වීම් ආදිය කළ යුතුය. ''උට්ඨානෙන'' යයි ඔහු සඳහා කියන ලදී. **උපට්ඨානෙන** - දවසට තුන්වරක් උපසථාන ගමනෙන්. ශිල්ප ලබාගන්නා කාලයෙහි වනාහි අවශ්‍යම දේකට යා යුතුය. **සුස්සූසාය** - අදහා ශ්‍රවණය කිරීමෙන්, නොඅදහා අසන්නේ විශේෂයකට නො පැමිණේ. **පාරිචරියාය** - අවශේෂ කුඩා වතාවත් කිරීමෙන්. අතවැසියා ඇදුරාට කලින් උදේම අවදිව මුවසෝදන පැන් දැහැටි පිළිගන්වා දන් වළඳන විටද පැන් ගෙන අසුනෙන් නැගිට වැඳ යා යුතුයි. **සක්කච්චං සිප්ප පටිග්ගහනෙන** - සකසා ගැනීම නම් ටිකක් ගෙන බොහෝ වරක්

සජ්ඣායනය කොට එක් පදයක් හෝ පිරිසිදුවම ගත යුතුය. **සුවිනීතං විනෙනති** - මෙසේ ඔබල හිඳිය යුතුය. මෙසේ සිටිය යුතුය. මෙසේ අනුභව කළ යුතුය. මෙසේ වැළඳිය යුතුය. පාප මිතුරන් වර්ජනය කළ යුතුය. කලණ මිතුරන් ඇසුරු කළයුතුය. මෙසේ මෙසේ හැසිරීම පුහුණු කරවන්නේ හික්මවයි. **සුගගහීතං ගාහාපෙති** - මෙසේ ඉගැන් වූ දේ හොඳින් ඉගණ ගනී. ඉගෙණ ගත් දෙය අර්ථ ව්‍යඤ්ජන පිරිසිදුව ප්‍රයෝග දක්වා පෙන්විය යුතුය. **මිත්තාමච්චෙසු පටියා දෙනති** - මේ අපේ අතවැසියා ව්‍යාකතය, බහුශ්‍රැතය, මා හා සම සමව සලකන්න යයි මෙසේ ගුණ කථා කොට මිතුරන් කෙරෙහි පිහිටුවයි. **දිසාසු පරිත්තාණ කරොති** - ඔහුට ශිල්ප ඉගැන්වීමෙන් සියළු දිසාවල ආරක්ෂා කරති. උගත් ශිල්පය වනාහි යම් යම් දිසාවලට ගොස් ශිල්ප දක්වයි. ඒ ඒ තැන්වල ලාභ සත්කාර ලැබේ. හේ ආචාර්වරයා විසින් කරන ලදවේ. ගුණ කියන ඔහුට මහ ජනයා ආචාර්යන්ගේ පා දොවා විසූ අනෙතවාසික වත මෙය යයි පළමුව ආචාර්වරයාගේ ගුණ කථා කරති. බ්‍රහම ලෝක ප්‍රමාණයට ඔහුට ලාභ ලැබුනත් ආචාර්වරයා සන්තකම වේ. තවද යම් විද්‍යාවක් ජපකොට යන්නේ වනයෙහි සොරු නොබලති.

අමනුෂ්‍යයන් හෝ දීඝ ජාතීන් (සර්පයන්) ගෙන් පෙළිමක් නැත. පුහුණු කරන්නෝද දීඝායු පිරිත් කරති. හේ යම් දිසාවකට ගියේ ද එයින් සැක උපදවා තමා සමීපයට පැමිණ මිනිසුන් ඒ දිසාවෙහි අපගේ අතවැසියා වසයි. ඔහුගේ ද මගේ ද මේ ශිල්පයෙහි වෙනසක් නැත. එහි යන්න. ඔහුගෙන් අසන්න. මෙසේ අතවැසියා උනන්දු කරන්නේ එහි ලාභ සත්කාර ඉපදවීමට ආරක්ෂා කරති. ප්‍රතිෂ්ඨාව කෙරේ යන අර්ථයයි. මෙහි සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුය.

තුන්වන දිසා වාරයෙහි **සම්මානනාය** - දේව මාතා තිසස මාතා යයි මෙසේ සම්භාවිත කථා කීමෙන්. **අනවමානනාය** - දාසි දස් කම්කරුවන් වෙහෙසවා කියති. මෙසේ පිළිකුල් කොට අවමන් කර නොකීමෙන්. **අනතිචරියාය** - ඇය ඉක්මවා පිටත අන් ස්ත්‍රියක සමග හැසිරෙන්නේ ඉක්මවා හැසිරෙයි. එසේ නොකිරීමෙන් **ඉසසරිය වොසසගෙගන** - ස්ත්‍රීහු වනාහි මහාලතා සමාන ආභරණ ලැබ ආහාරය සෙවීමට නොලබන්නේ කිපෙති. හැන්දක් අතේ තබා ඔබේ කැමත්තෙන් කරන්න යයි උයන ගේ (කුස්සිය) අත්හළ කල්හි සියළු ඉසුරු අත්හළේ නම් වේ. මෙසේ කිරීමෙන් යන අර්ථයයි. **අලඞකාරානුපපදානෙන** -

තමාගේ සම්පත් අනුව අලංකාර දේ දීමෙන්. **සුසංවිහිත කම්මන්තා** - කැඳබත් පිසන කාල ආදිය නොඉක්මවා ඔහට මනාව කිරීමෙහි හොඳින් සංවිධාන කළ කර්මාන්ත. **සුසංගහීත පරිජනා** - හොඳින් සංග්‍රහ කරන ලද සේවක පිරිස. මෙහි පරිජන යනු සවාමියාගෙන් මෙන්ම තමාගේ ඥාතිවරු. **අනතිචාරිණී** - සවාමියා හැර අනිකකු සිතින්වත් නොපැතීම. **සමභතං** - කෘෂිකර්මය වෙළඳාම ආදිය කොට ලබාගත් ධනය. **දක්ඛා ච හොති** - කැඳබත් සැපයීමෙහි දක්ෂ, නිපුණ වේ. **අනලසා** - කුසීත නැති. යම්සේ අන් අය කම්මැලිව හුන් තැනට හිඳිති. සිටිතැන සිටිති. මෙසේ වී පැතිරුණු සිතින් කම්මැලිව හුන් තැනට හිඳිති. සිටිතැන සිටිති. මෙසේ වී පැතිරුණු සිතින් සියළු කටයුතු සම්පූර්ණ කරයි. මෙහි සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුය.

හතරවන දිසා වාරයෙහි **අවිසංවාදනතාය** - යමක් ගනීද එය වාදයක් නැතිව අපේ ගෙයි මෙය ඇත. මෙයද ඇත. ගෙන යන්න යයි විවාදයක් නැතිව දීමෙන්. **අපරපජා තස්ස පටිපූජෙන්ති** - සහකරුගේ දූ පුතුන් ප්‍රජාව නම් වේ. ඔවුන්ගේ දූ පුත්තු සහ මුණුබුරු මිණිබිරියෝ අපර ප්‍රජාව වෙති. ඔව්හු පුදති, ක්‍රීඩා කරති. මමායනය කරති. මංගලාදි යෙහි ඔවුන්ගේ මංගලාදිය කරති. මෙහි සෙස්ස පෙර නයින්ම යෙදිය යුතුය. **යථා බලං කම්මන්ත සංවිධානෙන** - ළදරුවන් කළයුතුදේ මහල්ලන් විසින් මහල්ලන් කළයුතු දේ ළදරුවන් විසින් සත්‍රීන් කළයුතු දෙ පුරුෂයන් විසින්, පුරුෂයන් කළයුතු දෙ ස්ත්‍රීන් විසින් නොකරවා ඔහුගේ මේ චූටි පුතෙකි. මොහු තනිව වාසය කරයි. ඔහුට අනුරූපව සලකා බත් වැටුප් දීමෙන්. **ගිලානුපට්ඨානෙන** - අපහසු කාලයෙහි වැඩ නොකොට සප්පාය බෙහෙත් ආදිය දෙමින් උවටැන් කිරීමෙන්, **අච්ඡරියානං රසානං සංවිභාගෙන** - ආශ්චර්ය මධුර රස ලැබී තමාම අනුභව නොකොට ඔවුන්ට ද එයින් කොටසක් ලැබීමට සංවිධාන කිරීමෙන් **සමයෙ වොස්සග්ගෙන** - කාල සමය කිච්ච සමය යයි වොස්සජ්ජන තිබේ. කාල සමයේ වොස්සජනය (වැඩ අත් හැරීම) නම් දවස පුරා වැඩකරන විට කලාන්තවීමට පෙර වැඩ අත් හැරවීම කාල වොස්සජ්ජනය වේ. නැකත් උත්සව ආදියෙහි අලංකාර බඩු, කන බොන දේ දී වැඩ අත්හැරවීම **දින්නාදායිනො** - සොරෙන් කිසිවක් නොගෙන ස්වාමීන් දෙන ලද දෙයක්ම අරගැනීම. **සුකතකම්මකාරකා** - මේ වැඩේ කිරීමෙන් මට කිසි ලාභයක් නැතැයි අසතුට - අසතුටු වචන නොකියා සතුටු සිතින් ඒ වැඩේ හොඳට

කිරීම. **කිත්තිවණ්ණහරා** - පිරිස මැද කතාවෙන් අපේ ස්වාමියා හා සමාන කෙනෙක් කොහෙ ඇත්ද. අපි අපගේ දාසභාවය නොදනිමු. ඔවුන්ගේ ස්වාමිබවවත් නොදනිමු. මෙසේ අපට අනුකම්පා වෙති යි ගුණකථා ගෙන එන්නෝය. මෙහි සෙස්සද පෙර පරිද්දෙන්ම යෙදිය යුතුය.

**මෙත්තෙන කායකම්මෙන** - ආදියෙහි මෙත්සිත පිහිටුවා කරන කායකම්මාදිය මෛත්‍රිය නමැයි කියන ලදී. එහි භික්ෂූන්ට ආරාධනා කරන්නෙමි යයි විහාරයට යෑම, පෙරහන ගෙන ජල පෙරහන්කඩය, පිට පිරිමැදීම, පා පිරිමැදීම මෛත්‍රී කායකර්ම නම්. භික්ෂූන් පිණ්ඩපාතෙ වැඩිය කල්හි සකසා කැඳ පිළිගන්වන්න, ආහාර පිළිගන්වන්න ආදි වචන ද සාධුකාර දී ධර්මශ්‍රවණ කිරීම, සකසා පිළිසඳරෙහි යෙදීමාදිය මෛත්‍රී වචී කර්ම නම්. අපගේ කුළුපග තෙරුන් වහන්සේ වෛර නැත්තෙක් වෙත්වා. තරහ නැත්තෙක් වෙත්වායි මෙසේ සිතීම මෛත්‍රී සහගත මනෝ කර්ම නම්. **අනාවට ද්වාරතාය** - දොරවල් නොවසා ඇති බව. එහි සියළු දොරවල් විවෘතකර ඇතද සිල්වතුන් ගේ ගෙන යන්නා නොකරන්නේ වැසූ දොරවල් ඇත්තේම වේ. මෙසේ සිල්වතුන් ගෙදරට පැමිණි කල්හි තිබුණු විට නැතැයි නොකියා දිය යුතුය. මෙසේ නොවැසූ දොරවල් ඇතිබව වේ. **ආමිසානුප්පදානෙන** - පෙරබත් කාලයෙහි වැළඳිය යුතු දේ ආමිස නම්. එහෙයින් සිල්වතුන් කැඳබත් සම්පාදනය කිරීමෙන් යන අර්ථයයි. **කල්‍යාණෙන මනසා අනුකම්පන්ති** - සියළු සත්‍වයෝ සුවපත් වෙත්වා රෝග නැත්තෝ වෙත්වා කරදර නැත්තෝ වෙත්වායි මෙසේ යහපත පැතිරවීමෙන් උපස්ථායකයාගේ ගෙදරට වෙනත් සිල්වත් බ්‍රහ්මචාරීන් කුළුණු සිතින් වැඩමවා ගැනීම ද අනුකම්පා නම් වේ. **සුතං පරියොදපෙන්ති** - ප්‍රකෘතියෙන් ඇසූ යම්දෙයක් ඇත්ත ද එහි අර්ථය කියා සැක දුරු කරති කියන ලද්ද පිළිපදවති. මෙහි සෙස්ස පෙර මෙන් යෙදිය යුතුය.

**අලමත්ථො** - අඹුදරුවන් පෝෂණය කොට ගිහිගෙයි විසීමට සමත්. **පණ්ඩිතො** - දිසා වඳින ස්ථානයෙහි පණ්ඩිතයෙක්ව. **සණ්හා** - සියුම් අරුත් දැකීමෙන්, මෘදු වචන කතා කිරීමෙන් හෝ. **පටිභාණවා** - දිසා වඳින ස්ථානයෙහි ප්‍රතිභාණයෙක්ව. **නිවාත වුත්ති** - යටත්පහත් පැවැත්ම. **අත්ථද්ධො** - තද නැති. **උට්ඨානකො** - උට්ඨාන වීර්ය සම්පන්නව. **අනලසො** - කුසීත නැති. **අචඡිද්දවුත්ති** - නිතර කිරීම් වශයෙන් කඩ

නොවූ වෘත්තිය. **මෙධාවී** - ස්ථානෝචිත නුවණ. **සංගාහකො** - සතර සංග්‍රහ වසතුවෙන් සංග්‍රහ කිරීම. **මිත්තකරො** - මිතුරන් සොයන්නේ. **වදඤ්ඤූ** - පෙර කරන කියන වචන දනී. මිතුරාගේ ගෙට ගිය කල්හි යාළුවාගේ ජටාව මට දෙන්න. සලුව දෙන්න. මිනිසුන්ට බත් වැටුප් දෙන්න. කියූ වචන සිහි කරන්නේ ඔහු තමාගේ ගෙට පැමිණි කල්හි එපමණ හෝ ඊට අතිරේකයකින් පෙරළා කරයි යන අර්ථය වේ. තවද යහළුවාගේ ගෙට ගොස් මෙය නම් ගන්නෙමියි පැමිණි මිතුරා කීමට ලැජ්ජාවෙන් නොහැකි වන්නේ නොකිව යුතු වූ තමාගේ වචනය දන යමක් සඳහා ඔහු පැමිණියේ නම් එය සපයා දෙන්නේ වදඤ්ඤූ නම් වේ. මිතුරාගේ අඩුපාඩු දැක ඒවා දෙන්නේ ද වදඤ්ඤූ නම් වේ. **නෙතා** - යම් යම් අර්ථ දක්වන්නේ පෙන්වා දෙන්නේ පමුණු වන්නේ නේතා. විවිධ කරුණු දක්වන්නේ පමුණු වන්නේ නෙතා. හික්මවන්නේ විනෙතීති **විනෙතා** - වේ. නැවත නැවත පමුණු වන්නේ **අනුනෙතා** - වේ. **තත්ථ තත්ථ** - ඒ ඒ පුද්ගලයන් කෙරෙහි. **රථස්සාණීව යායතො** - කඩ ඇණය තිබෙන තුරු රථය යයි. නැති විට නොයයි. මෙසේ මේ සංග්‍රහ තිබෙන කල්හි ලොව පවතී. නොමැති කල්හි නොපවතී. **මානං පූජංවා න මාතා පුත්තකාරණා** - ඉදින් මව මේ සංග්‍රහයන් පුතුට නොකරේද? පුතා ගේ කරුණු වන ගරු කිරීම හෝ පිදීම හෝ මව නොලබන්නේය. **සංගහා එතෙ** - මේ සංග්‍රහ සංගහෙ එතෙ යනු ද පාඨයකි. **සමෙපක්ඛන්ති** - මනාව බලති. **පාසංසා ච භවන්ති** - ප්‍රශංසාවද වෙති. ගෘහපති පුත්‍රය, යම් දිසා සඳහා ඔබට ඔබගේ පියා කීවේද මේ ඒ දිසා හය වේ. ඉදින් පියා ගේ වචනය අනුව කරන්නේ නම් මේ දිසාවලට නමස්කාර කරවයි දක්වන්නේ සිඟාලගේ ප්‍රශ්නය මත සිට මේ දේසනාව මුදුන් පමුණුවා රජගහ නුවරට පිඬුපිණිස වැඩියහ. සිගාල ගෘහපති පුත්‍රයාද සරණ ශීලයෙහි පිහිටා හතලිස් කෝටියක් ධනය බුද්ධ සාසනයෙහි විසුරුවා පින්කම් කොට ස්වර්ග පරායන විය. මේ සූත්‍රයෙහි වනාහි ගිහියන් විසින් කළයුතු වැඩකටයුතු සියල්ල මෙහි දේශනා කරන ලදී. එහෙයින් මේ සූත්‍රාන්තය ගිහි විනය නම් වේ. මේ සූත්‍රය අසා මේ අනුව කටයුතු කරන්නාට දියුණුවක් මිස පිරිහීමක් නොවේ.

**සිඟාලෝවාද සූත්‍ර වර්ණනාව නිමි.**

# 3 - 32

## ආටානාටිය සූත්‍ර වර්ණනාව

ආටානාටිය සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. එහි පෙර නො ආ වචන වර්ණනාවයි මේ. **චතුද්දිසං රක්ඛං ඨපෙත්වා** - අසුර සේනාව වලක්වනු පිණිස ශක්‍රදේවේන්ද්‍රයාට සතර දිසාවෙහි ආරක්ෂාව සලසා. **ගුම්බං ඨපෙත්වා** - බල සේනා තබා. **ඔවරණං ඨපෙත්වා** - සතර දිසාවෙහි දිසා ආරක්ෂකයින් තබා. මෙසේ ශක්‍ර දෙවියන්ට ආරක්ෂාව සංවිධානය කොට ආටානාටං නගරයෙහි වැඩසිටි සත් බුදුවරුන් අරබයා මේ පිරිත බැඳ යමෙක් ශාස්තෲ ධර්මයෙහි අණ ද අපගේ රජතුමාගේ අණ නො අසත්. ඔවුන්ට මේ මේ දෑ කරන්නෙමු යයි ශ්‍රවණය කොට තමන්ගේ සතර දිසාවල. ''මහතියා ච යක්ඛ සේනාය'' යනාදියෙන් සේනා සතරකින් ආරක්ෂාව සංවිධානය කොට ''අභික්කන්තාය රත්තියා......එකමන්තං නිසීදිංසු''. මෙහි අභික්කන්ත වචනය, ඛය - ක්ෂයවීම, සුන්දර, අභිරූප-ලස්සන, අබ්භනුමොදනා - පින් අනුමෝදන් කරවීම යනාදියෙහි පෙනේ. එහි ''අභික්කන්තා භන්තෙ රත්තියා....යනාදියෙහි ක්ෂයවීමෙහි පෙනේ. ''අයං ඉමෙසං පුග්ගලානං.... ආදියෙහි සුන්දර අරුත්හි පෙනේ.

ඉඳු යසින් දිලිසෙන - කවරෙක් මගෙ පා වඳී
හැම දෙස් එකළුකර - මනහර රුවින් බබළන

මේ ආදියෙහි ලස්සන රූපයෙහි, ''අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම'' මේ ආදියෙහි පින් අනුමෝදනාවෙහි. මෙහි වනාහි ක්ෂයවීමෙහිය. එයින් අභික්කන්තාය රත්තියා-රාත්‍රිය ගෙවී යන විට යයි කියන ලද්දේ වේ. **අභික්කන්ත වණ්ණා** - මෙහි අභික්කන්ත ශබ්දය අභිරූපයෙහිය. වණ්ණ ශබ්දය වනාහි, ඡවි-සම, ථුති-ස්තුතිය,, කුලවග්ග-කුලවර්ග සණ්ඨාපන- සටහන, පමණ- ප්‍රමාණය, රූපායතන ආදියෙහි පෙනේ. එහි ''සුවණ්ණ වණ්ණොසි භගවා,[1] මේ ආදියෙහි සමෙහි. කදා සඤ්ඤූළ්හා පන තෙ සමණස්ස ගොතමස්ස වණ්ණ''[2] මේ ආදිය ස්තුතියෙහි. ''චත්තාරො මෙ භො ගොතම වණ්ණා''[3] මේ ආදිය කුලවර්ගයෙහි. ''මහන්තං හත්ථිරාජ වණ්ණං නිම්මිනිත්වා''[4] මේ ආදිය

සටහනෙහි ''තයො පතතසස වණ්ණා''[5] මේ ආදිය ප්‍රමාණයෙහි ''වණ්ණො ගන්‍ධො රසො ඔජා''[6] මේ ආදිය රූපායතනයෙහි. මෙහි සම දක්වේ.

එහෙයින් අභික්කන්‍තවණ්ණා - අභිරූප - ඡවි යයි කියන ලද්දේ වේ. කෙවලකප්පං - මෙහි 'කෙවල' ශබ්දයඃ අනවසෙස - සම්පූර්ණ, යෙභුය්‍යත - බොහෝ ඇති බව, අව්‍යාමිස්සකතා - අමිශ්‍ර බව, අනතිරෙකතා - අධික නැති ගාළ්හත්ථතා - දැඩි අරුත් ඇති බව, විසංයොග - විසං යොගයෙහි ආදී අනේක අර්ථ ඇත. එසේම [1]''කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං'' මේ ආදියෙහි සම්පූර්ණයෙන්ම යන අරුත් වේ. [2]කෙවල කප්පා ච අංග මගධා පහුතං ඛාදනීයං භොජනීයං ආදාය අභික්කමිතුකාමා හොන්‍ති'' මේ ආදියෙහි බොහෝ සෙයින් අර්ථයෙහි වේ. [3]''කෙවලස්ස දුක්ඛක්ඛන්‍ධස්ස සමුදයො හොති'' මේ ආදියෙහි අමිශ්‍ර බව වේ. [4]''කෙවලං සද්ධාමත්තං නූන අයමායස්මා'' මේ ආදියෙහි අධිකනැතිබව [5]'ආයස්මතො අනුරුද්ධස්ස බාහිකො නාම සද්ධි විහාරිකො කෙවලකප්පං සංඝභෙදාය ඨිතො'' මේ ආදියෙහි දැඩි බව සඳහා. [6]''කෙවල වුසිතවා උත්තම පුරිසොති වුච්චති මේ ආදියෙහි විසංයොගයෙහි. මෙහි වනාහි අනවසෙස අර්ථය කැමති වේ. කැප ශබ්දය වනාහි අභිසද්දහන - විශ්වාස කිරීම, වොහාර - ව්‍යවහාරය, කාලො - කාලය, පඤ්ඤත්ති - පැනවීම, ඡෙදන - සිඳීම, විකප්ප - විකල්ප, ලෙස - ස්වල්පයක්. සමන්‍ත - හාත් පස මේ ආදි අනේක අර්ථ ඇත. [1]''තථාභිසස ඔකප්පනීයමෙතං භොතො ගොතමස්ස යථා තං අරහතො සම්මා සම්බුද්ධස්ස'', මේ ආදියෙහි විශ්වාස කිරීම. [2]''අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණ කප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං'' මේ ආදියෙහි ව්‍යවහාරය [3]''යෙනපන සුදං නිච්ච කප්පං විහරාමි'' මේ ආදියෙහි කාලය. [4]''ඉච්චායස්මා කප්පො'' - පැනවීම. [5]''අලංකතො කප්පිත කෙසමස්සු'' - ඡෙදනයෙහි. [6]''කප්පති ද්වඞ්ගුලකප්පො'' - විකල්පයෙහි. [7]''අත්ථි කප්පො නිපජ්ජිතුං'' ස්වල්පයෙහි. කෙවලකප්පං'' [8]''වෙළුවනං ඔභාසෙත්වා'' - හාත්පස. මෙහි වනාහි හාත්පස අභිප්‍රේතය. එහෙයින් කෙවලකප්පං ගිජ්ඣකූටං යනු ගිජුකුළු පව්ව හාත්පස. ඔභාසෙත්වා - වස්ත්‍රාභරණ සහ ශරීරයෙන් නිකුත් එළිය පතුරවා. සඳමෙන් හිරු මෙන් එකම ආලෝකයක් එකම පහනක් කොට

1. භාග්‍යවතුන් වහන්සේ රත්වන්ය සම රත්පාටය. 2. ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ කීර්තිය හැමතැනම පැතිරේ. 3. භවත් ගෞතමයෙනි, මාගේ වර්ණ සතරකි. 4. මහත් ඇත් රජකු මවා. 5. පාත්‍රයෙහි වර්ණ තුනකි. 6. වර්ණ ගන්ධ රස ඕජා.

යන අර්ථයයි. **එකමන්තං නිසීදිංසු** - දෙවියන් බුදුන් වහන්සේ ලඟ හිඳගත් තැනක් නොවීය. මේ සූත්‍රයෙහි පිරිතට ගෞරව වශයෙන් හිඳගත්හ. **වෙසසවණො** - සතර වරම් රජවරු පැමිණිය ද වෙස්සවණ වනාහි බුදුරදුන්ගේ විශ්වාසිකයෙකි. කථා පැවැත්වීමේ ව්‍යක්තයෙකි. ශික්ෂිතයෙකි එනිසා වෙස්සවණ මහරජ බුදුරදුන්ට මෙසේ කීය. **උලාරා** - මහේසාක්‍ය, ආනුභා සම්පන්න. **පාණාතිපාතා වෙරමණියා** - ප්‍රාණඝාතයෙහි මෙලොව පරලොව ආදීනව දක්වා එයින් වෙන්වීමට දහම් දෙසයි. සෙස්සෙහි ද මෙම නයයි.

**තත්‍ර සනති උලාරා යකඛා නිවාසිනො** - ඒ සේනාසනවල බලසම්පන්න යක්කු නිතරම සිටිති. **ආටානාටියං** - ආටානාට නගරයෙහි බදධ වූ බැවින් මෙසේ නාමය. භාග්‍යවතුන් වහන්සේට ප්‍රත්‍යක්ෂ නොවූ ධර්මයක් ඇත්ද? නැත. වෙස්සවණ භාග්‍යවත් වහන්සේ ඉගෙන ගන්න යයි කුමක් හෙයින් කීවේද? අවකාශ ලබාදීම සඳහා හේ වනාහි භාග්‍යවතුන් වහන්සේට මේ පිරිත ඇසීමට අවකාස ලබා දෙන්නේ මෙසේ කීය. ශාස්තෲන් වහන්සේ මෙය දේශනා කළ කල්හි ගෞරවයක් වන්නේ යයි ද කීය. **ඵාසු විහාරාය** - ගමනාදි සිව් ඉරියව්වෙහි පහසු විහරණය සඳහා. **චකඛුමනතසස විපසසි පමණක්** නොව සත් බුදුවරයෝම චක්ඛුමන්තයහ. එහෙයින් එක් එක් බුදුන්ට හත හත නම් වේ. සියළුම බුදුවරු චක්ඛුමන්තයහ. සියල්ලෝම සියළු සතුන්ට අනුකම්පා කරති. සියළු දෙනා වහන්සේ කෙලෙස් නැසූ හෙයින් නහාතක වෙති. මාරසේනා පැරදවූහ. වැස නිම වූ බ්‍රහම චර්යා ඇත්තාහ. මිදුනහ. සියල්ලෝ අංගවලින් රස් විහිදුවන නිසා අංගීරසයහ. බුදුවරුන්ට මේ නම් හත පමණක් නොව ගුණ සහිත මහේසීවරුන්ට නම් අසංඛ්‍ය ගණන් වේයයි.

---

කෙවල

1.හාත්පිසින්ම පරිපූර්ණ වූ පිරිසිදු වූ බ්‍රහමචර්යාව. 2.අඟු මගද දෙරට බොහෝ කැම් බීම්වලින් යුක්ත වේ. 3.හුදු ස්කන්ධයෙහි හට ගැනීම වේ. 4.මේ ආයුෂ්මතුන් වහන්සේ ශ්‍රද්ධාව පමණක්. 5.ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ගේ බාහික නම් සද්ධිවිහාරකියා සංඝ භේද සඳහා සිටියේය. 6.විසූ උතුම් පුරුෂයා.

කපප

1.භවත් ගෞතමයන් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ මෙය විශ්වාස කරන්න. 2.මහණෙනි. ශ්‍රමණයන් විසින් පල පසක් අනුභව කිරීමට අනුදනිමි. 3.යමකින් වනාහි නිතරම වෙසෙමි. 4.ආයුෂ්මතුනි මෙහි නියම කෙරේ. 5.කෙස්රැවුල් බෑමෙන් අලංකාර වූ. 6.අඟල් දෙකක් කැපයි. 7. වැදහෙවීමට සවල්පයක් ඇත. 8.වේළුවනාරාමය හාත්පස බබුළුවා.

කියන ලදී. වෙස්සවණ වනාහි තමාට ප්‍රකට නම් වශයෙන් මෙසේ කීය. තෙ ජනා - මෙහි රහතන්වහන්සේය. ''අපිසුණා'' මෙය දේශනා ශීර්ෂ මාත්‍රයකි. සත්‍ය, අපිසුණ, ප්‍රිය, මිතභාණී (පමණ දැන කතා) යන අර්ථ වේ. මහනතා - මහත් බවට පැමිණි. මහතතා යනු ද පාඨයි. මහත් යන අර්ථයයි. වීතසාරදා - නිසසසාරද, බිය නැති. හිතං - මෛත්‍රී පැතිර වීමෙන් හිතවූ. යං නමසසනති - මෙහි යං යනු නිපාතයකි. මහතතං - මහනතං මෙයම හෝ පාඨයයි. මෙය කියන ලදී. ලොව යමෙක් කෙලෙස් නිවුමෙන් නිමුනේ යථාර්ථය දක්කහ. විජ්ජාදි ගුණ සම්පන්න වූ දෙවිමිනිසුනට හිත වූ ගෞතමයන් වඳිති, ''තෙ ජනා අපිසුණා'' ඔව්හු ද වඳිති. ''තෙජනා අපිසුණා අටුවාවෙහි ඒ බුදුවරුන්ගේ වර්ණනාව කරන ලදී. එනිසා පළමු ගාථාව සත් බුදුවරුන් උදෙසා කියන ලදී.

දෙවන ගාථාවෙන් ''ගොතමං'' දේශනා ආරම්භයයි. මෙයද සත්දෙනාගේ වශයෙන් කියන ලදැයි දත යුතුය. මේ අර්ථය වනාහි ලොව නුවණැත්තෝ දෙවිවරු ගෞතමයන් වඳින්නේ ඒ හා සමාන වූ බුදුවරු වඳිති. යතො උගගචඡති - යම් තැනකින් උදාවේ. ආදිචෙචා - අදිතිය ගේ පුතා. සමානාර්ථ වචනයකි මේ සූරිය ශබ්දයට. මහත් වූ මණ්ඩලයක් එයට ඇත්තේ යයි මණ්ඩලී මහා යනු වේ. යසසවුගගතෙ - යමෙක් උදාවූ කල රහදො - ජලවිල, තඤ්ඤ - සූර්ය උදාවන තැන. සමුදෙදා සරිතොදකො - පැමිණි ජලය, නොයෙක් නදී ජලය මෙයට පිවිසේ. හෝ ගංගා ජලය, එවං නං තඤ්ඤ ජානනති - එහි ඒ ජලය මෙසේ දනී. ඉතො - මහාමේරුවෙන් හෝ එය පිහිටි සථානයෙන් හෝ ජනො - මේ මහජනයා. එකනාමා - ඉන්‍ද්‍ර යයි එක් නමක්. සියල්ලෝම ඔවුන්ගේ සක්දෙව්රජුගේ නාමයම නම් කළහ. අසීතිං දස එකො ච - අනූ එකක් ජනයා. ඉඥනාමා - ඉන්‍ද්‍ර යන නම් බුදධං ආදිචච බන්‍ධුනං - කෙලෙස් නැති කිරීමෙන් ප්‍රබුදධ වූ, ආදිචච හා සමාන ගෝත්‍ර ඇති බැවින් ආදිචචබන්‍ධු නං වේ. කුසලෙන සමෙකඛසි - අනවද්‍යයෙන්, දක්‍ෂතාවෙන් හෝ සර්වඥතා ඥානයෙන් මහජනයා බැලූහ. අමනුසසා පි තං වඥනති - අමනුෂ්‍යයෝ ද සර්වඥතාඥානයෙන් ජනයා බැලූහයි කියා වඳිති. සුතං නෙතං අභිණහසො - අප විසින් මෙය නිතර අසන ලදී. ජිනං වන්දථ ගොතමං ජිනං වඥාම ගොතමං - අප විසින් අසන ලද ගෞතම ජින වඳිමු යයි වඳිති. යෙන පෙතා පවුචචනති - ප්‍රේත නම් කළුරිය කළ අයයි. ඔව්හු යම් පැත්තකින් පිටත් කරවයි කියති. පිසුණා

**පිට්ඨිමංසිකා** - කේළාම් වචන මෙන්ම පිටිමස කන්නා සේ නැති තැන ගරහන්නෝද මොව්හුද යමකින් පිටත් කරවයි කියති. දකුණු දොරටුවෙන් පිටත් කොට නගරයේ දකුණු පැත්තෙන් දවනු හෝ සිදි. කපනු හෝ ලැබේවා යයිද මෙසේ කියයි. **ඉතො සා දක්ඛිණ දිසා** - දකුණු දිසාවත් ඔව්හු ද ඒ පිටමස්කන්නෝද බැහැර කරවනු යයි කියනු ලැබේ. මේ දකුණු දිසාව මහමෙරින් හෝ ඔවුන් සිටින්නා වූ තැනින් හෝ. **කුම්භණ්ඩානං** - මහත් බඩවල් ඇති දෙවිවරුය. ඔවුන්ගේ රහස් අංගද කලයක් මෙන් මහත් වේ. එහෙයින් කුම්භණ්ඩ යයි කියනු ලැබේ. **යත්‍ථ චොග්ගච්ඡති සුරියො** - හිරු බැසයන දිසාව. **යෙන** - යම් දිසාවකින් **මහානෙරු** - මහාමෙරු පර්වතය. **සුදස්සනො** - රන්වන් නිසා සොඳුරු දසුන් ඇති. මහාමේරුවේ පෙර දිසාව රිදීය. දකුණු දිසාව මැණික්ය. බටහිර දිසාව පලිඟුය. උතුරු දිසාව රත්රන්ය. එය මනෝඥ දර්ශන වේ. **මනුස්සා තත්‍ථ ජායන්ති** - එහි උතුරුකුරුවෙහි මිනිස්සු උපදිති. **අමමා** - වස්ත්‍රාභරණ කෑමබීම ආදියෙහි මමත්‍වය නැති. **අපරිග්ගහා** - ස්ත්‍රීන් පාවා නොගෙන. ඔවුන්ගේ වනාහි මෝ තොමේ මගේ භාර්යාව යයි මමත්වයක් නැත. මව හෝ සහෝදරිය හෝ දූක ඡන්දරාගය නො උපදී. **නපි නීයන්ති** - නගුල් එහි කෘෂි කර්මය කරන්නෙමු කුඹුරට නොගෙනයති. **අකට්ඨපාකිමං** - වනයෙහි නොසාන ලද බිම් කොටසක තමාම හටගත් (සංයජාත) හාල්ම එහි පලය වේ. **තණ්ඩුලප්ඵලං, තුණ්ඩිකීරෙ පචිත්‍වාන** - හැලියෙහි දමා දුම් නැති අඟුරු ගින්නෙන් පිස, එහි දල්වෙන ගල් වේ. ඉක්බිති ඔව්හු ගල් තුනක් තබා එහි හැලිය තබා ගල්වලින් ගිනි ඇති වී එය පිසයි. **තතො භුඤ්ජන්ති භොජනං** - ඒ හැලියෙන්ම භෝජන අනුභව කරති. වෙනත් සූපයක් හෝ ව්‍යඤ්ජනයක් හෝ නැත. අනුභව කරන්නන්ගේ කැමත්ත පරිද්දෙන්ම රසය ඇතිවේ. ඔව්හු එහි පැමිණෙන්නන්ට ද දෙන්නේමය. මසුරු සිතක් ඔවුන්ගේ නැත. මහත් සෘද්ධි ඇති පසේ බුදුවරු එහි ගොස් පිණ්ඩපාතය ලබාගනිති. **ගාවිං එකඛුරං කත්‍වා** - එහි වෙස්සවන ගේ පිරිවර යක්කු එලදෙනක ගෙන එක්කුර වාහනයක් කොට පිටට නැගී **දිසොදිසං අනුයන්ති** - ඒ ඒ දිසාවලට යති. **පසුං එක ඛුරං කත්‍වා** - දෙන පමණක් නොව සෙසු සිව්පා සතුන්ද එක්කුර වාහන කොට ඒ ඒ දිසාවල යති. **ඉත්‍ථී වාහනං කත්‍වා** - බොහෝ සෙයින් ගැබිනි ගැහැණිය වාහනය කොට ඇගේ පිටේ නැගී යති. ඇගේ පිට නැමීම ඉවසයි. සෙසු ස්ත්‍රීන් යානයෙහි යොදති. **පුරිස වාහනං කත්‍වා** - පුරුෂයන් ගෙන යානයෙහි යොදති. සම්‍යක් දෘෂ්ටිකයන්

ගැනීමට නොහැකි වෙති. බොහෝ සෙයින් ප්‍රත්‍යන්තවල මෙලච්ඡ ජාතිකයන් ගනිති. මේ ජනපදයෙහි එක්තරා අයෙක් එක්තරා තෙරුන් වහන්සේ කෙනෙකුගේ සමීපයෙහි හිඳ නිදයි. තෙරුන් වහන්සේ උපාසක බොහෝ වේලා නිදන්නේදැයි ඇසූහ. සවාමීණි, වෙස්සවනගේ දාසයින් මුළු රැයම බොහෝ වෙහෙස කළහයි කීය. **කුමාරි වාහනං කත්වා** - ගැහැණු ළමයින් ගෙන එක්කුර වාහන කොට රථයෙහි යොදති. කුමාර වාහනයෙහිද මෙම නයයි. **පචාරා තසස රාජිනො** - ඒ රජුගේ පිරිවර. **හත්ථියානං අසස යානං** - ගව යාන පමණක් නොව ඇත් අස් යානාදියෙහි ද නැගී යති. **දිබ්බං යානං** - වෙනත් බොහෝ දිව්‍ය යාන ද වේ. ඒවා ඔවුන්ගේ උපකල්පන යානා වේ. ඒවා පහයේ සයනෙහිම නිපන්නා වේ. කුසත් කළ පුටු සිවිකා ආදියෙහි හුන්නෝද ඒවායින් යති. එහෙයින් කියන ලදීඃ **පාසාදා සිවිකා චෙව. මහාරාජසස යසසසිනො** - මෙසේ අනුභාසම්පත් කීර්ති ඇති මහරජුගේ මේ යානා පහළ විය. **තසස ච නගරා අහු අනතලිකෙඛ සුමාපිතා** - ඒ රජුට ආකාසයෙහි මවන ලද මේ ආටානාටාදි නගර විය. එක් නගරයක් ආටානාට නම් විය. එකක් පරකුසිනාටා විය. එකක් නාටපුරියා විය. එකක් පරකුසිත නාටා විය. **උත්තරෙන කපීවනෙතා** - එහි සිට කෙලින් උතුරු දිසාවෙහි කපීවන්ත නම් නගරයකි. **ජනොසමපරෙන ච** - ඒවාට පසුව ජනෝස නම් වෙනත් නගරයකි. **නවනවතියො** - නවනවතිය නම් නගරයක්. **අමබර අමබරවතියො** - අම්බර අමබරවතියො නම් නගරයක්. **ආලකමන්‍දා** - ආලකමන්දා නම් රාජධානිය. **තසමා කුවෙරො මහා රාජා** - මෙතෙම වනාහි බුදුන් ඉපදීමට පෙර කුවේර නම් බ්‍රාහමණයෙක්ව උක් වගා කරවා යන්ත්‍ර හතක් යෙදවීය. එක් සාලාවකින් ලබාගත් අය (ආදායම) පැමිණි මහාජනයට දී පින් කෙළේය. අවශේස ලාබ වශයෙන් එහි බොහෝ ආදායම ඇති විය. හේ එයින් පැහැදී සෙසු සාලාවල ආදායමද ගෙන විසිදහසක් අවුරුදු දන් දුන්නේය. හේ කළුරිය කොට චාතුර්මහා රාජිකයෙහි කුවෙර නම් දෙව්පුත්ව උපන්නේය. පසු කාලයක විසානා රාජධානියෙහි රජය කෙළේය. එතැන් පටන් වෙසසවණ යයි කියනු ලැබේ. **පචෙචසනෙතා පකාසෙනති** - සොයා බලා වෙන වෙනම අර්ථ පරීක්‍ෂා කර අනුසාසනා කරන්නේ අන්‍ය යක්‍ෂයින් දොළොස් දෙනෙක් ප්‍රකාශ කරති. ඒ යක්‍ෂ රථියිකයෝ අනුශාසනාව ගෙන යක්‍ෂ දොරටුපාලකයන් දොළහකට නිවේදනය කරති. දොරටු පාලයෝ ඒ පණිවිඩය මහරජතුමාට සැලකරති. ඒ රටවැසි යකුන්ගේ නම් දක්වන්නේ

''තතොලා' ආදිය කීය. ඔවුන් අතරෙන් එකෙක් තතොලා - වේ. එකෙක් තත්තලා - එකෙක් තතොතලා, ඔජසී, තෙජසි. තතොජසී, සරෝරාජා, රාජා, සූරොරාජා, අරිට්ඨො, නෙමි, අරිට්ඨො නෙමි - ඔවුන් ගේ නම් වේ.

රහදොපි තත්‍ථ ධරණී - එහි ධරණී නමින් විලක් ඇත. පනස් යොදුන් මහ පොකුණක් ඇතැයි ද කියනු ලැබේ. යතො මෙඝා පවස්සන්ති - පොකුණෙන් ජලය ගෙන මේඝය වැසි වස්සයි. වස්සා යතො පතා යන්ති - වැස්ස තෙමාගෙන පැතිර යයි. වැසි පටන්ගත් කල්හි පැරණි ජලය පොකුණෙන් බැසයයි. වැස්ස නැගී අළුත් ජලයෙන් පොකුණ පුරවයි. පැරණි ජලය යටින් නැඟී සිට නික්මෙයි. පොකුණ පිරුණු පසු වැහි වලාකුළු ඉවත් වෙයි. සභාපි - පොකුණු තීරයෙහි භගලවතී වැල්වලින් වටවූ දොලොස් යොදුන් රුවන් මණ්ඩපයක් ඇත. ඒ සඳහා කියන ලදී. පයිරුපාසන්ති - හිඳිති තත්‍ථ නිච්චඵලා රුක්ඛා - ඒ මණ්ඩපය පිරිවරා සැමදා පලදරණා, අඹ දඹ ආදි ගස් හා මල්පිපුණු සල්ගස් ආදිය ඇත. නා නා දිජ ගණා යුතා - විවිධ පක්ෂි සමූහ ගැවසුනා වූ මයූර කොඤ්චාභිරුදා - මොනරුන් ද කොස්වා ලිහිණියෝ ද කැමැති සේ නාද කරයි. ජීවංජීවක සද්දෙත්‍ථ - මෙහි ජීවංජීව කුරුල්ලන්ගේ ද නාද ඇත. එහි උට්ඨව, චිත්ත, පක්ෂීහු ද හැසිරෙති. කුකුත්ථකා - වලිකුකුලන්, කුලීරකා - රත් කකුළුවෝ පොක්ඛරසාතිකා - එනම් පක්ෂීහු. සුකසාලික සද්දෙත්‍ථ - ගිරවුන්ගේ සහ සැළලිහිණියන්ගේ ශබ්ද, දණ්ඩමාන වකානි ච - මිනිස් මුව ඇති පක්ෂීහු - ඔව්හු දැතින් රන් දඬුවක් ගෙන එක් පොකුරු පතක් (නෙළුම් කොලය) ඉක්මවා ඊළඟ පත්‍රයෙහි රන් දඬුව තබා හැසිරෙති. සොභති සබ්බකාලං සා - ඒ පොකුණ සැමදා සෝභන වේ. කුවෙර නලිනී - කුවේරයාගේ පියම්විල ධරණී නම් වේ. මේ පොකුණු නිතර සෝභමාන වේ. යසස කසසචි - වෙස්සවණ මේ ආටානාටිය අවසන් කොට එහි පරිකර්ම (කළයුතු දේ) දක්වන්නේ කීය. එහි මනාව ඉගෙණගත යුතුය. අර්ථ ව්‍යඤ්ජන පිරිසිදු කොට මනාව උගත යුතුය. සමන්තා පරියාපුතා - පද ව්‍යඤ්ජන නොනසා උගත යුතුය. අර්ථය ද පෙළද වෙන්කොට හැම අතින් ම ගුණ නැතිව සජ්ඣායනය කිරීමෙන් පිරිතෙහි තෙදවත් බව ඇති නොවේ. ලාභ අපේක්ෂාවෙන් ඉගෙණ කියනවිට ද එහි අරුත නොලැබේ. තිසරණගතව මේ පිරිත මෛත්‍රිය පෙරටුකොට කීමෙන් ගුණ ලැබේ. යක්ඛපචාරො - යක්ෂ පිරිවර. වත්‍ථුං

වා - ගෘහ වස්තුව. **වාසංවා** - එහි නිතර වාසය. **අවිවයහ** - විවාහ යුත්. ඔවුන් සමග ආවාහ විවාහ නොකරනු යන අර්ථයයි. **අතනාහිපි පරිපුණණාහි** - නිල්පාට ඇස් නිල් දත් මොවුන්ගේ සවභාවය පෙන්වා කියන ලදී. අක්ෂර ශුද්ධියෙන් **පරිභාසාහි පරිභාසෙයාං** - යක්ෂ ආක්‍රෝසයෙන් ආක්‍රෝස කරන්නෝ ය යන අර්ථ ගනී. **රිත්තම්පි පත්තං** - භික්ෂූන්ගේ පාත්‍රයට සමාන ලෝහ පාත්‍රයක් ඇත. එය හිසේ නැමූ විට ගෙල දක්වා වැටේ, ඉක්බිති ඔහු යකඩ උලකින් තළයි. **චණ්ඩා** - ක්‍රොධය. **රුද්දා** - විරුද්ධ. **රභසා** - එකට එක කිරීම, **නෙව මහා රාජානං ආදියන්ති** - වචනය ගණන් නොගනී. අණ නොපිළිපදියි. **මහාරාජනං පුරිසකානං** - අටවිසි සෙන්පතියෝ. **පුරිසකානං** - යක් සෙනෙවියන්ගේ. යම් අමනුෂ්‍යයෝ ඔවුන්ගේ අවරුද්ධා නාම - පසමිතුරෝය. වෛරීහු. **උජ්ඣාපෙතබ්බං** - පිරිත් කියා අමනුෂ්‍යයන් ඉවත් කිරීමට නොහැකි වන්නා විසින් මේ යකුන්ගේ දොස් කිව යුතුය. මොවුන්ට දැන්විය යුතුය යන අර්ථයයි. මෙහි වනාහි පිරිතේ පිළිවෙත් කිව යුතුය. පළමුවෙන්ම ආටානාටි සූත්‍රය නොකිව යුතුය. මෙත්තසූත්‍රය, ධජග්ග සූත්‍රය, රතන සූත්‍රය යන මේ සූත්‍ර දින හතක් කිව යුතුය. එයින් මිදේ (අමනුෂ්‍ය කරදර දුරුවේ) නම් යහපත්ය. නො මිදේ නම් ආටානාටිය සූත්‍රය කිව යුතුය. එය දේශනා කරන භික්ෂුව පිටි හෝ මස් හෝ නො කෑ යුතුය. සොහොනෙහි නොවිසිය යුතුය. කුමක් හෙයින්ද? අමනුෂ්‍යයන්ට ඉඩ ලැබෙන නිසාය. පිරිත් කරන තැන කොල පැහැ ආලේප කොට පිරිසිදු ආසන පණවා හිඳගත යුතුය. පිරිත් කරන භික්ෂුව විහාරයෙහි සිට ගෙදරට වැඩමවන විට පලිස් ආවුධ පිරිවරා වැඩම විය යුතුය. අභ්‍යවකාසයෙහි සිට නොකිව යුතුය. දොර ජනෙල් වසා ආවුධ ගත් අය පිරිවරා මෙත්සිත පෙරටු කොට කිව යුතුය. පළමුව ශික්ෂාපද සමාදන් කරවා සීලයෙහි පිහිටි අයත් පිරිත් කිව යුතුය. මෙසේ ද මිදවීමට නොහැකි වන්නා විසින් විහාරයට පමුණුවා සෑ මළුවෙහි වැදහොවා ආසන පූජාව කරවා පහන් දල්වා සෑ මළුව ඇමද මංගල ගාථා කිව යුතුය. සියළු දෙනා රැස් වී ගෝසා කළ යුතුය. විහාර උපවනයෙහි දෙවු රුකක් වේ. එහි භික්ෂුසංඝයා ඔබට සත්කාර කරති යයි යැවිය යුතුය. සියළු දෙනා රැස්වන තැන අනාගතයක් නොලැබේ. ඉක්බිති අමනුෂ්‍ය ගන්නා ලද ඔබ කිනම් වේදැයි විචාල යුතුය. නම කී කල නමින් ම ආමන්ත්‍රණය කළ යුතුය. මේ නම ඇති ඔබට සුවඳ මල් පූජා ආදියේ පින, ආසන පූජාවෙහි පින, පිණ්ඩපාතයෙහි පින භික්ෂු

සංඝයා විසින් ඔබට පඬුරු පිණිස මහාමංගල ගාථා දේශනා කරන ලදී. භික්ෂු සංඝයා කෙරෙහි ගෞරවයෙන් මොහු මුදවයි කියා මිදවිය යුතුය. එයින් ද නොමුදවා නම් දෙවියන්ට දන්විය යුතුය. දෙවිවරුනි ඔබලා දැනගන්න. මේ අමනුෂ්‍යයා අප කියන දේ නො අසයි. අපි බුදු අණ කරන්නෙමු. යයි පිරිත් කළ යුතුය. මෙසේ මේ ගිහියන් ගේ තේවාවය.

ඉදින් භික්ෂු කෙනෙක් අමනුෂ්‍යයකු විසින් ගන්නා ලද්දේ නම් ආසන සෝදා සියල්ල රැස් වී සෝෂා කොට සුවඳමල් පූජාඑල පින් දී පිරිත් කිව යුතුය. මේ භික්ෂූන්ගේ තේවාවයි. විකකතබ්බං තබබං - සියල්ල රැස් වී සෝෂා කොට අටවිසි යක් සෙනවිවරු හැඬවිය යුතුය. විරවිතබ්බං - ''අයං යකෙඛා ගණහාති'' යනාදිය කියන්නහු විසින් ඔවුන් සමග කිව යුතුයි. එහි ගණහාති - ශරීරයට ආවේශ වෙයි. ආවිසති - එහිම සමාන වචනයකි හෙවත් ලගී, පහ නොවේ යයි කියන ලදී. හෙඨෙති - උපන් රෝග වඩන්නේ බාධා කරති. විහෙඨෙති - එහිම සමාන වචනයකි. හිංසති - ඇගේ මස් ලේ අඩු කරමින් දුකට පත් කරයි. විහිංසති - එහිම සමාන වචනයකි. නමුඤ්චති - මූර්ජා රෝගය ගෙන මිදීමට කැමති නොවේ. මෙසේ ඔවුන්ට කෑ ගැසිය යුතුය. මෙසේ කෑ ගැසිය යුතුය.

ඔවුන් දක්වීමට ''කතමෙසං යක්ඛානං'' යනාදිය කීහ. එහි ''ඉන්දො සොමො'' ආදිය ඔවුන්ගේ නම් වේ. වෙසසාමිතෙතා - වෙස්සාමිත්ත පර්වත වාසි යක්ෂයා. යුගන්ධරො - යුගන්දර වැසි, හිරිනෙතතීච මන්දියො - හිරිනෙත්තියා ද මන්දියා ද. මණිමාණිචරො දීඝො - මණි ද මාණි ද චර ද දීග ද. අථො සෙරිසසකොසහා - ඔවුන් සමග වෙනත් සේරිසසක නම්. ඉමෙසං යකඛානං.....උජ්ඣාපෙතබ්බං - මේ යකා මොහු පෙළයි, හිංසා කරයි. නොමුදයි කියා මෙසේ මේ යක්ෂ සේනාපතිවරුන්ට දන්විය යුතුය. එයින් ඒ භික්ෂු සංඝයා තමන්ගේ ධර්ම ආඥාව කරති. අපිද අපේ යක්ෂ රාජ ආඥාව කරමු යයි උත්සාහවත් වෙති. මෙසේ අමනුස්සයන්ට ඉඩක් නොලැබේ. බුද්ධ ශ්‍රාවකයින්ට පහසු විහරණය වන්නේ යයි දක්වන්නේ ''අයං ඛො සා මාරිස ආටානාටියා රකඛා'' යනාදිය කීය. ඒ සියල්ල ද එයින් පසු ඒවාද පැහැදිලි අරුත් ඇත්තේ වේ.

**ආටානාටිය සූත්‍ර වර්ණනාව නිමි.**

# 3-33
## සංගීති සූත්‍ර වර්ණනාව

සංගීති සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. මේ එහි පෙර නො ආ පද වර්ණනාවයි. චාරිකං චරමානො - නිබඳ වූ චාරිකාවේ හැසිරෙන්නේ එදා වනාහි ශාස්තෲන් වහන්සේ දස දහසක් සක්වල නුවණ දැල එලා ලෝකය දෙස බලන්නේ පාවා නගරවාසී මල්ල රජවරුන් දැක, මේ රජවරු සර්වඥතා ඥාණ ජාලයට ඇතුළත්ව පෙනීයති. කුමක්දැයි අවර්ජනා කරන්නේ. රජවරු එක් සන්ථාගාරයක් කරවූහ. මා ගිය කල්හි මංගල කියවන්නෝය. ඔවුන්ට මංගල කියා උනන්දු කරවා භික්ෂු සංඝයාට ධර්ම කථාවක් කියන්නැයි සැරියුත්ට කියන්නෙමි. සාරිපුත්ත තුන් පිටකයම සම්මර්ශනය කොට තුදුස් පැන අධික වූ පන්දහසක් අලංකාර කොට භික්ෂු සංඝයාට සංගීති සූත්‍රය කියන්නේය. සූත්‍රාන්තය ආවර්ජනා කොට පන්සීයක් භික්ෂූන් වහන්සේ සිව් පිළිසිඹියා, සහිතව රහත් බවට පැමිණෙන්නෝය. මේ අර්ථය දැක චාරිකාවට පිටත් වූහ. එහෙයින් කියන ලදී - ''මලෙලසු චාරිකං චරමානො''. උබ්භටකං - ඔහුගේ නම උස් බැවින් ද මෙසේ කියන ලදී. සන්ථාගාරං - නගරය මැද රැස්වීම් ශාලාව. සමණෙන වා - මෙහි යම් ගෘහයක් ආර්ම්භ කරන කාලයෙහි ම දෙවියෝ තමන් වසන තැන ගනිති, එහෙයින් දෙවෙන වා නොකියා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මනුෂ්‍ය වූ කවරෙක් හෝ යයි කියන ලදී. යෙන භගවා තෙනුපසංකමිංසු - භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම අසා අප විසින් හෝ දූතයන් විසින් හෝ ආරාධනා කොට වැඩමවීම නොකරන ලදී. උන් වහන්සේම මහා භික්ඛු සංඝයා පිරිවරා අප වසන තැනට වැඩියහ. අප විසින් ද සන්ථාගාර සාලාව කරවන ලදී. මෙහි අපි බුදුරදුන් වැඩමවා මංගල කියවන්නෙමු යයි සිතා පැමිණියහ. යෙන සන්ථාගාරං තෙනුපසංකමිංසු - එදවස වනාහි සන්ථාගාරයෙහි චිත්‍රකර්ම නිමවා අටල්ල සැකසීමට පමණක් තිබිණි. බුදුවරු නම් අරණේ අදහස් ඇති වනයට ඇළුණු නිසා ඇතුළුගම වසතිද නොවසතිදැයි දැනගැනීමට ඔව්හු බුදුන් වහන්සේ වෙත පැමිණියහ. දැන් වනාහි අදහස් දැන පිළිදැගුම් කරනු කැමැත්තේ සන්ථාගාරය වෙත පැමිණියහ. සබ්බ සන්ථරිතං - සියල්ල ඇතිරි අතුරා. මෙසේ ඒ රජවරු සන්ථාගාරය සකස් කොට නගරවීථි ඇමදවා පිරිසිදු කරවා කොඩි ද ඔසවා ගෙවල් දොරකඩ

පුන් කුඹු සහ කෙසෙල් ගස් තබා සියළු නගරය දීපමාලාවෙන් විසුරුණු තාරකා මෙන් කොට කිරිබොන දරුවන් කිරි පොවව, දහර ළමයින් වහ වහා කවා නිදිකරව උස් ශබ්ද නොකරව අද එක රැයක් ශාස්තෘන් වහන්සේ ඇතුළුගම වැඩ වසති. බුදුවරු නිහඬබවට කැමති වෙතියි බෙර හසුරුවා තෙමේ දඬු පහනක් ගෙන බුදුන් වහන්සේ වෙත පැමිණියහ. භගවන්තංයෙව පුරක්ඛත්වා - භගවත් බුදුරජ පෙරටුකොට, එහි බුදුරජ භික්ෂූන්ට හා උපාසකවරුන්ට මැද වැඩ සිටියේ අතිශයින් බබළති. සියල්ලන් පහදවන්නා වූ රන්වන් වූ ලස්සන වූ දර්ශනීය වූ ශරීරය ඉදිරිපසින් රන්වන් රස් නැගී අසූ රියනක් තැන පැතිරේ. ශරීරය පිටුපසින් ද දකුණු අතින් වම් අතින් රන්වන් රස් නැගී අසූ රියන් තැන් පැතිරේ. උපරිම කෙස් අග පටන් කෙස්වලින් මයුර ගීව වර්ණ නැගී ගුවන් තලයෙහි අසූරියන් තැන් පැතිරේ. යටි පතුලෙන් පබළුවන් රස් නැගී ගණ පොළොවෙහි අසූරියන් තැන් පැතිරේ. මෙසේ හාත්පස අසූරියන් තැන් සවණක් බුද්ධ රශ්මි බබළමින් ස්පන්දනය වෙමින් දිව යයි. සියළු දිසාභාග රන්වන් සල් කුසුම් විසුරුවන්නා මෙන් රන්වන් කුඩුවලින් නික්මෙන රුවන් රසධාරා ඉසින්නාක් මෙන් පැතුරුණු රන්වන් පටකින් වටකළා මෙන් වේරම්භ වාතයෙන් විසුළ කිකිණි කිණිහිර කුසුම්රේණු ගැවසුණා සේ ප්‍රකට වේ. භාග්‍යවතුන් වහන්සේ ද අසූ අනුව්‍යඤ්ජන ව්‍යාම ප්‍රභා දෙතිස්මහ පුරිස් ලකුණුවලින් බබළන්නේ ශරීරය ගුවන් තලයේ පැනනැගුණු තරුවක් සේ විකසිත පියුම් වනයක් සේ, යොදුන් සියයක් වූ පාරිජාත වෘක්ෂ මලින් පිරීගියා සේ පිළිවෙළින් තබන ලද දෙතිස් සඳක් සේ දෙතිස් හිරුසේ දෙතිස් සක්විත්තන් සේ දෙතිස් දෙව් රජුන් සේ දෙතිස් මහාබ්‍රහමයින් ගේ සිරිය අභිභවනය කරන්නාක් මෙන් බබළයි. පිරිවරා සිටි භික්ෂූහු ද අපිස් සතොස් පවිවෙක වූ අමිශ්‍රව ඇරඹූ වීරියෙන් යුත් වූ වචනක්ෂම වූ පවට ගැරහූ සීලසම්පන්න වූ සමාධි සම්පන්න වූ - පඤ්ඤා විමුත්ති විමුත්ති ඤාණ සම්පන්න වූ ඔවුන් විසින් පිරිවරන ලද භාග්‍යවතුන් වහන්සේ රතු කම්බිලියකින් වටකරන ලද්දාක් මෙන් රන් කඳක් රත්පියුම් වනයක් මැදට පැමිණියා සේ රන් නැවක් පබළු වේදිකාවෙන් වටකරන ලද්දාක් මෙන් රන් පහයක් මෙන් බබළයි. අසූමහ ශ්‍රාවකයෝද ඒ මේවන් පංසුකුල චීවර පෙරවා මැණික් සන්නාහ සන්නද්ධ වූවා මෙන් මහා භික්ෂූන් පිරිවැරූහ. රාගය වමැරූ කෙලෙස් බින්දා වූ ජටා විජටනය කළා වූ බැම් සිඳළු කුලයෙහි හෝ ගණයෙහි නොඇළුනා වූ ගුණ ඇත්තාහ. මෙසේ බුදුන් වහන්සේ තමන් වහන්සේ වීතරාගීන් විසින් වීත දෝසව වීත දොසින් විසින් වීතමෝහව වීත

මෝහීන් විසින් නිෂ්තෘෂ්ණාව තෘෂ්ණා නැත්තන් විසින් නික්ලේශව නික්ලේශීන් විසින් සවයං බුද්ධව බහුස්සුත බුදුවරුන් විසින් පිරිවරන ලද්දේ සිංහයා සිංහයන් විසින් පිරිවැරුවා සේ කර්ණිකා අටදහසක් ඇතුන් පිරිවැරුවැමෙන් ඡද්දන්ත ඇත් රජ අනූ දහසක් හංසයින් පිරිවැරුවා සේ ධෘතරාෂ්ට්‍ර හංසරජ සේනාව පිරිවැරුවා මෙන් සක්විති දිව්‍ය සමූහයා පිරිවැරුවා මෙන් සක්දෙව් රජු බ්‍රහ්ම සමූහයා පිරිවැරුවා මෙන් හරිත මහා බ්‍රහ්මයා බුදු වෙසින් මෙන් අසම වූ අප්‍රමාණ වූ බුද්ධ විලාසයෙන් ඒ පිරිසෙහි වැඩ සිටින්නේ පාවෙය්‍යක මල්ලයන් රාත්‍රියේ බොහෝ වේලාවක් දහැමි කථාවෙන් විස්තර කොට පිටත් කළහ. මෙහි ධම්ම කථා නම් සන්ථාගාර අනුමෙවෙනි යුත් ප්‍රකීර්ණක කථා දතයුතුය.

එදා භාග්‍යවතුන් වහන්සේ ආකාශ ගංගාව වැටෙන්නාක් මෙන් පෘථිවි ඕජාව අදින්නාක් මෙන් මහ දඹගසක් මුදුනෙන් අල්ලා සොලවන්නාක් මෙන් යොදුනක් දිග මී වැදැල්ලක් චක්‍ර යන්ත්‍රයෙන් තද කර මී පානය පොවන්නාක් මෙන් පාවෙය්‍යක මල්ල රජදරුවන්ට දියුණුව සැප සඳහා ප්‍රකීර්ණක කථා වදාළහ. **තුණ්හීභූතං තුණ්හී භූතං** - ඒ ඒ දිසා බලයි. එහි නිශ්ශබ්දමය. **අනුපලොකෙත්වා** - මසැසින් දිවැසින් දෙඇසින්ම යන ඒවායින් බලා, මසැසින් ඔවුන්ගේ බාහිර ඉරියව් විමසූහ. ආලෝකය වැඩිකර දිවැසින් ඔවුන්ගේ හදවත දැක ආධ්‍යාත්මික සීලය බැලූහ. නොයෙක් සිය ගණන් භික්ෂූන් ගේ කාලය තුළ දැල්වෙන පහනක් මෙන් අර්හත්වයට පැමිණි සීලය දුටහ. ඇරඹූ විදර්ශනා ඇති ඒ භික්ෂූහු ඔවුන්ගේ සීලය දැක මේ භික්ෂූහු මට සුදුසුයයි ඇස්වල නිමිති තබා බික්සඟන බලා සැරියුත් හිමි ඇමතූහ. **පිට්ඨි මෙ ආගිලායති** - කුමක් නිසා රිදේද? සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කිරීමෙන් කායික දුක් ඇතිවිය. ඉක්බිති මහළුකල පිටේ වාතය ඇතිවිය. (ඒ නිසා පිට රිදෙ) **සංඝාටිං පඤ්ඤාපෙත්වා** - සන්ථාගාරයේ එකත් පසෙක ඒ රජවරු කැප ඇඳක් පනවා තිබුණහ. ශාස්තෘන් වහන්සේට වැදහෙවීමට යෙහෙකැයි කීය. ශාස්තෘන් වහන්සේද සිව් ඉරියව්වෙන් සිටින්නේ මෙය ඔවුන්ට මහත්ඵල වන්නේ යයි (වදාරා) එහි සඟල සිවුර පනවා සැතපුනහ. **තසස කාලකිරියා** - මෙහි කිවයුතු දේ ඉහත කියන ලදී. **ආමන්තෙසි** - කෝලාහල ආදිය සමනය කරන ස්වාක්ඛාත ධර්මය දේශනා කරනු කැමැත්තේ ආමන්ත්‍රණය කෙළේය. **තත්‍ථ** - ඒ ධර්මයෙහි **සංගායිතබ්බං** - සමගියෙන් කිවයුතුය. **නවිවදිතබ්බං** - අර්ථයෙහි හෝ ව්‍යඤ්ජනවල (අකුරුවල) විවාද නොකළ යුතුය. **එකො ධම්මො** - ඒකක දුක ආදි වශයෙන් සමගි කෘත්‍යය දක්වනු

කැමැත්තේ පළමුව ඒකො ධම්මෙ යනාදිය කීහ. සබ්බෙ සත්තා - කාම භව සඤ්ඤා භව ඒක වෝකාරාදි භව යනාදි සියළු භවවල සියළු සත්වයෝ, ආහාරට්ඨිතිකා - ආහාරවලින් සිටි මොවුන් යයි - ආහාරට්ඨිතිකා වේ. මෙසේ සියළු සත්වයන් ගේ පැවතීමේ හේතුව ආහාර නම් එකම ධර්මය යයි අපගේ ශාස්තෘන් වහන්සේ දූන මනාව දූක දූක්වූහ. මෙසේ ඇති කල්හි අසඤ්ඤ සත්වයෙහි දෙවියන් අහේතුක අනාහාර ස්පර්ශ නැත්තන් යයි යන මෙයට විරුද්ධ නොවේද? විරුද්ධ නොවේ. ධ්‍යානය ඔවුන්ගේ ආහාරයයි. මෙසේ ඇති කල්හි "මහණෙනි, මේ ආහාර සතරකි, පහළ වූ සතුන්ගේ පැවතීම පිණිස හටගන්නවුන්ට අනුග්‍රහ පිණිස පවතී. කවර සතරක්ද? ඕලාරික වූ කබලිංකාර ආහාරය සියුම් වූ ස්පර්ශ ආහාරය, මනෝ සංචේතනා ආහාරය, විඤ්ඤාණ ආහාරය යන සතරය. සතරවැන්න විරුද්ධ වේද? නැත. එක් සූත්‍රයක නිෂ්පර්යාය වශයෙන් ධර්මය ද ආහාරයෙකැයි දක්වන ලදී. මෙහි වනාහි පර්යායයෙන් ප්‍රත්‍යක්ෂ වේ යයි දක්වයි. සියළු ධර්මවල ප්‍රත්‍යය ලැබීම වටී. එය ද යම් යම් ප්‍රතිපල ඇතිවේ නම් ඒවාද ආහාර යයි කියනු ලැබේ. අවිජ්ජාපහං භික්ඛවෙ ආහාරං වදාමි. මහණෙනි. එහෙයින් කියන ලදී. අවිද්‍යාව ද මම ආහාරයකැයි කියමි. පංචනීවරණ මෙහි කියන අවිද්‍යාවයි. පංච නීවරණයද මහණෙනි. ආහාරයකැයි කියමි. මහණෙනි, පංචනීවරණවල ආහාරය කුමක්ද? නුනුවණින් මෙනෙහි කිරීමය. එය මෙහි ආහාර යයි අදහස් කරයි. එය ආහාරයයි ගැනීමෙන් පච්චයාහාර, පරියාය ආහාර නිප්පරියාය ආහාර යයි සියළු ආහාර ගත්තේ වේ. එහි අසඤ්ඤ භවයෙහි පච්චය ආහාර වේ. බුදුන් පහළ නොවූ කාලයෙහි තීර්ථ ආයතනවල පැවිද්දෝ වායෝ කසිණය වඩා සතරවන ධ්‍යානය උපදවා එතැන් පටන් සිතට නින්දා කොට සිත නැතිවීමට යහපත් යයිද සිත නිසා වධබන්ධන දුක් ඇතිවේ යයි ද සිත නොමැති නම් ඉවසීම රුචිය උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් කළුරිය කොට අසඤ්ඤ සත්වයෙහි උපදිති. යමෙක් මනුෂ්‍ය ලෝකයේ සිටි ඉරියව්වෙන්ම මෙහි උපදිති. කල්ප පහක් සිටගෙන හෝ හිඳගෙන හෝ දිගාවී හෝ වෙති. මෙබඳු වූ සත්වයන්ට පච්චය ආහාර වේ. ඔවුන් විසින් යම් ධ්‍යානයක් වඩා මෙහි ඉපදුනේ නම් ඒ ධ්‍යානයම ඔවුන්ට ප්‍රත්‍ය වේ. යම්සේ දුනුදියෙන් මුදාහළ ඊය දුනුදියේ වේගය ඇතිතාක් යයි. එසේම ධ්‍යාන ප්‍රත්‍යය තිබෙන තුරු සිටිති. එය අවසන් වූ පසු හීන වේග වූ ඊය වැටේ. නේරයික සත්වයෝ උට්ඨාන ඵලූපජීවී නොවෙති, පුඤ්ඤඵලූප ජීවිද නොද වෙති. ඔවුන්ගේ ආහාරය කුමක්ද? ඔවුන්ගේ කර්මයම ආහාරයයි.

කිම ආහාර වර්ග පහක් ඇතිද? පහක් නැත. මෙය පස්වන ආහාරයයි නොකිව යුතුය. ප්‍රත්‍යය ආහාර වේ. මේ ආහාරයෙන් සියළු සත්‍වයෝ ආහාර නිසා සිටිති යි මෙසේ ප්‍රශ්නය උත්තර දී ඇවැත්නි, මෙසේ පැමිණවිය යුතු අර්ථ ඇත. ඇවැත්නි අධ්‍යාහාර නොකළ යුතුවද ඇතැයි සියළු සත්‍වයෝ සංඛාර නිසා සිටිතියි දෙවන ප්‍රශ්නය ද විසඳූහ. කුමක් හෙයින් නො පැමිණවීද? නො ඉදිරිද? ඒ ඒ තැන්වල පැමිණවීම්ද ඉදිරීමේ ද ඉගණීමට කීමට දුක්වේ. ඒ නිසා දෙකම එකතු කොට විසඳූහ. මේ විසඳුමෙහි යට කියනලද ප්‍රත්‍යයද තමාගේ පලයද සංසකරණයෙන් සංඛාරයයි කියන ලදී. මෙසේ යට ආහාර ප්‍රත්‍ය කියන ලදී. මෙහි සංඛාර ප්‍රත්‍යයයි යට කියන ලද්දට වඩා විශේෂයකි. යට නිපඵරියා ආහාර ගන්නා ලදී. මෙහි පරියාය ආහාර වේ. මෙසේ ගන්නා ලද්දෙහි විශේෂය ප්‍රකට වන්නේය. ගැන්මෙහි නොවේ යයි මහාසීව තෙරහු කීහ. ඉන්‍ද්‍රිය බඳධ දෙයටද ප්‍රත්‍ය ලැබීම වටී. ප්‍රත්‍ය හැර ඵලයක් නැත. එහි අනින්‍ද්‍රිය බඳධ තෘණ වෘක්‍ෂලතාදීන්ගේ ද පෘථිවි රසයටද ආපෝ රසයටද ප්‍රත්‍ය වේ. වැස්ස නැතිවිට තෘණාදිය මැලවේ. වහින විට හරිත වර්ණ වේ. ඹ්මෙසේ ඒවාට පඨවි ආපෝ රස ප්‍රත්‍ය වේ. ඉන්‍ද්‍රිය බඳධයනට අවිජජා තණහා කමම ආහාර යයි මේ ආදිය යට ප්‍රත්‍ය ආහාර යයි කියන ලදී. මෙහි සංඛාරය විශේෂ අර්ථයක් වේ. අයං ඛො ආවුසො - ඇවැත්නි අපගේ ශාසතෘන් වහන්සේ මහබෝමැඩ හිඳ තෙමේ සර්වඥ ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට මේ ඒක ධර්මය දේශනා කළහ. මේ ඒක ධර්මය ඔබලා විසින් සංගායනා කළ යුතුය. විවාද නොකළ යුතුය. යථා ඉදං බ්‍රහමචරියං - ඔබ විසින් සංගායනා කරනු ලබන මේ සාසන බ්‍රහම චර්යාව දිගු කලක් සථිරව පවතින්නේය, එක් භික්‍ෂුවක් විසින් ඇවැත්නි, මනාව දේසිත එක් ධර්මයක් ඇත. කවර එක් ධර්මයක්ද? සියළු සත්‍වයෝ ආහාර නිසා පවතී. සියළු සත්‍වයෝ සංඛාර නිසා පවතී යයි කී කල්හි ඒ කථාව අසා තව භික්‍ෂු කෙනෙක් කියන්නේය. එය අසා තවකෙනෙක් මෙසේ පරමපරා නියමයෙන් මේ බ්‍රහම චර්යාව බොහෝ කලක් පැවතෙමින් දෙවියන් සහිත ලෝකයාගේ ප්‍රයෝජන පිණිස දියුණුව පිණිස වන්නේ යයි ඒකක වශයෙන් දම්සෙනවි සැරියුත් මහ රහත්හු සාමගගි රසය දක්වූහ.

**ඒකකය නිමි.**

මෙසේ ඒකක වශයෙන් සාමගගි රසය දක්වා දැන් දුක වශයෙන් දැක්වීමට නැවත දේශනය ඇරඹීය. එහි නාමරූප දෙකෙහි - **නාමං** - සතර අරූප ස්කන්ධ සහ නිවනය. එහි සතර ස්කන්ධ නාම අර්ථයෙන් නාම වේ. ''නාමනටෙඨන'' නම් කරන අර්ථයෙන් නාම වේ. මහජන සම්මතයෙන් වේ. මහජන සම්මතයට මහා සම්මතයයි නම් විය. මව්පියෝ මොහුට තිස්ස නම වේ. ඵුසස නම වේවයි මෙසේ පුතාට කීර්ති නමක් කරති. ධමමධර විනයධර යයි ගුණ වශයෙන් නම් එයි. වේදනාදියට මෙසේ නොවේ. මහා පඨවි ආදිය මෙන් තමා නම් කරමින් පහළ වේ. ඒවා පහළවූ විට ඒවායේ නම් පහළ වේ. වේදනාවක් ඇති වූ විට ඔබ වේදනාව යයි කිසිවෙක් නොකියයි. එයට නම් තබන සිරිතක් නැත. පොළොව පහළ වූ විට ඔබ පොළොව යයි නම් තබන කෙනෙක් නැත. සක්වල මහමෙර සඳහිරු නකත් තරු පහළ වු විට ඔබ සක්වල නම් නකත් නම් යයි නම් තබන කිසක් නැත. නම ඉපදීමෙන්ම (පහළවීමෙන්ම) වේ. ඕපපාතික පහළ වීමය. එසේම වේදනාව ඇති වූ විට ඔබ වේදනාව නම් වේ යයි නම් තබන කිසක් නැත. වේදනාව ඇතිවීමෙන් නාමය ද ඇතිවේ. සඤ්ඤාදියෙහි ද මෙම නයයි. අතීතයෙහි ද වේදනා වේදනාමය. සඤ්ඤා සංඛාර විඤ්ඤාණද එසේය. අනාගතයෙහි ද වර්තමානයෙහි ද එසේය. නිර්වාණය සදහටම නිර්වාණම වේ. මෙසේ නම්කරන අර්ථයෙන් නාම වේ. නම් කරන අර්ථයෙන් මේ සතර ස්කන්ධ වේ. ඒවා අරමුණට අභිමුව නැමේ. සියළු නම් කරන අර්ථයෙන් මේ සතර ස්කන්ධ වේ. ඒවා අරමුණට අභිමුව නැමේ. සියළු නම් නම අර්ථයෙන්ම වේ. ස්කන්ධ සතර අරමුණෙහි ඔවුනොවුන් නැමේ. නිවන අරමුණු අධිපති ප්‍රත්‍ය බැවින් තමා කෙරෙහි අනවද්‍ය ධර්මයෙහි නැමේ. **රූපං** - මහාභූත සතර ඒවායේ උපාදාය රූප සතර යන ඒ සියල්ල රුප්පන (වෙනස්වන) අර්ථයෙන් රූප වේ. සෙසු විස්තර කථා විසුද්ධි මාර්ගයෙහි කී නයින් දත යුතුය. **අවිජ්ජා** - දුක්ඛාදියෙහි නොදැනීම. මෙහි විස්තර ද විසුද්ධි මගගයේ කියන ලදී. **භවතණ්හා** - භව ප්‍රාර්ථනයයි. එහි භව තණ්හාව කවරේද? යමෙක් භවයෙහි භව කැමත්ත. භවදිට්ඨිය ද භවයෙහි තමාද ලෝකය ද වන්නේය යන දෘෂ්ටියයි. එය සාස්වත වශයෙන් උපදින දෘෂ්ටියයි. **විභව දිට්ඨි** - විභව යනු උචෙඡ්ද දෘෂ්ටියයි. එයද එහි විභව දෘෂ්ටිය කවරේද? තමාද ලෝකය ද නොවන්නේය යන මෙබඳු දෘෂ්ටි, දෘෂ්ටි ගත යයි ආදි නයින් අභිධර්මයෙහි විස්තර කරන ලදී. **අහිරිකං** - ලජ්ජා විය යුත්තෙහි ලජ්ජා නොවන්නේ යයි මෙසේ විස්තර කරන ලදී. **අනොත්තප්ප** - බියවිය

යුත්තෙහි බිය නොවන්නේ යයි මෙසේ විස්තර කරන ලද බිය නැති ආකාරයයි. **හිරිච ඔත්තප්පං** - ලජ්ජා විය යුත්තෙහි ලජ්ජා වීම බිය විය යුත්තෙහි බියවීම යයි මෙසේ විස්තර කරන ලදී. තවද එහි ආධ්‍යාත්ම හට ගැනීම ලජ්ජාය. බාහිර හට ගැනීම බියය. තමා අධිපති කොට ඇත්තේ ලජ්ජාවය. ලෝකයා අධිපති කොට ඇත්තේ බියය. විස්තර කථා වනාහි සියළු ආකාරයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. **දොවචස්සතා** - දුක් වූ වචනය මොහු කෙරෙහි යයි අනුකූල නොවූ ගැනීම සැපයට විරුද්ධ වූ අනාදර පුද්ගලයා කෙරෙහි දුර්වචවේ. ඔහුගේ ක්‍රියාව දොවචස්ස වේ. එහි භාවය දොවචස්සතා වේ. විස්තර වශයෙන් මෙහි දොවචස්සතා කවරේද? එකට හැසිරෙන අප (සහ ධම්මික) කියන කල්හි නොඇසීමෙන් යයි අභිධර්මයෙහි ආවේය. එය අර්ථ වශයෙන් සංඛාර ස්කන්ධය. **පාපමිත්තතා** - පාප අශ්‍රද්ධාදි පුද්ගලයෝ, මොහුගේ මිත්‍රයෝය යනු පාපමිත්ත වේ. විස්තර වශයෙන් මෙය එහි පාපමිත්තතා කවරේද? යම් පුද්ගලයෙක් අශ්‍රද්ධා ද දුස්සීලද අල්පශ්‍රැතද මසුරුද ලෝභද මෝඩද යමෙක් ඔහු ආශ්‍රය කෙරේද සෙවිනේද භජනය කෙරේද ඔහු වේ. අර්ථ වශයෙන් දොවචස්සතා මෙනි. **සොවචස්සතා** - සොවචස්සතා ද **කල්‍යාණ මිත්තතා** - කල්‍යාණ මිත්තතා ද යට කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් දත යුතුය. මේ දෙකම ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. **ආපත්ති කුසලතා** - ආපත්ති ස්කන්ධ පහ ආපත්ති වේ. ආපත්ති ස්කන්ධ හත ද ආපත්ති (ඇවැත්) වේ. ඒ ඇවැත්වල දක්ෂතාව ප්‍රඥාව යයි දනී. මෙසේ කියන ලද්දේ ආපත්ති කුසල භාවයයි. **ආපත්තිවුට්ඨාන කුසලතා** - ඒ ආපත්තිවලින් නැගිටීමේ (ඉවත්වීමේ) දක්ෂතා පඤ්ඤා දනීයයි මෙසේ කියන ලදී. කර්ම වාක්‍ය සහිතව ආපත්තිවලින් නැගිටින කොටස දන්නා ප්‍රඥාව. **සමාපත්ති කුසලතා** - විතර්ක විචාර සහිත සමත් ඇත. අවිතර්ක අවිචාර සහිත සමවත් ඇත. ඒ සමාපත්තිවල සමාපන්න කුසලතා ප්‍රඥාව දනී යයි කියන ලද පරිකර්ම සහිතව අර්පනා කොටස දන්න ප්‍රඥාව වේ. **සමාපත්ති වුට්ඨාන කුසලතා** - ඒ සමාපත්තිවලින් නැගිටීමේ සමර්ථ බව. ඉර මෙතෙක් ගිය කල්හි නැගිටියි නැගිටින කාලය වෙන්කරන ප්‍රඥාව. **ධාතුකුසලතා** - දොළොස් ආයතන - චක්ඛු ආයතන....ධම්ම ආයතන, ඒ ආයතනවල ආයතන කුසලතා ප්‍රඥාව දනී යයි මෙසේ කියන ලද දොළොස් ආයතන ඉගෙන ගන්න මෙනෙහි කරන දැනගන්න ප්‍රඥාව. තවද ධාතු කුසලතා ද උද්ග්‍රහණ කරන ශ්‍රවණ කරන සම්මර්ශණය කරන ප්‍රතිවේද කරන ප්‍රත්‍යවේක්ෂණයෙහි වටී. මනසිකාර කුසලතා ද ආයතන කුසලතා ද දෙකේ විශේෂය

මෙයයි. ශ්‍රවණය, උද්ග්‍රහණය, ප්‍රත්‍යවෙක්ෂණ ලෞකිකය. ප්‍රතිවෙධය ලෝකෝත්තරය. සමමසන මනසිකාර ලෞකික ලෝකෝත්තර මිශ්‍රය. **පටිච්ච සමුප්පාද කුසලතා** - අවිජ්ජා පච්චයා, සංඛාරා... සමුදය වේ. එහි ප්‍රඥාව දනී යයි කී කල ප්‍රත්‍යාකාරවල උද්ග්‍රහණාදි වශයෙන් පවත්නා ප්‍රඥාව **ඨාන කුසලතා** - යම් යම් ධර්ම ඒවායේ හේතු ප්‍රත්‍යවලින් ඉපදී ඒ ඒ තැන වේ යයි යම් ප්‍රඥාවක් දනී ද මෙසේ කීකල ඇස වසතු කොට රූපය අරමුණු කොට උපන් චකඛු විඤ්ඤාණයේ චකඛුරූප ස්ථානයද හේතුවදැයි මෙසේ ස්ථාන පිරිසිඳින සමර්ථ ප්‍රඥාව **අට්ඨාන කුසලතා** - යම් යම් ධර්ම ඒ ඒ ධර්මවල හේතු නැත ප්‍රත්‍ය නැත බැවින් අට්ඨාන යයි එහි යම් ප්‍රඥාවක් දනීදැයි මේ කී කල්හි ඇස වස්තුකොට රූපය අරමුණු කොට සෝත විඤ්ඤාණාදිය නො උපදී. එහෙයින් ඒවායේ ස්ථානය නොවේ හේතු නොවේ යයි මෙසේ අස්ථාන පිරිසිඳීම් සමර්ථ ප්‍රඥාව. තව ද මේ දුකයෙහි ස්වාමීනි කොපමණකින් ඨානාඨාන කුසල භික්ෂුව යයි කීමට සුදුසු වේ. ''ආනන්ද භික්ෂුව මෙහි අස්ථානය අනවකාශය, යම් පුද්ගලයෙක් දෘෂ්ටිසම්පන්නව කිසියම් සංඛාරයක් නිත්‍ය වශයෙන් ගනීද. මෙය නොවේ යයි දැනගනී. යම් පෘථග්ජනයෙක් කිසියම් සංඛාරයක් නිත්‍ය වශයෙන් ගන්නේද මෙය සිදුවේ යයි දැන ගනීදැයි මේ සූත්‍රයේ මේ අර්ථය දතයුතුය. **අජ්ජවං** - ගෝ මුත්‍ර වංකබව චන්‍ද්‍ර වංක බව නගුල් මිටේ වක්බව යන මේ තුන අනවද්‍ය වේ. ඇතැම් භික්ෂුවක් පළමු වයසෙහි එක්විසි අනේසනවලද අගෝචර තැන් සයෙහිද හැසිරේ. මධ්‍යම පශ්චිම වයස්වල ලජ්ජා වී ශික්ෂාකාමී වේ. මෙය ගෝ මුත්‍ර වංකබව වේ. කෙනෙක් පළමු පශ්චිම වයස්වල චතුපාරිශුද්ධි සීලය පුරයි. ලජ්ජී කුකුස් ඇත්තේ ශික්ෂා කාමි වේ. මධ්‍යම වයසෙහි පෙරපරිදිය. මෙය සඳවක් බව වේ. කෙනෙක් පළමු මධ්‍යම වයස්වල චතුපාරිශුද්ධි සීලය පුරති. ලජ්ජීද කුකුස් ඇත්තේ ද වේ. පශ්චිම වයසෙහි පෙර පරිදි වේ. මෙය නගුල් කෙළවර වක් බව වේ. කෙනෙක් මේ සියළු වක්බව අත්හැර තුන් වයසෙහි ද ප්‍රියශීලි වූයේ ලජ්ජා වූයේ කුකුස් ඇත්තේ ශික්ෂාකාමී මෙනි. ඔහුගේ ඒ මේ ඍජුභාවය මේ අජ්ජව නම් වේ. අභිධර්මයෙහිද කියන ලදී - එහි ඍජුභාවය කවරේද? යමෙක් ඍජු. ඍජුභාවය, ඇදනොවූ බව, අවංකබව, වක්නොවූ බව මෙය අජජව යයි කියනු ලැබේ. **ලජ්ජවං** - එහි ලජ්ජාව කවරේද? ලජ්ජා විය යුතු දෙයින් යමෙක් ලජ්ජාවේද, පව් අකුසල ධර්මයන්ගේ සිතිවිලි ඇතිවීමෙන් එය ලජ්ජාවය. මෙසේ කියන ලද ලජ්ජාබව. **ඛන්ති** - එහි ක්ෂාන්තිය කවරේද? ක්ෂාන්ති ක්ෂාන්ති බව, ඉවසීම සතුටු සිත් ඇති බව මෙසේ කියන ලද අධිවාසන ක්ෂාන්තිය.

සොරච්චං - සෝරච්චය කවරේද? කායික වාචසික සංවරයයි. සීල සංවරයයි, මෙසේ කියන ලද සුරතභාවය, සාඛල්‍ය - රළු පරුෂ චණ්ඩ දොස් වචන හැර නිදොස් කනට මිහිරි ප්‍රේමනීය හෘදයංගම ශිෂ්ට බොහෝ දෙනාට පිය මනාප වචන සබිල වචන සාබල්‍ය වේ.

පටිසන්ථාරො - මෙය ලෝකය සමග එක්ව විසීමට ආමිසයෙන් සහ ධර්මයෙන් සිදුරු වැසීමය. සිදුරු නොපෙනීමට පුටුවට ඇතිරිල්ලක් මෙන් ආමිසයෙන් හා ධර්මයෙන් පිළිසඳරයි. අභිධර්මයෙහි ද ආමිස ධම්ම යයි පටිසන්ථාර දෙකකි. ආමිසයෙන් සංග්‍රහ කිරීම ආමිස පටිසන්ථාර වේ. එය කරන්නා විසින් දෙමව්පියන්ට භික්ෂූන්ට වතාවත් කරන රජුට සොරුන් ස්පර්ශ නොකොට යමක් බලාපොරොත්තු නොවී දිය යුතුය. ස්පර්ශ කොට දුන් තැනැත්තාට අනර්ථයක් ම කරති ජීවිතක්‍ෂයට ද පමුණුවති. මෙහි චෝරනාග ආදි වස්තු කිවයුතුය. ඒවා සමන්ත පාසාදිකා විනය වස්තු අටුවාවෙහි විස්තර කරන ලදී. සකසා උද්දෙස දාන පාළි වණ්ණනා ධර්මකතා කීම මෙසේ ධර්මයෙන් සංග්‍රහ කිරීම ධම්මපටිසන්ථාර - නම් වේ. අවිහිංසා - කරුණාව. කරුණා පෙරටු භාගයද, මෙය කියන ලදී. එහි අවිහිංසාව කවරේද? සත්වයින් කෙරෙහි කරුණාව, කරුණාව පැමිණවීම, කරුණා චේතො විමුත්තිය. සොචෙය්‍ය - මෛත්‍රීය ද පූර්වභාගයද වශයෙන් පිරිසිදු බව, මෙයද කියන ලදී. එහි සොචෙය්‍ය කවරේද? සත්වයන් කෙරෙහි මෛත්‍රීය, මෛත්‍රීය පැතිරවීම, මෛත්‍රී චේතෝ විමුත්තියද වේ. මුට්ඨසච්ච - සිහියෙන් වෙන්ව විසීම. සිහි නොකිරීම, අසරණ බව, නොදරණ බව, ඉල්පෙන බව, සිහි නැති කම වශයෙන් දක්වයි. අසම්පජඤ්ඤා - එහි අසම්පජඤ්ඤය නම් නොදැනීම, නොදැකීම, අවිද්‍යාව, ඇලීම, අකුසල් මුල් වූ මෝහය යයි කියන ලද අවිද්‍යාවය, එහි සිහිය වේ. සම්පජඤ්ඤං ඤාණය වේ.

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා - එහි ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා කවරේද? මෙහි කෙනෙක් ඇසින් රූපය දැක නිමිති ගන්නේ වෙති. ආදි නයින් විස්තර කළ ඉන්‍ද්‍රිය සංවර භේදය. භොජනෙ අමත්තඤ්ඤුතා - මෙහි කෙනෙක් සිහි නොකොට නුනුවණින් ආහාරය ගනිති. ජවයට මදයට අලංකාරයට සැරසීමට, එහි අසන්තෝෂය, පමණ නොදැනීම භෝජනයෙහි සිහි නොකිරීම මෙසේ පැමිණ භොජනයෙහි පමණ නොදැනීම වේ. අනතුරුව එන යුගලය කියන ලද දෙයට ප්‍රතිපක්‍ෂ වශයෙන් දත යුතුය.

පටිසංඛාන බලං - එහි පටිසංඛාන බලය කවරේද? යම් ප්‍රඥාවක් දනිදූයි මෙසේ විස්තර කරන ලද නොසිහිකිරීමෙන් කම්පා නොවන ඥාණය. භාවනා බලං - වඩන්නාට උපදින බලය. අර්ථ වශයෙන් විරිය සම්බෝධ්‍යංග ශිර්ෂයෙන් බොජ්ඣංගය සතම වේ. මෙය කියන ලදී. භාවනා බලය කවරේද? කුසල ධර්මයන්ගේ යම් සේවනය කිරීමක්, වැඩීමක් බොහෝ කිරීමක් වන මෙය භාවනා බලය වේ. බොජඣඞග සතම භාවනා බලයයි. කම්පා නොවීම් වශයෙන් සිහියම භාවනා බලයයි. සමාධි බලං - සිතේ විසිරීමෙහි කම්පා නොවන සමාධියම සමාධි බලයයි. සමථය සමාධියයි. විපසසනා ප්‍රඥාව සමථය වේ. එහි ආකාරය ගෙන නැවත නැවත පැවතීම සමථයේ නිමිත්ත වශයෙන් වේ. ප්‍රග්‍රහ නිමිත්තෙහි ද මෙම නයයි. පගගහ නම් විරියයි. වික්‍ෂෙප නොවීම එකගගතාවයි. මේවායින් වනාහි සිහියද සමපජඤඤය ද පටිසංඛාන බලභාවනා බල සති බල සමාධි බල සමථ විපසසනා ද සමථ නිමිතතද පගගහ නිමිතත ද පගගහ ද අවික්‍ෂෙපය ද හයේ දෙකවලින් පසුව සීල දිට්ඨි සම්පදා දෙකෙන් ද ලෞකික ලෝකෝත්තර මිශ්‍රව ධර්මය කියන ලදී.

සීලවිපතති - සිල විපත්ති කවරේද? කායික ව්‍යතික්‍රමණය.... සියළු දුසිල්බව සීලවිපතති වේ. සීල විනාශකය අසංවරයයි මෙසේ කියන ලදී. දිට්ඨි විපතති - එහි දිට්ඨි විපත්ති නම් දෙන දෙයෙහි පල නැත. මෙසේ ආ සම්‍යක් දෘෂ්ටි විනාශ කරන මිථ්‍යා දෘෂ්ටියයි. සීලසමපදා - කායික ව්‍යතික්‍රමණය නොවීමයි. පෙර කී සොරච්චය ම සීලයේ සම්පාදනයෙන් පරිපූරණයෙන් සීල සම්පදාවයි කියන ලදී. මෙහිද සියළු සංවරය සීලසම්පදා යයි මෙය මනස ගැනීමට කියන ලදී.

දිට්ඨි සමපදා - දෙන දෙයෙහි පල ඇත......අවබෝධ කොට ප්‍රකාශ කරති යි මෙබඳු වූ ප්‍රඥාව දනී යයි මෙසේ පැමිණි දෘෂ්ටි සම්පූර්ණ වූ ඥාණයයි. සීලවිසුද්ධි - විසුද්ධියට පැමිණවීමට සමර්ථ සීලය. අභිධර්මයෙහි - කායික වාචසික අවිතික්‍රමණය. දිට්ඨි විසුද්ධි - විසුද්ධියට පැමිණ වීමට සමර්ථ දර්ශනය - දැකීම. අභිධර්මයෙහි කමමසසකත ඥාණය, සච්චානුලෝමික ඥාණය, මාර්ගයුකත ඥාණය, ඵල යුක්ත ඥාණයයි. මෙසේ කියන ලදී. මෙහි ත්‍රිවිධ දුශ්චරිතය තමා කළ ද අනුන් කළද සවකීය නොවේ. සුචරිතය සවකීය වේ. අර්ථය දැනවීම වේ. මෙසේ දනවන කමමසස කත ඥාණය නම් එහි සිට සසරට කර්ම

රැස්කර සැපයෙන් අරහත් බවට පත් ගණන් ඉක්මවීය. විපසසනා ඤාණය වනාහි වචී සත්‍යයද අනුලෝම වේ. පරමාර්ථ සත්‍යයද විලෝම නොවේ එනිසා සච්චානුලෝමික ඤානයයි කියන ලදී. දිට්ඨිවිසුද්ධි - දෘෂ්ඨියට ප්‍රධාන නිසා ඤාණ දසසන යයි කියන ලදී. එය සම්පයුකත වීර්යයි. තවද පෙර පදයෙන් චතුමගග ඤාණය ද පසු පදයෙන් ඒ හා සම්ප්‍රයුකත වීර්ය, අභිධර්මයෙහි - අමොහ, ධමමවිචය සමමාදිට්ඨි යයි යම් ප්‍රඥාවක් දනී නම් එය වේ. දිට්ඨිසස පධානං යනු චෙතසික විරියාරමභ යයි සමමා වායාම යයි. මෙසේ මේ දුක බෙදන ලදී.

සංවේගය ද සංවේගය දනවන ස්ථානදැයි මෙහි සංවෙගො - ජාති භය, ජරා භය, ව්‍යාධි භය මරණභය, මෙසේ ජාති ආදි බියෙන් දකින ඤාණය. සංවෙජනීය ඨානං - ජාති ජරා ව්‍යාදි මරණ. මේ සතර ජාති දුක, ජරා දුක, ව්‍යාධි දුක, මරණ දුක යයි සංවේග ඉපදීමට හේතුව, සථානයයි කියන ලදී. සංවිගගසස ච යොනිසො පධානං - මෙසේ සංවේගයට පැමිණ විට උපායෙන් ප්‍රධාන වූ. මහණෙනි, මෙහි නූපන් පාප අකුසල දහම් නොඉපදීම් පිණිස කැමත්ත වී ඇතිවීම යයි මෙසේ පැමිණි වීර්යට සමාන වචනයකි. අසනතුට්ඨිතා ච කුසලෙසු ධමෙමසු - කුසල දහම් භාවනාවෙන් තෘප්තිමත් නොවූ පුද්ගලයා බොහෝ කැමතිවන්නේ ඒවායින් යුකත පුද්ගලයා සීලය සම්පූර්ණ කොට ධ්‍යාන උපදවයි. ධ්‍යාන ලබා විදර්ශනාව අරඹයි. අරඹන විදර්ශනා ඇත්තේ රහත් නොවී අතරමග අවසානයට නොපැමිණේ. අප්පටිවානිතා ච පධානසමිං - කුසල් දහම් භාවනාවෙන් සකස්ව කළබව නිතර කළබව, නොසැඟවුණු පැවැත්ම ඇති බව, නොහරින ලද දුර ඇති බව, සේවනය කරන භාවනාව බෝහෝ කිරීමෙන් යයි මෙසේ කියන ලදී. රෑ දාවල් කොටස් හයකට බෙදා නිදි වැරීම් යෝග වශයෙන් ආරම්භ වීර්යෙහි රහත් නොවී නොනවතින බව. විජ්ජා - ත්‍රිවිද්‍යා. විමුතති - අධිමුතති හා නිබ්බාන යයි විමුතති දෙකකි. එහි අෂට සමාපත්ති, නීවරණාදියෙන් හොඳින් මිදුණු නිසා අධිමුතති නම් වේ. නිවණ සියළු සංඛතවලින් මිදුණු බැවින් විමුතති යයි දත යුතුය. ඛයෙ ඤාණං - කෙලෙස් නැති කරන ආර්ය මාර්ග ඤාණය අනුප්පාදෙ ඤාණං - ප්‍රතිසන්ධි වශයෙන් නොඉපදෙන, කෙලෙසුන් නොඉපදෙන අවසානයේ උපන් ආර්ය ඵල ඤාණය, එහෙයින් කීහ: ඛයෙ ඤාණං මාර්ග යුක්ත ඤාණය. අනුප්පාදෙ ඤාණං - ඵල යුකත ඤාණය. ඉමෙ ඛො ආවුසො - යනාදි මෙය

ඇවැත්ති ඒකකයෙහි කියන ලද නයින්ම යෙදිය යුතුය. මෙසේ පන්තිසක් වූ දුක වශයෙන් සංවිර තෙමේ සාමග්‍රී රසය දක්විය.

### දුක නිමි.

මෙසේ දුක වශයෙන් සාමගගි රසය දක්වා දැන් තික වශයෙන් දක්වීමට නැවත දේශනය ඇරඹීය. එහි ලෝබ කෙරේනුය - ලොභො. අකුසලය ද එය මුලයද අකුසල්වල මූලයයි අකුසල මුල් වේ. දූෂණය වේ යයි - දොස් වේ. මුලාවේ යයි මෝහ වේ. ඒවාට ප්‍රතිපක්‍ෂ වශයෙන් අලෝභ ආදිය දත යුතුය. දුෂට චරිත නරක හැසිරීම් හෝ දුෂ්චරිත වේ. කාය දුෂ්චරිත කයින් පවත්වන දුෂචරිත - කාය දුචචරිත වේ. සෙසු ඒවායෙහි ද මෙම නයයි. යහපත් හැසිරීම් සුන්දර හෝ හැසිරීම් සුචරිත වේ. මේ දෙක ද පැණවීමෙහි හෝ කර්ම පථයෙහි හෝ ත්‍රිකය ද කිව යුතුය. පැණවීමෙන් කාය දවාරයෙහි පැණ වූ ශික්‍ෂා පද ව්‍යතිකක්‍රමණය කාය දුචචරිතවේ. ව්‍යාතිකක්‍රමණය නොවීම කාය සුචරිත වේ. වචී දවාරයෙහි පණවන ලද ශික්‍ෂාපද ව්‍යාතිකක්‍රමණය වචී දුෂ්චරිත වේ. අවීතික්‍රමණය මනෝ සුචරිත වේ. මෙ පණවනලද කථාය. පාණාතිපාතා ආදි චේතනා තුන කාය දවාර වචීදවාරවල උපන්නේ කාය දුෂචරිත වේ. ඒවායේ විරති (වෙන්වීම) චේතනා තුන කාය සුචරිත වේ. මුසාවාද ආදි සතර වචී දුචචරිත වේ. විරතිය වචී සුචරිත වේ. අභිජ්ඣා ව්‍යාපාද මිච්ඡා දිට්ඨි තුන මනෝ දුෂචරිත වේ. අනභිද්‍යා, අව්‍යාපාද, සම්මා දිට්ඨි තුන මනෝ සුචරිත වේ. මේ කර්මපථ කථා වේ. කාම පටිසංයුත්ත විතක්ක (සිතිවිලි) ය. කාම විතකක - වේ. ව්‍යාපාදයෙන් යුක්ත විතක්කය ව්‍යාපාද විතකක - නම් වේ. හිංසාවෙන් යුත් විතක්කය විහිංසා විතකක වේ. ඒවායින් දෙකක් සත්‍වයන් කෙරෙහි ද සංඛාර කෙරෙහි හෝ සංඛාර කෙරෙහි හෝ සිතිවිල ඇත්තාට උපදී. කිපී සිතිවිලි ඇති වී නැතිවන තුරු උපදී. විහිංසා විතකකය සංඛාර කෙරෙහි නූපදී. සංඛාර වනාහි දුක පැමිණවිය යුතුයයි නැත. මේ සතුන් විනාශ කරත්වා සිදුරු කෙරේවා නසත්වා හෝ නොවේවා හෝ සිතන කල්හි සත්‍වයන් කෙරෙහි උපදී. නික්මීමේ සිතිවිල නෙකඛමම විතකක - වේ. එය අසුභ පූර්වභාගයෙහි කාමාවර වේ. අසුභ ධ්‍යානයෙහි රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කොට උපන් මාර්ග ඵල කාලයෙහි ලෝකෝත්තර වේ. තරහ නැතිව

උපදින සිතිවිලි අව්‍යාපාද විතක්ක - වේ. එය මෛත්‍රී පූර්වභාගයෙහි කාමාවචර වේ. මෛත්‍රී ධ්‍යානයෙහි රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කොට උපදින මාර්ගඵල කාලයෙහි ලෝකෝත්තර වේ. අවිහිංසා සිතිවිලි අව්‍යාපාද විතක්ක - වේ. එය මෛත්‍රී පූරවභාගයෙහි කාමාවචර වේ. මෛත්‍රී ධ්‍යානයෙහි රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කොට උපදින මාර්ගඵල කාලයෙහි ලෝකෝත්තර වේ. අවිහිංසා සිතිවිලි අවිහිංසා විතක්ක - වේ. කරුණාව පෙරටු වූ කල්හි කාමාවචරවේ. කරුණා ධ්‍යානයෙහි රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කොට උපන් මාර්ගඵල කාලයෙහි ලෝකෝත්තර වේ. අලෝභය ශීර්ෂ වූ විට ඉතිරි දෙක ඒ අර්ථයෙහි වේ. මෛත්‍රීය ශීර්ෂ වූ විට ඉතිරි දෙක ඒ අර්ථයෙහි වේ. කරුණාව ශීර්ෂ වූ විට ඉතිරි දෙක ඒ අර්ථයෙහි වේ. කාම සංකල්පාදිය කියන ලද නයින්ම කියන ලදී. දේශනා මාත්‍රයම වේ. අර්ථ වශයෙන් කාම විතක්ක හා කාම සංකල්පවල වෙනසක් නැත.

කාමයෙන් යුත් හැඳිනීම කාමසඤ්ඤා - වේ. ව්‍යාපාදයෙන් සඤ්ඤාව ව්‍යාපද සඤ්ඤා - වේ. විහිංසාවෙන් යුත් සඤ්ඤා විහිංසා සඤ්ඤා - වේ. ඒවාද කාම විතක්කාදිය මෙන් උපදින ආකාරය දත යුතුය. එසේම එය සම්පයුත්ත ද වේ. නෙක්ඛම්ම සංඥා ආදිය ද නෙක්ඛම්ම විතක්කාදිය සමග යුක්ත වේ. එහෙයින් ඒවායේ ද එසේම කාමවචරාදි භාවය දත යුතුය. කාමධාතු ආදියෙහි කාමයෙන් යුක්ත තර්කය විතර්කය මිථ්‍යා සංකල්පය මෙය කාමධාතු යයි කියනු ලැබේ. සියළු අකුසල දහම් කාමධාතු වේ. මෙය කාමධාතු ව්‍යාපාදයෙන් යුත් තර්ක විතර්ක මිථ්‍යා සංකලප මෙය ව්‍යාපාද මනසින් යුත් සිත මේ ව්‍යාපාද ධාතු - වේ. විහිංසාවෙන් තර්ක විතර්ක මිථ්‍යා සංකල්පය යන මෙය විහිංසා ධාතු වේ. මෙහි කෙනෙක් අතින් හෝ ගලකින් හෝ දණ්ඩකින් හෝ ආයුධයකින් හෝ ලනුවකින් හෝ යමකින් සතුන්ට හිංසා කෙරේ නම් මෙය විහිංසා ධාතු - වේ. එහි සබ්බ සංගාහික ද යමකින් සතුන්ට හිංසා කෙරේ නම් මෙය විහිංසා ධාතු - වේ. එහි සබ්බ සංගාහික ද අසම්භින්න ද යයි කථා දෙකකි. එහි කාම ධාතුව ගැනීමෙන් ඉතිරි දෙකද ගත්තා වේ. එය බැහැර කොට මේ ව්‍යාපාද ධාතු මේ විහිංසා ධාතු යයි දක්වී යයි මේ සබ්බ සංගාහික කථා නම් වේ. භාග්‍යවතුන් වහන්සේ කාමධාතු දේශනා නම්, නෙක්ඛම්ම ධාතු ආදියෙහි නෙක්ඛම්මයෙන් යුත් තර්ක.... මෙය නෙක්ඛම්ම ධාතු - යයි කියනු ලැබේ. අව්‍යාපාදයෙන් යුත් තර්ක......මෙය අව්‍යාපාද ධාතු - යයි කියනු ලැබේ.

සත්වයන් කෙරෙහි යම් කරුණා චේතෝ විමුත්තිය යන මෙය අවිහිංසා ධාතු වේ. මෙහි ද කියන ලද නයින් දේශනා දෙක දත යුතුය. අපරාපි තිසෙසා ධාතු - යයි අන්‍ය වූ ශුන්‍ය සථාන අර්ථයෙන් ධාතු තුනකි. ඒවායින් එහි කාමධාතු කවරේද? යටින් අවීචි නිරය අවසන් කොට මෙසේ පළල්වූ කාමභවය කාමධාතු - නම් වේ. බ්‍රහම ලෝකය අවසන් කොට ආකාසානඤ්චායතනයට පැමිණි දෙවියන් කෙළවර කොට මෙසේ පැතුරුණු රූපාරූප භවවල ඉතිරි ධාතු දෙක වේ. ධාතුවෙන් පැමිණිතැන භවයෙන් අවසන් කළයුතුය. භවයේ පැමිණිතැන ධාතුවෙන් පිරිසිඳිය යුතුය. මෙහි භවයෙන් පිරිසිඳීම කියන ලදී. රූපාරූපධාතු ආදියෙහි රූපාරූප ධාතු රූපාරූප භවවේ. නිරෝධ ධාතුවෙන් නිර්වාණය කියන ලදී. හීනාදියෙහි හීනාධාතු - යයි දොළොස් අකුසල සිත් ඉපදීම. සෙසු ත්‍රෛභූමික ධර්ම මජ්ඣිමා ධාතු - වේ. නවලෝකෝත්තර ධර්ම පණීත ධාතු - වේ. කාම තණ්හා - පංචකාම ගුණික රාගයයි. රූපාරූප භවවල චනාභි රාගය - ධ්‍යාන ලෝභයයි. ශාස්වත දෘෂ්ටි සහගත් රාගය භව වශයෙන් ප්‍රාර්ථනාවද භව තෘෂ්ණා වේ. උච්ඡෙද දෘෂ්ටි සහගත රාගය විභව තණ්හා වේ. තවද අවසන් තෘෂ්ණා දෙක හැර සෙසු තෘෂ්ණා කාම තණ්හා - නම් වේ. යම්සේ කීහ: එහි භව තණ්හාව කවරේද? භව දෘෂ්ටි සහගත රාගය, සිත රාග සහිතවීම, මෙය භව තණ්හාව යයි කියනු ලැබේ. එහි විභව තණ්හාව කවරේද? උච්ඡෙද දෘෂ්ටි සහගත රාගය භව වශයෙන් පතන සිතේ ඇතිවන රාගය විභව තණ්හාව යයි කියන ලදී. අවසේස තෘෂ්ණා කාමතණ්හා වේ. නැවත කාමතණ්හා ආදියෙහි පංච කාම ගුණික රාගය කාම තණ්හා වේ. රූපරූප භවවල, ඡන්ද රාගය ඉතිරි තණ්හා දෙක වේ. අභිධර්මයෙහි මෙසේ විස්තර කරන ලදී: ''කාමධාතු පටිසංයුතත.....අරූපධාතු පටිසංයුතත'' වශයෙනි. මේ වාරයෙහි කුමක් දක්වීද? සියළු ත්‍රෛභූමික ධර්ම, ඇලීම් අර්ථයෙන් තෘෂ්ණා වස්තු වේ. සියළු කාම තෘෂ්ණාව අල්ලාගෙන එයින් ගෙන ඉතිරි තණ්හා දෙක දක්වීය. රූප තණ්හා - රූප භවයෙහි ඡන්දරාගය රූප තණ්හාවය. අරූප භවයෙහි ද එසේය.

සංයෝජන - සසරෙහි යොදයි බඳියි යනු - සංයොජනා - වේ. රූපාදිභෙදි ඇති කල්හි කයෙහි ඇති දෘෂ්ටිය කයෙහි දෘෂ්ටිය විද්‍යාමාන වූයේ හෝ සක්කාය දිට්ඨි - වේ. විමසීම මෙහි කෘත්‍ය වේ. තීරණය කිරීමට නොහැකි වේ යන විචිකිච්ඡා - වේ. සීලය ද ව්‍රතය ද පරාමර්ශනය කරයි යනු සීලබ්බත පරාමාස - වේ. අර්ථ වශයෙන් රූපය ආත්ම

වශයෙන් බලයි යනාදි වශයෙන් පැමිණි වස්තු විස්සෙහි පවත්නා දෘෂ්ටිය සක්කාය දිට්ඨි වේ. ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කෙරේ ආදි නයින් අෂ්ටවස්තු කෙරෙහි විමතිය විචිකිච්ඡා - නම් වේ. මෙහි ඇතැමෙක් සීලයෙන් සුද්ධි ව්‍රතයෙන් ශුද්ධි සීලව්‍රතයෙන් සුද්ධි යයි සීලය පරාමර්ෂණය කරයි. ව්‍රතය පරාමර්ෂණය කරයි මෙබඳු වූ දෘෂ්ටිය දිට්ඨ ගත යයි ආදි නයින් ආවා වූ විපර්යාශ ගැනීම සීලබ්බත පරාමාස වේ.

තයො ආසවා - මෙහි බොහෝ කලක් විසීය යන අර්ථයෙන් හෝ වැගිරේය යන අර්ථයෙන් හෝ ආසවා - වේ. මහණෙනි එහි ආරම්භය මුල නොපෙනේ. අවිද්‍යාව මෙයින් පෙර නොවුයේ යයි ඉන් පසුව ඇති වී යයි මුල්කොන නොපෙනේ. භවතෘෂ්ණාව, භවදෘෂ්ටිය මෙයින් පෙරභව දෘෂ්ටිය නොවීය. ඉක්බිති පසුව සම්භව වූයේ යයි මෙසේ බොහෝ කාලයක් විසීය යන අර්ථයෙන් ආසව - දතයුතුය. ඇසින් රූපයෙහි වැගිරේ, පවත්වයි කනින් ශබ්දයෙහි නාසයෙන් ගඳ සුවඳෙහි දිවෙන් රසයෙහි කයින් ස්පර්ශයෙහි මනසින් සිතිවිලිවල වැගිරේ ගලයි පවත්වයි යන මෙසේ වැගිරේ යන අර්ථයෙන් ආසව - දතයුතුය. පෙළෙහි වනාහි කිසියම් ආසව දෙකක් දිට්ඨ ධම්මික සම්පරායික වශයෙන් ආවේය. කිසිතැනක "මහණෙනි, කාමාසව භවාසව අවිජ්ජාසව යයි ආසව තුනකි" අභිධර්මයෙහි ඒ ආසව දිට්ඨාසව සමග හතරකි. නිබ්බේධික ක්‍රමයෙහි, "මහණෙනි, නිරයගාමී ආසව ඇත, තිරච්ඡානගාමී ආසව ඇත, ප්‍රේත විෂය ගාමී ආසව ඇත, මනුෂ්‍ය ලෝකගාමී ආසව ඇත, දේව ලෝකගාමී ආසව ඇතැ"යි මෙසේ පහක්. ඡක්ක නිපාතයෙහි ආහුනෙය්‍ය සූත්‍රයේ "මහණෙනි, සංවරයෙන් පහකළ යුතු ආසව ඇත, සේවනය කිරීමෙන් පහකළයුතු ආසව ඇත, දුරු කිරීමෙන් පහකළ යුතු ආසව ඇත. ඉවසීමෙන් පහකළ යුතු ආසව ඇත, අත්හැරීමෙන් (විනොදනා) පහකළ යුතු ආසව ඇත, භාවනාවෙන් පහකළයුතු ආසව ඇතැයි මෙසේ හයක්. සබ්බාසව පරියායෙහි ඒවා දර්ශනයෙන් පහකළයුතු ආසව සමග හතකි. මේ සංගීති සූත්‍රයෙහි තුනකි. එහි යමෙක් කාමයන්හි කාම අදහස ඇතිව මෙසේ කියන ලද පංචකාම ගුණික රාගය කාමාසව - නම්. යමෙක් භවයෙහි භව කැමැත්තේ මේ කියන ලද සාස්වත දිට්ඨි සහගත රාගය භව වශයෙන් ප්‍රාර්ථනා භවාසව - නම්. දුකෙහි නොදැනීම ආදි නයින් පැමිණි අවිද්‍යාව අවිජ්ජාසව නම් වේ.

කාමභවාදිය කාමධාතු වශයෙන් කියන ලද්දේමය. කාමය සෙවීම ආදියෙහි, එහි කාමය සෙවීම කවරේද? යමෙක් කාමයන් කෙරෙහි කාම කැමත්තේ කාම ඇල්ම මෙය කාම සෙවීම යයි කියනු ලැබේ. මෙසේ කී කාම ගවේෂණය කාමෙසනා - නමි. එහි භවය සෙවීම කවරේද? යමෙක් භවයෙහි භවය කැමැත්තේ භවයෙහි බලවත් ඇල්ම මෙය භවය සෙවීම යයි කියනු ලැබේ. භවය සෙවීම යයි මෙසේ කියන ලද භවය ගවේෂණය කරන රාගය භවෙසනා - නම් වේ. එහි බ්‍රහ්මචරිය සෙවීම කවරේද? ලෝකය ශාස්වත යයි හෝ .......නොවේ යයි, නොවන්නේ නොවේ යයි සත්වයා මරණින් පසු, මෙබඳු දෘෂ්ටිය විපර්යාසව ගැනීම බ්‍රහමචරියෙසනා - යයි කියනු ලැබේ. හුදෙක් එම අර්ථය බ්‍රහ්මචර්ය ගවේෂණය පමණක් නොව කර්මය ද සොයන්නේමය. මෙය කියන ලදී. එහි කාම සෙවීම කවරේද? කාමරාගය එය ඒ අර්ථයෙන් අකුසල කාය කර්ම, වචීකර්ම, මනෝ කර්ම මෙය කාමෙසනා - යයි කියනු ලැබේ.

එහි භවය සෙවීම කවරේද? භව රාගය එය ඒ අර්ථයෙන් අකුසල කායකර්මය, වචීකර්මය, මනෝ කර්මය මෙය භවය සෙවීම යයි කියනු ලැබේ. එහි බ්‍රහමචරිය සෙවීම කවරේද? අනතග්‍රාහී දෘෂ්ටිය එය ඒ අර්ථයෙන් අකුසල කාය කර්ම, වචීකර්ම, මනෝ කර්ම මෙය බ්‍රහමචරිය සෙවීම යයි කියනු ලැබේ. විධාසු - සීලවනත යයි කියන්නේ කවර ආකාරයෙන්ද? ප්‍රඥාවනත යයි කියන්නේ කවර ආකාර යෙන්ද? ආදියෙහි ආකාර පිහිටීම විධා නම් වේ. ඒක විධෙන ඤාණවත්‍ථු දුවිධෙන ඤාණවත්‍ථු ආදියෙහි මානය විධා නම් වේ. මෙය එය අදහස් වේ. මානය සෙය්‍යාදි වශයෙන් විධානයෙන් විධා - යයි කියනු ලැබේ. සෙය්‍යොහමස්මි යයි මෙයින් සෙය්‍ය සදිස හීන වශයෙන් මාන තුනක් කියන ලදී. සදිස හීනවල ද මෙ නයම වේ. මේ මානය නම් ශ්‍රේෂ්ඨයාගේ වශයෙන් ත්‍රිවිධය, සමානයාගේ වශයෙන් ත්‍රිවිධ වේ. හීනයාගේ වශයෙන් ත්‍රිවිධ වේ යයි නවවිධ වේ. එහි ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමියි මේ මානය රජවරුන්ට සහ පැවිද්දන්ට උපදී. රජ වනාහි රටින් හෝ ධනයෙන් හෝ වාහනවලින් හෝ මා හා සමාන කවරෙක් සිටීදැයි මේ මානය කරයි. පැවිද්දා ද සීල ධුතංග ආදියෙන් මා හා සමාන කෙනෙක් ඇද්දැයි මේ මානය කරයි, ශ්‍රේෂ්ඨයාට සමාන වෙම් යන මානය ද ඔවුන්ට ම උපදී. රජ රටින් ධනයෙන් වාහනවලින් අනිත් රජුන් සමග මගේ ඇති වෙනස කුමක්දැයි මේ මානය කරයි. පැවිද්දා ද අන්‍ය භික්‍ෂූන් සමග සීල ධුතාංග

ආදියෙන් මගේ ඇති වෙනස කුමක්දැයි මේ මානය කරයි. සෙය්‍යසස හීනොහමසමි- ශ්‍රේෂ්ඨයාට වඩා හීන වෙමි යන මානය ද ඔවුන්ටම උපදී. යම් රජෙකුට රට හෝ ධන වාහනාදිය ඉතා අඩුය. හේ මම රජෙකු වෙමියි ව්‍යවහාර මුඛයෙන් මිස මා මොන රජෙක්දැයි මේ මානය කරයි. අල්ප ලාබ සත්කාර ඇති පැවිද්දාද මම ධර්මකථිකයෙකි බහුශ්‍රැතයෙකි මහා ස්ථවිර යයි කථාමාත්‍රයෙන් පමණය. මා මොන ධර්ම කථිකයෙක්ද බහුශ්‍රැතයෙක්ද මහතෙර කෙනෙක්දැයි මේ මානය කරයි. **සදිසසස සෙය්‍යාහමසමි** - සමානයාට වඩා ශ්‍රේෂ්ඨ වෙමි. මේ මානාදිය ඇමතියන්ට උපදී. ඇමතියෙක් හෝ රට වැසියෙක් හෝ භෝග යානාවාහනාදියෙන් මා හා සමාන වෙනත් රාජ පුරුෂයෙක් ඇද්දැයි හෝ අන්‍යයන් හා මගේ ඇති වෙනස කුමක්දැයි හෝ මට ඇමති නම විතරයි කෑම ඇඳීමක් නැත. මා ඇමතියෙක්දැයි මේ මාන කරයි. **හිනසස සෙය්‍යා හමසමි** - හීනයාට වඩා ශ්‍රේෂ්ඨ වෙමි. මේ මානාදිය දාසාදීන්ට උපදී. දාසයා මව් පාර්ශවයෙන් හා පිය පාර්ශවයෙන් මා හා සමාන වෙනත් දාසයෙක් සිටිනවාද අතින් අය ජීවත් වෙන්ට නොහැකිව බඩ නිසා දාසයෝ වූහ. මා වනාහි ප්‍රවේණියෙන් ආ බැවින් ශ්‍රේෂ්ඨයයි හෝ ප්‍රවේණියෙන් ආ බැවින් උභය ශුද්ධියෙන් අසවල් දාසයා සමග මගේ ඇති වෙනස කුමක්දැයි හෝ බඩ නිසා මා දාසභාවයට පැමිණියත් මාපියන්ගේ වශයෙන් මම දාසයෙක් නොවෙමි හෝ මේ මානයන් කරති. යම්සේ දාසයා මෙන් මෙසේ පුක්කුස චණ්ඩාල ආදීහුද මේ මානයන් කරති. මෙහිද සෙය්‍යසස සෙයොහමසමි ශ්‍රේෂ්ඨයාට වඩා ශ්‍රේෂ්ඨ වෙමි හෝ සදිසසස සදිසොහමසස - සමානයාට සමාවෙමි හෝ හීනයාට හීනවෙමි හෝ මේ මාන තුන අරහත් මාර්ගය හැර තත් වූ මානය, සෙසු මාන හය සෝවාන් මාර්ගය හැර තත්වූ පරිදි නොවූ මානය. **අතීතො අද්ධා** - යනාදියෙහි පරියාය දෙකකි. සුත්තනත, අභිධමම වශයෙනි. සූත්‍රාන්ත ක්‍රමයෙන් ප්‍රතිසන්ධියට පෙර අතීත කාල නම් වේ. චුතියෙන් පසු අනාගත කාල නම් වේ. චුති පටිසන්ධි අතර කාලය වර්තමාන වේ. අභිධර්ම ක්‍රමයෙන් ක්ෂණ තුනෙහි භංගයෙන් ඉහත අතීතකාල, උප්පාදයට පෙර අනාගතකාල ක්ෂණ තුනෙහි වර්තමාන කාල වේ.

මේ ධර්මවල අතීතාදි භේද වේ. කාලයෙහි අතීතාදි භේද නැත. මෙහි පරමාර්ථ වශයෙන් කාලය අවිද්‍යාමානය. එහෙයින් එය ව්‍යවහාර වශයෙන් කියන ලදැයි දත යුතුය. **තයො අනතා** - කොටස්

තුනකි. බඳපටියේ කෙළවර දිරයි ආදියෙහි අන්තය. **එසෙවනෙතා දුකඛසස** - මෙය දුකෙහි කෙළවරය. ආදියෙහි අවසානය. මහණෙනි, මේ ජීවිතයේ අනතයයි. මෙහි ලාමක භාවයයි. ඇවැත්නි 'සකකාය' පළමුවන අන්තයයි. ආදියෙහි කොටස අනතයයි. **සකකායො** - උපාදාන ස්කන්ධ පහ. **සකකාය සමුදයො** - ඒවා ඉපද වූ පෙරවූ තෘෂණාව. දෙකම නොපැවතීම නිර්වාණයයි - **සකකාය නිරොධය** - මාර්ගය වනාහි නිරොධ අධිගමයට උපාය බැවින් නිරෝධය ගන්නා කල්හි ගන්නා බව දත යුතුය. **දුකඛ දුකඛතා** - දුක් වූ දුක් බව මෙය වේදනාවට නමකි. **සංඛාර දුකඛතා** - සංස්කාර භාවයෙන් දුක් බව. අදුකඛමසුඛ වේදනාවට මෙය නමකි. එය වනාහි සංඛත බැවින් උත්පාද ජරා බිඳීම්වලින් පෙළෙන බව, එහෙයින් අන්‍ය දුකඛ සවභාවයකින් විරහිත වූ සංසාර දුක්ඛ කියනලදී. **විපරිනාම දුකඛතා** - වෙනස්වීමේ (විපරිනාම) දුක් බව, සුඛ වේදනාවට මෙය නමකි. සැපයේ වෙනස්වීමේදී දුක් උපදී. එහෙයින් සැපය විපරිනාම දුක්බව යයි කියන ලදී. තවද දුක් වේදනාව හැර සැප වේදනාවද සියළු ත්‍රෛභූමික ධර්ම ''සබෙබ සංඛාරා දුකඛා'' යන වචනයෙන් සංඛාර දුක් යයි දත යුතුය. **මිචඡතත නියතො** - මිථ්‍යා සවභාවය නියතය. නියත මිථ්‍යාදෘෂ්ටිය සමග ආනනතරිය කර්මයට මෙය නමකි. සම්‍යක් සවභාවයෙහි නියතය **සමමතත නියතතා** - සිව් අරිය මගට මෙය නමකි. **න නියතො** - අනියතය. අවසේස ධර්මවලට මෙය නමකි. **තයොතමා**'' මුළාව අඳුරයි. අවිද්‍යා ඕඝය මහබියකි'' යන වචනයෙන් අවිද්‍යාව තම (අඳුර) නම් වේ. මෙහි වනාහි අවිජජා ශීර්ෂයෙන් විචිකිචඡාව කියන ලදී. **ආරමභ** - පැමිණ. **කංඛති** - සැකය උපදවයි. **විචිකිචඡති** - සොයන්නේ දුකට පැමිණේ. තීරණය කිරීමට නොහැකි වේ. **නාධිමුචචති** - එහි මිදීමට තීරණය කිරීමට නොහැකි වේ. **න සමපසීදති** - එය ඇරබ ප්‍රසාදය ආරෝපනය නොහැකි වේ. **අරකෙඛයාති** - රැකිය යුතු නොවේ. තිදොරෙහි වෙනම රකින කිසක් නැත. සියල්ලම සිහියෙන් රකින ලදයි දක්වයි.

**නතථි තථාගතසස** - මෙය නම් මට වහා ඉපදුණ කාය දුසිරිත අන් අයට දැනගැනීමට නොදී රකිම් වසම් යි මෙසේ රැකිය යුතු කාය දුසිරිතක් තථාගතයන් වහන්සේට නැත. සෙස්සෙහි ද මෙම නය වේ. කිම සෙසු ක්ෂීණාශ්‍රවයන්ගේ කාය සමාචාරාදිය අපිරිසිදුවේද? අපිරිසිදු නොවේ. තථාගතයන් වහන්සේගේ මෙන් පිරිසිදු නැත. අල්පශ්‍රැත ක්ෂීණශ්‍රවයන් වහන්සේ ද කිසිදු ලෝක වැරැද්දකට නොපැණේ. පැණ වූ

ශික්‍ෂාහි වනාහි අදක්‍ෂ බැවින් විහාර කිරීම, කුටි කිරීම, සහකාරයන්, සහසෙය්‍ය එබඳු වූ කාය දවාරයෙහි ආපත්තියට පැමිණේ. සංචරිත්ත, පදසො ධම්ම, උත්තරිං ඡප්පඤ්චවාචං වූ දෙයක් දූන්වීම් වශයෙන් මනෝ ද්වාරයෙහි රූපිය පටිග්ගහණ ආපත්තියට පැමිණේ. ධම්ම සේනාපති වැනි ක්‍ෂීණාශ්‍රවයින්ටද මනෝ දවාරයෙහි දෝෂාරෝපණ වශයෙන් මනෝ දුසිරිත් උපදී. චාතුම වසතුවෙහි සැරියුත් මුගලන් දෙනමගේ අතවැසි භික්‍ෂූහු බුදුන් වහන්සේ විසින් නෙරපන ලද වූ අවස්ථාවක, සැරියුත් හිමියන්ට කුමන අදහසක් ඇතිවීදැයි බුදුහිමි ඇසූයේය. එවිට සැරියුත් සඳහන් කෙළේ මින්පසු අන්‍යයන්ට උපදෙස් දෙන්නේ නැත. අනුසාසනා කරන්නේ නැත යන සිතක් ඉපදුණු බවය. බුදුහිමි භික්‍ෂූහු නෙරපනු ලැබූ කල්හි මඳ උත්සාහ ඇති නිසා බුදුහිමි දිටඨ ධම්ම සැප විහරණයෙන් වාසය කරන්නේය. අපි ද මඳ උත්සාහ ඇති නිසා දිටඨධම්ම සැපවිහරණයෙන් වාසය කරන්නෙමු ඒ මනෝ දුසිරිතෙහි දෝෂාරෝපනය ආරෝපනය කරමින් බුදුහිමි, "අනුන්ට අවවාද අනුසාසනා කරන්නේ, නැතැයි නැවත එබඳු සිතක් ඉපදවීමට බලාපොරොත්තු වන්නෙහි දැයි ඇසීය. තර්ක මාත්‍රයකින් සැරියුත් හිමිට මනෝ දුසිරිතක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේට වනාහි එපමණකුදු නැත. සර්වඥතා ඥානයට පැමිණියහුට දුසිරිතක් නොවෙන්නේය යන මෙය ආශ්චර්ය නොවේ. බෝධි සත්ව භූමියේ සිටියේ සාවුරුදු දුෂ්කර ක්‍රියා සමයෙහි ද නොවීය. උදරයේ සම පිට කොඳු ඇට ඇලීයෑමෙන් ශ්‍රමණ ගෞතමයන් කළුරිය කෙළේ යයි සැක ඇති වූ කල්හිද "සිද්ධාර්ථ කුමට ක්ලාන්ත වෙනවද? ආහාර ගෙන පින්කළ හැකියයි" මාරයා කියන කල්හිද ආහාර ගනිමියි සිතිවිල්ලක්වත් නූපන්නේය. ඉක්බිති මාරය බෝසත් කාලයේ ඒ අවුරුදු හයද බුදු වූ පසු එක් අවුරුද්දක් ද ලුහුබැඳ කිසි වරදක් නොදුක මෙය කියා ගියේය.

සත් වසක් ලුහුබැඳ - බගවත් පිය'නුපියනුව
නොලදිමි කිසි දොසක් - සිරිමත් සම්බුදුන්ගේ

තවද අටලොස් බුදු දහම් වශයෙන් ද භාග්‍යවතුන් වහන්සේගේ දුසිරිත් අභාවය දත යුතුය. අටලොස් බුදු දහම් නම්. තථාගතයන් වහන්සේගේ කාය දුසිරිත් නැත. වාක් දුසිරිත් නැත. මනෝ දුසිරිත් නැත. අතීත, අනාගත, වර්තමාන කාලවල තථාගතයන්ගේ නොපැකිලෙන ඥාණය බුදුරදුන්ගේ සියළු කාය කර්ම ඥාණයට අනුව

සකස් වේ. සියළු වාක් කර්ම සියළු මනෝකර්ම ඥාණයට අනුව සකස් වේ. කැමැත්තට හානි නැත. වීර්යට හානි නැත. සිහියට හානි නැත. ක්‍රීඩා නැත. ශබ්ද නැ. දෝෂ නැත. හදිසි නැත. නොයෙදුණු මනසක් නැත. අකුසල සිතක් නැත. කිඤචනා - පළිබෝධ. රාගොකිඤචනං - රාගය ඉපදී සත්‍වයන් බඳියි. එහෙයින් කිඤචන යයි කියයි. ඉතිරි දෙකෙහිද මෙම නයයි. අගගි - අනුව දවන අර්ථයෙන් ගිනි. රාගගගි - රාග ඉපදී සතුන් දවයි. එනිසා ගිනි යයි කියයි. ඉතිරි දෙකෙහිද මෙම නයම වේ.

එහි කථාවස්තුව එක් දහර භික්ෂුණියක් සිතුල්පව් විහාරයෙහි පොහොය ගෙට ගොස් දොරටුපාල රූපය බලමින් සිටියාය. ඉක්බිති ඇයගේ ඇතුළත රාගය ඇති වී ඕ එයින් ම දැවී කළුරිය කළාය. භික්ෂුණීහු ද යන්නෝ මේ දහර භික්ෂුණීට කථාකර කැඳවන්නැයි කීහ. එක් භික්ෂුණියක් ගොස් මොකද සිටින්නේ කියා අත ඇල්ලීය. ඇල්ලුව විතරයි. පෙරළී වැටුණේය. මෙය රාගයේ අනුදහන වස්තුවකි. ද්වේශයේ අනුදහනයට මනෝ පදෝසිකා දෙවියන් දක්වේ. මෝහයේ අනුදහනයට කිඩ්ඩා පදොසිකා දෙවියන් දක්විය හැකිය. මෝහ වශයෙන් ඔවුන්ගේ සිහි මුළාවේ එහෙයින් ක්‍රීඩා වශයෙන් ආහාර වේලාව ඉක්මවා කළුරිය කරති. ආහුනෙය්‍යගගී - යනාදියෙහි ආහුනය සත්කාරයයි කියනු ලැබේ. සත්කාරයට සුදුසු වන නිසා ආහුනෙයෙති වේ. මාපියෝය. මව්පියෝ වනාහි දරුවන්ට බොහෝ උපකාර බැවින් සත්කාරයට සුදුසු වෙති. ඔවුන් කෙරෙහි වැරදි ලෙස හැසිරෙන දරුවො නිරයාදියෙහි උපදිති. එහෙයින් ටිකක්වත් මව්පියෝ අනුදහන නොකරති. අනුදහනයට හේතු වේ. මෙසේ අනුදහන අර්ථයෙන් ආහුනෙය්‍යගගී යයි කියනු ලැබේ. මේ අර්ථය සඳහා මිත්තවින්‍දකයාගේ වස්තුව දතයුතුය. මිත්තවින්දකගේ මව දරුව, අද පෝය. පන්සලේ මුළු රැයම බණ ඇසුවොත් දහසක් දෙමියි කීවාය. ධන ලෝභයෙන් පෙහෙවෙස් සමාදන්ව විහාරයට ගොස්. මෙතැන බය නැතැයි සලකා ධර්මාසනය යටට වැද මුළු රැයම නිදාගෙන සිට ගෙදර ආවේය. මව පාන්දරම කැඳපිස පිළිගැන්වීය. හේ දහස ගෙන බීවේය. ඉක්බිති ඔහුට ධනය සොයන්නෙමියි අදහසක් ඇතිවිය. හේ නැවෙන් මුහුද තරණය කිරීමට කැමති විය. ඉක්බිති ඔහුගේ මව දරුව, මේ කුලයෙහි ධනය හතලිස් කෝටියක් ඇත. ගමනේ තේරුමක් නැතැයි කීවාය. හේ ඇගේ වචනය ගණන් නොගෙන යයි. ඕ තොමෝ ඉදිරියේ සිටියාය. ඉක්බිති හේ කිපී මෝ මා ඉදිරියේ

සිටී යයි පයට පහර දී වැටුණු පසු ගියේය. මව නැගිට මා වැනි මවකට මෙබඳු කර්මයක් කොට ඔහු ගිය තැන සැපවේවායි මෙබඳු හැඟීමක් නැති පුත්තු යයි කීවාය. ඔහු නැවට නැගී යන්නේ සත්වන දිනයෙහි නැව නැවතුණේය. ඉක්බිති එහි මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් මෙහි පව්වූ පුරුෂයෙක් ඇත්තේය. සලාක දෙන්න යයි කීහ. සලාක දෙනු ලබන්නේ ඔහුටම තුන්වරක් පැමිණියේය. ඔව්හු ඔහුට පහුරක් දී මුහුදට දැමූහ. හේ එක් දිවයිනකට පැමිණ විමාන ප්‍රේතියන් සමග සම්පත් අනුභව කරන්නේ ඇලා විසින් ඉදිරියට යන්ට එපා කියද්දීත් ඒ ඒ සම්පත් බල බලා ඉදිරියට යන්නේ එක් ඛුර චක්‍රයක් (දැලිපිහියා මුවත වැනි මුවත ඇති චක්‍රයක්) දරූ එකෙකු දුටුවේය. ඔහුට ඒ චක්‍රය නෙළුම් මලක් මෙන් වැටහුණේය. හේ ඔහුට කීවේය. පින්වත, ඔබ පැළඳගෙන ඉන්න මේ පියුම මට දෙන්නැයි ඉල්ලීය. සවාමීනි මෙය පියුමක් නොවේ ඛුර චක්‍රයක් හේ මා වංචා කෙරේ යයි සිතා ඔබ හිතන්නේ මා නෙළුම්මල් දැක නැතැයි කියාද කියා රත් හඳුන් ආලේප කොට ඇති පැලඳ සිටින නෙළුම් මල මට නොදෙනු කැමති යයි කීය. හේ සිතීය. මෙයාද මා කළ කර්මයට සමාන කර්මයක් කොට එහි විපාක විඳින්න කැමති වේ. ඉක්බිති හේ එහෙනම් වරෙන් කියා ඔහු මත චක්‍රය තැබීය. එයින් කියන ලදී:

> සතර අට පැමිණිය - අට සොළොසට ද පත් වී
> සොළොස දෙතිසෙක් වී - ලං කෙළෙ ලෝබී සක වෙත
> කැමති බිඳ මිනිසගෙ - සියගත බෙමේ උරසක

ගහපති - ගෘහ සවාමියා කියයි. හේ ගැහැණියට සයන, වස්ත්‍ර අලංකාරදිය දීමෙන් බොහෝ උපකාර වේ. ඔහු ඉක්ම යන ගැහැණිය නරකාදිවල උපදී. හේ ද පෙර නයින් ම අනුදහන අර්ථයෙන් ගහපතගගී යයි කියන ලදී. එහි වස්තුව මෙසේය.

කාශ්‍යප බුදුන් කාලයෙහි සෝවාන් උපාසකයෙකුගේ භාර්‍යාව පුරුෂයා ඉක්මවා හැසිරෙයි. හේ ඇය ඇසින් දැක කුමක් නිසා මෙසේ කෙරෙහි දැයි ඇසීය. ඉදින් මා එබඳු දෙයක් කෙරේ නම් බල්ලෙක් හපා කන්නේ යයි කියා කළුරිය කොට කණ්ණ මුණ්ඩක විලෙහි වෛමානික ප්‍රේතියක්ව ඉපිද දිවා කාලයෙහි සම්පත් අනුභව කරයි. රාත්‍රියෙහි දුක් විඳියි. බරණැස් රජ මුවකෙළි හැසිරෙන්නේ වනයට පිවිස පිළිවෙළින් කණ්ණමුණ්ඩක විලට පැමිණියේ ඇය සමග සම්පත් අනුභව කෙළේය.

ඕ ඔහු රවටා රාත්‍රියේ දුක් විඳියි. හේ දන කොහියේදැයි පිටිපසින් ගොස් ලඟ සිටියේ, කණනාමුණ්ඩක විලෙන් මතු වී ඇය පට පට අනුකරණයෙන් කන බල්ලකු දැක කඩුවෙන් දෙකට කැපීය. නැවත කැපුවේ හතරෙක් විය. නැවත අටක් වී නැවත සොළොසක් වී ඕ තොමෝ ස්වාමීනි කුමක් කරන්නේදැයි ඇසුවාය. හේ මේ කුමක්දැයි ඇසීය. ඕ මෙසේ නොකොට කෙලපිඩක් පොළොවට කාරා දමා පයින් පාගන්නැයි කීවාය. හේ එසේ කෙළේය. බල්ලෝ අතුරුදහන් වූ එදින ඇගේ කර්මය ගෙවිණ. රජ විපිළිසර වී යන්ට සූදානම් විය. සවාමීනි කර්මය ගෙවිණ. නොයනු මැනවැයි කීවාය. රජ නො අසා ගියේය.

**දක්ඛිණෙය්‍යාගගි** - මෙහි දක්ඛිණ, යන සිව්පසය වේ. භික්‍ෂු සංඝයා දක්ඛිණෙය්‍ය වේ. උන්වහන්සේලා ගිහියන් තිසරණ පන්සිල්හි පිහිටුවයි. ධාර්මික මාපිය, ශ්‍රමණ බ්‍රාහ්මණ උපස්ථානයේ පිහිටුවා බොහෝ උපකාර කරති. උන්වහන්සේලා කෙරෙහි වැරදි ලෙස පිළිපන් ගිහියෝ ආක්‍රොස පරිභව කොට නිරයාදියෙහි උපදිති. එහෙයින් එය ද පෙර නයින්ම අනුදහන අර්ථයෙන් දක්ඛිණෙය්‍යාගගි යයි කියන ලදී. මේ අර්ථය පැහැදිලි කිරීම සඳහා විමාන වසතුවෙහි රේවතී විස්තර කළ යුතුය.

''තිවිධෙන රූප සංගහො'' යන මෙහි **තිවිධෙන** - කොටස් තුනකින් **සංගහො** - ජාති, සඤ්ජාති, කිරිය, ගණ වශයෙන් චතුර්විධ සංග්‍රහය. ''සබ්බෙ කොසලා'' ආදිය සංජාති වේ. එහි ''සබ්බෙ ඛත්තියා, ආගච්ඡන්තු'' ආදිය ජාති වේ. ''සබ්බෙ හත්ථාරොහා'' ආදිය කිරිය සංගහ වේ. ''චක්ඛායතනං කතමං ඛන්ධ ගණනං ගච්ඡති'' යන මෙය ගණන සංගහ වේ. මෙය මෙහි බලාපොරොත්තු වේ. එහෙයින් කොටස් තුනේ රූප ගණන යන අර්ථය වේ. නිදර්ශන සහිත ආදියෙහි තමා අරබයා පවත්නා චක්ඛු විඤ්ඤාණාදිය සංඛ්‍යාතයෙන් සහ නිදර්ශනයෙන් යනු **සනිදස්සනං** - වේ.

ඇස ගැටීමට සමත් පටිඝයෙන් යුත් වූයේ **සප්පටිඝ** වේ. එය අර්ථ වශයෙන් රූපායතනයම වේ. චක්ඛු විඤ්ඤාණ සංඛ්‍යාත එයට නිදර්ශන නොවේ යයි **අනිදස්සන** - වේ. කන ආදිය ගැටෙන සමත් පටිඝයෙන් යුත් වූයේ **සප්පටිඝං** - වේ. එය අර්ථ වශයෙන් චක්ඛු ආයතනාදි නව ආයතන වේ. කියන ලද ආකාර නිදර්ශන එයට

අනිදසසනං - වේ. එයට ගැටීමක් නැතැයි අප්පටිඝ - වේ. එය අර්ථ වශයෙන් දස ආයතන හැර අවසේස සුඛුම රූපවේ. තයො සංඛාරා - සහජාත ධර්මයන් මෙන්ම සම්පරාය ඵල ධර්මයන් රැස් කරයි එකතු කරයි. සඞ්ඛාර වේ. අභිසංස්කරණය කරයි යනු අභිසංඛාර වේ. පුඤ්ඤ අභිසංඛරණය. පුඤ්ඤාභිසංඛාර වේ. එහි පුඤ්ඤාභිසංඛාර කවරේද? කාමාවචර රූපාවචර දානමය සීලමය භාවනාමය කුසල චේතනා වේ. අට වැදෑරුම් කාමවචර කුසල හා චිත්ත චේතනා මෙසේ කියන ලද හා රූපාවචර කුසල චේතනා පහට ද මෙය අධි වචනයකි. එහි ද දාන සීලමය වශයෙන් චේතනා අටක් වේ. ඒවා භාවනාමය වශයෙන් දහතුනක්ද යම්සේ ප්‍රගුණ දහම් සජ්ඣායනය කරන්නේ එකක් දෙකක් වෙන ඒවා හා සම්බන්ධ වනවිට නොදනී. පසුව ආවර්ජනා කරන්නේනේ දනී. මෙසේ කසිණ පරිකර්ම කරන්නාට ප්‍රගුණ ධ්‍යාන ප්‍රත්‍යවේක්ෂා කරන්නාටද ඤාණ විප්‍රයුක්ත වූවද භාවනා වේ. එහෙයින් කියන ලදී. භාවනාමයා තෙරසාපි - එහි දානමය ආදියෙහි දානය අරබයා දාන අධිකෘත්‍යයෙන් උපදින චේතනා සංචේතනා සිතන බව දානමය පුඤ්ඤාභි සංඛාර යයි කියනු ලැබේ. සීලය අරබයා - භාවනාව අරබයා භාවනා අධිකෘත්‍යයෙන් පහළවන චේතනා සංචේතනා සිතිවිලිබව භාවනාමය පුඤ්ඤාභිසංඛාරයයි කියනු ලැබේ. මේ සංක්ෂේප දේශනය සිවුරු ආදියෙහි වනාහි සිව්පසයෙහි රූපාදියෙහි හෝ අරමුණු සයෙහි අන්නාදි දස දාන වසතුවෙහි ඒ ඒ දෙන්නාට ඒවා ඉපදීමේ සිට පූර්භාග පරිත්‍යාග කාලයෙහි පසුව සොම්නසින් සිතින් සිහි කිරීම යි යන තුන් කාලයෙහි පවතින චේතනාව දානමය නම් වේ. සිල් පිරීම සඳහ පැවිදි වන්නෙමිය විහාරයට යන්නට පැවිදිවන්නාට අදහස මුදුන් පමුණුවා පැවිදිව වතාවත්වල යහපත් යයි ආවර්ජනා කරන්නාට ප්‍රාතිමෝක්ෂ සංවරය වන්නාට චීවරාදි ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ආපාථගත රූපාදියෙහි චක්ෂු ආදිය සංවර කරන්නාට ආජීවය කියන ලද විපසසනා මගින් චක්ෂුව අනිත්‍ය වශයෙන් අනාත්ම වශයෙන් භාවනා කරන්නාට.... මනස රූප ධර්මයෙහි චක්ඛු විඤ්ඤාණය මනොවිඤ්ඤාණය වේදනාව, රූප සඤ්ඤාව.... ජරා මරණ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් භාවනා කරන්නාට පවත්නා චේතනාව භාවනාමය නම් යයි මෙය විස්තර කථාය. අපුඤ්ඤය ද එය අභිසංඛාර යයි අපුඤ්ඤාභිසංඛාර වේ. දොළොස් අකුසල චේතනාවලින් යුත් චේතනාවට මෙය අධි වචනයකි. මෙය කියන ලදී. එහි අපුඤ්ඤාභිසංඛාර කවරේද? කාමවචර අකුසල චේතනා යන මෙය අපුඤ්ඤාභිසංඛාර යයි කියනු ලැබේ. කම්පා නොවන නිසල

සානන්ත විපාක වූ අරූපයම අභිසංස්කරණය කෙරේ යනු ආනෙඤ්ජාභි සංඛාර වේ. සතර අරූපාවචර කුසල චේතනාවලට මෙය සමාන නාමයකි. යම්සේ කීහ. එහි ආනෙඤ්ජාභිසංඛාර කවරේද? අරූපාවචර කුසල චේතනා ආනෙඤ්ජාභිසංඛාර යයි කියන ලදී.

පුද්ගල ත්‍රිකයෙහි ආර්ය පුද්ගලයෝ සප්තවිධයහ. ශික්ෂා තුනකි. හික්මේ යයි සේඛ වේ. ක්ෂීණාශ්‍රවයා හික්මුණු ශික්ෂා ඇති හෙයින් නැවත හික්මීමක් නැති නිසා - අසේඛ වේ. පෘථක් ජනයා ශික්ෂාවලින් පරිබාහිර බැවින් සෙඛ නොවේ. අසේඛද නොවේ. ථේර ත්‍රිකයෙහි - වයසින් මහළු, ගිහි, උපසම්පදාවෙන් මහළු. ථේර කරන දහම් සතරකි. මහණෙනි. මෙහි සථවිර - සිල්වත් වේ. බොහෝ ඇසූපිරූ තැන් ඇති වේ. ධ්‍යාන සතර ලාභී වේ. ආශ්‍රවයන් ගේ ක්ෂය බවට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ සතර ථේර කරන්නා වූ ධර්ම වේ. මේ ධර්ම කී කල්හි එකකින් හෝ කීපයකින් යුක්ත වූ ධර්ම ඇත්තේ ථෙරො නම් වේ. අඤ්ඤතරො ථෙර නාමකො භික්ඛු - මෙසේ ථේර නාමයෙන් හෝ මහළු කාලයේ පැවිදි සාමණේරාදීන් දුක ථෙරො ථේරො යයි කියති. මෙය සම්මුති ථේර නම් වේ. පින්කිරියවත්හි දානමය වේ. පින්කිරියද එය ඒවායේ ආනිසංසයන්ගේ වසතුද පුඤ්ඤකිරිය වත්‍ථු වේ. ඉතිරි දෙකෙහි ද මෙම නයම වේ. අර්ථ වශයෙන් වනාහි පෙර කියන ලද දානමය චේතනා දි වශයෙන් ම පෙරපසු චේතනා සමග මේ පින්කිරිය වත් තුන දත යුතුය. මෙහි එක එකක් පෙර සිට කයින් කරන්නාට කායකර්ම වේ. වචනයෙන් ප්‍රකාශ කරන්නාට වචී කර්ම වේ. කාය වාක් නැතිව මනසින් සිතන්නාට මනෝ කර්ම වේ. ආහාරාදිය දෙන්නාට ද ආහාරදානාදිය දෙමියි හෝ දානපාරමී ආවර්ජනා කොට හෝ දන්දෙන කල දානමය පින්කිරිය වත් වේ. වතාවත්හි යෙදී සිට දෙන්නාට සීලමය වේ. ඛය වය සම්මසනය පිහිටුවා දෙන්නාට භාවනාමය පින්කිරිය වත් වේ. වෙනත් පින්කිරියවත් හතක්. ගෞරවය සහිත පින්කිරිය වත. වතාවත් සහිත, පින්දීම, පින් අනුමෝදනා, දේශනාමය, සවණමය. දිට්ඨි ඍජු පින්කිරිය වත්. එහි මහළු භික්ෂුවක දූක පෙර ගමන් පා සිවුරු පිළිගැනීම්, අභිවාදන මාර්ග සම්පාදනාදි වශයෙන් ගෞරව සහිත පින්කිරිය වත් දත යුතුය. සඟ මහළු පිළිවෙළින් වත් පිළිවෙත් කිරීම් වශයෙන් ගමට පිඩු සිඟා වැඩි භික්ෂුව දූක පාත්‍රය ගෙන ගමෙහි භික්ෂාව ගන්වාගෙන සමාන කිරීම් වශයෙන් යයි. භික්ෂූන්ගේ පාත්‍රය ගෙනෙවයි අසා ඉක්මනින් ගොස් පාත්‍රය දීම් වශයෙන් ද වතාවතින් යුක්ත යයි දත යුතුය. සිව්පසය දී

සියළු සත්‍වයන්ට පින්වේවයි පැවැත්වීම් වශයෙන් පින් අනුමෝදනය දත යුතුය. අනුන් දෙන ලද පිනෙන් සාධු යහපත් යයි අනුමෝදන් වශයෙන් පින් අනුමෝදන්වීම දත යුතුය. එක්කෙනක් මම ධර්ම කථික යයි දැනගන්නේ යයි කැමැත්තෙන් සිට ලාභ ගරුක වී දේශනා කරයි. එය මහත්පල නොවේ. කෙනෙක් තමා ප්‍රගුණ කළ ධර්මය බලාපොරොත්තු නොවන්නේ අනුන්ට දේශනා කරයි. මෙය දේශනාමය පින්කිරිය වත් නම්. කෙනෙක් අසන්නේ මා ශ්‍රද්ධාවන්තයෙක් යයි දන්නේ යයි අසයි. එය මහත්පල නොවේ. කෙනෙක් මෙසේ මට මහත් පල වන්නේ යයි හිත පැතිරීම් වශයෙන් මෘදු සිතින් දහම් අසයි. මෙය සවණමය පින්කිරිය වතයි. යම්කිසි පිනක් කරනවිට ඍජු දෘෂ්ටියෙන් ම කිරීමෙන් මහත්පල වේ. මේ පින්කිරිය වත් හත ද පෙර මෙන් සංග්‍රහ තුනෙන් දත යුතුය. එහිද අපචිති වතාවත් සීලමය වේ. පින්දීම දානමය වේ. දේශනාව හා සවණ භාවනාමය වේ. දිට්ඨිජ්ජු සංග්‍රහ තුනටම යයි. **චොදනාවත්ථූනි** - චෝදනා කිරීම. **දිට්ඨෙන** - මසැසින් හෝ දිවැසින් ව්‍යාතික්‍රමණය දැක චෝදනා කරයි.

**සුතෙන** - පියවි කනින් හෝ දිව කනින් හෝ අසා අනුන්ට චෝදනා කරයි. **පරිසඞ්කාය** - දුටු සැකයෙන් ඇසූ සැකයෙන් සෙසු ඉඳුරන්ගෙන් දැන සැකයෙන් හෝ චෝදනා කරයි. . මෙය සංක්ෂෙපයෙනි. විස්තර වශයෙන් වනාහි සමන්ත පාසාදිකා වේ කියනලද නයින් දත යුතුය. **කාමූපපත්තියො** - කාම සේවනය, කාම ප්‍රතිලාභය හෝ **පච්චුපට්ඨිතකාමා** - නිතර කාමය, නිතර අරමුණ. **සෙය්‍යථාපි මනුස්සා** - මිනිසුන් මෙන් මිනිස්සු නිතරම කාම වස්තුවෙහි වසඟයට පත්වෙති. යම්තැනක පිළිබඳ සිතවේද සියයක්ද දහසක් දීමෙන් හෝ ගැහැණිය ගෙන්වා නිතර කම්සුව විඳියි. **එකච්චෙ දෙවා** - නම් සිව් දෙව්ලෝ වාසීන් ඔව්හුද කාම වස්තුවෙහි නිතරම වසඟයට වැටෙති. **එකච්චෙ විනිපාතිකා** - නම් නිරය වාසීන් හැර සෙස්සෝ මත්ස්‍ය කැසුබු ආදිහුද නිතර කාම වස්තුවෙහි වසඟයට වැටෙති. මත්ස්‍යයා තමාගේ මත්ස්‍ය දෙන සමග කැසුබුවා කැසුබුදෙන සමග ප්‍රියවෙයි. **නිම්මිනත්වා නිම්මිනිත්වා** - තිල් කහ ආදි වශයෙන් තමාගේ රූපය කැමති වන ලෙසින් මවාගෙන. ආයුෂ්මත් අනුරුද්ධ හිමියන් ඉදිරියේ මනාපකායික දෙවියන් මෙන්. **නිම්මානරතී** - සේ තම නිර්මාණයෙහි ඇල්ම ඔවුන්ට තිසා නිම්මානරති වේ. **පරනිම්මිත කාමා** - අනුන් විසින් නිර්මාණය කළ කාමය. ඔවුන්ගේ සිත දැන රුචිපරිදි කාම යෝගය නිර්මාණය කරති. ඔව්හු එහි වසඟයට

පත්වෙති. අනුන්ගේ සිත කෙසේ දනිත්ද? ප්‍රකෘති සේවන වශයෙන්, යම්සේ දක්‍ෂ කෝකියා රජු අනුභව කරන යමක් වැඩිපුර ගන්නා සේ ඔහුගේ රුචිය දනී. මෙසේ ප්‍රකෘතියෙන් අභිරුචි අරමුණ දූන එබඳු වූවක්ම නිර්මාණය කරති. ඔව්හු එහි වසඟයට යති. මෛථුන සේවනය කරති. ඇතැම් තෙරවරු සිනාවීම් පමණින් බැලූ පමණින් වැළඳගත් පමණින් කාම කිස සිදුවේ යයි කියති. අටුවාවෙහි මෙය නැතැයි ප්‍රතික්‍ෂේපිතය. කය ස්පර්ශ නොකර ස්පර්ශ කාමය ඇති නොවේ. කාමාවචර හයක කාමය ප්‍රකෘති වේ. එය කියන ලදී.

සය එකෙහි කම්සැරි - හැමකම්සැප පිරී ඇති
සැම එක් ගණනයෙන් - වෙයි ආයු කොපමණකින්

සුඛුප්පත්තියො - සැප ලැබ. ඉපදී සැපසේ වාසය කරති. ඔව්හු පහත පළමු දූහැන් සැප උපදවා ඉහළ විපාක දූහැන් සැප විඳිති යන අර්ථයයි. **සුඛෙන අභිසන්නා** - දෙවන දූහැන් සැපයෙන් තෘප්තිමත්. **පරිසන්නා** - හාත්පසින් තෘප්තිමත්. **පරිපූරා** - පරිපළුටා - එහිම සමාන වචනයක්. මෙයද විපාක දූහැනකි. සැප සඳහාම කියන ලදී. **අහො සුඛං අහො සුඛං** - ඔවුන්ට භව ලෝභය උපදී. එහෙයින් සමහරවිට මෙසේ උදන් අනති. සන්තමෙව ප්‍රණීතමය. **කුසිතා** - එයින් ඉහළ සැප නොපතා සතුටු වී. **සුඛංපටිසංවෙදෙන්ති** - තෙවන ධ්‍යාන සැප ලබයි. **සෙඛා පඤ්ඤා** - සත් අරිය ප්‍රඥාව. අරහත් ප්‍රඥාව අසේඛ වේ. සෙසු ප්‍රඥා සේඛද නොවේ. අසේඛද නොවේ.

චින්තාමය ආදියෙහි විස්තරයයි මේ. එහි චින්තාමය ප්‍රඥාව කවරේද? සංවිධානය කරණ ලද කර්මාන්ත ආයතනවල හෝ ශිල්පායතනවල හෝ විද්‍යාස්ථානවල හෝ කම්මස්සකත හෝ සත්‍යානු ලෝමික හෝ රූපය අනිත්‍ය යයි හෝ...... විඤ්ඤාණය අනිත්‍ය යයි හෝ යම් එබඳු වූ අනුලෝමික ක්‍ෂාන්ති, දෘෂ්ටි, රුචි, ආස්‍රාණාදිය, ධර්මය අනුව බැලීම, අනුන්ගෙන් නො අසා තමන්ම අවබෝධය මෙය චින්තාමය ප්‍රඥාවයයි කියනු ලැබේ. සංවිධානය කරන ලද කර්මාන්ත ආයතනවල... අනුන්ගෙන් අසා ප්‍රතිවේධය මෙය සුතමය ප්‍රඥා නම් වේ. එහි භාවනාමය ප්‍රඥාව කවරේද? සියළු සමාපත්තිවලට පැමිණි ප්‍රඥාව භාවනාමය ප්‍රඥාව වේ. සූත්‍ර යයි කියනු ලබන්නේ ඇසීමම ආවුධයයි. එය අර්ථ වශයෙන් ත්‍රිපිටක බුද්ධ වචනයයි. එය නිසා භික්ෂුව සූර යෝධයෙක්

කම්පා නොවී මහා කාන්තාරයක් මෙන් සංසාර කාන්තාරය නොවෙහෙසී ඉක්මවයි. එහෙයින් කියන ලදී. මහණෙනි, සුත ආවුධය නිසා ආර්ය ශ්‍රාවකයා අකුසල් දුරු කරයි. කුසල් වඩයි. සාවද්‍ය දුරු කරයි අනවද්‍ය වඩයි. තම ජීවිතය පිරිසිදුව පවත්වයි. පවිවෙකාවුධ යනු කාය විවේකය සිතේ විවේකය, පස් කඳේ විවේකය යයි මේ ත්‍රිවිධ විවේකය විවේකයම ආවුධ යයි. විවේකය සිතේ විවේකය, විවේක වූ කයින් අභිනිෂ්ක්‍රමණයට කුමක් වේ. චිත්ත විවේකයද පිරිසිදු සිත් ඇත්තන්ට පරම පිරිසිදු බවට පැමිණේ. උපධි විවේකය ද උපධිරහිත පුද්ගලයන්ට සංඛාර නැතිවේ. මේ විවේක තුනේ ඇලුනේ කිසිවකට බිය නොවේ. එහෙයින් මෙයද අවශ්‍ය අර්ථයෙන් ආවුධ යයි කියන ලදී. ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවද ආවුධයකි. පඤ්ඤායුධං. යමෙකුට එය ඇත්නම් කිසිවකට බිය නොවේ. ඔහුටද කිසිවෙක් බිය නොවේ. එනිසා එයද අවශ්‍ය අර්ථයෙන් ආවුධයකැයි කියන ලදී. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය - මින් පෙර නොදන්නා ලද අවබෝධ නොකරන ලද ධර්මය දන්නෙමි යයි පිළිපන්නහුට පහළවන ඉන්ද්‍රිය. සෝවාන් මාර්ග ඤාණයට මෙය සමාන වචනයකි. අඤ්ඤින්ද්‍රිය - නොදන්නා ලද දේ දැනගන්නා වූ ඉන්ද්‍රිය. සෝවාන් පලයේ සිට ස්ථාන සයක ඤාණයට මෙය අධි වචනයකි. අඤ්ඤාතාවින්ද්‍රිය - දැන ගත යුතු ධර්මවල අවසාන දැන ගැනීමෙහි ඉන්ද්‍රිය. අරහත් පල ඤාණයට අධිවචනයකි. මසැස - චක්ඛුපසාදො. දිවැස - ආලොකනිස්සිත ඤාණය. පැණැස - ලොකිය ලොකුත්තර. අධිසීල සික්ඛාදියෙහි අධිසීලයද එය හික්මිය යුතු හෙයින් ශික්‍ෂා යයි ද අධිසීල සික්ඛා. ඉතිරි දෙකෙහි ද මෙම නයමයි. එහි සීලය අධිසීල සිත - අධිචිත්තං වේ. පඤ්ඤා අධිපඤ්ඤා යි මේ භේදය දත යුතුය. සීල නම් - පන්සිල් දසසිල්. ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලය අධිසීල නම් වේ. අෂ්ට සමාපත්ති - චිත්තං වේ. විදර්ශනා සාධක ධ්‍යාන අධිචිත්තං වේ. කම්මස්සකත ප්‍රඥාව විදර්ශන ප්‍රඥාව - අධිපඤ්ඤා අබුද්දොත්පාද කාලයෙහි පවත්වන පන්සිල් දසසිල් සීලම වේ. ප්‍රාතිමොක්‍ෂ සංවර සීලය බුද්ධොත්පාද කාලයෙහිම පවත්වන නිසා අධිසීල - නම් වේ. චිත්ත පඤ්ඤාවල ද මෙම නයම වේ. එසේ වුවද නිවන් පතන්නා විසින් සමාදන්වන පන්සිල් දස සිල් ද අධිසීලම වේ. සමවත් අෂ්ඨ සමාපත්තිද අධිචිත්තම වේ. ලෞකික සීලය සීලවේ. ලෝකෝත්තර සීලය අධිසීල වේ. චිත්ත පඤ්ඤාවල ද මෙම නයම වේ. භාවනාවල ක්‍ෂීණාශ්‍රවයාගේ පඤ්චද්වාරික කාය, කාය භාවනා නම් වේ. අෂ්ට සමාපත්ති චිත්තභාවනා නම් වේ. රහත්පල ප්‍රඥාව පඤ්ඤා භාවනා නම් වේ. අෂ්ට සමාපත්තිය ද

අන් අයගේ මෙන් දුර්වල නොවේ. ප්‍රඥාව ද එසේ ම ප්‍රඥාව ව ද වඩන ලද්දේ වේ. ප්‍රඥාව මහත්බවට පැමිණියේ එනිසා මෙසේ කියන ලදී.

අනුත්තරිය ධර්මවල (ශ්‍රේෂ්ඨ ධර්මවල) විපස්සනා - දස්සනානුත්තරිය වේ. මාර්ගය - පටිපදානුත්තරිය වේ. ඵලය - විමුත්තානුත්තරිය වේ. හෝ නිවන - දස්සනානුත්තරිය වේ. එයින් එහා දතයුත්තක් නැත. මාර්ගය පටිපදානුත්තරිය වේ. ඵලය - විමුත්තානුත්තරිය වේ. අනුත්තරියං යනු උත්තම වේ. ජෙට්ඨක සමාධිවල ප්‍රථම ධ්‍යාන සමාධි සවිතක්ක සවිචාරය. පඤ්චක නයෙන් ද්විතීය ධ්‍යාන සමාධිය අවිතක්ක විචාරමත්ත වේ. සෙස්ස අවිතක්ක අවිචාරය. සුඤ්ඤතාදියෙහි ආගමන වශයෙන් සගුණ වශයෙන්, අරමුණු වශයෙන් කථා ත්‍රිවිධය. ආගමන වශයෙන් නම් එක් භික්ෂු නමක් අනත්ත වශයෙන් ඇතුළට පිවිස අනත්ත වශයෙන් දක අනිත්‍ය වශයෙන් නැගිටියි. උන්වහන්සේගේ විදර්ශනාව ශූන්‍යතා නම් වේ. කුමක් හෙයින් ද? අශූන්‍යතා කරන කෙලෙසුන් ගේ අභාවයෙන් විදර්ශනාව පැමිණීමෙන් මාර්ග සමාධි ශූන්‍යතා නම් වේ. මාර්ග ආගමනයෙන් ඵලසමාධි ශූන්‍යතා නම් වේ. වෙන කෙනෙක් අනිත්‍ය වශයෙන් පිවිස අනිත්‍ය වශයෙන් දක අනිත්‍ය වශයෙන් නැගිටියි. උන්වහන්සේ විදර්ශනාව අනිමිත්ත නම් වේ. කුමක් හෙයින්ද? නිමිති ඇතිකරන කෙලෙසුන්ගේ අභාවයෙන් විදර්ශනා ආගමනයෙන් මාර්ග සමාධි අනිමිත්ත නම් වේ. මාර්ග ආගමනයෙන් ඵලය අනිමිත්ත වේ. තව කෙනෙක් දුක් වශයෙන් පිවිස දුක් වශයෙන් දක දුක් වශයෙන් නැගිටියි. උන්වහන්සේ ගේ විදර්ශනාව අප්පණිහිත නම් වේ. කුමක් නිසාද? ප්‍රාර්ථනා ඇති කරන කෙලෙසුන්ගේ අභාවයෙන් විදර්ශනාව පැමිණීමෙන් මාර්ග සමාධිය අප්පණිහිත නම් වේ. මාර්ග ආගමනයෙන් ඵලය අප්පණිහිත යයි මේ ආගමන වශයෙන් කථාය.

මාර්ග සමාධිය වනාහි රාගාධියෙන් ශූන්‍ය බැවින් ශූන්‍යය. රාග නිමිත්තාදීන්ගේ අභාවයෙන් අනිමිත්තය. රාග පණිධි (ප්‍රාර්ථනා) ආදියේ අභාවයෙන් අප්පණිහිත වේ. මේ සගුණ වශයෙන් කථාය. නිවණ රාගාදියෙන් ශූන්‍ය බැවින් රාගාදී නිමිති ප්‍රාර්ථනා ද අභාවයෙන් ශූන්‍ය ද අනිමිත්ත ද අප්පණිහිත ද වේ. ඒ අරමුණු මාර්ග සමාධි ශූන්‍යය, අනිමිත්තය, අප්පණිහිතය මෙය ආරම්මණ වශයෙන් කථාය. සොචෙය්‍යානි - පිරිසිදු බව ඇතිකරන සොචෙය්‍ය පටිපදා ධර්මය. මෙහි විස්තරය වනාහි "එහි සොචෙය්‍ය කවරේද? පාණාතිපාතා වෙරමණී" ආදි නයින්

කියන ලද සුචරිත තුණ වශයෙන් දත යුතුය. මොනෙය්‍යානි - නිශ්ශබ්දතාව කරන මොනෙය්‍ය පටිපදා ධර්මයයි. ඒවායේ විස්තරය "එහි මොනෙය්‍ය කවරේද? ත්‍රිවිධ කාය දුශචරිත කාය මොනෙය්‍ය හැර ත්‍රිවිද සුචරිත කාය මොනෙය්‍ය වේ. කාය ආරම්මණයෙහි ඤාණය කාය මොනෙය්‍ය වේ. කය ගැන දැනුම කාය මොනෙය්‍ය වේ. කය ගැන දැනුම සහිත මග කාය මොනෙය්‍ය වේ. කය කෙරෙහි ඡන්දරාග ප්‍රහාණය කාය මොනෙය්‍ය වේ. කාය සංසකාර නිරෝධය වූ චතුර්ථ ධ්‍යාන සමාපත්තිය කාය මොනෙය්‍ය වේ. එහි වචී මොනෙය්‍ය කවරේද? චතුර්විධ වචී දුශචරිතයේ ප්‍රහාණය වචී මොනෙය්‍ය වේ. චතුර්විධ සුචරිතය, වාක් අරමුණු ඤාණය, වාග් දැනුම සහිත මග වචනයෙහි ඡන්ද රාග ප්‍රහාණය, වාග් සංසකාර නිරෝධය වූ ද්විතීය ධ්‍යාන සමාපත්තිය වචී මොනෙය්‍ය වේ. එහි මනෝ මොනෙය්‍ය කවරේද? ත්‍රිවිධ මනෝ දුශචරිත ප්‍රහාණය, ත්‍රිවිධ මනෝ සුචරිත ඤාණය, මනස ගැන දැනුම සහිත මග, මනසෙහි ඡන්දරාග ප්‍රහාණය, චිත්ත සංඛාර නිරෝධය, සඤ්ඤා වෙදයිත නිරෝධ සමාපත්තිය මනො මොනෙය්‍ය වේ. කුසලතා රැස්වීම වර්ධනය. රැස් නොවීම අවර්ධනයයි. ඒ ඒ කරුණු උපාය වේ. ඒවායේ දැනීම් දක්‍ෂතා පිළිබඳ විස්තර වනාහි විභංගයෙහි කියන ලද්දේමය. මෙය කියන ලදී.

එහි ආය කොසලල කවරේද? මේ ධර්මයන් මෙනෙහි කරන්නා වූ මට නූපන් අකුසල ධර්මයන් නූපදීද උපන් අකුසල ධර්මයන් නිරුද්ධවේද, මේ ධර්මයන් මෙනෙහි කරන්නා වූ මට නූපන් කුසල දහම් උපදී ද උපන් කුසල දහම් බොහෝ බවට මහත් බවට භාවනාව පරිපූර්ණවීම සඳහා පවතී. එහි ප්‍රඥාව, දැනීම, සම්මා දිට්ඨිය යන මෙය ආය කොසලල යයි කියනු ලැබේ.

එහි අපාය කොසලල කවරේද? මේ ධර්මයන් මෙනෙහි කරන්නා වූ මට නූපන් කුසල දහම් නූපදී. උපන් කුසල දහම් නිරුද්ධ වේ. නූපන් අකුසල දහම් උපදී. උපන් අකුසල දහම් බොහෝ බවට මහත් බවට භාවනාව පරිපූර්ණවීමට පවතී. එහි දැනීම, ප්‍රඥාව, සම්මා දිට්ඨිය යන මෙය අපාය කොසලල වේ. එහි සියළු උපාය ප්‍රඥාව උපාය කොසලල වේ. මෙය වනාහි ඉක්මණිනින් කළයුතු කටයුත්තෙහි හෝ බියෙහි හෝ ඒ ඒ ප්‍රතිකාර සඳහා ස්ථානයේ උපන් කරුණු දැනීම් වශයෙන් ම දත යුතුය.

මදා - මත්වන ආකාර වශයෙන් පවත්වන ඔවුනතරෙන් මම අවුරුදු හැටක් හෝ හැත්තෑවක් ඉක්මවා සිටිමි. අරළු කැබැල්ලක්වත් නොකෑවිරීමි. අසවල් තැන රිදෙනවා කියා බෙහෙතක් නොකෑවිරීමි. මා වගේ නිරෝග වෙන කවුද යයි මෙසේ මානය ආරෝග්‍ය මදය වේ. මහළු කාලයේ පින් කරන්නෙමු. තවම තරුණය. යෞවනයෙහි සිට මානය කිරීම යොබ්බවන මදයයි. කලක් ජීවත්වීමි. කලක් ජීවත්වෙමි. කලක් ජීවත් වෙන්නෙමි යයි මෙසේ මානය කිරීම ජීවිත මදයයි. අධිපති බව කෙරෙහි අධිපති වශයෙන් පැමිණීම ආධිපතෙය්‍ය වේ. සීල සමාධි පඤ්ඤා. විමුත්තියෙන් මා හා සමාන කෙනෙක් නැතැයි තමා අධිපති ජේෂ්ඨ කොට පව් නොකිරීම අත්තාධිපතෙය්‍ය නම් වේ. ලෝකය අධිපති කොට නොකිරීම ලෝකාධිපතෙය්‍ය වේ. ලෝකෝත්තර ධර්මය අධිපති කොට නොකිරීම ධම්මාධිපතෙය්‍ය වේ. කථා වත්‍ථුණි - කථා කිරීම්. අතීතං වා අද්ධානං - අතීත ධර්මගතිය, අතීත සකන්ධ යන අර්ථයයි. තවද මහණෙනි. යම් රූපයක් අතීත වී නිරුද්ධ විය. වෙනස් වීමට පත් විය. එහි සැක ඇතිවිය. එහි සැක නොමැත. මෙසේ පැමිණීමෙන් නිරුක්ති මාර්ගය මෙහි අර්ථය සූත්‍රයෙන් දත යුතුය. විජ්ජා - අඳුර නසන අර්ථයෙන් දැනුම ඇතිකරන අර්ථයෙන්ද විජ්ජා වේ. පුබ්බෙනිවාසානුස්සති ඤාණය උපදින්නේ පුබ්බෙනිවාසය වසා සිටි අඳුර නසයි. එයින් අවබෝධ කරයි යනු විජ්ජා වේ. ආශ්‍රවයන්ගේ ඛය ඤාණය චතුසසත්‍ය වසා අති අඳුර නසයි. චතුසසත්‍ය ධර්මය අවබෝධ කරයි යනු විජ්ජා වේ. විහරණයන්හි අෂ්ට සමාපත්තිය දිව්‍ය විහාර වේ. සිව් අප්පමඤ්ඤා බ්‍රහ්ම විහාර වේ. ඵල සමාපත්ති අරිය විහාර වේ. ප්‍රාතිහාර්ය කෙවටට සූත්‍රයෙහි විස්තර කරන ලද්දේමය, "ඉමෙ ඛො ආවුසො" ආදියෙහි කියන ලද නයින්ම යෙදිය යුතුය. මෙසේ සම සැට තුනේ කොටස් වශයෙන් අසූහත් ප්‍රශ්නය කියන්නෝ ස්ථවිරයන් වහන්සේ සාමග්ගි රසය දැක්වූහ.

**තික නිමි.**

මෙසේ තික වශයෙන් සාමග්ගි රසය දක්වා දැන් චතුක්ක වශයෙන් දැක්වීම සඳහා දේශනය නැවත ඇරඹූහ. එහි සතිපට්ඨාන චතුක්කය පළමු විස්තර කරන ලදී. සම්මප්පධාන චතුක්කයෙහි ඡන්දං ජනෙති -

යමෙක් කැමැත්ත, කැමති බව, කුසල් කරනු කැමති බව ධර්මයට කැමැත්ත යයි මෙසේ කියන ලදී. කරනු කැමැත්ත උපදවයි. **වායමති** - වීර්ය කරයි. **විරියං ආරභති** - වීර්ය උපදවයි. **චිත්තං පගණ්හාති** - සිතට උනන්දුව ඇතිකරයි. මෙය මෙහි සංක්ෂේපයයි. විස්තර වනාහි සම්මප්පධාන විභංගයෙහි ආයේය. ඉද්ධිපාදවල කැමැත්ත නිසා පවත්වන සමාධිය - ඡන්ද සමාධි වේ. ප්‍රධාන වූ සංඛාර ප්‍රධාන සංඛාර වේ. **සමන්නාගතං** - ඒ ධර්මවලින් යුත්, සෘද්ධියෙහි පාද හෝ සෘද්ධි වූ පාද හෝ ඉද්ධිපාද වේ. සෙස්සෙහිද මෙම නයයි. මෙය මෙහි සංක්ෂේපයයි. විස්තර ඉද්ධිපාද විභංගයෙහි ආවේය. විසුද්ධි මාර්ගයෙහි වනාහි අර්ථය දක්වන ලදී. ධ්‍යාන කථා ද විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී.

**දිට්ඨධම්ම සුඛවිහාරාය** - මෙම ආත්මභාවයෙහි සැප විහරනය පිණිස. මෙහි ඵලසමාපත්ති ධ්‍යාන රහතන් වහන්සේ පසුව උපදවා ගන්නා ලද ධ්‍යාන ද කියන ලදී. **ආලොක සඤ්ඤං මනසි කරොති** - දවල් හෝ රාත්‍රියෙහි හෝ බබළන හිරු සඳු මැණික් ආදියේ එළිය කෙරේ යයි මෙනෙහි කරයි. **දිවාසංඤ්ඤං අධිට්ඨාති** - මෙසේ මෙනෙහි කොට දවල් යන සංඥාව ඇතිකර ගනී.

**යථාදිවා තථා රත්තිං** - දවල් දකින ලද ආලෝකය රාත්‍රියේ මෙනෙහි කරයි. **යථා රත්තිං තථා දිවා** - රාත්‍රියේ දක්නා ලද ආලෝකය දිවා කාලයේ මෙනෙහි කරයි. **ඉති විවටෙන චෙතසා** - මෙසේ නොවසන ලද සිතින්. **අපිරියොනද්ධෙන** - හාත්පසින් විවෘත කරන ලද. **සප්පභාස** - ආලෝකය සහිත **ඤාණදස්සන පටිලාභාය** - ඥාණ දර්ශන ප්‍රතිලාභය සඳහා. මෙයින් කුමක් කියන ලදද? කම්මැලිකම නැතිකරන ආලෝකය කියන ලදී. පරිකර්ම ආලෝකය හෝ. මෙයින්ද කුමක් කියන ලද්දේ වේද? රහතන් වහන්සේගේ දිවැස් නුවණයි. එහි හෝ පැමිණියා වූද නොපැමිණියා වූ ද පාදක ධ්‍යාන සමාපත්තියම සඳහා ''ආලෝකය සහිත සිත වඩයි'' යයි කියන ලදී. **සතිසම්පජඤ්ඤාය** - ''විදිතා වෙදනා උපජ්ජන්ති'' ආදියෙහි රහතන් වහන්සේ ගේ වස්තුව දැන ගන්නා ලදී. අරමුණ දැන ගන්නා ලදී. වස්තු ආරම්මන දැන ගන්න ලදී. වස්තු අරමුණු දැන ගන්නා ලද බැවින් මෙසේ වේදනා උපදී. මෙසේ නවතී. මෙසේ නිරුද්ධ වේ යයි දැන ගනී. හුදෙක් වේදනා පමණක් මෙහි නොකියන ලදී. සංඥාදිය ද කියන ලදී. නොකියන ලද චේතනාදියද උපදී සිටී නිරුද්ධ වේ. යයි දැනගන්නා ලදී. තව ද වේදනාවෙ ඉපදීම දන්නා ලදී

උපට්ඨානය ද දන්නා ලදී. අවිද්‍යා සමුදයෙන් වේදනා සමුදය වේ. තෘෂ්ණා සමුදයෙන් කර්ම සමුදය වේ. ඵසස සමුදයෙන් වේදනා සමුදය වේ. නිවීම් ලක්‍ෂණය දකින්නා ද වේදනාස්කන්ධයේ සමුදය දකියි. මෙසේ වේදනාවේ ඉපදීම දක්නා ලදී. වේදනාවේ හේතුව කෙසේ දන්නා ලද්දේද? දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් ක්‍ෂය වීමට කරුණු වන්නේ යයි දන්නා ලදී. අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ශූන්‍යය වේ යයි දැන ගන්නා ලදී. මෙසේ වේදනාවට හේතු දන්නා ලදදේ වේ. බය වන්නේ භය වශයෙන් ශූන්‍ය වශයෙන් දනී. වේදනාවේ අත්‍ථංගමය (නැතිවීම) කෙසේ දන්නා ලදද? මේ නයින් එහි අර්ථය දත යුතුය. ''මෙසේ රූප'' යයි ආදී කියනලද නයින්ම වේ. අයං ආවුසො සමාධි භාවනා - මෙය ආශ්‍රවයන්ගේ බය ඤාණයට පාදක ධ්‍යාන සමාධි භාවනා වේ. අප්පමඤ්ඤ - ප්‍රමාණයක් නොගෙන නිරවසේස ඵරණ වශයෙන් අප්පමඤ්ඤා අනුපද වණ්ණනා භාවනා සමාධි භාවනාද වේ. මේවා විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේය. අරූප කථා ද විසුද්ධි මාර්ගයෙහි විස්තර කර ඇත. අපසෙසනානි - නො දක්නා ලද. සංඛාය - නුවණින් දැන. පටිසෙවති - නුවණින් දැන සේවනය කළයුත්තම සේවනය කරති. එහි විස්තරය ද පටිසංඛා යෝනිසො චීවරං පරිභුඤ්ජති යනාදි නයින් දත යුතුය. සංඛායෙතං අධිවාසෙතීති - නුවණින් දැන ඉවසිය යුත්තම ඉවසයි. මෙහි විස්තරය වනාහි ''පටිසංඛා යෝනිසො ඛමොහොති සීතසස'' ආදි නයින් දත යුතුය. පරිවජ්ජේති - නුවණින් දැන දුරුකළ යුත්තම දුරු කරයි. එහි විස්තරය ''පටිසංඛා යෝනිසො චණ්ඩ හත්‍ථිං පරිවජ්ජේති'' ආදි නයින් දත යුතුය.

විනොදෙති - නුවණින් දැන විනෝදනය කළ යුත්ත විනෝදනය කරයි. දුරුකරයි. බැහැර කරයි. ඇතුළට පිවිසීමට නොදෙයි. එහි විස්තරය ''උප්පනනං කාම විතක්කං නාධි වාසෙති'' ආදි නයින් දත යුතුය. අරියවංසා - ආර්යන්ගේ වංසය. යම්සේ ක්‍ෂත්‍රිය වංශය, බ්‍රාහමණ වංශය, වෛශ්‍ය වංශය, ශුද්‍ර වංශය, ශ්‍රමණ වංශය, කුල වංශය. රාජ වංශය මෙන් මෙසේ මෙයද අටවන ආර්ය වංශයයි. අරියතං යනු ආර්ය ප්‍රවේණිය වේ. ඒ මේ වංසය මේ වංසයන්ගේ මූලගන්ධවල කාලානුසාරී ගන්ධය මෙන් අග්‍ර යයි කියනු ලැබේ. ඒ මේ වංසවල ආර්යයෝ කවරහුද? බුදු පසේ බුදු තථාගත ශ්‍රාවක අරියා - ආර්ය යයි කියනු ලැබේ. මේ ආර්යයන් ගේ වංශය - අරිය වංසය වේ. මෙයින් පෙර කල්ප ලක්‍ෂයක් අධික වූ සාර අසංඛ්‍යයට මත්තෙහි තණ්හංකර මෙධංකර

සරණංකර දීපංකර යයි සතර බුදු කෙනෙක් උපන්හ. උන්වහන්සේලා ආර්යයෝය. ඒ ආර්යයන් ගේ වංසය අරියවංස වේ. ඒ බුදුවරුන්ගේ පිරිනිවීමෙන් එක් අසංඛයක් ඉක්මී කොණ්ඩඤ්ඤ නම් බුදුවරයා උපන්හ.... මේ කල්පයෙහි කකුසඳ කෝණාගම කාශ්‍යප ගෞතම යයි සතර බුදු කෙනෙක් උපන්හ. ඒ ආර්යයන් ගේ වංශය යයි අරියවංස වේ.

තවද අතීත අනාගත වර්තමාන සියළු බුදු පසේ බුදු බුද්ධ ශ්‍රාවක ආර්යන් ගේ වංශය අරිය වංස වේ. **අග්ගඤ්ඤ** - ඒ මේ උන්වහන්සේලා අග්‍ර වංස යයි දත යුතුය. **පොරාණා** - දූන් උපන් අය නොවේ. **අසංකිණ්ණා** - සංකීර්ණ නොවූ. ඉවත් නොකළ. **අසංකිණ්නා පුබ්බා** - අතීත බුදුවරුන් විසින් සංකීර්න නොවූ විරූ. මේවායින් කුමක්ද? ඉවත් නොකළ විරූ **න සංකීයනති** - දැනුදු ඉවත් නොකරයි. න සංකීයිසසනති අනාගත බුදුවරුන් විසින් ද ඉවත් නොකරන්නාහ. ලෝකයෙහි යම් විද්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද? ඔවුන් විසින් නින්දා නොකළ නො ගරහන ලදී. **සනතුට්ඨා හොති** - ප්‍රත්‍ය සන්තෝෂ වශනේ සන්තෝෂ වූයේ වේ. **ඉතරීතරෙන චීවරෙන** - මහත් සිනිඳු රළු ප්‍රණීත සටීර ජීර්ණ (දිරූ) යම්කිසිවක් ලැබූ පරිද්දෙන් සන්තෝෂ වේ යන අර්ථය වේ. සිවුරෙහි, යථාලාභ සන්තෝෂ, යථාබලසන්තෝස, යථා සාරුප්ප සන්තෝෂයයි සන්තෝෂ තුනකි. පිණ්ඩපාතා දියෙහි ද මෙම නයම වේ. ඒවායේ විස්තර කථා සාමඤ්ඤඵලයෙහි කියන ලද නයින් දත යුතුය. මෙසේ මේ සන්තෝෂ තුන සඳහා සන්තෝෂ වූයේ වේ. මෙහි සිවුරෙහි යයි දත යුතුය. සිවුර දතයුතුය. සිවුරු ක්ෂේත්‍රය දතයුතුය. පංසුකූලය දතයුතුය. චීවර සන්තෝෂය දත යුතුය. චීවර සංයුතත වූ ධූතංග දත යුතුය. සිවුරු දත යුතු යයි ඛොමාදි සිවුරු සය. දුකුලානි. අනුලෝම සයද දතයුතුය. මේ දොළොස කැප සිවුරුය. කුස චීවර වාක චීවර ඵලක චිවර කේසකම්බල වාලකම්බල පොත්ථක චමම උලූක පකඛ රුකඛ දූසස ලතා දූසස එරක දූසස කදලි දූසස වෙළු දූසස මේ ආදිය අකැප සිවුරුය. චීවර ඛෙතතං යනු සංඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ ඤාතීන්ගෙන් හෝ මිත්‍රයන්ගෙන් හෝ තමාගේ ධනයෙන් හෝ පංසකූලයෙන් දූයි මෙසේ උපදින ක්ෂෙත්‍ර හයකි. මාතෘකා අටක් වශයෙන් ක්ෂේත්‍ර අටක් යයි දත යුතුය. **පංසකූලං** - සොසාණික, පාපණික (වෙළෙන්දාගෙන්) රථිය (වීථිය) කසල ගොඩ, නහන තොට. තීර්ථය, ගතපච්චාගතය, ගින්නෙන් දැමුණු ගවයින් කෑ වේයන් කෑ මීයන් කෑ කෙළවර සිඳුණු. වාටි නැති කොඩියෙන් ගෙනා, ථූපයෙහි වූ මහණ සිවුරු මුහුදෙහි වූ අභිෂේකයට

ගත්, පාරේ ඇති, සුළඟින් ගෙනා දෙවියන් දුන් විසිතුන් වූ පසුල් සිවුරු දත යුතුය. මෙහි සොත්ථිය යනු ගැබ්මල පිස දැමූ. ගතපච්චාගත යනු මළසිරුර ඔතා සොහොනට දමා ගෙන ආ. ධජාහටං කොඩි ඔසවා හැරදැමූ, ථූපං සුඹසෙහි පිදූ සිවුරු. චීවර සන්තොසො - විසි සිවුරු සන්තෝෂය. සිවුරෙහි විතක්ක සන්තෝෂය, ගමන සන්තෝෂය, සොයන සන්තෝෂය, ප්‍රතිලාභ සන්තෝෂය, පිළිගන්න සන්තෝෂය, ලොල්බව දුරුකරන සන්තෝෂය, යථාලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය, යථා සාරුප්ප සන්තෝෂය, උදක සන්තෝෂය, සෝදන සන්තෝෂය කරණ සන්තෝෂය, පරිමාණ සන්තෝෂය, සුත්ත සන්තෝෂය, මහන සන්තෝෂය, රඳන් කරන සන්තෝෂය, කප්බිඳු තබන සන්තෝෂය, එහි සාටකයක් කැමතිවන භික්ෂුව විසින් තෙමසක් නිබද්ධ වාසව වැස එක් මසක් පමණක් සිතීම වටී. හෙතෙම පවරා සිවුරු මාසයෙහි සිවුර කරයි. පංසුකූලිකයා අඩමසකින් කරයි. මෙසේ අඩමසක් පමණ සිතන විතක්කන සන්තෝෂය. විතක්කන සන්තෝෂයෙන් සන්තෝෂ වන භික්ෂුව විසින් පාචීන ඛණ්ඩ රාජියෙහි වෙසෙන පංසුකූලික තෙරුන් හා සමාන විය යුතුය. තෙරුන් වහන්සේ වනාහි සෑගිරි පව් වෙහෙරෙහි චෛතිය වැඳ සිතුහ. මගේ සිවුර දිරා ඇත. බොහෝ දෙනා වසන තැනින් ලබන්නෙමි.

හෙතෙම මහා විහාරයට ගොස් සඟතෙර දැක වසන තැන අසා එහි වැඩ දෙවන දවසේ සිවුර ගෙන පැමිණි තෙරුන් වැන්දේය. තෙරුන් වහන්සේ ඇවැත්නි කිමදැයි ඇසුහ. ස්වාමීනි ගම්දොරට යන්නෙමි. ඇවැත්නි මමත් එන්නෙමි. හොඳයි ස්වාමීනි යි යන්නේ මහාබෝධි දොර කොටුවෙහි සිට පින්වතුන් වසන තැන මනාප දෙයක් ලබන්නෙමි යයි සිතා මගේ සිතිවිල්ල වැරදි යයි එහිම නැවතුනේය. දෙවන දින අම්බණගහන සමීපයෙන්. ඊළඟ දිනයේ මහා සෑයේ උතුරු දොරටුවෙන්. එසේම නැවතී සතරවන දිනයෙහි තෙරුන් සමීපයට පැමිණියේය. තෙරුන් වහන්සේ මේ භික්ෂුවගේ සිතිවිල්ල පිරිසිදු නොවන්නේ යයි සිවුර ගෙන ඔහු සමග ප්‍රශ්න අසමින් ගමට පිවිසියේය. එහි රාත්‍රියේ එක් මිනිසෙක් මල පලිබෝධයෙන් වස්ත්‍රයෙහිම මලපහ කොට එය කහලගොඩට දැම්මේය. පංසුකූලික භික්ෂුව එය නිල් මැස්සන් ගැවසී සිටිනු දැක ඇඳිලි බැන්දේය. මහතෙරුන් වහන්සේ ඇවැත්නි කිම කහලගොඩට වැඳගෙන. ස්වාමීනි කහලගොඩට වඳිනවා නොවේ. මාගේ පිය දසබලයන් වහන්සේට වඳිමි. පුණ්ණ දාසියගේ සිරුර වසා හැරදමන ලද පංසුකූලය තුඹස මත ප්‍රාණීන් (වේයන්) ඉවත්කර සොහොනින්

ගත්නා විසින් දුෂ්කර කාර්යයක් කරන ලදී. ස්වාමීනි, මහතෙරුන් වහන්සේ පිරිසිදු සිතිවිලි ඇති පංසුකූලික භික්ෂුවකැයි සිතුහ. පංසුකූලික තෙරුන් වහන්සේ ද ඒ ස්ථානයෙහි ම සිට විදසුන් වඩා තුන්පලයට පැමිණ ඒ වස්ත්‍රය ගෙන සිවුරක් කොට පොරවා පාචීනඛණ්ඩ රාජියට ගොස් අග්‍රඵලය වූ රහත් බවට පැමිණියහ. සිවුරු සඳහා යන්නාට වනාහි කොහෙන් ලබන්නෙම්දැයි නොසිතා කමටහන් හිසින් ම ගමන ගමන සන්තෝෂ නම්. සොයන්නාට වනාහි යම් කෙනෙකුන් සමග නොසොයා ලජ්ජී පියසීලි භික්ෂුවගෙන් සෙවීම පරියේසන සන්තෝෂ නම්. මෙසේ සොයන්නාට ගෙනෙනු ලබන සිවුරු දුරදීම දූක මෙය මනාප වන්නේය මෙය අමනාප යයි මෙසේ නොසිතා රළු සියුම් ආදි ලැබූ පරිද්දෙන්ම සන්තෝෂය යථාලාභ සන්තෝෂ නම්. මෙසේ ලැබූ දෙය ගන්නාට මෙපමණක් දුපපට වන්නේය. මෙපමණක් එක්පට වන්නේය. තමාට ප්‍රමාණවත් තරමින් සන්තෝෂය පිළිගැන්ම පටිග්ගහණ සන්තෝෂ නම්. සිවුර සොයන්නාට වනාහි අසවල් ගෙදරින් මනාප ලැබෙන්නේ යයි නොසිතා දොර පිළිවෙළින් හැසිරීම ලොලුපප විවජ්ජන නම් වේ. රළු ප්‍රණීත යමකින් යැපීමට හැකි ලද දෙයකින් යැපීම යථාලාභ සනෙතාස නම්. තමාගේ ශක්තිය දූන යැපීමට හැකි දෙයකින් යැපීම යථාබල සන්තෝෂ නම්. මනාපය අනෙකෙකුට දී තමා යම්කිසිවකින් යැපීම යථා සාරුප්ප සන්තෝස නම්. එහි ජලය මනාප අමනාප කොහේදැයි නොසලකා දෝවනය කිරීමට උපකාර ජලයකින් සේදීම උදක සන්තෝෂය නම්. පඬු පැහැති මැටි ගුරුගල් වැනි මැටි දිරූ කොල රසය කිලිටි වූ ජලය දුරු කිරීමට වටී. සෝදන්නා මුගුරු ආදියෙන් නොකළඹා සේදීම ධෝවන සන්තෝෂය නම්. එසේම අසුදධ කොල බැහැර කොට උනු ජලයෙන් සේදීම වටී. මෙසේ සෝදා කරන්නාට මෙය ගොරෝසුය මෙය සියුම් යි වෙනස් නොකොට ප්‍රමාණවත් ගැනීමෙන් කරනය කරණ සන්තෝස නම්. ත්‍රිමණ්ඩලය වැසෙන පමණට කිරීම පරිමාන සන්තෝෂ නම්. සිවුරු කිරීම සඳහා මනාප නූල් සොයමියි නොහැසිර විදී ආදියෙහි හෝ දේවස්ථානයෙහි හෝ ගෙන පාමුල තැබූ යම්කිසි දේව සූත්‍රයක් ගෙන කිරීම සූතන සන්තෝස නම්. දිග මැනීම් කාලයෙහි අඟලක් පමණ සත්වරක් විද මෙසේ කරන්නාට සහාය භික්ෂූවක් නොමැති නම් ඔහුට වත්භේදයක් නොවේ නම් දැඟලක් පමණ සත්වරක් විදිය යුතුය. මෙසේ කරන්නාට මාර්ගයෙහි යන්නාද සහාය විය යුතුය. ඔහුට වත් භේදයක් නොවේ නම් මෙය සිබ්බන සන්තෝසය නම්. රඳන්නහු විසින් කාලකචඡාදිය සොයමින් නොහැසිරිය යුතුය. සෝම හෝ රිටිසුඹුළු

හෝ ගෙන හැරදමූ රඳන් හෝ භික්ෂූන් පිස හැරදමූ කසට හෝ ගෙන රඳන් (පෙවීම) කළ යුතුය. මෙය රජන සන්තෝෂය වේ. නිල්මඩ කාලසාම ආදි යම්කිසිවක් ගෙන ඇතුපිටේ සිටින්නාට පෙනෙන පරිදි කැප කිරීම කපපාස සන්තෝස නම්. වසත්‍රයක් ලැබ නූල් හෝ ඉදිකටුවක් හෝ මහන්නෙකු නොලබන්නා විසින් තැබීමට වටී. ලබන්නහු විසින් නොවටී. අන්තේවාසිකාදීන්ට දෙනු කැමැති වේ නම් නොතබා එනතුරු තැබිමට වටී. පැමිණි වහා දිය යුතුය. දීමට නොහැකි වුවහු විසින් අධිට්ඨාන කළයුතුය. අනිත් සිවුරක් ඇති කල්හි ඇතිරීමට ද අදිට්ඨානය කිරීමට වටී. අදිටන් නොකෙළේ සන්නිධිවේ. අදිටන් කළ කල්හි සන්නිධි නොවේ යයි මහා සිව තෙර කීය. මෙය සනනිධි පරිවජ්ජන සන්තොෂ නම්. විසඳන්නහු විසින් මුහුණ බලා තීරණ නොදිය යුතුය. සාරාණීය ධර්මයෙහි පිහිටා විසඳිය යුතුය. මෙය විසසජ්ජන සන්තෝස නම්. චීවරය සම්බන්ධ ධූතංග නම් පංසුකුලිකංග මෙන්ම තෙචීවරිකංගයද වේ. ඒවායේ විස්තර කථා විසුද්ධි මගගයෙහි ආවේය. මෙසේ චීවර සන්තෝෂ මහා අරියවංස පුරන භික්ෂුව මේ ධූතංග දෙක පුරයි. රකියි. මෙය රකින්නේ චීවර සන්තෝෂ මහා අරියවංසයෙන් සතුටු වේ. **වණ්ණවාදී** - කෙනෙක් සතුටු වෙති. සන්තෝෂ වූවහුගේ වර්ණනාව නොකියයි. කෙනෙක් සතුටු නොවෙති. සන්තෝෂ වූවහුගේ වර්ණනාව කියයි. ඔහු දක්වීමට ඉතරීතරචීවර සන්තෝෂ වූවහුද වණ්ණවාදී යයි කියන ලදී. **අනෙසනං** - දූතයන් යැවීම ගමනා ගමන යෝග භේද විවිධ අනේසන වේ. **අප්පතිරූපං** - අයුත්ත. **අලද්ධංච** - නොලැබ. එක් කෙනෙක් සිවුරු කෙසේ ලබන්නෙම්දැයි පින්වත් භික්ෂූන් සමග එකතුව කුහකකම් කරන්නේ උත්‍රාස කරයි. සන්තෝෂ භික්ෂුව මෙසේ නොලද්දේද සිවුරට උත්‍රාස නොකරයි. **ලද්ධා ච** - දැහැමින් සෙමින් ලැබ. **අගථිතො** - දුරුකළ ලෝබ බැඳුම් ඇත්තා. **අමුච්ඡිතො** - අධිමාත්‍ර තෘෂ්ණාවෙන් මූර්ඡාවට නොපැමිණි තැනැත්තා. **අනජ්ඣාපනෙනා** - තෘෂ්ණාවෙන් යුකත නොවූ. **ආදීනව දසසාවි** - අනේසන ආපත්තිය ද ගථිත පරිභොගයෙහි ද ආදීනව දකින්නේ. **නිසසරණ පඤ්ඤාති** - යම්තාක් සීත වලක්වනු පිණිස යයි කියන ලද නිස්සරණ දන්නේ. **ඉතරීතර චීවර සනතුටඨියා** - යම්කිසි චීවර සන්තෝෂයෙන්. **නෙවතතානං උක්කංසෙති** - මම වනාහි පංසුකුලිකයෙක්මි මවිසින් උපසම්පදා මාලයෙහි ම පංසුකුලික අංගය ගන්නා ලදී. මා හා සමාන කවරෙක් සිටීදැයි තමා උසස් කොට නොසලකන ලදී. **න පරං වමෙහති** - මේ අනිත් භික්ෂූහු පංසුකුලිකංගිකයෝ නොවෙති. පංසුකුල මාත්‍රයක්වත් ඔවුන්ට නැත.

මෙසේ අනුන් පහත් කර නො සලකති. යො හි තත්‍ථ දක්ඛො - යමෙක් ඒ චිවර සන්තෝෂ වණ්ණ වාදිතයෙහි දක්‍ෂ වූයේ ව්‍යකත වූයේ. අනලසො - නිතර ක්‍රියාවෙහි අලස නොවූයේ. සමපජානො පතිස්සතො - දත්තේ ප්‍රඥාවෙන්ද සිහියෙන් ද යුකත වූයේ. අරියවංසෙ ඨිතො - අරියවංසයෙහි පිහිටියේ. ඉතරීතර පිණ්ඩපාතෙන ච - යම්කිසි පිණ්ඩපාතයකින්. මෙහි පිණ්ඩපාතය දත යුතුය. පිණ්ඩපාත ක්‍ෂෙත්‍රය දත යුතුය. පිණ්ඩපාත සන්තොසය දත යුතුය. පිණ්ඩපාත පටිසංයුතත වූ ධුතංගය දත යුතුය.

එහි පිණ්ඩපාතය නම් බත්, පිට්ටු අගගලා, මත්‍ස්‍යමාංස, කිරි දී ගිතෙල් වෙඬරු මෝරු තෙල් මී පැණි, උක්පැණි කැඳ කෑ යුතු, ලෙවිය යුතු (ලෙහනීය) මිදුණු කිරි ආදිය). සොළොසය. පිණ්ඩපාත ක්‍ෂෙත්‍රය. සංඝභත්ත, උද්දෙස භත්ත, නිමන්තණය, සලාක භත්ත, පක්ඛිකය, උපොසථිකය, පාටිපදිකය, ආගන්තුක භත්ත, ගමික භත්ත, ගිලාන භත්ත, ගිලානුපට්ඨාන භත්ත, ධුරභත්ත, කුටි භත්ත, වාරභත්ත, විහාර භත්ත පසළොස පිණ්ඩපාත ක්‍ෂෙත්‍ර වේ. පිණ්ඩපාත සන්තෝෂය නම් පිණ්ඩපාතයෙහි විතක්ක සන්තොසස, ගමන සන්තෝසය, සොයන සන්තෝෂය ප්‍රතිලාභ සන්තෝෂය ප්‍රතිග්‍රහණ සන්තෝෂය ප්‍රමාණය පිලිගන්න සන්තෝෂය, ලොල් බව දුරු කරන සන්තෝෂය යථා ලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය යථා සාරුප්ප සන්තෝෂය උපකාර සන්තෝෂය පරිභෝග සන්තෝෂය සනිධි දුරුකරන සන්තෝෂය විසජ්ජන සන්තෝෂය යයි පසළොස් සන්තොස වේ. එහි යම් දක්‍ෂ භික්‍ෂුවක් මුව දොවා සිතයි. පිණ්ඩපාතික විසින් ගණයා සමග හැසිරෙන්නේ, සවස තෙර උවටැන් කාලයෙහි ම කොතැනට පිඬු සිඟා යන්නෙම්දැයි සවාමීනි අසවල් ගමට යයි මෙපමණක් සිතා ඉන් පසු නොසිතිය යුතුය. එක් චාරිකාවකින් විතක්ක මාලයෙහි සිට සිතිය යුතුය. එතැන් පටන් සිතන්නා අරියවංසයෙන් චුත වී පරිබාහිර වේ. මෙය විතක්ක සන්තෝෂය වේ. පිඬු පිණිස පිවිසෙන්නා වනාහි කොහෙන් ලබන්නෙම්දැයි නොසිතා කමටහන් හිසින් යා යුතුය. මෙය ගමන සන්තෝස නම්. සොයන්නා විසින් එහෙන් හෝ මෙහෙන් හෝ නොගෙන ලජ්ජාව පියසීලිකම නොගෙන සෙවිය යුතුය. මෙය පරියේසන සන්තෝස නම්. දුරසිට ගෙන එනු දැක මෙය මනාපය මෙය අමනාපයයි සිතක් නූපදවිය යුතුය. මෙය පටිලාබ සන්තෝස නම්. මෙය මනාපයෙන් ගන්නෙම් මෙය මනාපයෙන් නො ගන්නෙම්යි නොසිතා යැපෙන පමණක් ගතයුතුය. දෙය්‍ය ධර්මය දායකයා බොහෝ දීමට කැමති නොවේ.

ස්වල්පයක් ගත යුතුය. දෙය්‍ය ධර්මය දායකයෝ බොහෝ දීමට කැමති වෙති. ප්‍රමාණයෙන් ගත යුතුය. පිළිගැනීමෙහි පමණ නොදන්නා මිනිසුන්ගේ ප්‍රසාදය නැති කරයි. ශ්‍රද්ධාවෙන් දුන් දෙය විනාශ කරයි. සාසන පටිපදාව නොකරයි. වැදූ මවගේ ද සිත ගැනීමට නොහැකි වේ. මෙසේ පමණ දැනම පිළිගත යුතුය. මෙය පමණ දැන පිළිගැනීමේ සන්තෝෂයයි. ධනවත් කුලවලටම නොගොස් ගෙ පිළිවෙළින් යා යුතුය. මෙය ලොල්බව දුරුකරන සන්තෝස නම්. යථාලාබ සන්තෝස ආදිය සිවුරෙහි කී නයින් වේ. පිණ්ඩපාතය වළඳා මහණ දම පාලනය කර ගන්නෙමියි මෙසේ උපකාරය සිතා වැළඳීම උපකාර සන්තෝස නම්. පාත්‍රය පුරවා ගෙන එන ලද්ද නොගත යුතුය. අනුපසම්පන්නයෙකු ඇත් නම් ඔහු ලවා ගන්නවා ගත යුතුය. නොමැති නම් අස්කරවා පිළිගැනීමට සුදුසු තරම් පිළිගත යුතුය. මෙය ප්‍රමාණ සන්තෝස නම්. කුසගින්න විනෝදනය සඳහා මෙය මෙහි නිස්සරණ යයි මෙසේ වැළඳීම පරිභොග සන්තෝස නම්. අරන් තබා පසුව නොවැළඳිය යුතුය. මෙය සන්නිධි පරිවජ්ජන සන්තෝස නම්. මුහුණ නොබලා සාරාණීය ධර්මයෙහි සිට විසඳිය යුතුය. මෙය විසසජ්ජන සන්තෝස නම්. පිණ්ඩපාතය සමග යුක්ත ධුතංග පහකි. පිණ්ඩපාතිකංග, සපදාන චාරිකංග එකාසනිකංග, පත්තපිණ්ඩිකංග, ඛලුපච්ඡාභත්තිකංග ඒවායේ විස්තර කථා විසුදධි මගගයෙහි කියන ලදී. මෙසේ පිණ්ඩපාත සන්තෝස මහා අරියවංසය පුරණ භික්ෂුව මේ ධුතංග පහ රකියි.

මේවා රකින්නේ පිණ්ඩපාත සන්තෝස මහා අරිය වංසයේ සතුටු වූයේ වේ. වණ්ණවාදිය කී නයින් ම දත යුතුය. සෙනාසනෙන - මෙහි සෙනසුන දත යුතුය. සෙනසුන් ක්ෂෙත්‍රය දතයුතුය. සෙනසුන් සන්තෝසය දත යුතුය. සෙනසුන් යුතු දුහඟ දත යුතුය. එහි සේනාසන යනු ඇඳ පුටු පාපිසි කොට්ට විහාර, අඩ්ඪයොග, පාසාද, හම්මිය, ගුහා. ලෙන අට්ටා, මලල, වෙලුගුම්බ, රුක්ඛමූල භික්ෂුව කැමතිවන තැනක. මේ පසළොස සේනාසන වේ. ඛෙත්ත නම් සංඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ ඤාතීන් ගෙන් හෝ මිත්‍රයන්ගෙන් හෝ තමාගේ ධනයෙන් හෝ පංසුකූලයේ යයි ක්ෂේත්‍ර සයකි. සේනාසන සන්තෝෂ නම් සේනාසනයෙහි විතක්ක සන්තෝෂාදිය පසළොස් සන්තෝසය. ඒවා පිණ්ඩපාතයෙහි කී නයින් දත යුතුය. සේනාසන පටිසංයුත්ත නම් ධුතංග පහය. ආරඤ්ඤකංග, රුක්ඛමූලිකං අබ්භොකාසිකංග, සෝසානිකංග, යථා සන්තතිකංගය, ඒ ඒවායේ විස්තර කථා විසුද්ධි මගගයෙහි කියන

ලදී. මෙසේ සේනාසන සන්තෝස මහා අරියවංසය පූරන භික්‍ෂුව මේ ද්‍රුහඟ පස රකියි. මේවා රකින්නේ සෙනාසන සනෙතාස අරියවංසෙන සතුටු වේ. ගිලාන පච්චය පිණ්ඩපාතයෙහි ම පිවිසයේ එහි යථාලාභ යථාබල යථා සරුපප සන්තෝසයෙන් ම සන්තෝස විය යුතුය. නෙසජ්ජිකංගය භාවනාවට ඇළුණු අරියවංසය භජනය කරයි. එය කියන ලදී.

සෙනසුනෙහි පහකිය - අහරෙහි ද පහ වන්නේ
විරිය හා එකකිය - සිවුරෙහි දෙකක් වන්නේ

මෙසේ ආයුෂ්මත් ධම්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේ පෘථිවිය දිග හැරෙන්නාක් මෙන් සාගර කුස පූරවන්නා සේ අහස පුළුල්වන්නා සේ ද පළමුව චීවර සන්තෝෂ අරියවංස කියා සඳ නංවන්නා සේ හිරු උලලංඝනය කරන්නාක් මෙන් ද දෙවනුව පිණ්ඩපාත සන්තෝෂය කියා මහමෙර ඔසවන්නා සේ ද තෙවනුව සේනාසන සන්තෝෂ අරියවංස කියා දූන් දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සතරවනුව භාවනාරාම අරියවංස කීමට නැවත "ආවුසො, භික්ඛු" පහාණාරාම හොති" යන දේශනාව අරඹති. එහි ආරමනං ආරාම වේ. ඇලීම ඇතිවේ යන අර්ථයයි. පංචවිධ ප්‍රහාණ ආරාම ඔහුට යයි පහාණාරාම වේ. කාමච්ඡන්දය දුරු කරන්නේ ප්‍රිය වේ. නෙක්ඛම්ම වඩන්නේ ප්‍රිය වේ. ව්‍යාපාදය දුරු කරන්නේ ප්‍රිය වේ. සියළු කෙලෙස් දුරු කරන්නේ පිය වේ. අරහත්ත මාර්ගය වඩන්නේ ප්‍රිය වේ. මෙසේ ප්‍රහාණයෙහි ප්‍රිය වන්නේ පහාණ රත වේ. කියන ලද නයින්ම භාවනාව මොහුට ආරාම වේනුයි - භාවනාරාම වේ. භාවනාවෙහි ප්‍රිය වූයේ - භාවනාරත වේ. මේ සතර අරියවංසයෙහි පළමු තැනින් තෙළෙස් ධූතාංගවල සිව්පසය සන්තෝෂ වශයෙන් සියළු විනය පිටකය කියන ලද්දේ වේ. භාවනාරාමයෙන් අවශේෂ පිටක දෙක. මේ භාවනාරාමය අරියවංසය කියන භික්‍ෂුව විසින් පටිසම්භිදා මාර්ගයෙහි නෙක්ඛම්ම පෙළ කිව යුතුය. දීඝනිකායෙහි දසුත්තර සූත්‍රාන්ත පරියායෙන් කිව යුතුය. මජ්ඣිම නිකායෙහි සතිපට්ඨාන සූත්‍රාන්ත පරියායෙන් කිව යුතුය. අභිධර්මයෙහි නිද්දෙස පරියායෙන් කිව යුතුය. එහි පටිසම්භිදා මාර්ගයෙහි නෙක්ඛම්ම පෙළ යනු "සො නෙක්ඛම්මං භාවෙනෙතා" හේ නෙක්ඛම්මය වඩන්නේ ප්‍රිය වේ. කාමච්ඡන්දය දුරු කරන්නේ ප්‍රිය වේ. අව්‍යාපාදං......ව්‍යාපාදය, ආලෝක

සංඥා. ථින මිද්ධ, අවික්ඛෙප උද්ධච්ච. ධම්ම වවත්ථාන විචිකිච්ඡා ඤාණ අවිජ්ජා පාමොජ්ජ අරති පංචනීවරණ ඉවත්කර ප්‍රථම ධ්‍යානය විතක්ක විචාර ඉවත්කර ද්විතීය ධ්‍යාන පිති තතියට්ඨාන සුඛ දුක්ඛ චතුර්ථ ධ්‍යාන. ආකාසානඤ්චායතන සමාපත්ති භාවෙනෙතා ප්‍රිය වේ. ආකිඤ්චඤ්ඤා-යතන සංඥාව දුරු කරන්නේ ප්‍රිය වේ. අනිත්‍යානුපස්සනාව වඩන්නේ ප්‍රිය වේ. නිත්‍ය සංඥාව දුරුකරන්නේ ප්‍රිය වේ. දුක්ඛානුපස්සනාව සුඛ සංඥාව, අනත්තානුපස්සනාව ආත්ම සංඥාව නිබ්බිදානුපස්සනාව බැඳීම, විරාගානුපස්සනාව රාගය, නිරෝධානුපස්සනාව සමුදය, පටිනිස්සග්ගානු-පස්සනාව ගැනීම, ඛයානුපස්සනාව ඝන සංඥාව, වයානුපස්සනාව රැස් කිරීම, විපරිනාමානුපස්සනාව ස්ථිර සංඥාව, අනිමිත්තානුපස්සනාව නිමිත්ත, අප්පනිහිතානුපස්සනාව ප්‍රාර්ථනාව, සුඤ්ඤතානුපස්සනාව අභිනිවෙසය අධිපඤ්ඤා ධම්ම විපස්සනාව සාරදා අනාභිනිවෙසය, යථාභූත ඤාණ දස්සනං සම්මොහ අභිනිවෙසස, ආදීනවානුපස්සනය ආලය අභිනිවෙසය, පටිසංඛානුපස්සනය අප්පටි සංඛාව, විවට්ටානු පස්සනය සංයොග අභිනිවෙසය, සොතාපත්ති මග්ග සක්කාය ආදි කෙලෙස්, සකදාගාමී මග්ග ඕලාරික කෙලෙස්, අනාගාමිමග්ග අනු සහගත කෙලෙස් අරහත් මාර්ගය වඩන්නේ ප්‍රිය වේ. සියළු කෙලෙස් දුරු කරන්නේ ප්‍රිය වේ. මෙසේ පටිසම්භිදා මාර්ගයෙහි නෙකඛම්ම ධම්ම පෙළ කිවයුතුය. දීඝනිකායෙහි දසුත්තර සූත්‍රාන්ත පරියායෙන් එක් ධර්මයක් වඩන්නේ ප්‍රිය වේ. එක් ධර්මයක් දුරු කරන්නේ ප්‍රිය වේ.... දස ධර්ම වඩන්නේ ප්‍රිය වේ. දස ධර්ම දුරු කරන්නේ ප්‍රියවේ. එක ධර්මයක් වඩන්නේ ප්‍රිය වෙන්නේ කෙසේද? කායගතා සතිය මිහිර සමග මේ එක ධර්මය වඩන්නේ ප්‍රිය වේ. එක් ධර්මයක් දුරුකරද්දී ප්‍රිය වන්නේ කෙසේද? අසම්මානය මේ එකම ධර්මය දුරු කරන්නේ ප්‍රිය වේ. දෙකක කෙසේද?....දස ධර්මයක් භාවනා කරන්නේ ප්‍රියවන්නේ කෙසේද? දස කසිණායතන, මේ දස දහම් වඩන්නේ ප්‍රිය වේ. දස දහම් දුරු කරද්දී ප්‍රිය වන්නේ කෙසේද? දස මිථ්‍යා වේ. මේ දස දහම් දුරු කරන්නේ ප්‍රිය වේ. මහණෙනි. මෙසේ භික්ෂුව භාවනාවට ඇළුණේ වේ. මෙසේ දීඝනිකායෙහි සතිපට්ඨාන සූත්‍රාන්ත පරියායෙන් එකායනො අයං භික්ඛවෙ.... මහණෙනි. මේ ඒකායන.... යම්තාක් ඤාණය සඳහා පමණක්. සිහිය සඳහා පමණක් එකලා වාසය කරයි ලෝකයේ කිසිවක් අල්ලා නොගනී. මහණෙනි භික්ෂුව මෙසේ භාවනාවට ඇළුණේ වේ. භාවනාවට රතිය වේ ප්‍රහාණය ඇළුණේ වේ. ප්‍රහාණය රතිය වේ.

මහණෙනි, නැවත ද භික්ෂුව යන්නේ යම්යි දනගනී....මහණෙනි, නැවත භික්ෂුව සොහොනෙහි හැර දමන ලද කුණු වූ සුණු බවට පත් වූ ශරීරය යම්සේ බලන්නේය. තම කයද ලංකර බලයි. මේ කය ද මේ ධර්ම සවභාවය වේ. මෙසේ වන්නේය මෙය නො ඉක්ම වූයේය. මෙසේ අජ්ඣත්ත හෝ කයෙහි කය අනුව බලන්නේ වාසය කරයි. මහණෙනි. මෙසේ ද භික්ෂුව භාවනා රාම වේ. මෙසේ මජ්ඣිම නිකායෙහි සතිපට්ඨා සූත්‍රාන්ත පරියායෙන් කිව යුතුය. අබිධර්මයෙහි නිද්දෙස පරියායෙන් කිවයුතුය. සියළු සංඛත ධර්මයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩු වශයෙන්.....සංකෙලශ ධර්ම වශයෙන් බලන්නේ ප්‍රිය වේ. මෙසේ මහණෙනි, භික්ෂුව භාවනාරාම වේ. මෙසේ නිද්දෙස පරියායෙන් කිව යුතුය. නෙව අත්තානං උක්කංසෙති - අදට මවිසින් වර්ෂ හැටක් හෝ හැත්තෑවක් හෝ අනිත්‍ය දුක්ඛ අනත්ත විපස්සනා භාවනා කරන්නට වෙලා. කෝ මං වගේ කෙනෙක් ඉන්නවද? මෙසේ අත්තුක්කංසනය නොකරයි. න පරං වම්භෙති - අනිත්‍ය දුක්ඛ විපස්සනා මාත්‍රයක්වත් නැත. ඇයි මේ අය කමටහන් අතහැර හැසිරෙන්නෙ මෙසේ පරවම්භනය නොකරයි. සෙස්ස කියන ලද සේය.

පධානානි - උතුම් වීර්ය, සංවරප්පධානං - චක්ඛු ආදිය සංවරණය සඳහා උපන් වීර්ය. පහානප්පධානං - කාම සිතිවිලි ප්‍රහාණය සඳහා උපන් වීර්ය. අනුරක්ඛණප්පධානං - සමාධි නිමිත්තා රකින්නාට උපන් වීර්ය. විවෙකනිස්සිතං - ආදියෙහි විවෙක විරාග නිරොධ තුනම නිවණට නම් වේ. නිර්වාණය උපධි විවෙක බැවින් විවෙක - වේ. ඊට පැමිණ රාගාදිය විරජ්ජණය වේ යයි විරාග - වේ. නිරුද්ධ වේ යයි. නිරොධො - වේ. එහෙයින් විවෙකනිස්සිතං ආදියෙහි අරමුණු වශයෙන් හෝ අවබෝධ කිරීමේ වශයෙන් හෝ නිර්වාණය නිශ්‍රිතයය අර්ථ වේ. වොස්සග්ග පරිනාමිං - මෙහි වොස්සග්ග දෙකකි, පරිත්‍යාග වොස්සග්ග, ප්‍රස්කන්ධන (පැනයෑම) වොස්සග්ග ද යනුවෙනි. (වොස්සග්ග යනු අතහැරීමය) විපස්සනාවෙහි තදඞ්ග වශයෙන් කෙලශයන්ද ස්කන්ධයන්ද අත්හරී යනු පරිච්චාග වොස්සංග - වේ. මාර්ගය අරමුණු වශයෙන් නිර්වාණය ලුහුබඳී යයි පරිච්චාග වොස්සග්ග - වේ. එහෙයින් වොස්සග්ග පරිණාමිං වේ. සත්ත සම්බොජ්ඣඞ්ගය මනා සේ භාවිත කරන්නේ වොස්සග්ගත්වය (අත්හැරීම සඳහා) නැමේ. විපස්සනා භාවනාවටද මාර්ග භාවනාවටද පැමිණේ. මෙසේ ඔහු වඩන්නේ යයි මෙහි අර්ථය වේ. සෙසු පදවලද මෙම නයම වේ. භද්දිකං - ලදදේ. සමාධිනිමිත්තං - අට්ඨි

සඤ්ඤාදි වශයෙන් ලැබූ සමාධිය. අනුරක්ඛති සමාධියෙන් පිරිපුන් ධර්මයෙහි රා දොස් මෝ පිරිසිදු කරමින් රකියි. මෙහිද අට්ඨික සඤ්ඤා අධික වූ සඤ්ඤා පහම කියන ලදී. මේ ස්ථානයෙහි වනාහි දස අසුභ විස්තර කොට කිව යුතුය. ඒවායේ විස්තර විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දේමය.

ධම්මෙ ඤාණං - ඒක ප්‍රතිවේධ වශයෙන් චතුරාර්ය සත්‍ය ධර්ම ඥානය. චතුරාර්ය සත්‍ය තුළ නිරෝධ සත්‍ය ධර්මයේ ඤාණය ද කීහ: එහි ධර්මේ ඤාණය කුමක්ද? සතර මාර්ගයෙහි සතර පලයෙහි ඤාණයයි. සිව්සස් පස් විකන්නේ දැක දැන් මෙන්ම අතීතයෙහි ද අනාගතයෙහි ද මේ පංචසකන්ධයම දුක්ඛ සත්‍ය මේ තෘෂ්ණාවම සමුදය සත්‍යය මේ නිරෝධයම නිරෝධ සත්‍යය මේ මාර්ගයම මාර්ග සත්‍යය වේ. මෙසේ ඔහුගේ ඤාණයට අනුගත වූ ඤාණය එයින් කීහ. හේ මෙ දහමින් දැන ගන්නා ලද දකින ලද පැමිණෙන ලද අවබෝද කරගන්නා ලද බැස ගන්නා ලද අතීත අනාගතයෙන් යමක් පමුණුවයි. පරිචෙඡදෙඤාණං - අනුන්ගේ සිත් පිරිසිඳින ඤාණය. යම් සේ කීහ. එහි පරිචෙඡදෙ ඤාණය කවරේද? මෙහි භික්ෂුව පර සත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිතින් සිත වෙන්කොට දැනගනී. විස්තර කළයුතුය. මේ ඤාණ තුන හැර අවසේස ඒවා සම්මුති ඤාණ වේ. කීහ: එහි සම්මුති ඤාණය කවරේද? ධර්ම ඤාණය හැර, අන්වය ඤාණය හැර පරිචෙඡද ඤාණය හැර අවසේසය සම්මුති ඤාණ වේ. දුක්ඛයේ ඤාණාදියෙන් රහත් බවට පමුණුවා එක් භික්ෂුවකට නිර්ගමනයට චතුසච්ච කමටහන් කියන ලදී. එහි සත්‍ය දෙකක් වට්ට නිශ්‍රිතය. සත්‍ය දෙකක් විවට්ට නිශ්‍රිතය. අභිනිවේශය වට්ටයෙහිය. විවට්ටයෙහි නොවේ. සත්‍ය දෙකෙහි පරියත්තිය ආචාර්යවරයා සමීපයෙහි උගෙන කර්ම කරයි. සත්‍ය දෙකෙහි ඉගණීම ප්‍රශ්න කිරීම ඇසීම දැරීම විමසීම ප්‍රතිවේධය වටී. සවණ පටිවෙධ දෙක කෘත්‍ය තුණ වශයෙන් පිළිවිදියි. එකක් අරමුණ වශයෙන් සත්‍ය දෙක දැකීමට දුෂ්කර නිසා ගැඹුරුය. දෙකක් ගැඹුරු නිසා දැකීමට අපහසුය.

සොතාපත්තියඞ්ගානි - සොතාපත්තියේ අංග. සෝවාන් මග ලැබීමට කරුණු යන අර්ථයි. සප්පුරිස සංසෙවා - බුද්ධා දි සත්පුරුෂයන් වෙත එළඹ ඇසුර. සද්ධම්ම සවණං - සත්පාය ත්‍රිපිටක ධර්මය ශ්‍රවණය, යොනිසො මනසිකාරො - අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කිරීම. ධම්මානු ධම්ම පටිපත්ති - ලෝකෝත්තර ධර්මයේ අනුධර්මය වූ පූර්වභාග

ප්‍රතිපත්තිය පිළිපැදීම. අවෙච්චපසාදෙන - අචල ප්‍රසාදයෙන්. ''ඉතිපි සො භගවා'' ආදිය විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. එල ධාතු ආහාර චතුක්ක අර්ථ කියන ලදි. එහෙත් එහි රළු ප්‍රණීත වස්තු වශයෙන් ඕලාරික සියුම් බව දත යුතුය. **විඤ්ඤාණට්ඨිතියො** - විඤ්ඤාණය මේවායෙහි ඇතැයි ආරම්මණ ඨිති වශයෙන් මෙය කියන ලදී. **රූපූපායං** - රූපය වෙත පැමිණ. පංච වෝකාර භවවල අභිසංඛාර විඤ්ඤාණය රූපස්කන්ධය නිසා පවතී. එය සඳහා මෙය කියන ලදී. **රූපාරම්මණං** - රූපයෙහි පිහිටා. **නන්දූප සෙවනං** - ලෝභ සහගත නන්දියෙන් යුත් **වුද්ධිං විරූළහිං වෙපුල්ලං ආපජ්ජති** - හැට හැත්තෑ වසක් මෙසේ පවතින්නේ මෙසේ පැමිණේ. වෙදනා උපායාදියෙහි ද මෙම නයම වේ. මේ පද තුනෙන් චතුවෝකාර භවයෙහි අභිසංඛාර විඤ්ඤාණය කියන ලදී. එය දිවිතෙක් පැවැත්වීම් වශයෙන් වෘද්ධියට වැඩීමට විපුල බව පැමිණීම දත යුතුය. චතුක්ක වශයෙන් දේශනාවේ ආ බැවින් විඤ්ඤාණ උපායට නොකියනලදී. මෙසේ කියන්නේ මෙහි කම්ම විඤ්ඤාණය කෙසේද විපාක විඤ්ඤාණය කෙසේදැයි මුළාවන්නේය. එනිසා නොකියන ලදී. අගති ගමන විස්තර කරන ලද්දේය. **චීවරහෙතු** - එහි මනාප සිවුරක් ලබන්නෙමියි සිවුරු කරුණු උපදී. **ඉති භවා භව හෙතු** - මෙහි ඉති යනු නිදර්ශන අර්ථයෙහි නිපාතයෙකි. චීවරාදි හේතු සේ භවාභව හේතු යයි ද අර්ථය මෙහි භවාභව යනු ප්‍රණීත ප්‍රණීතතර වේ. තෙල් පැණි ආදිය අදහස් කෙරේ. මේ තෘෂ්ණා උපාදාන සතර ප්‍රහාණය සඳහා සතර අරියවංස පිළිවෙළින් දේසිත යයි දත යුතුය. පටිපදා චතුක්කය යට කියන ලදී. නො ඉවසීම් ආදියෙහි ප්‍රධාන කරන විට සීතාදි නබ මතීති **අක්ඛමා** - වේ. **ඛමතීති** - **ඛමා ධම්මපදානි** - දහම් කොටස් **අනභිජ්ඣා ධම්මපදං නම** - අලෝභය හෝ අලෝභ හිසින් අධිගත ධ්‍යාන මග්ග ඵල නිබ්බාණ හෝ **අව්‍යාපාද ධම්මපදං නාම** - කෝප නොවීම හෝ මෙත් හිසින් අධිගත ධ්‍යානාදිය හෝ **සම්මා සති ධම්ම පදං නාම** - මනාව පිහිටි සිහිය හෝ සති හිසින් අධිගත ධ්‍යාන. **සම්මා සමාධි ධම්මපදං** - අෂ්ට සමාපත්ති හෝ සමාපත්ති හිසින් අධිගත ධ්‍යාන විපස්සනා මග්ගඵල නිබ්බාණ හෝ දස අසුභ වශයෙන් අධිගත. **අව්‍යාපාදො ධම්මපදං** - දස අනුස්සති ආහාරයෙහි පිළිකුල් සඤ්ඤා වශයෙන් අධිගත. **සම්මා සති ධම්මපදං** - දස කසිණ දෙවනුව සියළු කෙලෙසුන්ගෙන් මිදී රහත් වන්නට නොහැකිව අඬන්නාට පිරිසිදු බ්‍රහ්ම චරියාව තෙවනුව කාමයන් කෙරෙහි වැසීම. සතරවනුව සිව්පසය නොලබන්නාට ධ්‍යාන විපස්සනා වශයෙන්

සැප සහිත සාසන බ්‍රහමචරියාව, ධමමකඛනධ - මෙහි ගුණය ඛනධ වේ. සීලකඛනෙධා - සීල ගුණ මෙහි ඵල සීලය අදහස් කරයි.

බලානී - උපකාර අර්ථයෙන් කම්පා නොවන අර්ථයෙන් හෝ බලානි වේ. ඒවාට ප්‍රතිපක්‍ෂ කුසීතාදියෙන් කම්පා නොවන බව දත යුතුය. සියල්ල ද සමාධි විපසසනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තරම කියන ලදී. අධිට්ඨානානි - මෙහි අධි යන උපසර්ග පමණි. අර්ථ වශයෙන් වනාහි එයින් හෝ සිටිති, එහි හෝ සිටිති. ප්‍රඥාවද අධිෂ්ඨානය ද පඤ්ඤාධිට්ඨානං වේ. එහි ද පළමුවෙන් අග්‍රඵල ප්‍රඥාවය. දෙකෙන් වාක් සත්‍යවේ. තුනෙන් ආමිස පරිත්‍යාග සතරෙන් කෙලෙස් උපසමය කියන ලදී. එකෙන් කමමසසක පඤ්ඤා විපසසනා පඤ්ඤා හෝ ආදිකොට ඵල පඤ්ඤා කියන ලදී. දෙකෙන් වචී සත්‍ය ආදිකොට පරමාර්ථ සත්‍ය නිර්වාණය. තුනෙන් ආමිස පරිත්‍යාග ආදිකොට අග්‍ර මර්ගයෙන් කෙලෙස් අතහැරීම. සතරෙන් සමාපත්තියෙන් කෙලෙස් යටපත් කළවිට අග්‍ර මාර්ගයෙන් කෙලෙස් වූපසමනය. පඤ්ඤාධිට්ඨානයෙන් එකෙන් අරහත්තඵල පඤ්ඤා කියන ලදී. සෙස්සෙන් පරමාර්ථ සත්‍යය. සච්චාධිට්ඨානයෙන් හෝ එකෙන් පරමත්‍ථ සච්ච කියන ලදී. සෙස්සෙන් අරහත්ත පඤ්ඤා මුසිකාභය තෙර කිය. ප්‍රශ්න ව්‍යාකරණය මහා පදෙස කථාවෙහි විස්තර කරන ලද්දේය. කණ්හං - කළු දස අකුසල පථ කමම. සුක්කං - සුදු දස කුසල කමම පථ කමම. සුක්ක විපාක - ස්වර්ගයෙහි ඉපදවීමෙන් සුදු විපාක කණ්හ සුක්ක - මිශ්‍ර කර්ම. කණ්හ සුක්ක විපාක - සැප දුක් විපාක. මිශ්‍ර කර්ම කොට අකුසලයෙන් තිරිසන් යෝනි මංගල හස්ති ස්ථානයෙහි ඉපදී කුසලයෙහි පවතින සැප විඳියි. කුසලයෙන් රජ කුලයෙහි උපන්නේ අකුසලයෙන් දුක් විඳියි. අකණ්හං අසුඛං - කමමකඛය කරන සිවුමග නුවණ අදහස් කරයි. කළු වන්නේ නම් කළු විපාක දෙන්නේය. සුදු වන්නේ නම් සුදු විපාක දෙන්නේය. සච්ඡිකරණීයා - ප්‍රත්‍යක්‍ෂ කරනයෙන් ද ප්‍රතිලාභයෙන් ද අවබෝධ කළයුතුය. චක්ඛුනා - දිව ඇසින් කායෙන - සහජාත නාම කයින්. පඤ්ඤාය - අරහත්ත ඵල ඤාණයෙන්. ඔඝා - සසරෙහි සතුන් යටකරයි ගිල්වයි යනු ඔඝා වේ. එහි පංචකාම ගුණික රාගය කාමොඝො - වේ. රූපාරූප භවවල ඡන්දරාගය භවොඝො - වේ. එසේම ධ්‍යාන ආශාව සාසවත දෘෂ්ටිය යුත් රාගය, දෙසැට දිටු දිට්ඨොඝො - වේ. සසරෙහි යොදයි යනු යොගා. ඒවා ඔඝ මෙන් දත යුතුය. වෙන්ව යෙදීම විසංයොග වේ. එහි අසුභ ධ්‍යානය කාමයොගයට විසංයොග

වේ. එය පාදක කොට අධිගත අනාගාමි මාර්ගය ඒකාන්තයෙන්ම **කාමයොග විසංයොග** - නම්. අරහත්ත මාර්ගය **භවයොග විසංයොග** - නම්. සොතාපත්ති මග්ග **දිට්ඨියොග විසංයොග** - නම් ගෙතීම් වශයෙන් **ගන්‍ථා** - වේ. සසරෙහි නාමකයද රූපකයද ගොතයි බඳියි. **කාය ගන්‍ථො** - වේ. **ඉදං සච්චාභිනිවෙසො** - මෙයම සත්‍ය වේ. සෙසු ඒවා හිස්ය මෙසේ පවතින දෘෂ්ටිය නිවේස වූයේ, **උපාදානං** - ආදානය ගැනීම. **කාමො** - රාගය එයද ගැනීම් අර්ථයෙන් උපාදානයය **කාමුපාදානං** - වේ. දිට්ඨි ද මිථ්‍යා දිට්ඨි. එය ගැනීම් අර්ථයෙන් උපාදාන යයි **දිට්ඨුපාදානං** - වේ. මෙයින් සුද්ධ වේ යයි මෙසේ සීල වුතයන්ගේ ගැනීම **සීලබ්බතුපාදානං** වේ. **අත්තා** යයි මෙයින් කියයි. එසේම ගනියි. **සංසෙදයෙති** (කසලෙහි) උපන් **සංසෙදජා**. වේගයෙන් අවුත් වැටුනාක් මෙන් වූයේ **ඔපපාතිකා** - එහි දෙවි මිනිසුන් කෙරෙහි සංසේදජ ඕපපාතිකයන්ගේ මෙය විසේසයෙකි. සංසේදජයෝ මඳව දහරව උපදිති. ඕපපාතිකයෝ සොළොස් වයස්ව, මිනිසුන් කෙරෙහි ද බුමාටු දෙවියන් කෙරෙහි ද මෙයද ඒ යෝනි ද ලබයි. එසේම තිරිසන් සතුන් කෙරෙහිද සුපර්ණ නාගයන් කෙරෙහිද, මෙය කියන ලදී. මහණෙනි එහි අණ්ඩජ සුපර්ණයෝ අණ්ඩජනාගයන් ගෙනයති. ජලාබුජ නැත. ඕපපාතික නැත. චාතුමමහාරාජිකයේ පටන් ඉහළ දෙවියෝ ඕපපාතිකය. නෙරයිකාද එසේය. ගබ්භාවක්කන්තිතියො සම්පසාදනියෙහි කියන ලදී. ආත්මලාභ ප්‍රතිලාභවල පළමුව ඛිඩ්ඩා පදොසික වශයෙන් දත යුතුය. දෙවනුව ඝාතකයන් විසින් ඝාතනය කරන ලබන බැටළු ආදීන් වශයෙන්. තෙවනුව මනොපදොසික වශයෙන් සිව්වෙනුව චාතුමමහාරාජිකය ගෙන ඉහළ සෙසු දෙවියන් වශයෙන් සමහර දෙවියෝ ආත්ම සංචේතනාවෙන් ද පරසංචේතනාවෙන් ද රමණය නොකරති.

**දක්ඛිණා විසුද්ධියො** - දාන සංඛ්‍යාත දක්ෂණාව, මෙයින් පිරිසිදු වේ. මහත් පල වේ දක්ඛිණ විසුද්ධියො නාම. **දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො** - දායකයා සිල්වත් වේද ධාර්මිකව සපයා ගත් දෙය ධර්මය දෙයි පතිග්‍රාහකයා දුසිල්ය. මේ දක්ෂිණා වෙසතුරු රජුගේ දක්ෂිනාවට සමානය. **පටිග්ගාහ කො විසුජ්ඣති නොදායකතො** - ප්‍රතිග්‍රාහකයා සිල්වත් වේ. දායකයා දුසිල් වේ. අධර්මයෙන් උපන් දේ දෙයි. මෙය චෝරඝාතකයාගේ දක්ෂිණාවට සමානය. **නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො** - දෙදෙනාම දුසිල්. දෙය්‍ය ධර්මයද අධාර්මිකය. මීට ප්‍රතිපක්ෂ වශයෙන් සතර දත යුතුය.

සංගහවත්ථූනි - සංග්‍රහ කරුණු ඒවා යට කියන ලදී. අනරිය වොහාරා - අනාර්යයන්ගේ ලාමක වූ ව්‍යවහාරය. අරිය වොහාරා - ආර්ය වූ සත්පුරුෂයන්ගේ ව්‍යවහාරය. දිට්ඨවාදිතා - මවිසින් දක්නා ලදැයි මෙසේ කියන්නා. එහි ද උපදවන ඒ ඒ චේතනා වශයෙන් අර්ථය දත යුතුය. අතතනතපාදියෙහි පළමුව අචේලකයෝ, දෙවනුව බැටළුඝාතකාදීන් කෙරෙහි එක්තරා එකෙක්, තෙවනුව යාඥා යාජකයා, සතරවනුව සාසනයෙහි මනාව පිළිපන්නා. තමාට හිත පිණිස පිළිපන්නාදීන් කෙරෙහි පළමු. යමෙක් තමා සීල සම්පන්නව අන්‍යය සීලයෙහි සමාදන් නොකරවාද ආයුෂ්මත් වක්කලි තෙරුන් මෙන් දෙවනුව යමෙක් තමා සීල සම්පන්න නොවී අනුන් සීලයෙහි සමාදන් කරවයි. ආයුෂමත් උපනන්ද තෙරුන් මෙන්. තෙවැන්න තමාද සීලසම්පනන නොවේ අනුන්ද සීලයෙහි සමාදන් නොකරවයි. දෙව්දත් තෙරුන් මෙනි. සතරවෙනුව යමෙක් තමාද සීලාදි සම්පන්නය. අනුන්ද සීලාදියෙහි සමාදන් කරවයි. ආයුෂමත් මහා කාශ්‍යප මහරහත්හු මෙනි.

තමාදියෙහි තමො - අන්ධකාර වූ. තම පරායනො - අඳුරම පරම මාර්ගය මොහුට වේ යයි. තම පරයනො වේ. මෙසේ සියළු පදවල අර්ථය දත යුතුය. මෙහි ද පළමුව පහත් චණ්ඩාලාදි කුලයෙහි දුෂ්කර ජීවිකාවෙහි හීන ආත්මභාවයෙහි ඉපිද තුන් දුසිරිත් පුරයි. දෙවුනව එබඳුව තුන් සුචරිත පුරයි. තෙවනුව ඕලාරික ක්‍ෂත්‍රිය කුලයෙහි බොහෝ ආහාරපාන ඇති ආත්මභවයෙහි ඉපිද තුන් දුසිරිත් කරයි. සිව්වෙනුව එබඳුම වී තුන් සුචරිත කරයි. සමණමචලො - සමණ අචලො මකාරය පද සන්ධියටය. හේ සෝවාන්වේ යයි ද දත යුතුය. සෝවාන් පුද්ගලයෝ සතර පැත්තෙන් හමන සුළඟට නො සෙල්වෙන ඉඳු ඛීලයක් මෙන් පරප්පවාදවලින් කම්පා නොවී අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ සමණමචල වේ. මෙය කියන ලදී සමණමචල පුද්ගලයා කළුවරේද? මෙහි එක් පුද්ගලයෙක් සංයෝජන තුනක් ක්‍ෂය කරන ලද්දේ යයි විස්තර වේ. රාග දෝස තුනී වීමෙන් සකදාගාමියා - සමණ පදුමො - නම් වේ. එයින් කීහ. සමණපදුම පුද්ගලයා කවරේද? එක් පුද්ගලයෙක් එක් වරක් පමණක් මේ ලෝකයට පැමිණ දුක් අවසන් කරයි. මේ පුද්ගලයා සමණ පදුම යයි කියනු ලැබේ. රාග දෝස අභාවයෙන් වහාම පිපේ යයි අනාගාමියා සමණ පුණ්ඩරීක - නම් වේ. එයින් කීහ. සමණ පුණ්ඩරීක පුද්ගලයා කවරේද? මෙහි එක් පුද්ගලයෙක් ඕරම්භාගිය පස....මේ පුද්ගලයා සමණ පුණ්ඩරීක යයි කියනු ලැබේ. රහතන් වහන්සේ වනාහි සියළු ග්‍රන්ථකාර

කෙලෙස්වල අභාවයෙන් සමණ සුඛුමාලො - නම් වෙති. එයින් කිහ. ආශ්‍රවයන් ක්‍ෂය කර පැමිණ වාසය කරන පුද්ගලයා කවරේද? මේ පුද්ගලයා ශ්‍රමණයන් අතර සමණ සුඛුමාල යයි කියනු ලැබේ. ඇවැත්නි මේ......මුලින් කියන ලද නයින්ම යෙදිය යුතුය. මෙසේ සමපනස් චතුකක වශයෙන් ප්‍රශ්න දෙසීයක් කියමින් සථවිරයන් වහන්සේ සාමග්ගි රසය දක්වති.

**චතුකක නිමි.**

මෙසේ චතුකක වශයෙන් සාමග්ගි රසය දක්වා දැන් පඤ්චක වශයෙන් දැක්වීමට නැවත දේශනාව ආරම්භ කළහ. එහි පඤ්චස්කන්ධයෙහි රූපස්කන්ධය ලෞකිකය. සෙස්ස ලෞකික ලොකෝත්තර වේ. උපාදාන ස්කන්ධ ලෞකික වේ. ස්කන්ධ කථා විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. පඤ්චකාම ගුණ විස්තර කරන ලදී. හොඳ නරක කරන්නන් විසින් යා යුතු යයි ගතිය වේ. නිරයො - ආශ්වාද රහිතය. අවකාස සහිතව ස්කන්ධ කියන ලදී. ඉන් පර තුනෙහි උපන් සකන්ධ කියන ලදී. සතරෙහි අවකාස ආවාසයෙහි මසුරුකම - ආවාස මච්ඡරිය - වේ. එයින් යුත් භික්‍ෂුව ආගන්තුකයකු දැක මෙහි චෛතියේ හෝ සංඝයාගේ හෝ පිරිකර තබන ලදැයි ආදිය කියා සංඝික ආවාසය ද නොදෙයි. හේ කළුරිය කොට ප්‍රේතයෙක් හෝ පිඹුරෙක්ව උපදියි. කුලයෙහි මසුරුකම. කුලමච්ඡරියං - වේ. එයින් යුත් භික්‍ෂුව ඒ ඒ කරුණින් තම උපසථාන කුලයෙහි අනෙකකුගේ පිවිසීම වලක්වයි. ලාභයෙහි මසුරුකම ලාභ මච්ඡරියං - එයින් යුත් භික්‍ෂුව සංඝික ලාභයට මසුරුවන්නේ අනුන්ට එය ලැබීමට නොදෙයි. වර්ණයෙහි මසුරුකම වණ්ණ මච්ඡරිය - වේ. මෙහි වර්ණයය ශරීර වර්ණය ද ගුණවර්ණය ද දත යුතුය. පර්යාප්ති ධර්මයෙහි මසුරුකම ධම්මච්ඡරියං - වේ. එයින් යුත් භික්‍ෂුව මේ ධර්මය ඉගෙන මෙතෙම මා අභිබවා යන්නේ අනෙකකුට නොදෙයි. හේ වනාහි ධර්මානුග්‍රහයෙන් හෝ පුද්ගලානුග්‍රහයෙන් හෝ නොදෙයි. ඒ මසුරු සිත නිවාරණය නොකරයි යනු නීවරණානි - වේ. කාමච්ඡන්ද නීවරණයට පැමිණියේ රහත් මග අත්හළේය. කාමරාගනුසය කාමරාග සංයෝජනයට පැමිණියේ අනාගාමි මග අත්හළේය. ථීනං - සිතේ මැලිබවයි. මිද්ධං - වෙදනාදි සකන්ධ තුනේ මැලිබවයි දෙකම රහත් මග අත්හළේය. එසේ උද්ධච්ච කුක්කුච්ච අනාගාමි මග හළේය. විචිකිච්ඡා පළමු මග අත් හළේය.

සංයෝජනානි - බන්ධන. ඒ ශ්‍රද්ධා පුද්ගලයන් අතරෙහි රූපා රූප භවයෙහි උපන් සෝවාන් සකදාගාමීහු ඇතුළත බැඳී පිටත නිදිය. ඔවුන්ගේ කාම භවයෙහි බැඳීම. කාම භවයෙහි අනාගාමීහු පිටත බැඳුනහ. ඇතුළත නිදිය. ඔවුන්ගේ රූපා රූප භවයෙහි බැඳීම. සෝවාන් සකදාගාමීහු ඇතුළත බැඳී ඇතුළත නිදිය. රූපා රූප භවයෙහි අනාගාමීහු පිටත බැඳී බහි (පිටත) සහිත නම් වේ. රහතන් වහන්සේ සියළු තැන නොබැඳුනහ. හික්මිය යුතු පදය සික්ඛා පදං වේ. සික්ඛා කොටස යන අර්ථයයි. සික්ඛා වේ පදය හෝ සික්ඛාපදයයි. අධි චිත්ත අධිපඤ්ඤ සික්ඛාවෙන් අධිගම උපාය යන අර්ථයි. මෙය මෙහි සංක්ෂෙපයයි. විස්තර වශයෙන් වනාහි සික්ඛාපද කථා, විභඞ්ගප්පකරණයෙහි ශික්ෂාපද විභඞ්ගයෙහි ආයේය. ඇවැත්නි රහතන් වහන්සේ පණ ඇති සතුන් නුසුදුසු යයි ආදි දේශනා සීසයෙන්ම. සෝතාපන්නාදීහු ද නුසුදුසුයහ. පෘථග්ජන ඛීණාසවයන්ට නින්දා ප්‍රසංසාද මෙසේ කියන ලදී. පෘථග්ජනයා නම් ගැරහිය යුතු මාතුඝාතනාදිය කරයි. ඛීණාසවයා පණ ඇති කුරා කුඹියෙකු ද ඝාතනය නොකරයි. ව්‍යසනවල විනාශ කෙරේ යයි ව්‍යසනං වේ. දියුණුව සැප තබයි විනාශ කරයි අර්ථයයි. ඤාතීන්ගේ විනාශය ඤාති ව්‍යසන වේ. චොර රෝග භය ආදියෙන් නෑයින් විනාශ කරයි යන අර්ථයයි. භෝගවල විනාශය - භොග ව්‍යසන වේ. රාජ චෞරාදි වශයෙන් භෝග විනාශ වේය යන අර්ථයයි. රෝගයම ව්‍යසනය - රෝග ව්‍යසන වේ. රෝගය - ආරෝග්‍ය විනාශ කරයි. සීලයේ විනාශය - සීල ව්‍යසනය වේ. මෙය දුස්සීලයට නමකි. සම්මා දිට්ඨිය විනාශ කරමින් උපන් දිට්ඨියම ව්‍යසනය දිට්ඨිව්‍යසන දෙක අකුසලය. තිලකුණු ගෙනෙන ලදී. ඤාති සම්පදා - නෑයින්ගේ සම්පත්, සම්පූර්ණවීම, බොහෝ වීම. භෝග සම්පත්වලද මෙම නයයි. ආරෝග්‍ය සම්පත්තිය - ආරෝග්‍ය සම්පදා වේ. සම්පූර්ණවීම, බොහෝ කලක් නිරෝගී වීම. සීල දිට්ඨි සම්පත්වල ද මෙම නයයි. මේ ඤාති සම්පදා ආදියද කුසල් නොවේ. තිලකුණු ගෙනෙන ලද්දේ නොවේ. සීලවිපත්ති සීලසම්පත්ති කථා මහා පරිනිබ්බාන සූත්‍රාන්තයේ විස්තර කරන ලද්දේය. චොදකෙන - වත්ථු සන්දස්සන, ආපත්ති සන්දස්සන, සංවාස ප්‍රතික්ෂෙප, සමීප ප්‍රතික්ෂෙප යයි චෝදනා වස්තු සතරින් චෝදනා කරමින්. සුදුසු කාලයෙහි කියමි. අකාලයෙහි නොවේ. මෙහි චූදිතයාට කාලය කියන ලදී. චෝදකයාට නොවේ. අනුන්ට චෝදනා කරන්නා විසින් පිරිස් මැද උපෝෂථ පවාරණ අග, ආසන සාලාවේ භොජන සාලාවේ චෝදනා නොකළ යුතුය. භූතෙන - සත්‍යයෙන්, සවභාවයෙන්. සණ්හෙන - මෘදුබවින්. අත්ථසංහිතෙන -

දියුණුව කැමතිව. පධානියංගානි - පධාන- වීර්යයි. වීර්ය ඇත්තා පධානිය - ප්‍රධානිය භික්ෂුවගේ අංග. සද්ධො - සද්ධාවෙන් යුත්. එය ආගමන, අධිගමන, ඔකප්පන, පසාද යයි සිව්වැදෑරුම් බෝධිසත්වයන්ගේ සද්ධාව ආගමන සද්ධා වේ. අරිය සාවකයන් ගේ සද්ධා අධිගම සද්ධා වේ. අචල සද්ධා ඔකප්පන සද්ධා වේ.

ප්‍රසාදයට හේතුව සද්ධා පසාද සද්ධාවේ. මෙහි ඔකප්පන සද්ධා අහස් කරයි. බොධිං - චතුමග්ග ඤාණය, තථාගතයන් වහන්සේ එය ඉතා හොඳින් අවබෝධ කෙළේ යයි අදහයි. මෙය දේසනා සීසය. මේ අංගයෙන් වනාහි ත්‍රිවිධ රත්නයෙහි සද්ධා අදහස් කෙරේ. බුද්ධාදීන් කෙරෙහි යමෙකුගේ ප්‍රසාදය බලවත් වේද ඔහුගේ ප්‍රධාන වීර්ය ඉටුවේ. අප්පාබාධො - අරෝගය. අප්පාතංකො - නිදුක්. සමවෙපාකිනියා - සමවිපාක, ගහණියා - කම්මජ තේජො ධාතුවෙන්. නාතිසීතාය නාච්චුණ්හාය - අතිසිත ගන්නා සිතට බිය වේ. අති උනුසුම් ගන්නා උනුසුමට බිය වේ. ඔවුන්ගේ ප්‍රධානය වීර්ය ඉටුනොවේ. මධ්‍යම ග්‍රහකයාගේ ඉටුවේ. එයින් කීහ. මධ්‍යමයාගේ වීර්ය අක්ෂමාය පිණිස වේ. යථාභූතං අත්තානං ආවිකත්ත - ඇති සැටි තමාගේ අගුණ ප්‍රකාශ කරන ලදී. උදයත්ථගාමිනියා - උදාවීමද අස්ථංගමය ද යෑමට පිරිසිඳීමට සමර්ථ. පනස් පරිග්‍රහ ලකුණු උදයව්‍යය ඤාණය මෙයින් කියන ලදී. පිරිසිදුවූ. නිබ්බෙධිකාය - නොබිඳුණු පෙර ලෝභ ස්කන්ධ ආදිය විනිවිද යෑමට සමත්. සම්මා දුක්ඛක්ඛය ගාමිනියා - තදංග වශයෙන් ක්ලේශ ප්‍රහීන කළබැවින් යම් දුකක් ක්ෂයවීම සඳහා මෙසේ මේ සියළු පදවලින් විපස්සනා පඤ්ඤාවම කියන ලදී. දුප්පඤ්ඤයාට පධාන ඉටු නොවේ. සුද්ධාවාසා - සුද්ධා මෙහි විසූහ. වසති, වසන්නාහයයි සුද්ධාවාස වේ. සුද්ධා - කෙලෙස් මල රහිත. අනාගාමී ඛීණාසවයා. අවිහ ආදියෙහි කිවයුතු දේ මහාපදානයෙහි කියන ලදී. අනාගාමීන්ගේ ආයුෂ මැදදී නොඉක්මවා කෙලෙස් පිරිනිවී රහත්වනතුරු පැවතීම අන්තරා පරිනිබ්බායි - නම් වේ. මැද ගැටී ඉක්මවා පැමිණියේ උපහච්ච පරිනිබ්බානයි - නම් වේ. අසංඛාරයෙන් අප්‍රයෝගයෙන් ක්ලාන්ත නොවී සැපයෙන් පැමිණියේ අසංඛාර පරිනිබ්බායි - නම් වේ. සසංඛාරයෙන් ප්‍රයෝග සහිතව ක්ලාන්තව දුකින් පැමිණියේ සසංඛාර පරිනිබ්බායි - නම් වේ. මේ සතර පංච සුද්ධාවාසවල ලබති. උද්ධං සොතො අකනිට්ඨගාමී - මෙහි වනාහි චතුක්කයක් දත යුතුය. යමෙක් අවිහයෙහි පටන් සතර දෙව් (බඹ) ලෝ සොයා අකනිට්ඨාවට ගොස් පිරිනිවන් පායි. මෙතෙම උද්ධංසොත

අකනිට්ඨගාමී නම් වේ. යමෙක් අවිහයෙහි පටන් දෙවෙනි හෝ තෙවන හෝ සතරවන හෝ දෙව්ලොවට ගොස් පිරිනිවන් පායි. මෙතෙම උද්ධංසොතො නඅකනිට්ඨගාමී - නම්වේ. යමෙක් කාමභවයෙන් අකනිට්ඨයෙහි ඉපදී පිරිනිවන් පායි. මෙතෙම න උද්ධංසොත - අකනිට්ඨාගමි නම් වේ. යමෙක් යට දෙව්ලෝ සතරෙහි ඉපදී පිරිනිවන්පායි. මෙතෙම න උද්ධංසොත න අකනිට්ඨාගමි - නම් වේ.

චෙතොඛිල - සිතේ තද බව, සත්‍ථරි කංඛති - ශාස්තෲ ශරීරයෙහි හෝ ගුණයෙහි හෝ සැක කරයි. ශරීරය ගැන සැක කරන්නේ දෙතිස් උතුම් පුරිස් ලකුණ ඇතිදැයි නැතිදැයි සැක කරයි. ගුණය ගැන තෙකල් දන්නා සර්වඥ ඥාණය ගැන සැක කරයි. ආතප්පාය - විරිය කරනු පිණිස. අනුයොගාය - නැවත නැවත යෙදීම සඳහා. සාතච්චාය - නිතර කිරීම පිණිස. පධානාය - වීර්ය කිරීම සඳහා. අයං පඨමො චෙතොඛිලො - මේ ශාසතෲන් කෙරෙහි විචිකිච්ඡා සංඛ්‍යාත සිතේ පළමු තදබව.

ධම්මෙ - පරියත්ති පටිපත්ති පටිවෙධ ධර්මයෙහි. පර්යාප්ති ධර්මයෙහි සැක කරන්නා. ත්‍රිපිටක බුද්ධ වචනය - අසූහාර දහසක් ධර්ම සකන්ධයයි කියති. මෙය ඇත්දැයි නැත්දැයි සැක කරයි. ප්‍රතිවෙධ ධර්මයෙහි සැක කරන්නා විපස්සනාවෙන් මාර්ගයද මාර්ගයෙන් ඵලය ද ගලා එයි. සියළු සංසකාර අත්හැරීමෙන් නිවාන යයි කියති. එය ඇත්ද නැත්ද සැක කරයි. සංඝෙ කංඛති - උජුපටිපන්නො ආදි පද වශයෙන් මෙබඳු වූ ප්‍රතිපදාවට පිළිපන්නේ සතර මාර්ගයට පැමිණි සතර පලයට පැමිණි අෂ්ට පුද්ගලයින් ගෙන් යුක්ත වූ සංඝයා සිටී ද නැද්ද යයි සැකකරයි. සික්ඛාය කඞ්ඛමානො - අධිසීල සික්ඛා, අධි චිත්ත සික්ඛා අධිපඤ්ඤා සික්ඛා නමැයි කියති. ඒවා ඇත්ද නැද්දැයි සැක කරයි. අයං පඤ්චමො - මෙය සබ්‍රහමචාරීන් කෙරෙහි කෝප සංඛ්‍යාත පස්වැනි සිතේ තද බවයි. කසල බවයි, කණු බවයි. චෙතසො විනිබද්ධා - සිත බැඳ මිටක් මෙන් කොට ගනිති. කාමෙ - වසතු කෙලශ කාම. කායෙ - තමාගේ කයෙහි. රූපෙ - බාහිර රූපයෙහි. යාවදත්‍ථං - කැමතිවන පමණ. උදරාව දෙහකං - කුසපුරා. සෙය්‍යසුඛං - ඇඳ පුටු සුවය. ඵස්ස සුඛං - පෙරලී නිදන්නාට දකුණු පැත්ත වම් පැත්ත සැප වේ. මෙසේ උපන් සැපය. මිද්ධ සුඛං - නිදි සැප. අනුයුත්තො - යුක්ත ප්‍රයුක්ත වසයි. පණිධාය - පතා. බ්‍රහමචරියෙන මෛථුන විරහිත බ්‍රහමචර්යාවෙන්. දෙවො වා භවිස්සාමි - මහේසාක්‍ය දෙවියෙක් හෝ වෙමි.

දෙවඤ්ඤතරා වා - අල්පේසාක්‍ය දෙවියෙක් හෝ ඉන්ද්‍රියවල පළමු පසෙහි ලෞකිකම කියන ලදී. තුන්වන පසෙහි සමථ විපසසනා මගග වශයෙන් ලෞකික ලෝකෝත්තර කියන ලදි.

**නිසසාරණීයා** - අත්හළ. වෙන්කළ. **ධාතුයො** - ආත්ම ශූන්‍ය සවභාවය. **කාමං මනසිකරොතො** - කාමය මෙනෙහි කරන්නාට. අසුභ ධ්‍යානයෙන් නැගිට. බෙහෙතක් ගෙන විස පරීක්ෂා කරන්නාක් මෙන් විමසීම සඳහා කාම අභිමුඛයට සිත යවන්නාට යයි අර්ථය. **න පකඛඤ්දති** - නොපිවිසෙයි. **නපපසීදති** - ප්‍රසාදයට නොපැමිණේ. **න සනතිටඨති** නො පිහිටයි. **න විමුචචති** - නො මිදෙයි. කුකුල් පිහාටිටක් හෝ නහර වැදැල්ලක් ගින්නෙහි දැමූකල හැකිලේ ප්‍රසාරණය නොවේ. මෙසේ හැකිලේ. **නෙකඛමමං ඛොපන** - මෙහි නෙකඛමම නම් දස අසුභවල ප්‍රථම ධ්‍යානය, එය මෙනෙහි කරන්නාට සිත දුවයි. **තසස තං චිතතං** - ඔහුගේ ඒ අසුභ ධ්‍යාන සිත. **සුගතං** - ගෝචරයේ ගිය බැවින් හොඳින් ගිය. **සුභාවිතං** - අහානභාගී. නිසා (නොපිරිහුණු) හොඳින් භාවිත කළ. **සුඋටඨිතං** - කාමයෙන් මනාව නැගිටින ලද. **සුවිමුතතං** - කාමයන්ගෙන් මනාව මිදුණු. **විඝාත** - දුක්. **පරිළාහ** - කාම දැවිල්ල. **න සො තං වෙදනං වෙදියති** - හේ ඒ කාම වේදනාව වෙන්වන්නේ දැවිලි වේදනාව ද නොවිඳියි. **ඉදමකඛාතං කාමානං නිසසරණං** -. මේ අසුභ ධ්‍යානය කාමයන්ගෙන් ඉවත් වූ බැවින් කාමයන්ගේ නිස්සරණයයි කියන ලදී. යමෙක් වනාහි ඒ ධ්‍යානය පාදක කරගත සංස්කාරයන් සම්මර්ශනය කරන්නේ තුන්වන මාර්ගයට පැමිණ අනාගාමී පලයෙන් නිවන් දැක නැවත කාම නැතැයි දැනගනී. ඔහුගේ සිත අත්‍යනතයෙන් නිසසරණය, සෙසුපදවල ද මෙම නයමය.

දෙවන වාරයෙහි මෛත්‍රී ව්‍යාපාදයේ නිස්සරණ නම්. තෙවන වාරයෙහි කරුණා ධ්‍යාන විහිංසාවේ නිස්සරණ වේ. සතරවන වාරයෙහි අරූප ධ්‍යාන රූපවල නිස්සරණය. මෙහ අත්‍යනත නිසසරණය අරහත්ත පලයෙහි යෙදිය යුතුය. පස්වන වාරයෙහි **සකකායං මනසිකරොතො** - සුද්ධ සංඛාරය විමසා රහත් බවට පැමිණි ශුෂ්ක විදර්ශකයාගේ පලසමාපත්තියෙන් නැගිට විමසීම සඳහා පඤ්ච උපාදානස්කන්ධ අභිමුඛයට සිත යවන්නාට. **ඉදමකඛාතං සකකායසස නිසසරණයං** - මෙය රහත් මාර්ගයෙන් ද පලයෙන් ද නිවන් දැක සිටි භික්ෂුවට නැවත සකකාය නැතැයි උපන් අරහත්පල සමාපත්ති හිත සකකායෙ නිසසරණ

යයි කියන ලදී. **විමුත්තායතනානි** - මිදෙන කරුණු. **අත්ථපටිසංවෙදිනො** - පෙළ අර්ථය දන්නහුට. **ධම්මපටිසංවෙදිනො** - පෙළ දන්නාට **පාමොජ්ජං** - තරුණ ප්‍රීතිය. **පීති** - සතුටු ආකාර බලවත් ප්‍රීතිය. **කායො** - නාම කය.

සංසිඳෙයි. **සුඛං වෙදෙති** - සැප ලබයි. **චිත්තං සමාධියති** - රහත්පල සමාධියෙන් සමාධි වෙයි. මෙතෙම ඒ ධර්මය අසන්නේ ආ ගිය තැන්වල ධ්‍යාන විදර්ශන මාර්ගඵල දනියි. මෙසේ දන්නා වූ ඔහුට ප්‍රීතිය උපදී. හේ ඒ ප්‍රීතියේ පසු බැසීමට නොදෙන්නේ උපචාර කම්මට්ඨානිකයෙක්ව විපස්සනා වඩා රහත් බවට පැමිණේ. ඒ සඳහා කියන ලදී. චිත්තං සමාධිපති සෙස්සෙහිද මෙම නයම වේ.

මේ විශේෂයකි. **සමාධි නිමිත්තං** - අටතිස් අරමුණුවල එක්තරා සමාධියක් සමාධි නිමිත්ත වේ. **සුග්ගහිතං හොති** - යනාදියෙහි ආචාර්යවරයා සමීපයෙහි කමටහන් ඉගෙන ගන්නා විසින් මනාව ගන්නා ලද්දේ වේ. **සුධාරිතං** - මනාව දරන ලදී. **සුප්පටිවිද්ධං** - **පඤ්ඤාය** - ප්‍රඥාවෙන් මනාව ප්‍රත්‍යක්ෂ කරන ලදී. **තස්මිං ධම්මෙ** - ඒ කමටහන් පෙළ දහමෙහි. **විමුත්තිපරිපාචනීය** - විමුත්ති අරහත් යයි කියනු ලැබේ. එය මේරීම. **අනිච්ච සඤ්ඤා** - අනිච්චානුපස්සනා ඤාණයෙහි උපන් සංඥාව. **අනිච්චෙ දුක්ඛ සඤ්ඤා** - දුක්ඛානුපස්සනා ඤාණයෙහි උපන් සංඥාව. **දුක්ඛෙ අනත්ත සඤ්ඤා** - අනත්තානුපස්සනා ඤාණයෙහි උපන් සංඥාව **විරාග සඤ්ඤා** - විරාගානුපස්සනා ඤාණයෙහි උපන් සංඥාව. "ඇවැත්නි ඉමෙ ඛො" ආදි කී නයින්ම යෙදිය යුතුය. විසිහයේ පංචක වශයෙන් එකසිය තිහක් ප්‍රශ්න කියන්නේ සාමග්ගි රසය දක්වූහ.

**පංචක නිමි.**

මෙසේ පංචක වශයෙන් සාමග්ගි රසය දක්වා දූන් ඡක්ක වශයෙන් දක්වීමට නැවත දේශනාව ආරම්භ කළහ. එහි **අජ්ඣත්තිකානි** - අජ්ඣත්ත තමා. **අජ්ඣත්තිකානි** - තමාට අයත්වන **බාහිරානි** - ඒ අධ්‍යාත්මයෙන් බාහිර වූ. විස්තර වශයෙන් වනාහි විසුද්ධි මග්ගයෙහි ආයතන කථාවල කියන ලදී. **විඤ්ඤාණ කාය** - විඤ්ඤාණ සමූහය. **චක්ඛු විඤ්ඤාණං** -

චක්‍ඛු ප්‍රසාදය නිශ්‍රිත කුසල අකුසල විපාක විඤ්ඤාණය. සියළු තැන මෙම නයයි. **චක්‍ඛුසම්ඵස්ස** - චක්‍ඛු සන්නිස්සිත ඵස්ස. සොත සම්ඵස්සාදිය ද මෙසේය. **මනො සම්ඵස්සා** - මේ සම්ඵස්ස දහය හැර සෙසු සියල්ලට මනෝ සම්ඵස්ස නම් වේ. වෙදනා ඡක්කයෙහි ද මේ නයින්ම දත යුතුය.

**රූපසඤ්ඤා** - රූපය අරමුණුකර උපන් සංඥාව. මේ උපායෙන් සෙස්ස ද දත යුතුය. චෙතනා ඡක්කය ද මෙම නයයි. එසේම තණ්හා ඡක්කයෙහි. **අගාරවො** - ගෞරව නැතිව. **අප්පතිස්සා** - මෙහි වනාහි යම් භික්ෂුවක් ශාස්තෲන් ධර්මාන කාලයෙහි තුන් කාලයෙහි ම උපස්ථානයට නොයයි. බුදුහිමි වහන් නැතිව සක්මන් කරන විට වහන් ඇතිව සක්මන් කරයි. පහත් මළුවෙහි සක්මන් කරන කල්හි උඩමලුවෙහි සක්මන් කරයි. පහත වසන විට උඩ වසයි. දකින ස්ථානයේ උභයාංශ කරයි. කුඩ දරයි. වහන් දරයි. ස්නානය කරයි. මල මූ කරයි. පිරිනිවන් පෑ කල්හි චෛතිය පෙනෙන තැන බුදුන් දකින තැන කී සියල්ලම කරයි. මෙය ශාස්තෲන්ට අගෞරවය නම් වේ. යමෙක් ධර්ම ඝොෂා කළ කල්හි සකසා නොයයි. සකසා නො අසයි. කථා කරමින් හිඳියි. සකසා නොගනී. නොකියයි. මෙය ධර්ම අගෞරවයයි. යම් භික්ෂුවක් ස්ථවිර භික්ෂුව විසින් නො අනු දන්නා ලද දහම් දෙසයි. හිඳගනියි. ප්‍රශ්න කියයි. වැඩිමහල් භික්ෂූන් හා ගැටෙමින් යයි.. සිටියි. හිඳියි. සිවුරෙන් පලලත්ථිකා කරයි. සඟමැද උභයාංශ කරයි. සත් වහන් (කුඩ සෙරෙප්පු) දරයි. මෙය සංඝ අගෞරවයකි. ත්‍රිවිධ ශික්ෂා නොපිරීම ශික්ෂා අගෞරවය වේ. අප්‍රමාදය නොවැඩීම අප්‍රමාදයෙහි අගෞරවයයි. ද්විධ පටිසන්ථාරය නොකිරීම පටිසන්ථාර අගෞරවයයි. සොමනස්සුපවිචාර, සොම්නස් යුත් විචාරයයි. **සොමනස්සට්ඨානීයං** - සොම්නසට හේතු වූ. **උපවිචරති** - සිතින් සිතා විචාරයෙන් තීරණය කරයි. **දිට්ඨිසාමඤ්ඤගතො** - මේ පදයෙන් වනාහි කොසම්බක සූත්‍රයෙහි පළමු මාර්ගය කියන ලදී. මෙහි මාර්ග සතරම. **විවාද මූලානි** - විවාදයට මුල් වූ. **කොධනො** - කිපෙන ලක්ෂණයේ ක්‍රෝධයෙන් යුක්ත වූ **උපනාහී** - වෛරය අත්නොහැරිය ලක්ෂණ උපනාහයෙන් යුක්ත වූ. **අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං** - භික්ෂූන් දෙනමකගේ විවාද කථා දෙව්මිනිසුන්ගේ අහිත පිණිස දුක් පිණිස පවතී. කොසම්බක්ඛන්ධකයෙහි මෙන් භික්ෂූන් දෙනමක් විවාදයට පැමිණි කල්හි ඒ විහාරයෙහි ඔවුන්ගේ අතවැසියෝ විවාද කරත්. ඔවුන්ගේ අවවාද ගන්නා භික්ෂුණීහු වාද කරති. එයින් ඔවුන්ගේ උපස්ථායකයෝ විවාද කරති. ඉක්බිති මිනිසුන්ගේ

ආරක්ෂ දේවතාවෝ කොටස් දෙකක් වෙති. එහි ධම්මවාදීන්ගේ ආරක්ෂක දෙවියන්ගේ මිත්‍ර භූමි දෙවියෝ බෙදෙති. මෙසේ පරම්පරාවෙන් ආර්යභූමිය හැර බ්‍රහ්මලෝකය දක්වා බෙදෙති. අධම්මවාදීහු බොහෝ වෙති. ඉක්බිති බොහෝ දෙනා විසින් ගන්නා ලද එය සත්‍ය (තච්ජනති) යයි ධර්මය අත්හැර අධර්මය ගනිති. ඔව්හු අධර්මය පෙරටුව හැසිරෙන්නෝ අපායවල උපදිති. මෙසේ භික්ෂූන් දෙනමගේ විවාදය දෙව්මිනිසුනට අහිත පිණිස දුක් පිණිස පවතී.

**අජ්ඣත්තං** වා - ඔබගේ අභ්‍යන්තර පිරිසේ. **බහිද්ධා** - පර පිරිසේ. **මක්ඛී** - අනුන්ගේ ගුණ මකන ලක්ෂණයෙන් මැකීමෙන් යුක්ත වූ. **පලාසී** - යුගග්ගාහ (එකට එක කීරීම) ලක්ෂණයෙන් යුත් පලාසයෙන්. **ඉස්සුකී** - පර සත්කාර ආදි නොඉවසන ලක්ෂණයෙන් යුත්. **මච්ඡරී** - ආවාස මසුරුකම් ආදී. **සඨො** - කයිරාටික. **මායාවී** - කරන ලද පාපය සඟවන. **පාපිච්ඡො** - දුස්සීල. **මිච්ඡාදිට්ඨී** - නාස්තිවාදී, අහේතුවාදී, අකිරියවාදී, **සන්දිට්ඨිපරාමාසි** - තමන් දුටුදේම ස්පර්ශ කරයි. **ආධාන ගාහී** - දෘඩගාහී. **දුප්පටිනිස්සග්ගී** - ගත් දේ අත්හළ නොහැකි. **පඨවිධාතු** - පිහිටි ධාතු. **ආපොධාතු** - බඳින ධාතු. **තෙජොධාතු** - පැසෙන ධාතු **වායොධාතු** - පුම්බවන ධාතු. **ආකාස ධාතු** - අස්පර්ශ ධාතු. **විඤ්ඤාණ ධාතු** - දැනගන්නා ධාතු. **නිස්සාරණීය ධාතුයො** - අත්හළ ධාතු. **පරියාදාය තිට්ඨති** - මැඩ නසා සිටියි. **මාහෙවන්තස්ස වචනීයො** - යම් හෙයකින් නොවූ දෙයක් ප්‍රකාශ කෙරේ නම් එසේ නොකිව යුතුයයි කිව යුතුය. **යදිදං මෙත්තා චෙතො විමුත්ති** - මෙය මෙත්තා චේතොවිමුත්තියයි. ව්‍යාපාදයේ මෙය නිස්සරණයයි. යමෙක් තෙවන සිව්වන ධ්‍යානවලින් නැගිට සංස්කාරයන් සම්මර්ෂණය කොට තුන්වන මාර්ගයට පැමිණ යළි ව්‍යාපාදය නැතැයි තුන්වන ඵලයෙන් නිවන් දකී. ව්‍යාපාදයේ අත්‍යන්ත නිස්සරණය.

**අනිමිත්තා චෙතො විමුත්ති** - රහත්ඵල සමාපත්ති. එය රාග නිමිත්ත ආදියේද රූප නිමිත්ත ආදියේද නිත්‍ය නිමිත්ත ආදියේද අභාවයෙන් අනිමිත්ත යයි කියනු ලැබේ. **නිමිත්තානුසාරී** - කියන ලද ප්‍රභේද ඇති නිමිති සිහි කෙරේ යනු නිමිත්තානුසාරී වේ. **අස්මි** - අස්මි මානය. **අයමහමස්මි** - පංචස්කන්ධයෙහි අයං අහං නම් මම වෙමි. මෙපමණකින් අර්හත්වය විස්තර කරන ලදී. **විචිකිච්ඡා කථං කථා සල්ලාපං** - විචිකිච්ඡා වූ කථා කථා සල්ලාප. **මාහෙවන්තස්ස වචනීයො** - ඉදින්

ඔබට පළමු මග වැරදුන හොත් විචිකිච්ඡා උපදී. අරහත්ත විවරණ මිථ්‍යා වෙයි. එහෙයින් අභූත නොකියවයි වැලැක්විය යුතුය. **අසම්මාන - සමුඝඝාතො** - අරහතත මග. රහත් මාර්ග පල වශයෙන් නිවන් දුටු විට යළි අසම්මාන නැති නිසා අරහතත මගග අසම්මාන සමුඝඝාත යයි කියන ලදී. **අනුත්තරියානි** - අනුත්තරානි, ඡෙට්ඨකානි. දර්ශනයෙහි අනුත්තර දස්සනානුත්තරියං වේ. සෙසු පදවල ද මෙම නයමයි. එහි හස්ථි රතන ඇත් රුවන් ආදිය දස්සනානුත්තරිය නොවේ. බුදුරදුන්ගේ හෝ බික් සඟනගේ කසින අසුභ නිමිති ආදි යම් දසුනක් දස්සනානුත්තරිය වේ. ක්ෂත්‍රියාදීන්ගේ ගුණ කථා ඇසීම සවණානුත්තරිය නොවේ. රතනත්‍රයේ ගුණ කථා ඇසීම ත්‍රිපිටක බුද්ධ වචනය හෝ ඇසීම සවණානුත්තරිය වේ. මැණික් රුවන් ආදි ලාභ ලාභානුත්තරිය නොවේ. සප්තවිධ ආර්ය ධනලාභ ලාභානුත්තරිය නම් වේ. ඇත් ශිල්පාදි ශික්ෂණ සික්ඛානුත්තරිය නොවේ. ශික්ෂා තුන පරිපූරණය කිරීම සික්ඛානුත්තරිය වේ. ක්ෂත්‍රියාදීන්ගේ පාරිචර්යාව පාරිචරියානුත්තරිය නොවේ. රතනත්‍රයේ පාරිචරියාව පාරිචරියානුත්තරිය වේ. ක්ෂත්‍රිය ආදීන්ගේ ගුණ සිහි කිරීම අනුස්සුතානුත්තරිය නොවේ. රතනත්‍රයේ ගුණ සිහි කිරීම 'අනුස්සුතානුත්තරිය නම් වේ.

අනුස්සතියම අනුස්සතිට්ඨාන නම් වේ. **බුද්ධානුස්සති** - බුදුගුණ සිහි කිරීමය. මෙසේ අනුස්සරන්නාට ප්‍රීති උපදී. හේ ඒ ප්‍රීතිය ඛය වශයෙන් ව්‍යය වශයෙන් පිහිටුවා රහත් බවට පැමිණේ. මෙය උපචාර කමටහන් නමි. ගිහියෝ ද ලබති. සියළු තැන මෙම නයයි. විස්තර විසුද්ධි මගගයෙන් බලන්න.

**සතත විහාරා** - ඛීණාසවයාගේ නිත්‍ය විහාරය. **චක්ඛුනා රූපං දිස්වා** - ඇස් දොරට පැමිණි ඒ රූපය ඇස් විනැණින් (විඥඥාණයෙන්) බලා. ජවන කෙණෙහි ඉටුවේ නො ඇලෙන්න සුමන නොවේ. අනිටුවෙහි දුසනය නොවන්නා දුමන නොවේ. අසම බැලීමෙන් මෝහය නො උපදවා මැදහත්ව වසයි. මැදහත්ව සිහියෙන් යුත්ත වූයේ **සතො** - වේ. සමීප ජානනයෙන් (දැනීමෙන්) යුත් නිසා **සම්පජාන** - වේ. සෙසු පදවල ද මෙම නයයි. මෙසේ සදොරෙහි මැදහත්ව **උපෙක්ඛකො විහරති** - වසයි. ''සම්පජාන'' යන වචනයෙන් ඥාණ සම්පයුතත සිත් සතර ලබයි. ''සතත විහාරා'' වචනවලින් අටමහා සිත් ලබයි. ''අරජ්ජනෙතා අදුසනෙතා'' වචනවලින් අටමහා සිත් ලබයි. සොම්නස කෙසේ ලැබේද? සේවනය කිරීමෙන් ලැබේ. **අභිජාතියො** - ජාති, **කණ්හාභිජාතිකො**

සමානො - කණ්හ නම් පහත් කුලයෙහි ඉපිද කණ්හං ධම්මං අභිජායති - කලක දස දුසිල් දම් රැස්කරයි. හේ එය උපදවා නිරයෙහි උපදියි. සුක්කං ධම්මං - මම පෙර පින් නොකළ නිසා පහත් කුලයෙහි උපන්මි. දැන් පින් කරන්නෙමියි පින් නම් වූ සුදු දම් උපදවයි. හේ එයින් සගෙහි උපදී. අකණ්හං අසුක්කං නිබ්බාණං - කණ්හ වන්නේ නම් කණ්හ විපාක දේ සුක්ක වන්නේ නම් සුක්ක විපාක. දෙකම නොදීමෙන් අකණ්හං අසුක්කං කියන ලදී. නිවන ද නම් වූ මේ අර්ථයෙහි රහත් බව අදහස් කරයි. එය කෙලෙස් නිබ්බාණ අන්තයේ ඇති වූ බැවින් නිබ්බාණ නමි. එය මොහු උපදවයි. රැස්කරයි. කරයි. සුක්කාභිජාතිකො සමානො - උසස් කුලයක ඉපිද සෙස්ස කී නයින් දත යුතුය. නිබ්බෙධභාගියා - නිබ්බෙධ යනු නිවණ යයි කියනු ලැබේ. එය භජනය කරයි. වෙතට යයි. නිබ්බෙධභාගිය වේ. අනිච්ච සඤ්ඤාදිය පංචකයෙහි කියන ලදී. නිරොධ අනුපස්සනා ඥාණයෙ සංඥා - නිරොධ සඤ්ඤා නම් වේ. ඇවැත්නි මෙය ආදිය කී නයින් යෙදිය යුතුය. මෙසේ ඡක්ක විසි දෙකක් වශයෙන් එකසිය දෙකක් ප්‍රශ්න කථා කරන තෙරුන් වහන්සේ සාමග්ගි රසය දැක්වූහ.

ඡක්කං නිමි.

ඡක්ක වශයෙන් සාමග්ගිරසය දක්වා දැන් සත්තක වශයෙන් දැක්වීමට නැවත දේශනාව ආරම්භ කළහ. එහි සම්පත් ප්‍රතිලාභ අර්ථයෙන් සද්ධාවම ධනය සද්ධාධනං වේ. මෙහි පඤ්ඤා ධනය සියල්ලටම සෙට වේ. පඤ්ඤායෙහි සිට තුන් සුචරිත පන්සිල් දසසිල් පුරා සගැ උපදිත්. ශ්‍රාවක පාරමී ඥාණ පසේ බුදු නැණ, සර්වඥතා ඥාණ ද ප්‍රතිවේධ කරත්. මේ සම්පත් ප්‍රතිලාභ කිරීමෙන් ප්‍රඥාව ධනයයි කියන ලදී. චේතනා සතම ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. බොජ්ඣඞ්ග කථා කියන ලදී.

සමාධිපරික්ඛාර - සමාධි පිරිවර. සම්මා දිට්ඨි ආදිය කියන ලදී. මේ සත්පිරිවර ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. අසත් ධර්මය අශාන්ත ධර්මය හෝ ලාමක ධර්මය හෝ අසද්ධම්මා - වේ. සද්ධර්මයට වෙනස් වශයෙන් දත යුතුය. මෙහි සෙස්ස කියන ලද අර්ථ ඇත්තේ වේ. සද්ධර්මයෙහි සද්ධා ආදි සියල්ල විපස්සකයෙහි කියන ලදී.

ඒවායෙහි ද පඤ්ඤා ලෞකික ලෝකෝත්තතරයි. මෙය විශේෂයකි. සත් පුරුෂයන් ගේ ධර්ම සප්පුරිස ධම්මා. එහි සුත්ත ගෙය්‍යාදි ධම් දනීනුයි. ධම්මඤ්ඤූ වේ. ඒ ඒවායෙහි කියන ලද දනීනුයි. අත්ථඤ්ඤූ වේ. මෙපමණෙහි සීලයෙන් සමාධියෙන් පැතේ යයි මෙසේ තමා දනී යයි අත්තඤ්ඤූ වේ. පිළිගන්නා පරිභෝගවල ප්‍රමාණය දනී යයි මත්තඤ්ඤූවේ. මෙම කාලය උදෙසීමට මෙම කාලය පිළිවිසීමට මෙම කාලය භාවනාවට මෙම කාලය අධිගමයට මෙසේ කාලය දනීනුයි කාලඤ්ඤූ වේ. එහිද වසර පහක් උදෙසන කාලයයි. දස වසරක් පිළිවිසින කාලයයි. මෙය අති සම්බාධය. දස වසක් වනාහි උදෙසන කාලයයි. විස්සක් පිළිවිසින කාලයයි. ඉන් පසු භාවනා කර්ම කළ යුතුය. අෂ්ටවිධ පිරිස දනී යයි. පරිසඤ්ඤූ වේ. සෙවිය යුතු සේවිත පුද්ගලයන් දනී යනු පුග්ගලඤ්ඤූ වේ. නිද්දස වත්ථූනි - නිර්දිස වස්තු නිද්දෙස භික්ෂූන් නිබ්බීස නිත්තිංස නිච්චත්තාලිස නිපඤ්ඤාස භික්ඛු යයි මෙසේ වචන කරුණු. මේ ප්‍රශ්නය තීර්ථක සමයෙහි ඇතිවිය. තීර්ථකයෝ දසවස් කාලයෙහි මළ නිගණ්ඨයකු නිද්දස යයි කියති. හේ වනාහි නැවත දස වර්ෂයක් නැත. දස වර්ෂයක් පමණක් නොව නව වර්ෂයක් ද නැත.........එක වර්ෂයක් ද නොවේ. මේ නයින් ම විසිවස් කාලයෙහි මළ නිබ්බීසො, නිත්තිංසො, නිච්චත්තාලීසො. නිපඤ්ඤාසො යයි කියති. ආයුෂ්මත් ආනන්ද හිමි ගමේ හැසිරෙන්නේ ඒ කථාව අසා විහාරයට ගොස් භාග්‍යවතුන් වහන්සේට දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ කීහ: ආනන්ද මෙය තීර්ථකයින් හේ අධිවචනයක් නොවේ. මාගේ සාසනයෙහි ක්ෂීණාශ්‍රයන්ට මෙය අධිවචනයකි. ක්ෂීණාශ්‍රවයා දසවස් කාලයෙහි පිරිනිවන් පෑවේ නැවත දස වර්ෂයක් නොවේ. දස වර්ෂයක් පමණක් නොවේ. නව වර්ෂයකුදු නොවේ.... එක් වර්ෂයකුදු නොවේ. එකොළොස් වසකුදු.....එකමාසයකුදු එක් දෙදවසක් ද එක් මොහොතකුදු නොවේ. කුමක් හෙයින්ද? නැවත පිළිසිඳීමක් නොමැති හෙයිනි. නිබ්බීසාදියෙහි ද මෙම නයමයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මාගේ සාසනයෙහි ඛීණාසවයන්ට අධිවචනයෙකැයි වදාරා යම් කරුණකින් ඒ නිද්දෙසය වේද එය දැක්වීමට සත් නිද්දස වත්ථු දෙසූහ.

සථවිරයන් වහන්සේද ඒ දේශනාවම උපුටා සත් නිද්දස වස්තු දක්වන්නේ ඇවැත්නි, මෙහි භික්ෂුව, "සික්ඛා සමාදානෙති" යනාදිය කීහ. එහි ඉධ - මේ සාසනයෙහි. ආයතිං සික්ඛා සමාදානෙ අධිගත පෙමො - අනාගතයෙහි නැවත දිනවලද ශික්ෂා පූරණයෙහි වෙනස්

නොවූ ප්‍රේමයෙන් ම යුක්ත වූයේ වේ. ධම්මනිසන්තියා - ධර්ම නිසාමතාවෙන් - මෙය විපස්සනාවට සමාන වචනයකි. ඉච්ඡාවිනයෙ - තෘෂ්ණා විනයයෙන්. පටිසල්ලාණෙ - ඒකීය භාවයෙහි. විරියාරම්භෙ - කායික චෛතසික වීර්ය පූරණයෙහි. සතිනෙපක්කෙ - සිහියෙහි ද දක්ෂභාවයෙහි ද, දිට්ඨිපටිවෙධෙ - මාර්ග දර්ශනයෙහි, සෙසු සියළු තැන කියන ලද නයින්ම දත යුතුය.

සංඥාවල, අසුභ අනුපස්සනා ඥාණයෙහි සංඥාව අසුභ සඤ්ඤා - වේ. සෙස්ස යට කියන ලදී. බල සත්තකය. විඤ්ඤාණ ඨිති සත්තකය පුද්ගල සත්තකය කියන ලද නය අනුව වේ. අප්‍රහීන අර්ථයෙන්, අත් නොහැර පවතී යනු - අනුසයා - වේ. බලවත් වූ කාමරාගයම කාමරාගානුසයො - වේ. සියළුතැන මේ නයම වේ. සංයෝජන සත්තකය කියන ලද අර්ථ ඇත්තේ වේ. අධිකරණ සමථවල අධිකරණ (නඩු, ආරවුල්) සමනය වෙයි. ව්‍යපසමනය වෙයි යන අධිකරණ සමථා - වේ. උප්පන්නුප්පන්නානං - උපන්නා වූ, උපන්නා වූ. අධිකරණානං - විවාදාධිකරණා අනුවාධිකරණා, අපාත්ති අධිකරණ, කිච්ච අධිකරණ මේ සතර. සමථාය වූපසමාය - සමථය සඳහා ද වූපසමය සඳහා ද සම්මුඛා විනයො දාතබ්බො.....තිණවත්ථාරකො - මේ සමථ සත දිය යුතුය. එහි විනිශ්චය නය මෙසේය. අධිකරණවල පළමුව ධර්ම යයි හෝ අධර්මයයි හෝ අටළොස් වස්තුවල විවාද කරන භික්ෂූන්ගේ යම් විවාදයක් මෙය විවාදාධිකරණ යයි. සීල විපත්තියෙන් හෝ ආචාර දෘෂ්ටි ආජීව විපත්තියෙන් අනුව කියන්නා වූ යම් අනුවාදයක් කීම චෝදනාවද මෙය අනුවාදාධිකරණයයි. මාතිකායෙහි ආ පංචවිභංග ද සත් ඇවැත් කඳුද මෙය ආපත්ති අධිකරණයයි. සංඝයාගේ අප ලෝකනාදි සතර කර්මයන්ගේ කිරීම මෙය කිච්චාධිකරණයයි. එහි විවාදාධිකරණය සමථ දෙකකින් සංසිඳේ. සම්මුඛා විනයෙන් ද යෙභුය්‍යසිකාවෙන් ද. සම්මුඛාවිනයෙන්ම සමනය කරන්නේ යම් විහාරයක ඇති වූ අධිකරණය ඒ විහාරයෙහි හෝ වෙන විහාරයක හෝ සමනය කිරීමට යන්නේ අතරමග හෝ යම් තැනකට ගොස් සංඝයාට පමණුවා එය එහි සංඝයා විසින් හෝ සංඝයාව සමථයකට පැමිණවීමට නොහැකි වනවිට එහිම සම්මත පුද්ගලයන්ගෙන් කොමිෂන් සභාවක් පත්කර හෝ විනිශ්චය සම්මතය. මෙසේ සමනය වීමෙන් ද එහි යම් සංඝ සම්මුඛතා ධම්ම සම්මුඛතා විනය සම්මුඛතා පුද්ගල සම්මුඛතා යන මෙය සම්මුඛා විනය නම් වේ. එහි ද කාරක සංඝයාට සංඝ සාමග්ගි වශයෙන් සම්මුඛ බව

සංඝසම්මුඛතා වේ. සමථයට පත්කළ යුතු වස්තුවෙහි තථ්‍යබව ධම්ම සම්මුඛතා වේ. සමනය කළයුතු ආකාරයටම සමනය වීම විනය සම්මුඛතා වේ. වාද කරන්නා ද කරනු ලබන්නාද දෙපාර්ශවයම (අත්ත පච්චත්ථික) හමුවීම පුග්ගල සම්මුඛතා වේ. මෙහි කාරක සභාවෙන් (උබ්බාහිකා) සමනය වීමෙහි සංඝ සම්මුඛතා පාවිච්චි කෙරේ. මෙසේ සම්මුඛා විනයෙන්ම සමනය වේ. මෙසේත් සමනය නොවුනේ නම් ඉක්බිති උබ්බාහිකාවට පත් වූ භික්ෂූහු සමථයට පැමිණවීමට අපට නොහැකි වුනෙමු යයි සංඝයාටම පවරා දෙති. ඉක්බිති සංඝයා අංග පසකින් යුත් සලාකගාහාපක (සලාක-ඉරටු වැනි ලකුණක් ගන්වන) භික්ෂුවක් සම්මත කොට උන්වහන්සේ ලවා රහස් විවෘත කණලඟ කියන (සකණ්ණ ජප්පක) ක්‍රමවලින් එකකින් සලාක ගන්වා රැස් වූ පිරිසේ ධර්මවාදීන් වැඩිවන්නේ නම් ධර්මවාදීහු කියති. මෙසේ සංසිඳුණු අධිකරණය සම්මුඛ විනයෙන් ද යෙභුය්‍යසිකායෙන් ද සංසිඳුනේ වේ. එහි සම්මුඛා විනය කියන ලද නය වේ. යමක් සඳහා යෙභුය්‍යසිකා කර්මය කිරීම මෙය යෙභුය්‍යසිකා නම් වේ.

විවාදාධිකරණය මෙසේ සමථ දෙකකින් සමනය කරයි, අනුවාදාධිකරණය සමථ හතරකින් සමනය කරයි. සම්මුඛ විනය, සති විනය, අමූළ්හ විනය, තස්සපාපිය්‍යසිකාය, සම්මුඛා විනයෙන් සමථයට පත් කරන විට යමෙක් අනුව කියයිද යමෙකුට කියයිද ඔවුන් වචනවල ඇහුන්කන්දී කිසිවෙකුගේ ඇවැත් නොමැති නම් දෙපාර්ශවය ක්ෂමා කරවා, ඇවැත් ඇත්නම් මෙහි ඇවැත මේ යයි මෙසේ විනිශ්චයෙන් සමනය කෙරේ. එහි සම්මුඛා විනය ලක්ෂණ කියන ලද්දේමය. ඛීණාසවයන් වහන්සේ නමකට අමූලික සීල විපත්තියෙන් චෝදිත කල්හි උන්වහන්සේට ඉල්ලනු ලබන සති විනය සංඝයා ඤත්ති චතුත්ථ කර්මයෙන් සති විනය දෙති. එකල සම්මුඛා විනයෙන් ද සති විනයෙන් ද සමනය වූයේ වේ. සති විනය දුන් පසු ඒ පුද්ගලයා කෙරෙහි කිසිවෙක් නැවත එය මතු නො කරයි. උමතු භික්ෂුවක් උමතුවෙන් අස්සමණක ආචාරයෙහි හැසිරෙන්නේ මෙබඳු ඇවතකට අවත් යයි භික්ෂූන් චෝදනා කරනු ලබන්නේ, ආයුෂ්මත්නි මා විසින් මෙසේ කරන ලද්දේ උමතුවෙනි. මම එය සිහි නොකරමියි කියන්නේ ද භික්ෂූන් විසින් චෝදනා කරනු ලබන්නේද නැවත චෝදනා නොකිරීම සඳහා අමූළ්හ විනය ඉල්ලයි. සංඝයා ඔහුට ඤත්ති චතුත්ථ කර්මයෙන් අමූළ්හ විනය දෙයි. එකල්හි සම්මුඛා විනයෙන් ද අමූළ්හ විනයෙන්ද උපසමනය කෙළේ වේ. අමූළ්හ විනය දුන් කල්හි ඒ පුද්ගලයා කෙරෙහි ඒ හේතුවෙන් නැවත එය මතු නොකරයි. යම් විට

පාරාජිකාවෙන් හෝ පාරජිකාවට සමාන දේකින් හෝ චෝදනා කරනු ලබන්නාට අනිකකින් අනිකක් වෙන්වූයේ පව උස්සන්න වූ පාපි පුද්ගලයාව නොසිඳන ලද මුල් ඇතිවන්නේය. මනාව පැවතී නැවත ඇතුළුවීම ලබන්නේය. ඉදින් සිදුණු මුල් ඇත්තේ නම් ඔහුගේ නාසනය මෙසේ වන්නේයයි සිතමින් සංඝයා ඤත්ති චතුත්ථ කර්මයෙන් තසස පාපීය්‍යසිකං කරති. එවිට සම්මුඛා විනයෙන්ද තසස පාපීය්‍යසිකාවෙන් ද උපසමනය වේ. මෙසේ අනුවාදාධිකරණය සමථ සතරකින් සංසිඳවයි. ආපත්තාධිකරණ සම්මුඛා විනය පටිඤ්ඤාත කරණය තිනවත්ථාරකය යන සමථ තුනෙන් සංසිඳවයි. යම් විට එක් භික්ෂුවක් සමීපයෙහි හෝ සංඝ මධ්‍යයෙහි හෝ භික්ෂුව වහා ඇවැත් දෙසාද එවිට ආපත්තාධිකරණය සම්මුඛා විනයෙන්ද පටිඤ්ඤාත කරණයෙන් ද සංසිඳුවයි. එහි පළමුව සම්මුඛා විනය යමෙක් දෙසයි, යමෙකුට දෙසයි. ඔවුන්ගේ සම්මුඛී භාවය පුද්ගල සම්මුඛතා වේ. සෙස්ස කියන ලද නයින්මය. පුද්ගලයාට ද ගණයාට ද දේශනා කාලයෙහි සංඝ සම්මුඛතා පිරිහෙයි. සවාමිනි ඉදිරි සංවරය වන්නේය. එය පටිඤ්ඤාත කරණය නම් වේ. සංඝාදිසෙසයෙහි පරිවාස ආදිය යාචනය පටිඤ්ඤාත පරිවාස ආදිය දීම පටිඤ්ඤාත කරණ නම් වේ. දෙපක්‍ෂයට බෙදුණු කලහකාර භික්ෂු බොහෝ අශ්‍රාමණකව හැසිර නැවත ලජ්ජිධර්මය ඇති වූ විට ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුන් කරන්නෙමු වන්නේ නම් ඒ අධිකරණය කර්කෂ බවට පත්වන්නේ යයි ඔවුනොවුන් ආපත්තිකරණයෙහි දොස් දක තිණවත්ථාරක කර්මය කරයි. එවිට ආපත්තාදිකරණය, සම්මුඛා විනයෙන් ද තිණවත්ථාරකයෙන් ද සංසිඳවයි. එහි අත්පසයට පැමිණ සියල්ල හැර මහත් වැරදිද ගිහි පටිසංයුක්තකය ද සියළු ආපත්තිවලින් නැගී සිටිති. මෙසේ ආපත්තාධිකරණය සමථ තුනකින් සංසිඳුවයි. කිච්චාධිකරණය එක් සමථයකින් සංසිඳුවයි. සම්මුඛා විනයෙන්. මේ අධිකරණ සතර මේ සමථ සතෙන් සුදුසු පරිදි සංසිඳුවති. එයින් කියන ලදී. **උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛා විනයො දාතබ්බො.... තිණවත්ථාරකො** - මෙය මෙහි විනිශ්චය වේ. විස්තර වනාහි සමථක්ඛන්ධකයෙහි ආයේය. මෙහි විනිශ්චය සමන්තපාසාදිකාවෙහි කියන ලදී. ''ඉමෙ ඛො ආවුසො'' කියන ලද නයින් යෙදිය යුතුය. තුදුස් සත්තකයන් ගේ වශයෙන් ප්‍රශ්න අනූ අටක් දේශනා කරන්නේ ස්ථවිරයන් වහන්සේ සාමග්‍රී රසය දක්වූහ.

**සත්තක නිමි.**

මෙසේ සත්තක වශයෙන් සාමග්‍රී රසය දක්වා දූන් අට්ඨක වශයෙන් දක්වීමට නැවත දේශනාව ආරමභ කළහ. එහි **මිච්ඡත්තා** - අයථා හෝ මිථ්‍යා ස්වභාවය, **සම්මත්තා** - යථා හෝ සම්මා සවභාවය. **කුසීත වත්ථූනි** - කුසීතයාගේ අලසයා ගේ වසතු. පිහිටි කුසීත කරුණු යන අර්ථය වේ. **කම්මං කත්තබ්බං හොති** - විවෘත විචාර ආදි ක්‍රියා කළයුතු වේ. **න විරියං ආරභති** - දෙවරක් ද විරිය නො අරඹයි. **අප්පත්තස්ස** - ධ්‍යාන විපස්සනා මාර්ගඵල ධර්මවලට නොපැමිණිය. **අනධිගතස්ස** - එහිම අනධිගමයට අධිගමවීම සඳහා **අසච්ඡිකතස්ස** - එහි අප්‍රත්‍යක්‍ෂයට ප්‍රත්‍යක්‍ෂවීම සඳහා **ඉදං පඨමං** - මෙය මම නිදාගනිම් යි මෙසේ පසු බසින්නාගේ පළමු කුසීත වසතුව. මෙම නයින් සියළු තැන අර්ථ දත යුතුය. **මාසාචිතං මඤ්ඤෙ** - මෙහි වනාහි මාසාචිතං යනු තෙත් මාසයයි. සීත මාසය ගරු වේ. මෙසේ ගරුක යයි අදහස් කරයි. **ගිලානො වුට්ඨිතො හොති** - ලෙඩ වී පසුව සුව වේ. **ආරම්භ වත්ථූනි** - විරිය කරුණු. ඒවාද මේ නයින්ම අර්ථ දත යුතුය. **දාන වත්ථූනි** - දාන කරුණු. **ආසජ්ජ දානං දෙති** - කියා දානය දෙයි. ආ අය දක ඔහු මොහොතක් හිඳුවා සත්කාර කොට දානය දෙයි. දෙන්නෙම් දෙන්නෙම් යි ක්ලාන්ත නොවේ. මෙසේ මෙහි ආසාදනය දාන කරුණු වේ. භයින් දන් දෙයි යන තන්හි භය ආදිය දාන කරුණු යයි දත යුතුය. එහි භය නම් මේ තෙමේ නොදෙන්නෙකැයි දුරු කෙරේ යයි ගරහා බියෙන් හෝ අපාය භයෙන් හෝ අදාසි මෙ - පෙර මොහු මට මෙනම් දෙයක් දුන්නේ යයි දෙයි. **දස්සති මෙ** - අනාගතයෙහි මෙ නම් දේ දෙන්නේ යයි දෙයි. **සාහුදානං** - දානය නම් යහපත්ය සුන්දරය බුද්ධාදි පණ්ඩිතයන් විසින් ප්‍රශස්ථයයි දෙයි. **චිත්තාලංකාරං චිත්තපරික්ඛාරං දානං දෙති** - සිත මුදු කරයි. ලැබූ තැනැත්තා ද ලදිම් යි මෘදු සිත් වේ. දෙන තැනැත්තාද දෙන ලදැයි මෘදු සිත වේ. මෙසේ දෙදෙනාගේ ම සිත් මෘදු කරයි. එහෙයින්ම "අදන්ත දමනං දානං" කියනු ලැබේ කීහ.

නොදමුණු දමනයට - දානය සැමට සාදක
දානෙන් පියබසින් - නැමේ ඉහළට පහළට

මේ දාන අටෙන් චිත්තාලංකාර දානයම උතුම් වේ. **දානුප්පත්තියො** - දාන ප්‍රත්‍යයෙන් උපත. **දහති** - තබයි. **අධිට්ඨාති** - එහිම සමාන වචන නයති. **භාවෙති** - වඩයි. **හීනෙ විමුත්තං** - හීනවූ පංචකාම ගුණයන්ගෙන් මිදුණු. **උත්තරිං අභාවිතං** - එයින් ඉහළ මාර්ග

ඵල සඳහා අභාවිත වූ. **සංවත්තති** - යමක් පතා කුසල් කොට ඒ ඒ තැන ඉපදීම සඳහා පවතී. **වීතරාගස්ස** - මාර්ගයෙන් හෝ සමුච්ඡින්න රාගයේ එහි උපදීම සඳහා සමාපත්තියෙන් විෂ්කම්භනය කළ රාගය දානයෙන් පමණක් බ්‍රහ්ම ලෝකයේ ඉපදීමට නොහැකි වේ. දානය වනාහි සමාධි විපස්සනා සිතට අලංකාර පරිවාර වේ. එයින් දානයෙන් මෘදු සිත් බ්‍රහ්ම විහාර වඩා බඹලොව උපදී. එයින් කියන ලදී. ''විරාගියාට නොව සරාගියාට'' ඛත්තියානං පරිසා **ඛත්තිය පරිසා** - වේ. සමූහ යන අර්ථයයි. සියළු තැන මෙම නයයි. ලෝකයේ ධර්මය **ලොකධම්මා** - මෙයින් මිදුනෙක් නැත. බුදුවරයෝ නම් වෙත්මය. මෙය කියන ලදී. ''මහණෙනි, මේ ලෝකධර්ම අටකි. ලෝකය අනුව වෙනස් වේ. අෂ්ට ලෝක ධර්ම අනුව වෙනස් වේ. **ලොභො අලොභො** - ලාභය පැමිණි කල්හි අලාභය ආවේ යයි දත යුතුය. යස ආදියෙහි ද මෙම නයයි, අභිභායතන විමොඛ කථා යටකියන ලදි. ''ඉමෙ ඛො ආවුසො'' යයි මුලින් කී පරිදි යෙදිය යුතුය. මෙසේ එකොළොස් අෂ්ටකයන් ගේ වශයෙන් අසූ අටක් ප්‍රශ්න කියමින් ස්ථවිරයන් වහන්සේ සාමග්ගි රසය දක්වූහ.

### අට්ඨක නිමි.

මෙසේ අෂ්ට වශයෙන් සාමග්ගි රසය දක්වා දූන් නවක වශයෙන් දක්වීමට නැවත දේශනාව ඇරඹූහ. එහි **ආඝාතවත්ථූනි** - ආඝාත කරුණු. **බන්ධති** - කෝපය උපදවයි. **තං කුතෙත්ථ ලබ්භා** - එය අනර්ථ වරණයක් නොවීය. මේ පුද්ගලයන් කොයින් ලබාද? කුමන කරුණකින් ලැබීමට හැකිද? අන්‍යයා නම් අන්‍යයාට තමාගේ හිතේ කැමැත්තෙන් අනර්ථයක් කෙරේ යයි මෙසේ සිතා ආඝාතය දුරුකරයි. නොහොත් ඉදින් මා ප්‍රතිකෝපය කළහොත් ඒ කෝප කරුණ මෙහි පුද්ගලයෝ කොයින් ලබත්ද කුමන කරුණකින් ලබත් ද යන අර්ථයයි. ''කුතොලාභා'' යනු ද පාඨය. ඉදින් මම කෝප කරන්නෙම් නම් මට ඒ කෝප කරුණු කොයින් ලැබේද? මේ අර්ථයෙහි ද තං යනු නිපාතයකි. **සත්තාවාසා** - සත්වයන්ගේ විසීම. වසන ස්ථානය යන අර්ථයි. එහි සුද්ධාවාස ද සත්වාවාස වේ. අසර්වකාලිකයෝ වනාහි නොගත්හ. සුද්ධාවාස බුදුවරයන්ට කඳවුරු තැන් හා සමානය. කල්ප අසංඛ්‍ය ගණන් බුදුවරුන් පහළ නොවූ කාලයේ ඒ තැන් ශූන්‍යව පවතී. මෙසේ අසර්වකාලික බව

නොගන්නා ලදී. **අක්ඛණයත්හි ධම්මො ච දෙසයති** - චතුසත්‍ය ධර්මය දේශනා කරනු ලැබේ. **ඕපසමිකො** - කෙලෙස් උපසම කෙරේ. **පරිනිබ්බාණිකො** - කෙලෙස් පිරිනිවුමෙන් පිරිනිවුම ගෙන ඒ. **සම්බොධගාමී** - සිවුමග නුවණ පිළිවිදියි. **අඤ්ඤතරං** - අසංඥභවය. අරූපභවය හෝ **අනුපුබ්බ විහාරා** - අනුපිළිවෙළින් සමවැදිය යුතු විහරණ. **අනුපුබ්බ නිරොධා** - අනුපිළිවෙළින් මෙසේ නවක සයක් වශයෙන් ප්‍රශ්න පනස් හතරක් කථා කරන්නේ සථවිරයන් වහන්සේ සාමගගි රසය දැක්වූහ.

නවක නිමි.

මෙසේ නවක වශයෙන් සාමග්ගි රසය දක්වා දැන් දසක වශයෙන් දැක්වීමට නැවත දේශනාව ආරම්භ කළහ. එහි **නාථකරණ** - ''සනාථා භික්ඛවෙ විහරථ'' මහණෙනි සනාථව වසන්න. ''මා අනාථා'' දස ඉමෙ භික්ඛවෙ ධම්මා නාථ කරණා'' අනාථව නොවසන්න. මහණෙනි, නාථ කරණ ධර්ම දහයකි. තමාට ප්‍රතිෂ්ඨාකර ධර්ම මෙසේ කියන ලදී. කල්‍යාණ මිත්තො යනාදියෙහි සිල් ගුණ සම්පන්න කල්‍යාණයන් ඔහුගේ මිත්‍රයෝ යයි **කල්‍යාණ මිත්තො** වේ. සිටින හිඳින තැන්වල සහ මාර්ගයෙන් සහාය වේ යයි. **කල්‍යාණ සහායො** - වේ. සිතෙන්ද කයින්ද කල්‍යාණ මිත්‍රයන් අතරම නැමුනේ **කල්‍යාණ සම්පවංකො** - වේ. **සුබ්බචො හොති** - සැපයෙන් කිව යුතුවේ. සැපයෙන් අනුසාසනා කළයුතුය. **ඛමො** - දැඩිකොට එරුෂ වශයෙන් කර්කෂ ලෙස කියනු ලබන්නේ ඉවසයි. නොකිපේ. **පදක්ඛිණග්ගාහී අනුසාසනී** - යම්සේ ඇතමෙක් අවවාද දෙනු ලබන්නේ වම්පසින් ගණී හෝ පතුරවයි හෝ නො ඇසුණා හෝ යයි, මෙසේ නොකරන්න. සවාමීණි අවවාද දෙන්න. අනුසාසනා කරන්න. ඔබ වහන්සේ අවවාද නොදෙන කල්හි අන් කවරෙක් අවවාද දෙන්නේදැයි පුදක්ෂිණාව ගනියි. **උච්චාවචානි** - උස් ද පහත් ද. **කිංකරණීයානි** - කුමක් කරම්දැයි මෙසේ කියා කළයුතු කර්ම. එහි උස් කර්ම නම්. සිවුරු කිරිම රඳන් කිරීම, සෑයේ සුධාකර්ම (සුදු කිරීම) පොහොය ගෙය සෑ ගෙය බෝ ගෙය කළයුතු මේ ආදිය. උච්ච කර්ම නම් වේ. පා දෝවන මකබනාදි කුඩ කර්ම වේ. **තත්‍රූපායයා** - එහි ගමනයෙන්. **අලංකාතල** - කිරීමට සමත් වේ. **අලංසංවිධාතුං** - විචාරීමට සමත්, ධර්මයට කැමති සෙනෙහෙ ඇති - **ධම්ම කාමො** වේ. ත්‍රිපිටක බුද්ධ වචනයට ප්‍රිය වේ යන අර්ථයයි. **පියසමුදාහාරො** - අනුන් කියන

විට සකසා අසයි. තමා ද අනුන්ට දෙසනු කැමැත්තේ වේ. අභිධම්මෙ අභිවිනයෙ - මෙහි ධම්මො අභිධම්මො විනයො අභිවිනයො යයි සතරක් දත යුතුය. එහි ධම්ම සූත්‍රාන්ත පිටකයයි. අභිධම්ම සත්තප්පකරණ, විනයො උභතො විභංගය, අභිවිනය, ඛන්ධක පරිවාර. එසේ නැතහොත් සුත්ත අභිධම්ම පිටක ධම්ම වේ. මගඵල අභිධම්ම. සියළු විනය පිටකය විනය. කෙලෙස් සමනය කාරණා අභිවිනය වේ. මෙසේ සියල්ලෙහි ද මෙහි ධර්මයෙහි අභිධර්මයෙහි විනයෙහි අභිවිනයෙහිද. උළාරපාමුජ්ජො - බහුල ප්‍රීතිය වේ. කසිණ දසකයෙහි සියළු යන අර්ථයෙන් කසිණ වේ. ඒ අරමුණේ ධර්මයන්ගේ ක්ෂේත්‍ර අර්ථයෙන් හෝ ආයතන අර්ථයෙන් හෝ උද්ධං - උපරි අහස්තලය අභිමුඛව හෙට්ඨා - යට භූමිතලය අභිමුඛව තිරියං - ක්ෂේත්‍ර මණ්ඩයක් මෙන් හාත්පස පිරිසිඳ. ඇතමෙක් ඉහළටම කසිණය වඩති. ඇතමෙක් යටට. ඇතමෙක් හාත්පසට. ඒ ඒ කරුණින් මෙසේ ප්‍රසාරණය කරයි. ආලෝකය මෙන් රූපදර්ශන කැමැත්තේ. එයින් කියන ලදී: ''පඨවි කසිණය කෙනෙක් ඉහළ යට හරහා දන ගනිති'' අද්වයං'' මෙය වනාහි කෙනෙකුගේ අන්‍යභාවයට නොපැමිණීම සඳහා කියන ලදී. යම් සේ ජලයට පිවිසියෙකුට හාත්පස වෙනකක් නොවී ජලයම වේ. එසේ පඨවි කසිණය පඨවිකරණයම වේ. එහි වෙනින් කසිණ සම්භේදයක් නැත. සියළු තැන මෙසේය. අප්‍රමාණය මෙය එහි අප්‍රමාණ පැතිරවීම් වශයෙන් කියන ලදී. ඒ චේතනාව සියල්ලෙහි ම පැතිරේ. මෙතෙම ආදි ප්‍රමාණයක් නොගනී. මෙහි විඤ්ඤාණ කසිණය කසිණ ඉගුලු අහසෙහි කසින ඉගුලු අහස වශයෙන් එහි පවතින විඤ්ඤාණයෙහි ඉහළ පහළ හරහ දත යුතුය. මෙය සංක්ෂේපයෙනි. කර්මස්ථාන භාවනා නයෙනි මේ පඨවි කසිණාදිය විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලදී.

කම්මපථවල - සුගති දුගතිවල කර්මයම මාර්ගය වන බැවින් කම්ම පථ නම් වේ. ඒවා අතරෙන් ප්‍රාණඝාත අදත්තාදාන මුසාවාදා සතර බ්‍රහ්මජාලයෙහි විසතර කරන ලද්දේය. කාමෙසුමිච්ඡාචාරා මෙහි වනාහි කාමෙසු - මෛථුන හැසිරීමෙහි. මෛථුන වසතුවල හෝ මිච්ඡාචාරො - යමකින් කාය ද්වාරයෙහි පවත්වන නොයා යුතු තැන ඉක්මවන චෙතනා කාමෙසු මිච්ඡාචාරො - එහි නොයා යුතු තැන් නම් පළමුව පිරිමින්ගේ මව රකින, පියා රකින මව්පිය රකින සොයුරා රකින සොයුරිය රකින නෑයන් රකින වංශය රකින ධර්මය රකින ආරක්ෂා සහිත දඬුවම් සහිත වේ. මාතු රක්ඛිතා ද දහය ධනය ගන්නා ලද

කැමැත්තෙන් වෙසෙත්නී. භෝගයෙන් වසන්නී වසත්‍ර වාසිනී. ජල පාත්‍රය සාක්ෂි කොට පාවාදුන් තැනැත්තිය. වසත්‍රවලින් පාවාගත් දාසි වසයෙන් පාවාදුන්, කම්කරු බිරිය, පැහැරගත් තැනත්තිය නැකතට පාවාගත්. මේ ධනක්කීතා දි දහය ද විසි සත්‍රීන් අතරෙන් සාරක්‍ඛ සපරිදණ්ඩා සහ ධනක්කීතාදි දස යන දොලොස් සත්‍රීන් වෙත අන්‍ය පුරුෂයන් නොයා යුතු තැන් නම් වේ. එසේ යෑම මිච්ඡාචාර, සීලාදි ගුණ රහිත නොයා යුතු තැන අලප සාවද්‍ය වේ. සීලාදි ගුණ සමපනනයන් කෙරෙහි මහා සාවද්‍ය වේ. නොයා යුතු වසතු කෙරෙහි කරුණු සතරකි. අගමනීය වසතු එහි සෙවන සිත, සේවන ප්‍රයෝග මාර්ගයෙන් මාර්ග ප්‍රතිපත්ති ඉවසීම, එක් ප්‍රයෝගයක් සාහත්‍ථිකය. ලෝභ කෙරේ යනු අභිජඣා - වේ. අනුන්ගේ භාණ්ඩ අභිමුඛයෙහි සිට ඊට සිතින් නැමීයෑම යන අර්ථයයි. අහෝ මෙය මට වේවයි මෙසේ පර භාණ්ඩ ලෝභ කරණ ලක්‍ෂණය. අදත්තාදානය මෙන් අලප සාවද්‍යයද මහා සාවද්‍යයද වේ. එහි සමභාර දෙකකි. පරභාණ්ඩවීම, තමාට පිරිනමා ගැනීම. පරභාණ්ඩ කෙරෙහි ලෝභය ඉපදීමෙන් කර්ම පථ නොවේ. අහෝ මෙය මට වේවයි තමාට පිරිනොනමාද එතෙක් කර්ම පථ නොවේ. ව්‍යාපදායත් ව්‍යාපාදො - හේ පරවිනාශය, මනස දූෂණය කරණ ලක්‍ෂණය වේ. එරුසා වාචා මෙන් අලප සාවද්‍ය මහාසාවද්‍ය වේ. එහි සමභාර දෙකකි. පර සත්‍වයෙක් වීම හා එය විනාශ කිරීමේ අත. පර සන්තක වස්තුවෙහි ක්‍රෝධය උපන්නේද කර්ම පථය නොවේ. අහෝ ඒකාන්තයෙන් ඝාතනය කරන්නේය විනාශ කරන්නේ යයි ඔහුගේ විනාශය නොසිතන්නේ නම් කර්මපථ නොවේ. යථාභූත තත්‍වය නොගැනීමෙන් වැරදි ලෙස දකින්නේ මිච්ඡා දිට්ඨී - වේ. එය ''නත්‍ථී දින්නං'' ආදි නයින් විපරීත දැකීම ලක්‍ෂණ වේ. සමපප්‍රලාප මෙන් අලප සාවද්‍ය මහා සාවද්‍ය වේ. තවද අනියතය අල්ප සාවද්‍යය. නියතය මහා සාවද්‍ය වේ. එහි ද සම්භාර දෙකකි. වසතුව ද ගන්නා ලද විපරීතභාවයද මේ දස අකුසල කමම පථ ධර්ම වශයෙන් කොටස් වශයෙන් අරමුණු වශයෙන් වෙදනා වශයෙන් මූල වශයෙන් දැයි පස් ආකාරයකින් විනිශ්චය දත යුතුය. එහි ධමම වශයෙන් මේවායෙහි පිළිවෙළින් සත් චේතනා ධමම වේ. අභිධ්‍යාදි චේතනා තුනෙන් සමප්‍රයුක්තය, කොට්ඨාශ වශයෙන් පිළිවෙළින් මිථ්‍යාදෘෂ්ටි සත යයි මේ අෂට ධර්ම කමමපථ වේ. මූලානි නොවේ. අභිධ්‍යා ව්‍යාපාද කමමපථ ද මූල ද වේ. අභිධ්‍යා මූලයට පැමිණ ලෝභය අකුසල මූලයක් වේ. ව්‍යාපාදය දෝසය අකුසලමූල වේ. අරමුණු වශයෙන් ප්‍රාණඝාතය ජීවිතේන්ද්‍රිය අරමුණු වශයෙන් සංඛාර අරමුණු වේ. අදත්තාදානය සත්ත

අරමුණු හෝ සංඛාර අරමුණු හෝ වේ. මිථ්‍යාචාරය ස්පර්ශ වශයෙන් සංඛාර අරමුණුය. කෙනෙක් සත්තාරම්මණද කියති. මුසාවාදය සතුන් අරමුණු හෝ සංඛාර අරමුණු වේ. පිසුණු වචනයද එසේය. පරුෂ වචනය සතුන් අරමුණු වේ. සම්පප්‍රලාප දිට්ඨ සුත මුත වශයෙන් සතුන් අරමුණ හෝ සංඛාර අරමුණු හෝ වේ. අභිධ්‍යාවද එසේය. ව්‍යාපාදය සතුන් අරමුණු වේ. මිථ්‍යා දෘෂ්ටී ත්‍රෛභූමික ධර්ම වශයෙන් සංඛාර අරමුණු වේ. වෙදනා වශයෙන් ප්‍රාණඝාත දුක් වේදනා. අදත්තාදානය තුන් වේදනාය. මිථ්‍යාචාරය සැප මධ්‍යස්ත වශයෙන් ද්විධය. මුසාවාදය ත්‍රිවිධය. පිසුණාවාචා ද එසේය. පරුෂා දුක්ය. ප්‍රලාප තුන්වේදනාය. අභිධ්‍යා සුඛ මජ්ඣත්ත වශයෙන් ද්විවිධය. මිථ්‍යා දෘෂ්ටියද එසේය. ව්‍යාපාදය දුක් වේදනාය. මූල වශයෙන් ප්‍රාණඝාතය දෝස මෝහ වශයෙන් දෙමුල් වේ. අදත්තාදානය ලෝභ මෝහ වශයෙන් හෝ දෝස මෝහ වශයෙන් දෙමූල් වේ. මිථ්‍යාචාරය ලෝභ මෝහ වශයෙන් දෙමුල් වේ. මුසාවාදය දෝස මෝහ වශයෙන් හෝ ලෝභ මෝහ වශයෙන් හෝ වේ. පිසුණා වාචා ද එසේය. පරුෂා වාචා දෝස මෝහ වශයෙන් වේ. අභිද්‍යා මෝහ වශයෙන් එක්මූලයකි. ව්‍යාපාදය ද එසේය. මිථ්‍යාදෘෂ්ටි ලෝභ මෝහ වශයෙන් දෙමූලයකි.

පාණාතිපාතා වෙරමණී ආදිය සමාදාන සම්පත්ත සමුච්ඡෙද විරති වශයෙන් දත යුතුය. ධර්ම වශයෙන් මේවායෙහි ද පිළිවෙළින් චේතනා සත ද වටී. විරති ද කෙළවර චේතනා තුන සමග යුක්තය. කොටස් වශයෙන් පිළිවෙළින් සත්ත කම්ම පථ ද මූල නොමැතිව. අන්තයෙහි කම්මපථ ද මූලද වේ. අනභිධ්‍යාවෙහි කම්මපථයට පැමිණ අලෝභය කුසල මූලයකි. අව්‍යාපාද අදොස කුසල මූල වේ. සම්මාදිට්ඨිය අමොහ කුසල මූලයකි. ආරම්මණ වශයෙන් ප්‍රාණඝාතාදීන්ගේ අරමුණුම මේවායේ ද අරමුණු වේ. ව්‍යාතික්‍රමණ විය යුත්තෙහි ''වේරමණි'' වැලකේ. යම් සේ නිවන් අරමුණු ආර්ය මාර්ගය කෙලෙස් දුරු කරයි. මෙසේ ජීවිතින්‍ද්‍රියාදි අරමුණු ද මේ කර්ම පථ ප්‍රාණඝාත දුස්සීල්‍යාදිය දුරු කෙරේ යයි දත යුතුය. වේදනා වශයෙන් සියල්ල සැප වේදනා හෝ මධ්‍යස්ථ වේදනා හෝ වේ. කුසලට පැමිණ දුක් වේදනා නම් නැත. මූල වශයෙන් පිළිවෙළින් සත් ඤාණයෙන් යුක්තව වෙන්වන්නාට අලෝභ අදෝස අමෝහ වශයෙන් තුන් මූලයක් වේ. ඤාණ විප්‍රයුක්ත චිත්තයෙන් වෙන්වන්නාට මූල දෙකක් වේ. අනභිධ්‍යාව ඤාණ සම්පයුත්ත සිතින් වෙන්වන්නාට දෙමූලකි. ඤාණ විප්‍රයුක්ත සිතින් එක් මූලකි. අලෝභය

වනාහි තමා විසින ම තමාගේ මුල් නොවේ. අව්‍යාපාදයෙහි ද මෙම නයයි. සම්මාදිට්ඨි අලෝභ අදෝස වශයෙන් දෙමූලයකි.

අරියවාස වේ. **පඤ්චංග විප්පහීණො** - අංග පහකින් විප්‍රයුක්ත වූ ඛීණාසවයන් වහන්සේ විසුහ. වසති, වසන්නාහ එහෙයින් මෙය අංග පහකින් හීන වූ ආර්යාගේ වාසය නිසා අරියවාසයයි කියනු ලැබේ. හැමතැන මෙම නයයි. **එවං ඛො ආවුසො භික්ඛු ඡළඞ්ග සමන්නාගතො හොති** - අංග හය අපේක්ෂාවෙන් යුක්ත වේ. අංග හය අපේක්ෂාව කුමක්ද? ඤාණාදිය ඤාණය කීකල්හි ක්‍රියාවෙන් ඤාණ සම්ප්‍රයුක්ත සතරක් ලැබේ. නිතර වාසය කෙරේ යයි කී කල්හි අටමහා සිතක් ලබයි. ඇලීම් ගැටීම් නැතැයි කී කල්හි සිත් දහයක් ලැබේ. සොම්නස් ආ සේවන වශයෙන් ලබයි. **සතාරක්ඛෙන චෙතසා** - ඛීණාශ්‍රවයාගේ දිවාරාත්‍රියෙහි සියළු කාලයේ සිහිය ආරක්ෂා කෘත්‍යය සිදු කරයි. එහෙයින් සරන්නේද සිටින්නේ ද නිදන්නේ ද නිදිවරන්නේද නිතර නුවණ පෙනීම/ඤාණ දස්සනං) එළඹ සිටියේ යයි කියනු ලැබේ. **පුථු සමණ බ්‍රාහමණානං** - බොහෝ මහණ බමුණන්. මෙහිද **සමණා** - පැවිදි වූ. **බ්‍රාහමණා** - භෝවාදීහු. **පුථු පච්චෙක සච්චානි** - බොහෝ වෙන් වූ සත්‍ය. මේ දර්ශනය සත්‍යය මේ දර්ශනය සත්‍ය යයි වෙනම ගන්නා ලදී. බොහෝ සත්‍ය යන අර්ථයයි. **නුන්නානි** - ගෙනෙන ලද **පනුණ්ණානි** - මනාව ගෙනෙන ලද. **චත්තානි** - අත්හරින ලද. **පනුණ්ණානි** - වමනය කරන ලද. **මුත්තානි** - බැඳුම් සිඳින ලදී. **පහිණානි** - දුරු කරන ලදී. **පටිනිස්සට්ඨානි** - නැවත සිත නොනැගීම පටි නිස්සජ්ජිත වේ. **සමවයසට්ඨෙසනො** - මෙහි "අවයා" අඩු නැති. "සට්ඨා" හැර දැමූ. සම්මා අවයා සට්ඨා එසිනා මොහුට වේ යනු සමවයසට්ඨෙසනා වේ. මනාව අත්හළ සියළු සෙවීම්. යන අර්ථයයි. **රාගචිත්තං විමුත්තං** - ආදියෙන් මාර්ගයේ කෘත්‍ය නිෂ්පත්තිය කියන ලදී. "රාගො මෙ පහීණා" මගේ රාගය ප්‍රහීණය ආදියෙන් ප්‍රත්‍යවේක්ෂණාවේ පලය කියන ලදී.

අසේඛා සම්මාදිට්ඨි ආදි සියල්ල ද පල සම්පයුක්ත ධර්ම වේ. මෙහි ද සම්මාදිට්ඨි සම්මා ඤාණ යන දෙතැනම ප්‍රඥාව කියන ලදී. සම්මා විමුත්ති යන පදයෙන් කියන ලද අවසේස පලසමාපත්ති ධම්ම සංගෘහිත යයි දත යුතුය, "ඉමෙ ඛො ආවුසො" යනාදි කියන ලද නයින්ම යෙදිය යුතුය. දසක හයක් වශයෙන් ප්‍රශ්න හැටක් කථා කරමින් ස්ථවිරයන් වහන්සේ සාමග්ගි රසය දක්වූහ.

**දසක නිමි.**

මෙහි සිට ප්‍රශ්න සමෝධානය කළයුතුය. මේ සූත්‍රයෙහි එකක වශයෙන් ප්‍රශ්න දෙකක් කියන ලදී. දුක වශයෙන් සැත්තෑවකි. තික වශයෙන් එකසිය අසූවකි. චතුක්ක වශයෙන් දෙසීයකි. පඤ්චක වශයෙන් එකසිය තිහකි. ඡක්ක වශයෙන් එකසිය තිස්දෙකක සත්තක වශයෙන් අනූ අටකි. අට්ඨක වශයෙන් අසූ අටකි. නවක වශයෙන් පනස් හතරකි. දසක වශයෙන් සම සැටකි. මෙසේ එක්දහස් තුදුසක් ප්‍රශ්න කියන ලදී. මේ සූත්‍රාන්තය හැර බොහෝ ප්‍රශ්නවලින් යුත් වෙනත් සූත්‍රාන්තයක් ත්‍රිපිටක බුද්ධ වචනයෙහි නැත. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රාන්තය මුල පටන් සියල්ල අසා සිතුහ. ''ධම්මසේනාපති සැරියුත් බුදධ බලය දක්වා නොපැවැත්විය හැකි සිංහනාදය නාදකරයි'' ශ්‍රාවක භාසිත යයි කීකල විශ්වාස නොවේ. ජින භාසිත යයි කීකල විශ්වාස වේ. එහෙයින් එය ජින භාසිත කොට මේ සූත්‍රාන්තය කෙරෙහි දෙවිමිනිසුන් ගේ විශ්වාසය උපදවමියි. එයින් නැගිට සාධුකාර දුන්නේය. එයින් කියන ලදී. ''සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත භික්ඛූනං සංගීතිපරියායං අභාසි'' සැරියුත, සාධු. සැරියුත, ඔබ භික්ෂූන්ට සංගීති පරියාය දේශනා කළා ඉතා මැනව. සංගීති පරියායං - සමගියට කරුණු. මෙය කියන ලදී: ''සැරියුත, ඔබ මාගේ සබ්බඤ්ඤුත ඤාණයෙන් සසඳා භික්ෂූන්ට සාමග්ගි කරුණු දේශනා කළා ඉතා මැනව''. සමනුඤ්ඤො සත්ථා අහොසි - අනුමෝදනාවෙන් සමනුඤ්ඤ විය. මෙපමණකින් මේ සූත්‍රාන්තය ජිනභාසිත නම් විය. දේශනාව අවසානයෙහි මේ සූත්‍රය මෙනෙහි කරන්නේ ඒ භික්ෂූහු රහත් බවට පැමිණියහ.

**සංගීති සූත්‍ර වර්ණනාව නිමි.**

# 3-34

## දසුත්තර සූත්‍රාන්ත වර්ණනාව

දසුත්තර සූත්‍රය මවිසින් මෙසේ අසන ලදී. එහි මේ පෙර අවර්ණිත පද වර්ණනාවයි. ආවුසො භික්ඛවෙ - මෙය ශ්‍රාවකයින්ගේ ආලපනයයි. බුදුවරු වනාහි පිරිස අමතන්නේ ''භික්ඛවෙ'' යයි කියති. සාවකයෝ ශාස්තෲන් වහන්සේ උස්තැන තබමු යයි ශාස්තෲ

ආලපනයෙන් නො අමතා ''ආවුසො'' යයි අමතති. තෙ භික්ඛු - ධම්මසේනාපති පිරිවරා හිඳි ඒ භික්ෂූහු. ඒ භික්ෂූහු කවරහුද? අනිබද්ධ වාසයෙන් දිසා ගමනෙහි යෙදුණු භික්ෂූහු. බුද්ධ කාලයෙහි භික්ෂූහු වාර දෙකක් රැස්වෙති. වස් එළඹෙන සමීප කාලයෙහි දහයක් ද විස්සක් ද තිහක් ද හතලිහක් ද පනහක්ද වශයෙන් සමූහ සමූහව කමටහන් ගැනීම සඳහා පැමිණෙති, භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේලා සමග සාමීචියේ යෙදී මහණෙනි, කවර ස්ථානයක් සමීපයේ වස් වෙසෙන්නේහුදැයි විමසති. ඉක්බිති උන්වහන්සේලා කමටහන් පිණිස පැමිණියෙමු. අපට කමටහන් දෙනුමැනවැයි අයදිති. ශාස්තෲන් වහන්සේ උන්වහන්සේලාගේ චරිත වශයෙන් රාග චරිතයාට අසුභ කමටහන දෙති. දෝස චරිතයාට මෙත්තා කමටහන මෝහ චරිතයාට උදෙසීම ප්‍රශ්න ඇසීම සුදුසු කාලයෙහි දහම් ඇසීම, සාකච්ඡා මෙය ඔබට සප්පාය යයි කියති. විතක්ක චරිතයාට ආනාපාන සති කමටහන දෙති. සද්ධා චරිතයාට ප්‍රසාදනීය සූත්‍රාන්තයකින් බුදුරදුන්ගේ සුබෝධිය, ධර්මයේ සුධර්මතාව, සංඝ සුප්‍රතිපත්ති ද ප්‍රකාශ කරති. ඤාණ චරිතයාට අනිත්‍යාදි ප්‍රතිසංයුක්ත ගැඹුරු සූත්‍රාන්තයක් කියති. උන්වහන්සේලා කමටහන් ගෙන සප්පාය වේ නම් එහිම වෙසෙති. නොවේ නම් සප්පයා සේනාසනයක් විමසා වඩිති. උන්වහන්සේලා එහි වසන්නෝ තුන් මාසයෙහි පිළිවෙතක් ගෙන වීර්ය අත්ත කොට උත්සාහ කරන්නෝ සෝවාන්වත් වෙති. සකදාගාමී ද අනාගාමී ද රහත් ද වෙති. එයින් විසූ වස් ඇත්තේ වස් පවරා සත්‍යු සන්තිකයට පැමිණ භාග්‍යවතුන් වහන්ස මම ඔබවහන්සේගෙන් කමටහන් ගෙන සෝවාන් පලයට පැමිණියෙමි. මම අග්‍රපල රහත්වීමියි. ලද ගුණ දන්වති. මෙසේ වස් එළඹීමට පැමිණි භික්ෂූන් ඇවිත් යනවිට භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් අග්‍රශ්‍රාවකයන් වෙත යවති. යම්සේ කීහ: ''මහණෙනි, සැරියුත් මුගලන් බලන්න.'' ඒ භික්ෂූහු අගසව්වන්ගේ දැකීම සඳහා පිටත් කරති, ''මහණෙනි, සැරියුත් මුගලන් සේවනය කරන්න භජනය කරන්න. මහණෙනි, සැරියුත් මුගලන් පණ්ඩිතයහ. භික්ෂූන් අනුග්‍රාහකයහ, මහණෙනි, සබ්‍රහමචාරීන්ට සැරියුත් යම්සේ මව මෙනි, මුගලන් පෝෂණය කරන පියා මෙනි. මහණෙනි, සැරියුත් සෝවාන් පලයෙහි හික්මවයි. මුගලන් උතුම් අර්ථයෙහි (රහත් ඵලයෙහි) හික්මවයි. එකලද භගවත්හු මේ භික්ෂූන් සමග පිළිසඳර කතා කොට ඒ භික්ෂූන්ගේ ආසයන් (නිදා ඇති කෙලෙස්) පරීක්ෂා කොට මේ භික්ෂූන් සාවකයන් හික්මවිය යුතු යයි දක්කහ. සාවකයන් හික්මවිය යුත්තෝ බුදුවරුන් හික්මවිය යුත්තෝ ශ්‍රාවකයන්ට හික්මවිය නොහැක. සාවක වෙනෙය්‍ය බව දැන කවර භික්ෂුවගේ

දේශනාවෙන් අවබෝධවෙත්දැයි බලන්නේ සැරියුත් තෙරුන් ගේ යයි දැක උන්වහන්සේ සමීපයට යැවූහ. ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන් විචළහ. ඇවැත්නි ශාස්තෲ සමීපයට ගියහුද? එසේය ගියෙමු. ශාස්තෲන් වහන්සේ ඔබවහන්සේ ළඟට එවූහ. ඉක්බිති ස්ථවිරයන් වහන්සේ මේ භික්ෂූහු මගේ දේශනයෙන් අවබෝධකර ගනිති. කෙබඳු දේශනාවක් වටීදැයි සිතන්නේ මේ භික්ෂූහු සමගියට ඇලුනහ. සාමග්ගිරසය දක්වා දේශනාව ඔවුන්ට වටනේ යයි තීරණය කොට එබඳු වූ දේශනාවක් දෙසීමට කැමැත්තේ "දසුත්තරං පවක්ඛාමි" යනාදිය කීහ. එහි මාතෘකා දහය බැගින් තබා බෙදන ලදැයි දසුත්තරො - වේ. ඒකකයේ සිට දසකය දක්වා ගිය නිසාද දසුත්තරො වේ. එක එක කොටසෙහි ප්‍රශන දහය බැගින් විසේස වූයේ ද දසුත්තර වේ. **තං දසුත්තරං පවක්ඛාමි** - කියන්නෙමි. ධම්මං - සූත්‍රය. **නිබ්බාණ පත්තියා** - නිර්වාණ ප්‍රතිලාභය සඳහා. **දුක්ඛස්ස න්තකිරියා** - සියළු සසර දුක් කෙළවර කරනු සඳහා **සබ්බගන්ථප්පමොචනං** - අභිධ්‍යා කාය ග්‍රන්ථාදි සිය ග්‍රන්ථ මිදීම සඳහා. මෙසේ දේශනා උසස් කරන්නේ එහි භික්ෂූන්ගේ ආදරය උපදවන්නේ මෙය මෙසේ උගත යුතුය. පුහුණු කළයුතුය. ධාරණය කළයුතුය කිව යුතුය සිතන්න යයි සතර පදයකින් වර්ණනා කළහ. "එකායනො අයං භික්ඛවෙ මග්ගො" යනාදි නයින් ඒ ඒ සූත්‍රවලින් භාග්‍යවතුන් වහන්සේ මෙන්. එහි **බහුකාරො** - බොහෝ උපකාර, **භාවෙතබ්බො** - වැඩිය යුතු. **පරිඤ්ඤෙය්‍යො** - පරිඥා තුනකින් දැනගත යුතුය. **පහාතබ්බො** - පහාණානුපස්සනාවෙන් දුරුකළ යුතුය. **හානභාගියො** - අපායගාමී පිරිහීම පවතින. **විසෙසභාගිය** - විසේසගාමී විසේසය පිණිස පවතින. **දුප්පටිවිද්ධො** - දුකසේ ප්‍රත්‍යක්ෂ කළ. **උප්පාදෙතබ්බො** - නිෂ්පාදනය කළ යුතුය. **අභිඤ්ඤෙය්‍යං** - දතයුතු දැනීම. අභිජානනය. **සච්ඡිකාතබ්බො** - ප්‍රත්‍යක්ෂ කළයුතු. මාතෘකා සියළු අර්ථ මෙසේ දත යුතුය.

මෙසේ ආයුෂ්මත් සාරිපුත්ත යම්සේ දක්ෂ වේළුකරුවෙක් (කුළුපොත්තා) හමු වූ උණ ගසක් මුලින් කපා ගැට සැස කොටස් දහයකට කපා එක එක කොටස තීරු තීරුවලට පලයි. එමෙන් ඒ භික්ෂූන්ට සප්පාය දේශනාව පරීක්ෂා කරන්නේ දස ආකාර මාතෘකා තබා එක එක කොටසක එක එක පදය බෙදන්නේ "කුසල ධර්මවල අප්‍රමාදව එක් ධර්මයක් බොහෝ උපකාර වන්නේ කෙසේද? යනාදි නයින් දේශනාව විස්තර කිරීමට ආරම්භ කළහ. එහි **අප්පමාදො කුසලෙසු ධම්මෙසු** - හැම අතටම උපකාරවන අප්‍රමාදය කීහ. මේ අප්‍රමාදය

වනාහි සීල පූරණයෙහි ඉන්‍ද්‍රිය සංවරයෙහි භෝජනයේ පමණ දැනීමෙහි නිදි වැරීමෙහි සත් ධර්මවල විපසසනා ගර්භව ගැන්වීමෙහි අතත පටිසම්භිදාදියෙහි සීලස්කන්‍ධාදි පංච ධර්මස්කන්‍ධවල ඨානාඨානයෙහි මහාවිහාර සමාපත්තියෙහි ආර්ය සත්‍යවල සතිපට්ඨානාදියෙහි බොජ්ඣංග ධර්මවල විදර්ශනා ඤාණාදියෙහි අෂ්ටවිද්‍යාවල සියළු අනවද්‍ය ස්ථාන කුසල ධර්මවල බොහෝ උපකාර වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි සත්‍වයෝ අපදා හෝ තථාගතයන් වහන්සේ ඔවුන්ගේ අග්‍රයයි කියයි. මහණෙනි, එසේම යම්කිසි කුසල ධර්මවේද ඒ සියල්ලට අප්‍රමාදය මූලකය. අප්‍රමාදය එක්තැන්වීම වේ. අප්‍රමාදය ඒ ධර්මයන්ට අග්‍රයයි කියයි. ආදි නයින් ඇත්පිය ආදි උපමාවෙන් උපමා කරන්නේ සංයුතත නිකායෙහි අප්‍රමාද වර්ගයේ නොයෙක් ආකාරයෙන් වර්ණනා කළහ. ස්ථවිරයන් වහන්සේ ඒ සියල්ල එකපදයකින් ම සංග්‍රහ කොට ''අප්පමාදො කුසලෙසු ධම්මෙසු'' යයි කීහ. ධම්මපදයෙහි අප්පමාද වග්ගයෙන් ද බොහෝ උපකාර ඇති බව දැක්විය යුතුය. අසෝක වස්තුවද දැක්විය යුතුය. අසෝක රජ ද නිග්‍රොධ සාමණේරයන්ගේ ''අප්පමාදො අමත පදං'' ගාථාව අසා දරුව නවතින්න, ඔබ විසින් මට ත්‍රිපිටක බුද්ධ වචනය කියන ලදැයි සාමණෙරයන් කෙරෙහි පැහැද විහාර අසූහාර දහසක් කරවීය. මෙසේ ධෛර්ය සම්පන්න භික්‍ෂුව විසින් අප්‍රමාදයේ බොහෝ උපකාර ඇති බැවින් තුන් පිටකය දක්වා කිව යුතුය.

යම්කිසි සූත්‍රයක් හෝ ගාථාවක් හෝ අප්‍රමාදය දැක්වීම සඳහා ගෙනෙන්නේ අස්ථානයෙහි සිට ගෙන එන්නෙහි සම්පූර්ණ නොකොට ඉවත්ව ගියහයි නොසිතිය යුතුය. ධර්මකථිකයාගේ වීර්යද බලය ද ප්‍රමාණ වේ. **කායගතා සති** - ආනාපාන, චතු ඉරියාපථ, සතිසම්පජඤ්ඤ, දවත්තිංසාකාරය චතුධාතු වවත්ථාන, දස අසුභ නවසීවථික, චුණ්ණික මනසිකාර, කේසාදියෙහි රූප ධ්‍යාන යන මෙහි උපන් සිහියට මෙය අධිවචනයකි. **සාතසහගතා** - චතුර්ථ ධ්‍යානය හැර සෙසු තන්හි සාත සහගත වේ. සැපයුත්ය. එය සඳහා කියන ලදී. **සාසවො උපාදානියො** - ආසවයන්ගේ ද උපාදානයන්ගේ ද ප්‍රත්‍ය වූ. මෙසේ ත්‍රෛභූමික ධර්මයම නියම වූ. **අසම්මානො** - රූපාදියෙහි වෙමි යන මැනීම්. **අයොනිසො මනසිකාරො** - අනිත්‍යයෙහි නිත්‍යයයි යනාදි නයින් පවතින වැරදි මාර්ග මෙනෙහි කිරීම. විපර්යාසයෙන් මෙනෙහි කිරීම යයි දත යුතුය. **ආනන්තරිකො චෙතො සමාධි** - අන්තැනක මාර්ගයට අනතුරුව

පලය ආනනතරික චේතෝ සමාධි නම් වේ. මෙහි වනාහි විපස්සනාවට අනතුරුව මාර්ගය විපසසනාවෙන් හෝ අනතුරුව තමාගේ හෝ අනතුරුව පලදායක බව ආනනතරික චේතෝ සමාධියයි අදහස් කරයි. අකුපපං ඤාණං - අන්තැනක පල පඤ්ඤාව අකුපප ඤාණ නම් වේ.

මෙහි පචචවෙක්ඛණ ප්‍රඥාව අදහස් කෙරේ. ආහාරට්ඨිතිකා - ප්‍රත්‍යය නිසා සිටීම. අයං එකො ධමෙමා - යම් ප්‍රත්‍යයකින් ඔව්හු සිටිත් ද මේ එක ධර්මය දන්නා ලද අවබෝධයෙන් අවබෝධ කොට අවබෝධ කළ යුතු. අකුපපා චෙතො විමුතති - රහත්පල මුක්තිය. මේ වාරයෙහි අවබෝධය ඤාත පරිඤ්ඤ යයි කියන ලදී. අපපටිවිජෙඣා - මෙහි වනාහි මාර්ගය කියන ලදී. සචඡිකාතබබං - ඵලය කියන ලදී. මාර්ගය එක පදයෙහි ලැබේ. ඵලය අනේක පදවල ලැබේ. භූතා - සවභාවයෙන් විද්‍යාමාන තචඡා - සත්‍ය. තථා - කියන ලද සේ. අවිතථා - කියන ලද්දට වෙනස්ව නොවේ. අනඤ්ඤථා - කියන ලද ආකාරයෙන් අන්‍ය ආකාරයකින් නොවේ. සමමා තථාගතෙන අභිසමබුදධා - තථා ගතයන් විසින් බෝපළඟෙහි හිඳ හේතු කරුණුවලින් තමා විසින්ම බුදුවූයේ. දන්නා ලද්දේ අවබෝධ කරන ලද්දේ සාක්‍ෂාත් කරන ලද්දේය. මේ සථවිරයෝ මේ ධර්ම තථාගතයන් විසින් අභිසම්බුද්ධය, මම වනාහි ඔබගේ රජුගේ ලේඛ වාචක වැනිය. ජින සූත්‍ර දක්වමින් විශවාසය ඇති කළහ. ඉමෙ දෙව ධමමා බහුකාරා - මේ සති සමපජඤ්ඤ ධර්ම දෙක සීල පූරණාදියෙහි අප්‍රමාදය මෙන් සියළුතැන උපකාරකය, දියුණුව ගෙන දේ. සමථො ච විපසසනා ච - මේ දෙක සංගීති සූත්‍රයේ ලෞකික ලෝකෝත්තර වශයෙන් කියන ලදී. මේ දසුත්තර සූත්‍රයෙහි මුල් කොටසෙහි කියන ලදී. සත්වයන්ගේ සංකිලෙසය පිණිස සත්වයන්ගේ විසුද්ධිය පිණිස. සත්වයින් කෙලෙසීම පිණිස අයෝනිසො මනසිකාරය හේතු ද ප්‍රත්‍යයද වේ. සත්වයින් විසුද්ධිය පිණිස යෝනිසො මනසිකාරය හේතු ද ප්‍රත්‍යය ද වේ. එසේම දුර්වචභාවය පාපමිත්‍ර සේවනය සංකිලේසය පිණිස, සුවචභාවය, කල්‍යාණ මිත්‍ර සේවනය විසුදධිය පිණිස වේ. එසේම අකුසල් මුල් තුණ, සතර යෝග සතර විසංයෝග, පංච චේතෝඛිල, පංච ඉන්ද්‍රිය, අගාරව සය, ගාරව සය, අසදධමම සත, සදධමමසත, කුසීත වසතු අට ආරමභ (පිරිස) වසතු අට. නව ආඝාත වසතු නව ආඝාත පටිවිනය, දස අකුසල කමම පථ දසකුසල කමමපථ මෙසේ ප්‍රභේද වූ මේ ධර්ම දෙක අවබෝධයට අසීරුබව දත යුතුය.

සංඛතා - ධාතු - ප්‍රත්‍යයෙන් කරන ලද පංචස්ඛන්ධ. අසංඛත ධාතු - ප්‍රත්‍යයෙන් නොකරන ලද නිබ්බාණං විජ්ජා ච විමුත්තිචාති - මෙහි විජ්ජා ත්‍රිවිද්‍යා වේ. විමුත්ති අරහත්ත ඵලය. මේ වාරයෙහි ආභිඤ්ඤඤාදිය එක සමානය. ඉපිදවිය යුතු පදය වනාහි මාර්ගය කියන ලදී. සාක්‍ෂාත් කළයුතු පදය ඵලයයි. මේ කාමයන්ගේ නිස්සරණය යම් මේ නෙක්ඛම්ම මෙනි. මෙහි නෙක්ඛම්මය අනාගාම මග්ග අදහස් කරයි. එය සියළු කාමයන්ගෙන් වෙන්වීමයි. යම්සේ ආරුප්ප මෙනි. මෙහි ආරුප්පයෙහි ද නැවත ඉපදීම නිවාරණයෙන් සියළු රූපයන්ගෙන් වෙන්වීම නම් නිරොධයයි. එහි නිසසරණය මෙහි අරහත්ත ඵලයයි. නිරෝධය අදහස් කරයි. අරහත් ඵලයෙන් නිවන් දුටුවිට නැවත ඉදිරියට සියළු සංස්කාරයෝ නොවෙත්. රහත් බව සියළු සංඛත නිරොධයට ප්‍රත්‍ය බැවින් නිරොධයයි කියන ලදී. **අතීතං සඤ්ඤඤාණං** - අතීත අරමුණු සහිත ඤාණය, ඉතිරි ඒවායේද මෙම නයයි, මේ වාරයෙහි අභිඤ්ඤඤාදීහු එක සමානමය. අවබෝධයට දුෂ්කර පදය වනාහි මාර්ග යයි කියන ලදී. ක්‍ෂාත් ක්‍ෂාත් කළයුතු පද ඵලයයි.

**චත්තාරි චක්කානි** - මෙහි චක්ක නම් දූව සක, රුවන් සක දහම් සක, ඉරියව් සක, සම්පත් සක යයි පස් අයුරුය. එහි යහළුව යම් මේ රියසක සමසකින් නිමකරන ලදී. සරයකින් මේ දූව සක, පිය විසින් පවත්වන සක (අණ) අනුව පවතී. මෙය රුවන් සකයි. මෙය දහම් සකයි. සතර සක නවදොර, මෙතන ඉරියා පථ, මහණෙනි. මේ සක් සතරෙකි. මෙයින් යුත් දෙව් මිනිසුන් සතර සක් පවත්වති. මෙය සම්පත් සකයි. මෙහිද එයම අදහස් කරයි.

**පතිරූප දෙස වාසො** - යම්තැනක සිව්පිරිස දක්නා ලැබෙත් ද එබඳු වූ සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, **සප්පුරිසූපසසයො** - බුදධාදි සත්පුරුෂයන්ගේ දැකීම සේවනය, භජනය. **අත්තසම්මා පණිධි** - තමා මනාව තැබීම. පෙර අශ්‍රද්ධාවෙන් යුක්තවීද ලද කුසල් ඇති බව. මෙහි මෙය ප්‍රමාණය. යම් ඤාණ සම්ප්‍රයුක්ත සිතකින් කුසල කර්ම කරන ලද්දේ වේද ඒ කුසලය ද ඒ පුරිසයා සුදුසු ප්‍රදේශයකට පමුණුවයි. සත්පුරුෂයන් භජනය කරවයි. හේ තමාම මනාව තබයි. සිවු ආහාරවල මුල්එක ලෞකිකය. සෙසුතුන පූර්වභාගය ලෞකිකය. කාමයෝග විසංයෝගාදිය අනාගාමි මග්ගාදි වශයෙන් දත යුතුය. හානභාගාදියෙහි ප්‍රථම ධ්‍යානාලාභී කාමසහගත සංඥා මෙනෙහි කරමින් හැසිරෙයි.

හානභාගිය සමාධි එහි ධර්මතා වශයෙන් පවතී. ඨිතිභාගිය සමාධි අවිතක්කසහගතා සංඥා මෙනෙහි කිරීම් පවතී. විසෙසභාගිය සමාධි නිබ්බිදා සහගත සංඥා මනසිකාරවලින් හැසිරේ. විරාග උපසංගිත වූ නිබ්බෙධභාගිය සමාධිය මෙම නයින් සියළු සමාපත්ති විස්තර කොට අර්ථය දත යුතුය. විසුද්ධි මාර්ගයෙහි විනිශ්චය කථා කියන ලදී.

මේ වාරයෙහි අභිඤ්ඤාදිය එක සමාන වේ. මෙහි අභිඤ්ඤා පදයෙහි මාර්ගය කියන ලදී. සාක්ෂාත් කළයුතු පදය ඵලය වේ. පීති පැතිරවීම ආදියෙහි ප්‍රීතිය පතුරුවමින් උපදින ධ්‍යාන දෙකෙහි ප්‍රඥාව පීති ඵරණතා නම් වේ. සැපය පතුරුවමින් ධ්‍යාන තුනෙහි උපදින ප්‍රඥාව සුඛ ඵරණතා නම් වේ. අනුන්ගේ සිත පතුරුවමින් උපදින චේතොපරිය ප්‍රඥාව චෙතො ඵරණතා නම් වේ. ආලෝකය පැතිරවීමෙහි උපදින දිබ්බචක්ඛු පඤ්ඤා ආලොක ඵරණතා නම් වේ. පච්චවෙක්ඛණා ඤාණය පච්චවෙක්ඛණ නිමිත්ත නම් වේ. මෙය කියන ලදීඃ ධ්‍යාන දෙකෙහි පඤ්ඤා පීති ඵරණතා නම් වේ. ධ්‍යාන තුනෙහි පඤ්ඤා සුඛ පරණතා නම් වේ. පරචිත්තෙ පඤ්ඤා චෙතො ඵරණතා නම්වේ. දිබ්බචක්ඛු ආලොක ඵරණතා, ඒ ඒ සමාධිවලින් නැගිටින්නාගේ පච්චවෙක්ඛණ ඤාණය පච්චවෙක්ඛණ නිමිත්ත නම් වේ. එහි ද පීති ඵරණ සුඛ ඵරණතා දෙක පාද මෙනි. චෙතො ඵරණ ආලොක ඵරණතා දෙක අත්දෙක මෙනි. අභිඥා පාදක ධ්‍යානය මධ්‍යම කය මෙනි පච්චවෙක්ඛණ නිමිත්ත හිස මෙනි. මෙසේ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර පංචංගික වූ සම්මා සමාධිය අඟපසඟ යුත් පුරුෂයකු කොට දක්වීය. මේ සමාධි වර්තමාන සැපය දූයි ආදියෙහි රහත් පල සමාධි අදහස් කරයි. එය අර්පිත අර්පිත ක්ෂණයෙහි සැප ඇතිවන බැවින් වර්තමාන සැපයයිද පළමු පළමු ඒවා පසු පසු සමාධි සැපයට හේතුවන බැවින් ආයති සැප විපාක ද වේ. කෙලෙස් වලින් ඈත් වූ නිසා අරියො - වේ. කාම ආමිස සසර ආමිස ලෝක ආමිස අභාවයෙන් නිරාමිස - වේ. බුද්ධාදි මහා පුරුෂයන් විසින් සේවනය කරනලද බැවින් අකා පුරිස සෙවිතය. අංග සාන්ත බැවින් අරමුණු සාන්ත බැවින් සියළු කෙලෙස් කරදරවලින් සාන්ත බැවින් සාන්තය. නොතෑවෙන අර්ථයෙන් ප්‍රණීතය. කෙලස් සංසිඳීමෙන් ලැබූ බැවින් කෙලෙස් සංසිඳුණු බැවින් ලද බැවින් සංසිඳුණු ලැබූවමින් පටිප්පසසද්ධා වේ. එකෝදිභාවයෙන් අධිගත බැවින් ඒකෝදිභවයෙන්ම යුත් නිසා එකෝධිභාව අධිගතෙන වේ. අලපගුණ ආශ්‍රව සහිත සමාධි මෙන් සංඛාරයෙන් සප්‍රයෝග සිතෙන් ප්‍රත්‍යනීක

ධර්මවලට නිග්‍රහකොට කෙලෙස් වලක්වා අනධිගත බැවින් සංඛාර නිග්‍රහ වැලැක්වීම නොවේ. ඒ සමාධියට සමවදින්නේ එයින් නැගී සිටින්නේ හෝ සිහි විපුලභාවයට ගියේ සිහියෙන්ම සමවදී. සිහියෙන්ම නැගිටී. එහෙයින් මෙහි මේ සමාධිය පච්චුප්පන්න සැපයද ආයති සැප විපාකදැයි මෙසේ ප්‍රතිවේක්‍ෂාකරන්නාට පච්චුප්පන්න සැපයද ආයති සැප විපාකදැයි මෙසේ ප්‍රතිවේක්‍ෂාකරන්නාට වෙනමම අපරපච්චය ඤාණය උපදී. එය එක මගකි. සෙස්සෙහි ද මෙම නයයි. මෙසේ මේ පස් ආකාර වූ පච්චවෙක්ඛණා ඤාණයෙන් මේ සමාධි පඤ්චඤාණික සම්මා සමාධි යයි කියන ලදී. මෙම වාරයෙහි විශේෂභාගිය පදයෙහි මාර්ගය කියන ලදී. සච්ඡිකා පද එලං. සෙස්ස පෙර මෙනි.

ඡකෙක සියල්ල නොගැඹුරු අරුත් වේ. දුප්පටිවිජ්ඣ පදෙ මෙහි මාර්ගය කියන ලදී. සෙස්ස පෙර මෙනි. සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, හේතුනයින් විපස්සනා ඤාණයෙන් මනාව දක්නා ලදී. කාමා - වස්තුකාමද ක්ලේශ කාමද, දෙකම පරිළාහ අර්ථයෙන් ගිනිඅඟුරු මෙන් දක්නා ලද වේ. විවෙක නින්නං - නිවනට නැමුණු පොණං පබ්භාරං - නින්න යන්නට සමාන වචන වේ. ව්‍යාන්තිභූතං - නියති වූ. තණ්හා නැති යන අර්ථයි. ආදිබ්‍රහ්මචරියකාය පඤ්ඤාය - ශික්‍ෂාත්‍රය සංග්‍රහ වූ මාර්ග බ්‍රහ්මචර්යාවට ආදිභූත වූ පූර්ව භාගයෙහි තරුණ සමථවිපස්සනා ප්‍රඥාවෙන්. අටඨංගික මාර්ගයට ආදිභූත වූ සමාදිට්ඨි ප්‍රඥාවෙන්. තිබ්බං - බලවත්. හිරොත්තප්ප - ලජ්ජා භය. පෙමං - ගෙහසිත ප්‍රේමය, ගාරවො - ගරු සිත් බව. ගරුභාවනීය උපනිශ්‍රයෙන් වාසය කරන්නේ කෙලෙස් නූපදියි. අවවාදානුසාසනා ලබයි. එහෙයින් ඒ නිසා විහාරය ප්‍රඥා ප්‍රතිලාභයට හේතු වේ. අක්‍ෂණයන්හි ප්‍රේතයෝ අසුරයන්ගේ ආවාහ විවාහයට යති. එහෙයින් පෙත්ති විසයෙන්ම අසුරකාය ගන්නා ලදැයි දත යුතුය.

අප්පිච්ඡස්ස - පච්චය අප්පිච්ඡ අධිගම අප්පිච්ඡ පරියත්ති අප්පිච්ඡ ධුතංග අප්පිච්ඡ යයි අප්පිච්ඡ සතරකි. එහි පච්චය අප්පිච්ඡ බොහෝ දෙන්නේ සවල්පයක් ගනී. සවලපයක් දෙන්නේ එයින් ද බොහෝ දෙන්නේ සවල්පයක් ගනී. අධිගම අප්පිච්ඡ මජ්ඣන්තික තෙරුන් මෙන් තමාගේ අධිගම අන්‍යයන්ට දැන ගැනීමට නොදෙයි. පරියත්ති අප්පිච්ඡා ත්‍රිපිටකය සමාන වූයේ මුත් බහුස්සුත භාවය දැක්වීමට කැමති නොවේ. සාකෙතක තිස්ස තෙරුන් මෙනි. ධුතංග අප්පිච්ඡ ධුතංග පරිහරණ බව

අන්‍යයන්ට දූනගැනීමට නොදෙයි. සහෝදර තෙරුන් දෙදෙනාගෙන් දෙවු තෙරුන් මෙනි. වසතුව විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. **අයං ධම්මො** - මෙසේ ඇති ගුණ සැඟවීමෙන් ද ප්‍රත්‍ය පිළිගැනීමේ පමණ දූනීමෙන් ද අපිස් පුඟුලාගේ මේ නව ලොකොත්තර ධර්මය මහිච්ඡයාට සම්පාදනය නොවේ. මෙසේ සියළු තැන යෙදිය යුතුය. **සන්තුට්ඨස්ස** - සිව්පසයෙහි තුන් ආකාර සන්තෝෂයෙන් සන්තෝෂ වූවහුට. **පවිවිත්තස්ස** - කාය චිත්ත උපධි විවේකයෙන් විවේක ඇත්තාට, එහි කාය විවේක නම් ගණ සමූහයෙන් වෙන්ව අෂ්ට ආරම්භ වස්තු වශයෙන් ඒකියභවයයි. ඒකීයභාවයෙන් කර්ම නොනිපදෙයයි කසිණ භාවනා කොට අෂ්ට සමාපත්ති උපදවයි. මෙය චිත්ත විවේක නම්. සමාපත්ති මත්තෙහි කර්ම නොනිපදවේ. ධ්‍යාන පාදක කොට සංඛාර සම්මර්ෂණය කර සිව්පිළිසිඹියා සහිත රහත් බවට පැමිණේ. මෙය උපධි විවේක නම්. **සංගණිකාරාමස්ස** - ගණ සංගණිකාය ද කිලේස සංගණිකායෙහි හැසිරෙන්නාට. **ආරද්ධවිරියස්ස** - කායික චෛතසික විරිය වශයෙන් පටන්ගත් වීර්ය ඇත්තාට. **උපට්ඨිතසතිස්ස** - චතු සතිපට්ඨාන වශයෙන් එළඹසිටි සිහිය ඇත්තාට. **සමාහිතස්ස** - එකඟ වූ සිත් ඇත්තාට. **පඤ්ඤාවදාතො** - කම්මස්සක ප්‍රඥාවෙන්. **නිප්පඤ්ඤස්ස** - පහවූ මාන තණ්හා දිට්ඨි ප්‍රඥා ඇත්තාට. මෙහි වැඩිය පදය මග්ග යයි කියන ලදී. සෙස්ස පෙර මෙනි.

**සීලවිසුද්ධි** - විසුද්ධියට පැමිණවීමට සමත් චතුපාරිසුද්ධි සීලය. **පාරිසුද්ධිපධානියංග** - පාරිසුද්ධිභාවයට ප්‍රධාන අංග. **චිත්ත විසුද්ධි** - විපස්සනාව පදනම් වී ප්‍රගුණ වූ අෂ්ට සමාපත්ති. **දිට්ඨි විසුද්ධි** - ප්‍රත්‍ය සහිත නාමරූප දැකීම. **කංඛාවිතරණ විසුද්ධි** - ත්‍රි ප්‍රත්‍යාකාර ඥාණය. අද්ධත්තයෙහි ද ප්‍රත්‍ය වශයෙන්ම ධර්ම පවතී යයි දකින්නේ සැක නැතිවෙයි. **මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි** - ඕභාස (ආලොක) ආදිය මාර්ගය නොවේ. වීරියට පිළිපන් උදයව්‍යාය ඥාණය මාර්ගය වේ. මෙසේ මාර්ග අමාර්ගයේ ඥාණය. **පටිපදාඤාණ දස්සනවිසුද්ධි** - රථවිනීත සූත්‍රයෙහි වුට්ඨානගාමිනී විපස්සනා. මේ සත් විසුද්ධි විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. **පඤ්ඤා** - අරහත්තඵල ප්‍රඥාව. **විමුත්ති** - අරහත්තඵල විමුත්තියම. **ධාතු නානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්ස නානත්තං** - චක්ඛු ආදි ධාතු නානත්වය නිසා චක්ඛු සම්ඵස්සජාදි ඵස්ස නානත්වය වේ. **ඵස්ස නානත්තං පටිච්ච** - චක්ඛු සම්ඵස්ස නානත්වය නිසා **වෙදනා නානත්තං** - චක්ඛු සම්ඵස්සජාදි වෙදනා නානත්වය. **සඤ්ඤා**

නානත්තං පටිච්ච - කාම සංඥා ආදි නානත්වය නිසා. සංකප්ප නානත්තං - කාම සංකල්පාදි නානත්වය. සංකප්ප නානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්ද නානත්තං - සංකල්ප නානත්වය රූපයෙහි කැමැත්ත ශබ්දයෙහි කැමැත්ත යයි මෙසේ ඡන්ද නානත්වය ඇතිවේ. පරිළාහනානත්තං - ඡන්ද නානත්වය උපදී. පරියෙසනා නානත්තං - පරිළාහ නානත්වය රූප පරියේසනාදි නානත්වය උපදී. ලාභ නානත්තං - පරියෙසන නානත්වය රූප ප්‍රතිලාභාදි නානත්වය උපදී. සංඥාවල මරණ සඤ්ඤා - මරණානුපස්සනා ඥානයෙහි සංඥාව. ආහාරෙ පටික්කූල සඤ්ඤා - ආහාරය ගන්නාට උපන් සංඥාව. සබ්බලොකෙ අනභිරත සඤ්ඤා - සියළු සසරෙහි කලකිරුණු තැනත්තාට උපන සංඥාව. සෙස්ස යට කියන ලදී.

මෙහි බහුකාර පදයෙහි මාර්ගය කියන ලදී. සෙස්ස පෙර පරිදිය. නිජ්ජර වත්‍ථූනි - නිජ්ජර කරුණු. මිච්ඡා දිට්ඨී නිජ්ජිණ්ණා හොති - මෙය යට විපස්සනායෙන් ද නිජ්ජිනනා ම ප්‍රහීනය, කුමක් හෙයින් නැවත ගන්නා ලදද? සමුච්ඡිනන නොවූ නිසා. විපස්සනාවෙන් කිසිවක් ප්‍රහීනය. සමුච්ඡිනන නොවිය. මාර්ගය වනාහි ඉපදී එය සමුච්ඡෙදනය කරයි. නැවත නැගිටීමට නොදෙයි. එහෙයින් නැවත ගන්නා ලදී. මෙසේ සියළු පදවල නය පැමිණවිය යුතුය. මෙහිද සම්‍යක් දෘෂ්ටි ප්‍රත්‍යයෙන් සූසැට දහම් වැඩීම සම්පූර්ණ බවට යයි. සූසැට කවරේද? සෝවාන් මාර්ග ක්‍ෂණයෙහි අධිමොක්ඛ අර්ථයෙන් සද්ධා ඉන්‍ද්‍රිය සම්පූර්ණ කරයි. අවික්‍ෂෙප අර්ථයෙන් සමාධි ඉන්‍ද්‍රිය සම්පූර්ණ කරයි. පග්ගහ අර්ථයෙන් විරියින්‍ද්‍රිය සම්පූර්ණ කරයි. දර්ශන අර්ථයේ ප්‍රඥා ඉන්‍ද්‍රිය සම්පූර්ණ කරයි. විජානන (දැනීම්) අර්ථයෙන් මන ඉන්‍ද්‍රිය සම්පූර්ණ කරයි. අභිනන්ද අර්ථයෙන් සොමනස්ස ඉන්‍ද්‍රිය....සන්තතිය පවත්වන අධිපති අර්ථයෙන් ජීවිත ඉන්‍ද්‍රිය සම්පූර්ණ කරයි...අරහත්ත ඵල ලක්‍ෂණයෙහි අධිමොක්ඛ අර්ථයෙන් සද්ධා ඉන්‍ද්‍රිය සන්තතිය පවත්වන අධිපති අර්ථයෙන් ජීවිතේන්‍ද්‍රිය සම්පූර්ණ කරයි. මෙසේ සතර මාර්ගයෙහි සතර ඵලයෙහි අට අට වී සූසැට දහම් සම්පූර්ණත්වයට යයි.

මෙහි අභිඤ්ඤෙය්‍ය පදයෙහි මග්ග කියන ලදී. සෙස්ස පෙර පරිදිය. මෙහි සිට ප්‍රශ්න සමෝධානය කළයුතුය. දසකයෙහි ප්‍රශ්න සියයක් කියන ලදී. එකෙහි ද නවකයෙහි ද සියයක්, දුකෙහිද අට්ඨකයෙහි ද

සියයක්, තිකෙහි ද සත්තකයෙහි ද සියයක්. චතුක්කයෙහි ද ඡක්කයෙහි ද සියයක්. පඤ්චකයෙහි පනහක් දැයි අදධ ෂටය් ප්‍රශන සියය කියන ලද්දේ වේ.

ආයුෂමත් සාරිපුත්ත රහතන් වහන්සේ මෙය දේශනා කළහ. ඒ භික්ෂූහු ආයුෂමත් සාරිපුත්ත රහතන් වහන්සේ ගේ දේශනාවට සන්තෝෂ වි සතුටු වූහ. සාධු සාධු යයි සතුටු වන්නේ හිස් මුදුනින් පිළිගත්හ. ඒ සන්තෝෂයෙන් මේ සූත්‍රය ආවර්ජනා කරන්නේ ඒ භික්ෂූහු පන්සිය දෙනාම සිව්පිලි සිඹියා සහිත අග්‍ර ඵලය වූ රහත් බවෙහි පිහිටියහ.

**දසුත්තර සූත්‍ර වර්ණනාව නිමි.**

**පාටික වර්ගය සමාප්තයි.**

## දීඝනිකායටය් කථාව නිමියේය.